# කෙලෙස්
# එක්දහස් පන්සියය

(නව වන මුද්‍රණය)

මහාචාර්ය

**රේරුකානේ චන්දවිමල**

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,
අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)

**මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්**

**සම්පාදිතයි.**

*Non-commercial distribution*

## දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත

# රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චෛතසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල නිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සුරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979) ෆැක්ස් : 034-2265251

*Non-commercial distribution*

**ලේකම්ගේ සටහන්......**

# කෙලෙස් එක්දහස් පන්සියය

අපෙන් සිදු වන පව් බොහොමයක් කරන-කියන පව්කම් වලට වඩා හිතන-පතන පව්ය. හිත ගැනත් හිතෙහි ඇති වන සිතුවිලිවල විවිධාකාර ස්වරූප ගැනත් අප නොදන්නා තරමට මේ පව්වල ප්‍රමාණය ද වැඩිවිය හැකිය. ලෝභ දෝස මෝහ යන අකුසල් මුල් තුන පදනම් කරගෙන පාපකාරී චෛතසික කීපයක් විවිධ ආකාරවලින් මතු වී එන හැටි තේරුම් ගැනීමට මේ පොත උපකාරී වෙයි.

එකම වස්තුවක් එක් එක් පැත්තෙන් සිට බලන විට එහි පෙනීම වෙනස් ය. එකම වස්තුවක් දෙස එක තැනක සිට පුද්ගලයන් දෙදෙනකු බලන විට ද වෙනස් පෙනීමක් ඇතිවිය හැකි ය. එසේ ම එක් එක් ස්ථානය අනුව, අවස්ථාව අනුව හා පුද්ගලයා අනුව එකම සිතිවිල්ලක ස්වරූපයේ ද නොයෙක් වෙනස්කම් ඇතිවිය හැකි ය. කෙලෙස් එක්දහස් පන්සියයක් වශයෙන් ගණන් බලන්නට හැකිව ඇත්තේ එම විවිධාකාරය නිසාය. මේ තත්ත්වය යම්තම් මතුපිටින් හෝ තේරුම් ගන්නට අප සමත් වේ නම් ලෝකයේ නො ගැලී-නො ගැටී ජීවත් වීමට එයම ප්‍රමාණවත් වේ.

හික්මුණු (සමාහිත) සිතක් ඇතිකර ගැනීමට සිත පිළිබඳ මේ ඉගෙනීම ප්‍රයෝජනවත් වෙයි. විදසුන් මගට පිවිසීමට එය දොරටුවක් වෙයි. **ධම්දනය ඉතා උසස් වන්නේ පුද්ගලයාටත්, සමාජයටත් විමුක්තිය උදාකර ගැනීමට අණට වඩා බණ අවබෝධයට තැන දෙන නිසා ය.** අණ නොතකා යන්නට බොහෝ දෙනකු උත්සාහ කරතත් බණ දැනගතහොත් එවැනි පව් නො කරන බව පැහැදිලිය.

*Non-commercial distribution*

2500 බුද්ධ ජයන්තිය වන විට බෞද්ධයන් තුළ තිබූ දුර්වල ආගමික දැනුම පොහොසත් කිරීම අරමුණු කර ගෙන ඇරඹුණු රේරුකානේ චන්දවිමල මහානාහිමි පාණන්ගේ "සම්බුද්ධ ජයන්ති ධර්ම පුස්තක වැඩපිළිවෙල" එකල වැඩවිසූ සමහර භික්ෂූන් වහන්සේලාගේ හා විවිධ උගතුන්ගේ විවේචන ජයගනිමින් දීර්ඝ මාවතක ගමන් කළ බව ඔබ දනී. මේ පොත් නිසා බුද්ධ විනය පිළිබඳවත්, භාවනා කිරීම පිළිබඳවත් ගිහියන් දැනුවත් කළවුන්ට පහසුවක් වූ බව ද පෙනේ. ගිහියන්ට නිවැරදි බෞද්ධයන් ලෙස සාර්ථක ගිහි ජීවිතයක් ගත කිරීමට මේ පොත් නිසා ලැබුණු අනුබලය විශේෂයෙන් අගය කළ යුත්තකි.

මුද්‍රණ තාක්ෂණයේ නව ශිල්ප ක්‍රම, පාඨක රුචිය ඇති කරන ආකෘතිකමය අවශ්‍යතා, සේවක වැටුප්, වෙළඳ නියෝජිතයන් ආකර්ෂණය කර ගැනීම වැනි අභියෝග රැසක් ඉදිරියේ මේ පොත්වලින් වන සේවය නොකඩවා ලබා දෙන්නට "ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය" කටයුතු කරයි. ඒ අභියෝග ඉදිරියේ නොසැලී සිටීම සඳහා සැදැහැවතුන් දෙන අනුබලය මහත් පිටුවහලකි. තම තමනට ඒ ඒ අවස්ථාවල හැකි ඉහළ මුදල් ප්‍රමාණවලින් උදව් දෙමින් සැදැහැවත් අනුග්‍රාහක භවතුන් දක්වන සහයෝගය අප ලද භාග්‍යයකි.

මෙහි අනුක්‍රමණිකාව ලියූ පරලෝසැපත් හර්බට් පතිරණ මහතාණන් ද, මඳ ඉසුඹුවක් පවා නොගෙන අවසන් වන පොතෙන් පොත මුද්‍රණය කරන්නට මා මෙහෙයවන ගරු සභාපති පූජ්‍ය කිරිඹරුවේ ධම්මානන්ද සමිඳුන් ද, කලින් මුද්‍රණ වාරයකදී සැදැහැබරව සෝදුපත් සැසඳූ ප්‍රජා පොල්පිටිය, දයාවතී අබේසිංහ මහත්මීන් ද, කලට වේලාවට මනා ලෙස මුද්‍රණ කටයුතු කළ සිකුරු පොත් ප්‍රකාශක ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ඇතුළු කාර්‍ය මණ්ඩලය ද සංශෝධිත පරිගණක සටහන් යෙදූ හොරණ රූ-මායා ග්‍රැෆික්ස් හි සාලිය ජයකොඩි යුවල ද දයාවෙන් සිහිපත් කරමි.

තිසරණ සරණයි!

සී. තනිප්පුලි ආරච්චි
ගරු ලේකම්
ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2008 නොවැම්බර් 12 වන දින,
පොකුණුවිටදී ය.

Non-commercial distribution

# ප්‍රස්තාවනා

ස්මරණශක්තිය ඥානශක්තිය ඉන්ද්‍රියශක්තිය ශරීරශක්තිය යන මේවා වයස් ගත වීමෙන් පිරිහෙන්නේය. ඒ ශක්තීන් පිරිහුණු මහලු අයට පොත් ලිවීම අපහසුය. අමාරුවෙන් ලියුව ද ඒවායේ ද දුබල බව සිටින්නේ ය. අපි ද දැන් මහලු වියෙහි සිටින්නෙමු. දැන් අපගේ ශක්තිය බොහෝ හීන ය. එබැවින් පොත් ලිවීම නවත්වා විවේකීව කල් යැවීම ආරම්භ කෙළෙමු. එහෙත් අපගේ පොත් කියවීමෙන් සතුටට පත්, අප වෙත පැමිණෙන අපට මුණ ගැසෙන බොහෝ ගිහි පැවිදි පින්වත්හු පොත් ගැන ම කථා කළහ. බොහෝ දෙනා අලුත් පොත් ගැන විමසූහ. ඇතැම්හු දැනට ලියන පොත කුමක්දැ යි ඇසූහ. ඇතැම්හු අලුත් පොත් නැත්තේ ඇයිද? දැන් පොත් නො ලියන්නේ ඇයිදැ යි ඇසූහ. ඇතැම්හු අලුත් පොත් ලිවීම සඳහා නොයෙක් මාතෘකා ඉදිරිපත් කළහ. ඇතැම්හු තවත් පොත් ලියන ලෙස ඇරයුම් කළහ. ඇතැම්හු අපගේ පොත් කලක් නො නැසී පවතිනු පිණිස තල්පත්වල හෝ තඹපත්වල ලියා තැබීමට ද යෝජනා කළහ. මේ කරුණු අනුව අප විසින් සම්පාදනය කරන දහම් පොත් කියවීමට ආශාව ඇති විශාල පිරිසක් ඇති බව පෙනී ගියෙන් නැවතත් පොතක් ලිවීමේ අදහස අපට ඇති විය.

'කෙලෙස් එක් දහස් පන්සියය' යනු නොයෙක් විට ධර්මකථිකයන් වහන්සේලාගේ මුවින් නිකුත් වන බෞද්ධයන්ට නිතර ඇසෙන වචනයෙකි. එහෙත් කෙලෙස් එක්දහස් පන්සියය දන්නවුන් දුලබ නිසා එය වචනමාත්‍රයක් වී ඇති බැවින් (කෙලෙස් එක්දහස් පන්සියය) ඒ ගැන පොතක් කවරෙකු විසින් හෝ ලියුව හොත් මැනව යන අදහස අප තුළ බොහෝ කලක පටන් පැවතිණ. කෙලෙස් ගිනි දල්වන කෙලෙස් වඩන පොත් කොතෙකුත් බිහිවුණා මිස, කෙලෙස් ගිනි නිවීමට උපකාර වන පරිදි කෙලෙස් එක්දහස්

Non-commercial distribution

පන්සියය ගැන පොතක් නො බිහි විය. එබැවින් බෞද්ධ ග්‍රන්ථමාලාවට අඩුවක්ව පවතින ග්‍රන්ථයක් වන මේ කෙලෙස් එක්දහස් පන්සියය නමැති ග්‍රන්ථය ලිවීම ආරම්භ කරන ලදී.

මෙය අප විසින් ආරම්භ කරන ලද්දේ අවසානය තෙක් ලියමිය යන ස්ථිර බලාපොරොත්තුවකින් නොව අපහසුකමක් නො වුව හොත් අවසානය තෙක් ලිවීමේ අදහසිනි. ඒ අතර යම් යම් අපහසු කම් ඇති වුව ද ලිවීම ආරම්භ කළ දිනයේ පටන් සෑම දිනයක ම පොතින් පේළි කීපයක් හෝ ලිවිය හැකි විය. තෙමසක් පමණ ලිවීමෙන් පොත සම්පූර්ණ විය.

**මේ ක්ලේශයෝ වනාහි මැටිකැට ගල්කැට පොල් ගෙඩි කොස් ගෙඩි ආදිය මෙන් පැහැයක් නැති සටහනක් නැති ප්‍රමාණයක් නැති ශරීරයක් නැති ඇසට නො පෙනෙන අතට අසු නො වන සිතෙහි ඇති වන අරූපී ධර්ම කොට්ඨාසයෙකි**. ඒවා තේරුම් කිරීමට උපයෝගී කර ගැනීමට ඇති එකම දෙයත් වචනය ම ය. ඇසට පෙනෙන අතින් ගත හැකි මැටිකැටයක ගල් කැටයක සැටි පවා වචනයෙන් හරියට ම තේරුම් කළ නො හැකි ය. පුද්ගලයන් හා වස්තූන් තේරුම් කිරීමට ඡායාරූප උපයෝගී කර ගන්නේ එබැවිනි. වචනයට වඩා බලයක් ඡායාරූපයට තිබේ. ශරීරයක් නැති කෙලෙසුන්ගේ ඡායාරූප ගැනීමක් නො කළ හැකි ය. ඒවා කෙසේ හෝ වචන වලින් ම තේරුම් කළ යුතු ය. අරූපී ධර්මයන් වචනවලින් තේරුම් කිරීම පහසු නො වන බැවින් අභිධර්ම ග්‍රන්ථයන්හි එක් එක් ක්ලේශයක් තේරුම් කිරීමට බොහෝ වචන උපයෝගී කර ගෙන ඇත්තේ ය. ලෝභය දැක්වීමට වචන සියයක් ද, ද්වේෂය දැක්වීමට වචන සවිස්සක් ද, මෝහය දැක්වීමට වචන පස් විස්සක් ද ගෙන තිබේ. පාළි භාෂාව නොදත් සිංහල ජනයාට ඒ වචන වලින් කාරණය තේරුම් කළ නො හෙන බැවින් ඔවුනට තේරෙන්නට සිංහල වචනවලින් අමුතු ආකාරයකින් කෙලෙසුන් විස්තර කළ යුතු ය. එය දුෂ්කර කාර්‍ය්‍යයෙකි. එය අපේ ශක්තියේ සැටියට කරන ලදී. කාහටත් පහසුවෙන් තේරුම් ගත හැකි ප්‍රසිද්ධ සිංහල වචනම යොදා මේ ග්‍රන්ථය ලියන ලදී. අපට දැනට ස්මරණ ශක්තිය ගිලිහී ගොස් ද ඇත. ලියන ලද දෙය ඉක්මනින් අමතක වී යන බැවින් මෙහි ඇතැම් තැනක පුනරුක්තයන් ද තිබිය හැකි

Non-commercial distribution

ය. කෙලෙසුන් බෙහෙවින් වැඩෙන්නේ ආර්‍ය්‍ය ධර්මය නො දත් ආර්‍ය්‍ය ධර්මයෙන් නො හික්මවන ලද කෙලෙසුන් නො හඳුනන අන්ධ පෘථග්ජනයන් ගේ සිත්වලය. ඔවුන් ගේ සිත් කෙලෙස් නමැති විස ගස්වලට සරුබිම් ය. මේ පොත කියවා කෙලෙසුන් ගැන දැනීමක් ඇති කර ගැනීම තමන්ගේ සිත් පිරිසිදු කර ගනු කැමති ගිහි පැවිදි සියලු පින්වතුන්ට ඉතා ප්‍රයෝජන වනු ඇත.

මේ පොත මුද්‍රණය කරවීමේ දී ශෝධ්‍ය පත්‍ර බැලීම් ආදි සියල්ල අපගේ ශිෂ්‍ය ශාස්ත්‍රාචාර්‍ය්‍ය **හේන්ගොඩ කල්‍යාණධම්ම** ස්ථවිරයන් **කිරිඹරුවේ ධම්මානන්ද** භික්ෂු නමගේ සහාය ඇතිව කරන ලදී. මේ පොත ඉක්මනින් මුද්‍රණය කර දුන් පන්නිපිටියේ තිලක් මුද්‍රණාලයේ **ඇම්. ජේ. පෙරේරා** මහතා ප්‍රමුඛ සේවක පිරිසට ද පින් සිදුවේවා.

මීට,
ශාසනස්ථිතිකාමී

**රේරුකානේ චන්දවිමල මහා ස්ථවිර**

2517/1973 සැප්තැම්බර් 7 වැනි දින.

පොකුණුවිට,
ශ්‍රී විනයාලංකාරාරාමයේ දී ය.

Non-commercial distribution

## ජාතික අභියෝගය...

දීර්ඝකාලීන විදේශ ආධිපත්‍යයෙන් නිදහස ලද ශ්‍රී ලංකාව, 19 වන සියවස තුළ ජාතිවාදී අරගල යන්ගෙන් හා ආගමික පීඩනයෙන් සිංහල බෞද්ධයා හෙම්බත් කළ සියවසක් විය. පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි, ටිබෙට් ජාතික එස් මහින්ද හිමි, අනගාරික ධර්මපාල තුමා, එල්. එච්. මෙත්තානන්ද, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ වැනි විරුවන් මේ අරබයා ජාතිය දැනුවත් කර පාලනයට අභියෝග කළ අතර, 2500 ශ්‍රී බුද්ධ ජයන්ති උත්සවය නිසා යම් අස්වැසිල්ලක් ලැබීමට හැකි විය.

අපේ ම පාලකයන් විදේශ පාලකයන්ගේ ඊළඟ පුරුකක් වූ නිසා ස්වදේශිකයන් කුමන අංශයකින්වත් නිදහස් ලැබූ ජාතියක් නොවී ය.

2006. 01. 08 වන දිනට සියවසක් සපුරන ශ්‍රී ලංකා ශ්වෙජින් නිකායේ පූජ්‍යපාද රේරුකානේ චන්දවිමල මහානාහිමි සරල දහම් පොත් මගින් ආගමික දැනුම ඇති කිරීමෙන් ද, පූජ්‍යපාද කහටපිටියේ සුමතිපාල නාහිමි භාවනා ක්‍රම ප්‍රගුණ කරවීමෙන්ද තීරණාත්මකව මේ අභියෝගවලට මුහුණ දිය හැකි ජාතියක් සකස් කිරීමට නිහඬව විපුල සේවයක් ඉටු කළහ.

නූතන තරුණ පරපුර මේ යුගයේ ඉතිහාසය විස්තරාත්මකව දැනගෙන, අනාගතය සකස් කර ගැනීමට උත්සාහවත්වීම අපේ පැතුමයි.

*Non-commercial distribution*

# පටුන


| | පිට |
|---|---|
| **එක බැගින් දැක්වෙන ධර්ම තෙසැත්තෑව** | 7 |
| ජාති මදෝ | 8 |
| ගොත්ත මදෝ | 8 |
| ආරොග්‍ය මදෝ | 11 |
| යොබ්බන මදෝ | 12 |
| ජීවිත මදෝ | 13 |
| ලාභ මදෝ | 15 |
| සක්කාර මදෝ | 15 |
| ගරුකාර මදෝ | 16 |
| පුරෙක්ඛාර මදෝ | 16 |
| පරිවාර මදෝ | 17 |
| භෝග මදෝ | 17 |
| වණ්ණ මදෝ | 18 |
| සුත මදෝ | 18 |
| පටිභාන මදෝ | 19 |
| රත්තඤ්ඤු මදෝ | 19 |
| පිණ්ඩපාතික මදෝ | 19 |
| අනවඤ්ඤාත මදෝ | 20 |
| ඉරියාපථ මදෝ | 20 |
| ඉද්ධි මදෝ | 20 |
| යසමදෝ | 20 |
| සීල මදෝ | 20 |
| ඣාන මදෝ | 21 |
| සිප්ප මදෝ | 21 |
| ආරෝහ මදෝ | 21 |
| පරිණාහ මදෝ | 21 |
| සණ්ඨාන මදෝ | 21 |
| පාරිපූරි මදෝ | 21 |
| මදෝ | 22 |
| පමාදෝ | 22 |
| ථම්භෝ | 23 |
| සාරම්භෝ | 23 |
| අත්‍රිච්ඡතා | 24 |
| මහිච්ඡතා | 25 |
| පාපිච්ඡතා | 27 |
| සිංගං | 29 |
| තින්තිණං | 30 |
| චාපල්‍යං | 30 |
| අසාගවුත්ති | 30 |
| අරති | 32 |
| තන්දි | 32 |
| විජම්භිතා | 33 |
| භත්ත සම්මදෝ | 33 |
| චේතසො ලීනත්තං | 33 |
| කුහනා | 33 |
| ලපනා | 36 |
| නේමිත්තිකතා | 36 |
| නිප්පේසිකතා | 37 |
| ලාභෙන ලාභං නිජිගිංසනතා | 38 |
| සෙය්‍යො හමස්මීති මානෝ | 38 |
| සදිසො හමස්මීති මානො | 38 |
| හීනෝහමස්මීති මානෝ | 38 |
| සෙය්‍යස්ස සෙය්‍යෝ හමස්මීති මානො | 39 |
| සෙය්‍යස්ස සදිසෝ හම්ස්මීති මානො | 40 |
| සෙය්‍යස්ස හීනෝ හමස්මීති මානො | 40 |
| සදිසස්ස සෙය්‍යෝ හමස්මීති මානො | 40 |
| සදිස්ස සදිසෝ හමස්මීති මානෙ | 41 |
| සදිසස්ස හීනෝ හමස්මීති මානො | 41 |
| හීනස්ස සෙය්‍යෝ හමස්මීති මානො | 41 |
| හීනස්ස සදිසෝ හමස්මීති මානො | 41 |
| හීනස්ස හීනෝ හමස්මීති මානො | 41 |
| මානෝ | 42 |
| අතිමානෝ | 42 |
| මානාතිමානෝ | 42 |
| ඕමානෝ | 42 |
| අධිමානෝ | 43 |
| අස්මිමානෝ | 45 |
| මිච්ඡාමානෝ | 45 |
| ඤාතිවිතක්කෝ | 46 |


Non-commercial distribution

| | පිට |
|---|---|
| ජනපද විතක්කෝ | 46 |
| අමර විතක්කෝ | 46 |
| පරානුද්දයතා පටිසංයුත්තෝ විතක්කෝ | 47 |
| ලාභසක්කාර සිලෝක පටිසංයුත්තෝ විතක්කෝ | 48 |
| අනවඤ්ඤත්ති පටිසංයුත්තෝ විතක්කෝ | 48 |
| **ද්වික වශයෙන් දක්වන ලද ධර්ම** | **49** |
| කෝධ, උපනාහ | 50 |
| මක්ඛ, පලාස | 52 |
| ඉස්සා, මච්ඡරිය | 53 |
| පඤ්ච මච්ඡරිය | 55 |
| මායා, සාඨෙය්‍ය | 57 |
| අවිජ්ජා, භවතණ්හා | 59 |
| භවදිට්ඨි, විභවදිට්ඨි | 65 |
| සස්සත දිට්ඨි, උච්ඡේද දිට්ඨි | 66 |
| අන්තවා දිට්ඨි, අනන්තවා දිට්ඨි | 66 |
| අහිරික, අනොත්තප්ප | 67 |
| දොවචස්සතා, පාපමිත්තතා | 69 |
| අනජ්ජවෝ, අමද්දවෝ | 73 |
| ත්‍රිවිධ වංක | 74 |
| අක්ඛන්ති, අසොරච්චං | 75 |
| අසාඛල්ල, අප්පටිසන්ථාර | 77 |
| ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා | 80 |
| භෝජනේ අමත්තඤ්ඤුතා | 82 |
| මුට්ඨසච්චං, අසම්පජඤ්ඤං | 83 |
| සීලවිපත්ති, දිට්ඨිවිපත්ති | 84 |
| සංයෝජන | 85 |
| **ත්‍රික වශයෙන් දැක්වෙන ධර්ම** | **86** |
| අකුසල මූල | 87 |
| අකුසල විතර්ක | 88 |
| අකුසල සංඥා | 89 |
| අකුසල ධාතු | 89 |
| දුශ්චරිත | 89 |
| ආශ්‍රව | 90 |
| සංයෝජන | 90 |

| | පිට |
|---|---|
| විචිකිච්ඡාව | 93 |
| සීලබ්බත පරාමාස | 95 |
| තණ්හා | 96 |
| ඒසනා | 97 |
| අන්තග්‍රාහික දෘෂ්ටි | 97 |
| විධා | 102 |
| භය | 102 |
| තීණි තමානි | 103 |
| තීණි තිත්ථායතනානි | 104 |
| තිත්ථායතන | 109 |
| කිඤ්චන | 110 |
| අංගන | 110 |
| මල | 110 |
| විසම | 110 |
| ගිනි | 111 |
| කසාව | 114 |
| දිට්ඨි | 115 |
| අරති ආදි | 116 |
| දෝවචස්සතා ආදි | 117 |
| උද්ධච්ච ආදි | 118 |
| අසන්තුට්ඨිතා ආදි | 120 |
| කාමජාතකය | 125 |
| අසම්පජඤ්ඤතා | 126 |
| අහිරික ආදි | 128 |
| අනාදරිය ආදි | 128 |
| අශ්‍රද්ධා ආදි | 129 |
| උද්ධච්ච ආදි | 132 |
| අරියානං අදස්සනා ආදි | 136 |
| මුට්ඨ සච්චං | 140 |
| අයෝනිසෝමනසිකාර ආදි | 142 |
| අපුත්තක සිටු | 144 |
| **චතුෂ්ක වශයෙන් දැක්වෙන ධර්ම** | **146** |
| ආසව | 146 |
| ග්‍රන්ථ | 148 |
| ඕඝ | 149 |
| යෝග | 150 |
| උපාදාන | 150 |
| තණ්හුප්පාද | 151 |
| අගති ගමන | 153 |

*Non-commercial distribution*

| | පිට |
|---|---|
| විපරියේස | 154 |
| අනරිය වෝහාර | 157 |
| දුච්චරිත | 159 |
| භය | 159 |
| දිට්ඨි | 162 |
| **පඤ්චක වශයෙන් දැක්වෙන ධර්ම** | **164** |
| සංයෝජන | 164 |
| මච්ඡරිය | 165 |
| සංග | 165 |
| සල්ල | 166 |
| චේතෝඛිල | 166 |
| චේතසෝ විනිබන්ධ | 168 |
| නීවරණ | 170 |
| අනන්තරිය කම්ම | 174 |
| දිට්ඨි | 177 |
| වේර | 178 |
| ව්‍යසන | 178 |
| අක්ඛන්තියා ආදීනව | 178 |
| පඤ්ච භය | 178 |
| දිට්ඨධම්ම නිබ්බානවාද | 180 |
| **ෂට්ක වශයෙන් දැක්වෙන ධර්ම** | **182** |
| විවාද මූල | 182 |
| ඡන්දරාග | 183 |
| විරෝධවත්ථු | 184 |
| තණ්හාකාය | 185 |
| අගාරව | 185 |
| පරිහානීය ධර්ම | 186 |
| සෝමනස්සුපවිචාරා | 190 |
| දෝමනස්සුපවිචාරා | 191 |
| උපෙක්ඛුපවිචාරා | 191 |
| ගේහසිත සෝමනස්ස | 192 |
| ගේහසිත දෝමනස්ස | 193 |
| ගේහසිත උපෙක්ඛා | 193 |
| දිට්ඨි | 194 |
| **සප්තක නිර්දේශය** | **196** |
| සත්තානුසය | 196 |
| සත්ත සඤ්ඤොජන | 197 |

| | පිට |
|---|---|
| සත්ත පරියුට්ඨාන | 197 |
| සත්ත අසද්ධම්ම | 198 |
| සත්ත දුච්චරිත | 198 |
| සත්ත මාන | 198 |
| සත්ත දිට්ඨි | 199 |
| **අෂ්ටක වශයෙන් දැක්වෙන ධර්ම** | **202** |
| කිලේසවත්ථු | 202 |
| කුසීතවත්ථු | 202 |
| ලෝකධර්ම | 206 |
| අනරිය වෝහාර | 209 |
| මිච්ඡත්ත | 210 |
| පුරිස දෝස | 210 |
| සඤ්ඤීවාද | 212 |
| **නවක වශයෙන් දැක්වෙන ධර්ම** | **214** |
| නව ආඝාතවත්ථු | 214 |
| නව පුරිස මල | 215 |
| නවවිධ මාන | 217 |
| නව තණ්හාමූලක ධර්ම | 217 |
| නව ඉඤ්ජිත | 218 |
| නව මඤ්ඤිත | 219 |
| නව ඵන්දිත | 220 |
| නව පපඤ්චිත | 220 |
| නව සංඛත | 220 |
| **දශක වශයෙන් දැක්වෙන ධර්ම** | **222** |
| දස කිලේස වත්ථු | 222 |
| දස ආඝාත වත්ථු | 227 |
| දස අකුසල කම්ම පථ | 227 |
| දස සංයෝජන | 228 |
| දස මිච්ඡත්ත | 228 |
| දස වත්ථුක මිච්ඡාදිට්ඨි | 229 |
| දස වත්ථුක අන්තග්ගාහිකදිට්ඨි | 229 |
| දෙසැට මිථ්‍යා දෘෂ්ටිය | 231 |
| කෙලෙස් 1500 ගන්නාක්‍රම | 244 |
| ක්ලේශ ප්‍රහාණය | 250 |
| චිත්තෝපක්ලේශ ප්‍රහාණය | 256 |
| අනුක්‍රමණිකාව | 258 |


*Non-commercial distribution*

"සබ්බදානං ධම්මදානං ජිනාති"

## දහම් පොත් මුද්‍රණයට සහාය වූ අභිනව සාමාජිකයෝ

| | | | |
|---|---|---|---|
| රණංජය මිහිරිපැන්න මයා | පිළියන්දල | රු. | 10,000.00 |
| ලිලී සුබසේකර මිය | කුරුණෑගල | රු. | 2,000.00 |

අතික් පොත් හා සසඳන විට කාලීනව අඩු මිලකට මේ පොත් සැපයිය හැකිව ඇත්තේ ධර්මදානමය කුශලයේ වටිනාකම අවබෝධ කරගත් සැදැහැවතුන් නිසාය.

එක් මුද්‍රණයක් විකිණීමෙන් ලැබෙන මුදලත්, ඊළඟ මුද්‍රණයේ මුද්‍රණ වියදමත් අතර පරතරය පියවා ගැනීමට මේ ආධාර උපයෝගී වේ.

ඔබට ද මේ සඳහා සහභාගි විය හැකිය.

*Non-commercial distribution*

# කෙලෙස් එක් දහස් පන්සියය

සවාසනා සකලක්ලේශයන්ගේ ප්‍රහීණත්වයෙන්
පරමවිශුද්ධ චිත්තසන්තානයක් ඇති භාග්‍යවත්
අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට
මාගේ නමස්කාරය වේවා!

සත්ත්වයකුට සිතය කයය කියා කොටස් දෙකක් ඇත්තේ ය. සිත නිසා කයත්, කය නිසා සිතත් පවතී. කයට දැනුමක් නැත. එබැවින් එය කිසි ක්‍රියාවක් නො කරයි. කයින් සිත පහ වුව හොත් එය දරකඩක් සේ තුබූ තැනක නිශ්චල ව තිබී කුණු වී යයි. මරණය කියනුයේ ද කයින් සිත පහ වීමට ය. සකල ක්‍රියාවන්ම සිදු කරන්නේ සිතය. කය ඒ සිතට වාසස්ථානයෙකි. වාහනයකි. ක්‍රියා කිරීමට උපකරණ රැසකි. වඩුවකු කියත් නියන් මිටි ආදි උපකරණවලින් නොයෙක් දේ කරන්නාක් මෙන් සිත ද ශරීරයේ ඇති ඒ ඒ උපකරණ වලින් නොයෙක් ක්‍රියා කරයි. ඇස නමැති උපකරණයෙන් බලයි. කන නමැති උපකරණයෙන් අසයි. නාසය නමැති උපකරණයෙන් සුවඳ දුගඳ දැන ගනී. දිව නමැති උපකරණයෙන් රස විඳී. කය නමැති උපකරණයෙන් පහස විඳී. මුව නමැති උපකරණයෙන් කථා කරයි. ආහාර වළඳයි. පා නමැති උපකරණයෙන් ගමන් කරයි. අත නමැති උපකරණයෙන් නොයෙක් ක්‍රියාවන් කරයි. මරණින් පසු ශරීරය විනාශ වන නුමුත් ඒ ශරීරය ඇසුරු කොට පැවති චිත්ත පරම්පරාව නො නැසේ. එක් ශරීරයකින් ඉවත් වූ චිත්ත පරම්පරාව අන් සිරුරකට ආරූඪ වී

*Non-commercial distribution*

පවතී. එයත් නැසුණු කල්හි අන් සිරුරකට ආරූඪ වේ. මෙසේ නිවනට පැමිණීම දක්වා චිත්ත පරම්පරාව නො සිඳී පවතී. මිනිසකු මැරී දෙව්ලොව උපදනා කල්හි මිනිස් ශරීරයෙන් කිසිවක් දෙව්ලොවට නො යයි. මළ මිනිසා ය, දෙවියා ය යන දෙදෙනා එක් පුද්ගලයෙකු වන්නේ දෙවියාගේ ශරීරයේ පවත්නා සිත මිනිස් සිරුරෙහි වූ චිත්ත පරම්පරාවට ම අයත් වන බැවිනි. මිනිසකු මැරී ප්‍රේත ව උපන් කල්හි ඒ දෙදෙනා එක් පුද්ගලයකු වන්නේ මිනිසාගේ සිත් පරම්පරාව ම ප්‍රේත ශරීරයට පැමිණීම නිසා ය. කය සේ ම සිතත් මරණයෙන් සිඳී යන්නේ නම් පුනර්භවයක් නො ලැබේ. කුශලාකුශල කර්මයන් කරන්නේ ද සිතිනි. ඒවා විපාක දෙන්නේ ද කර්මයන් කළ සිත් පරම්පරාවේ පැවැත්ම නිසා ය. මේ කරුණු අනුව සිත ම සත්ත්වයකුගේ ප්‍රධාන කොට්ඨාසය බව කිය යුතු ය. බුදුන් වහන්සේ විසින් ද මෙසේ වදාරා ඇත්තේ ය.

**චිත්තේන නීයති ලෝකෝ - චිත්තේන පරිකස්සති**
**චිත්තස්ස ඒකධම්මස්ස - සබ්බේව වසමන්වගූ**

(දේවතා සංයුත්ත)

'සත්ත්වයා සිතින් ඒ ඒ භවයට ඒ ඒ තත්ත්වයට ගෙන යනු ලැබේ. සිතින් ඒ මේ අත අදිනු ලැබේ. එක ධර්මයක් වූ සිතෙහි වසයට සියලු සත්ත්වයෝ ම ගියෝ ය' යනු එහි තේරුම ය.

සත්ත්වයනට සුවදුක් ලැබෙන්නේ ඔවුන්ගේ සිත් පැවති ආකාරයේ සැටියට ය. එබැවින් සැප කැමති, දුක් නො කැමති සෑම දෙනා විසින් ම සිත ගැන දැනුමක් ඇති කර ගත යුතුය. සිත පාලනය කර ගත යුතු ය.

**"පභස්සරමිදං භික්ඛවේ චිත්තං"** යි වදරා ඇති පරිදි සත්ත්වයාගේ සිත ප්‍රකෘතියෙන් පිරිසිදු ය. මඩ දැලි කෙළ සෙම් සොටු මල මූත්‍ර ආදිය එක් වීමෙන් ශුද්ධ ජලය අපවිත්‍ර වන්නාක් මෙන් රාගාදි පාප ධර්මයන් එකතු වීමෙන් පිරිසිදු සිත කිලිටි වේ. කුණු වේ. සිත කිලිටි වූ කල්හි ඒ පුද්ගලයා හට තමාට විය හැකි අර්ථානර්ථයන් නො දැනෙන්නේ ය. අනුන්ට විය හැකි අර්ථානර්ථයන් ද නො දැනෙන්නේ ය. කළ යුත්ත නො කළ යුත්ත

Non-commercial distribution

නො දැනෙන්නේ ය. කිලිටි වූ සිතෙන් කිසි කලෙක යහපතක් සිදු නො කෙරේ. කෙරෙතොත් කෙරෙන්නේ තමාට හා අන්‍යයන්ට නපුරක් වන දෙයක් පමණෙකි. කිලිටි නො වන පරිදි සිත ආරක්ෂා කර නො ගත් පුද්ගලයෝ දුකින් දුකට ම පත් වෙති. එබැවින් මහාකාරුණික වූ භාග්‍යවතුන් වහන්සේ විසින් සිත ආරක්ෂා කර ගැනීම සඳහා බොහෝ අනුශාසනයන් කර ඇත්තේ ය. අනේකාකාරයෙන් නොයෙක් උපමා දක්වමින් අනුශාසනා කර ඇත්තේ ය. ඉන් කීපයක් මෙසේ යː–

**දිසො දිසං යත්තං කයිරා - වෙරිවා පන වෙරිනං**
**මිච්ජා පණිහිතං චිත්තං - පාපියොනං තතො කරෙ.**

අනුන්ගේ වස්තුව පැහැර ගන්නා සොරෙක් ඔහුගේ වස්තුව පැහැර ගන්නා සොරකු හමු වූ විට, ඒ සොරාට යම් බඳු නපුරක් කෙරේ ද, තමාට අනර්ථ කරන සතුරකු මුණ ගැසුණු තැනැත්තකු විසින් ඒ සතුරාට යම්බඳු නපුරක් කෙරේ ද, එයට වඩා මහත් නපුරක් නො මනා සිත් ඇති පුද්ගලයාට ඒ සිත කරන්නේ ය.

**න තං මාතාපිතා කයිරා - අඤ්ඤෙ වා පිච ඤාතකා**
**සම්මා පණිහිතං චිත්තං - සෙය්‍යසො නං තතො කරෙ**

(ධම්මපද චිත්තවග්ග)

පුද්ගලයකුට කිළිටි වන්නට නො දී මනා කොට තබා ගන්නා ලද සිත යම් යහපතක් සිදු කෙරේ ද එපමණ යහපතක් ඔහුට මා-පියෝ ද නෑයෝ ද නො කරන්නාහ. කිරීමට සමත් නො වන්නා හ.

**සමතිත්තිකං අනවසෙසකං**
**තෙලපත්තං යථා පරිහරෙය්‍ය.**
**එවං සචිත්ත මනුරක්ඛෙ**
**පත්ථයානො දිසං අගත පුබ්බං**

(ජාතික පාළි)

මුවවිට දක්වා තෙල් පිරවූ පාත්‍රයක් තෙල් නො ඉසිරෙන සේ සිහියෙන් ගෙන යන්නාක් මෙන් කිසි කලෙක නො ගිය තැන වූ නිවනට යනු කැමති තැනැත්තේ තමාගේ සිත කිලිටි නො වන සේ සිහියෙන් ආරක්ෂා කරගන්නේ ය.

Non-commercial distribution

සිත කිලිටි කරන නරක් කරන තවන අකුශල පාක්ෂික චෛතසික ධර්මයෝ **කිලේස** නම් වෙති. **කෙලෙස්**, **ක්ලේශ** යන මේවා ද ඒවාට කියන නම් ය. එක්දහස් පන්සියයක් ලෙස ගණන් ගෙන ඇති කෙලෙස් සියල්ල විභාග වශයෙන් දක්වා ඇති යම්කිසි එක් සූත්‍රධර්මයක් නැත්තේ ය. එබැවින් කෙලෙසුන්ගේ ගණන අඩුවැඩි නැති ව හරියට ම දැක්වීම අපහසු ය. එක්දහස් පන්සියය යන මේ ගණන සාමාන්‍ය ගණනෙකි. සිත කිලිටි කරන ධර්ම සියල්ල තථාගතයන් වහන්සේ විසින් දේශනය කර ඇත්තේ ක්ලේශ යන නාමයෙන් ම නොවේ. **උපක්කිලේස කිලේස අංගණ චේතොඛිල ආසව ඔඝ යෝග නීවරණාදි** නොයෙක් නම් වලින් සූත්‍ර පිටකයෙහි හා අභිධර්ම පිටකයෙහි නොයෙක් තැන්වල නොයෙක් සූත්‍රවල සිත කිලිටි කරන ධර්ම, දේශනය කර ඇත්තේ ය. එක් දහස් පන්සියය යන ගණන කියන්නේ ඒවා ක්ලේශ යන නමින් එකතු කර ගැනීමෙනි. ආචාර්‍ය්‍යවරයන් විසින් කෙලෙස් එක්දහස් පන්සියය දක්වන ක්‍රම කීපයක් ඇත්තේ ය. අභිධර්මපිටකයේ ඛුද්දකවත්ථුවිභංගයේ හා බ්‍රහ්මජාලසූත්‍රයෙහි දැක්වෙන කරුණු අනුව කෙලෙස් එක්දහස් පන්සියය දැක්වීම ඉන් එක් ක්‍රමයෙකි. මේ ග්‍රන්ථයෙහි කෙලෙස් එක්දහස් පන්සියය විස්තර කරන්නේ ද ඒ ක්‍රමයෙනි.

ලෝකෝත්තර මාර්ගයෙන් මතු කිසිකලෙක නැගී නො එන පරිදි කෙලෙසුන් සහමුලින් ම නසා නැති පෘථග්ජන පුද්ගලයන් තුළ මේ කෙලෙස් එක් දහස් පන්සියය ම යටපත් වී පවත්නේය. එහෙත් පෘථග්ජන චිත්තය නිරන්තරයෙන් ම කිලිටි වී පවත්නේ නො වේ. සිත කිලිටි වන්නේ යටපත් වී ඇති කෙලෙසුන්ගෙන් යම්කිසිවක් නැගී ආ විට ය.

අලු යට ගිනි අඟුරු ලෙසින්, ඇති බව නො දැනෙන පරිදි යටපත්ව පවත්නා අවස්ථාව ය, ඇති බව දැනෙන පරිදි මතුවී පවත්නා අවස්ථාවය, ක්‍රියා කරන අවස්ථාවයයි **කෙලෙසුන්ගේ අවස්ථා තුනක්** ඇත්තේ ය. රාගාදි කෙලෙසුන් ඇතිවීමට හේතු වන රූපාදි ආරම්මණයන් ලද කල්හි ඒ කෙලෙසුන් ඇති වන්නේ ඒවා ඒ පුද්ගලයාගේ සන්තානයෙහි යටපත් ව තිබීම නිසා ය. අනාගාමී

Non-commercial distribution

මාර්ගයෙන් කාමරාගය සම්පූර්ණයෙන් ම නැති කරනු ලැබේ. එබැවින් අනාගාමී අර්හත් පුද්ගලයන්ගේ සන්තානවල යටපත්ව පවතින කාමරාගයක් නැත. කාමරාගයට ආහාරය වන ස්ත්‍රී රූපයක් දැකීමෙන් හෝ ශෝභන තරුණියක හා කථා කිරීමෙන් හෝ එක් ව විසීමෙන් හෝ එක් ව ශයනය කිරීමෙන් හෝ අනාගාමී අර්හත් පුද්ගලයන්ට කාම රාගයක් ඇති නො වන්නේය. එයට හේතුව ඒ පුද්ගලයන් තුළ යටපත්ව පවතින කාම රාගයක් නැතිබව ය. පෘථග්ජන පුද්ගලයන්ට වනාහි ලස්සන තරුණියක් ගැන ඇසූ පමණින් වුව ද කාම රාගය ඇති වේ. එයට හේතුව ඔවුන් තුළ කාම රාගය නමැති ක්ලේශය යටපත් ව තිබීමය. ධර්ම විභාග නොදත් පුද්ගලයෝ තමන් තුළ කෙලෙස් ඇති වුව ද ඒ ඇති වුන දේවල් කෙලෙසුන් බව නො දනිති. ශෝභන තරුණිය දුටු තරුණයා කෙරෙහි තරුණිය ගැන ආදරයක් ඇති වේ. ඇය නැවත නැවත දැකීමේ ආශාවක්, ඇය හා කථා කිරීමේ ආශාවක්, ඇගේ සිත් ගැනීමේ ආශාවක් ඇයට සංග්‍රහ කිරීමේ ආශාවක් ඇති වේ. තරුණයා තුළ ඇතිවන ඒ ආදරය හා ආශා රාශිය කාමරාගය නමැති ක්ලේශය ය. ස්ත්‍රී රූපයේ නිසරු බව සැලකීමෙන් හෝ රාගයේ ආදීනවය සැලකීමෙන් හෝ අන් වැඩක යෙදීමෙන් හෝ ඒ නැගී සිටි කාමරාගය නමැති ක්ලේශය යටපත් නො කළහොත් එය වැඩී ක්‍රියාකාරී භාවයට පැමිණෙන්නේය. ඔහු දුටු තරුණිය වෙත යන්නේ ය. ඇය හා කථා කරන්නේය. එයට විරුද්ධ වන අය හා කලහ කරන්නේය. ඇය සතුටු කරවීම සඳහා ප්‍රාණවධාදි නොයෙක් පව්කම් ද කරන්නේ ය. ඒ කාමරාගය නමැති ක්ලේශයේ කියා කරන අවස්ථාව ය. කියන ලද ක්‍රමයෙන් සියලු කෙලෙසුන්ගේ ම අවස්ථා තුන තේරුම් ගත යුතුය. පත්ළෙහි මඩ ඇති ළිඳේ ජලය නො කැළඹෙන තෙක් පිරිසිදු ය. එමෙන් එක් දහස් පන්සියයක් කෙලෙසුන් සිතෙහි යටපත් වී ඇත ද ඒවායින් කවරක් හෝ නැඟී එන තුරු සිත පිරිසිදුය. සිත අපිරිසිදු වන්නේ නැගී සිටියාවූ ද ක්‍රියාකාරීත්වයට පැමිණියා වූ ද කෙලෙසුන්ගෙනි. කෙලෙස් යටපත් වී පවත්නා තෙක් පුද්ගලයාගෙන් පාපයක් නො කෙරේ. සියලු ම පව් කෙරෙන්නේ නැගී සිටියා වූ කෙලෙසුන් නිසාය. බොහෝ පින් ඇති පුද්ගලයකු වුව ද මරණාසන්න කාලයේ කෙලෙසුන්ගෙන් දූෂිත වූ සිතින් චිුතවහොත් ඔහු පින් ඇත ද නරකයෙහි උපදනා බව-

Non-commercial distribution

**"චේතොපදෙස හෙතු පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති"**

(අංගුත්තර ඒකකනිපාත)

යනුවෙන් වදරා ඇත්තේ ය. කෙලෙසුන් ගෙන් සිත දූෂිතවීම ඉමහත් නපුරක් බැවින් එසේ නො වන පරිදි පරෙස්සම් විය යුතු ය. පරෙස්සම් වීම නම් බුදුන් වහන්සේ විසින් දේශිත ධර්මය සේවනය කිරීම හා සිහියෙන් යුක්තව විසීමය. එසේ වාසය කරන සත්පුරුෂයන්ගේ සිත්වල කෙලෙස් නැග සිටීම අඩුය. පෘථග්ජන පුද්ගලයාට සැම කල්හි ම සිහියෙන් යුක්ත විය නො හෙන බැවින්, ගිහිගෙය හැර පැවිදිව වනගත ව මහණදම් පුරන පින්වතුන් තුළ ද සමහර විට කෙලෙස් මතු වේ. එසේ මතු වන්නා වූ කෙලෙසුන් ඒ පින්වත්හු වහා සන්සිඳවා ගනිති. ඒ ජාතියෙහිදී ම රහත්වීමේ බලාපොරොත්තුවෙන් අතීතයේ මහණදම් පිරූ ඇතැම් භික්ෂූන් ගමනෙහිදී උපන් ක්ලේශය ගමනෙහිදී ම ද, සිටීමේදී උපන් ක්ලේශය සිටීමේදී ම ද, හිඳීමෙහි දී උපන් ක්ලේශය හිඳීමෙහිදී ම ද, ශයනයෙහිදී උපන් ක්ලේශය ශයනයෙහිදී ම ද සන්සිඳුවා ගනිමින් මහණ දම් පිරූ බව දහම් පොත් වල සඳහන් ව ඇත්තේය. සාමාන්‍ය ජනයාගේ සිත් නිතරම පවතින්නේ කෙලෙසුන් ගෙන් දූෂිතව ය. කෙලෙසුන් නො හඳුනන බැවින් ඔවුහු ඒ බව නො දනිති. එබැවින් ඔවුහු උපන් ක්ලේශය සන්සිඳවීමට උත්සාහ නො කෙරෙති. කෙලෙසුන් නැඟී නො එන ලෙස විසිය හැකි වීමට හා උපන් ක්ලේශය දුරු කර ගත හැකි වීමට කෙලෙසුන් හැඳින ගත යුතුය.

## කෙලෙස් එක් දහස් පන්සියය සැකෙවින් දැක්වීම

විභංගප්‍රකරණයේ ඛුද්දකවත්ථු විභංගයේ:–

| | | |
|---|---|---|
| එක බැගින් දැක්වෙන | ධර්ම | 73 |
| දුක වශයෙන් දැක්වෙන | " | 36 |
| ත්‍රික වශයෙන් දැක්වෙන | " | 105 |
| චතුෂ්ක වශයෙන් දැක්වෙන | " | 56 |
| පඤ්චක වශයෙන් දැක්වෙන | " | 75 |
| ෂට්ක වශයෙන් දැක්වෙන | " | 84 |

Non-commercial distribution

| | | |
|---|---|---|
| සප්තක වශයෙන් දැක්වෙන | ” | 49 |
| අෂ්ටක වශයෙන් දැක්වෙන | ” | 64 |
| නවක වශයෙන් දැක්වෙන | ” | 81 |
| දශක වශයෙන් දැක්වෙන | ” | 70 |
| බ්‍රහ්මජාල සූත්‍රයෙහි දැක්වෙන දෘෂ්ටි | | 62 |
| | එකතුව | 755 |

මේ ධර්ම සත්සිය පස්පනස උත්පන්න අනුත්පන්න භේදයෙන් ගන්නා කල්හි එක්දහස් පන්සිය දසයක් වේ. නොයෙක් නම් වලින් දේශනය කර ඇත්තා වූ ඒ සියල්ලෝ ම සිත කිලිටි කරන ධර්මයෝ ය. අධික වූ දශය ගණනට නො ගෙන ඒ ධර්ම සමූහයට කෙලෙස් එක්දහස් පන්සියය යි කියනු ලැබේ. මේ **ධර්මසංගණී මූලටීකාවේ** දක්වා ඇති ක්‍රමය ය.

## එක බැගින් දැක්වෙන ධර්ම තෙ සැත්තෑව

ජාතිමදෝ, ගොත්තමදෝ, ආරෝග්‍යමදෝ, යොබ්බනමදෝ, ජීවිතමදෝ, ලාහමදෝ, සක්කාරමදෝ, ගරුකාරමදෝ, පුරෙක්ඛාරමදෝ, පරිවාරමදෝ, හෝගමදෝ, වණ්ණමදෝ, සුතමදෝ, පටිහාණමදෝ, රත්තඤ්ඤුමදෝ, පිණ්ඩපාතිකමදෝ, අනවඤ්ඤාතමදෝ, ඉරියාපථමදෝ, ඉද්ධිමතෝ, යසමදෝ, සීලමදෝ, ඣානමදෝ, සිප්පමදෝ, ආරෝහමදෝ, පරිණාහමදෝ, සණ්ඨානමදෝ, පාරිපූරිමදෝ, මදෝ, පමාදෝ, ථම්හෝ, සාරම්හෝ, අත්‍රිච්ඡතා, මහිච්ඡතා, පාපිච්ඡතා, සිංගං, තින්තිනං, චාපල්‍යං, අසභාගවුත්ති, අරති, තන්දි, විජම්හිතා, හත්තසම්මදෝ, චේතසෝලීනත්තං, කුහනා, ලපනා, නේමිත්තිකතා, නිප්පේසිකතා, ලාහෙන ලාහං නිජිගිංසනතා, සෙය්‍යෝහමස්මීති මානෝ, සදිසෝ හමස්මීති මානෝ, හීනෝහමස්මීති මානෝ, සෙය්‍යස්ස සෙය්‍යෝහමස්මීති මානෝ, සෙය්‍යස්ස සදිසෝහමස්මීති මානෝ, සෙය්‍යස්ස හීනෝහමස්මීති මානෝ, සදිසස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ, සදිසස්ස සදිසෝ හමස්මීති මානෝ, සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙයොහමස්මීති මානෝ, හීනස්ස හීනෝහමස්මීති මානෝ, මානෝ, අතිමානෝ, මානාතිමානෝ, ඕමානෝ, අධිමානෝ, අස්මිමානෝ, මිච්ඡාමානෝ, ඤාතිවිතක්කෝ, ජනපද විතක්කෝ, අමරවිතක්කෝ,

Non-commercial distribution

පරානුද්දයතා පටිසංයුත්තො විතක්කො, ලාභසක්කාරසිලෝක පටිසංයුත්තො විතක්කො, අනවඤ්ඤත්ති පටිසංයුත්තො විතක්කො, එකකං,

(ඛුද්දකවත්ථු විභංග)

## 1. ජාතිමදෝ 2. ගොත්තමදෝ

අධික ව මත්පැන් පානය කළ අයට ඇත්ත නැත්ත නො දැනෙන, කළ යුත්ත නො කළ යුත්ත නොදැනෙන, ගරු කළ යුත්තන් කීකරු විය යුත්තන් නො දැනෙන, තමා ම ලෝකයේ ශ්‍රේෂ්ඨයා ය, සපනාය උගතාය නැණවතා ය කියා හැඟෙන මහා සම්මෝහයෙන් යුත් උඩඟුවක් ඇති වේ. එයට **මත**යයි ද කියනු ලැබේ. සුරා මදය දිගු කලක් නො පවතී. පැය ගණනකින් සන්සිඳේ. ලෙහෙසියෙන් නො සන්සිඳෙන බැවින් ද බොහෝ කල් පවත්නා බැවින් ද සුරා මදයට වඩා නපුරු වඩා අනර්ථකර **මද සත්විස්සක්** ඇත්තේ ය. මේ කෙලෙස් ලැයිස්තුවේ මුලින් ම දැක්වෙන්නේ ඒ මද සත්විස්සය.

මනුෂ්‍යයෝ සිංහල දෙමළ මුස්ලිම් බුරුම සියම් චීන ජපන් යනාදි නම්වලින් ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි නම් වලින් ද කොටස් වලට බෙදී සිටිති. ඒ කොටස් **ජාති** නම් වේ. එක් එක් ජාතියක් ද තවත් නොයෙක් නම් වලින් කුඩා කොටස් වලට බෙදී සිටී. ඒ කොටස් **ගෝත්‍ර** නම් වේ. ඇතැම් ජාතියක් ඇතැම් ගෝත්‍රයක් උසස් කියා ද ඇතැම් ජාතියක් ගෝත්‍රයක් පහත් ය කියා ද සම්මුති ඇත්තේ ය. තමන්ගේ ජාතිය ගෝත්‍රය උසස් යයි පිළිගන්නා අයට ඒ නිසා **සෙය්‍යමානය** ද පහත් යයි පිළිගන්නා අයට **හීනමානය** ද ඇති වේ.

ජාතියෙන් කුලයෙන් ගෝත්‍රයෙන් තමා උසස් ය කියා ඇති වන මානය මෝහයේ සහාය ලැබීමෙන් ක්‍රමයෙන් දියුණු වේ. මම උසස් ජාතියක උසස් කුලයක කෙනෙක් වෙමි, මම උසස් කෙනෙක් වෙමි, සෙස්සෝ පහත් අය ය, මා ඔවුන්ගෙන් වෙන් ව විසිය යුතුය, ඔවුන් හා එක් ව කටයුතු නො කළ යුතුය, ඔවුන්ගේ වැඩවලට මා සහභාගි නො විය යුතුය, ඔවුන් මට ගරු කළ යුතුය. සැලකිලි කළ යුතුය. කීකරු විය යුතුය යන සම්මෝහයෙන් යුක්ත ව දියුණු

Non-commercial distribution

වූ මහත් වූ බලවත් වූ මානය **ජාති මද** නම් වේ. ගෝත්‍රය නිසා එසේ ඇතිවන මානය **ගෝත්‍රමද** නම් වේ. මේ මදය එක්තරා සියුම් උමතු බවෙකි.

**මේ ජාති කුල ගෝත්‍ර මදවලින් මත් වී සිටින අය බෙහෙවින් ඇත්තේ ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ය. එය මේ දෙරටට බලවත් පිරිහීමේ හේතුවක් ව ඇත්තේ ය.** ජාතිමද ගෝත්‍රමද නිසා කෙනෙක් තමා උසස්ය, සෙස්සෝ පහත් යයි සිතා ගෙන සිටියාට සෙස්සෝ එය නො පිළිගනිති. තමා පහත් යයි කීමට කැමති වන කෙනෙක් ද නැත. එබැවින් සෙසු අය තමා උසස් ය කියා ගෙන සිටින තැනැත්තාට සතුරුය. ඔහුට කිසි කරුණකට සෙස්සන්ගේ සහයෝගය නො ලැබේ. සෙස්සන් ඒ උසස් කම නො පිළිගන්නේ නම් උසස්ය කියා තමා ගැන තමා සිතා ගෙන සිටීමෙන් ඇති යහපතක් නැත. එයින් ඇත්තේ තමා අප්‍රිය කරන සතුරු පිරිසක් ඇති වීම පමණකි. ඇතැම්හු ජාතිමද ගෝත්‍රමදයන් නිසා තුමූ නිර්ධනව සිට පෙහොසතුන් අනුකරණය කරන්නට ගොස් රටට ණය වී තමන්ගේ නිවහනට පවා අහිමි වී පරම දරිද්‍ර භාවයට පත් වෙති. ඇතැම්හු මේවා අප විසින් නො කළ යුතු, පහත් අය විසින් කළ යුතු වැඩ යයි තමන් විසින් කළ යුතු වැඩ ද නො කර හැර දිළිඳු බවට පත් වෙති. ඇතැම්හු ගරු බුහුමන් කළ යුතු ගුණවතුන්ට අගෞරව කොට අවමන් කොට මරණින් පසු අපායට ද යෙති. උම්මත්තකයා තමාගේ උමතු බව නොපිළිගන්නාක් මෙන් මදය ඇති තැනැත්තා ද තමා මත් වී ඇති බව නො පිළිගනී. එබැවින් මේ මදය නමැති ක්ලේශය දුරු කරවීම දුෂ්කර ය. එය දුරු වන්නේ සත්‍යය වැටහීමෙනි. එය දුරු කරවීමට දිය යුතු බෙහෙත සත්‍යය අවබෝධ කරවීමය. ජාතිගෝත්‍ර වශයෙන් කියන ඒ ඒ අයගේ උසස් පහත් බවෙහි සත්‍යාසත්‍ය භාවය සෙවිය යුතුය. රන් කාසිය රිදී කාසි තඹ කාසි වලට වඩා උසස් ය. එය සැම දෙන ම පිළිගනිති. එබැවින් එය සත්‍යයෙකි. අන් සැමට ම වඩා ජාතියෙන් බමුණන් උසස්ය යනු ඔවුන්ගේ පිළිගැනීමය. එබැවින් ඇතැම් බමුණෝ බුදුරදුන්ගෙන් පවා ගරු බුහුමන් බලාපොරොත්තු වූහ. ඇතැම්හු ඔවුන්ගේ උසස් බව බුදුරදුන්ටත් පිළිගැන්වීමට උන් වහන්සේ ලවා අනුමත කරවා ගැනීම සඳහා වාදයට ද ආහ. තුමූ අන් හැමට ම වඩා ජාතියෙන් උසස් ය යි බමුණෝ පිළිගනිති.

Non-commercial distribution

බහුතර සංඛ්‍යාවක් වන සෙස්සෝ එය නො පිළිගනිති. බමුණන්ගේ උසස් බවත් රන්පවුමේ උසස් බව මෙන් සැම දෙනාම පිළිගන්නේ නම් එය සත්‍යයක් විය හැකිය. ලෝකයේ වැඩි ජනකායක් නො පිළිගන්නා බැවින් එය සත්‍යයක් නො විය හැකිය. මේ රටේ ද ඇතැම් කුල ගෝත්‍රවල අය කුලය ගෝත්‍රය නිසා තුමූ උසස් යයි සිතා ගෙන සිටිති. ඒ උසස් කම ඒ කුලයේ ඒ ගෝත්‍රයේ අය මිස සෙස්සෝ නො පිළිගනිති. නො පිළිගන්නෝ ම ඉතා බොහෝය. එබැවින් එහි සත්‍යයක් නැති බව කිව යුතුය. බ්‍රාහ්මණයා උපදින්නේත් රාජකුමාරයා උපදින්නේත් රදලයා උපදින්නේත් රොඩියා උපදින්නේත් අපවිත්‍ර දෙයින් පිරුණු පරම දුර්ගන්ධයෙන් යුක්ත ස්ත්‍රියකගේ කුසය නමැති අපවිත්‍ර ස්ථානයක ය. උත්පත්තිස්ථානය අනුව ඒ සතර දෙනාගේ වෙනසක් නැත. ඉදින් උසස් ය කියන බ්‍රාහ්මණාදීන් පියුමක හෝ රන් කරඬුවක හෝ රිදීකරඬුවක හෝ සඳුන් කරඬුවක හෝ උපදින්නේ නම් ඔවුන්ගේ වෙනසක් ඇත. සැම දෙන ම ගැහැණුන්ගේ කුස වල ම උපදනා බැවින් උත්පත්තියෙන් ඔවුන්ගේ වෙනසක් නැත. සැඩොල් ගැහැණියකගේ කුසයට වඩා අමුතු පිරිසිදු බවක් බැමිණියගේ කුසයේ හෝ රැජිනගේ කුසයෙහි නැත. ඒ එක් අයකුගේවත් ශරීරයේ චන්දනාදී සුගන්ධ ද්‍රව්‍යයක් හෝ රන් රිදී ආදි වටිනා දෙයක් හෝ නැත. සැම දෙනාගේම ශරීර සෑදී ඇත්තේ කේශාදි කුණප කොට්ඨාසයන්ගෙනි. චණ්ඩාලයාගේ ශරීරයෙන් ද, දහඩිය, කෙළ, සෙම, සොටු මලමූත්‍ර ගලන්නේය. බමුණාගේ, රජුගේ සිරුරෙන් ද ඒවා ම ගලන්නේ ය. කුලවතාගේ ශරීරයෙන් ගලන දහඩිය ආදියෙහි අමුතු සුවඳක් නැත. චණ්ඩාලයාටත් ඇසක් ඇත. බමුණාටත් ඇසක් ඇත. කුලයේ අනුහසින් චණ්ඩාලයාගේ ඇසේ පෙනීමට වැඩි පෙනීමක් බමුණාගේ ඇසෙහි නැත. බමුණාගේ කණට ඇසෙන සියල්ල චණ්ඩාලයාගේ කනටත් ඇසෙන්නේය. බමුණාගේ අත් පා වලින් කළ හැකි සියල්ල චණ්ඩාලයාගේ අත් පා වලින් ද කළ හැකිය. බමුණාටත් පින් පව් දෙක ම කළ හැකිය. චණ්ඩාලයාටත් පින් පව් දෙක ම කළ හැකි ය. පව් කළ බමුණා කුලයේ බලයෙන් අපායට නොයන්නේ නොවේ. පින් කළ චණ්ඩාලයාට ස්වර්ගයට යාමට කුලය නිසා බාධාවක් ද නැත. බුදුන් වහන්සේ ජාති කුල ගෝත්‍ර අනුව මිනිසුන්ගේ උසස් පහත් බව නො පිළිගන්නාහ. බුදු සස්නෙහි සැමට ම පැවිද්ද ලැබිය

Non-commercial distribution

හැකිය. උපසම්පදව ලැබිය හැකිය. ධ්‍යානාභිඥා මාර්ග ඵල ලැබිය හැකි ය. කරුණු මෙසේ හෙයින් ජාති කුල ගෝත්‍ර අනුව මිනිසුන්ගේ උසස් පහත් බවක් නැති බව කිය යුතුය.

**න ජච්චා වසලෝ හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො**
**කම්මනා වසලෝ හොති - කම්මනා හොති බ්‍රාහ්මණො**

(වසල සුත්ත )

ජාතිය නිසා වසලයෙක් පහත් පුද්ගලයෙක් නොවේ. ජාතිය නිසා බ්‍රාහ්මණයෙක් උසස් පුද්ගලයෙක් ද නොවේ. ඒ ඒ තැනැත්තාගේ ක්‍රියා අනුව ම පහත් පුද්ගලයෙක් වේ. උසස් පුද්ගලයෙක්ද වේ.

## 3. ආරෝග්‍යමදෝ

නිරෝගී භාවය නිසා ඇති වන මත, උඩඟු බව **ආරෝග්‍යමද** නම් වේ. මේ මිනිස් ලොව සම්පූර්ණයෙන් නිරෝගී පුද්ගලයෙක් නැත. ඇතුන් දහසක බල ඇති බුද්ධ ශරීරයේ ද නොයෙක් රෝග හට ගත්තේ ය. සෙස්සන් ගැන කියනුම කිම? ශරීරය රෝග හට ගන්නා ස්ථානය ය. ජලය ඇති තැන මඩුන් ඇති වන්නාක් මෙන් ශරීරයක් ඇතොත් රෝග හට ගන්නේ ය. එබැවින් **නකුලපිතු** නම් ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ.

**"ආතුරොහයං ගහපති කායො අණ්ඩභූතො පරියොනද්ධො. යො හි ගහපති ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරෝග්‍යං පටිජානෙය්‍ය. කිමඤ්ඤත්‍ර බාලය්‍යා?"**

( සංයුක්ත නිකාය ඛන්ධවග්ග )

ගෘහපතිය, මේ කය රන් පැහැ ඇතියක් වුවද නිතර අපවිත්‍ර දෑ උතුරන වැගිරෙන එකක් බැවින් ආතුර ය. දුබල බැවින් බිජුවටක් බඳුය. දුබල සමකින් වැසී ඇතියක. ගෘහපතිය, යමකු මේ කය පරිහරණය කරමින් මොහොතකට හෝ නිරෝගී බව පවසනවා නම් එය මෝඩ කම මිස අන් කුමක් ද? යනු එහි තේරුම ය.

සාගින්නත් රෝගයකි. පිපාසයත් රෝගයකි. ශරීරයෙන් දහඩිය කෙළ සෙම් සොටු මලමුත්‍ර ගැලීමත් රෝගයකි. එක් ඉරියව්වකින් වැඩි වේලාවක් සිටීතහොත් වේදනා හට ගැනීමත්

Non-commercial distribution

රෝගයකි. මේ රෝග කාහටත් නිරන්තරයෙන් ඇත්තේ ය. සෙම්ප්‍රතිශ්‍යාව කැස්ස උණ වමනය විරේචනය පීනස අර්ශස කුෂ්ටය පිළිකාව යනාදි රෝග ස්ථිර වශයෙන් නො වැළඳෙන ශරීරයක් නැත. ඇතැම්හු රෝග බහුලයෝය. ඇතැමුන්ට රෝග මඳය. ධර්මයෙන් ඈත්ව වාසය කරන්නා වූ ඇතැමුන්ට නිතර රෝග වලින් පෙළෙන අය දුටු විට තුමූ නිරෝගීය කියා රෝගීන් පහත් කොටත් තමන් උසස් කොටත් ගන්නා මානයක් ඇති වේ. එය දියුණු වීමෙන් ආරෝග්‍යමදය නමැති මත ඇති වේ. එහි ආදීනවය තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදරා ඇත්තේ ය.

**"ආරෝග්‍යමද මත්තෝ වා භික්ඛවේ, අස්සුතවා පුථුජ්ජනෝ කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති. මනසා දුච්චරිතං චරති. සෝ කායේන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භේද පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති."**

( අංගුත්තර නිකාය තික නිපාත )

"මහණෙනි, ආරෝග්‍ය මදයෙන් මත් වූ නූගත් පෘථග්ජන තෙමේ කයින් ද පව් කරයි. වචනයෙන් ද පව් කරයි. සිතින් ද පව් කරයි. හෙතෙමේ පව් කොට මරණින් මතු සැපයෙන් පහ වූ අපායෙහි උපදීය" යනු එහි අදහසයි.

ආරෝග්‍ය මදයෙන් මත් වූ ඇතැම්හු අන්‍යයන්ට ලෙඩ හැදුනාට අපට සෑදෙන්නේ නැත කියා ශරීරයට අහිත දේ කා බී, පමණ ඉක්මවා ඇතැම් ක්‍රියා කොට නුසුදුසු සේ හැසිර රෝග සාද ගනිති. එය ද ආරෝග්‍ය මදයෙන් වන එක් අන්තරායකි.

## 4. යොබ්බනමදෝ

ජරාව එක්තරා සංවේග වස්තුවකි. එහෙත් නුවණ මඳ තරුණයන්ට මහල්ලන් දුටු විට ඔවුන් දුබලයන් කොට මෝඩයන් කොට පහත් කොට පිළිකුල් කොට සලකන තමා උසස් කොට ගන්නා මානය ඇති වේ. කළ යුත්ත නොකළ යුත්ත නො දැනෙන පමණට වැඩුණා වූ ඒ මානය **යොබ්බනමද** නම් වේ. යෞවන මදය, තරුණ මදය යන මේවා ද එහි නම් ය. වැඩි මහල්ලෝ බාලයන්

Non-commercial distribution

විසින් ගරු කළ යුත්තෝ ය. රහත් භික්ෂුව විසිනුදු වැඩිමහලු පෘථග්ජන භික්ෂුවට ගරු කළ යුතු බව වැඳිය යුතු බව බුද්ධ නියමය ය. යෞවන මදයෙන් මත්වූවෝ මහල්ලන්ට විසුළු කරමින් ඔවුනට කරදර කරති. එය මහත් පාපයකි. ගුණවත් මහල්ලන්ගේ සිත් රිදවන තරුණයන්ට සමහර විට එයින් වන අනිෂ්ට විපාක මෙලොවදීමත් ලැබෙන්නේ ය. වැඩිමහල්ලෝ ද එක්තරා පූජනීය කොට්ඨාසයකි. එබැවින් ඔවුනට ගරු කළ යුතු ය. වැඩිමහල්ලන්ට ගරු කිරීමේ අනුසස් මෙසේ වදාරා ඇත්තේ ය.

**යේ වුද්ධ මපචායන්ති - නරා ධම්මස්ස කෝවිදෙ.**
**දිට්ඨෙව ධම්මේ පාසංසා - සම්පරායේ ච සුග්ගති.**

( ජාතක පාළි )

“වැඩි මහල්ලන්ට ගරු කිරීමට දන්නා වූ අය යම් මිනිස් කෙනෙක් වෘද්ධයන්ට ගරු බුහුමන් කෙරෙත් ද ඔවුහු ඉහත ආත්මයෙහි ප්‍රශංසා ලබන්නෝ ද මරණින් මතු සුගතියෙහි උපදින්නෝ ද වෙත්ය” යනු එහි තේරුමය.

තරුණ මදය දෙලොව ම පිරිහීමට හේතුවන නපුරු මදයකි. තරුණ මදයෙන් මත් වූවෝ කාරුණික වූ ද හිතකාමී වූ ද මාපියන්ගේ අවවාද අනුශාසනයන් නො පිළිගනිති. ඕවා මහල්ලන්ගේ මෝඩ අදහස් ය කියා අවමන් කර ධර්මය නො පිළිගනිති. ඔවුහු ඕනෑ නීච ක්‍රියාවක් කිරීමට ලැජ්ජා නො වෙති. සොරකම් ආදි නීච ක්‍රියා දස්කම් ලෙස සලකති. ඕනෑ ම අපරාධයක් කිරීමට බිය නො වෙති. එයින් ඔවුහු මෙලොවත් පිරිහී මරණින් මතු අපායට ද යති.

## 5. ජීවිතමදෝ

සෙස්සෝ මද ආයුෂයකින් ම මැරෙන්නාහ. මම බෝ කල් ජීවත් වූයෙමි. මතු ද බෝ කලක් ජිවත් වන්නෙමියි ජීවිතය සම්බන්ධ මුලාවෙන් යුක්ත අධික මානය **ජීවිත මද** නම් වේ. ජීවිත මදය ඇත්තේ කුමක් හෝ කොට මෙලොව පස්කම් සුව විඳීමට බලාපොරොත්තු වනවා මිස පරලොව ගැන නො සිතයි. ඔහු මෙලොව සැප ලැබීම සඳහා නොයෙක් පව්කම් කොට කිසි පිනක්

Non-commercial distribution

නො කොට මරණින් පසු අපායට පැමිණෙන්නේය. ජීවිතමදය ඇති වන්නේ බුදු දහම නො දැනීම නිසා ය. දහම් සේවනය නොකිරීම නිසා ය. ඒ මදය දුරු වීමට ඇති එක ම බෙහෙත බුදු දහම ය.

ජීවිතය අති දුබලය. විනාඩි ගණනක් වුව ද පැවතිය හැකි ශක්තියක් එයට නැත. අසවලාගේ ජීවිතය මෙපමණ කලක් පවතිනවා ය කියා සහතිකයක් කිසිම ජීවිතයකට නැත. ජීවිතයක් ඇතහොත් මරණය ද ඇත්තේ ය. මරණය නැති ජීවිතයක් නැත. මරණය නැත්තේ ජීවිතයක් ද නැති නිවනෙහි පමණෙකි. ජීවිතය ඇති වූ ද පටන් ම මරණය එයට සම්බන්ධව පවතී. ජීවිතය මරණය යන දෙක දෙපටකින් ඇඹරූ කඹයක් සේ සැලකිය හැකිය. දෙපොටකින් ඇඹරූ කඹයෙහි සැම තැනම එක පොටක් අනෙක් පොටෙහි වෙලී පවතින්නාක් මෙන් ජීවිත මරණ දෙක ඔවුනොවුන් එකට වෙලී පවතී. ජීවිතයක් දින ගණනක් වුව ද පවතින්නේ එහි ශක්තියෙන් නොව ආහාරාදීන්ගේ අනුග්‍රහයෙනි. ආහාර ගන්නේ, ආහාරයේ අනුග්‍රහය නැතිනම් ජීවිතයට පැවතිය නොහෙන බැවිනි. ජීවිත මදයෙන් මත්ව සිටින අඥයා ආහාර ගනිතත් එය කරන්නේ කුමට ද යන බව ඔහුට නො දැනේ. ආහාරය ලද පමණින් ම ද ජීවිතය නො පැවතිය හැකිය. එයට බොහෝ අන්තරාය ඇත්තේ ය. ජීවිතය පිට්ටනියක් මැද දැල්වෙන පහන් සිළුවක් බඳුය. පිට්ටනියේ දැල්වෙන පහන් සිළුව කිනම් දිසාවකින් සුළඟ ආයේ ද නිවෙයි. සතකු පැන්නේ ද නිවෙයි. එසේ ම ජීවිතයට හැම දිසාවකින් ම පැමිණෙන අනේකාන්තරාය ඇත්තේ ය. සත්ත්වයා වටේට ජීවිත නාශක හේතූන් පිරී ඇත්තේය. ශරීරය තුළද ඇත්තේ ය. සමහර විට දිවි පවත්වා ගැනීමට අනුභව කරන ආහාරය ද දිවි නසයි. දිවි පවත්වා ගැනීමට බොන වතුර ටික ද දිවි නසයි. රෝගය සුව කර ගැනීමට ගන්නා බෙහෙත ද දිවි නසයි. ශරීරයේ වෙසෙන පණුවෝ ද ජීවිතය නසති. ශරීරයේ ඇති වා - පිත් - සෙම් යන මේවා ද කිපුණු විට ජීවිතය නසයි. මෙසේ ජීවිතය අනේකාන්තරායයන් මැද පවත්නා බැවින් මම නො මැරෙන්නෙමිය බෝ කල් ජීවත් වෙමි යයි සිතීම ඉමහත් අනුවණකමක් බව දත යුතුය. ඇතැමකුට ආරෝග්‍ය මද යෞවනමද ජීවිතමද යන තුනම ඇති වේ. එසේ වීම ඉතා නපුරු ය.

Non-commercial distribution

## 6. ලාභමදෝ

ලාභය නිසා ඇතිවන කළ යුත්ත නො කළ යුත්ත නො දැන මෝහයෙන් යුක්ත වන බලවත් මානය **ලාභමද** නම් වේ. ඇතැම් භික්ෂූහු අල්ප ලාභීහුය. සෑහෙන පමණට ආහාර පානාදිය නො ලබන්නෝ ය. මිනිසුන් පැහැදවීමට සමත් වූ ඇතැම් භික්ෂූහු මහා ලාභීහුය. බොහෝ ප්‍රත්‍යය ලබන්නෝ ය. බොහෝ ප්‍රත්‍යයන් ලබන ඇතැම් භික්ෂූන්ට බොහෝ ප්‍රත්‍යය නො ලබන භික්ෂූන් පහත් කොට තමන් උසස් කොට ගන්නා මානය ඇති වේ. එය දියුණුවීමෙන් ලාභමද නම් වූ මත්වීම ඇති වේ. ඇතැමුන්ට දිවි පැවැත්වීමට සෑහෙන පමණට ද යමක් නො ලැබේ. ඇතැමුන්ට බොහෝ ධනය ලැබේ. ඇතැමුන්ට ඇත්තේ යමක් ලැබීමට එක් මගක් පමණෙකි. ඇතැමුන්ට ලැබීමේ මං බොහෝ ඇත්තේ ය. රැකියාවක් ද ඇත්තේ ය. වතු ද ඇත්තේය. කුඹුරු ද ඇත්තේ ය. ගෙවල් ද ඇත්තේ ය. වෙළඳාම් ද ඇත්තේ ය. නොයෙක් මාර්ග වලින් බොහෝ ලබන්නන්ට මඳ ලාභ ඇතියවුන් පහත් කොට සිතන තමා උසස් කොට සිතන මානය ඇති වී, එය වැඩී ලාභමදය ඇති වේ.

## 7. සක්කාරමදෝ

හොඳ හොඳ උසස් උසස් දේ ලැබීම නිසා අති වන, මුළා කරවන අධික මානය **සක්කාර මද** නම් වේ. ඇතැම් භික්ෂූන්ට ගිහියෝ වැඩි සැලකිල්ලකින් දන් නො දෙති. ජනයා පැහැදවීමට සමත් ඇතැම් භික්ෂූන්ට ඉතා ප්‍රණීතවත් ලෙස පිළියෙල කර දන් දෙති. වටිනා සිවුරු දෙති. ඇඳ පුටු මේස ආදි වටිනා භාණ්ඩ දෙති. ප්‍රණීත ආහාර පානයන් හා වටිනා භාණ්ඩයන් ලබන්නා වූ ඇතැම් භික්ෂූන්ට ප්‍රණීත දෑ නො ලබන භික්ෂූන් සුළු කොටත් තමන් උසස් කොටත් සිතන මානය ඇති වී එයින් මත් වේ. ගිහියන් අතුරින් ද ඇතැම්හු හොඳ ආහාර ඇඳුම් වාසස්ථාන නො ලබන්නෝ ය. ඇතැම්හු ප්‍රණීත ආහාර පානයන් ඇති ව වටිනා ඇඳුම් පැලඳුම් ඇති ව ඉඩකඩ ඇති ලස්සන ගෙවල් ඇතිව, හොඳ රථවාහන ඇති ව සැපසේ ජීවත් වන්නෝ ය. ඔවුන් ගෙන් ඇතමුනට සත්කාර මදය ඇති වේ. ලාභමදය හා සත්කාරමදය නිසා ඇතැම්හු ලාභ සත්කාරයෙන් පිරිහෙති.

Non-commercial distribution

ලාභය සත්කාරය යන මේ දෙක විශේෂයෙන් ගිහිපැවිදි කවුරුනුත් මත් කරවන කරුණු දෙකකි. භික්ෂූන්ට ලාභය සත්කාරය ඉතා නපුරු කරුණු දෙකක් බව බුදුන් වහන්සේ විසින් අනේකාකාරයෙන් නොයෙක් උපමායෙන් දේශිත සූත්‍ර බොහෝ ගණනක් සංයුක්තනිකායේ ලාභසක්කාර සංයුත්තයේ එන්නේය. **"අසනිවක්කන්ති භික්ඛවෙ ලාභසක්කාරසිලෝකස්සේතං අධිවචනං"** යනුවෙන් ලාභය සත්කාරය කීර්තිය යන මේ කරුණු තුන භික්ෂුවට හෙණයකැයි වදාරා ඇත්තේය. මහත් දරුණු දෙයකැයි ද වදාරා ඇත්තේ ය. එබැවින් ලාභසත්කාරය ලබන භික්ෂූන් ඒවාට ගිජු නො වී ඒවායින් මත් නො වන සේ පිළිපැදිය යුතු ය.

## 8. ගරුකාරමදෝ

"අන්‍යයන්ට කිසිවකු විසින් ගෞරවයක් සැලකිල්ලක් දක්වන්නේ නැත. මා හට වනාහි දුටු දුටු සැම දෙන ම ගරු කරති. සලකති"යි මහජනයාගෙන් ගෞරව ලබන ඇතැම් ගිහියන්ට ඇතිවන අන්‍යයන් පහත් කොට තමන් උසස් කොට ගන්නා වූ අධික මානය **ගරුකාර මද** නම් වේ. එයින් මත් වූයේ නිතර ම සැම තැනකදී ම අන්‍යයන්ගෙන් ගරු සැලකිලි බලාපොරොත්තු වේ. නො ලැබෙන තැනදී දෙම්නසට පත් වේ. ගරු නො කරන්නවුන්ට විරුද්ධ වේ. එයින් ඔහු ජනයාට අප්‍රිය බොහෝ දෙනා හෙළා දකින පුද්ගලයෙක් වේ. මෙබඳු පුද්ගලයන්ට කෛරාටිකයෝ බොරුවට ගෞරව දක්වා ප්‍රයෝජන ලබති.

## 9. පුරෙක්ඛාරමදෝ

කථාවෙහි දක්ෂ උගත් ධනවත් ක්‍රියාශූරත්වය ඇති පුද්ගලයන් පෙරටු කොට ගෙන ඔවුනට මුල් තැන දෙමින් මහජනයා වැඩ කරති. ජනයා විසින් මුල් තැන දෙන්නා වූ පෙරටු කර ගන්නා වූ අයට ඒ නිසා තමන් උසස් ය සෙස්සන් පහත් ය කියා මත්වීම් ආකාරයෙන් ඇති වන අධිකමානය **පුරෙක්ඛාර මද** නම් වේ. එයින් මත් වූයේ ගිය ගිය තැන ප්‍රධානත්වය බලාපොරොත්තු වේ. ප්‍රධානත්වය නො ලද හොත් දෙම්නසට පත් වේ. ප්‍රධානත්වය සඳහා සටන්

Non-commercial distribution

කරයි. ප්‍රධානත්වය නොලද තැන කටයුතු අවුල් කරන්නට උත්සාහ කරයි. එයින් ඔහු ජනයාට අප්‍රිය පුද්ගලයෙක් වේ.

## 10. පරිවාරමදෝ

පිරිවර ඇති බව නිසා සෙස්සන් පහත් කොට තමා උසස් කොට ගන්නා වූ මත් වීම ඇති අධික මානය **පරිවාරමද** නම් වේ. බොහෝ ශිෂ්‍යයන් දයකයන් ඇති ඇතැම් භික්ෂූන්ට හා බොහෝ දූදරුවන් සහෝදර සහෝදරියන් නෑ මිතුරන් ඇති ඇතැම් ගිහියන්ටත් මේ පරිවාර මදය ඇති වේ. පරිවාරමදයෙන් මත් වූවෝ තමන්ගේ පිරිස් බලය නිසා නොයෙක් පව්කම් කරති. සමහරවිට යම් යම් නොමනා කම්වලට, පිරිසේ සහයෝගය නො ලැබී යාමෙන් අමාරුවට පත් වෙති. පිරිසට අප්‍රිය ද වෙති.

## 11. භෝගමදෝ

“ඇතැමකුට සෙට ආහාරවේල සපයා ගැනීමට තරම් මුදලක් අද නැත. මට වනාහි බොහෝ මුදල් ඇත්තේය. බොහෝ ගෙවල් වතු කුඹුරු වාහන ඇත්තේය. බොහෝ පරිභෝග භාණ්ඩ ඇත්තේය’යි ධනය නිසා ඇතිවන මත් කරන අධික මානය **භෝගමද** නම් වේ. එයට **ධන මදය** යි ද කියනු ලැබේ. ධනය වනාහි අන් සැම කරුණකට ම වඩා මිනිසා මත් කරවන දෙයකි. ධනවත්හු බොහෝ සෙයින් ධනමදයෙන් මත්ව සිටින්නෝ ය. කලින් දිළිඳුව සිට හදිසියෙන් ධනය ලැබුවෝ ධනයෙන් වඩාත් මත් වෙති. එබඳු අය මහා ධනයකින් නොව, මඳ ධනයකින් ද මත් වෙති. නොයෙක් විට ඒ මත් වීම නිසා ඔහු පමණ ඉක්මවා වියදම් කොට නැවතත් දිළිඳු බවට පත් වෙති. අන් කරුණු වලින් ඇති වන මදයට වඩා ධන මදය නපුරුය. ධනමදයෙන් මත් වූවෝ සතුන් මැරීම පමණක් නොව මිනී මැරීම ද කෙරෙති. සුළු සොරකම් නොව මහ සොරකම් කරති. අධික ලෙස කාමයෙහි වරදවා හැසිරෙති. මහා වඤ්චා කරති. අධික ලෙස සුරා පානය කරති. ගරු කළ යුත්තන්ට ගරු නො කරති. අවමන් කරති. කාරුණිකයන් ගේ අවාදනුශාසනයන් නො පිළිගනිති. ධනමදයෙන් මත් වූවන්ට ඉහත දැක්වූ ජාති මදදි

Non-commercial distribution

මද ද එකතු වේ. එබැවින් ඔවුන්ගේ මදය සන්සිඳවීමට දුෂ්කර මහා මදයක් වේ. මත් වී අධික ලෙස පව් කළා වූ ද, දරුණු පව්කම් කළා වූ ද, ඇතැම්හු ඒවායේ විපාක වශයෙන් මෙලොව ද බෝකල් දුක් විඳ මරණින් පසු නරකයට පැමිණෙති. ඇතැම්හු සතුරන් අතින් අකාලයේ මැරෙති. ඇතැම්හු කාමරෝග හා මත්පැනින් වන රෝග සාදගෙන බොහෝ දුක් විඳ අකාලයෙහි මියෙති. ධනය මනුෂ්‍යයාට අත්‍යාවශ්‍ය දෙයකි. සැම දෙනා විසින් ම ධනය සපයා ගත යුතු ය. ධනයෙන් මෙලොව ලබන සියලු සැප ලැබිය හැකිය. පරලොව සැප ද ලැබිය හැකි ය. එහෙත් එයින් මත් වන නුසුදුසු පරිදි ධනය පරිහරණය කරන පුද්ගලයා මරා දමන්නේත් අපායට යවන්නේත් ඒ ධනය ය. දෙලෝ වැඩ කැමතියෝ මත් නොවී ධනය පරිහරණය කරන්නට දැන ගනිත්වා!

## 12. වණ්ණමදෝ

වර්ණය නිසා මත්වීම් ආකාරයෙන් ඇති වන අධික මානය **වණ්ණමද** නම් වේ. රූප ශෝභාව, ගුණය යන දෙකට ම වර්ණය යි කියනු ලැබේ. ස්ත්‍රීහු රූප ගරුකයෝ ය. තුමූ ලස්සනය කියා බොහෝ සෙයින් මත් වන්නෝ ස්ත්‍රීහුය. ශරීරවර්ණයෙන් ප්‍රයෝජනය ජනප්‍රිය වීමයි. ජනාදරය ලැබීමයි. එහෙත් වර්ණයෙන් මත් ව සිටින කාන්තාව ජනයාට අප්‍රිය, ජනාදරය නො ලබන්නියක් වේ. සිල් ඇත්තියෙක, පණ්ඩිතයෙක, කථිකයෙක, ලෝ සඳුන් දෙකට වැඩ කරන්නෙක, කාරුණිකයෙක, ත්‍යාගවන්තයෙක, මේ මේ දෙයට දක්ෂයෙක කියා කීර්තිය පතළ කල්හි, සෙස්සෝ නිර්ගුණයෝ ය, මගේ ගුණ රාශිය ලොව පුරා ඇත්තේ ය කියා ගුණ වර්ණය නිසා ඇති වන වර්ණමද , ස්ත්‍රී පුරුෂ ගිහි පැවිදි කාහටත් වෙනසක් නැතිව ඇති විය හැකි ය.

## 13. සුතමදෝ

අන්‍යයෝ නූගත්හුය, මම උගතෙක්මි ය, උපාධි ධරයෙක්මි ය කියා අන්‍යයන් පහත් කොට තමා උසස් කොට ගන්නා වූ අධික මානය **සුතමද** නම් වේ.

Non-commercial distribution

## 14. පටිභාණමදෝ

"සෙස්සෝ මෝඩයෝ ය, තැනට සුදුසු සේ කථා කරන්නට ක්‍රියා කරන්නට නො දන්නෝ ය. මම වනාහි තැනට සුදුසු සේ කථා කරන්නට ක්‍රියාකරන්නට පැන නැගෙන කිනම් ප්‍රශ්නයක් වුව ද විසඳීමට සමතෙක් වෙමි"යි සෙස්සන් පහත් කොට තමා උසස් කොට ගන්නා මත් කිරීමට සමත් අධික මානය **පටිභාණමද** නම් වේ. මෙය පණ්ඩිතයන්ට හා ඇතැම් මෝඩයන්ටත් ඇති වන මදයෙකි. මෙසේ මත් වී සිටින මෝඩයෝ ලෝකයෙහි බහුල යැයි කිය යුතුය.

## 15. රත්තඤ්ඤුමදෝ

"අන්‍යයෝ රටේ පැරැණි තොරතුරු කිසිවක් නො දන්නෝය, මම වනාහි මේ ගම්වල නගරවල පැරැණි තොරතුරු දනිමිය, මේ මිනිසුන් ගේ කුල පරම්පරාව දනිමිය, බුද්ධවංශ රාජවංශ ශාසනවංශයන් දනිමිය, ලෝකයේ නොයෙක් ජාතීන්ගේ ඉතිහාසය දන්නෙමි'යි සෙස්සන් පහත් කොට පැරැණි දෑ දැනුමෙන් තමන් උසස් කොට ගන්නා මත්වීම ඇති අධික මානය **රත්තඤ්ඤුමද** නම් වේ. මෙය ඇතැම් මහල්ලන්ට හා ඉතිහාසඥයන්ට ඇති වන මදයෙකි.

## 16. පිණ්ඩපාතිකමදෝ

පිණ්ඩපාතික භාවය නිසා තමා උසස් කොට අන්‍ය භික්ෂූන් පහත් කොට සැලකීම් වශයෙන් ඇතිවන මත්කරවන අධික මානය **පිණ්ඩපාතිකමද** නම් වේ. පිණ්ඩපාතික භෝජනයෙන් ජීවත් වීම බුදුන් වහන්සේ විසින් පසස්නා ලද උතුම් ගුණයෙකි. එහෙත් හැම කල්හි එසේ ජීවත් වීම පහසු නැත. එබැවින් බොහෝ භික්ෂූහු සැදැහැතියන් ඔවුන්ගේ ගෙවලට වැඩම කරවා දෙන භෝජනයත් විහාරයට ගෙනවුත් දෙන භෝජනයත් පිළිගනිති. යම් භික්ෂුවක් එසේ දායකයන් දෙන දානයන් නො පිළිගනිමින් පිණ්ඩපාත භෝජනයෙන් ම ජීවත් වන්නේ නම් එය උසස් ගුණයෙකි. එසේ ජීවත්වන භික්ෂුවකට පිණ්ඩපාතිකමදය ඇති වුව හොත් එයින් ඔහුගේ ඒ උතුම් ගුණය බාල වන්නේ ය.

Non-commercial distribution

## 17. අනවඤ්ඤාතමදෝ

බොහෝ දෙන අන්‍යයන් විසින් පහත් කොට සලකනු ලබන්නෝ ය. අවමන් කරනු ලබන්නෝ ය. මම වනාහි කිසිවකුගෙන් අවමානයක් නො ලබමියි ඇතිවන අධිකමානය **අනවඤ්ඤාතමද** නම් වේ.

## 18. ඉරියාපථමදෝ

අන්‍යයන්ගේ ගමනාදි ඉරියව් අශෝභනය, අප්‍රසාදනීය ය, මාගේ ගමනාදි ඉරියව් ශෝභනය, ප්‍රසාදජනකය යි ඇති වන මානය **ඉරියාපථමද** නම් වේ.

## 19. ඉද්ධිමදෝ

අන්‍යයෝ පියාපත් සුන් කපුටන් සේ දුබලයෝය. මම මහා ඍද්ධි ඇතියෙක, මහානුභාව ඇතියෙක කියා ද, මා කරන සියල්ල ම හරි යන්නේ ය කියා ද තමාගේ සමත් බව නිසා ඇති වන අධික මානය **ඉද්ධිමද** නම් වේ.

## 20. යසමදෝ

සෙස්සෝ මා යටතේ වාසය කරන්නෝ ය. මම ඔවුන් හසුරුවන්නා වෙමි ය යි පිරිස්වල ප්‍රධානත්වය දරන පැවිද්දන්ට හා ගිහියන්ට ප්‍රධානත්වය නිසා ඇති වන අධික මානය **යසමද** නම් වේ.

## 21. සීලමදෝ

බොහෝ දෙනා දුශ්ශීලයෝ ය, මම සිල් ඇතියෙක්මි යයි ශීලය නිසා ඇතිවන අධික මානය **සීලමද** නම් වේ. මෙය පැවිද්දන්ට වඩාත් ඇතිවන මදයෙකි. ඒ මදය නිසා ඔහුගේ ශීලයේ අගය අඩු වේ. ශීලමදය ප්‍රාණවධාදී බලවත් පාපයන්ට හේතු නො වන නුමුත් දුශ්ශීලයෝ ය කියා අන්‍යයන්ට ගර්හා කිරීමේ පාපයට හේතු වේ. ශීලමදයෙන් මත් වූ ඇතැම්හු ඒ පාපය බෙහෙවින් කරති.

Non-commercial distribution

## 22. ඣානමදෝ

සෙස්සෝ විනාඩි කීපයක් වුව සිත එක් අරමුණක තබා විසීමට අසමර්ථයෝ ය. මම පැය ගණනක් සමාධියෙන් විසීමට සමත් වෙමි යයි සමාධිය නිසා ඇති වන මානය **ඣානමද** නම් වේ. මෙය පාපකර්මයක් වුව ද එතරම් හානිකර ධර්මයක් නො වේ. සමහරවිට එයින් ලබා ඇති සමාධියට බාධා විය හැකි ය.

## 23. සිප්පමදෝ

බොහෝ දෙනා නිසි ශිල්පයක් නො දන්නෝ ය. මම හොඳ ශිල්පයක් දනිමි ය, බොහෝ ශිල්පයන් දනිමිය කියා ශිල්පය නිසා උපදනා මත් කරවන මානය **සිප්පමද** නම් වේ.

## 24. ආරෝහමදෝ

සෙස්සෝ මිට්ටෝ ය, මම උස් වෙමියි අන්‍යයන් පහත් කොට තමා උසස් කොට සලකන මත් කරවන මානය **ආරෝහමද** නම් වේ.

## 25. පරිණාහමදෝ

අන්‍යයෝ පමණට වඩා උස් හා මිටි වන්නාහ. මම වනාහි උස් මිටිකම නැති සමප්‍රමාණ ශරීරය ඇතියෙමි යි ඇති වන මත් කරවන මානය **පරිණාහමද** නම් වේ.

## 26. සණ්ඨානමදෝ

බොහෝ දෙනාගේ ශරීර සටහන අශෝභනය. භයානකය. මාගේ ශරීරය ශෝභනය යි සටහන සම්බන්ධයෙන් ඇති කරවන මත් කරවන මානය **සණ්ඨානමද** නම් වේ.

## 27. පාරිපූරිමදෝ

අන්‍යයන්ගේ ශරීරයෙහි බොහෝ දෙස් ඇත්තේ ය. අඩු පාඩුකම් ඇත්තේ ය. මාගේ ශරීරයෙහි කිසි දෙසක් නැතය යි මත්වීම් වශයෙන් ඇතිවන මානය **පාරිපූරිමද** නම් වේ.

Non-commercial distribution

## 28. මදෝ

ඉහත දැක් වූ ජාති මදෝ ගොත්තමදෝ යනාදි වචන වලින් හේතු සහිත ව සත්විස්සක් මද දක්වන ලදී. අනතුරුව මදය වෙන්කොට දැක්වීම සඳහා මදෝ යන මෙය නැවත වදාරන ලදී. කොතක් මෙන් කොඩියක් මෙන් තමා අතිශයින් උසස් කොට ගන්නා වූ හොඳ නරක - කළ යුත්ත නො කළ යුත්ත නො හඳුනන, ගරු කළ යුත්තන් නො හඳුනන සම්මෝහයෙන් යුක්ත වන බලවත් මානය **මද** නම් වේ. එයින් මත් වූවන්ට තමන් මත් වී ඇති බව නො දැනේ. ඔවුන් කරන කියන දේ දකින අසන නුවණැතියන්ට මොහු මෙනම් කරුණෙන් මත් වී සිටීය කියා දත හැකි වේ. සමහරුන්ට අන්‍යයන් විසින් පෙන්වා දුන් කල්හි තමන්ගේ මුළාව වැටහෙන්නේ ය. සමහරුන්ට අන්‍යයන් කීව ද නො වැටහෙන්නේ ය. එබඳු අයගේ මදය දුරු කිරීම අතිශයින් දුෂ්කරය. මේ මදය නොයෙක් පව්කම් වලට හා මෙලොව පරිහානියට ද හේතු වන ක්ලේශයකි.

## 29. පමාදෝ

සාමාන්‍ය ජන ව්‍යවහාරයෙහි ප්‍රමාද යන වචනයෙන් කියැවෙන්නේ යම්කිසි කාර්‍ය්‍යයක් කළ යුතු අවස්ථාවේදී නො කළ හැකි වීමට හා නො කර හැරීමට ය. මෙහි **පමාද** යනුවෙන් කියැවෙන්නේ අකුශල ධර්ම රාශිය ය. ගසක නටුවෙන් එල්ලී පවත්නා ගෙඩිය ගසේ තිබෙන්නේ පොළොවට බරව ය. නටුයෙන් මිදුණු වහාම එය පොළවට වැටෙන්නේ ය. වනයෙන් බැඳ ගෙන ආ කුළු ගොනා රැහැන නිසා මිනිසුන් අතර සිටිය ද ඌ නිතරම සිටින්නේ වනයට යාමේ බලාපොරොත්තුවෙනි. එමෙන් පෘථග්ජන සිත ද නිතර ම පවත්නේ පඤ්ච කාමයන්ට හා දුශ්චරිතයන්ට බරව ය. ඒවා වෙතට නැමී ගෙන ය. පඤ්චකාමයට හා දුසිරිතට නැමී බරවී ඇළ වී පවත්නා සිත සුසිරිතයෙහි පවත්නේ සිහියේ බලයෙනි. සිහිය නමැති රැහැනින් මිදුණු වහා ම සිත පඤ්චකාමයට හා දුසිරිතයට ඇදී යන්නේ ය. පඤ්ච කාමයට හා දුසිරිතට යන්නට නො දී සිත කුශල ක්‍රියාවෙහි බැඳගෙන සිටින, සිහිය නමැති රැහැන

Non-commercial distribution

**අප්පමාද** නම් වේ. සිහියෙන් තොර වීම පඤ්චකාමයන් වෙත හා දුසිරිතට යන පරිදි සිත මුදා හැරීම පමාද නම් වේ. ආහාර පාන ඇඳුම් පැලඳුම් වතු කුඹුරු ගෙවල් රථවාහන ඇඳ පුටු පාරිභෝගික භාණ්ඩ, මුදල් යනාදිය කාම වස්තුය. ඒවා සැපයීම් ආරක්‍ෂා කිරීම් භුක්තිවිඳීම් වශයෙන් ඒවායේ සිත පැවැත්වීම ප්‍රමාදයයි. අඹු දරු නෑ මිතුරු ආදීහු ද කාම වස්තූහු ය. ඔවුන් කෙරෙහි සිත පැවැත්වීම ප්‍රමාදය ය. දුසිරිතෙහි යෙදීමත් ප්‍රමාදය ය. දනාදි කුශලයන් කළත් මැනවින් නො කරන බව ද, නො සැලකිල්ලෙන් යන්තමින් කරන ස්වභාවය ද ප්‍රමාදය ය. සැම කල්හි කුශල ක්‍රියාවන්හි නො යෙදෙන ස්වභාවය ද ප්‍රමාදය ය. කටුස්සා නැවති නැවතී ගමන් කරන්නාක් මෙන් කලින් කල නවත්ව නවත්වා කුසල් කරන ස්වභාවය ද ප්‍රමාදය ය.

**පමාදමනුයුඤ්ජන්ති - බාලා දුම්මෙධිනෝ ජනා.**
**අප්පමාදඤ්ච මේධාවී - ධනං සෙට්ඨංච රක්ඛති.**

( ධම්මපද )

නුවණ නැත්තා වූ දෙලෝ වැඩ නො දන්නා වූ පුද්ගලයෝ ප්‍රමාදයෙහි යෙදෙති. නුවණැත්තේ ශ්‍රෙෂ්ඨ ධනයක් මෙන් අප්‍රමාදය ආරක්‍ෂා කෙරේ.

## 30. ථම්භෝ

සිතෙහි, කණුවක් මෙන් කෙළින් සිටින දැඩිව සිටින නො නැමෙන ස්වභාවය **ථම්භ** නම් වේ. එය මානයේ ම ආකාර විශේෂයකි. ථම්භය ඇත්තේ ගරු කළයුත්තන්ට නො වඳී, නො නැමේ, අවවාදනුශාසනයන් නො පිළිගනී.

## 31. සාරම්භෝ

සැම දෙය ම අනුන් කළාට වඩා ඉහළින් කරන ස්වභාවය, අනුන්ට ඉහළින් සිටින කැමැත්ත **සාරම්භ** නම් වේ. මෙය ඒ ආකාරයෙන් පවත්නා මානය ම ය. සාරම්භය ඇත්තේ අනුන් එකක් කරනු දුටු විට තමා දෙකක් කරයි. අනුන් දෙකක් කරනු දුටු විට තමා තුන හතරක් කරයි. අනුන් එක ගෙයක් තනනු දුටු විට තමා

Non-commercial distribution

ගෙවල් දෙකක් තනයි. අනුන්ට එක රියක් තිබෙනු දුටු විට තමා රිය දෙකක් සපයා ගනී. අනුන් එක කුඹුරක් වපුරනු දුටු විට තෙමේ කුඹුරු දෙකක් වපුරයි. අනුන් එක ඉඩමක් වගා කරනු දුටු විට තමා ඉඩම් දෙකක් වගා කරයි. එක් භික්ෂුවක් එක් නිකායක් උගෙන සිටිනු දුටු විට තමා ඔහුට ඉහළින් සිටිය යුතු යැයි නිකාය දෙකක් උගනී. අන් භික්ෂුවක් එක් පිටකයක් උගෙන සිටිනු දුටු විට මා ඉහළින් සිටි යුතු යයි දෙපිටකයක් හෝ ත්‍රිපිටකය ම හෝ උගනී. ධර්මය ඉගෙනීම කුශලයක් වුවද සාරම්භ වශයෙන් එසේ කිරීම අපායට මගකි. එක් භික්ෂුවක් එක් පිටකයක් උගෙන සිටින විට මා හට දෙපිටකයක් හෝ තුන් පිටකයම හෝ උගෙනීමේ ශක්තිය ඇතැයි සිතා උගෙනීම යහපති. කෙනකු මසකට වරක් දන් දෙනු දුටු විට මම ඔහුට ඉහළින් සිටීමට මසකට දෙවරක් දෙමියි දීම නො මැනවි. මසකට දෙතුන් වරක් දීමේ හැකියාව ඇතැයි දෙතුන් වරක් දීම මැනවි.

## 32. අත්‍රිච්ඡතා

**අත්‍රිච්ඡතා** යනු ලද දෙයින් සතුටු නො වන තමාට ඇති දෙයට වඩා අනුන් වෙත ඇති දෙය හොඳය සිතා අනුන් අයත් දෙයට ඇලුම් කරන ස්වභාවයය. අත්‍රිච්ඡතාව ඇති පුද්ගලයා හට එක හැළියේ පිසූ බත වුව ද තමාට බෙදූ ඇති බතට වඩා අනෙකාගේ භාජනයෙහි බත යහපත් යයි සිතෙන්නේ ය. ඇතැම් අත්‍රිච්ඡයෝ අනුන්ගේ දේ ලබන්නට ගොස් තමාට තුබූ දේ ද නැති කර ගනිති. මෙය ඇතැම් පැවිද්දන්ටත් ගිහියන්ටත් ඇත්තේය. තිරිසනුන්ට ද ඇත්තේය. මෙය සුනඛයන් අතර බෙහෙවින් දක්නා ලැබේ. සුනඛයන් කීප දෙනකුට එක විට කෑම දුන් කල්හි එකෙක් අනිකාගේ පංගුව වඩා හොඳ ඇතැයි සිතා එයට පැන පොර කයි. ඒ අතර උගේ පංගුව කපුටෝ කා යති. අත්‍රිච්ඡතාව නිසා ඌට තමාගේ පංගුව ද නැති වේ. ඇතැමුන් තමන් කරන රස්සාව හොඳ නැත පඩිය මදි යයි සිතා එය හැර අන් රැකියා සොයන්නට ගොස් අන්තිමේදී කිසිවක් නැති ව තැවෙන්නේ මේ අත්‍රිච්ඡතාව නිසා ය. අත්‍රිච්ඡතාව ඇති පුද්ගලයාට තමාට ඇති දෙය කොතරම් හොඳ වුවත් අනුන් වෙත ඇති නරක දෙය වුව ද හොඳ සැටියට පෙනේ.

Non-commercial distribution

## 33. මහිච්ඡතා

කොතෙක් ලදත් කොතෙක් තිබුණත් සෑහීමට පත් නො වී තව තවත් සොයන මහා ලෝභය **මහිච්ඡතා** නම් වේ. එය ද ගිහි පැවිදි කාහටත් ඇති වන ක්ලේශයෙකි. තමා ගේ ගුණ ප්‍රසිද්ධ කිරීමත්, එයින් කොතෙක් ප්‍රත්‍යය ලදත් සියල්ල පිළිගැනීමත්, පමණ ඉක්මවා ප්‍රත්‍යයන් පරිභෝග කිරීමත් මහිච්ඡතාව ඇති පැවිද්දාගේ ලක්‍ෂණයයි. තමාට ජීවත් වීමට සෑහෙන පමණ ධනය ඇතත් සෑහීමට පත් නොවී රෑ දාවල් දෙක්හි නැවතීමක් නැති ව දුක් විඳිමින් ධනය සැපයීමත්, පමණ ඉක්මවා පරිභෝජනය කිරීමත් ගිහියාගේ මහිච්ඡතා ලක්‍ෂණය ය. ජීවත් වීමට සෑහෙන ධනය සපයා ගත් තැනැත්තා විසින් කළ යුත්තේ පරලොවටත් පිහිටවනු පිණිස කුශල ක්‍රියාවන්හි යෙදීම ය. එහෙත් මහිච්ඡතාව ඇති පුද්ගලයාට එසේ නො කළ හැකි ය. ඔහු ගෙයක් තිබිය දී තවත් ගෙවල් සාදයි. ඉඩම් තිබිය දී තවත් ඉඩම් ගනී. කුඹුරු තිබිය දී තවත් කුඹුරු ගනී. වාහන තිබිය දී තවත් වාහන ගනී. ලක්‍ෂයක් ඇති කල්හි තව ලක්‍ෂයක් සෙවීමට වෑයම් කරයි. කෝටියක් ඇති කල්හි තවත් කෝටියක් සෙවීමට වෑයම් කරයි. මේ මහිච්ඡතාව ඇතියහුගේ ස්වභාවය ය. ඔහු කිසි කලෙක සෑහීමට පත් නො වේ. මැරෙන තුරු රැස් කරමින් සිට කිසි පිනක් නැතිව කලුරිය කොට ධනාශාවෙන් ප්‍රේතත්වයට හෝ පැමිණේ. තිරිසන් බවට හෝ නරකයට හෝ පැමිණේ. පරිභෝගය පිළිබඳ මහිච්ඡතාව ඇතියෝ පමණ ඉක්මවා ලැබෙන සියල්ල කා බී රෝගීහු වෙති. සමහර විට එයින් මැරෙති.

මේ මහිච්ඡතාව භික්ෂූන්ට ඉතා අයෝග්‍ය ක්ලේශයකි. මහිච්ඡතාව ඇතියහු කොතෙක් දී ද තෘප්තියට නො පැමිණවිය හැකි ය. එබැවින් මහිච්ඡතාව ඇති භික්ෂූන් කෙරෙහි දායකයෝ කලකිරෙති. කලකිරුණු දායකයෝ සමහර විට කලක් පවත්වා ගෙන ආ දීමනා ද නවත්වති. දෙන්නට සිතා සිටි දෙය ද නො දී හරිති. මහිච්ඡතාව පිළිබඳ කථා දෙකක් **විභංග අටුවාවෙහි** දක්වා ඇත. ඒ කථා මෙසේ ය.

පිටියෙන් තනන එකතරා කෑම ජාතියකට කැමති භික්ෂුවක් විය. ඔහුගේ මව වස් කාලයක් සමීපයේ දී මාගේ පුතා පිළිගැනීමේ

Non-commercial distribution

පමණ දන්නේ නම් ඔහුට වස් තෙමස මුළුල්ලෙහි ම පිටියෙන් පූ තනා දෙන්නට සිතුවා ය. මව් තොමෝ වස් එළඹෙන දිනයෙහි පුත්‍ර භික්ෂුවට එක් පූවක් දුන්නී ය. භික්ෂුව එය අනුභව කෙළේ ය. ඉක්බිති අනිකක් දුන්නී ය. භික්ෂුව එයත් අනුභව කෙළේ ය. තුන්වෙනුව අනිකක් දුන්නී ය. භික්ෂුව එයත් පිළිගෙන අනුභව කෙළේ ය. මවු තොමෝ මොහු සෑහීමට පත් කළ හැකියෙක් නොවේ ය, මොහුට ඇති වන සැටියට පූ තනා දීම කළ හැකි වැඩක් නොවේ ය, මින් පසු මොහුට පූ තනා නො දෙමිය, මොහු තෙමසට ම කන පූ අද ම කෑයේ ය යි සිතා ගත්තා ය. ඉන් පසු ඒ භික්ෂුවට පිටි කෑම තනා දීම නො කෙළේ ය. මේ කථාවෙන් දැක්වෙන්නේ සෙස්සන්ට තබා වැදූ මවට ද මහිච්ඡතාව ඇති පුද්ගලයා අප්‍රිය වන බව ය.

**තිස්ස** නමැති රජතුමා සෑගිරියේ වෙසෙන සංඝයා හට දිනපතා මහා දනයක් දෙමින් සිටියේ ය. දිනක් ජනපද වැසියෝ "මහරජ කුමක් නිසා එක් තැනකට ම දන් දෙන්නෙහි ද? අනික් විහාරවල භික්ෂූන්ට නොදිය යුතුදැ" යි කීහ. රජතුමා පසුදින අනුරාධපුරයේ මහා දනයක් පිළියෙල කරවා භික්ෂූන්ට දුන්නේ ය. පිළිගැනීමේ පමණ දන්නා එක් භික්ෂුවකුදු ඒ දනයට නො පැමිණියේ ය. එක් එක් භික්ෂුවක් පිළිගත් බත් හා කැවිලි දෙතුන් දෙනකු නැතිව ගෙන යා නො හැකි තරම් විය. රජතුමා පසුදින සෑගිරියේ සංඝයාට ආරාධනා කරවා දන් දුන්නේ ය. රජතුමා භික්ෂූන් ගෙන් පාත්‍ර ඉල්ලීය. සෑහෙන පමණට අපි පිළිගනිමු ය කියා එක් භික්ෂුවකුදු පාත්‍ර නුදුන්නෝ ය. ඒ භික්ෂූහු තමන්ට යැපීමට පමණට ආහාර පිළිගත්හ. ඉතිරි වී අහක යන ලෙස බොහෝ ආහාර නො පිළිගත්හ. භික්ෂූන් පිළිගත් ආහාර වලට වඩා ආහාර ඉතිරි වී තිබිණ. රජතුමා වැසියන් කැඳවා "බලව්, ඊයේ දනයේ දී කිසිවක් ඉතිරි නොවී ය. අද ඉතිරි ආහාර බොහෝ ය. භික්ෂූන් පිළිගත් ආහාර මඳය" යි පිළිගැනීමේ පමණ නො දත් භික්ෂූන් ගැන අප්‍රසාදය පළ කෙළේ ය. එයින් රජු සෑගිරියේ භික්ෂූන්ට දිගට ම දන් දුන්නේ ය. පිළිගැනීමේ පමණ නො දත් භික්ෂූන්ට දන් දීම එක් දිනකින් ම අවසන් විය.

Non-commercial distribution

## 34. පාපිච්ඡතා

නැති ගුණ දැක්වීමේ ආශාව, නැති ගුණ දක්වා ගිහියන් පහදවා ප්‍රත්‍යයන් ලබා ගැනීමේ ආශාව **පාපිච්ඡතා** නම් වේ. මෙය පැවිද්දන්ට ඇති වන ක්ලේශයකි. ලාභ ප්‍රයෝජන ලබනු සඳහා නැති ගුණ පෙන්වන ගිහියන්ට ද මෙය ඇත. පාපිච්ඡතාව ඇති භික්ෂු තෙමේ තමා වත් පිළිවෙත් නො කරන කිසි ශ්‍රද්ධාවක් නැති ව සිට ම මිනිසුන් පැමිණෙන අවස්ථාවන්හි තමාගේ ශ්‍රද්ධාවත් බව දක්වා ඔවුන් රවටනු පිණිස පත්කඩක් ගෙන විහාර චෛත්‍ය බෝධි සමීපයේ හැසිරෙයි. සෑමලු බෝමලු හැමදීම කරයි, කසළ ඉවත් කරයි. බෝධියට පැන් වත්කරයි. මලසුන් පිරිසිදු කරයි. තමා භාවනා නො කරතත් භාවනා කරන ආසන, භාවනා කරන ස්ථාන, සක්මන්මලු පිළියෙල කර තබා ගනී. තමා සිල්වතකු නො වීම අන්‍යයන් හමුවෙහි මිනිසුන්ට ඇසෙන සේ විනය ගැන කථා කරයි. අන්‍යයන් කරන වරදවල් ගැන තමාගේ සංවේගය ප්‍රකාශ කරයි. ශාසනයේ පිරිහීම ගැන කථා කරයි. ශාසනය දියුණු කිරීමේ වැඩ යෝජනා කරයි. තමා නූගතකු වුව ද උගත් බව පණ්ඩිත බව දැක්වීම පිණිස "අහවල් පිරිවෙනට අහවල් විද්‍යාලයට මා පත් කර ගැනීමට කථා කළා ය. ඕවට ගියාම භාවනාවක් කරන්නටවත් අවකාශයක් නො ලැබෙන නිසා මා ගියේ නැත. දැනට පණ්ඩිතයෝ ය උපාධිධරයෝ ය කියා සිටින බොහෝ දෙනා ඔවුන් ගේ නොයෙක් ප්‍රශ්න විසඳ ගැනීමට පැමිණෙන්නේ අප වෙතය" යනාදිය කියයි. තමා විවේකකාමියකු අල්පේච්ඡයකු බව හැඟවීම පිණිස නගරයක ගමක ජනාකීර්ණ පන්සලක වෙසෙමින් පැමිණෙන ජනයාට "අපට වී ඇත්තේ මහ කරදරයෙක, මෙවැනි ජනාකීර්ණ තැන්වල විසීම අපගේ වැඩවලට බාධාවෙක, අපට වුවමනා ආරණ්‍යයක හෝ එවැනි විවේක ස්ථානයක හෝ විසීමය. එහෙත් මේ මිනිසුන් අපට එයට ඉඩ දෙන්නේ නැත. ඒ නිසා මෙහි රැඳී සිටින්නට සිදු වී තිබෙනවාය" යි කියා මෙසේ මිනිසුන් පහදවා බොහෝ ප්‍රත්‍යයන් ලබා ගෙන ඒවා පමණ ඉක්මවා පරිභෝග කරමින් විසීම පාපිච්ඡ භික්ෂුවගේ ස්වභාවය ය. පාපිච්ඡතාව නපුරු පාපයෙකි. මෙකල රහත් බව අඟවන කුහකයන් ගැන අසන්නට ලැබේ. බොහෝ රහතන් විසූ අතීත කාලයේත් ඇතැම් කුහකයන් ප්‍රත්‍යය ලැබීම

Non-commercial distribution

සඳහා නැති රහත්කම් ද මිනිසුන්ට ඇඟවූහ. **විභංග අටුවාවෙහි** පාපිච්ඡාවෙන් මඩනා ලදුව මිනිසුන්ට රහත් බව අඟවමින් විසූ කුහක භික්ෂූන් දෙදෙනකුගේ කථා දක්වා ඇත. ඒවා මෙසේය.

එක් කුහක භික්ෂුවක් ඔහු වෙසෙන කාමරයේ මහ සැළියක් වළලා තබා ගෙන මිනිසුන් එන විට එහි සැඟවෙයි. මිනිසුන් අවුත් හාමුදුරුවෝ කොහිදැ යි ඔහුගේ අනුචරයන්ගෙන් අසන විට හාමුදුරුවෝ කාමරයේ වැඩ සිටිති යි කියති. මිනිසුන් කාමරයට පිවිස බලා භික්ෂුව නොදැක පිටතට අවුත් එහි නැත ය යි කියති. ඒ හඬ ඇසෙන විට භික්ෂුව සැළියෙන් පිටතට අවුත් අසුනෙක්හි හිඳ ගනී. සෙස්සෝ මිනිසුන්ට හාමුදුරුවෝ කාමරයේමය" යි කියති. මිනිස්සු නැවත කාමරයට පිවිස බලති. අසුනක ඉඳිනා භික්ෂුව ඔවුහු දකිති. මිනිස්සු භික්ෂුව දැක පුදුම වී "නුඹ වහන්සේ දක්නට මඳකට කලින් අපි මෙහි පැමිණියෙමු ය. එහෙත් නුදුටුයෙමුය" යි කියති. කුහක භික්ෂු තෙමේ තමා රහත් කෙනකැයි ඔවුන්ට ඇඟවීම සඳහා "භික්ෂූහු රිසි රිසි තැන්වලට යන්නාහ. භික්ෂූන්ගේ ගමන් ගැන නො ඇසිය යුතුය" යි කියයි. මිනිස්සු මේ හාමුදුරුවෝ ඍද්ධි-මත් රහත් කෙනෙකැයි සිතා වඩ වඩා පූජා සත්කාර කරන්නාහ.

එක්තරා කුහක භික්ෂුවක් කඳු ගැටයක් මත පන්සලක වෙසෙයි. පන්සලේ පිටුපස ප්‍රපාතයකි. ඒ නිසා ඒ පැත්තෙන් මිනිසුන්ට යාම ඒම නො කළ හැකි ය. කඳු බෑවුමේ වැවී තුබූ ගසක මුලක්, යට සම බිමට සම්බන්ධ වී පිහිටා තිබුණේ ය. කුහක භික්ෂුව පිණ්ඩපාතාදිය සඳහා තමාට ආරාධනා කරන්නට එන මිනිසුන් පිටත් කර යවා මම පසුව එන්නෙමියි කියා ඒ මුලේ එල්ලී කන්දෙන් බැස ඔවුනට පළමුව ගම දොරට ගොස් සිටී. මිනිසුන් විසින් නුඹ වහන්සේ අපට පෙර මෙහි පැමිණියේ කෙසේදැයි අසන කල්හි "පැවිද්දෝ තමන්ට රිසි මාර්ග වලින් යන්නාහ. ඒවා ගැන නො ඇසිය යුතුය" ය කියයි. මිනිස්සු මුන්වහන්සේ රහත් කෙනෙකැයි සිතා වඩ වඩා පූජා සත්කාර කරති. කුහක මහණාගේ රහස දැනගත් අයෙක් රහසිගතව මුල කපා භික්ෂුව බස්නා කල්හි කඩා හැළෙන පරිදි මඳක් ඉතිරි කොට තැබීය. එදින රහත් බව පෙන්වීමට ගිය කුහක භික්ෂුව ප්‍රපාතයෙන් වැටී පාත්‍රය ද බිඳගෙන පලා ගියේ ය.

Non-commercial distribution

## 35. සිංගං

**සිංග** යනු සතුන්ගේ අංවලට ද නමෙකි. අහක් සේ තියුණු බැවින් ද තද බැවින් ද අහ අන්‍ය වස්තූන් සිදුරු කරන්නට පුළුදු කරන්නට සමත් වන්නාක් මෙන් කුසලය සිදුරු කරන්නට පලුදු කරන්නට සමත් බැවින් රාගයට සිංග යයි කියනු ලැබේ. කැමතීම අඩු වුවත් ශරීරය හා වාසස්ථානය සරසාගෙන සිටීමත් සුමිහිරි ව්‍යක්ත කථාව ඇති බවත් මේ සිංග නම් වූ රාගය අධික වූවහුගේ ලක්‍ෂණය ය. මෙය ධනාශාවට වඩා අනර්ථ දයකය. බොහෝ පැවිද්දන් පැවිද්ද කිලිටි කර ගන්නේත් පැවිද්දෙන් පහවන්නේත් මේ සිංග නම් වූ රාගය ඇති වීමෙනි. ධ්‍යාන ලබා අහසින් ගමන් කරන පැවිද්දෝ ද මේ සිංගය නිසා ධ්‍යානයෙන් පිරිහී පියාපත් සුන් පක්‍ෂීන් මෙන් බිම වැටෙති. බොහෝ තරුණ තරුණියෝ මේ රාගය නිසා සියදිවි නසා ගනිති. මද දැක්වීමෙහි දී මෙය නො කියවුවත් මෙය ද සත්ත්වයා අතිශයින් මත් කරවන උමතු කරවන ක්ලේශයකි. **මනෝරථපූරණී අටුවාවෙහි** එන කථාවක් මෙසේ ය:–

**මහාදඨික** නම් රජතුමා සෑගිරියේ අම්බස්තලයෙහි මහා සෑයක් කරවා **ගිරිභණ්ඩවාහන පූජාව** නම් මහා පූජාවක් කොට කලින් කල සෑගිරියට ස්ත්‍රීන් ද පිරිවරා ගොස් මහා දනයක් දෙයි. ඒ රජුට තරුණ වූ ඉතා දර්ශනීය සිරුර ඇති **දමිළදේවී** නම් දේවියක් වූවා ය. **චිත්තත්ථෙර** නම් වූ බුඩ්ඪපබ්බජිතයකුට ඇය දැකීමෙන් බලවත් ලෙස රාගය ඇති විය. ඒ මහණ යන යන තැන දමිළ දේවිය ගැන ම කියන්නට විය. ඒ නිසා ඔහුට උම්මත්තක චිත්තත්ථෙර යන නම ඇති විය. දමිළ දේවිය නොබෝ කලකින් කලුරිය කළා ය. භික්ෂු සංඝයා වහන්සේ ඇගේ මළ සිරුර දැකීමට ගොස් පැමිණි පසු සාමණේරයෝ චිත්ත ස්ථවිරයන් වෙත ගොස් “ස්වාමීනි, ඔබ වහන්සේ නිතරම කියමින් සිටි දමිළ දේවිය කලුරිය කළා ය. අපි ඇගේ මළ සිරුර දක්නට ගොස් පෙරලා ආවෙමු” යි කීහ. එය නො අදහා චිත්ත ස්ථවිර උමතු කතා ම කියන්නට වූයේ ය. මේ මනෝරථපූරණියේ එන කතාව ය.

රාගයෙන් මත් වූවකුට නො කළ හැකි නීච වැඩක්, නො කළ හැකි පාපයක් නැත. රාගයෙන් මත්වූවෝ පරම අපවිත්‍ර ස්ථානයන්

Non-commercial distribution

සිඹිති. ලෙවකති. ලෝකාචාරය නො දැනී ගොස් පියවරු දූවරුන් හා ද පුත්තු මවුන් හා ද සහෝදරියෝ සහෝදරියන් හා ද අසද්ධර්මයෙහි යෙදෙති. ඇතැම්හු මාපියන් පවා මරති. එබැවින් මෙය භයානක ක්ලේශයෙකි. දුරු කිරීමට ද දුෂ්කර ක්ලේශයෙකි. රාගයෙන් මත් වූයේ කිසිවකුගේ අවවාදනුශාසනයත් නො පිළිගනී. රාගය දුරු කර ගැනීමට ඇති උපාය නම් අශුභ භාවනාව ය.

## 36. තින්තිණං

ආහාර පාන වස්ත්‍රාදියට ලොල් බව **තින්තිණ** නම් වේ. බෙදන තැනදී මෙය මටය, මෙය නුඹටය, මෙය මාගේය, මෙය නුඹේය කියා පොර කෑම හා කෑ ගැසීම; කෑම ලබාගැනීමට නගුට වනමින් යටහත්කම දක්වමින් බලා සිටින සුනඛයා මෙන් ලැබෙන තැන ලැබෙන තුරු යටහත් ව බලා සිටීම, හොඳ හොඳ දෙය බලාපොරොත්තු වීම තින්තිණ නම් ක්ලේශයේ ලක්ෂණය ය.

## 37. චාපල්‍යං

කියන දෙය වරින් වර වෙනස් කරන වරින් වර එක එක අතට හැරෙන චාසි පැත්ත සොයන ස්ථිරගති නැති අයට ලෝකයෙහි චපලයෝය යි කියති. මෙහි **චාපල්‍යං** යන වචනයෙන් දක්වන්නේ ඒ අර්ථය නොවන බව දත යුතුය. මේ ක්ලේශ දක්වන තැන අදහස් කරන්නේ ශරීරය හා පරිභෝග කරන වස්තූන් ද වාසස්ථාන ද සරසා ගැනීමේ ආශාවය. මෙය ගිහි පැවිදි කාහටත් ඇතිවන ක්ලේශයකි. ගිහි කාමභෝගීහු නොයෙක් ඇඳුම් පැළඳුම් වලින් ශරීරය සරසති. වාසස්ථාන සරසති. පාරිභෝගික භාණ්ඩ සරසති. එයින් ඔවුනට කෙලෙස් වැඩේ. කෙලෙස් බැහැර කිරීමට මහණදම් පුරන පැවිද්දන් චාම් ලෙස ජීවත් විය යුතුය. ශරීරය හා චීවරාදිය පිරිසිදුව තබා ගැනීම පමණක් කළ යුතුය.

## 38. අසභාගවුත්ති

අනුකූල විය යුතු සැලකිය යුතු ගරු කළ යුතු මාපිය ගුරුවරාදීන්ට අනුකූල නොවන ස්වභාවය **අසභාගවුත්ති** නම් වේ.

Non-commercial distribution

මෙය ඒ ආකාරයෙන් ඇති වන මානය හා ද්වේෂය ය. අසභාගවුත්තිතාවෙන් යුක්ත වන පුද්ගලයාට මාපියන්ට නො සලකා සිටීම විරුද්ධව සිටීම මිහිරකි. මෙය ඉතා පහත් අසත්පුරුෂ ලක්ෂණයෙකි. එයින් යුක්ත වූ පාපී පුද්ගල තෙමේ මව හෝ පියා හෝ සහෝදරයෙකු හෝ සහෝදරියක හෝ අන් සැලකිය යුත්තකු හෝ ගිලන් වුව ද පැත්තවත් නොබලයි. පියා අයත් දෙය සම්බන්ධයෙන් මව හා කෝලාහල කරයි. මව අයත් දෙය සම්බන්ධයෙන් පියා හා කෝලාහල කරයි. මාපියන් අයත් දේ සම්බන්ධයෙන් සහෝදර සහෝදරියන් හා කෝලාහල කරයි. මාපියන්ට නො වඳී. ඔවුන් දුටු විට හුනස්නෙන් නො නැගිටී. මාපියන් බිම සිටියදී අසුනෙහි හිඳී. මාපියන් නීචාසනයේ සිටියදී තමා උසස්නෙහි හිඳී. මාපියන් ගේ වැඩ වලට සහාය නොවේ. මාපියන් පහත් කොට සලකයි. අසභාගවුත්තිතාව ඇති පැවිද්ද ද ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ගිලන් වුව ද හැරී බැලීමකුදු නො කර යයි. විහාරයේ වෙසෙන අනිකකු ගිලන් වුව ද එසේ ම කරයි. ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන්ට හා වැඩිමහලු භික්ෂූන්ට නො වඳී. විහාරයට චෛත්‍යයට බෝධියට ගරු නො කරයි. සෑ මලු බෝ මලුවල වහන් පයලා ගමන් කරයි. කුඩ ඉසලා ගමන් කරයි. සංඝයාට ගරු නො කරයි.

මා පියන් බොහෝ දුක් විඳ බොහෝ වෙහෙසී දියුණු කළ ඇතැම් දරුවෝ තමන් උසස් තත්ත්වයකට පැමිණි පසු මම දැන් මවුපියන්ට වඩා උසස් තත්වයක සිටිමි ය, ඔවුන්ගෙන් මට වැඩක් නැත කියා මාපියන් පහත් කොට සලකමින් හැසිරෙති. ඇතැම් පැවිද්දෝ ද ගුරුවරුන් ගේ ආධාරයෙන් උසස් තත්වයට පැමිණි කල්හි දැන් මම ගුරුවරයාට වඩා උසස් තත්වයක සිටිමියි ගුරුවරුන් නොසලකා හරිති. මහලුව දුබලව සිටින ගුරුවරුන්ට අවමන් කරති. ගුරුවරයා තමා යටතට ගන්නට තැත් කරති. මාපියන් ගුරුවරුන් තමන් යටතට ගන්නට තැත් කිරීම ඔවුනට ගරු නො කිරීම මෙලොව ද පිරිහීමට හේතු වන බලවත් පාපයෙකි.

දරුවෝ මාපියනට ප්‍රියයෝ ය. දරුවා ගැන මාපියන් ගේ සිත්හි ඇතිවන ඒ ප්‍රියත්වය කුශල ධර්මයක් නො වේ. එය රාග නමැති ක්ලේශය ය. දරු සුරතලය මාපියන්ට මිහිරකි. කැවීම් පෙවීම් නෑවීම් හැඳවීම් පැළඳවීම් ආදියෙන් දරුවන්ට සත්කාර

Non-commercial distribution

කිරීමත් මාපියන්ට මිහිරකි. ඒ සියල්ල ම කෙරෙන්නේ රාග නමැති ක්ලේශයෙන් ම ය. එහෙත් දරුවන් විසින් මා පියන්ට ගරු කළ යුතුය. බුදුසසුනෙහි මහතෙරවරුන් ගෝලයන් ඇති දැඩි කරන්නේ ගෝලයන් දියුණු කරන්නේ රාගාදි යම්කිසි ක්ලේශයකින් නොව මෛත්‍රී කරුණාදි කුශල ධර්මවලිනි. එබැවින් මාපියන්ට ද වඩා ගුරුවරුන්ට ගරු කළ යුතුය. එබැවින් බුදුසසුනෙහි දෙවැනි තැන ලබා සිටි ශ්‍රාවකයන්ගෙන් මුල් තැන ලබා සිටි උසස් ම බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ වන සැරියුත් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේට බුදුසසුනට ඇතුළු වීමට මුලින්ම මග පෙන්වූ ගුරුවරයා වන අස්සජී තෙරුන් වහන්සේට දිනපතා වැඳීම කළහ. අස්සජී තෙරුන් වහන්සේ නැති තන්හිදී උන්වහන්සේ වැඩ සිටින දිශාවට හැරී වැඳ ඒ දිශාවට ම හිස ලා ශයනය කළහ. මෙය භික්ෂූන් විසින් ආදර්ශයට ගත යුතු කරුණෙකි.

මාපියන්ට ගුරුවරුන්ට අනුකූල පැවැත්මක් නැතිව ඔවුන්ගේ සිත් රිදවන අයට එයින් වන අනිෂ්ඨ විපාක මෙලොවදීමත් නොයෙක් විට විඳින්නට සිදු වේ. එසේ කරන අසත්පුරුෂයන්ට සත්පුරුෂයෝ පිළිකුල් කෙරෙති. ඔවුහු ජනයාට අප්‍රියයෝ වෙති. අනුන්ගෙන් උපකාර වුවමනා අවස්ථා කාහටත් එළඹේ. අනුන්ට අනුකූල පැවතුම් නැති උඩඟු පුද්ගලයා එබඳු අවස්ථාවක් පැමිණි විට තනි වේ. එබඳු පුද්ගලයන්ට උපකාරයට කිසිවෙක් ඉදිරිපත් නො වෙති.

## 39. අරති

ආරණ්‍ය සේනාසනයන්හි හා විවේකස්ථානයන්හි විසීම ගැනත්, ශමථවිදර්ශනා භාවනාවන්හි යෙදීම ගැනත් ශීලය සම්පූර්ණ කිරීම ගැනත් පැවිද්දන්ට ඇති වන අප්‍රියතාව හා ශීලසමාදන භාවනා ආදිය පිළිබඳ ව ගිහියන්ට ඇතිවන නො සතුටත් **අරති** නම් වේ. එය ඒ ආකාරයෙන් ඇති වන සූක්ෂම ද්වේෂය ය.

## 40. තන්දි

වත් පිළිවෙත් කිරීම් භාවනා කිරීම් ආදි කුශල ක්‍රියාවන්ට අලස බව **තන්දි** නම් වේ. මෙයින් කියනුයේ රෝගාදිය නිසා

Non-commercial distribution

ඇතිවන කයේ අලස බව නොව ක්ලේශයන් නිසා සිතෙහි හටගන්නා අලස බව ය.

## 41. විජම්භිතා

කය පණ නැති කරන ඉස්සරහට පස්සට දෙපසට ඇළ කරන අමාරුවෙන් නැගිටවන අලස බව **විජම්භිතා** නම් වේ.

## 42. භත්ත සම්මදෝ

පමණට වඩා ආහාර ගැනීම නිසාත්, අපථ්‍යාහාර ගැනීම නිසාත් ශරීරයේ ධාතු කෝපයෙන් හට ගන්නා වූ අලස බව **භත්තසම්මද** නම් වේ. මෙය ද ආහාර හේතුවෙන් ඇති වන ථීනමිද්ධය ම ය.

## 43. චේතසෝ ලීනත්තං

සිතෙහි අලස බව **චේතසෝ ලීනත්තං** නම් වේ. එයත් ථීනමිද්ධය ම ය. එය ඇති කල්හි සිත හැකිලෙයි. ක්‍රියාවන්හි යෙදීමට නො සමත් වෙයි. ක්‍රියාවෙහි යෙදෙන්නේ ද ඉතා සෙමින් නවත්ව නවත්වමින් ක්‍රියා කරයි. නිදිමත වැඩි වෙයි. තන්දි විජම්භිතා භත්තසම්මද චේතසෝලීනත්ත යන මේ ක්ලේශයෝ වීර්‍ය්‍යයට විරුද්ධ වූවෝ ය. ශිෂ්‍යයන්ට උගෙනීමට ද, රැකියා කරන්නවුන්ට දියුණුවට ද, යෝගීන්ට යෝගයට ද බාධකයෝ ය.

## 44. කුහනා

කුහනා, ලපනා, නේමිත්තිකතා, නිප්පේසිකතා, ලාභේන ලාභං නිජිගිංසනතා යන මේවා පැවිද්දන්ට ඇති විය හැකි ක්ලේශයෝ ය.

ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ලබනු පිණිස ප්‍රණීත චීවර පිණ්ඩපාතාදිය පරිභෝග නො කොට නො වටනා රූක්ෂ චීවර පිණ්ඩපාතාදිය පරිභෝග කිරීමෙන් ද, ධ්‍යානාභිඥා මාර්ගඵල යන උත්තරී මනුෂ්‍ය ධර්මයන් ඇතියෙකැ යි හැඟෙන ලෙස කතා කිරීමෙන්

Non-commercial distribution

ද, එසේ හැඟෙන ලෙස ගමනාදි ඉරියව් පැවැත්වීමෙන් ද ජනයා විස්මයට පත් කිරීම රැවටීම **කුහනා** නම් වේ.

ඇතැම් කුහක භික්ෂූහු ගිහියන් සිවුරු පූජා කරන්නට දන් දෙන්නට ආවාස පන්සල් කරවන්නට කථා කළ හොත් ඔවුන් රවටා වඩ වඩා ලබා ගන්නා අදහසින් "හොඳ ඇඳුම් ප්‍රණීත ආහාර හොඳ ගෙවල් වුවමනා කාමභෝගී ගිහියන්ට ය. මහණදම් පුරන අපට, කෙබඳු සිවුරක් තිබුණත් ඇතය, මේ සිවුරු අපට හොඳය තවත් අපට සිවුරු වුවමනා නැත, අපට ගෙදෙරක් පාසා සිඟා ගොස් ලබන පිණ්ඩපාත භෝජනය ඇත, තවත් දන වුවමනා නැත, අපට කොහිත් විසිය හැකිය, වටිනා අවාස පන්සල්වල විසීමෙන් කෙලෙස් වැඩෙනවා ය, අපට කැලෑවක ගසක් මුල හෝ ගුහාවක අතුපැලක විසීම වඩා හොඳය" කියා ප්‍රත්‍යයන් ප්‍රතික්ෂේප කරති. හොඳ ඇඳුම් පැළඳුම් ආහාර පාන යාන වාහන ගෙවල් ඇති ව සැපසේ ජීවත් වන්නන් ගැන බොහෝ දෙනාට ඇති වන්නේ ඊර්ෂ්‍යාව ය. ඔවුනට ප්‍රත්‍යයන් ප්‍රතික්ෂේප කරන භික්ෂුව ගැන ඇති වන්නේ සතුටෙකි. ඔවුහු ප්‍රත්‍යය ප්‍රතික්ෂේප කරන පැවිද්දගේ අභ්‍යන්තරය ගැන නො දන්නා බැවින් මුන් වහන්සේ අන්‍ය භික්ෂූන්ට වඩා ගුණවත් උත්තමයෙක, දන් දිය යුත්තේ උපස්ථාන කළ යුත්තේ මෙබඳු උත්තමයන්ට යයි සිතා නැවත නැවතත් දන් දෙන්නට පූජා සත්කාර කරන්නට කථා කරති. එකල්හි කුහක භික්ෂුව මෙසේ බණ කියයි. "ශ්‍රද්ධාව ය, දීමට වස්තුව ය, සුදුසු ප්‍රතිග්‍රාහකයෝ ය යන මේ තුන සම්මුඛ වීමෙන් ශ්‍රද්ධාවත් කුල පුත්‍රයා බොහෝ පින් රැස් කර ගන්නේ ය' යි බුදුන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය. මේ පින්වතුන්ට අඩුවක් නැතිව ශ්‍රද්ධාව ඇත්තේ ය. දීමට ධනය ද ඇත්තේ ය. නැත්තේ පිළිගැනීමට ප්‍රතිග්‍රාහකයන් ය. අප මේ පින්වතුන් දෙන දනය නො පිළිගත හොත් මේ පින්වතුන් කරන පූජා සත්කාරයන් නො පිළිගත හොත් මේ පින්වත්හු පිනෙන් පිරිහෙන්නාහ. එබැවින් මේ පින්වතුන්ගේ යහපත පිණිස අපි මින් පසු සැදැහැවතුන් දෙන ප්‍රත්‍යයන් පිළිගන්නෙමුය" යි කියයි. එයට සතුටු වන ගිහියෝ ඉන් පසු ඔහු වෙත ආහාර පානයන් ගොඩ ගසති. පිරිකර ගොඩ ගසති. ඔහුට විසීම සඳහා බොහෝ ගිහියන්ට ද නැති තරමේ, සුවපහසු ඇති

Non-commercial distribution

ලස්සන ගෙවල් තනා දෙති. ඉන්පසු කුහක මහණ එහි වෙසෙමින් සුවසේ කල් යවයි. මේ **ප්‍රත්‍යය ප්‍රතික්ෂේප කිරීමෙන්** බොහෝ ප්‍රත්‍යය ලබා ගන්නා ආකාරය ය.

තමා කෙරෙහි නැති උත්තරී මනුෂ්‍ය ධර්ම නම් වූ ධ්‍යාන අභිඥා මාර්ගඵල ධර්මයන් ඇති බව ප්‍රකාශ කළ හොත් එයින් භික්ෂුව පරිජි ඇවතට පැමිණේ. ඇත්තා වූ උත්තරී මනුෂ්‍ය ධර්මය වුව ද අනුපසම්පන්නයකුට කිවහොත් පචිති ඇවැත් වේ. කුහක භික්ෂුව ඇවැත්වලට අසු නොවන පරිදි තමා උත්තරීමනුෂ්‍ය ධර්ම ඇත්තකු සේ ගිහියන්ට හැඟෙන පරිදි වටින් පිටින් කතා කරයි. ධ්‍යානලාභී ඍද්ධිබල ඇතියෝ අප වැනි අය ම ය. මෙවැනි සිවුරු පොරවා සිටින අය ය. මෙවැනි තැන්වල වෙසෙන අය ය. අපගේ උපදෙස් අනුව ධ්‍යාන ලබා සිටින අය, සෝවාන් වී සකෘදගාමී වී අනාගාමී වී රහත් වී සිටින අය බොහෝ ඇත්තා හ. අප ආචාර්‍ය්‍යයන් වහන්සේගේ ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් ධ්‍යාන ලාභීහු ය. සෝවාන් පුද්ගලයෝ ය, සකෘදගාමීහුය, අනාගාමීහුය, රහත්හුය යනාදීන් ගිහියන් හමුවෙහි කථා කරයි. එය අසන ගිහියෝ මුන් වහන්සේ එසේ මෙසේ කෙනෙක් නො වෙතිය, මුන්වහන්සේත් උසස් තත්වයක් ඇති කෙනෙක් විය යුත්තෝ ය යි සිතා උපස්ථාන කරති. බොහෝ චීවරාදි ප්‍රත්‍යයන් පිරිනමති. මේ **වටින් පිටින් කථා කිරීමෙන්** ප්‍රත්‍යය ලබන ආකාරය ය.

කිසි කුහක පැවිද්දෙක් ලාභාශාවෙන් තමා ධ්‍යාන ලාභියකු සේ ආර්‍ය්‍යපුද්ගලයකු සේ දක්වා ජනයන් රවටනු පිණිස ගමනාදි ඉරියව් පවත්වයි. ඔහු මිනිසුන් පැහැදවීම පිණිස, ලාභාපේක්ෂාවෙන් “මා රහත් කෙනෙකැයි සිතත්වා” යි අති ශාන්ත භාවයක් දක්වමින් බිම බලා ගෙන සෙමින් ගමන් කරයි. කය සෘජු ව තබා නිශ්චලව හිඳී. නිශ්චලව සිටී. සිංහ සෙය්‍යාවෙන් ශයනය කරයි. ගමන් කරන කල්හි මිනිසුන් හමු වුව ද ඔවුන් දෙස නොබලයි. ඔවුන් හා කථා නොකරයි. හිඳින විට මිනිසුන් පැමිණියේ ද ඇස පියා ගෙන ඔවුන් දෙස නො බලමින් කථා නො කරමින් සිටී. මිනිසුන් එසේ සිටින භික්ෂුව මහ සිල්වතෙක, සමාධි ලාභියෙකැ යි සිතා වඩ වඩා ඒ භික්ෂුවට පූජා සත්කාර කෙරෙති. මේ **ඉරියව් පැවැත්වීමෙන්** මිනිසුන් රවටා ප්‍රත්‍යය ලබන ආකාරය ය.

Non-commercial distribution

## 45. ලපනා

ප්‍රත්‍යයන් ලැබෙන පරිදි කථා කිරීම ලපනා නම් වේ. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා බලාපොරොත්තු වන, ඒවාට ගිජු වූ කථාවෙහි දක්ෂ වූ ඇතැම් කුහක පැවිද්දෝ කථාවෙන් ඒවා ලබා ගැනීමට උත්සාහ කරති. කථාවෙන් ප්‍රත්‍යය ලැබීමට බලාපොරොත්තු වන කුහක පැවිද්ද විහාරයට ගිහියකු පැමිණි කල්හි මහත්මයා ආයේ ආරාධනාවක් කරන්නට ද? මහත්මයාට කොපමණ භික්ෂූන් වුවමනාද? වුවමනා පමණක් භික්ෂූන් මට වැඩම කරවා දිය හැකිය යනාදීන් කථා කරති. අසවල් ඇමතිතුමා අසවල් මන්ත්‍රීතුමා අසවල් මහත්මයා අපගේ දායකයෝය, මෙහි නිතර පැමිණෙන්නෝය යනාදීන් තමාගේ උසස් බව පෙනෙන්නට කථා කරයි. මේ මහත්මයා, මේ මහත්මිය හොඳට පින් කරන අයය, අතීතයේ මෙසේ පින් කර ඇති අයය, මහා දනපතියෝය, දීමට යමක් ඇතියෝය යනාදීන් උසස් කොට කථා කරයි. මේ මහත්වරු අන් අවුරුදුවල නම් මේ මාස වලදී පින්කම් කරන්නෝය, දන් දෙන්නෝය, මේ වර්ෂයේ තව ම නැත්තේ අවකාශ නො ලැබූ නිසා ද යනාදීන් දෙමිය කියන තෙක් නොයෙක් ලෙසින් කථා කරයි. මේ පවුලේ අය සෝවාන් පුද්ගලයන් වැනියෝය, යමක් ලදහොත් අප අමතක නො කරන්නෝය, හොඳ දෙයක් ලද හොත් එය අපට ම දෙන්නෝය යනාදීන් බොරු කරුණාව මෛත්‍රිය හිතවත්කම දක්වා කථා කරයි. දායකයා සතුටු වන පරිදි ඔහු කියන කුමක් වුව ද සත්‍යය, ධර්මය අපේක්ෂා නො කොට අනුමත කරමින් කථා කරයි. බොරු සැබෑ මිශ්‍ර කොට කථා කරයි. දායකයන් ගේ දරුවන් සුරතල් කරයි. මේ කථාවෙන් ප්‍රත්‍යය ලබාගන්නා ආකාරය ය.

## 46. නේමිත්තිකතා

තමන්ට වුවමනා දෙය ගිහියන්ගෙන් කෙළින්ම ඉල්ලීමක් නො කොට එය ලබා ගැනීම පිණිස කයින් හෝ වචනයෙන් හෝ යම්කිසි නිමිත්තක් දැක්වීම **නේමිත්තිකතා** නම් වේ. නේමිත්තිකතාව පිළිබඳව **විභංග අටුවාවෙහි** එන කථාවක් මෙසේ ය.

එක් ජාතක භාණක භික්ෂුවක් දිනක් වැළඳීමේ බලාපොරොත්තු-වෙන් එක් උපාසිකාවකගේ නිවසකට ඇතුළු වී හිඳ ගත්තේය.

Non-commercial distribution

භික්ෂුවට සංග්‍රහ කිරීමට කැමති නො වූ උපාසිකාව 'අද උයන්නට දෙයක් නැත' යයි කියමින් සහල් සෙවීමට යන ආකාරය දක්වා සමීප ගෙයකට ගියා ය. භික්ෂුව ඒ අතර ගෙට ඇතුළු වී බලනුයේ ගෙය තුළ එක් තැනක උක් දණ්ඩකුත් භාජනයක සකුරුත් කුඩයක ලුණු මාලු පෙත්තකුත් සැළියක සහලුත් කළයක ගිතෙලුත් තිබෙනු දැක, කිසිවක් නොදන්නාක් මෙන් එළියේ වාඩි වී හුන්නේ ය. උපාසිකාව 'අද සහල් ටිකක්වත් ලබා ගන්නට නො පුළුවන් වී ය'යි කියමින් ගෙට ආවා ය. එකල්හි භික්ෂුව "උපාසිකාවෙනි. අද දනය හරි නො යන බව මා කළින් ම දැන ගත්තා ය. අතර මගදී නිමිත්තක් දුටුවෙමි" යි කීය. උපාසිකාව විසින් "ස්වාමීනි, ඒ කුමක්දැ"යි ඇසූ කල්හි "මම මගදී අර කවුළුව සමීපයේ ඇති උක්දණ්ඩ වැනි සර්පයකු දුටිමි, ඌ පලවා හැරීමට ගැසීමට දෙයක් වටපිට බලන කල්හි අර භාජනයේ ඇති සකුරු කැට වැනි මැටි දැක, ඒවායින් ඌට ගැසුවෙමි. ඌ පෙණය කළේය. උගේ පෙණය අර කුඩයේ ඇති ලුණු මාලු පෙත්ත වැනිය. උගේ දත් අර සැළියේ ඇති සහල් ඇට වැනිය. උගේ කටින් හෙළූ කෙළ අර සැළියේ ඇති ගිතෙල් වැනිය'යි කීය. උපාසිකාව "මේ මහණා රැවටිය හැකි කෙනකු නො වෙති"යි උක් දණ්ඩ දී බත් පිස ලුණුමාලු සකුරු ගිතෙල් සමග භික්ෂුවට දුන්නා ය. එසේ රවටා ප්‍රත්‍යය ලබන ස්වභාවය නෛමිත්තිකතා නම් ක්ලේශය ය.

## 47. නිප්පේසිකතා

නො දෙන්නවුන්ට ආක්‍රෝශ කිරීම් ආදියෙන් පීඩා කොට ප්‍රත්‍යය ලබා ගන්නා ස්වභාවය **නිප්පේසිකතා** නම් වේ. නිප්පේසිකතා ඇති පැවිද්ද ප්‍රත්‍යය ලබනු පිණිස නො දෙන්නවුන්ට ආක්‍රෝශ කරයි. පහත් කොට කථා කරයි. මසුරෙක, ශ්‍රද්ධාව නැතියෙක, ලෝභියෙක කියා නින්ද කරයි. මොහු මහා දනපතියෙක, සැමදම නැතය යන වචනය දෙතිය කියා විසුළු කරයි. මසුරෙකු කියා නො දෙන්නාගේ අවගුණ පතුරවයි. ඉදිරියේදී ගුණ කියා නැති තැන නින්ද කරයි. එසේ කරන භික්ෂුවට ඔහුගේ කරදරයෙන් බේරීම පිණිස නො කැමැත්තෙන් වුව ද දෙති.

Non-commercial distribution

## 48. ලාභේන ලාභං නිජිගිංසනතා

ලාභ කාමයෙන් කෙනකුගෙන් ලද දෙය අනිකකුට ද ඔහුගෙන් ලද දෙය තවත් කෙනකුට ද දීමෙන් වඩා හොඳ දේවල් ලබන තණ්හාව **ලාභෙන ලාභං නිජිගිංසනතා** නම් වේ. මෙය විභංග ප්‍රකරණයෙහි විස්තර කර ඇත්තේ පිණ්ඩපාතය පිළිබඳව ය. ගෙන් ගෙට පිණ්ඩපාතය ගෙන ගොස් දෙන අය මේ රටේ දක්නට නැත. සමහරවිට විදේශවල සිටිය හැකි ය. කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පේසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේ ක්ලේශයන් විස්තර කර ඇත්තේ පැවිද්දන් සම්බන්ධයෙනි.

## 49. සෙය්‍යො හමස්මීති මානෝ

සෙය්‍යෝහමස්මීති මානෝ යනු මම ජාතියෙන් හෝ කුලයෙන් හෝ ගෝත්‍රයෙන් හෝ රූපසම්පත්තියෙන් හෝ තනතුරෙන් හෝ උගත්කමින් හෝ නුවණින් හෝ යම්කිසි ශිල්පයකින් හෝ ශාස්ත්‍රයකින් හෝ වෙනත් කරුණකින් හෝ අන්‍යයන්ට වඩා උසස්ය කියා ඇති වන හැඟීම ය. ආත්මය කොඩියක් මෙන් කොතක් මෙන් උස් කොට සලකන්නා වූ ස්වභාවය ය.

## 50. සදිසෝ හමස්මීති මානෝ

සදිසෝ හමස්මීති මානෝ යනු මම ද ජාතිගෝත්‍රාදියෙන් උසස් වන අන්‍යයන් හා සමාන කෙනෙක් වෙමි යයි ආත්ම භාවය උසස් කොට ගන්නා ස්වභාවය ය.

## 51. හීනෝ හමස්මීති මානෝ

මම ජාති ගෝත්‍ර ධනාදියෙන් අන්‍යයන්ට හීනය කියා තමා පහත් කොට සලකන, සිතන ස්වභාවය ය. මේ මාන තුනට පිළිවෙලින් සෙය්‍යමානය, සදිසමානය, හීනමානය යන නම් කියනු ලැබේ. මානය ලෝභ ද්වේෂයන් තරම් නපුරු ක්ලේශයක් නො වේ. එය පුද්ගලයාගේ දියුණුව පිරිහීම යන දෙකට ම හේතු වන පින් පව් දෙකට ම හේතුවන ක්ලේශයකි. සෙය්‍යමාන සදිසමානයන්

Non-commercial distribution

ඇතියෝ ආත්ම ගෞරවය ඇත්තෝ ය. තමන්ගේ ගෞරවය රැක ගැනීමේ අදහසින් උගෙනීම් ධන සැපයීම් ආදියෙහි යෙදී; සිටි තත්වයට වඩා උසස් තත්වයට ඔවුහු පැමිණෙති. ආත්ම ගෞරවය රැක ගත යුතු බැවින් නීච ක්‍රියාවලින් පව්කම් වලින් වැළකෙති. අන්‍යයන්ගේ යහපත පිණිස වැඩ කරති. දානාදී පින්කම් කෙරෙති. තත්වයෙන් උසස්ව සිටින බොහෝ දෙනෙකුන් නීච ක්‍රියා නො කරන්නේත්, පව්කම් වලින් වැලකී සිටින්නේත්, අන්‍යයන්ගේ යහපත සඳහා වැඩ කරන්නේත්, පින්කම් කරන්නේත්, ආත්ම ගෞරවය රැක ගැනීමේ අදහසිනැයි කිය යුතුය. හීනමානය ඇතියහුට රැක ගැනීමට ගෞරවයක් නැත. ඔවුන්ගෙන් ඇතැමෙක් තමන්ගේ හීනත්වය ගැන කලකිරී ඉන් මිදෙනු පිණිස මහෝත්සාහයෙන් ඉගෙනීමෙහි, ධනය සැපයීමෙහි, පින්කම්හි යෙදෙති. පව්කමින් වළකිති. එසේ කිරීමෙන් හීනමානය නිසා ඔවුහු දියුණු වෙති. එසේ දියුණු වූවන් අද ලෝකයේ බොහෝ දෙනෙකුන් ඇති බව කිය හැකිය. අධික වූ කල්හි හීනමානය ද පුද්ගලයා මත් කරන ක්ලේශයකි. එයින් මත් වූවහුට ජීවිතය ද එපා වේ. විභාග වලින් සමත් නො වීම, රැකියා නැති වීම, රටට මුහුණ දිය නොහෙන නීච ක්‍රියා තමා අතින් සිදු වීම යන මේ කරුණුවලින් ඇතැමුන් දිවි නසා ගන්නේ ඔවුනට ඇතිවුණු හීනමානය නිසා ය. හීනමානය ඇතියහුට රැකගතයුතු ආත්ම ගෞරවයක් නැත. එබැවින් ඔහු වුවමනා වුවහොත් කිනම් නීච ක්‍රියාවක් වුව ද කරයි. කිනම් දරුණු පවක් වුව ද කරයි. එයින් ඔහු වඩ වඩාත් පිරිහී මරණින් මතු අපායට පැමිණේ.

## 52 සෙය්‍යස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ

සෙය්‍යස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ යනු ජාති කුල ගෝත්‍ර ධනාදි කරුණකින් උසස් පුද්ගලයකු හට ලෝකයේ හෝ රටේ ම හෝ පලාතේ ම හෝ මා වැනි අනිකෙක් කොයින් ද? මම ම සැමට වඩා උසස් වෙමියි ඇති වන මානය ය. මෙය රජුන්ට හා පැවිද්දන්ට ඇති වන මානයකැයි අටුවාවෙහි කියා තිබේ. මට පමණ ධන බලය, සේනා බලය, වාහන බලය ඇති අන් රජෙක් කොහි ඇත්තේ ද? මම ම ලෝකයේ ශ්‍රේෂ්ඨ රජ වෙමියි රජුන්ට මේ මානය ඇති වේ. ශීල ගුණ ධුත ගුණ ආදියෙන් මට සමාන අනිකෙක් කොහි

Non-commercial distribution

ඇත්තේ ද? මම ම ශ්‍රේෂ්ඨ වෙමි' යි මේ මානය ඇතැම් පැවිද්දන්ට ඇති වේ. අටුවාවෙහි මෙසේ කියා තිබුණත් මා වැනි පණ්ඩිතයෙකු කොහි ඇත්තේ ද? මම පණ්ඩිතයන්ගෙන් ශ්‍රේෂ්ඨ වෙමිය කියා පණ්ඩිතයකුට ද මා වැනි ධනවතකු කොහි ඇත්තේ ද? කියා ධනවතකුටත් තවත් අයටත් මේ මානය ඇති වන්නට බැරි නැත.

## 53. සෙය්‍යස්ස සදිසෝ හමස්මීති මානෝ

සෙය්‍යස්ස සදිසෝ හමස්මීති මානෝ යනු ජාති කුල ගෝත්‍ර ධනාදියෙන් උසස් පුද්ගලයකු හට මමත් අන්‍ය උසස් අය මෙන්ම ජාත්‍යාදියෙන් උසස් වෙමියයි ඇති වන මානය ය. සේනා ධන වාහන සම්පත් ඇති අන් රජුන්ට මෙන් මටත් ඒවා ඇත්තේය. මම ද කිසිවකින් ඔවුන්ට පහත් නොවෙමියි කියා රජුන්ට ද; අන් පැවිද්දන්ට මෙන් මටත් ශීල ධූත ගුණ ඇත්තේ ය, මම ද කිසිවකින් ඔවුනට දෙවෙනි නො වෙමි යි කියා පැවිද්දන්ට ද මේ මානය ඇති වේ.

## 54. සෙය්‍යස්ස හීනෝ හමස්මීති මානෝ

සෙය්‍යස්ස හීනෝ හමස්මීති මානෝ යනු උසස් පුද්ගලයන් වන රාජාදීන්ට තමා හා සම තත්වයේ සිටින අන්‍යයන්ට යම් යම් කරුණු වලින් තමා පහත්ය කියා ඇති වන හීනමානය ය. මඳ සේනා ධන සම්පත් ඇති රජුන්ට අන් රජුන් ගේ මහත් වූ සම්පත්තිය ගැන ඇසූ කල්හි මම කුමන රජෙක් ද? මට ඇත්තේ රජය යන නම පමණෙකැයි තමා පහත් කොට සලකන මේ හීනමානය ඇති වේ. ලාභසත්කාර මඳ ගුණවත් උගත් මහතෙරවරුන්ට ද, සලකන කෙනකුන් නැති කිසි ලාභ සත්කාරයක් නැති මම කිනම් මහතෙර කෙනෙක් ද? කිනම් උගතෙක් ද? කියා මේ හීනමානය ඇති වේ.

## 55. සදිසස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ

සදිසස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ යනු තමා හා ජාතිගෝත්‍ර ධනාදියෙන් සමාන අය ඇතියකුට තමා අන්‍යයන්ට උසස් ය කියා ඇති වන මානය ය.

Non-commercial distribution

## 56. සදිසස්ස සදිසෝ හමස්මීති මානො

සදිසස්ස සදිසෝ හමස්මීති මානෝ යනු තමා හා ජාතිගෝත්‍ර ධනාදියෙන් සමාන අය ඇතියකුට මම ද අන්‍යයන්ට සමාන වෙමි යි ඇතිවන මානය ය.

## 57. සදිසස්ස හීනෝ හමස්මීති මානෝ

සදිසස්ස හීනෝ හමස්මීති මානෝ යනු තමා හා තත්ත්වයෙන් සමාන තවත් අය ඇතියකුට තමාගේ අඩුවක් දැකීමෙන් තමා පහත්ය කියා ඇති වන හීන මානය ය.

## 58. හීනස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ

හීනස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ යනු ජාති ගෝත්‍ර ධනාදියෙන් හීන පහත් තත්ත්වයේ සිටින කෙනකුට තමා ශ්‍රේෂ්ඨය කියා ඇති වන මානය ය. පහත් තත්ත්වයේ සිටින දසාදීන් අතුරෙන් කෙනකුට, වැඩට සමත් මම අන්‍ය දසයන්ට වඩා ශක්තිමත් අයෙක, දැනුමැතියෙක, හිමියන්ගේ සිත් දිනාගෙන සිටින අයෙක යනාදීන් යම්කිසි කරුණක් නිසා තමා උසස් කොට සලකන දසාදීන්ට මෙසේ මානය ඇති වේ.

## 59. හීනස්ස සදිසෝ හමස්මීති මානෝ

හීනස්ස සදිසෝ හමස්මීති මානෝ යනු ජාතිගෝත්‍ර ධනාදියෙන් පහත් තත්ත්වයේ සිටින කෙනකුට තමා ඒ තත්ත්වයේ සිටින අන්‍යයන්ට සමය කියා ඇති වන මානය ය.

## 60. හීනස්ස හීනෝ හමස්මීති මානෝ

හීනස්ස හීනෝ හමස්මීති මානෝ යනු ජාතිගෝත්‍ර ධනාදියෙන් හීනයකුට තමා හීනයයි ඇති වන මානය ය.

ශ්‍රේෂ්ඨ පුද්ගලයාට තමා ශ්‍රේෂ්ඨය යි ඇති වන මානය ද, සමයාට තමා සමය යි ඇති වන මානය ද, හීනයාට තමා හීනය

Non-commercial distribution

යි ඇති වන මානය ද, **යාථාවමානය** ය. අනුකූල මානය ය. අන් ආකාරයෙන් ඇති වන මානයෝ ඒ ඒ පුද්ගලයාට අනුකූල නො වන මානයෝ ය. ඒවා **අයාථාවමාන** නම් වේ. අයාථාවමානය සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වේ. යාථාවමානය අර්හත්වය දක්වා පවතී.

## 61. මානෝ

නාම රූප ධර්මයන්ගේ ස්වභාවය නො දැනීම නිසා පඤ්චස්කන්ධය ම හෝ ඉන් එක් ස්කන්ධයක් හෝ කීපයක් හෝ මමය, සත්ත්වයාය, පුද්ගලයාය කියා වරදවා තේරුම් ගෙන ඒ මම හෙවත් පුද්ගලයා අන්‍යයන් හා සසඳා බලා ශ්‍රේෂ්ඨය කියා හෝ සමය කියා හෝ හීනය කියා හෝ ගන්නා ස්වභාවය මාන නම් වූ ක්ලේශය ය. සත්‍ය වශයෙන් මමය යි ගැනීමට නැති කල්හි මම උසස්ය සමය පහත්ය යි සැලකීමෙහි තේරුමක් නැත. එය උමතු කමක් වැනිය. එසේ මැන ගැනීම දුකින් මිදීමට බාධාවක් බැවින් ඒ මැනීම නො කළ යුතු බව බුදුන් වහන්සේ විසින් නොයෙක් තැන වදරා ඇත්තේ ය.

## 62. අතිමානෝ

අන්‍යයන් පහත් කොට තමා කොඩියක් සේ කොතක් සේ උස් කොට සලකන ස්වභාවය අතිමාන නම් වේ.

## 63. මානාතිමානෝ

කලින් තමා අන්‍යයන් හා සම කොට සිතා ගෙන සිට පසු කාලයේ අන්‍යයන්ට වඩා තමා උසස් යයි සලකන මානය මානාතිමාන නම් වේ.

## 64. ඕමානෝ

ජාති කුල ගෝත්‍ර ධනාදියෙන් තමා සෙස්සන්ට වඩා හීනය කියා ඇති වන හැඟීම් ඕමාන නම් වේ. එනම් හීන මානය ය.

Non-commercial distribution

## 65. අධිමානෝ

මම සෝවාන් වෙමිය, සකෘදගාමී වෙමිය, අනාගාමී වෙමිය යි ඇතැම් පෘථග්ජනයන්ට ඇති වන මෝහය අධිමාන නම් වේ. මේ ක්ලේශය පෘථග්ජනයන්ට මිස ආර්‍යයන්ට ඇති නො වේ. පහළ ම ආර්‍ය පුද්ගලයා වන සෝවාන් පුද්ගලයා ද මාර්ගය ඵලය නිර්වාණය ප්‍රහීණ ක්ලේශ අප්‍රහීණ ක්ලේශ යන මේවා නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොට නිසැක ලෙස තමාගේ තත්ත්වය දැන ගනී. එබැවින් සෝවාන් පුද්ගලයකුට තමා සකෘදගාමී අනාගාමී වී ඇතය රහත් වී ඇතය යන මුළාව ඇති නොවේ. සකෘදගාමි අනාගාමී පුද්ගලයන්ට මතු මඟ ඵල ලබා ඇතය යන මුළාව ඇති නො වේ. මඟ ඵල ලැබීමේ බලාපොරොත්තුවක් නැති දුශ්ශීලයන්හට ද මෙය ඇති නොවේ. මඟ ඵල ලබනු රිසියෙන් සමථ විදර්ශනාවන්හි නො යෙදෙන කුසීත සිල්වතුන්ට ද මෙය ඇති නො වේ. පිරිසිදු ශීලයෙහි පිහිටා නාම රූප ධර්මයන් පිරිසිඳ දැන ඒවායේ ප්‍රත්‍යයන් විමසා දැන සැක දුරු කොට තමා රූපයන්ගේ තිලකුණු බැලීම් වශයෙන් අප්‍රමාදව විදර්ශනාවෙහි යෙදෙන ඇතැම් යෝගාවචරයන්ට මේ මුළාව ඇති වේ. මුළාවී ඇති යෝගාවචරයා තමා තුළ කෙලෙසුන් නැඟී ඒමක් නැති නිසා තමා සෝවාන් වී ඇතය, සකෘදගාමී අනාගාමී වී ඇතය යි රැවටේ. සමථයෙන් කෙලෙසුන් යටපත් කොට විදර්ශනාවෙන් සංස්කාරයන් පිරිසිඳ දැන සිටින යෝගාවචරයන්ට අවුරුදු සැට සැත්තෑව පමණ කල් කිසි ක්ලේශයක් නූපදී. රහත් කෙනකුගේ මෙන් සිත පිරිසිදු ව පවතී. එයින් ඇතැම් යෝගාවචරයන්ට රහත් නොවීම රහත් වූයෙමි ය යි මුළාව ඇති වේ. මේ අධිමානයෙන් වන හානිය නම් උත්සාහය නවත්වන නිසා මඟ ඵල නොලැබී යාම ය. අරණ්‍ය සේනාසනවල භාවනා මධ්‍යස්ථානවල භාවනා කළ ඇතැම් යෝගාවචරයන්ටත් අධිමානය ඇති වී තිබිය හැකිය. **උච්චමාලිකවාසී මහානාග** තෙරුන් වහන්සේ ය, **හංකනවාසි මහාදත්ත** තෙරුන් වහන්සේ ය, **සිතුල්පව්වේ චූල්ලසුම්ම** තෙරුන් වහන්සේය යන මේ තෙරුන් වහන්සේලා අධිමානයෙන් විදූහ යි **විභංග අටුවාවෙහි** දක්වා ඇත්තේ ය. උච්චමාලිකවාසී මහානාග තෙරුන් වහන්සේගේ කථාව මෙසේය :-

Non-commercial distribution

**මාලිකවාසී මහාධම්මදින්න** නම් වූ බොහෝ භික්ෂූන්ට අවවාද දෙන පිළිසිඹියා පත් මහ රහතන් වහන්සේ නමක් වූහ. දිනක් උන් වහන්සේ දිවා ස්ථානයෙහි වැඩ හිඳිනා සේක් තමන් වහන්සේගේ ආචාර්‍ය්‍යයන් වහන්සේ වන උච්චමාලිකවාසී මහානාග තෙරුන් වහන්සේගේ ශ්‍රමණකෘත්‍යය මස්තකප්‍රාප්තවී දැ යි බලන්නාහු උන්වහන්සේ පෘථග්ජනව වෙසෙන බව දැක, තමන් වහන්සේ එහි නො ගිය හොත් උන්වහන්සේ පෘථග්ජන භාවයෙන් ම කලුරිය කරන බව දැන සෘද්ධියෙන් අහසට නැගී ගොස් තෙරුන් වහන්සේ සමීපයෙහි අහසින් බැස වැඳ එකත් පසෙක හිඳ ගත්හ. එකල්හි මහානාග තෙරුන් වහන්සේ ඇවැත්නි, ධම්මදින්න, ඔබ මේ අකාලයේ කුමට ආවහුදැ'යි කීහ. ධම්මදින්න තෙරණුවෝ "ස්වාමීනි, පැනයක් විචාරීමට ආයෙමි" යි කීහ. "ඇවැත්නි, අසව දන්නා දෙයක් නම් කියමි" යි මහානාග තෙරණුවෝ කීහ. ධම්මදින්න තෙරණුවෝ දහසක් පමණ ප්‍රශ්නයන් ඇසූහ. කිසිදු පැකිළීමක් නැතිව මහානාග තෙරුන් වහන්සේ සියල්ල විසඳූහ. එකල්හි ධම්මදින්න තෙරණුවෝ "ස්වාමීනි, ඔබ වහන්සේගේ නුවණ ඉතා තියුණුය. නුඹ වහන්සේ මේ ධර්මය කවද අධිගමනය කළ සේක් දැ"යි කීහ. "අවැත්නි, සැට අවුරුද්දකටත් පෙරදීය" යි කීහ. "නුඹ වහන්සේට සමාධීන් ඇත්තේදැ"යි ධම්මදින්න තෙරණුවෝ ඇසූහ. "ඇවැත්නි, එයත් මට ලොකු දෙයක් නොවේය" යි තෙරණුවෝ කීහ. "ස්වාමීනි එසේ නම් ඇතකු මවන සේක්වා" යි ධම්මදින්න තෙරණුවෝ කීහ. තෙරුන් වහන්සේ විශාල සුදු ඇතකු මැවූහ. "මේ ඇතා නගුට ඔසවා කන් ඔසවා කුඤ්ච නාද කරමින් ඔබ වහන්සේ ඉදිරියට එන ලෙස කරනු මැනව"යි ධම්මදින්න තෙරණුවෝ කීහ. මහානාග තෙරුන් වහන්සේ එසේ කොට තමන් වහන්සේ මැවූ ඇතුට ම බිය වී පලා යන්නට තැත් කළහ. ධම්මදින්න තෙරුන් වහන්සේ මහානාග තෙරුන් වහන්සේට පලායන්නට නොදී අත දිගු කොට සිවුරු කොනින් අල්වා "ස්වාමීනි, රහතුන්ට බියෙක් ඇතිදැ" යි කීහ. එකල්හි තෙරුන් වහන්සේ තමා රහත් නොවන බව දැන "ඇවැත්නි, ධම්මදින්න මට පිහිට වෙව" යි කියා ධම්මදින්න තෙරුන් වහන්සේගේ පාමුල උක්කුටිකයෙන් හිඳ ගත්හ. ධම්මදින්න තෙරණුවෝ "ස්වාමීනි, මා ආයේ නුඹ වහන්සේට පිහිට වන්නටමය"

Non-commercial distribution

යි කියා කමටහන් කීහ. තෙරුන් වහන්සේ කමටහන් ගෙන සක්මනට නැඟ භාවනා කරන්නේ තුන්වන පියවරෙහිදී ම සියලු කෙලෙසුන් නසා අග්‍රඵලය වූ අර්හත්වයට පැමිණියහ. මේ අධිමානයෙන් සැට වසක් ගත කළ උච්චමාලිකවාසී මහානාග තෙරුන් වහන්සේගේ කථාව ය.

## 66. අස්මිමානෝ

පෘථග්ජන පුද්ගලයන්ට හා සොවාන් සකෘදගාමී අනාගාමී පුද්ගලයන්ට ගමනාදි ඉරියව් පැවැත්වීමෙහිදී මම යෙමි යි රූපස්කන්ධයෙහි මමය යන හැඟීමක් ඇති වේ. සුවදුක් විඳිනා කල්හි මම විඳිමි යි වේදනා ස්කන්ධයෙහි මමය යන හැඟීම ඇති වේ. සංඥා පහළ වන කල්හි මම දනිමි යි සංඥාස්කන්ධයෙහි මමය යන හැඟීම ඇති වේ. දනාදි ක්‍රියා සිදු කරන කල්හි මම දෙමිය ගනිමිය කතා කරමිය යනාදීන් සංස්කාර ස්කන්ධයෙහි මමය යන හැඟීම ඇති වේ. දැකීම් ඇසීම් ආදිය සිදු වන කල්හි මම දකිමිය අසමිය යනාදීන් විඥනස්කන්ධයෙහි මමය යන හැඟීම ඇති වේ. එසේ පඤ්චස්කන්ධයෙහි ඇති වන මමය යන හැඟීම **අස්මිමාන** නම් වේ. රූපය මමය වේදනාව මමය යනාදීන් ඇති වන සක්කාය දෘෂ්ටිය එක් ක්ලේශයෙකි. රූපය මමය යනාදීන් ඇති වන අස්මිමානය අනිකකි. මේ දෙකින් මමය යන දෘෂ්ටිය සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වේ. අස්මිමානය අර්හන්මාර්ගය දක්වා පවතී. එය ප්‍රහීණ වන්නේ අර්හත් මාර්ගයෙනි. "**අස්මිමානස්ස යෝ විනයෝ එතං වේ පරමං සුඛං**" යි වදාරා ඇත්තේ ඒ නිසා ය.

## 67. මිච්ඡා මානෝ

ප්‍රාණඝාතාදි පාපක්‍රියාවන්හි දක්ෂතාව නිසා එයින් තමා උසස්ය කියා ඇති වන මානය **මිච්ඡාමාන** නම් වේ. ඇතැම්හු වෙඩි තැබීමට බෝම්බ දැමීමට මඤුන් මැරීමට වනසතුන් මැරීමට සොරකමට පරදර සේවනයට අනුන් රැවටීමට කේලාම් කීමට දක්ෂයෝ ය. කඩු කිණිසි තුවක්කු දැල් ආදී ප්‍රාණවධය සඳහා ගන්නා උපකරණ තැනීමේ දක්ෂයෝ ය. ඇතැම්හු කොඩිවින

Non-commercial distribution

සූනියම් වස්කවි ආදියට දක්ෂයෝ ය. ඔවුන්ට මේ කරුණු සම්බන්ධයෙන් තමා උසස් කොට ගන්නා මිථ්‍යාමානය ඇති වේ. නැටීමෙහි ගැයුමෙහි වැයුමෙහි දක්ෂතාව නිසා ද මිථ්‍යාශීල මිථ්‍යාව්‍රත මිථ්‍යාදෘෂ්ටි නිසා ද තමා උසස් කොට ගන්නා මිථ්‍යා මානය ඇති වේ.

## 68. ඤාති විතක්කෝ

අසවල් පවුල පොහොසත් ය, අසවල් පවුල දිළිඳුය, අසවල් පවුල දියුණු වන්නේය, අසවල් පවුල පිරිහෙන්නේය, අසවලාට විවාහයක් කර දිය යුතුය, අසවලාට රැකියාවක් සොයා දිය යුතුය යනාදීන් ඤාතීන් සම්බන්ධයෙන් ඇති වන තෘෂ්ණා සහගත කල්පනාව **ඤාති විතක්ක** නම් වූ ක්ලේශය ය. අපගේ බොහෝ නෑයෝ මළහ, බොහෝ නෑයෝ සැදැහැවත්හු ය, සිල්වත්හුය, දන් දෙන්නෝය, භාවනා කරන්නෝය, වෙනත් පින්කම් කරන්නෝය යනාදීන් ඥාතීන් ගැන කල්පනා කිරීම ක්ලේශ කොට්ඨාසයට අයත් නො වේ.

## 69. ජනපද විතක්කෝ

අපගේ ජනපදය සරුය, මිනිසුන් සුවසේ ජීවත් වන්නාහ, මේ ජනපදයේ සියල්ලම ඇත යනාදීන් ජනපදය සම්බන්ධයෙන් ඇති වන ගෘහාශ්‍රිත තෘෂ්ණාවෙන් යුක්ත කල්පනාව **ජනපද විතක්ක** නම් වේ. අපගේ ජනපදය නිශ්ශ්‍රීකය, මෙහි වෙසෙන්නෝ කාලකණ්ණීහුය, සොරුය, පව්කාරයෝය යනාදීන් ජනපදය ගැන ඇති වන ද්වේෂ සහගත කල්පනාව ද ක්ලේශයෙකි. අපගේ ජනපද වැසියෝ සත්පුරුෂයෝය, පින් පව් දන්නෝ ය, පින් කරන්නෝය යනාදීන් ජනපදය සම්බන්ධයෙන් ඇතිවන කල්පනාව ක්ලේශයක් නො වේ.

## 70. අමර විතක්කෝ

දුක් විඳීමෙන් කළ පව් ගෙවා නො මැරෙන තත්ත්වයට පැමිණීම සඳහා ඇතැම් මිසදිටුවන් කරන දුෂ්කර ක්‍රියා

Non-commercial distribution

සම්බන්ධයෙන් හා දෘෂ්ටි සම්බන්ධයෙන් ඇතිවන මිථ්‍යා සංකල්පය **අමරවිතක්ක** නම් වේ. ඇතැම් මිසදිටුවෝ උක්කුටිකයෙන් හිඳීම්, කටුමත හිඳීම්, අව්වේ සිටීම්, ගිනිගොඩවල් සමීපයේ සිටීම්, ආහාර වර්ජනය කිරීම් ආදියෙන් දුක් විඳ කළ පව් ගෙවා අවසන් කොට නො මැරෙන දේවත්වයට පැමිණීමට උත්සාහ කරති. දුෂ්කර ක්‍රියා කරති. ඔවුනට ඒ දුෂ්කර ක්‍රියා සම්බන්ධයෙන් ඇතිවන මිථ්‍යාවිතර්කය නො මැරීම පිළිබඳ විතර්කයක් බැවින් අමර විතක්කය නම් වේ. අමර යනු ආදාට ද නමෙකි. ඌට දිය ගොඩ දෙකෙහි ම හැසිරිය හැකිය. ඌ ඇල්ලීම දුෂ්කරය. ඒ මේ අත පැන ඌ මස් මරන්නන්ගෙන් ගැලවෙයි. ආදා මෙන් ම ඇතැම් දෘෂ්ටිගතිකයෝ සත්ත්වයා මරණින් මතු ඇත් දැ යි ඇසුව හොත් ඇතය යි ද නො කියමි යි කිය යි. නැත දැ යි ඇසුව හොත් නැතය යි ද නො කියමි යි කිය යි. මෙසේ කුමකට වත් හසු නො වී ඒ මේ අත පැන, හසු නොවී බේරෙන දෘෂ්ටිගතිකයාගේ ඒ දෘෂ්ටිය පිළිබඳ මිථ්‍යා විතර්කය ද අමරවිතක්ක නම් වේ.

## 71. පරානුද්දයතා පටිසංයුත්තෝ විතක්කෝ

ගෘහාශ්‍රිත ප්‍රේමයෙන් ගිහියන් හා සම්බන්ධකම් පැවැත්වීමට පැවිද්දන්ට නුසුදුසුය. ඇතැම් භික්ෂූහු සතුටු විය යුත්තෙහි ගිහියන් හා එක්ව සතුටු වෙති. ශෝක කළ යුත්තෙහි ගිහියන් හා එක්ව ශෝක කෙරෙති. ගෙවල් සෑදීම, ඉඩම් ගැනීම, අවාහ විවාහ කිරීම, රැකියා සෙවීම ආදි ගිහියන්ගේ කටයුතු වලට සහභාගි වෙති. එසේ කරන පැවිද්දන්ට ගිහි කටයුතු සම්බන්ධයෙන් ඇතිවන ගෘහාශ්‍රිත විතර්ක පරානුද්දයතා පටිසංයුත්ත විතක්ක නම් වේ. දයාව කුශලපක්ෂයට අයත් ධර්මයෙකි. මෙහි අදහස් කරන දයාව කරුණාවේ මුහුණු වර ඇති තණ්හාව ය. කරුණාවේ හෙවත් දයාවේ මුහුණුවර ඇති තණ්හාවෙන් යුක්ත කල්පනාව පරානුද්දයතා පටිසංයුක්ත විතක්කය ය. ගිහියන්ට ධර්මය තේරුම් කරදීම, ඔවුන් ශීලයෙහි පිහිටවීම, භාවනාවෙහි යෙදවීම ආදිය සම්බන්ධයෙන් ඇතිවන පරානුද්දයතා පටිසංයුක්ත විතක්කයක් ද ඇත. එය ක්ලේශයක් නොව කුශල ධර්මයෙකි.

Non-commercial distribution

## 72. ලාභ සක්කාර සිලෝක පටිසංයුත්තෝ විතක්කෝ

ලාභ ඇති ලාභ සත්කාර කීර්තිය පිළිබඳව හා ලැබීමට බලාපොරොත්තු වන ලාභ සත්කාර කීර්තීන් පිළිබඳව ද ඇති වන තෘෂ්ණා සහගත මිථ්‍යා විතර්කය ලාභසත්කාර සිලෝක පටිසංයුත්ත විතක්ක නම් වේ.

## 73. අනවඤ්ඤත්ති පටිසංයුත්තෝ විතක්කෝ

ජාතියෙන් හෝ කුලයෙන් හෝ ගෝත්‍රයෙන් හෝ ධනයෙන් ශිල්පයෙන් ශාස්ත්‍රයෙන් හෝ අන් කරුණකින් හෝ අන්‍යයෝ මා පහත් කොට නො සිතත්වා. පහත් කොට කථා නො කෙරෙත්වා. පහත් කොට බැහැර නො කෙරෙත්වා. උසස් කොට හෝ සම කොට හෝ සලකත්වා, මා පිළිගනිත්වා යි ඇති වන තෘෂ්ණා සහගත වූ මාන සහගත වූ හෝ මිථ්‍යා කල්පනාව "අනවඤ්ඤත්ති පටිසංයුක්ත විතක්ක" නම් වේ.

මේ විභංග පාලියේ එක බැගින් දක්වා ඇති
කෙලෙස් තෙසැත්තෑව ය.

**ඒකක නිර්දේශය නිමි.**

*Non-commercial distribution*

## ද්වික වශයෙන් දක්වන ලද ධර්ම සතිස

කෝධො ච උපනාහෝ ච

මක්ඛෝ ච පලාසෝ ච

ඉස්සා ච මච්ඡරියං ච

මායා ච සාඨෙය්‍යං ච

අවිජ්ජා ච භවතණ්හා ච

භවදිට්ඨි ච විභවදිට්ඨි ච

සස්සත දිට්ඨි ච උච්ඡේද දිට්ඨි ච

අන්තවා දිට්ඨි ච අනන්තවා දිට්ඨි ච

පුබ්බන්තානුදිට්ඨි ච අපරන්තානුදිට්ඨි ච

අහිරිකං ච අනොත්තප්පං ච

දෝවචස්සතා ච පාපමිත්තතා ච

අනජ්ජවෝ ච අමද්දවෝ ච

අක්ඛන්ති ච අසෝරච්චං ච

අසාඛල්ලං ච අප්පටිසන්ථාරෝ ච

ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා ච භෝජනේ අමත්ත-ඤ්ඤුතා ච

මුට්ඨසච්චං ච අසම්පජඤ්ඤං ච

සීලවිපත්ති ච දිට්ඨිවිපත්ති ච

අජ්ඣත්තසංයෝජනං ච බහිද්ධාසංයෝජනං ච

මෙහි දුක අටොළොසකි. ධර්ම සතිසෙකි.

Non-commercial distribution

## 1. කෝධෝ 2. උපනාහෝ

අනුන්ට බණිනා තර්ජනය කරනා අත්පා ආදියෙන් පහර දෙන අනුන් මරණ අන්සතු වස්තුව විනාශ කරන සමහරවිට තමාගේ වස්තුව වුව ද විනාශ කරන තමාගේ ජීවිතය වුව ද නසන රෞද්‍ර වූ විරුද්ධ ස්වභාවය **ක්‍රෝධය** ය. බලවත් ක්‍රෝධය පුද්ගලයා උමතු කරයි. ක්‍රෝධයෙන් උමතු වූ පුද්ගලයා සමහරවිට තමා ගේ බඩු ද බිම ගසා පොඩි කර විනාශ කරයි. සමහරවිට ගිනි තබා විනාශ කරයි. තමාගේ අඹුදරුවන්ට තර්ජනය කරයි. පහර දෙයි. සමහරවිට මරා දමයි. එසේ කොට තමාගේ ජීවිතය ද නසා ගනියි. අන්‍යයන්ට අපරාධ කිරීම ගැන කියනුම කිම? මේ ක්‍රෝධය ලෝකවද්‍ය වශයෙන් ද මහාසාවද්‍යය ය. විපාකවද්‍ය වශයෙන් ද මහාසාවද්‍යය ය. ක්‍රෝධය හටගත් පුද්ගල තෙමේ මව්පියන්ට ද අපරාධ කරයි. සහෝදර සහෝදරියන්ට ද අපරාධ කරයි. පැවිද්දන්ට ද අපරාධ කරයි. ගරු කළ යුතු වූ අපරාධ කිරීමට නුසුදුසු වූ අන් ගුණවතුන්ට ද අපරාධ කරයි. එයින් ඔහු ආ ගිය තැන ගැරහුම් ලබයි. දඬුවම් ද ලබයි. ක්‍රෝධය මෙසේ ලෝකවද්‍ය වශයෙන් මහාසාවද්‍ය වේ. කෝප වූ පුද්ගලයා සමහර විට මවුපියන් මරා කල්පයක් අපායෙහි පැසෙයි. එබැවින් ක්‍රෝධය විපාකවද්‍ය වශයෙන් ද මහාසාවද්‍ය වේ. ක්‍රෝධයෙන් වන පව්වල විපාකය නැති කර ගැනීම අපහසු ය.

**දෝසේන හි දුට්ඨයෝ මාතාපිතුසුපි චෙතියේ පි බෝධිම්හි පි පබ්බජිතෙසු පි අපරජ්ඣිත්වා මය්හං ඛමථාති අච්චයං දෙසෙති. තස්ස සහ ඛමාපනේන තං කම්මං පටිපාකතිකමේව හෝති'**

යනුවෙන් කෝප වූ මව්පියන්ට හෝ චෛත්‍යයට බෝධියට හෝ පැවිද්දට හෝ අපරාධ කළ තැනැත්තාට ක්ෂමා කරවා ගැනීමෙන් එහි දෝෂය නැති කර ගත හැකි බව **මනෝරථ පූරණී අට්ඨකථාවෙහි** දක්වා ඇත්තේය. ක්ෂමාව ලබා ගැනීමෙන් නිදහස් විය හැක්කේ කුඩා අපරාධ ගැන පමණක් බව කිය යුතු ය. මව්පියන් මැරීම ආනන්තරිය කර්මයක් වන නිසා කවරාකාරයකින් වත් එහි විපාකය නො වැළැක්විය හැකි ය.

Non-commercial distribution

මහානර්ථකර වූ මේ ක්‍රෝධය ඇති වුව හොත් එය සිය නිවසට ඇතුළු වූ සර්පයකු සේ ද, කුසයට ඇතුළු වූ වසක් මෙන් ද සලකා දුරු කිරීමට උත්සාහ කළ යුතු ය. යම්කිසි කරුණක් ගැන කෝපය ඇති වූ කල්හි එය වහා සන්සිඳවා නො ගත හොත් ක්‍රමයෙන් වැඩේ. මුලින් ඇති වූ ක්‍රෝධය ක්‍රමයෙන් පරුෂ වචන කියන තත්ත්වයට ද, පහර දීම සඳහා අත් පා ක්‍රියා කරවන තත්ත්වයට ද, ගල් මුල් පොලු වලින් පහර දෙන තත්ත්වයට ද, කඩු කිණිසි වලින් පහර දෙන තත්ත්වයට ද, ගෙවල් ගිනි තබන බඩු විනාශ කරන තත්ත්වයට ද, සිය දිවි නසා ගන්නා තත්ත්වයට ද දියුණු වේ. මෙසේ ක්‍රෝධය දියුණු වන්නේ කිපී ඇත්තේ මමය කියා ක්‍රෝධය ආත්ම වශයෙන් හෝ මාගේ ක්‍රෝධය කියා ආත්මීය වශයෙන් හෝ සැලකීම නිසාය. ක්‍රෝධය එසේ ආත්ම වශයෙන් හෝ ආත්මීය වශයෙන් හෝ නො ගෙන තමාගේ පඤ්චස්කන්ධය නමැති ගෙට ඇතුළු වූ සර්පයකු ලෙස විෂක් ලෙස සලකන්නවුන්ට ක්‍රෝධය නො වැඩේ. ඔවුනට සර්පයා පලවා හරින්නාක් මෙන් ක්‍රෝධය පලවා හැරිය හැකි ය.

ගිනිදැල් විහිදුවමින් පැවති ගිනි අඟුරු අලුයෙන් යට වූ විට කලක් නිසල ව පවතී. එමෙන් පටන් ගැන්මේ දී ක්‍රියාකාරීත්වයෙන් පැවති ක්‍රෝධය එහි අධික වේගයන් සන්සිඳී අලුයෙන් යට වූ ගිනි අඟුර මෙන් සිත්සතන්හි යට වී පවතී. එය අප්‍රකටය. ඒ තත්ත්වයට පැමිණි ක්‍රෝධය **උපනාහ** නම් වේ. වෛරය යනු ද එයට නමෙකි. වෛරය ලෙහෙසියෙන් නො සන්සිඳෙන දීර්ඝ කාලයක් පවතින ක්ලේශයෙකි. සමහරවිට එය එක් ජාතියකදී කෙළවර නොවී කාළි යකින්නගේ වෛරය මෙන් ද, දෙව්දත්ගේ වෛරය මෙන් ද භවාන්තරයට ද යන්නේ ය. වෛරය නිසා බෝසතාණන්ට අපරාධ කොට දෙව්දත් බොහෝ වාර ගණනක් අවීචියෙහි උපන් බව ජාතක කථාවල සඳහන් ව ඇත්තේ ය.

**න හි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං.**
**අවේරේන ච සම්මන්ති - එස ධම්මෝ සනන්තනෝ**

(ධම්මපද යමක වග්ග)

කෙළ සෙම් සොටු මළ මුත්‍රයෙන් අපවිත්‍ර වූ තැනක් ඒවායින් ම සෝද පිරිසිදු නො කළ හැකි ය. පිරිසිදු කරන්නට ය කියා

Non-commercial distribution

ඒවායින් සේදුවහොත් ස්ථානය වඩාත් අපවිත්‍ර වන්නේ ය. වඩා දුගඳ වන්නේ ය. බණින්නහුට පෙරළා බැණීමෙන්, පහර දෙන්නහුට පෙරළා පහර දීමෙන් වෛරය නො සන්සිඳේ. එයින් වෛරය වඩාත් දියුණු වේ. පිරිසිදු දියෙන් සේදීමෙන් අපවිත්‍ර ස්ථාන පිරිසිදු වන්නාක් මෙන් ක්ෂාන්ති මෛත්‍රී ආදි අවෛරයෙන් ම වෛරය දුරු වේ. මේ බුද්ධාදි මහෝත්තමයන් ගිය පෞරාණික මාර්ගය ය යනු ඉහත දැක් වූ ගාථාවේ අදහස ය.

## 3. මක්ඛෝ 4. පළාසෝ

මාපියන් විසින් ගුරුන් විසින් නෑයන් මිතුරන් විසින් කළ උපකාර වලින් දියුණු වී, මා මාගේ වීර්‍ය්‍යයෙන් ම දියුණු වූවා මිස මට කවුරුන් වත් කළ දෙයක් නැත. කාගෙන්වත් මට උවමනාවක් ද නැත කියා කළ ගුණ අවලංගු කරන ස්වභාවය **මක්ඛ** නම් වේ. ගුණමකු බවය යනු ද එයට නාමෙකි. එය ද්වේෂයේ ම ආකාර විශේෂයකි.

අනිකකුගෙන් උපකාර ලබා ගත්තා වූ හෝ ලබමින් සිටින්නා වූ හෝ ඇතැමෙක් යම්කිසි කරුණකින් කෝප වූ විට, මට ඔබ කළ දෙයකුත් නැත, ඔබෙන් මට වුවමනාවකුත් නැත, කියා ගුණ අවලංගු කරයි. ජීවත් වීමට පවා ක්‍රමයක් නොමැතිව අසරණ ව සිටි ඇතැම් අසත්පුරුෂයෙක් යම්කිසි කාරුණිකයකුගේ උපකාරයෙන් දියුණු වූ පසු උසස් තත්ත්වයට පැමිණි පසු උපකාර කළ සත්පුරුෂයා හමු වී ඒ ගැන කථා කළ හොත් ඔබෙන් ලත් සතයකුදු මා වෙත නැත. මා දියුණු වී සිටින්නේ කාගේවත් උදව්වකින් නොව මාගේ උත්සාහයෙනැයි කියා කළ ගුණ අවලංගු කරයි. ඇතැම් පාපී ශ්‍රමණයෝ ද සාමණේර කාලයේ පටන් සිවුපසය සපයා දෙමින් ලෙඩ දුකට පිහිට වෙමින් අධ්‍යාපනයක් ලබා දෙමින් උපකාර කළ ගුරුවරුන්ගේ ගුණ අමතක කරති. ගුරුවරුන්ගේ උපකාරයෙන් දියුණු වී, මහජනයාගෙන් පුද සත්කාර ලබන, උසස් අයගෙන් සැලකිලි ලබන තත්ත්වයට පැමිණි පසු මා මේ තත්ත්වයට පැමිණියේ කාගේවත් උපකාරයකින් නොව මාගේ නුවණින් මාගේ උත්සාහයෙනැයි කියමින් කළගුණ නසති. මෙසේ කළගුණ අවලංගු

Non-commercial distribution

කර ගුණ කළ අයගේ සිත් රිදවීම මත් අසත්පුරුෂ කමෙකි. මහත් පාපයෙකි. එහි විපාක වශයෙන් ඇතැම්හු මෙලොවදී ම නැවත පිරිහීමට පත් වෙති, ඇතැම්හු නපුරු රෝග වැළඳී බෝකල් දුක් විඳ ධනයත් අවසන් කර ගෙන මිය යති. මෙහි සත්‍යතාව ලෝකය දෙස විමසිල්ලෙන් බලන්නවුන්ට තේරුම් ගත හැකි වනු ඇත.

තමාට වඩා ගුණයෙන් උසස් අය හා තමා සම කොට ගන්නා ස්වභාවය **පලාස** නම් වේ. සිල්වත්හු ය, ආරණ්‍යකයෝ ය, පිණ්ඩපාතිකයෝ ය, පණ්ඩිතයෝ ය, කාරුණිකයෝ ය, ශාසන සේවකයෝ ය, ශාසන ශෝධකයෝ ය යි කියමින් සිටින අයගේත් අපගේත් ඇති වෙනසක් නැත. ඔවුන්ට කළ හැකි හැම දෙයක් ම අපටත් කළ හැකිය. ඔවුහු ද අප මෙන් මැරෙන්නෝ ය. මරණින් පසු ඔවුනට යාමට අමුතු ලෝකයක් නැත යනාදීන් පලාසය ඇතියෝ ගුණවතුන් හා තමා සම කොට සිතති. සම කොට කථා කරති. එද ඒ ආකාරයෙන් පවත්නා මානය ම ය.

## 5. ඉස්සා 6. මච්ඡරිය

අන්‍යයන්ට ඇඳුම් පැලඳුම් ගෙවල් වතු කුඹුරු තනතුරු ආදිය තිබීම නො ඉවසන්නා වූ ද, අන්‍යයන් පූජා සත්කාර ගරු බුහුමන් කීර්ති ප්‍රසංශා ලැබීම නො ඉවසන්නා වූ ද ස්වභාවය **ඉස්සා** නම් වේ. **ඊර්ෂ්‍යා** නම් ද වේ. ඊර්ෂ්‍යාව ඇතියහුගේ කැමැත්ත අනුන්ගේ සම්පත්තිය නැති කිරීමට ය. එසේ නො කළ හැකි කල්හි එහි දෙසක් බලා සැනසෙයි. ඔහු අනුන්ගේ ලස්සන ඇඳුමෙහි දොසක් දකී. ලස්සන සිරුරෙහි දෙසක් දකී. අන්‍ය වස්තූන් හි ද එසේ ම දෙස් බලා ඒවායේ දෙස් ගැන කථා කොට සැනසෙයි. ඔහු අනුන්ගේ ගෙය අනුන්ගේ වාහනය අනුන්ගේ වත්ත කුඹුර අනුන්ගේ රැකියාව තනතුර කවදා හෝ නැති වේ දෝ යි බලා සිටී. නැති වූ විටෙක ඉමහත් සතුටක් ලබයි. මේ ඊර්ෂ්‍යාව බෙහෙවින් ඇති වන්නේ ගිහියන්ට ගිහියන් ගැනත් පැවිද්දන්ට පැවිද්දන් ගැනත් ය. පැවිද්දකු ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ලබන කල්හි තවත් පැවිද්දකුට ඒ ගැන ඊර්ෂ්‍යාව ඇති වේ. ගිහියකුට ඒ ගැන එතරම් ඊර්ෂ්‍යාවක් ඇති නො වේ. මෙය ඇති තැනැත්තාට නො දැනෙන

Non-commercial distribution

ක්ලේශයෙකි. එබැවින් බොහෝ දෙන තමන් කාටවත් ඊෂ්‍යා නො කරන බවත් තමාට අන්‍යයන් ඊෂ්‍යා කරන බවත් කියති. ඊෂ්‍යාව මිනිසුන්ට පමණක් නොව තිරිසනුන්ටත් ඇති බව පෙනේ. ප්‍රාණඝාතකයාට මස් ලැබේ. සොරාට ධනය ලැබේ. මිථ්‍යාචාරයෙහි යෙදෙන්නාට සුවයක් ලැබේ. බොරු කියන්නාටත් එයින් ප්‍රයෝජන ලැබේ. සුරා පානය කරන්නහුට ද ඉන් සුවයක් ලැබේ. ඊෂ්‍යා කරන්නහුට ඉන් වන යහපතක් නො පෙනේ. එබැවින් ඊෂ්‍යාව ඉතාම ලාමක පාපයෙකැ යි කිය යුතු ය.

තමාගේ දෙය අනුන්ට හිමි වීමටත් එයින් අනුන්ට සුළු ප්‍රයෝජනයක් වුව ලැබෙනවාටත් විරුද්ධ ස්වභාවය "**මච්ඡරිය**" නම් වේ. මාත්සර්‍ය්‍ය නම් ද, මසුරු බව නම් ද වේ. මසුරු තැනැත්තේ තමාගේ දෙය අනුන්ට දෙනු තබා අනුන් දකිනවාට ද නො කැමැත්තේ ය. දුටහොත් අනුන් ඉල්ලතියි යන බියෙන් ඔහු නිතර ම තමාගේ සම්පත්තිය සඟවයි. මසුරා ය, ලෝභියා ය යන දෙදෙනා ම නො දෙති. මසුරා නො දෙන්නේ මසුරු බව නිසා ය. ලෝභියා නො දෙන්නේ ලෝභය නිසාය. මාත්සර්‍ය්‍යය එක් ක්ලේශයෙකි. ලෝභය එයට වෙනස් අන්‍ය ක්ලේශයෙකි. මේ දෙක කිසි කලෙක එක් ව එක සිතක ඇති නො වේ.

අධික මසුරුකම් ඇත්තේ අනුන් දෙනවාට ද නො කැමති ය. ඔහු අනුන් කරන දීම් ද වළක්වයි. අනුන්ගේ දීම් වළක්වන මහ මසුරුකම '**කදරිය**' නම් වේ. කදරිය නම් වූ මහ මසුරුකම් ඇතියෝ දෙන අයටත් දෙස් කියති. අනුන්ගේ දීම් වළක්වන තැනැත්තේ ප්‍රතිග්‍රාහකයාගේ ලාභය නැතිකරයි. දයකයා ලබන පින ද නැති කරයි. දීම වැළැක්වීම දෙදෙනකුට අන්තරාය කිරීමකි. එබැවින් එය මහ පාපායකි. එය කරන්නෝ මරණින් මතු නරකයෙහි හෝ ප්‍රේත ව හෝ උපදිති.

**න වේ කදරියා දේවලෝකං වජන්ති**
**බාලා හවෙ නප්පසංසන්ති දනං.**
**ධීරෝ ච දනං අනුමෝදමානෝ**
**තේනේව සෝ හෝති සුඛී පරත්ථ.**

(ධම්මපද - ලෝකවග්ග)

Non-commercial distribution

තද මසුරෝ දෙව් ලොවට නො යෙත්. බාලයෝ දීමට නො පසසන්නාහ. නුවණැත්තේ ම දීම අනුමෝදන් වන්නේ එයින් ම ඔහු පරලොව සැප ඇත්තේ වන්නේ ය - යනු එහි තේරුම ය.

**පඤ්ච මච්ජරියානි ආවාස මච්ජරියං කුල මච්ජරියං ලාභ මච්ජරියං වණ්ණ මච්ජරියං ධම්ම මච්ජරියං**

යනුවෙන් මච්ඡරිය පසක් දක්වා ඇත්තේ ය. වාසස්ථානය පිළිබඳ මසුරු බව **ආවාස මච්ජරිය** නම් වේ. ප්‍රත්‍යය පහසුව ඇත්තා වූ සුවසේ විසිය හැකි ආවාසයක පන්සලක සංඝාරාමයක වෙසෙන භික්ෂුවක් ඒ ස්ථානයට වතින් සම්පූර්ණ අන්‍ය සිල්වත් භික්ෂූන් ගේ පැමිණීමට නො කැමති වේ නම් පැමිණියාහු ද වහා ආපසු යත්වා යි සිතා නම් ඒ ආවාස මච්ඡරිය ය. ස්ථානය දූෂණය කරන කෝලාහල කරන දුශ්ශීල භික්ෂූන් ගේ පැමිණීම නො ඉවසීම පැමිණියාහු ද වහා යත්වායි සිතීම, එබඳු භික්ෂූන් ස්ථානයෙන් බැහැර කිරීම ආවාස මච්ඡරිය නො වේ. ආවාසයට පැමිණෙන අන්‍ය භික්ෂූන්ට කරදර කරන බණින **ධම්මික** නමැති භික්ෂුව ජාති භූමියේ ආවාස සතකින්ම නෙරපන ලදුව අන්තිමට වාසස්ථානයක් නොමැති ව පිහිට සොයා බුදුරදුන් වෙත පැමිණි බව **අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ** සඳහන් වේ. එබඳු භික්ෂූන් අවාසවලින් බැහැර කිරීම සුදුසු ය.

තමාගේ දයක පවුල්වලට නෑ පවුල්වලට අන්‍ය භික්ෂූන් ගේ පැමිණීම නො කැමති බව **කුලමච්ජරිය** ය. මිනිසුන්ගේ ප්‍රසාදය නැති වන පරිදි හැසිරෙන පාප භික්ෂූන්ගේ පැමිණීම නො කැමති වීම කුල මච්ඡරිය නො වේ. අන් භික්ෂූන්ට පැහැදී ඔවුන්ටත් සලකන්නට පටන් ගත හොත් තමාට පාඩුවක් වේ යයි සිතා ගුණවත් භික්ෂූන් ගේ පැමිණීම නො ඉවසීම ආවාස මච්ඡරිය ය.

අන්‍යයන් සිවුපසය ලබනවාට නො කැමති බව **ලාභ මච්ජරිය** ය. යම් භික්ෂුවක් තමන්ට ලැබෙන ප්‍රත්‍යය ඥාති මිත්‍ර ගිහියන්ට දී කුල දූෂණය කෙරේ නම් නො මනා ලෙස පරිභෝග කොට ප්‍රත්‍යය විනාශ කෙරේ නම් තමාට වැඩි හරිය කුණු වී යන්නට දිරා යන්නට හරිනවා මිස ප්‍රයෝජනය ඇතියකුට නො දේ නම් ඒ භික්ෂුවට මේවා නො ලැබී අන් සිල්වත් භික්ෂුවකට ලැබේ නම් යහපතැයි සිතීම ලාභ මච්ඡරිය නො වේ.

Non-commercial distribution

ශරීර වර්ණය හා ගුණ වර්ණය පිළිබද මසුරු බව **වණ්ණ මච්ජරිය** වේ. ශරීර වර්ණ හෙවත් රූප ශෝභාව පිළිබඳ මසුරු තැනැත්තේ අන්‍යයන්ගේ රූප ශෝභාව කියනු ඇසීමට නො කැමති වේ. තෙමේ ද නො කියයි. ගුණ වර්ණයට මසුරු තැනැත්තේ අනුන්ගේ ශීලාදි ගුණ ගැන කියනු ඇසීමට නො කැමති වේ.

තමා දත් ධර්මය අන්‍ය භික්ෂූන් දැන ගන්නවාට නො කැමති බව **ධර්ම මච්ජරිය** නම් වේ. පර්යාප්ති ධර්මය, ප්‍රතිවේධ ධර්මය යි ධර්මය දෙ පරිදි වේ. ප්‍රතිවේධ ධර්මය යනු මාර්ගඵල නිර්වාණයෝ ය. ඒවා ඇත්තේ ආයඍියන්ට ය. ආයඍියන්ට ඒවා ගැන මසුරු බවක් නැත. ඔවුහු තමන් ප්‍රතිවේධ කර ඇති ධර්මය ලොව සැම දෙන ම ප්‍රතිවේධ කරනවාට කැමැත්තෝ ය. ඇතැම් පෘථග්ජන භික්ෂූහු තමන් දැන සිටින ගැඹුරු ධර්මය අන් භික්ෂූන් දැන ගන්නවාට අකමැති ය. ඔවුහු ඒ ධර්ම අන් භික්ෂූන් ඇසුව ද නො කියති. සඟවති. එය ධම්ම මච්ඡරිය ය. තමාට වන වාසි අවාසි අනුව කලින් කල එක එක අතට හැරෙන කලකට පැවිදි වන කලකට ගිහි වන කලකට තාපස වන කලකට ක්‍රිස්තියානි වන ලාමක පුද්ගලයෝ වෙති. එබඳු ලාමක පුද්ගලයන් සියුම් වූ ගැඹුරු වූ ධර්මය උගතහොත් ඒ ධර්ම තමාට වාසි වන පරිදි තමා කැමති පරිදි තේරුම් කොට අවුල් කරන්නාහ. එබන්දන්ට ධර්මය නො දීම ධම්ම මච්ඡරිය නො වේ. ඇතැම් පාපී පුද්ගලයෝ සියුම් වූ ගැඹුරු වූ ධර්මයන් උගෙන ඒ මගින් තමන්ට නැත්තා වූ ලෝකෝත්තර ගුණ ප්‍රකාශ කොට නැසෙන්නාහ. එවැනි අයට ඔවුන්ගේ යහපත සලකා ධර්මය නො දීමත් ධම්ම මච්ඡරිය නො වේ. ඇතැම්හු ධර්මය අවුල් කිරීම අවලංගු කිරීම පිණිස ම ධර්මය දැන ගැනීමට උත්සාහ කරති. ඔවුනට ධර්මය නො දීම ද ධම්ම මච්ඡරිය නො වේ. බුදුරජාණන් වහන්සේ විසින් සකල ලෝකයා ගේ යහපත පිණිස සැම දෙනාට ම දැන ගැනීම පිණිස දේශනය කර ඇති ධර්මය හැකි තාක් ලෝකයෙහි පැතිරවිය යුතුය. එය සැඟවීම ඉතා ලාමක ය. එබැවින් :-

**“ඉමේසං කෝ පඤ්චන්නං මච්ජරියානං එතං පතිකුට්ඨං යදිදං ධම්මමච්ජරියං”** යනු භාග්‍යවතුන් වහන්සේ විසින්

Non-commercial distribution

වදරන ලද්දේ ය. මච්ඡරියයේ විපාක දම්සඟුණු අටුවාවෙහි මෙසේ දක්වා ඇත.

ආවාස මච්ඡරියෙන් යක්ෂයකු හෝ ප්‍රේතයකු හෝ වී, ඒ ආවාසයේ කසළ හිස තබා ගෙන හැසිරෙන්නේ ය. කුල මච්ඡරියෙන් තමාගේ දායකයන් නෑයන් අන්‍යයන්ට සත්කාර කරනු දක්නා කල්හි සිත උණු ඒ ලේ වමනය, ලේ පාචනය වන්නේ ය. ලාභ මච්ඡරියයෙන් සංඝයාගේ ගණයාගේ ලාභයත් පුද්ගලික දේවල් මෙන් පරිභෝග කොට යක්ෂයකු හෝ ප්‍රේතයකු හෝ පිඹුරකු හෝ වන්නේ ය. වණ්ණ මච්ඡරියයෙන් උපනුපන් තැන විරූප ව උපදී. ධම්ම මච්ඡරියයෙන් උපනුපන් ජාතිවල මෝඩයෙක් වේ.

තවත් ක්‍රමයක් මෙසේ ය. ආවාස මච්ඡරියෙන් ලොහොකුඹු නරකයෙහි උපදී. කුල මච්ඡරියයෙන් අල්පලාභී වේ. ලාභ මච්ඡරියයෙන් ගූථ නරකයෙහි උපදී. වණ්ණ මච්ඡරියයෙන් උපනුපන් තැන විරූප වේ. ධම්ම මච්ඡරියයෙන් කුක්කුල නරකයෙහි උපදී.

( අත්ථසාළිනි 315 )

## 7. මායා. 8. සාඨෙය්‍ය.

පව්කම් කොට ඒවා සඟවන ස්වභාවය **මායා** නම් වේ. ඇතැම්හු තුමූ ම අනුන්ගේ බඩු සොරකම් කර හිමියා වෙත ගොස් ශෝකය පළ කෙරෙති. නැති වූ බඩු සෙවීමට සහාය වෙති. මේ මායාව ය. ඇතැම් පැවිද්දෝ ද තමන් කරන ලද වරද වසා ගැනීම සඳහා මහත් සංවරයක් දක්වති. වත් පිළිවෙත් කරති. මල් පහන් පුදති. ඒවායේ ආදීනව කියා දහම් දෙසති. අන්‍යයන් වරද කිරීම ගැන ශෝකය පළ කරති. බුදු සසුන බබලවන්නට සිල්වතුන් ඇති කරන්නට කථා කරති. මේ මායා කාරයන්ගේ ස්වභාවය ය. මායාවට බොහෝ දෙනා රැවටෙන්නාහ. මායාකාර තවුසකු ගැන ඇති ජාතක කථාවක් මෙසේ ය :–

අතීතයේ එක් ගමක් ඇසුරු කරමින් කුට තවුසෙක් විසීය. ඔහුගේ ඉරියව් දැක ඔහු කෙරෙහි පැහැදුණු ගම් වැසියෙක් ඔහුට වනයෙහි පන්සලක් සාදා දී එහි වාසය කරවා තමාගේ ගෙහි ම ඔහුට

Non-commercial distribution

ප්‍රණීත භෝජනයෙන් උපස්ථාන කෙළේය. මේ වැසියා කූට තාපසයා මහ සිල්වතෙකැයි සිතා තමා වෙත තුබූ රන්කාසි සියයක් ආරක්ෂාව සඳහා කූට තවුසාගේ අසපුවට ගෙන ගොස් පොළොවෙහි වළලා "ස්වාමීනි, මෙය බලාගන්නය" යි කීය. "පින්වත, පැවිද්දන්ට මෙවැනි කරුණු කීම නුසුදුසු ය. අපට අන් සතු වස්තුවෙහි ලෝභයක් නැතය" යි තවුසා කීය. ගම් වැසියා "එසේය ස්වාමීනි" යි කියා ඔහුගේ කීම විශ්වාස කොට පෙරළා ගියේය. දින කීපයකට පසු කූට තවුසා "මට වූයේ ගජ වාසියෙක, මේ මුදල මට සැපසේ ජීවත් වන්නට සෑහෙන්නේ ය."යි බිම කැණ රන්කාසි සියය ගෙන වනයේ අන් තැනක සඟවා එදින පන්සලට වී සිට පසු දින ගම් වැසියාගේ නිවසට ගොස් ඔහු පිළියෙල කර තුබූ ප්‍රණීත භෝජනය බඩ පුරා වළඳා දායකයාට කථා කොට, "පින්වත, අප ඔබ නිසා බෝ කලක් වාසය කර ඇත්තේ ය. වැඩි කල් එක් තැන විසීම පැවිද්දන්ට නුසුදුසු ය. එසේ විසීමෙන් ගිහියන් හා බන්ධනයක් වන්නේ ය. එය පැවිද්දට කිලුටෙක. එබැවින් මම අන් තැනකට යෙමි"යි කීය. ගම් වැසියා නො යන ලෙස නැවත නැවත යාච්ඤා කළ නමුත් තවුසා එය ප්‍රතික්ෂේප කෙළේය. එකල්හි ගම්වැසියා තවුසා පිටත් කොට ගම් දොර දක්වා පසු ගමන් කොට පෙරළා ආයේය. කූට තවුසා මදක් දුර ගොස් ගම්-වැසියා වැඩි දුරටත් රවටන්නට සිතා ජටාවෙහි තණපටක් රඳවා ගෙන ඒ නිවසට නැවත ද ආයේය. ගම් වැසියා තවුසා දැක "ස්වාමීනි, කුමට පෙරළා වැඩම කළ සේක්දැ" යි ඇසූ කල්හි "පින්වත ඔබගේ නිවසේ පියැස්සෙන් එක් තණපතක් මාගේ ජටාවෙහි රැඳී තිබුණේ ය. සුළු වූ ද අන් සතු දෙයක් ගෙන යාම පැවිද්දන්ට නුසුදුසු බැවින් එය ගෙන ආමි"යි කීය. ගම්වැසියා "ස්වාමීනි, තණපත විසි කර යනු මැනවැ"යි කියා මාගේ තාපසයන් වහන්සේ තණපතක් පමණ වුද, අන්සතු වස්තුවක් නො ගනිතියි වඩාත් පැහැදී වැඳ තවුසා පිටත් කෙළේය.

බෝසතාණන් වහන්සේ බඩු සෙවීම පිණිස ප්‍රත්‍යන්තයට ගියාහු එදින ඒ ගෙයි නවාතැන් ගෙන සිටියහ. උන්වහන්සේ ඒ ක්‍රියාව දැක සැක සිතී "යහළුව, ඔබ මේ තවුසා වෙත කිසි ධනයක් තබා ඇත්තේ දැ'යි අසා එසේය යි කී කල්හි වහා ගොස් විමසන්නය

Non-commercial distribution

යි කීහ. ගම්වැසියා වහා ගොස් බලා රන් කාසි සියය නො දැක වහා අවුත් ඒ බව බෝසතාණන්ට කීය. එකල්හි බෝසතාණෝ "ඔබගේ මුදල් ගත්තේ අනිකකු නොව මේ කුට තවුසා ම ය. වහා ගොස් ඔහු අල්ලා ගෙනෙවු"ය යි ගම්වැසියන් කැඳවා ගෙන ලුහුබැඳ ගොස් තවුසා අල්ලා තවුසාට අතින් පයින් තළා රන් කාසි ලබා ගත්හ. බෝසතාණෝ මතු එබඳු පව්කම් නො කරන ලෙස අවවාද කොට තාපසයා පිටත් කළහ. මායා කාරයෝ ඒ කුට තවුසා වැන්නෝ ය.

ලාභ සත්කාරාශාවෙන් තමා තුළ නැති ගුණ ඇති ලෙස හැඟවීම **සාඨෙය්‍ය** නම් වේ. දුශ්ශීලව හිඳ සිල්වතකු බව හඟවන ස්වභාවය, ගමෙහි වෙසෙමින් ආරණ්‍යකයකු ලෙස හඟවන ස්වභා-වය, ශ්‍රද්ධාව නැති ව ශ්‍රද්ධාව ඇතියකු ලෙස හඟවන ස්වභාවය, උගතකු නොවී උගතකු ලෙස හඟවන ස්වභාවය, පෘථග්ජනව සිට ආය්‍ර්‍යයකු ලෙස හඟවන ස්වභාවය සාඨෙය්‍ය නම් ක්ලේශය ය. මායා සාඨෙය්‍ය යන මේ දෙක තරමක් එකිනෙකට සමාන ය. ධ්‍යානාභිඥා මාර්ග ඵල යන මේ උත්තරී මනුෂ්‍ය ධර්මයන් තමා කෙරෙහි නැතිව ඇතය යි පැවසීම ඉතා ම නපුරු පාපයෙකි.

**සදේවකෙ භික්ඛවේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අයං අග්ගෝ මහා චෝරෝ යෝ අසන්තං අභූතං උත්තරි මනුස්සධම්මං උල්ලපති.**

(පරාජිකා පාළි )

මහණෙනි, යමෙක් තමා කෙරෙහි නැත්තා වූ උත්තරී මනුෂ්‍ය ධර්මය ඇතැයි පවසා නම් හෙතෙමේ දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණබ්‍රාහ්මණයින් සහිත දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයෙහි අග්‍ර වූ මහා චෞරයාය යනු එහි තේරුම ය.

## 9. අවිජ්ජා 10. භවතණ්හා

ඒ ඒ දෙය නො වරදවා ඇති සැටියට ම දැන ගැනීමට සමර්ථ වූ නුවණ **විජ්ජා** නම් වේ. ආලෝකයට විරුද්ධ වූ අන්ධකාරය මෙන් ඒ ඒ දෙයෙහි ඇති සැටිය වසන ස්වභාවය **අවිජ්ජාව** නම් වේ. මේ

Non-commercial distribution

අවිද්‍යාව කෙලෙසුන්ගෙන් ප්‍රධාන ක්ලේශය බව කිය යුතුය. අවිද්‍යා-වෙන් තොරව ඇති වන ක්ලේශයක් නැත. සියලු ම කෙලෙසුනට අවිද්‍යාවේ සහාය වුවමනා ය. අවිද්‍යාව නැති වුවහොත් අන් එක් ක්ලේශයකුදු ඇති නො වේ. ජලය හා මිශ්‍ර වී ජලයෙහි පැතිර පවත්නා සායමක් මෙන් මේ අවිද්‍යාවත් සිත හා බැඳී සිත හා මිශ්‍රව සිතේ පැතිර පවතී. අඳුරේ ඇති වස්තූන් දෙස බලන්නකුට ඒ වස්තූන් ඇති සැටියට නොව අන් ආකාරයකට පෙනෙන්නාක් මෙන් අවිද්‍යා සහගත සිතට ද ඒ ඒ ධර්මය ඇති සැටියට නොදැනී අන් ආකාරයකින් දැනේ. ඇති සැටියට නො දැනෙන බැවින් අවිද්‍යාවට අඤ්ඤාණ හෙවත් නො දැනීම ය යි කියනු ලැබේ. ලෝකයේ දත යුතු දෑ බොහෝ ය. ඒවායින් යමකට සිත යොමු කරන ලද නම් ඒ දෙය දැනේ. සිත යොමු නො කළ දෙය නො දැනේ. ඒ නො දැනීම අවිද්‍යාව නොවන බව දත යුතු ය. අවිද්‍යාව ප්‍රහාණය කළ රහතුන්ට ද සිත යොමු කළ දෙය හැර අනිකක් නො දැනේ.

අවිද්‍යා සහගත සිතට රූපය රූපයක් ලෙස නොව සත්ත්වයකු ලෙස දැනේ. අනිත්‍ය වූ රූපය නිත්‍ය ලෙස දැනේ. අශුභ වූ රූපය ශුභයක් ලෙස දැනේ. දුඃඛයක් වූ රූපය සුවයක් ලෙස දැනේ. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන් ද එසේ ම වැරදි ලෙස දැනේ.

> **"දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධෙ අඤ්ඤාණං, දුක්ඛනිරෝධගාමිනියා පටිපදය අඤ්ඤාණං, පුබ්බන්තේ අඤ්ඤාණං, අපරන්තේ අඤ්ඤාණං, පුබ්බාපරන්තේ අඤ්ඤාණං, ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නේසු අඤ්ඤාණං"**

( ධම්මසංගණී )

මෙසේ අභිධර්මයෙහි කරුණු අටකින් අවිද්‍යාව දේශනය කර ඇත්තේ ය. තවත් ක්‍රමයකින් කියතහොත් අෂ්ටාකාර අවිද්‍යාවක් දේශනය කර ඇත්තේ ය. දුක නොදැනීම, දුක් ඇති වීමේ හේතුව නො දැනීම, දුක්ඛ නිරෝධය නො දැනීම, දුක්ඛ නිරෝධයට පැමිණීමේ ක්‍රමය නො දැනීම, තමාගේ ස්කන්ධ පරම්පරාවෙහි පූර්ව කොට්ඨාසය නො දැනීම, අනාගත කොට්ඨාසය නො දැනීම,

Non-commercial distribution

අතීතානාගත දෙකොට්ඨාසය ම නො දැනීම, ස්කන්ධ පරම්පරාවේ හේතු ඵල ක්‍රමය වන පටිච්ච සමුප්පාදය නො දැනීම යනු අභිධර්මයෙහි දැක්වෙන අෂ්ටප්‍රකාර අවිද්‍යාව ය.

උපාදානස්කන්ධ පඤ්චකය දුකෙකි. එහෙත් ආර්‍යධර්මය නො දත් පෘථග්ජනයාට පෙනෙන්නේ එය ඉතා හොඳ දෙයක් සැපයක් ලෙස ය. උපාදාන ස්කන්ධ පඤ්චකය නැති වෙතැයි කියත හොත් ඔහුට ඇති වන්නේ මහත් බියෙකි. උපාදාන සකන්ධය දුකක් වශයෙන් නො ගෙන හොඳ දෙයක් සැපයක් වශයෙන් ගැනීම දුඃඛය නො දැනීම හෙවත් වැරදි ලෙස දැන ගැනීම වූ අවිද්‍යාව ය.

පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛය නො සිඳී නො නිවී ඉදිරියට දිගින් දිගට ඇති වන්නේ තණ්හාව නිසා ය. එය තේරුම් ගැනීම වඩාත් අපහසු ගැඹුරු කරුණෙකි. අවිද්‍යා සහගත සිතට තණ්හාවෙහි ඇති දුක් ඉපදවීමේ හේතුභාවය නො පෙනේ. එයට පෙනෙන්නේ තණ්හාව සැපයට හේතුවක් ලෙස ය. එසේ ඇති වන වැරදි දැනීම දුක් ඇති වීමේ හේතුව නො දැනීම වූ අවිද්‍යාව ය.

පඤ්චස්කන්ධයාගේ අනුත්පාද නිරෝධය හෙවත් නිවන අවිද්‍යා සහගත සිතට නො දැනේ. ඒ නිවන ගැන කියනු ඇසුවහොත් අවිද්‍යා සහගත සිතට දැනෙන්නේ එය ඉතා නපුරක් ලෙස ය. දුඃඛ නිරෝධය පිළිබඳ ව ඇති වන ඒ වැරදි දැනීම දුඃඛ නිරෝධය නො දැනීම ය යි කියන ලද අවිද්‍යාව ය.

දුඃඛ නිරෝධයට පැමිණීමේ ප්‍රතිපදාව අවිද්‍යා සහගත සිතට දැනෙන්නේ පලක් නැති කරදර වැඩක් සේ ය. දුකක් සේ ය. දුඃඛ නිරෝධයට පැමිණීමේ ප්‍රතිපදාව පිළිබඳ වූ ඒ වැරදි දැනීම දුකින් මිදීමේ මග නො දැනීම නමැති අවිද්‍යාව ය.

අතීත භවයන්හි වූ ස්කන්ධයන් ස්කන්ධ සැටියට නාමරූප ධර්ම සැටියට තෙරුම් ගත නොහී, මා අතීතයේ දෙවියෙක්ය මිනිසෙක්ය යනාදීන් අතීත නාමරූපයන් පිළිබඳ ව ඇතිවන වැරදි හැඟීම් අතීත කොට්ඨාස නො දැනීම යයි කියන ලද අවිද්‍යාව ය.

මම මතු දෙවියෙක් වෙමි ය මිනිසෙක් වෙමි ය යනාදීන් අනාගත ස්කන්ධයන් පිළිබඳ ව ඇති වන වැරදි හැඟීම් අපරාන්තය නො දැනීම යයි කියන ලද අවිද්‍යාවය.

Non-commercial distribution

අතීතයේ විසූයේත් මමය අනාගතයෙහි වෙසෙන්නේත් මමය කියා අතීතානාගත ස්කන්ධයන් සම්බන්ධයෙන් ඇති වන වැරදි හැඟීම පුබ්බාපරන්තේ අඤ්ඤාණං යනුවෙන් දැක්වෙන අවිද්‍යාව ය.

හේතුඵල පරම්පරාවක් වන මේ නාම රූප ධර්ම රාශිය එක් දෙයක් වශයෙන් වරදවා දැනීම පටිච්ච සමුප්පාදය නො දැනීම නමැති අවිද්‍යාව ය.

**ඛන්ධ සංයුත්තයේ චූලපණ්ණාසකයේ අවිජ්ජාවග්ගයේ** අවිද්‍යාව දැක්වෙන සූත්‍ර දශයක් එන්නේ ය. ඒ සූත්‍රයෙහි අවිද්‍යාව විස්තර කර ඇත්තේ පඤ්චස්කන්ධය අනුව ය. ඉන් එක් සූත්‍රයක අවිද්‍යාව දක්වා ඇත්තේ මෙසේය.

ඉධ භික්ඛු! අස්සුතවා පුථුජ්ජනො සමුදයධම්මං රූපං සමුදයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති, වයධම්මං රූපං වයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති, සමුදයධම්මං රූපං සමුදයවයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති, සමුදයධම්මං වේදනා සමුදය ධම්මා වේදනාති යථාභූතං නප්පජානාති, වයධම්මං වේදනං වයධම්මා වේදනාති යථාභූතං නප්පජානාති, සමුදයවයධම්මා වේදනා සමුදයවයධම්මා වේදනාති යථාභූතං නප්පජානාති. සමුදයධම්මං සඤ්ඤං සමුදය ධම්මා සඤ්ඤාති යථාභූතං නප්පජානාති, වයධම්මං සඤ්ඤං වයධම්මා සඤ්ඤාති යථාභූතං නප්පජානාති, සමුදයවයධම්මං සඤ්ඤං සමුදයවයධම්මා සඤ්ඤාති යථාභූතං නප්පජානාති, සමුදයධම්මෙ සංඛාරේ සමුදය ධම්මා සංඛාරාති යථාභූතං නප්පජානාති, වයධම්මෙ සංඛාරේ වයධම්මා සංඛාරාති යථාභූතං නප්පජානාති, සමුදයවයධම්මෙ සංඛාරේ සමුදයවයධම්මා සංඛාරාති යථාභූතං නප්පජානාති, සමුදයධම්මං විඤ්ඤාණං සමුදයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති, වයධම්මං විඤ්ඤාණං වයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති, සමුදයවයධම්මං විඤ්ඤාණං සමුදයවයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති අයං වුච්චති භික්ඛු අවිජ්ජා.

රූපය ප්‍රත්‍යයෙන් හටගන්නා ස්වභාවය ඇතියක් බව බිඳෙන ස්වභාවය ඇතියක් බව ඇති වන නැති වන ස්වභාවය ඇතියක් බව නොදන්නේ නම් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන් ද

Non-commercial distribution

එසේ නො දන්නේ නම් ඒ නො දැනීම අවිද්‍යාව යනු ඒ සූත්‍රයේ කෙටි තේරුම ය.

මේ අවිද්‍යාව ලෝකය යට කර ගෙන වසා ගෙන සිටින මහා ක්ලේශය ය. එබැවින් "අවිජ්ජාය නිවුතෝ ලෝකෝ"යි වදරා ඇත. ලෝකයේ සියලුම පෘථග්ජනයන් වැඩ කරන්නේ අවිද්‍යාව තුළ සිටගෙන ය. අවිද්‍යාව ඇති පුද්ගලයාට තමාගේ අවිද්‍යාව නො දැනේ. ඔහුට දැනෙන්නේ තමාගේ අවිද්‍යාව විද්‍යාව ලෙසය. අවිද්‍යාව නිසා වරක් වූ මුළාව වරක් ඇති වූ වැරදි හැඟීම ස්ථිර වීමට නොයෙක් හේතූදහරණ ඒ අවිද්‍යාව ම මතු කර දෙන්නේ ය. මරණින් මතු නැවත උපතක් ඇති බව අවිද්‍යාව වසයි. එබැවින් අවිද්‍යාභිභූත පුද්ගලයා මරණින් මතු නැවත උපතක් නැතැයි සිතයි. එය ඔප්පු කිරීමට නොයෙක් හේතූදහරණ ඒ අවිද්‍යාවෙන් ම මතු කරනු ලැබේ. මුළා වූවහුට එය අවිද්‍යාව බව නො දැනේ. ඔහුට දැනෙන්නේ මුළාව ඔප්පු කිරීමට හේතූදහරණ මතු කර දෙන අවිද්‍යාව විද්‍යාව ලෙස ය. ඒවා විද්‍යාව ලෙස දැනීමත් අවිද්‍යාව ම ය.

සත්ත්වයාත් ලෝකයත් ඉබේ ම ඇති වූයේය, කෙනකු විසින් මවන ලද්දේය, සුව දුක් විඳින ඒ ඒ කටයුතු සංවිධානය කරන ශරීරය හා සිත ස්වවශයෙහි පවත්වන කිසිකලෙක නො මැරෙන ජාතියෙන් ජාතියට යන ආත්මයක් ඇත්තේ ය, කුමක් කළත් එයින් පිනක් හෝ පවක් නො වන්නේය, පින් පව් වලින් වන ඵලයක් නැත ය යන මේ දෘෂ්ටි ඇති වන්නේ පටිච්ච සමුප්පාදය ආවරණය කරගෙන සිටින අවිද්‍යාව නිසා ය. ඒ ඒ දෘෂ්ටි ගෙන සිටින අයට ඒවා ඔප්පු කිරීමට නොයෙක් හේතු යුක්ති මතු කර දෙන්නේ ද අවිද්‍යාවෙන් ම ය.

ප්‍රඥාව කිසි කලෙක පව්කම් කිරීමට සහාය වන ධර්මයක් නො වේ. ලෝභය දෘෂ්ටිය විතර්කය විචාරය චිත්තය යන මේ ධර්මයන්ට එකතුව ඒවායේ උපකාරයෙන් මේ අවිද්‍යාව අකුශල කරණයේ දී ප්‍රඥාව මෙන් ක්‍රියා කරන්නේ ය. එසේ ක්‍රියා කරන විද්‍යාවේ මුහුණුවර ඇති අවිද්‍යාවට ලෝකයෙහි කියන්නේ නුවණය කියා ය. සතුන් මැරීමේ නුවණ, සතුන් මරණ උපකරණ

Non-commercial distribution

තැනීමේ නුවණ, යුද කිරීමේ නුවණ, යුද අවි තැනීමේ නුවණ, සොරකම් කිරීමේ නුවණ, මිථ්‍යාචාරය පිළිබඳ නුවණ, වඤ්චා කිරීමේ නුවණ යන මේවා සැබෑ නුවණ නොව විද්‍යා රූපයෙන් ඇති වන අවිද්‍යාව ය.

අර්හත්වයට පැමිණෙන තුරු අවිද්‍යාව පවතී. එහෙත් උපක්‍රමයෙන් එය තුනී කර ගත හැකිය. ආර්යධර්ම උගෙනීම, සත්පුරුෂ සේවනය, භාවනාවෙහි යෙදීම, කාමයන්ගෙන් ඈත්වීම යන මේවායින් ආර්ය විද්‍යාව ඇති කර ගත හැකිය. අවිද්‍යාව තුනී කර ගත හැකිය. ලෝකයෙහි ඇති බොහෝ උගෙනීම්වලින් සිදුවන්නේ අවිද්‍යාව දියුණුවීම හා තහවුරු වීම ය. ඇතැම් පොත් කියවීමෙන් ද එසේ ම වේ.

**සේවෙථ වුද්ධෙ නිපුණේ බහුස්සුතේ**
**උග්ගාහකෝ ච පරිපුච්ඡකෝ සියා**
**සුණෙය්‍ය සක්කච්ච සුභාසිතානි**
**එවං කරෝ පඤ්ඤවා හෝති මච්චෝ**

( සරභංග ජාතක )

තියුණු නුවණැති වෘද්ධ බහුශ්‍රැතයන් (උගතුන්) සේවනය කරන්නේය. උගන්නා වූ ද පිළිවිසීම් කරන්නා වූ ද පුද්ගලයෙක් වන්නේ ය. සුභාෂිතයන් මනා කොට අසන්නේය. එසේ කරන මනුෂ්‍යයා ප්‍රඥාව ඇතියෙක් වන්නේය යනු ගාථාවෙහි තේරුම ය.

**භවතණ්හා**

කාම තණ්හා භව තණ්හා විභව තණ්හා යි තණ්හා තුනක් ඇත්තේ ය. රූපාරූප භව පිළිබඳ වූ ද රූපාරූප භවයන්හි ඉපදීමට හේතු වන රූපාරූපධ්‍යාන පිළිබඳ වූ ද තණ්හාව **භවතණ්හා** නම් වේ.

බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්මපුරෝහිත මහාබ්‍රහ්මය යි ප්‍රථමධ්‍යාන භූමි තුනෙකි. පරිත්තාභ අප්පමාණාභ ආභස්සරය යි ද්විතීයධ්‍යාන භූමි තුනෙකි. පරිත්තසුභ අප්පමාණසුභ සුභකිණ්ණය යි තෘතීයධ්‍යාන භූමි තුනෙකි. වේහප්ඵලය අසඤ්ඤසත්තය අවිහය අතප්පය සුදස්සය සුදස්සීය අකණිට්ඨය යි චතුර්ථධ්‍යාන භූමි

Non-commercial distribution

සතකි. මේ භූමි සොළස රූපාවචර බ්‍රහ්මලෝකයෝ ය. ආකාසානඤ්චායතන ය, විඤ්ඤාණඤ්චායතන ය, ආකිඤ්චඤ්ඤා යතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි අරූපාවචර භූමි සතරෙකි. භවතණ්හා යන මෙහි භවය යි කියැවෙන්නේ ඒ විස්සක් වන රූපාරූප භූමීන්හි ඇති ස්කන්ධයන් හා ධ්‍යානයන් ය. මේ භව තණ්හාව සත්ත්වයාහට නිවනට යන්නට නො දී රූපාරූප භවයන් හි ඔහු බැඳ තබයි. සිත අඳුරු කරන බැවින් එය ක්ලේශයකි.

## 11. භවදිට්ඨි 12. විභවදිට්ඨි

ජාතියෙන් ජාතියට යෙමින් සුව දුක් විඳින නො මැරෙන ආත්මයක් ඇත යන දෘෂ්ටිය **භවදිට්ඨි** නම් වේ. ශාස්වත දෘෂ්ටිය යනු ද එයට නමෙකි. මේ ශාස්වත දෘෂ්ටිය මාර්ගඵල නිර්වාණ සංඛ්‍යාත ලෝකෝත්තර ධර්මයන් ලැබීමට බාධාවක් වුව ද ස්වර්ග සම්පත්තියට බාධක නො වේ. ඒ දෘෂ්ටිය ඇත්තෝ ආත්මය සැපවත් කරනු සඳහා පිනවනු සඳහා පින් කොට ස්වර්ගයෙහි උපදිති. ආත්මය දුකට පත් නො කොට රැකීම පිණිස පව්කම් වලින් වලකිති.

මරණින් මතු ආත්මය සිඳෙන්නේය, කෙළවර වන්නේය යන දෘෂ්ටිය **විභවදිට්ඨි** නම් වේ. උච්ඡේද දෘෂ්ටිය යනු ද එයට නමෙකි. එය බුදුන් කල විසූ **අජිතකේසකම්බල** විසින් පවසමින් සිටි දෘෂ්ටිය ය. "මිනිසා පඨවි ආපෝ තේජෝ වායෝ යන භූතයන් ගේ පිණ්ඩයෙක, මළ පසු ශරීරයේ පඨවි ධාතුව බාහිර පඨවි ධාතුවටත් ආපෝ ධාතුව බාහිර ආපෝ ධාතුවටත් තේජෝ ධාතුව බාහිර තේජෝ ධාතුවටත් වායෝ ධාතුව බාහිර වායෝ ධාතුවටත් වන්නේය. ඉන්ද්‍රියයෝ අහසට යන්නාහ. එයින් සත්ත්වයා කෙළවර වන්නේය. දුන්නා වූ යාග පූජා ද්‍රව්‍ය අලුවීමෙන් කෙළවර වන්නේ ය. දනය මෝඩයන් ගේ වැඩක් ය" යනු ඔහු පවසන දෘෂ්ටිය ය.

එය සුගති, මාර්ග, ඵල, නිර්වාණ යන සියල්ල ම ආවරණය කරන නපුරු දෘෂ්ටියෙකි. ඒ දෘෂ්ටියෙහි පිහිටා සිටිනුවන් මරණින් පසු නැවත උපතෙක් නැතය කියා පිළිගෙන සිටිය ද ඔවුනට අපායෙන් නො ගැලවිය හැකි ය. පින්පව් ප්‍රතික්ෂේප කරන මිථ්‍යාදෘෂ්ටියට කියනුයේ නියත මිථ්‍යාදෘෂ්ටිය කියා ය.

Non-commercial distribution

එහි තේරුම මරණින් මතු ඒකාන්තයෙන් ම අපායට යාමට නියත මිථ්‍යාදෘෂ්ටිය යනු යි. වරදවලින් ලොකු ම වරද මිථ්‍යාදෘෂ්ටිය බව:-

**නාහං භික්ඛවෙ අඤ්ඤං ඒකධම්මම්පි සමනුපස්සාමි යං ඒවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවේ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨි පරමානි භික්ඛවෙ වජ්ජානි.**

(අංගුත්තර ඒකක නිපාත )

යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය. ආනන්තර්ය කර්ම කළවුන් කල්ප විනාශයේදී නරකයෙන් මිදෙන බවත් නියත මිථ්‍යා දෘෂ්ටිකයා කල්ප විනාශයේ දී ද නරකයෙන් නො මිදී විනාශ නොවූ ලෝකයක පාපයට වැටී පැසෙන බවත් **මනෝරථපූරණී අටුවාවෙහි** කියා ඇත්තේ ය.

## 13. සස්සතදිට්ඨි 14. උච්ජේද දිට්ඨි

සස්සත දිට්ඨි උච්ඡේද දිට්ඨි යන වචන වලින් කියැවෙන්නේ භවදිට්ඨි විභවදිට්ඨි දෙක ම ය.

## 15. අත්තවාදිට්ඨි 16. අනත්තවාදිට්ඨි

ආත්මය ආකාශය සේ කොනක් නැති ඉතා මහත් දෙයක් නොව පර්යන්තයක් ප්‍රමාණයක් ඇතියක්ය යන දෘෂ්ටිය **අන්තවාදෘෂ්ටි** නම්. ආත්මයෙහි පර්යන්තයක් නැත, එය අති විශාලය යන දෘෂ්ටිය **අනන්තවාදිට්ඨි** නම් වේ. ආත්මදෘෂ්ටිකයෝ ඔවුන්ගේ හැඟීම් අනුව අනේකාකාර ආත්ම ප්‍රකාශ කෙරෙති. ඇතැමුන්ගේ හැඟීම් අනුව ආත්මය කුඩාය. ඇතැමුන්ගේ හැඟීම් හැටියට ආත්මය විශාල ය. කසිණ භාවනාව කරන්නෝ තමන් විසින් ලබා ඇති කසිණ නිමිත්ත කෙමෙන් මඳින් මඳ මහත් කොට සිතති. ඔවුනට ඔවුන් ගේ සිත් අනුව කසිණ නිමිත්ත මහත් මහත් වී වැටහෙයි. ඇතැමෙක් තමාට වැටහෙන කසිණ නිමිත්ත පමණට, තමාගේ සිතත් ආත්මයත් ඇතිය යි කසිණයේ ප්‍රමාණයෙන් ආත්මය ප්‍රමාණ කරයි. ඔහුට කසිණය සේ ම ආත්මයත් පර්‍යන්තයක් ඇතියක් ය යන දෘෂ්ටිය ඇති වේ.

Non-commercial distribution

ආත්මය ගැන සොයන ඇතැම් තාර්කිකයන්ට හා නිගණ්ඨයන්ට හා ආජීවකයන්ට මේ දෘෂ්ටිය ඇති වන බව කියා තිබේ. උත්පත්තියෙන් සත්ත්වයා පූර්වාන්තය ඇතියෙක, මරණයෙන් අපරාන්තය ඇතියෙකැයි ගන්නා උච්ඡේදවාදීන්ට ද මේ දෘෂ්ටිය ඇති වන බව කියනු ලැබේ. කසිණ නිමිත්ත ප්‍රමාණයක් නැති තරමට මහත් කොට වැඩූ අයට කසිණ නිමිත්ත අනුව ආත්මය අන්තරහිතය යන දෘෂ්ටිය ඇති වේ.

## 17. පුබ්බන්තානුදිට්ඨි
## 18. අපරන්තානුදිට්ඨි

පුබ්බන්ත යනු අතීත කොට්ඨාසය ය. අපරන්ත යනු අනාගත කොට්ඨාසය ය. සමහරුන්ට තමාගේ අතීත භව පරම්පරාව දැකිය හැකි ශක්තිය ඇති වේ. මම අතීතයේ මෙබඳු ශරීර ඇති ව මේ මේ නම් ඇතිව මෙ බඳු සැපදුක් ඇතිව විසුවෙමි යි අතීත ස්කන්ධ පරම්පරාව එක් කොට ආත්ම වශයෙන් ගැනීම පුබ්බන්තානු දිට්ඨිය ය. මේ ශීලයේ බලයෙන් මේ දනයේ මේ භාවනාවේ මේ පූජාවේ බලයෙන් අනාගතයෙහි මිනිසෙක් වෙමිය දෙවියෙක් වෙමිය යනාදීන් අනාගත ස්කන්ධ පරම්පරාව ඒකත්වයෙන් ගෙන එය ආත්ම වශයෙන් ගැනීම අපරන්තානුදිට්ඨිය ය.

## 19. අහිරික 20. අනොත්තප්ප

පාපය අසූචිය සේ පිළිකුල් දෙයකි. පව් කිරීම මුහුණෙහි අසූචි තවරා ගැනීම වැනි ලැජ්ජා විය යුතු දෙයකි. එසේ වූ පාපය පිළිකුල් නො කරන පව් කිරීමට ලැජ්ජා නො වන ස්වභාවය **අහිරික** නම් වේ. පාපය උසස් දෙයක් කොට සැලකීම, පව්කිරීම සම්මානයට සුදුස්සක් කොට සැලකීම අහිරිකය ය. මෙලොව පරලොව දෙක්හි ම අනිෂ්ට විපාක ලැබෙන දෙයක් බැවින් පාපය බිය විය යුත්තකි. පාපයට බිය නො වන ස්වභාවය **අනොත්තප්ප** නම් වේ. පව් කිරීම වික්‍රමයක් කොට සැලකීම අනොත්තප්පය ය. අහිරික අනොත්තප්ප යන මේ චෛතසික ධර්ම දෙක ඔවුනොවුන්ගෙන් වෙන් නොවූ සැම කල්හි ම එක්ව එක සිතක ඇතිවන ධර්ම දෙකකි. මේ දෙක අකුසල

Non-commercial distribution

කරණයට ඇති මහා බල දෙක ය. මේ බල දෙක නැතිනම් පිළිකුල් කළ යුතු බිය විය යුතු අකුශලයන් නො කළ හැකි ය. ප්‍රාණවධය ලජ්ජා විය යුතු පාපයෙකි. එය කළ හැකි වන්නේ අහිරික අනොත්තප්පයන්ගේ බලයෙනි. මිනී මැරීම ඉතා භයානක පාපයෙකි. ඇතැමුන් එය කරන්නේ අහිරික අනොත්තප්පයන්ගේ බලයෙනි. මිනීමරුවන් මා මෙපමණ මිනිසුන් මරා ඇත්තේ ය යි ආඩම්බර වන්නේ නිර්භීත භාවය පවසන්නේ අහිරික අනොත්තප්ප බලයෙනි. පිළිකුල් කළ යුතු බිය විය යුතු සොරකම් කරන්නේ ද, පරදර සේවනය කරන්නේ ද, බොරු කියන්නේ ද, සුරාපානය කරන්නේ ද, අහිරික අනොත්තප්ප බලයෙන්ම ය. අහිරික අනොත්තප්ප දෙකට විරුද්ධ හිරි ඔත්තප්ප නම් වූ කුශල පක්ෂයට අයත් ධර්ම දෙකක් ඇත්තේ ය. “ද්වේ මේ භික්ඛවේ ජ ධම්මා සුක්කා ලෝකං පාලෙන්ති. කතමේ ද්වේ හිරී ච ඔත්තප්පං ච” යනුවෙන් හිරි ඔත්තප්ප ධර්ම දෙක ලෝකය පාලනය කරන ධර්මයෝ ය යි වදරා ඇත්තේ ය. ලෝකය රැකෙන්නේ හිරි ඔත්තප්ප දෙකෙනි. මිනිසුන් අතර ඒ ධර්ම දෙක නැති නම් මාපියන් දූදරුවන් සහෝදර සහෝදරියන් වෙනසක් නැතිව හැසිර මිනිස් සමූහයත් තිරිසනුන් වන්නාහ. ඒ දේශනය අනුව අහිරික අනොත්තප්ප යන මේ ධර්ම දෙක ලෝකනාශක ධර්මයයි කිය යුතුය.

**හිරිඔත්තප්ප සම්පන්නා - සුක්කධම්ම සමාහිතා.**
**සන්තෝ සප්පුරිසා ලෝකේ - දේවධම්මාති වුච්චරේ**

(ජාතකපාළි)

යනුවෙන් හිරි ඔතප් දෙක **දේවධර්මය** යි වදරා ඇත්තේ ය. ඒ අනුව අහිරික අනොත්තප්ප දෙක **තිරශ්චීන ධර්මය** යි කිය යුතු ය. ඒ ධර්ම දෙක ඇති බැවින් තිරිසනාට වළකින්නට දෙයක් නැත. කිනම් නීච ක්‍රියාවක් වුවද තිරිසනාට කළ හැකි ය.

**අජේගුච්ඡ අහිරිකෝ - පාපා ගූථාව සූකරෝ**
**අහිරූ ච අනොත්තප්පි - සලභෝ විය පාවක.**

ගූථය පිළිකුල් නො කරන සූකරයා මෙන් අහිරිකයා පාපය පිළිකුල් නො කරන්නේ ය. පළහැටියා ගින්නට බිය

Non-commercial distribution

නො වන්නාක් මෙන් අනොත්තප්පය ඇත්තේ පාපයට බිය නො වන්නේ ය.

අහිරික අනොත්තප්ප නමැති ලෝක නාශක තිරශ්චීන ධර්ම දෙක හිරිඔතප් නමැති ලෝකපාලක බල ධර්ම දෙක ඇති කර ගැනීමෙන් දුර ලිය යුතුය. ජාතිය වයස ශූරභාවය උගත්බව යන මේ කරුණු සලකා අහිරිකය දුරු කළ හැකිය. මේ පව් කිරීම වැදි කෙවුල් සැඩොල් ආදීන්ට මිස මා වැනි ජාතිසම්පන්නයකුට නුසුදුසුය යි සැලකීමෙන් හිරිය ඇති වී අහිරිකය දුරු වේ. මේ පව් කිරීම කොල්ලන් කෙල්ලන්ට මිස මා වැනි වෘද්ධයකුට නුසුදුසුය යි වයස සැලකීමෙන් හිරිය ඇති වී අහිරිකය දුරු වේ. පව් කිරීම කිසිවකට සමත් කමක් නැති අවාසනාවත් පුද්ගලයන්ට මිස දැහැමින් ජීවත් වීමට සමත් මා වැනියන්ට නුසුදුසුය යි ශූරභාවය සැලකීමෙන් හිරිය ඇති වී අහිරිකය දුරු වේ. පව්කම් කිරීම අඥයන්ගේ ක්‍රියාවෙක, මා වැනි පණ්ඩිතයකුට උගතකුට පව් කිරීම නුසුදුසු ය යි උගත් බව සැලකීමෙන් ද හිරිය ඇති වී අහිරිකය දුරු වේ. පව් කිරීමෙන් මෙ ලොව සිදු විය හැකි සත්පුරුෂයන් විසින් බැහැර කරනු ලැබ බොහෝ ජනයාගේ පිළිකුලට භාජනවීම, අපකීර්තිය පැතිරීම, දඩුවම් ලැබීම යන මෙවාත් මරණින් මතු අපාගත වීමත් සැලකීමෙන් ඔත්තප්පය ඇති වී අනොත්තප්පය දුරු වේ.

## 21. දෝවචස්සතා 22. පාපමිත්තතා

ගුරුවරයන්ගේ හා මාපියන්ගේ ද අවවාද පිළිගැනීමට සුදුසු අන් දැනුමැතියන්ගේ ද අවවාදයන් අනුශාසනයන් නො පිළිගන්නා ස්වභාවය **දෝවචස්සතා** නම් වේ. එනම් අකීකරු බව ය. පුද්ගලයකු දුර්වල වන්නේ රාග ද්වේෂ මෝහ මානාදීන් නිසා ය. බොහෝ තරුණ තරුණියෝ රාගයෙන් මඩනා ලදුව මාපියාදි හිතවතුන්ගේ අවවාද නො පිළිගෙන සිය කැමැත්තට අනුව ක්‍රියා කොට විනාශයට පත් වෙති. ඇතැම් පැවිද්දෝ ද රාගය නිසා ආචාර්යෝපාධ්‍යායයන් ගේ අවවාදයට අනුකූල නොවී පැවිද්දෙන් පිරිහෙති. අන්‍යයකු හා හෝ අවවාද දායකයා හා හෝ ද්වේෂයෙන්

Non-commercial distribution

සිටින තැනැත්තා ද අවවාද නො පිළි ගනී. කළ යුත්ත නො කළ යුත්ත මග නො මග මම දනිමි ය, කාගේවත් අවවාද මට නුවුමනා ය යන සම්මෝහය නිසා ද අවවාද නො පිළි ගනී. ඇතැම්හු මට ගුරුකම් දෙන්නට කෙනෙක් නැත යන මානය නිසා ද අවවාද නො පිළිගනිති. ධර්ම වශයෙන් කියත හොත් රාග ද්වේෂ මෝහ මානාදිය ම දෝවචස්සතාවය යි කිය යුතුය. දෝවචස්සතා නම් වූ මේ අවවාද නො පිළි ගන්නා ස්වභාවය මහත් පරිහානිකර කරුණෙකි. එයින් පිරිහීමට පත්ව සිටින අය ලෝකයෙහි බොහෝ ය. **සෝවචස්සතා** නම් වූ අවවාද පිළිගන්නා ස්වභාවය දියුණුවට ඉමහත් හේතුවකි. සෝවචස්සතා ගුණය මංගල සූත්‍රයෙහි දැක්වෙන අටතිස් මගුල් කරුණු වලින් ද එකකි. උගත් නූගත් බාල මහළු කාහටත් වරදින අවස්ථා ඇති වේ. මුළාවන අවස්ථා ඇති වේ. කා අතිනුත් වරද සිදු විය හැකි ය, කවුරුනුත් නො මග යා හැකි ය. තමාගේ වරද තමාට නො පෙනේ. එය පෙනෙන්නේ අන්‍යයන්ට ය. නොයෙක් විට උගතා ගේ වරද නූගතාට ද ගුරුවරයාගේ වරද ගෝලයාට ද පෙනේ. මාපියන්ගේ වරද දූදරුවන්ට ද පෙනේ. එසේ පෙනෙන බැවින් සමහර විට උගතුන්ට නූගතුන්ගෙන් ද වටිනා අවවාද ලැබේ. මාපියන්ට ද දරුවන්ගෙන් වටිනා අවවාද ලැබේ. එබැවින් කවුරුන් විසිනුත් අවවාද පිළිගත යුතුය. සමහරුන්ගෙන් ලැබෙන අවවාද පිළිගැනීමට නුසුදුසු ඒවා විය හැකි ය. එහෙත් කාගෙන් වුවද අවවාදයක් ලද හොත් එය ප්‍රතික්ෂේප කිරීමට ඉක්මන් නො වී විමසා බැලිය යුතු ය. පහත් කෙනකුගේ අවවාදයක් පිළිගැනීම තමාට මදිකමකැයි නො සිතිය යුතු ය. ප්‍රඥාවෙන් බුදුරදුන්ට පමණක් දෙවෙනි සැරියුත් මහ තෙරුන් වහන්සේ කුඩා අයගේ අවවාද ගෞරවයෙන් පිළිගත්හ.

දිනක් සැරියුත් මහ රහතන් වහන්සේ හැඳ සිටි අඳනයේ කොනක් එල්ලෙමින් තිබුණේ ය. කොන එල්ලෙන සේ හැඳීම පරිමණ්ඩල සිකපදයට විරුද්ධ ය. එය දුටු සත් හැවිරිදි සාමණේර නමක් "ස්වාමීනි, නුඹ වහන්සේ ගේ අඳනයේ කොනක් එල්ලේය" යි කී ය. එබස් ඇසූ සැරියුත් මහ තෙරුන් වහන්සේ එකෙණෙහි ම පරිමණ්ඩල සිකපදය අනුව අඳනය සකසා හැඳ "ආචාර්යයෙනි, දැන් හොඳදැ" යි කියා ඇඳිලි බැඳ,

Non-commercial distribution

**තදහු පබ්බජිතෝ සන්තෝ - ජාතියා සත්තවස්සිකො**
**සෝපි මං අනුසාසෙය්‍ය - සම්පටිච්ඡාම මත්ථකෙ**

( දේවපුත්ත සංයුත්තට්ඨකථා )

යනුවෙන් දැක්වෙන පරිදි එදවස් පැවිදි වූ සත් හැවිරිදි නමක් වුව ද මා හට අනුශාසනා කළ හොත් මුදුනෙන් පිළිගනිම් යි වදළහ.

## පාපමිත්තතා

පරපණ නසන, සොරකම් කරන, කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන, සුරාපානය කරන, ශ්‍රද්ධාව නැති, තුනුරුවන්ට අගරු කරන, මසුරු නපුරු අදහස් ඇති, ධර්මය නො දත් ගිහියෝ ද; දුශ්ශීල වූ ලාමක ගති පැවතුම් ඇත්තා වූ අපවිත්‍ර කායකර්මාදිය ඇත්තා වූ සැක කළ යුතු පැවතුම් ඇත්තා වූ ශ්‍රමණත්වය නැති ව ශ්‍රමණයන් සේ පෙනී සිටින්නා වූ අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරීන් සේ පෙනී සිටින්නා වූ කුණු වූ කායකර්මාදිය ඇත්තා වූ රාගාදි කෙලෙස් දියෙන් තෙත් වූ රාගාදි කෙලෙස් කසළ ඇත්තා වූ පැවිද්දෝ ද පාපී පුද්ගලයෝ ය. ගිහි වූ හෝ පැවිදි වූ හෝ ඒ පාප පුද්ගලයන්ට නැමී සිටින ඔවුන් වෙත නැවත නැවත එළඹෙන ඔවුන් හා එක්ව කටයුතු කරන එක්ව වාසය කරන ස්වභාවය **පාපමිත්තතා** නම් වේ. එය ඒ ආකාරයෙන් ඇතිවන තණ්හාව ය. පාප පුද්ගලයන් හොඳ අතට හැරවීමේ අදහසින් මෛත්‍රියෙන් කරුණාවෙන් ඔවුන් හා මිත්‍ර කම් පැවැත්වීම ඔවුන් ඇසුරු කිරීම පාපමිත්තතා නම් වූ ක්ලේශය නො වේ. යහමගට පැමිණවීම පිණිස පාප පුද්ගලයන් සේවනය කිරීම කුශල ක්‍රියාවකි. සත්පුරුෂයන් එසේ නො කළහොත් පාපීන්ට යහමගට හැරීමට ක්‍රමයක් නැත. පාපය පිළිකුල් කළ යුත්තකි. බුදුරදුන් විසින් වදරා ඇත්තේ පාපී පුද්ගලයන් ද භජනය නො කළ යුතු පිළිකුල් කටයුතු පුද්ගලයන් බව ය. ධර්මසංඥාවක් නැති පෘථග්ජන පුද්ගලයාගේ සිත පවතින්නේ පවට බරව ය. ඔහුට කුශලයෙන් සතුටක් නො ලැබිය හැකිය. ඔහුට ඇති මිහිර පාපය ය. ඔහුට ප්‍රීතියක් ලැබෙන්නේ පාපයෙනි. පාපකාරී පුද්ගලයන් ද ඔහුට ප්‍රිය ය. ඔහු ගේ සිත ලෙහෙසියෙන් ම පාපකාරීන් වෙත ඇදෙන්නේ ය. නැමෙන්නේ ය. සත්පුරුෂයන් ඔහුට එතරම් ප්‍රිය නැත. ඔහුට

Non-commercial distribution

පෙනෙන්නේ හොඳ නරක කියන සත්පුරුෂයන් කරදරකාරයන් ලෙස ය. එබැවින් පාප පුද්ගලයන් වෙත ධර්මය නො දත් පෘථග්ජන පුද්ගලයාගේ සිත ලෙහෙසියෙන් ඇදී යා හැකි බැවින් එසේ නොවන පරිදි පරිස්සම් විය යුතු ය. පාපමිත්‍ර සේවනය ඉතා අනර්ථකර කරුණෙකි. කලින් යහපත් චරිතය ඇතිව සිටි බොහෝ දෙනකුන් පව්කාරයන් වී දෙලොවින් ම පිරිහෙන්නේ පාප මිත්‍ර සේවනයෙනි. එබැවින් එය භයානක දෙයක් ලෙස සැලකිය යුතුය. ලෝකයෙහි යහපත් පුද්ගලයන් වී දියුණු වී සිටිය හැකි බොහෝ දෙනකුන් දෙලොවින්ම පිරිහෙන්නේ පාපමිත්‍ර සේවනයෙනි. ගිහියන් බෙහෙවින් පිරිහෙන්නේ ගිහි පාපමිත්‍රයන් නිසා ය. පැවිද්දන් බෙහෙවින් පිරිහෙන්නේ ශ්‍රමණ පාපමිත්‍රයන් නිසා ය. ශ්‍රමණ පාපමිත්‍රයා නිසා ගිහි පැවිදි දෙපක්ෂය ම පිරිහෙන බව කිය යුතු ය. අජාසත් රජතුමා පමණ බුදුනට පැහැදී සිටිය අනිකෙක් නො වීය. දේවදත්ත නමැති පාප භික්ෂුව ඇසුරු කිරීම නිසා ඔහුට අපායට යන්නට සිදු විය.

ඇතැම්හු පාපපුද්ගලයන්ගෙන් ලබාගත යුතු යම් යම් ප්‍රයෝජන ලබනු පිණිස ඔවුන් ආශ්‍රය කළ ද අපි ඔවුන් අනුගමනය නො කරමු ය, ඔවුන් කරන පව්කම් වලට හවුල් නො වෙමුය යි සිතමින් කියමින් පාපමිත්‍ර සේවනය කෙරෙති. ඔවුන්ට ආරම්භයේදී පව්කම් පිළිකුල් ය. නැවත නැවත දැකීමෙන් ඒ පිළිකුල ක්‍රමයෙන් හීන වේ. පව්කම් ගැන මධ්‍යස්ථ භාවයක් ඇති වේ. තවත් කල් යාමෙන් මඳින් මඳ පව්කම් වලට සහාය වන්නට පටන් ගනී. අන්තිමේ දී තුමූ ද ඒවා කරන්නට පටන් ගනී. මෙසේ විය හැකි බැවින් කිනම් කරුණක් නිසා වුව ද පාපමිත්‍ර සේවනය නොකිරීම ම යහපත් බව කිය යුතු ය.

**යාදිසං කුරුතෙ මිත්තං - යාදිසං චූපසේවති,**
**ස වේ තාදිසකෝ හෝති - සහවාසෝ හි තාදිසෝ.**

( ඉතිවුත්තක )

යම්බඳු පුද්ගලයකු මිත්‍ර කර ගනී ද යම්බඳු පුද්ගලයකු සේවනය කෙරේ ද ඔහු ද එබඳු වන්නේ ය. එක්ව වාසය කිරීමේ ස්වභාවය එය ය.

Non-commercial distribution

පාපකාරීන් ඇසුරු කරන්නේ සොරකම් ආදි පව්කම් වලට සහභාගී වේ. සහභාගී නුවූයේ ද පව්කම් ගැන සැක කරනු ලබන්නේ ය. එයින් ඔහුට අපකීර්තියක් ද ඇති වන්නේ ය.

**අකරොන්තෝපි වේ පාපං - කරොන්ත මුප සේවති.**
**සංකියෝ හෝති පාපස්මිං - අවණ්ණෝ චස්ස රූහති.**

(ඉතිවුත්තක )

පව් නොකරන්නේ ද පාපකාරීන් සේවනය කෙරේ නම් පව් කම් ගැන සැක කළ යුත්තෙක් වන්නේ ය, අපකීර්තියක් ද ඔහුට වන්නේ ය යනු ගාථාවේ තේරුම ය.

අලි බලන්නා අලියාගෙන් නැසෙන්නාක් මෙන් සර්පයන් ඇසුරු කරන්නා සර්පයකුගෙන් නැසෙන්නාක් මෙන් දුර්ජන පාපීන් ඇසුරු කරන්නා ඔවුන්ගෙන් ම විපතට පත් වේ. ඇතැම් පාපීහු ඔවුන් කළ අපරාධ වලට ආශ්‍රිතයන් හසු කොට ඔවුහු ගැළවෙති. පාප මිත්‍රයන්ගෙන් උපකාර ලැබීමෙන් ද වන්නේ නොයෙක් විට නපුරෙකි. පාපමිත්‍රයන්ට උපකාර කිරීමෙන් ද නොයෙක් විට වන්නේ නපුරෙකි. පාපීන්ට උපකාර කිරීමෙන් බෝසතාණන් වහන්සේට නොයෙක් විට විපත් පැමිණි බව ජාතක කතා වල දක්නා ලැබේ. කරුණු මෙසේ හෙයින් පාප මිත්‍ර සේවනයෙන් වෙන්වීම කාහටත් යහපතක් බව කිය යුතු ය.

## 23. අනජ්ජවො 24. අමද්දවො

ඇද නැති බව අජ්ජව නම් වේ. ඇද බව සෘජුත්වක් නැති බව **අනජ්ජව** නම් වේ. එනම් වංක බවය. යමකු පව්කමින් වැළකී දිගට ම කුශල ක්‍රියා ම කරන්නේ නම් ඔහුගේ ඒ ක්‍රියා පරම්පරාව ඇද නැති ගැට නැති මට්ටට් රිටක් සේ සෘජුය. එසේ යහපත් ක්‍රියා කරගෙන යන පුද්ගලයා යම්කිසි විටෙක පව්කමක් කළහොත් එය ඔහුගේ ක්‍රියා පටිපාටිය අන් අතකට හැරීම ය. එයින් ක්‍රියා පටිපාටිය ඇද වූයේ වෙයි. ඇද යයි කියනුයේ එක් අතකට කෙළින් ම පැවති දෙය අන් අතකට හැරීම ය. මේ ඇදය ඒ ඒ ක්‍රියා අනුව වෙන වෙන ම ද කිය හැකි ය. ප්‍රාණවධයෙන් වළකින තැනැත්තා

Non-commercial distribution

එය දිගට ම පවත්වනවා නම් ඒ ඍජු බවය. අතරකදී කළ හොත් එය ප්‍රතිපත්තිය ඇදවීම ය. අන්‍ය පාපයන්ගෙන් වැළකීම ගැන ද එසේ ම සැලකිය යුතු ය.

**ගෝමුත්‍රවංකය, චන්ද්‍රලේඛාවංකය, නංගල ශීර්ෂ වංකය** යි තුන් ආකාර වංකයක් අටුවාවල දක්වා ඇත්තේය. එය විස්තර කර ඇත්තේ මෙසේ යː

යමෙක් පව් කරමින් ම මම පව් නොකරමි යි කියා නම් ඔහුගේ ඒ ගතිය ඉදිරියට පස්සට ඒමක් බැවින් ගෝමුත්‍ර වංකය ය. යමෙක් පව් කරමින් ම මම පවට බිය වෙමි යි කියා නම් ඔහුගේ ඒ ගතිය බෙහෙවින් ඇදයක් බැවින් චන්ද්‍රලේඛා වංකය ය. යමෙක් පව් කරමින් ම කවරෙක් පාපයට බිය නොවේ දැයි කියා නම් ඔහුගේ ඒ ගතිය මහත් ඇදයක් නො වන බැවින් නංගලකෝටි වංකය ය. තවත් ක්‍රමයක් මෙසේ යː යමකුගේ කර්මද්වාර තුන ම අශුඬ නම් එය ගෝමුත්‍ර වංකය ය. කර්මද්වාර තුනෙන් දෙකක් අශුඬ නම් ඒ චන්ද්‍රලේඛා වංකය ය. එක් කර්මද්වාරයක් අශුඬ නම් ඒ නංගලශීර්ෂවංකය ය. මේ අභිධර්ම අටුවාවේ ආ ක්‍රමය ය. දීඝ නිකාය අටුවාවෙහි දැක්වෙන ක්‍රමය මෙසේ ය :–යම් පැවිද්දෙක් ප්‍රථම වයසේදී එක් විසි අනේසනයන්හි හා සයක් වූ අගෝචරයන්හි ද යෙදෙමින් කල් යවා මධ්‍යම පශ්චිම දෙවයසෙහි ලජ්ජී ශික්ෂාකාමී පුද්ගලයෙක් වේ නම් ඔහුගේ ස්වභාව ගෝමුත්‍රවංකය ය. ප්‍රථම පශ්චිම වයස දෙක්හි අනේසන අගෝචරයන්හි හැසිර මැදුම්වියේ දී ශික්ෂාකාමී පුද්ගලයකු වන භික්ෂුවගේ ස්වභාවය චන්ද්‍රලේඛා වංකය ය. ප්‍රථම මධ්‍යම දෙවයසෙහි ශික්ෂාකාමීව සිට පශ්චිම වයසේ දී අනේසන අගෝචරයන්හි හැසිරෙන්නහු ගේ ඒ ස්වභාවය නංගල කෝටි වංකය ය. තුන් වියේ දී ම මැනවින් හැසිරෙන භික්ෂුව ගේ ස්වභාවය අවංක ය.

අන්‍යයන් ගැන නො සලකන, අන්‍යයන් හා හොඳින් කථා නො කරන, අප්‍රිය කථා කරන, අසන දෙයකට පිළිතුරක් නො දෙන, නැමිය යුත්තන්ට නො නැමෙන ගරු කළ යුත්තන්ට ගරු නො කරන, වැඳිය යුත්තන්ට නො වඳින, කාහටත් කීකරු නො වන රළු ගතිය තද ගතිය **අමද්දව** නම් වේ. එය ඒ ආකාරයෙන් පවත්නා

Non-commercial distribution

අධික මානය ය. අමද්දවය ඇති පුද්ගලයා කුළු ගොනකු වැනි ය. කුළු මීහරකකු වැනි ය. ජනයාට අප්‍රියය, බොහෝ දෙනා විසින් වර්ජනය කරන පුද්ගලයෙකි.

මේ රළු ගතිය දෙලෝ වැඩ නසනා ඉමහත් දුර්ගුණයෙකි. මෘදු බව නමැති සද්ගුණයෙහි පිහිටා එය නැති කර ගත යුතු ය. ගරු කළ යුත්තන්ට ගරු කරන ස්වභාවය උත්තම පුද්ගලයන් ගේ ගුණයෙකි. ගරු කිරීම හා යටහත් පැවැත්ම උසස් ගුණයක් වන බැවින් පස් මරුන් පරදවා සර්වඥපද ප්‍රාප්තව ලෝකාග්‍රත්වයට පැමිණි භාග්‍යවතුන් වහන්සේ බුදු වූ අලුත නේරඤ්ජරා නදී තීරයේ අජපාල නුගරුක මුල වැඩ වෙසෙන සේක. ගෞරවයක් යටහත් පැවැත්මක් නැති ව විසීම දුකෙක, මා විසින් ගරු කිරීමට සුදුසු පුද්ගලයකු සොයා ගරු බුහුමන් කරමින් විසිය යුතු ය යි සිතා සුදුසු පුද්ගලයකු සොයන සේක් එයට සුදුස්සකු නො දැක, උන් වහන්සේ තමන් වහන්සේ විසින් අවබෝධ කර ගත් ධර්මයට ම ගරු කරමින් සත්කාර කරමින් වාසය කරන්නට සිතා ගත්හ.

## 25. අක්ඛන්ති 26. අසෝරච්චං

බැණුම් තර්ජන අවමාන ධනහානි ඥාතීන්ගේ මරණ බලාපොරොත්තු කඩවීම අධික ශීතෝෂ්ණ රෝග සතුන්ගෙන් වන කරදර සාගින්න පිපාසාව යනාදියට ඔරොත්තු නො දෙන සිතෙහි දුබල බව **අක්ඛන්තිය** ය. එයට නො ඉවසීමය යි ද කියනු ලැබේ. තවත් ක්‍රමයකින් කියත හොත් ඉහත කී කරුණුවල දී කෝපවීම, ,කෝලාහල කිරීම, බියවීම, පලායාම, ගමරට හැරයාම, ශෝක වීම, හැඬීම, කටයුතු අතපසු කිරීම, කටයුතු අත හැරීම යනාදිය අක්ඛන්තිය යි කිය යුතු ය. අනුන් කරන වරද හා තමාට වන අලාභ හානි දුක් වේදනා ඉවසිය හැකි බව මහා බලයෙකි. එයට ක්ෂාන්ති බලය යි කියනු ලැබේ. ඒ ක්ෂාන්තිය මහා බෝධිසත්වයන් පුරන පාරමිතා දශයෙන් ද එකකි. අඥයෝ ඒ ක්ෂාන්ති බලය දුබල බවෙකැයි ද ඉවසීමට නො සමත් බව වූ දුබලකම බලයකැයි ද සිතා අන්‍යයන් හා කෝලාහල කර ගනිමින් පිරිහීමට පත් වෙති.

Non-commercial distribution

කෝලාහල නොකර අනුන් කළ වරද ඉවසීමෙන් තමාට ද වරද කළ තැනැත්තාට ද යන දෙදෙනාට ම වන්නේ යහපතෙකි. කෝලාහලයෙන් වන්නේ දෙපක්‍ෂයටම විපතෙකි.

**උභින්න මත්ථං චරති - අත්තනෝ ච පරස්ස ච**
**පරං සංකුපිතං ඤත්වා - යො සතො උපසම්මති**

(සක්ක සංයුත්ත)

යමෙක් අනුන් කිපුණු බව දැන තෙමේ නො කිපී සන්සිඳේ නම් හෙතෙමේ තමාගේ ද අන්‍යයාගේ ද යන දෙදෙනාගේ ම අර්ථය පිණිස හැසිරෙන්නේ ය.

**උභින්නං තිකිච්ඡන්තානං - අත්තනෝ ච පරස්ස ච**
**ජනා මඤ්ඤන්ති බාලෝති - යෙ ධම්මස්ස අකෝවිද**

(සක්ක සංයුත්ත)

කෝලාහල නො කිරීම් වශයෙන් තමාට ද අනිකාට ද යන දෙදෙනාට ම පිළියම් කරන්නා වූ තැනැත්තා ධර්මය නොදත් අඥයෝ මෝඩයෙකැ යි සිතත්.

උත්තම පුද්ගලයෝ අනුන් ගේ බැණුම්වලින් නො සෙල්වෙති. පෙර ලක්දිව විසූ **දීඝභාණක අභය** තෙරුන් වහන්සේ මාගම දී **ආර්‍ය්‍යවංශ ප්‍රතිපදාව** දේශනය කළහ. බණ ඇසීමට බොහෝ ජනයා පැමිණියහ. එයින් උන් වහන්සේට බොහෝ සත්කාර ලැබිණ. එය දුටු එක්තරා තෙර නමකට එය නො ඉවසිය හැකි වී දීඝභාණකයා ආර්‍ය්‍ය වංශය දේශනය කරමි යි රාත්‍රිය මුළුල්ලෙහි කෝලාහලයක් කෙළේ ය යි කියමින් බණින්නට විය. බණ අවසන් වී තම තමන්ගේ විහාරවලට වැඩම කළා වූ ඒ ස්ථවිර දෙනම ගව්වක් මඟ එකට ම ගමන් කළහ. කෝප වී සිටි ස්ථවිර තෙමේ මඟ දිගට ම ද අභය තෙරුන් වහන්සේට බණිමින් ම ගමන් කෙළේ ය. විහාර දෙකට යන මඟ බෙදෙන තැන දී අභය තෙරුන් වහන්සේ බණින තෙරුන් වහන්සේට වැඳ "ස්වාමීනි, මේ ඔබ වහන්සේ ගේ මඟය"යි කීහ. ඒ ස්ථවිර තෙමේ තුෂ්ණීම්භූත ව ඒ මඟ ගියේ ය. අභය තෙරුන් වහන්සේ ද තමන්ගේ විහාරයට ගොස් පා සෝදා අසුනක හිඳ ගත්හ. අතවැසියෝ උන් වහන්සේ වෙත එළඹ, "ස්වාමීනි, මඟ දිගට ම

Non-commercial distribution

බැන්නා වූ ස්ථවිර නමකට කිසිවක් නොකී සේක් දැ" යි කීහ. එකල්හි අභය තෙරුන් වහන්සේ "ඇවැත්නි, ඉවසීම ම අපට භාර දෙය ය, කමටහනින් වෙන් ව තැබූ එක පියවරකුදු නොදකිමු" යි කීහ. ඉවසීමට නො සමත් බව නමැති දුබල කම දුරු කොට ශාන්ති බලය ඇති කර ගත හැකිවීමට මෙවැනි කතා ආදර්ශයට ගත යුතු ය.

ඇතැම්හු තමන් ගේ කෙනකු කලුරිය කළ විට බිම පෙරළෙමින් හඬති. අතින් පපුවට ගසා ගනිති. නො කා නො බී සිටිති. එය ද අක්ඛන්ති නම් වූ දුබල බව ය. ඇතැම්හු කෙනකු මළහොත් එසේ කළ යුතු යයි සිතති. නො කිරීම මළහුට අගෞරවයකැයි සිතති. එය අනුවණ කමකි. තමාගේ කෙනකු නැතිවීම පාඩුවක් වුව ද ශෝක කිරීමෙන් ඒ පාඩුව නො පිරීමැසේ.

අද ශීතල අධිකය, අද උෂ්ණය, අද වැස්සය, පින්නය, අසනීපය කියා කටයුතු පමා කිරීම ද අක්ඛන්තිය ම ය. එසේ කරන්නෝ සැපයෙන් පිරිහෙති. ශීතෝෂ්ණාදිය ගණන් නො ගෙන ඉවසීමෙන් ක්‍රියා කරන්නෝ සැපතින් නො පිරිහෙති. ඇතැම්හු රැකියාවක් නැත, ධනයක් නැත කියා තැවි තැවී කල් යවති. එද අක්ඛන්තිය ය. එයින් පුද්ගලයා තවත් පිරිහේ. තැවි තැවී නො සිට කුමක් හෝ කරන වෛර්‍ය්‍යවත් පුද්ගලයා සැපතට පැමිණේ.

**අසෝරච්චං**

දුසිල් බව **අසෝරච්ච** නම් වේ. ගිහියන් විසින් කායද්වාරයෙන් සිදුවන අකුශල කර්ම තුනෙන් හා වාක් ද්වාරයෙන් සිදුවන අකුශල කර්ම හතරෙන් නො වැළකීමත් පැවිද්දන් විසින් ශ්‍රමණ ශීලයට අයත් සිකපද නො රැකීමත් **අසෝරච්චය** ය.

## 27. අසාබල්ලං 28. අප්පටිසන්ථාරෝ

අසන්නාට අප්‍රිය, අසන්නාගේ සිත රිදෙන නොමනා කථා කරන බව **අසාබල්ල** නම් වේ. මේ අසාබල්ලය මානයත්, ද්වේෂයත් ය. ඇතැම්හු තමන් උසස් කොට අනුන් පහත් කොට සලකන මානය නිසා ද ඇතැම්හු අනුන් ගැන ඇති නො සතුට ද්වේෂය නිසා ද

Non-commercial distribution

නොමනා කථා කෙරෙති. තෝ බොල අරූ මූ ඕකා මේකා ලොක්කා නාකියා වර පල දුවපිය කාපිය බීපිය යනාදි වශයෙන් කරන කථා අසන්නවුන්ට අප්‍රිය අමිහිරි කථා ය. කථාවෙහි මහා බලයක් ඇත්තේ ය. වචනවල බලයෙන් අසන්නවුන්ට නො සතුට සතුට කෝපය හය ආදි නොයෙක් දේ ඇති වේ. කෙනකුගේ සිත යම්කිසි අලාභයක් කිරීමෙන් රිදවනවාට වඩා වචනයෙන් රිදවිය හැකි ය. යම්කිසිවක් දීමෙන් සතුටු කරනවාට වඩා වචනයෙන් සතුටු කරවිය හැකිය. ඒ වචනයේ බලය ය. නො මනා කථා කරන තැනැත්තා ජනයාට අප්‍රිය ය. එයින් ඔහු පිරිහේ. ප්‍රිය වචනයට මිනිසුන් තබා දෙවියෝ ද නැමෙති. යහපත් කථා ඇතියහුට සෑම තැනම මිතුරෝ ය. වියදමක් නැතිව අනුන්ගේ සිත් සතුටු කරවීමට අනුන්ගෙන් වැඩ ගැනීමට උපකාර ලැබීමට ඇති හොඳම උපාය යහපත් කථාව ය. යහපත් කථා ඇති බව බුද්ධාදීන් විසින් වර්ණනා කරන ලද උතුම් ගුණයෙකි.

පටිසන්ථාර නම් වූ උත්තම ගුණයක් ඇත්තේ ය. එයට විරුද්ධ ස්වභාවය **අප්පටිසන්ථාර** නම් වේ. එය දුර්ගුණයකි. කා බී සුඛිතව සිටින පුද්ගලයාගේ හා සාගින්නේ සිටින පුද්ගලයාගේ වෙනසක් ඇත.පරතරයක් ඇත. වෙහෙසට පත්ව සිටින පුද්ගලයාගේ හා සුවසේ සිටින පුද්ගලයා ගේ වෙනසක් ඇත. රෝගී පුද්ගලයාගේ හා නිරෝගී පුද්ගලයාගේ වෙනසක් ඇත. වස්ත්‍ර ඇති පුද්ගලයාගේ හා නැති පුද්ගලයාගේ වෙනසක් ඇත. උගත් පුද්ගලයාගේ හා නූගත් පුද්ගලයාගේ වෙනසක් ඇත. මෙසේ පුද්ගලයන් අතර බොහෝ වෙනස්කම් පරතර ඇත්තේ ය. තමා හා අන්‍යයන් අතර ඇති වෙනස්කම් නැති කිරීමේ කැමැත්ත, නැති කිරීම සඳහා ක්‍රියා කිරීම "පටිසන්ථාර" නම් වූ ගුණය ය. තමා හා අන්‍යයන් අතර ඇති වෙනස නැති කිරීමට නො කැමැත්ත, ඒ සඳහා ප්‍රිය නොකිරීම අප්පටිසන්ථාරය ය. ගිහි පැවිදි කවුරුනුත් මේ පටිසන්ථාර ගුණය පැවැත්විය යුතුය. තමාගේ නිවසට අමුත්තකු පැමිණිය හොත් ආදරයෙන් පිළිගෙන ඔහුට සුදුසු සංග්‍රහ කිරීම, සාගින්නෙන් පෙළෙන්නකු පැමිණියහොත් ආහාරයක් දීම, පිපාසිතයකු පැමිණියහොත් බීමට යමක් දීම, යම් දෙයක් ඉල්ලීමට පැමිණියහොත් ඒ දෙය දීම, යමක් දැන ගැනීමට පැමිණිය හොත් එය කියා දීම පටිසන්ථාරය ය.

Non-commercial distribution

පටිසන්ථාරය අටුවා පොත්වල විස්තර කර ඇත්තේ පැවිද්දන් අනුව ය. පටිසන්ථාර වතය, සාරාණීය වතය කියා භික්ෂූන් පුරන වත් දෙකක් ඇත්තේ ය. පටිසන්ථාරය **ධම්මසංගණී** අටුවාවෙහි විස්තර කර ඇත්තේ මෙසේ ය. ආමිසපටිසන්ථාරය ධම්මපටිසන්ථාරය යි පටිසන්ථාර දෙකකි. ආමිසයෙන් අන්‍යයන් තමා හා සම බවට පැමිණවීම ආමිස පටිසන්ථාරය ය. ධර්මයෙන් සම බවට පැමිණවීම ධම්මපටිසන්ථාරය ය. පටිසන්ථාරය පුරන භික්ෂුව විසින් ආගන්තුක භික්ෂුවක් එනු දැක පෙර ගමන් කොට පාසිවුරු ගත යුතුය. ආසනයක් දිය යුතුය. පවන් සැලිය යුතුය. පා සෝද තෙල් ගැල්විය යුතුය. ගිතෙල් පැණි ඇතහොත් ගිලන්පස දිය යුතුය. පැනින් විචාළ යුතු ය. විසීමට පිළියෙල කර දිය යුතුය. එසේ කළ කල්හි ඒක දේශයකින් ආමිස පටිසන්ථාරය කරන ලද්දේ වේ. සවස් කාලයේ ආගන්තුකයා වෙත ගොස් හිඳ ඔහුට අවිෂය ප්‍රශ්න නො විචාරා ඔහුට විෂය කරුණු පිළිබඳ ප්‍රශ්න ඇසිය යුතුය. ඔබ කිනම් ග්‍රන්ථයක් උගෙන ඇත්තේ දැයි නො විචාරා ඔබ වහන්සේගේ ආචාර්‍ය්‍යෝපාධ්‍යායයෝ කිනම් ග්‍රන්ථ පරිශීලනය කෙරෙත්දැයි අසා විසඳීමට සමත් ප්‍රශ්න විචාළ යුතුය. ඉදින් ආගන්තුකයා ඒවා විසඳීමට සමත් නො වුවහොත් තමා විසින් කියා දිය යුතුය. එසේ කළ කල්හි ඒක දේශයකින් ධම්ම පටිසන්ථාරය කරන ලද්දේ වන්නේ ය. ඉදින් ආගන්තුකයා තමා සමීපයෙහි වෙසෙන්නේ නම් දිනපතා ඔහු කැඳවා ගෙන පිඬු පිණිස හැසිරිය යුතුය. ආගන්තුකයා යනු කැමැත්තේ නම් පසු දින ඔහු හා එක් ගමෙක පිඬු පිණිස හැසිර පිටත් කළ යුතුය. ඉදින් යම්කිසි තැනෙක නිමන්ත්‍රණයක් ඇත්තේ නම් ආගන්තුක භික්ෂුව ද කැඳවා ගෙන යා යුතුය. ආගන්තුක භික්ෂුව එහි යාමට නො කැමති වේ නම් අන්‍ය භික්ෂූන් එහි යවා ඔහු හා පිඬු පිණිස හැසිරිය යුතු ය. තමා ලද ආමිසය ඔහුට දිය යුතුය. එසේ කිරීමෙන් ආමිස පටිසන්ථාරය කරන ලද්දේ වන්නේ ය.

ආමිස පටිසන්ථාරකයා විසින් තමා ලද දෙය දිය යුත්තේ කා හටද? ආගන්තුකයාට දිය යුතු ය. ගිලනුන් හෝ ආවාසිකයන් හෝ ඇති නම් ඔවුනට ද දිය යුතුය. ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන්ට දිය යුතුය. තමාගේ පිරිකර ගෙන යන භික්ෂුවට දිය යුතුය. සාරාණීය වත

Non-commercial distribution

පුරන භික්ෂුව විසින් සිය වරක් දහස් වරක් වුව ද තමා ගෙනෙන පිණ්ඩපාතය ථෙරාසනයේ පටන් පිළිවෙලින් දිය යුතු ය. පටිසන්ථාර වත පුරන භික්ෂුව විසින් නො ලැබූ භික්ෂූන්ට දිය යුතු ය. විහාරයෙන් පිටතට ගොස් මහළු වූ හෝ අනාථ වූ හෝ භික්ෂුවක් භික්ෂුණියක් දුට හොත් ඔවුනට දිය යුතු ය.

සොරුන් විසින් **ගුත්තසාල** නම් ගමට පහර දුන් කල්හි නිරෝධ සමාපත්තියෙන් නැගිටියා වූ මෙහෙණක් ළදරු භික්ෂුණියක ලවා තමාගේ පිරිකර ගෙන්වා ගෙන මහජනයා හා මගට බැස මධ්‍යාහ්නයේ **නකුල නගර** නම් ගම් දෙරට පැමිණ ගසක් මුල හිඳගෙන සිටියා ය. එසමෙහි කාලවල්ලි මණ්ඩපවාසී **මහානාග** තෙරුන් වහන්සේ නකුල නගරග්‍රාමයේ පිඩු පිණිස හැසිර පෙරළා එන්නාහු තෙරණිය දැක පිණ්ඩපාතය දීමට විචාළහ. මෙහෙණිය මට පාත්‍රයක් නැතැයි කීවාය. තෙරුන් වහන්සේ මේ පාත්‍රයෙන් ම වළඳන්නය යි තමන් වහන්සේගේ ආහාර පාත්‍රය තෙරණියට දුන්හ. තෙරණි තෙරුන් වහන්සේගේ පාත්‍රයෙන් ම වළඳා එය සෝද තෙරුන් වහන්සේ අතට දී, දරුව අද ඔබ පිඩු සිඟීමෙන් වෙහෙසට පත් වූවාහු ය. මෙතෙක් පටන් කිසි දිනෙක ඔබ වහන්සේට පිණ්ඩපාතයෙන් වෙහෙසීමක් නො වන්නේ යයි කීය. නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි පුද්ගලයකුට දෙන දානය අතිශයින් මහත් ඵල වන බැවින් ඉන් පසු තෙරුන් වහන්සේට සැම කල්හි කහවණුවකට අඩු වටිනාකම ඇති පිණ්ඩපාතයක් නො ලැබුණේ ය. අටුවාවෙහි මේ විස්තර කර ඇත්තේ අතීතයේ විසූ භික්ෂූන් වහන්සේලා හැසිරුණු ආකාරය ටය. මේ කාලයේ පටිසන්ථාර වත පුරනවා නම් කාලය අනුව එය කළ යුතු ය. පටිසන්ථාර වත පිරීමෙන් නො ලැබූ ලාභයන් ලැබීමත් ලැබෙන ලාභය ස්ථිර වීමත් අනතුරුවලින් ගැලවීමත් සිදු වන්නේ ය.

## 29. ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා

## 30. භෝජනේ අමත්තඤ්ඤුතා

**ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා** යනු ඉන්ද්‍රිය සංවරය නැති බව ය. ඉන්ද්‍රිය යනු රූපාදි අරමුණු ගැනීමට උපකාර වන

Non-commercial distribution

වස්තූහු ය. ඇස, කන, නාසය, දිව, කය, මනස යන මේ සය ඉන්ද්‍රියෝ ය. ඒ සය ම චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යි ද කියනු ලැබේ. ඉන්ද්‍රිය සය කෙලෙස් නමැති දිය දහර ගලන සිදුරු සයෙකි. සියලුම කෙලෙසුන් සියලු පව්කම් ගලා යන්නේ ඒ සිදුරු වලිනි. ඒ සිදුරු වැසිය හැකි පියන සිහිය ය. ඒ බව භාග්‍යවතුන් වහන්සේ විසින් "සති තේසං නිවාරණං" යනුවෙන් වදරා ඇත්තේ ය. සතියෙන් ඉන්ද්‍රිය වසා ගෙන ඇති පුද්ගලයාගේ ඇසට හොඳ වස්ත්‍රයක්, ආභරණයක්, වාහනයක්, ගෙයක් හෝ අන් කිසි වස්තුවක් හෝ දැකුම්කලු පුද්ගලයකු හෝ මුණ ගැසුණ හොත් එකෙණෙහි ම ඒ දෙය ලස්සනය හොඳය කියා තණ්හාව ඇති වේ. අනතුරුව එය ලැබීමේ ආශාව වන අභිධ්‍යාව ඇති වේ. එය හෝ එවැනි දෙයක් ලැබෙන තුරු මාස ගණනක් වුව ද වර්ෂ ගණනක් වුව ද ඔහු ගේ සන්තානයෙන් දිගින් දිගට ම ක්ලේශ නමැති දිය දහර ගලන්නේ ය. ඉන්ද්‍රිය සංවරය නැති තරුණයකුගේ ඇසට ලස්සන තරුණියක් මුණ ගැසුණ හොත් රාගය නමැති කෙලෙස් දිය දහර අතිදීර්ඝ කාලයක් ගලන්නට වන්නේ ය. ඒ සම්බන්ධයෙන් ක්‍රෝධ ඊර්ෂ්‍යා නමැති කෙලෙස් ද නොයෙක් පව් කම් ද ගලන්නට වන්නේ ය. සෝතාදි අන්‍ය ඉන්ද්‍රියන්ගෙන් ද එසේම කෙලෙස් ගලන සැටි කල්පනා කොට තේරුම් ගත යුතු ය.

සර්වාකාර පරිපූර්ණ ඉන්ද්‍රිය සංවරයක් ඇති කර ගැනීම දුෂ්කර ය. එය හැකි වතොත් හැකි වන්නේ පැවිද්දකුට ය. සියලු පැවිද්දන්ට එය නො කළ හැකි ය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ගැන සික පද නො පනවන ලදී. යමෙකුට ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණ කළ හැකි වුවහොත් දුකින් මිදීමට අන් කළ යුත්තක් ඉතිරි නො වේ. එබැවින් භාග්‍යවතුන් වහන්සේ විසින් **මාලුංක්‍යපුත්‍ර** භික්ෂුවට හා **බාහිය දරුචීරියටත්** "ඉදින් ඇසින් රූප දැක දැකීම් මාත්‍රයෙහි සිටින්නේ නම්, කනින් ශබ්ද අසා ඇසීම් මාත්‍රයෙහි සිටින්නේ නම්, නාසයෙන් ගඳ සුවඳ දැන, දිවෙන් රස දැන, කයින් ස්පර්ශය දැන, සිතින් ධර්මයන් දැන, දැනීම් මාත්‍රයෙහි සිටින්නේ නම් නුඹ මෙලොවත් නො වේ ය, පරලොවත් නො වේ ය, දෙලොවෙහි ම නොවේ ය, එය ම දුක් කෙලවර වීම වන්නේ ය" යි

Non-commercial distribution

වදළ සේක. ශ්‍රමණප්‍රතිපදව දක්වන සූත්‍රවල මිස ගෘහස්ත ප්‍රතිපදව දක්වන සූත්‍රවල ඉන්ද්‍රිය සංවරය දක්වා නැත. එහෙත් ගිහියන් විසින් ද එක්තරා ප්‍රමාණයකින් ඉන්ද්‍රිය සංවරය ඇති කර ගත යුතු ය. එසේ නුවුවහොත් මිනිසා තිරිසන් ගණයට වැටෙන්නේ ය.

## භෝජනේ අමත්තඤ්ඤුතා

**භෝජනේ අමත්තඤ්ඤුතා** යනු ආහාර ගැනීමේ ප්‍රමාණය නො දන්නා බව ය. අපථ්‍ය ආහාර ගැනීම, නුසුදුසු කල්හි ආහාර ගැනීම, පමණට වඩා කුස පිරෙන සේ ආහාර ගැනීම භෝජනයෙහි පමණ නො දන්නා බව ය. ඒ ඒ පුද්ගලයාට පථ්‍යාපථ්‍ය ආහාර ඇත්තේය. ආහාර ගැනීමේ පමණ නොදත් පුද්ගලයා රස තණ්හාව නිසා අපථ්‍යාහාර අනුභව කොට රෝග සාද ගනී. සමහර විට අපථ්‍යාහාරයෙන් මරණයට ද පත් වේ. සැම වෙලාවේ ම ආහාර වැළඳීම නුසුදුසු ය. තණ්හාව නිසා, ලැබෙන සැම වෙලාවේ ම ආහාර ගැනීම ශරීරයට අහිත ය. එය නොයෙක් රෝගයන් ඇති වීමට හේතුවකි. ඇතැම්හු රස ආහාර ලද හොත් නැගිටින්නට බැරි වන තුරු උගුර තෙක් පිරෙන ලෙස අහර වළඳති. එය ද ශරීරයට අහිත ය. සමහර විට එයින් මරණය ද විය හැකිය. කොසොල් රජතුමා පමණට වඩා ආහාර වැළඳූ කෙනෙකි. එයින් ඔහු පීඩාවට පත් විය. ඔහු එයින් මුදවනු පිණිස බුදුන් වහන්සේ විසින් ඔහුට මේ ගාථාව වදරණ ලදී.

**මනුජස්ස සදා සතිමතෝ**
**මත්තං ජානතෝ ලද්ධයෝජනේ**
**තනු තස්ස භවන්ති වේදනා**
**සනිකං ජීරති ආයු පාලයං**

ලද බොජුනෙහි ප්‍රමාණය දන්නා වූ සැම කල්හි සිහියෙන් යුක්ත වන්නා වූ මනුෂ්‍යයාට ශාරීරික වේදනාවෝ මඳ වන්නාහ. ඔහු පමණට වැළඳූ ආහාරය ආයුෂය ආරක්ෂා කරමින් සෙමින් දිරන්නේ ය - යනු එහි තේරුම ය.

විභංග පාලියෙහි දක්වා ඇත්තේ ආහාර ගැනීමේ ප්‍රයෝජනය නුවණින් ප්‍රත්‍යවේක්ෂා නො කොට කෙලෙස් වැඩෙන පරිදි ආහාර

Non-commercial distribution

වළඳන බව භෝජනේ අමත්තඤ්ඤුතාව කියා ය. එය දක්වා ඇත්තේ භික්ෂු ප්‍රතිපදව අනුව ය. භික්ෂූන් විසින් ආහාර වැළඳිය යුත්තේ ඒ හේතුවෙන් කෙලෙස් නො වැඩෙන පරිදි නුවණින් ප්‍රත්‍යවේක්ෂා කොටය. නළුවෝ පිනුම් කාරයෝ සර්කස් කාරයෝ තම තමන් කරන ක්‍රීඩාව හොඳින් කිරීමේ ශක්තිය ලබනු පිණිස, ගී සින්දු හොඳින් කීමේ ශක්තිය ලබනු පිණිස මස් මාලු බිත්තර ආදි ආහාර පචිකමින් වුව ද සොයා අනුභව කරති. භික්ෂූන් විසින් එසේ ක්‍රීඩා පිණිස ආහාර නොවැළඳිය යුතු ය. රාජරාජමහාමාත්‍යාදීහු ජනයා අතර නිර්භීත ලෙස හැසිරිය හැකිවීම සඳහා මාන මදය වඩනු පිණිසත් පුරුෂ මද නම් වූ කාම ශක්තිය වඩනු පිණිසත් කිරි බිත්තර මස් මාලු ආදිය වළඳති. එසේ මානමද පුරුෂමද වඩනු පිණිස භික්ෂුව විසින් ආහාර නො වැළඳිය යුතු ය. ගණිකාවන් හා ඇතැම් තරුණ තරුණියෝ අත් පා ඇඟිලි ලස්සනට තබා සම පැහැපත් කොට ශරීරය සරසා ගැනීම සඳහා ගිතෙල් මී පැණි ආදී සිනිඳු භෝජන වළඳති. එසේ ශරීරය සැරසීම සඳහා ආහාර වැළඳීම භික්ෂූන්ට නුසුදුසු ය. ඇතැම්හු ශරීරයේ මස් වැඩවීම පිණිස ඇඟ තර කර ගැනීම පිණිස ආහාර වළඳති. භික්ෂූන් විසින් ඒ සඳහා ආහාර නො වැළඳිය යුතු ය. කියන ලද සතර කාරණය සඳහා ආහාර වැළඳීම භෝජනේ අමත්තඤ්ඤුතා නම් ක්ලේශය ය.

ක්‍රීඩා පිණිස ආහාර වැළඳීම ආදී හළ යුතු කරුණු සතර හැර "ඉමස්ස කායස්ස ඨිතියා, යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණං ච වේදනං පටිහංඛාමි, නවං ච වේදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මේ භවිස්සති අනවජ්ජතා ච" යනුවෙන් දැක්වෙන අෂ්ටාංගයෙන් යුක්ත කොට ආහාර වැළඳීම බුද්ධාදීන් විසින් වර්ණනා කරන ලද භෝජනේමත්තඤ්ඤුතා නම් වූ ගුණය ය.

## 31. මුට්ඨසච්චං 32. අසම්පජඤ්ඤං

සිහිය නැති බව සිහිමුළා බව **මුට්ඨසච්ච** නම් වේ. සර්පයන් දෂ්ට කිරීමෙන් ද, ඇතැම් බලවත් රෝගවලින් ද, අධික ව ලේ ගැලීමෙන් ද, ඇතැම් බෙහෙත් වලින් ද මිනිසාට කිසිවක් නො

Non-commercial distribution

දැනෙන ස්වභාවයක් ඇති වේ. එයට ද සිහි නැති වීමය යි කියති. උමතු රෝග වැළඳීමෙන් ද සිහිය අවුල් වේ. එයට ද සිහි නැති වීම යයි ද සිහි මුළා වීම ය යි ද කියති. මුට්ඨසච්ච යනුවෙන් අදහස් කරන්නේ ඒ සිහි නැති වීම හෝ සිහි මුළාව නො වේ. පෘථග්ජන පුද්ගලයා ගේ සිත ස්වභාවයෙන් පඤ්චකාමයට හා අකුශලයට ඇදී නැමී බරවී පවතී. "මධුවා මඤ්ඤති බාලෝ"යි වදාළ පරිදි ඔහුට අකුශලය මී සේ මිහිරිය. "පාපස්මිං රමතී මනෝ"යි වදාරා ඇති පරිදි පෘථග්ජන චිත්තය පාපයෙහි සතුට ලබන්නේ ය. දාන ශීල භාවනා යන මේවා පෘථග්ජන සිතට අමිහිරි ය. අප්‍රිය ය. එබැවින් සිත කුශලයට යැවිය හැකි වීමට කුශල් සිත් ඇති වීමට අකුශලයෙන් ඇද ගැනීමට සමත් විශේෂ බලයක් තිබිය යුතු ය. සතිපට්ඨාන සතින්ද්‍රිය සතිබල සතිසම්බොජ්ඣංග සම්මා සති යන නම් වලින් හඳුන්වන සති චෛතසිකය ඒ බලය ය. මෙහි සිහිය යි කියනුයේ ඒ බලයට ය. සෑම කුශලයක් ම ඇති වන්නේ ඒ බලයෙන් ය. ඒ බලය සමග ය. සෑම කුශල සිතක් සමග ම ඒ බලය ඇත්තේ ය. එය නැති වනු සමග ම ඇති වන්නේ අකුශල සිත් ය. මෙහි මුට්ඨසච්චය යි කියන ලද්දේ ඒ සිහියේ නැති බවට ය. දෙලොස් අකුශල චිත්තයන් ගේ ඇති බවට ය.

අනිත්‍ය වූ නාම රූප ධර්මයන් නිත්‍යය යි වරදවා ගන්නා වූ ද, දුක් වූ නාම රූප ධර්මයන් සැපය යි ගන්නා වූ ද, සත්ව පුද්ගල ආත්ම නො වන නාම රූප ධර්මයන් සත්ත්වයෝ ය, පුද්ගලයෝ ය යි වරදවා ගන්නා වූ ද මෝහය **අසම්පජඤ්ඤ** නම් වේ. අවිද්‍යාව යනු ද එයට ම නමෙකි. අවිද්‍යාව මෙහි අන් තැනක විස්තර කර ඇත.

## 33. සීලවිපත්ති 34. දිට්ඨි විපත්ති

පාණාතිපාත අදින්නාදාන කාමේසුමිච්ඡාචාර මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්පලාප යන පව්කම් සත කිරීම **සීලවිපත්ති** නම් වේ. විනය ක්‍රමයෙන් කියත හොත් පාරාජිකා සංඝාදිසේස ඇවැත්වලට පැමිණීම සීලවිපත්තිය ය

සම්‍යග්දෘෂ්ටිය නසන වැරදි දැකීම **දිට්ඨි විපත්ති** නම් වේ.

Non-commercial distribution

"නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකත දුක්කටානං කම්මානං ඵලං විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි පරෝ ලෝකෝ, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලෝකෙ සමණ බ්‍රාහ්මණා සමග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලෝකං පරඤ්ච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති."

යනුවෙන් දැක්වෙන දීමෙන් වන විපාක නැත. පැමිණෙන සැමට ම දෙන මහා දනවලින් වන විපාකයක් නැත. ආරාධනා කොට ගෙන්වා දීම පැමිණෙන ආගන්තුකයන්ට දීම මංගල්‍ය පිණිස දීම යන මේවායේ විපාකයක් නැත. පින්පව් වලින් වන විපාකයක් නැත. පරලොව සිටින්නවුන් මෙලොවට එන්නේ ද නැත. මෙලොව සිටින්නවුන් පරලොව යන්නේ ද නැත. මවට කරන හොඳ නො හොඳින් වන විපාකයක් නැත. පියාට කරන හොඳ නො හොඳින් වන විපාකයක් නැත. මැරී නැවත උපදින්නෝ නැත. නිර්වාණයට අනුකූල ප්‍රතිපදවක් පුරන තමන් විසින් ඇති කර ගත් විශිෂ්ට ඥානයකින් මෙලොවත් පරලොවත් ප්‍රකාශ කරන ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතය යන දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය දිට්ඨිවිපත්තිය ය. සාමාන්‍යයෙන් සියලුම මිථ්‍යාදෘෂ්ටි දිට්ඨි විපත්තිය ය.

## 35. අජ්ඣත්ත සංයෝජනං
## 36. බහිද්ධා සංයෝජනං

පලා යා නොහෙන ලෙස ගවයන් ගස්වල බඳින්නාක් මෙන් සත්ත්වයන් භවයෙහි බඳින ධර්මයෝ ඇත්තා හ. ඒවා **සංයෝජන** නම් වේ. කාමභවය අජ්ඣත්ත නම් වේ. රූපාරූපභව දෙක බහිද්ධ නම් වේ. සත්ත්වයන් කාම භවයෙහි බඳින ධර්ම **අජ්ඣත්ත සංයෝජන** නම් වේ. රූපාරූප භවයෙහි බඳින ධර්ම **බහිද්ධා සංයෝජන** නම් වේ. මතු පඤ්චක නිර්දේශයේ ඒවා විස්තර වන්නේ ය.

**ද්වික නිර්දේශය නිමි**

---

*Non-commercial distribution*

## ත්‍රික වශයෙන් දැක්වෙන ධර්ම එකසිය පහ

තීණි අකුසල මූලානි, තයෝ අකුසල විතක්කා,
තිස්සෝ අකුසල සඤ්ඤා, තිස්සෝ අකුශල ධාතුයෝ,
තීණි දුච්චරිතානි, තයෝ ආසවා
තීණි සංයෝජනානි, තිස්සෝ තණ්හා,
අපරා'පි තිස්සෝ තණ්හා, අපරාපි තිස්සෝ තණ්හා,
තිස්සෝ ඒසනා, තිස්සෝ විධා,
තීණි භයානි, තීණි තමානි, තීණි තිත්ථායතනානි, තයෝ කිඤ්චනා,
තීණි අංගණානි, තීණි මලානි,
තීණි විසමානි, අපරානි 'පි තීණි විසමානි,
තයෝ අග්ගි, තයෝ කසාවා,
අපරේ'පි තයෝ කසාවා,
අස්සාද දිට්ඨි, අත්තානු දිට්ඨි, මිච්ඡා දිට්ඨි,
අරති විහේසා අධම්මචරියා,
දෝවචස්සතා පාපමිත්තතා නානත්ත සඤ්ඤා,
උද්ධච්චං කෝසජ්ජං පමාදෙ,
අසන්තුට්ඨිතා, අසම්පජඤ්ඤතා මහිච්ඡතා,
අහිරිකං අනොත්තප්පං පමාදෝ,
අනාදරියං දෝවචස්සතා පාපමිත්තතා.

අස්සද්ධියං අවදඤ්ඤු කෝසජ්ජං
උද්ධච්චං අසංවරෝ දුස්සීල්‍යං,

අරියානං අදස්සන කම්‍යතා
සද්ධම්මං අසෝතු කම්‍යතා
උපාරම්භචිත්තතා,

Non-commercial distribution

මුට්ඨසච්චං අසම්පජඤ්ඤං චේතසෝ වික්ඛෙපෝ,
අයෝනිසෝමනසිකාරෝ කුම්මග්ග සේවනා
චේතසෝ ලීනත්තං

තිකං

( විභංගපාලි )

## අකුශල මූල

### 1. ලෝභෝ 2. දෝසෝ 3. මෝහෝ

ගසක හෝ වැලක මුල ඇති කල්හි ඒ මුල නිසා බොහෝ අතු පතර සතර දිශාවට හා උඩටත් ලියලා යන්නාක් මෙන් **ලෝභය** ඇති කල්හි ඒ ලෝභයෙන් අනේකප්‍රකාර අකුශල ධර්මයෝ ඇති වන්නාහ. ලෝභය ඇති වූ කල්හි ලෝභයෙන් මඩනා ලද පුද්ගල තෙමේ ඒ ලෝභයෙන් මෙහෙයන ලදුව මස් කෑම සඳහා සතුන් මරයි. සොරකම් කරයි. ධනය ගැනීම සඳහා සමහර විට මිනිසුන් ද මරයි. මාපියන් සතු ධනය ගැනීම සඳහා ඔවුන්ට ද නොයෙකුත් හිරිහැර කරයි. සමහර විට මාපියන් ද මරයි. අනුන්ගේ ධනය කොල්ල කයි. ධනය සඳහා චෛත්‍ය බුදු පිළිම බිඳී. භික්ෂූන් මරයි. පරදාර සේවනය කරයි. නොයෙක් වඤ්චා කරයි. සුරාපානය කරයි. ඒ පව් සියල්ලට ම ලෝභය මුල බැවින් ලෝභය අකුශල මූලයෙකි.

**ද්වේෂය** ඇති වූ කල්හි එයින් ද අනේකප්‍රකාර අකුශල ධර්මයෝ නැඟී එති. ද්වේෂය ලෝභයට වඩා දරුණු ය. ලෝභයෙන් අකුශලයන් නැඟී වැවී එන්නේ සෙමිනි. ද්වේෂයෙන් ඉතා වේගයෙන් අකුශල ධර්මයෝ වහා නැඟී එති. ද්වේෂය ඇති වූ කල්හි එයින් මඩනා ලද පුද්ගලයා පළමුවෙන් රවා බලයි. ඔහුගේ මුහුණ යක් මුහුණක් බඳු වෙයි. පරුෂ වචන කියයි. අත්පා ඔසවයි. පොලු කඩු කිණිසි තුවක්කු ගනී. අනුන්ට පහර දෙයි. සමහර විට අනුන් මරයි. ගෙවල් ගිනි තබයි. දේපොල විනාශ කරයි. සමහර විට තමා ද දිවි නසා ගනී. ඒ සියල්ලට ම මුල ද්වේෂය ය. එබැවින් ද්වේෂය අකුශල මූලයකි.

**මෝහය** නුවණැස නැති කොට සත්ත්වයා අන්ධ කරන ධර්මයෙකි. මෝහයෙන් මුළා වූවහුට ආත්මාර්ථය නො දැනේ. පරාර්ථය ද නො දැනේ. ඔහුට පෙනෙන්නේ යුක්තිය අයුක්තිය සේ

Non-commercial distribution

ය. අයුක්තිය යුක්තිය සේ ය. ධර්මය අධර්මය සේ ය. අධර්මය ධර්මය සේ ය. අර්ථය අනර්ථය සේ ය. අනර්ථය අර්ථය සේ ය. පින පව සේ ය. පව පින සේ ය. ඔහු අකාලවාදී වෙයි. අභූතවාදී වෙයි. අනර්ථවාදී වෙයි. අධර්මවාදී වෙයි. අවිනයවාදී වෙයි. ඔහුට නො කළ හැකි නීච ක්‍රියාවක් නො කළ හැකි පවක් නැත. ඔහු බලවතකු වී නම් වඩාත් පව්කම් කරයි. ඔහුට මෝහය නිසා ලෝභය ද නැඟ එයි. ද්වේෂය ද නැඟ එයි. ලෝභ ද්වේෂ මෝහ යන තුනෙන් ම පීඩිත වූ හෙතෙමේ මෙලොව ද දුකින් ජීවත් වී මරණින් මතු අපායෙහි ද උපදින්නේ ය. අනේක අකුශලයන්ට මුල් වන බැවින් මෝහය අකුශල මූලයකි. ලෝභ මෝහයෝ සංසාර ප්‍රවෘත්තියට ද මූලයෝ වෙති.

**අකුශල විතර්ක**

## 4. කාමවිතක්කෝ 5. ව්‍යාපාදවිතක්කෝ 6. විහිංසාවිතක්කෝ

සත්ත්වයන් කැමති වන ඇලුම් කරන වස්තුහු කාමයෝ ය. මනාප වූ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයෝ ය, තවත් ක්‍රමයකින් කියත හොත් සත්ත්වයනට ප්‍රියමනාප ආහාරපාන වස්ත්‍ර ආභරණ පරිභෝගභාණ්ඩ ගේ වතු කුඹුරු රන් රිදී මුතු මැණික් මුදල් යනාදිය ද ගවාදි සත්ත්වයෝ ද අඹු දරු නෑ මිතුරෝ ද යන මොහු කාමයෝ ය. ඒ කාමයන් ලැබීම පිළිබඳ වූ ද, පරිභෝග කිරීම පිළිබඳ වූ ද, පරෙස්සම් කිරීම පිළිබඳ වූ ද, දියුණු කිරීම පිළිබඳ වූ ද කල්පනාව **කාමවිතක්ක** නම් වේ. කාම විතර්කයෙන් තොර ව ගිහි ජීවිතය නො පැවැත්විය හැකි ය. කාමයන්ගෙන් ඈත් ව දුකින් මිදෙනු පිණිස මහණදම් පුරන්නවුන්ට මෙය අනර්ථකර ය.

ව්‍යාපාද විහිංසා විතර්ක දෙක බෙහෙවින් සම බැවින් වෙන් කිරීම අපහසු ය. මෛත්‍රියට විරුද්ධ ස්වභාවය ව්‍යාපාදය ය. අන්‍යයන්ට යහපතක් කිරීම මෛත්‍රියේ ස්වභාවය ය. නපුරක් කිරීම ව්‍යාපාදයේ ස්වභාවය ය. එබැවින් අන්‍යයන්ට අවමන් කිරීම පහරදීම ආදියෙන් පීඩා කිරීම් පිළිබඳ කල්පනාව **ව්‍යාපාද විතර්කය** යි කිය යුතු ය.

Non-commercial distribution

කරුණාවට විරුද්ධ ස්වභාවය විහිංසාව ය. කරුණාවෙන් කෙරෙනුයේ දුක්ඛිතයන්ට පිහිට වීම ය. අන්‍යයන්ට දුක්දීම විහිංසාව ය. අන්‍යයන්ට දුක් දීම කරදර කිරීම පිළිබඳ කල්පනාව **විහිංසා විතර්කය** ය. ව්‍යාපාද විහිංසා විතර්කයන් **ඉතිවුත්තක අටුවාවේ** දක්වා ඇත්තේ මෙසේ යඃ-

"ව්‍යාපාදවිතක්කෝ අප්පියේ අමනාපේ ච සත්තේ වා සංඛාරේ වා කුජ්ඣිත්වා ඔලෝකනතෝ පට්ඨාය යාව නාසනා උප්පජ්ජති. විහිංසා විතක්කෝ ඉමේ සත්තා හඤ්ඤන්තු වා වජ්ඣන්තු වා උච්ඡිජ්ජන්තු වා විනස්සන්තු වා මා වා අහේසුන්ති වා චින්තන කාලේ පන සත්තෙසු උප්පජ්ජති."

**අකුශල සංඥා**

### 7. කාමසඤ්ඤා 8. ව්‍යාපාදසඤ්ඤා 9. විහිංසාසඤ්ඤා

කාමයන් පිළිබඳ වූ කාමවිතර්ක සහගත සංඥාව "කාමසඤ්ඤා" නම් වේ. ව්‍යාපාද විතර්ක සම්ප්‍රයුක්ත සංඥාව "ව්‍යාපාදසඤ්ඤා" නම් වේ. විහිංසාවිතර්ක සම්ප්‍රයුක්ත සංඥාව "විහිංසාසඤ්ඤා" නම් වේ.

**අකුශල ධාතු**

### 10. කාමධාතු 11. ව්‍යාපාදධාතු 12. විහිංසාධාතු

කාමවිතර්කය ම "කාමධාතු" නම් වේ. ව්‍යාපාද විතර්කය "ව්‍යාපාදධාතු"නම් වේ. විහිංසාවිතර්කය "විහිංසාධාතු" නම් වේ.

**දුශ්චරිත**

### 13. කාය දුච්චරිත 14. වචී දුච්චරිත 15. මනෝ දුච්චරිත

පාණාතිපාතා අදින්නාදානා කාමේසුමිච්ඡාචාර යන තුන **කායදුච්චරිත** නම් වේ. මේවාට කාය දුශ්චරිත ය යි කියනුයේ කයින්

Non-commercial distribution

සිදු කෙරෙන නිසා ය. අනුන් ලවා මැරවීමේ දී හා අනුන් ලවා සොරකම් කරවීමේදී ඒවා වචනයෙන් ද සිදු වන නමුත් බෙහෙවින් කෙරෙන්නේ කයින් ම නිසා සමහර විටෙක වචනයෙන් සිදු වුව ද කාය දුශ්චරිතය යි ම කියනු ලැබේ. සමහර විට ගම්වල හැසුරුණු ද නාගරිකයාට ගැමියා ය යි නො කියා නාගරිකයා ය කියන්නාක් මෙනි.

මුසාවාදය පිසුණාවාචය ඵරුසාවාචය සම්ඵප්පලාපය යන දුශ්චරිත සතර වචනයෙන් බොහෝ සෙයින් සිදුවන බැවින් **වචීදුච්චරිත** නම් වේ. ඒවාත් සමහර විට හස්තවිකාරයෙන් කයින් ද සිදු කරන්නේ ය.

අභිජ්ඣා ව්‍යාපාද මිච්ඡාදිට්ඨි යන මේ අකුශල් තුන **මනෝ දුච්චරිත** නම් වේ. මේ දුශ්චරිත හෙවත් අකුශලකර්ම නොයෙක් පොත්වල විස්තර කර ඇති බැවින් මෙහි විස්තර නො කරමු.

**ආශ්‍රව**

### 16. කාමාසව 17. භවාසව 18. අවිජ්ජාසව.

මේ ධර්ම තුන මතු චතුෂ්ක නිර්දේශයේ විස්තර වනු ඇත.

**සංයෝජන**

### 19. සක්කායදිට්ඨි 20. විචිකිච්ඡා 21. සීලබ්බතපරාමාස

මම ය කියා ද නුඹ ය කියා ද දෙවියා මිනිසා ගවයා අශ්වයා ඇතා කියා ද තවත් නොයෙක් නම් වලින් ද ව්‍යවහාර කරන්නා වූ සංස්කාර ධර්ම පුඤ්ජයන් විභාග කර බැලුවාම ඒවායේ ඇත්තේ රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන මේ ධර්ම කොටස් පස පමණෙකි. ඒවායේ සැබෑ තත්ත්වය තේරුම් ගැනීමට නො සමත් ධර්මය නො දත් අන්ධ පෘථග්ජනයෝ ඒවා රූප වේදනාදිය ලෙස තේරුම් ගැනීමට අසමත් බැවින් ඒ රූපාදි ස්කන්ධ පස මම ය නුඹය මිනිසාය දෙවියා ය කියා වැරදි ලෙස

Non-commercial distribution

සලකති. ඒ වැරදි හැඟීම වැරදි පිළිගැනීම **සක්කායදිට්ඨි** නම් වේ. මෙයට ආත්ම දෘෂ්ටිය යි ද කියනු ලැබේ. මේ දෘෂ්ටිය එක් එක් ස්කන්ධයක සතර සතර ආකාරයකින් ඇති වන බැවින් ස්කන්ධපඤ්චකයෙහි ඇති වන සක්කාය දෘෂ්ටිය විසි වැදෑරුම් වේ. රූපස්කන්ධයෙහි සිව් වැදෑරුම් සක්කාය දෘෂ්ටිය මෙසේ ය.

1. රූපං අත්තතෝ සමනුපස්සති.
2. රූපවන්තං අත්තානං සමනුපස්සති.
3. අත්තනි වා රූපං සමනුපස්සති.
4. රූපස්මිං වා අත්තානං සමනුපස්සති.

1. ඇතැමෙක් රූපකයින් යාම් ඊම් හිඳීම් සිටීම් කෑම් පීම් ආදි ක්‍රියා සිදුවනු දැකීමෙන් ඒ රූපකය මම ය ආත්මය කියා වරදවා දකී. දැල්වෙන පහනෙහි ගිනි සිළත් වර්ණයත් දෙක එක් කොට, යමක් ගිනි සිළ නම් එය ම වර්ණය යි ද යමක් වර්ණය නම් එය ම ගිනි සිළ යයි ද ගන්නාක් මෙන් රූපය ආත්මය යි ද ආත්මය රූපය යි ද රූප ආත්ම දෙක දෙකක් නොව එකක්ම ය යි ද වරදවා ගනී.

2. ඇතැමෙක් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන ස්කන්ධ සතර ආත්මය යි ගෙන ඒ ආත්මයට රූපය ඇත ය කියා රූපය ඇති ආත්මයක් දකී. ගස ඡායාව ඇතියක් කොට ගන්නාක් මෙනි.

3. ඇතැමෙක් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන් ආත්ම වශයෙන් ගෙන මලක සුවඳ ඇතුවාක් මෙන් ඒ ආත්මයෙහි රූපය ඇතය යි සලකති.

4. ඇතැමෙක් වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණයන් ආත්ම වශයෙන් ගෙන ඒ ආත්මය හෙප්පුවක මැණික් තිබෙන්නාක් මෙන් රූපය තුළ ඇතය යි ගනිති.

වේදනා ස්කන්ධය සම්බන්ධයෙන් සතර ආකාර සක්කායදිට්ඨිය ඇති වන්නේ මෙසේ ය:– ඇතැමෙක් සුඛ දුක්ඛ සෝමනස්ස දෝමනස්ස උපෙක්ඛා වේදනාවන් ඇති වන කල්හි සැප විඳින්නේ

Non-commercial distribution

මම ය, දුක් විඳින්නේ මම ය, සතුටු වන්නේ මම ය, නො සතුටු වන්නේ මම ය, මැදහත් ව ඉන්නේත් මම ය යි වේදනාව ආත්ම වශයෙන් ගනිති. ඇතැමෙක් සඤ්ඤා සංඛාර විඤ්ඤාණ රූප යන ස්කන්ධ සතර ආත්මය යි ගෙන ඒ ආත්මයට වේදනාව ඇත්තේ ය යි ගන්නෝ ය. ඇතැමෙක් සඤ්ඤා සංඛාර විඤ්ඤාණ රූප යන ස්කන්ධ සතර ආත්මය යි ගෙන ඒ ආත්මයෙහි වේදනාව ඇතය යි ගනිති. ඇතැමෙක් සඤ්ඤා සංඛාර විඤ්ඤාණ රූපයන් ආත්ම වශයෙන් ගෙන ඒ ආත්මය වේදනාවෙහි ඇතියකැයි ගනිති. මෙසේ සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන ස්කන්ධයන්හි සත්කාය දෘෂ්ටිය ඇති වන සැටි සැලකිය යුතු ය.

ඇතැම් දෘෂ්ටීන් ඇති වන්නේ සත්ත්වයන් ගැන හා බාහිර ලෝකය ගැන කල්පනා කිරීමෙන් හෝ උගෙනීමෙනි. සත්කාය දෘෂ්ටිය හෙවත් ආත්ම දෘෂ්ටිය එසේ ඇති වන්නක් නොව එය සැමට ම උත්පත්තියේ පටන් ස්වභාව ධර්මය අනුව ඇති වන දෘෂ්ටියකි. කොතරම් මෝඩයකුට වුවත් සත්කාය දෘෂ්ටිය ඇත්තේ ය. ඉතා මඳ දැනුමක් ඇති තිරිසන් සතුන්ට ද එය ඇත්තේ ය. සත්ත්වයන් විසින් මම ය කියා සලකන දෙය සත්‍ය වශයෙන් ම ඇත්තේ නම් එය උත්පත්තියේ පටන් මරණය දක්වා හෝ සංසාරය දිගට ම හෝ පවත්නා දෙයක් විය යුතු ය. එය එක් පුද්ගලයකුට එක බැගින් පමණක් තිබිය යුතු ය. එක් පුද්ගලයකුට ආත්ම දෙක තුනක් සතර පහක් නො තිබිය යුතු ය. මමය මම යයි කියන්නවුන්ට මමය කියා ස්ථිර එක් දෙයක් නැත. වරින් වර එය වෙනස් කර වෙන වෙන දෙයට මම ය යි කියති. එහෙත් ඒ බව ඔවුහු නො දනිති. මම සැම කල්හි මම ම විය යුතු ය. එය කිසි කලෙක මාගේ නො විය යුතුය. මම හා මාගේ දෙක දෙකක් ම විය යුතු ය. රූපකය ගමනාදි ක්‍රියාවන්හි යෙදීම ගැන මම යමි, මම හිඳිමි, මම දනිමි, මම දෙමි, මම ගනිමි, මම කමි, මම බොමි යි රූපකය ආත්ම වශයෙන් ගෙන කථා කරන තැනැත්තා තවත් වරකදී මගේ ඇඟ පණ නැත, මගේ ඇඟ කෙට්ටුය, මගේ ඇඟ රිදෙනවා ය, මගේ ඇඟට ශීතලය, මගේ ඇඟේ ඩහදිය ය යනාදීන් කලින් මමය යි ගත් ඇඟ මාගේ කොට කථා කරයි. ඇඟ මාගේ යයි කීමෙන් දැක්වෙන්නේ එය

Non-commercial distribution

මම නො වන බව ය. මෙසේ වරින් වර ආත්මය වෙනස් වන්නේ සත්‍ය වශයෙන් ලැබෙන ආත්මයක් නැති බැවිනි.

වැරදි දැකීමක් වන මේ සත්කාය දෘෂ්ටිය නොයෙක් කෙලෙසුන්ට නොයෙක් පව්කම් වලට මුලකි. පඤ්චස්කන්ධය ම ඒ ඒ අතට හරවමින් මම ය යි සලකන්නහුට ඒ පඤ්චස්කන්ධය ගැන මහත් වූ තණ්හාවක් ඇති වේ. පඤ්චස්කන්ධය නැති වෙනවාය කියත හොත් ඔහුට එතරම් අන් කිසිම කරුණක් ගැන බියක් ඇති නො වේ. මාගේ බිරියය මාගේ පුතා ය මාගේ දූ ය මාගේ ගේය යනාදීන් අන් දේවලට තණ්හාව ඇති වන්නේ මම යන දෘෂ්ටිය ඇති නිසා ය. මේ දෘෂ්ටිය සංසාර ප්‍රවෘත්තියට බලවත් හේතුවකි. එය ඇති තාක් සත්වයාට විමුක්තිය නො ලැබිය හැකි ය. සත්කාය දෘෂ්ටියෙහි ඇති නපුර නිසා,

**සත්තියා විය ඔමට්ඨෝ - ඩය්හමානෝ ව මත්ථකෙ**
**සක්කායදිට්ඨිප්පහාණාය - සතෝ භික්ඛු පරිබ්බජෙ**

(සංයුක්ත නිකාය)

යනු වදාරන ලදී.

සැතකින් පහර ලැබූවකු මෙන් ද, හිස ගිනි ගත්තකු මෙන් ද අන් සියල්ල හැර සත්කාය දෘෂ්ටිය ප්‍රහාණය කරනු පිණිස උත්සාහ කළ යුතුය යනු එහි අදහස ය.

**විචිකිච්ඡාව**

විචිකිච්ඡාව අභිධර්මයෙහි අෂ්ටාකාරයකින්ද සබ්බාසව සූත්‍රයෙහි ෂෝඩෂාකාරයකින් ද දේශනාය කර ඇත්තේ ය. එය අභිධර්මයෙහි දේශනාය කර ඇත්තේ මෙසේ ය:-

තත්ථ කථමා විචිකිච්ඡා?

1. සත්ථරි කංඛති විචිකිච්ඡති
2. ධම්මේ කංඛති විචිකිච්ඡති
3. සංඝෙ කංඛති විචිකිච්ඡති
4. සික්ඛාය කංඛති විචිකිච්ඡති

Non-commercial distribution

5. පුබ්බන්තේ කංඛති විචිකිච්ඡති
6. අපරන්තේ කංඛති විචිකිච්ඡති
7. පුබ්බාපරන්තේ කංඛති විචිකිච්ඡති
8. ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නේසු ධම්මේසු කංඛති විචිකිච්ඡති.

(ඛුද්දකවත්ථු විභංග)

1. දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිත ෂඩ්වර්ණරශ්මිමාලා ඇති ශරීරයක් තිබිය හැකි ද? අතීතානාගත වර්තමාන යන කාලත්‍රයට අයත් සියල්ල දත හැකි නුවණක් තිබිය හැකි ද? දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ හා රශ්මි මාලාවන් ඇති සියල්ල දන්නා නුවණ ඇති පුද්ගලයකු සිටිය හැකි දැ යි ශාස්තෘන් වහන්සේ ගැන ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

2. ක්ලේශ ප්‍රහාණයට ආර්‍ය්‍යමාර්ග සතරක් හා කෙලෙස් සන්සිඳ වූ ඵලධර්ම සතරක් ද සියලු දුක්වල නිමවීම වූ නිර්වාණයක් ද ඇත ද නැත ද කියා නවලෝකෝත්තර ධර්මය ගැන ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

3. සතර මාර්ග සතර ඵලයන්හි ආර්‍ය්‍ය සංඝ රත්නයක් ඇත්තේ ද මේ සංඝයා සුප්‍රතිපන්න ද නැත ද සංඝ රත්නයට දන්දීමේ විපාකයක් ඇති ද නැති ද කියා සංඝරත්නය ගැන ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

4. ත්‍රිශික්ෂාවය කියා දෙයක් සත්‍ය වශයෙන් ඇත්තේ ද ඒ ශික්ෂාවන් පිරීමෙන් ප්‍රතිඵලයක් ඇත ද නැත ද කියා ශික්ෂාව පිළිබඳ ව ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

5. අතීත භව පරම්පරාවක් තිබී ද නො තිබී ද කියා අතීත ස්කන්ධයන් පිළිබඳ වූ සැකය එක් විචිකිච්ඡාවෙකි.

6. අනාගත භව පරම්පරාවක් ඇත්තේ ද නැත්තේ ද කියා අනාගත ස්කන්ධයන් ගැන ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

7. අතීතානාගත භව පරම්පරා දෙක ම සම්බන්ධයෙන් ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි.

Non-commercial distribution

8. මේ සත්ත්වයා හේතුඵල පරම්පරාවක් ද, ඉබේ ම ඇති වූවක් ද, කෙනකු විසින් මවන ලද්දක් ද කියා පටිච්චසමුප්පාදය ගැන ඇති වන සැකය එක් විචිකිච්ඡාවෙකි. මේ අභිධර්මයේ දැක්වෙන විචිකිච්ඡා අටය.

**සබ්බාසව සූත්‍රයේ දැක්වෙන ෂෝඩෂාකාර විචිකිච්ඡාව මෙසේ ය.**

“අහෝසිං නු ඛෝ අහං අතීතමද්ධානං, න නු ඛෝ අහෝසිං අතීත මද්ධානං, කිං නු ඛෝ අහෝසිං අතීත මද්ධානං, කථං නු ඛෝ අහෝසිං අතීතමද්ධානං, කිං හුත්වා කිං නු ඛෝ අහෝසිං අහං අතීතමද්ධානං භවිස්සාමි නු ඛෝ අහං අනාගතමද්ධානං, නනු ඛෝ භවිස්සාමි, අනාගතමද්ධානං, කිං නු ඛෝ භවිස්සාමි අනාගතමද්ධානං, කථං නු ඛෝ භවිස්සාමි අනාගත මද්ධානං, කිං හුත්වා කිං භවිස්සාමි නු ඛෝ අහං අනාගතමද්ධානං, අහං නු ඛෝස්මි, කෝ නු ඛෝස්මි, කිං නු ඛෝස්මි, කථං නු ඛෝස්මි, අයං නුඛෝ සත්තෝ කුතෝ ආගතෝ කුහිං ගාමී භවිස්සති.”

මම අතීතයේ වූයෙම් ද, නොවූයෙම් ද, මම අතීතයේ මනුෂ්‍ය දේව තිරශ්චීනාදීන්ගෙන් කවරෙක් වූයෙම් ද, මම අතීතයේ කෙබඳු සටහන් ඇතියෙක් වූයෙම් ද, මම අතීයේ කවරකු වී කවරෙක් වූයෙම් ද, මෙසේ අතීතය පිළිබඳ වූ විචිකිච්ඡා පසෙකි. මම මරණින් මතු අනාගතයෙහි ඇත්තෙම් ද, නැත්තෙම් ද, මම අනාගතයෙහි කවරෙක් වන්නෙම් ද, කෙබඳු කෙනෙක් වන්නෙම් ද, මම අනාගතයෙහි කවරකු වී කවරෙක් වන්නෙම් ද, මෙසේ අනාගතය පිළිබඳ විචිකිච්ඡා පසෙකි. උත්පත්තියේ පටන් මරණය දක්වා පවත්නා වර්තමාන පඤ්චස්කන්ධය ගෙන මේ මම දැ යි සැක කරයි. මේ මම නොවෙම් දැ යි සැක කරයි. මම කවරෙක් ද, මාගේ සැටි කෙසේ ද? මම කොහි සිට මේ භවයට ආයෙම් ද, මෙයින් මම කොහි යන්නෙම් ද? මෙසේ වර්තමාන භවය සම්බන්ධයෙන් ඇති වන විචිකිච්ඡා සයෙකි. මේ සබ්බාසව සූත්‍රයේ දැක්වෙන විචිකිච්ඡා සොළස ය.

**සීලබ්බතපරාමාසය.**

ගොහි ගවාදි සතුන්ගේ ප්‍රකෘතිස්වභාවය **සීල** නම් වේ. එනම් සතර පයින් යාම, බිම නිදගැනීම, අතට නො ගෙන මුවින් ම ආහාර

Non-commercial distribution

ගැනීම, හුන් තැන ම මලමුත්‍ර පහ කිරීම ආදිය ගවයන්ගේ ප්‍රකෘති ස්වභාවය ය. ගවයකු මෙන් හැසිරෙමි යි මනුෂ්‍යයකු විසින් සමාදන් වී පවත්වන ඒ ගව ස්වභාවය **ව්‍රත** නම් වේ. බුදු සසුනෙන් පිටත්හි ඇතැම් ශ්‍රමණයෝ ශීලයෙන් ව්‍රතයෙන් සත්ත්වයා ශුද්ධ වන්නේ ය යි සලකති. ඔවුන්ගේ ඒ දෘෂ්ටිය සීලබ්බත පරාමාස නම් වේ. සත්කායදෘෂ්ටිය විචිකිච්ඡාව ශීල ව්‍රතපරාමර්ශ යන මේ තුන සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වන සංයෝජනයෝ ය.

## 22. කාමතණ්හා 23. භවතණ්හා 24. විභවතණ්හා

මනාප රූප ශබ්දාදි පඤ්ච කාමයන්ට ආශාව කාම තණ්හාව ය. රූපාරූප භවයන්ට රූපාරූප ධ්‍යානයන්ට ආශාව භවතණ්හාව ය. ජීවත් වන තාක් හැකි තාක් සැප විඳිය යුතු ය යි සිතන්නවුන්ගේ උච්ඡේද දෘෂ්ටි සහගත ආශාව විභව තණ්හාව ය.

**අපරා' පි තිස්සෝ තණ්හා**

## 25. කාමතණ්හා 26. රූපතණ්හා 27. අරූපතණ්හා

සතර අපාය මනුෂ්‍ය ලෝකය දිව්‍ය ලෝක සය යන මේ එකොළොස් භූමියට අයත් ස්කන්ධයන්ට ආශාව, **කාම තණ්හාව** ය. සොළොසක් වූ රූපාවචර භූමින්ට අයත් ස්කන්ධයන්ට ආශාව, **රූපතණ්හාව** ය. අරූප භූමි සතරට අයත් සතර නාමස්කන්ධයන්ට ආශාව, **අරූප තණ්හාව** ය.

**අපරාපි තිස්සෝ තණ්හා**

## 28. රූපතණ්හා 29. අරූපතණ්හා 30. නිරෝධතණ්හා

රූපධාතුව පිළිබඳ ආශාව **රූප තණ්හාව** ය. අරූප ධාතුව පිළිබඳ ආශාව **අරූප තණ්හාව** ය. උච්ඡේද දෘෂ්ටි සහගත තණ්හාව **නිරෝධ තණ්හාව** ය.

Non-commercial distribution

**ඒසනා**

## 31. කාමේසනා 32. භවේසනා 33. බ්‍රහ්මචරියේසනා

රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යන පඤ්ච කාමයන් සෙවීම් වශයෙන් පවත්නා වූ රාගය ද එය හා ඇතිවන කායකර්ම වාක්කර්ම මනඃකර්මයෝ ද **කාමේසනා** නම් වේ.

රූපාරූප භවයන් සෙවීම් වශයෙන් ඇතිවන රාගය හා එය හා එක්ව ඇතිවන කායකර්ම වාක්කර්ම මනඃකර්මයෝ ද **භවේසනා** නම් වේ.

සස්සතෝ ලෝකෝ යනාදීන් දැක්වෙන අන්තග්‍රාහික දෘෂ්ටීහු ද දෘෂ්ටි ගතිකයන් විසින් කරන ඒ දෘෂ්ටි සම්බන්ධ කාය-කර්ම වාක්කර්ම මනඃකර්මයෝ ද **බ්‍රහ්මචරියේසනා** නම් වේ.

**අන්තග්‍රාහික දෘෂ්ටි දශය**.

1. සස්සතෝ ලෝකෝ,
2. අසස්සතෝ ලෝකෝ,
3. අන්තවා ලෝකෝ,
4. අනන්තවා ලෝකෝ,
5. තං ජීවං තං සරීරං,
6. අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං,
7. හෝති තථාගතෝ පරම්මරණා,
8. න හෝති තථාගතෝ පරම්මරණා,
9. හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා,
10. නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා.

සස්සතෝ ලෝකෝ යන මෙහි ලෝකය යි කියනුයේ පඤ්චස්කන්ධයට ය. ඇතැම්හු එය ආත්මය යි සලකති. බලන තැනැත්තාය යන අර්ථයෙන් ආත්මයට ලෝක යන නාමය ව්‍යවහාර කරති. ලෝක නම් වූ ඒ ආත්මය නො නැසී සැම කල්හි ම පවත්නේය යනු එක් දෘෂ්ටියෙකි.

Non-commercial distribution

ලෝක නම් වූ ඒ ආත්මය මරණින් සිඳී යන්නේ ය, කෙළවර වන්නේ ය යනු අසස්සතෝ ලෝකෝ යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය.

අන්තවා ලෝකෝ අනන්තවා ලෝකෝ යනුවෙන් දැක්වෙන දෘෂ්ටි දෙක ධ්‍යානලාභී බාහිරක තවුසන්ට ඇතිවන දෘෂ්ටි දෙකකි. පිඟානක් වට්ටියක් පමණ කුඩා කසිණ නිමිත්තක ධ්‍යානයට සම වැදී වෙසෙන ඇතැම් තවුසකුට ඒ සමාපත්තිය තුළ පැවති නාමරූප ධර්ම සමූහය ආත්මය යන හැඟීම ඇති වේ. ඒ ආත්මයේ ප්‍රමාණයත් කසිණ නිමිත්තේ ප්‍රමාණය ම ය යි ඔහු අදහස් කරයි. ඔහුට කසිණ නිමිත්ත අන්තවත් බැවින් ආත්මයත් අන්තවත් ය යන දෘෂ්ටිය ඇති වේ එය " අන්තවා ලෝකෝ " යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය.

ඉතා මහත් කසිණ නිමිත්තක ධ්‍යානයට සම වැදී සිටින තවුසෙක් සමාපත්තිය තුළ පැවති නාම රූප ධර්මයන් ආත්ම වශයෙන් ගෙන ඒ ආත්මය කසිණ නිමිත්ත සේ ම කොනක් නැති ය කැ යි ගනී. ඒ " අනන්තවා ලෝකෝ " යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය.

ආත්මය ගැන සොයන ඇතමෙකුට ශරීරය ම ජීවය ය යන හැඟීම ඇති වේ. ඔහු ජීවයත් ශරීරයත් එකම ය කියා පිළිගනී. එය " තං ජීවං තං සරීරං " යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය උච්ඡේද දෘෂ්ටියෙකි.

ඇතැමෙක් ශරීරය හැර ජීවයක් ඇත. ශරීරය අනිකෙක, ජීවය අනිකෙකැයි ගනිති. එය "අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. ඒ දෘෂ්ටියේ සැටියට මරණින් මතු ජීවය ඉතිරි වන බැවින් එය ශාස්වත දෘෂ්ටියෙකි.

හෝති තථාගතෝ පරම්මරණා යනාදියෙහි තථාගත යනුවෙන් කියැවෙන්නේ සත්ත්වයා ය. හෙවත් ආත්මය ය. පුද්ගලයකු මළ ද ආත්මය නොනැසී පවත්නේ ය යනු "හෝති තථාගතෝ පරම්ම-රණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. ඒ ශාස්වත දෘෂ්ටියෙකි.

මරණින් සත්වයා කෙළවර වන්නේ ය යි ගැනීම "න හෝති තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය.

Non-commercial distribution

මරණින් ඔබ්බට සත්ත්වයා නැත. මරණින් සත්ත්වයා කෙළවර වේය යි ගැනීම "න හොති තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. ඒ උච්ඡේද දෘෂ්ටියෙකි.

ආත්මය මරණින් පසු ඇතය කියා හෝ නැතය කියා හෝ එක් පක්ෂයක් ගැනීම සදෙස් ය යි ඇතැමෙක් මරණින් මතු සත්ත්වයා ඇත්තේ ද නැත්තේ ද වේය යන ඒකත්‍ය ශාස්වත වාදය ගනිති. ඒ "හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය.

ඇතමෙක් මරණින් පසු සත්ත්වයා ඇතය යි ගැනීමේ ද නැතය යි ගැනීමේ ද දෙස් දැක සත්ත්වයා මරණින් මතු ඇත්තේ ද නැත්තේ ද නොවේය යන දෘෂ්ටිය ගනිති. කිනම් අතකටවත් හසු නොවන බැවින් ඒ දෘෂ්ටිය **අමරාවික්ඛේප** නම් වේ.

ශාස්වත වාදය එක් අන්තයෙකි. උච්ඡේදවාදය එක් අන්තයෙකි. කියන ලද දෘෂ්ටි දශයෙන් සෑම එකක් ම ඒ අන්ත දෙකින් එකකට අයත් වන බැවින් ඒ දෘෂ්ටි දශය අන්තග්‍රාහික දෘෂ්ටීහු නම් වෙති.

ශාසනික බ්‍රහ්මචයෙ‍ෂීණය බාහිරික බ්‍රහ්මචයෙ‍ෂීණය යි බ්‍රහ්මචරියේසනා දෙකකි. මෙහි අදහස් කරන්නේ බාහිරික බ්‍රහ්මචරියේසනාව ය. ලෝකය ශාස්වතය යනාදි දර්ශනය ම බ්‍රහ්මචර්‍යයෙක, හෙවත් මෝක්ෂයට පමුණුවන උත්තම චරියාවක් ය යනු දෘෂ්ටිගතිකයන් ගේ සම්මුතියකි. දෘෂ්ටි ගතිකයෝ මෝක්ෂයට පැමිණීමේ මාර්ගයක් වශයෙන් ආත්මය ගැන සෙවීම කරති. ශාසනිකයන්ට ඇති මාර්ග බ්‍රහ්මචර්‍යාව සෙවීමේ අදහස නමැති බ්‍රහ්මචරියේසනාව අර්හත් මාර්ගයට පැමිණීමෙන් සන්සිඳේ. බාහිරික බ්‍රහ්මචරියේසනාව වූ දෘෂ්ටිය සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වන ක්ලේශයෙකි. කාමේසනාව අනාගාමී මාර්ගයෙන් ප්‍රහීණ වන ක්ලේශයෙකි. භවේසනාව අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වන ක්ලේශයෙකි.

ඉහත දැක් වූ විසි වැදෑරුම් සත්කාය දෘෂ්ටිය හා මේ අන්ත-ග්‍රාහික දෘෂ්ටිය ගැන අවබෝධයක් ඇති කර ගත හැකි වන්නේ

Non-commercial distribution

පඤ්චස්කන්ධය ගැන අවබෝධය ඇති කර ගැනීමෙන් ය. සියලු දෘෂ්ටීන් ම ඇති වන්නේ පඤ්චස්කන්ධය සම්බන්ධයෙනි. පඤ්චස්-කන්ධය හරියට තේරුම් ගත හොත් එයින් ම දෘෂ්ටීහු දුරු වෙති.

පඤ්චස්කන්ධයට අයත් නාමරූප ධර්මයෝ ඉතා සියුම් ය. අබ ඇටයක් පමණ කුඩා වස්තුවක වුව ද ලක්ෂ ගණන් කුඩා රූපකලාප ඇත්තේ ය. ඒ රූප කලාපයෝ ඇසිපිය හෙළන කාලය තරම් කාලයකුදු නො පවතිති. වහා නැති වෙති. තුබූ රූපකලාප බිඳුණු තැන්වලට අලුත් රූප කලාපයෝ ඉතා වේගයෙන් පහළ වෙති. තුබූ රූපකලාප බිඳීමේ හා ඒ තැන් වලට අලුත් රූපකලාප පහළ වීමේ අතරක් නො පෙනේ. එබැවින් දින ගණන් මාස ගණන් වර්ෂ ගණන් පවත්නා වස්තුව ඇති සේ පෙනේ. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන නාමස්කන්ධයන් ගේ ඉපදීම බිඳීම රූප කලාපයන්ගේ ඉපදීම බිඳීමට වඩා වේගවත් ය. ගමනාදි ක්‍රියාවක් සිදු වන්නේ එය ඉතා වේගයෙන් ඉපද ඉපද බිඳි බිඳී යන කෝටි සංඛ්‍යාත නාමරූප ධර්ම සමූහයකිනි. ඒවා සිදුවන ආකාරයත් නාමරූපයන් ගේ ඉපදීම බිඳීමත් නො පෙනෙන සාමාන්‍ය ලෝකයා ඒ නාමරූප ධර්ම සියල්ල එක් කොට ගෙන මම යමිය මම හිඳිමිය මම නිදමිය යනාදීන් ඒවා ආත්මය කොට වරදවා තේරුම් ගනිති. දර්ශන ශ්‍රවණාදි ක්‍රියාවන්ගේ සිද්ධිය වඩාත් ආත්ම සංඥාව ඇති වීමට හේතු වේ. යම්කිසි දැකීමක් සිදුවන්නේ ඇසීමක් සිදුවන්නේ ලක්ෂ ගණනක් නාම රූප ධර්ම ඉපිද බිඳී යාමේ ඵලයක් වශයෙනි. ඒවා දැන ගත නො හෙන තැනැත්තා ඒ නාම රූප සියල්ල එක් කොට ඒ මමය යි සිතයි. මම දකිමි මම අසමි යි සිතයි. එසේ ඇති වන ආත්ම සංඥාව මමය යන හැඟීම මේරීමෙන් ස්ථිරත්වයට පැමිණි සත්කාය දෘෂ්ටිය වේ.

මේ සත්කාය දෘෂ්ටිය පෘථග්ජන සකල සත්ත්වයන්ට ම ඇත්තේ ය. අන්‍ය දෘෂ්ටීහු කලින් කල වෙනස් වෙති. ලෝකය යමකු විසින් මවන ලදය යන දෘෂ්ටිය ගෙන සිටින තැනැත්තා සමහර විට කලකදී එය වෙනස් කරයි. ලෝකය ඉබේම ඇති වූයේය යන දෘෂ්ටිය ගෙන සිටින තැනැත්තා ද සමහර විට කලකදී එය වෙනස් කරයි. මෙසේ අන්‍ය දෘෂ්ටීන් කලින් කල වෙනස් කරන නුමුත් සත්කාය දෘෂ්ටිය වෙනස් නොවේ. එය භවාන්තරයට පැමිණීමෙන් ද වෙනස්

Non-commercial distribution

නොවේ. සෝවාන් වන තුරු සංසාරය දිගට ම පවතී. බොහෝ ජනයෝ ආත්මය කියා දෙයක් ඇතය යි පිළිගෙන ඒ ආත්මය ගැන කථා කරන නමුත් ඔවුහු ආත්මය නො හඳුනති. එය කුඩා ද මහත් ද සුදු ද කළු ද කොහි පවතින්නේ ද කියා නො දනිති. ඇතය කියා සැලකුව ද එහි සැටි නො දැනෙන්නේ ආත්මයක් සත්‍ය වශයෙන් නැති නිසා ය. තමන් විසින් ඇත යයි සලකන ආත්මය කුමක් ද එහි සැටි කෙසේදැ යි සෙවීමට බොහෝ දෙනා උත්සාහ කළහ. පඤ්චස්කන්ධයෙහි ආත්මය සෙවූ ඔවුනට වෙනස් වන ස්වභාවය ඇති රූපය ආත්මය නො වන බව දැනිණි. ඉපද බිඳී යන වේදනාව සංඥාව ආත්මය නොවන බව පෙනිණි. සංස්කාර විඤ්ඤාණයන් ආත්මය නොවන බව පෙනිණි. එසේ පෙනුණා වූ ඇතැම්හු මේ පඤ්චස්කන්ධය පාලනය කරන හිමියකු සිටිය යුතු ය, ඒ ස්වාමියා ආත්මය යි පැවසූහ. ඇතැම්හු කැති උදලු වෑ පොරෝ පිහියා ආදියෙන් ඒ ඒ ක්‍රියා කරන්නාක් මෙන් ශරීරයෙහි ඇති ඇස් කන් ආදි ඉන්ද්‍රියයන් ගෙන් හා අත් පා ආදියෙන් දැකීම් ඇසීම් ආදි ක්‍රියා සිදු කරන්නා ආත්මය යි පැවසූහ. ඇතැම්හු දුවදුක් විඳින්නා ආත්මය යි පැවසූහ. ඇතැම්හු මරණයෙන් පඤ්චස්කන්ධය නැති වී ගිය ද නො නැසී ඉතිරි වන දෙයක් ඇත, ඒ ආත්මය යි පැවසූහ. පක්ෂියා වාසය කරන කැදැල්ල බිඳුණු කල්හි අන් කැදැල්ලකට යන්නාක් මෙන් ශරීරය බිඳුණු පසු ආත්මය අන් ශරීරයකට යන්නේය යි ඔවුහු පවසති. ඇතැම්හු තමා කිසිවකට වසඟ නො වී ඉන්ද්‍රිය සහිත ශරීරය ස්වවශයෙහි පවත්වන ශරීරයට අධිපති දෙය ආත්මය යි පැවසූහ. ඇතැම්හු ඒ ඒ කෘත්‍යයන්හි පඤ්චස්කන්ධය මෙහෙයවන්නා ආත්මය යි පැවසූහ. ඇතැම්හු රූපාදිය ම ආත්මය වශයෙන් ගෙන මරණින් සත්ත්වයා කෙළවර වන්නේ ය යි පැවසූහ.

ආත්මය ස්කන්ධයන්ගෙන් අනිකකැයි සලකන්නෝ එය ආයුධයකින් කැපිය නොහෙන ගින්නෙන් දැවිය නො හෙන, ජලයෙන් තෙත් කළ නො හෙන ස්ථිර දෙයකැයි පවසති. ආත්මය ඉපදීමක් නැති මරණයක් නැති අමුතු කිසිවක් එයට එකතු නො වන එයින් ද කිසිවක් ඉවත් නො වන ශාස්වත දෙයකැයි ද කියති. එය අණුවකට වඩා කුඩා වූ ද සියල්ලට ම වඩා විශාල වූද හෘදයෙහි පවත්නා දෙයකැයි ද කියති. මෙසේ ආත්මයේ බොහෝ අනුසස් දක්නේ එය නැති දෙයක් නිසා ය.

Non-commercial distribution

## 34. සෙය්‍යෝ හමස්මීති විධා
## 35. සදිසෝ හමස්මීති විධා
## 36. හීනෝ හමස්මීති විධා

විධා යනු අර්ථ කීපයක යෙදෙන වචනයෙකි. මෙහි විධා යනුවෙන් කියැවෙන්නේ මානය ය. උසස් ය සමය හීනය කියා සත්ත්වයන් බෙදෙන බැවින් මානය විධා නම් වේ. "සෙය්‍යෝහමස්මීති විධා" යනුවෙන් දැක්වෙන්නේ සෙය්‍යමානය ය. "සදිසෝහමස්මීති විධා" යනුවෙන් දැක්වෙන්නේ සදිසමානය ය. හීනෝහමස්මීති විධා" යනුවෙන් දැක්වෙන්නේ හීනමානය ය.

## 37. ජාතිභයං 38. ජරා භයං
## 39. මරණ භයං

ඒ ඒ භවයෙහි ස්කන්ධයන් පළමු කොට පහළ වීම නිසා ඇතිවන භයාකාර ද්වේෂය 'ජාති භය' නම් වේ. ස්කන්ධයන්ගේ දිරීම හේතු කොට භයාකාරයෙන් ඇති වන ද්වේෂය "ජරාභය" නම් වේ. මරණය හේතු කොට ගෙන භයාකාරයෙන් ඇති වන ද්වේෂය මරණ භය නම් වේ.

ඔත්තප්ප භය ඤාණභය ද්වේෂභය යි භය තුනක් ඇත්තේ ය. පවට බිය වන ස්වභාවය ඔත්තප්ප භය ය. එය ක්ලේශයක් නො ව කුශලාව්‍යාකෘත දෙපක්ෂයට අයත් ධර්මයෙකි. විදර්ශනා වඩනා යෝගාවචරයන්ට විදර්ශනා ඥානය දියුණු වන කල්හි ස්වසන්තානයෙහි උපදින උපදින නාමරූප ධර්මයන් ඇසිපිය හෙළන තරම් කාලයකුදු නොපැවතී බිඳී යාම පෙනෙන්නට වන්නේ ය. ඒ අවස්ථාවෙහි පිහිට කර ගත හැකි කිසිවක් නො පෙනීම නිසා යෝගාවචරයාට බියක් ඇති වේ. එය ඥාන විශේෂයකි. එය භයතුපට්ඨාන ඤාණ නම් වූ විදර්ශනා ඥානය ය. ඒ භය ද ක්ලේශයක් නොව කුශල ධර්මයෙකි. නො කැමති වස්තුවක් හෝ පුද්ගලයකු හෝ මුණ ගැසුණු කල්හි ඒ වස්තුවට හෝ පුද්ගලයාට විරුද්ධ ස්වභාවයක් සිතෙහි ඇති වේ. එයට ද්වේෂයයි කියනු ලැබේ.. ඒ ද්වේෂය දියුණු වී අරමුණට විරුඬව ඉදිරිපත් වන අරමුණට පීඩා කරන ආකාරයෙන් ඇති වේ. ඒ

Non-commercial distribution

තත්ත්වයේ ද්වේෂයට කෝපය යි කියනු ලැබේ. තමා දුබල වී විරුද්ධකාරයා බලවත් වී සිටින කල්හි ඒ ද්වේෂය විරුඩාරම්මණය කෙරෙන් පසු බසින පලා යන සැහවෙන ස්වභාවයෙන් ඇති වේ. එසේ උපදනා ද්වේෂය ද්වේෂ භය ය. මේ ක්ලේශ කථාවෙහි අදහස් කරන්නේ ඒ ද්වේෂ භය ය.

ජරා යනු ස්කන්ධයන් ගේ දිරීම ය. එය ඇසට නො පෙනේ. රූපස්කන්ධය දිරීමේ ලකුණු පෙනේ. හිසකේ රැවුල් සුදු වී තිබීම, ඇඟ රැලි වැටී නහර ඉල්පී දුබල වී වක් වී තිබීම, ඉන්ද්‍රියයන් දුබල වී තිබීම, දත් සැලී තිබීම රූපස්කන්ධය දිරා යාමේ ලකුණු ය. වේදනා සංඥා සංඛාර විඥානස්කන්ධයන් දිරා යාමේ ලකුණු ද නැත්තේ ය.

ක්ෂණික මරණය, සම්මුති මරණය, සමුච්ඡේද මරණය යි මරණ තුනෙකි. උපදින සංස්කාරයන් ගේ ක්ෂණයක් පාසා සිදුවන බිඳීම ක්ෂණික මරණය ය. එක් භවයකට අයත් ස්කන්ධයන් ගේ බිඳීයාම සම්මුති මරණය ය. මතු ඉපදීමක් නොවන සේ සිදුවන රහතුන් ගේ මරණය සමුච්ඡේද මරණය ය. ඒ මරණ තුනෙන් මෙහි අදහස් කරන්නේ සම්මුතිමරණය ය.

**තීණි තමානි**

**40. අතීතං වා අද්ධානං ආරබ්භ කංඛති**
**41. අනාගතං වා අද්ධානං ආරබ්භ කංඛති**
**42. පච්චුප්පන්නං වා අද්ධානං ආරබ්භ කංඛති**

“තම” යනු අඳුරට නමෙකි. අඳුරක් වැනි බැවින් අවිද්‍යාවට ද “තම” ය යි කියනු ලැබේ. මෙහි “තීණි තමානි” යනුවෙන් දැක්වෙන්නේ අතීත ස්කන්ධයන් පිළිබඳ අවිද්‍යාව ය, අනාගත ස්කන්ධයන් පිළිබඳ අවිද්‍යාවය, වර්තමාන ස්කන්ධයන් පිළිබඳ අවිද්‍යාව ය යන අවිද්‍යා තුන ය. එය දක්වා ඇත්තේ විචිකිත්සා ශීර්ෂයෙනි. විචිකිත්සාව අනුව ය.

“අතීතං වා අද්ධානං ආරබ්භ කංඛති” යනුවෙන් දැක්වෙන්නේ මම අතීතයේ සිංහලයෙක් වූයෙම් ද දෙමළෙක් වූයෙම් ද ක්ෂත්‍රියයෙක්

Non-commercial distribution

වූයෙම් ද බ්‍රාහ්මණයෙක් වූයෙම් ද යනාදීන් සැක කරන්නහුට ඇති වන අතීත ස්කන්ධයන් වසන අවිද්‍යාව ය.

"අනාගතං වා අද්ධානං ආරබ්භ කංඛති" යනුවෙන් දක්වන්නේ මම අනාගතයෙහි සිංහලයෙක් වන්නෙම් ද දෙමළෙක් වන්නෙම් ද යනාදීන් සැක කිරීමේ දී අනාගත ස්කන්ධයන් වසන අවිද්‍යාව ය.

"පච්චුප්පන්නං වා අද්ධානං ආරබ්භ කංඛති" යනුවෙන් දක්වන්නේ මම ක්ෂත්‍රියයෙක් ද බ්‍රාහ්මණයෙක් ද වෛශ්‍යයෙක් ද ශූද්‍රයෙක් ද රූපය මම ද වේදනාව මම ද සංඥාව මම ද සංස්කාරයෝ මම ද විඥානය මම දැයි වර්තමාන ආත්මය ගැන සැක කරන්නවුන්ට ඇති වන වර්තමාන භවය වසන අවිද්‍යාව ය.

**තීණි තිත්ථායතනානි**

**43. යං කිඤ්චායං පුරිසපුග්ගලෝ පටිසංවේදේති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං පුබ්බේ කත හේතු.**

**44. යං කිඤ්චායං පුරිසපුග්ගලෝ පටිසංවේදේති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං ඉස්සර නිම්මාන හේතු.**

**45. යං කිඤ්චායං පුරිසපුග්ගලෝ පටිසංවේදේති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං අහේතු අප්පච්චය.**

මේ සත්ත්වයා යම්කිසි සැපක් හෝ දුකක් හෝ මධ්‍යස්ථාකාරයක් හෝ විඳී නම් ඒ සියල්ල විඳින්නේ පෙර කළ කර්ම හේතුවෙන් ය යනු එක් දෘෂ්ටියෙකි. එය පූර්වකෘත හේතුවාදය ය. මේ නිගන්ඨයන්ගේ දෘෂ්ටිය ය. මේ අදහස ඇතැම් බෞද්ධයන්ට ද නැත්තේ නො වේ.

තථාගතයන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වෙසෙන අවස්ථාවක **මෝළිය සීවක** නම් පිරිවැජියෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ "පින්වත් ගෞතමයන් වහන්ස, මේ සත්ත්වයා යම් කිසි සුඛයක් හෝ දුකක් හෝ උපේක්ෂාවක් හෝ විඳී නම් එය පෙර කළ කර්ම හේතුවෙන්ය යි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ

Non-commercial distribution

කියන්නාහ. ඔබ වහන්සේ මේ කරුණ ගැන කුමක් කියන සේක්දැ" යි විචාළේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "සීවක, පිත නිසා ද ඇතැම් ශාරීරික වේදනාවෝ උපදිති. එය තමාට ම ද දත හැකි ය. ලෝකයා විසින් ද පිළිගන්නා ලද්දකි. සීවක, සත්ත්වයා යම් සැපයක් හෝ දුකක් හෝ උපේක්ෂාවක් හෝ විඳී නම් ඒ සියල්ල පෙර කර්ම හේතුවෙන් යයි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ කියත් නම්, ඔවුහු තමාට ම දැනෙන දෙය ගැන ද අතිධාවනය කරන්නෝ ය. ලෝකයා විසින් සත්‍යයයි සම්මත කරන ලද්ද අතිධාවනය කරන්නෝය. එබැවින් මම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ කීම මිථ්‍යාවකැයි කියමි'යි වදාළ සේක. එසේ ම සෙමෙන් හට ගන්නා වේදනා ගැනද, වාතයෙන් හටගන්නා වේදනා ගැන ද, සන්නිපාතයෙන් (දෙස් දෙකක් හෝ තුනක් එකතු වීමෙන්) හට ගන්නා වේදනා ගැන ද, ඍතු විපර්‍යාසයෙන් හට ගන්නා වේදනා ගැන ද, ශරිරය නුසුදුසු ලෙස පරිහරණය කිරීමෙන් වන වේදනා ගැන ද, පරෝපක්‍රමයෙන් වන වේදනා ගැන ද, කර්ම විපාක වශයෙන් වන වේදනා ගැන ද වදාළහ. ඒ දේශනය අසා පැහැදී සීවක පිරිවැජි තෙමේ බුදුන් සරණ ගියේ ය. මේ සංයුත්ත නිකායේ වේදනා සංයුත්තයේ එන සූත්‍රයක අදහස ය. ඒ සූත්‍රයේ දැක්වෙන පරිදි

"පිත්තසමුට්ඨාන වේදනා
සෙම්හසමුට්ඨාන වේදනා
වාතසමුට්ඨාන වේදනා
සන්නිපාතික වේදනා
උතුපරිණාමජ වේදනා
විසමපරිහාරජ වේදනා
ඔපක්කමික වේදනා
කම්මවිපාකජ වේදනා" යි

වේදනා අටක් ඇත්තේ ය.

සීතලය, උෂ්ණය, විෂම භෝජනය යන කරුණු වලින් පිත කිපෙන බව නාගසේන ස්ථවිරයන් විසින් වදාරා ඇත්තේ ය.

Non-commercial distribution

යම්කිසිවකින් පිත කෝප වීමෙන් ශරීරයේ හට ගන්නා වේදනා ද මේ ආබාධයෙන් මා මැරෙතු ඇතැයි බිය වී දන් දෙන, සිල් රකින, පෙහෙවස් ... න අයට ඇති වන කුශල වේදනා ද, පිත සන්සිඳ වීම සඳහා බෙහෙත් සැපයීමට ප්‍රාණඝාත අදත්තාදනාදි පව්කම් කරන්නවුන්ට ඇතිවන අකුශල වේදනා ද යන මේ සියල්ල පිත්ත සමුට්ඨාන වේදනා ය. සිතින් ශරීරය දැවෙන කල්හි දුඃඛ වේදනා උපදී. බෙහෙත් කිරීමෙන් එය සන්සිඳෙන කල්හි සුඛ වේදනා උපදී. දනාදි පින්කම් හා ඇතැම් පව්කම් කිරීමේ දී සෝමනස්ස උපෙක්ඛා වේදනා උපදී. බෙහෙත් කොට සුවයක් නො ලැබ, වන්නක් වේවා යි නිදන තැනැත්තාට ද උපේක්ඛා වේදනා ඇති වේ.

ශීතය, උෂ්ණය, ආහාරය යන මේවායින් සෙම කිපෙන බවත්, ශීතය, උෂ්ණය, සාගින්න, පිපාසාව, අධික කොට ආහාර වැළඳීම, වැඩි කල් සිටගෙන සිටීම, වියාමකිරීම, දිවීම, උපක්‍රමය කර්මය යන මේ කරුණු වලින් වාතය කිපෙන බවත් **මිලින්දපඤ්හයේ** දක්වා ඇත්තේ ය. පිත, සෙම, වාතය යන තුන ම එක්වර කිපීමෙන් ද දෙකක් එකවර කිපීමෙන් ද වන වේදනා සන්නිපාතික වේදනා ය. සෙම්හසමුට්ඨාන වාත සමුට්ඨාන සන්නිපාතික වේදනා විස්තරය පිත්ත සමුට්ඨාන වේදනාව විස්තර කර ඇති අයුරින් තේරුම් ගත යුතු ය.

ශීත ප්‍රදේශයක වාසය කරන්නන්ට උෂ්ණ ප්‍රදේශයකට ගිය කල්හි ද, උෂ්ණ ප්‍රදේශයක වාසය කරන්නන්ට ශීත ප්‍රදේශයකට ගිය කල්හි ද, වාසය කරන ප්‍රදේශයේ ම සෘතුව වෙනස් වූ කල්හි ද, හටගන්නා සුඛ දුඃඛ උපේක්ෂා වේදනාවෝ උතුපරිණාමජ වේදනාවෝය. යම්කිසිවකුගේ උපක්‍රමයකින් තොරව ඇතිවන වැසි / නියං / ජල ගැලීම් / සැඩ සුළං / ගිනි / භූමි කම්පා / ගෙවල් බිඳ වැටීම් / ගස් ඇද වැටීම් ආදියෙන් වන වේදනා ද උතුපරිණාමජ වේදනා වශයෙන් ම සැලකිය යුතු ය. කටු ඇනීම්, උල් ඇනීම්, ගල්මුල් වල සැපීම්, වාහනවල සැපීම්, යන්ත්‍රවලට අසුවීම් ආදියෙන් පරෙස්සම් නො වන්නවුන්ට ඇති වන වේදනා විෂමපරිහාරජ වේදනා ය. සතුරන් පහර දීම්, සතුන් සපා කෑම් ආදියෙන් වන

Non-commercial distribution

වේදනා ඕපක්කමික වේදනා ය. මේ කරුණු සත හැර අතීත කර්මයෙන් හට ගන්නා වේදනා කර්මවිපාකජ වේදනා ය. ආහාර නො ලැබීම්, පැන් නො ලැබීම්, වස්ත්‍ර වාසස්ථාන නො ලැබීම් ආදියෙන් වන වේදනා කර්ම විපාකජ වේදනාවන්ට අයත් ය.

කර්මය වේදනා උපදවන්නේ ද වාත පිත්තාදියේ සම්බන්ධය ද ඇතිව ය. එසේ නැති ව කර්මය ම ශාරීරික වේදනා ඉපදවීමට සමත් නො වේ. වාතය කිපීමෙන් හෝ සෙම කිපීමෙන් හෝ පිත කිපීමෙන් හෝ වේදනාවක් හට ගත් කල්හි එය කර්ම විපාකජ වේදනාවක් ද වාතාදීන් ගේ කෝපය නිසා ම වූ වේදනාවක් ද යන බව තේරුම් ගැනීමට ක්‍රමයක් නැත. වාත කෝපාදියෙන් වන වේදනා බොහෝ බවත් කර්ම විපාකජ වේදනා මඳ බවත් පමණක් කිය යුතු ය.

"ඉති ඛෝ මහාරාජ අප්පං කම්මවිපාකජං, බහුතරං, අවසෙසං තත්ථ බාලා සබ්බං කම්මවිපාකජං යේවාති අතිධාවන්ති. තස්ස කම්මස්ස න සක්කා විනා බුද්ධඤාණෙන වවත්ථානං කාතුං"

( මිළින්දපඤ්හ )

මහරජ, කර්මවිපාකජ වේදනා මඳය. ඉතිරි වේදනා ම බොහෝ ය. එහි බාලයෝ සියලු වේදනා කර්ම විපාකජය යි අතිධාවනය කෙරෙති. ඒ කර්මයාගේ ව්‍යවස්ථාව බුද්ධ ඤාණය හැර අනිකකින් නො කළ හැකිය යනු එහි තේරුමයි.

"පුරිමේහි සත්තහි කාරණෙහි උප්පන්නා සාරීරිකා වේදනා සක්කා පටිබාහිතුං, කම්ම විපාකජානං පන සබ්බ භේසජ්ජානිපි සබ්බපරිත්තානිපි නාලං පටිඝාතාය."

(සංයුත්තට්ඨ කථා)

යනුවෙන් පළමු කී කරුණු සතෙන් උපන් ශාරීරික වේදනාවන් දුරු කළ හැකිය. කර්ම විපාකජ වේදනා දුරු කිරීමට සියලු බෙහෙත් සියලු පිරිත් සමර්ථ නො වන්නේයයි සංයුක්තට්ඨ කථාවෙහි දක්වා ඇත්තේය.

Non-commercial distribution

සත්ත්වයා යම්කිසි සුඛයක් හෝ දුඃඛයක් හෝ උපේක්ෂාවක් හෝ විඳින්නේ නම් ඒ සියල්ල විඳින්නේ ඊශ්වරයකු විසින් මවනු ලැබීම නිසාය යනු එක් දෘෂ්ටියකි. ඒ ඊශ්වර නිර්මාණ වාදය ය. මේ වාදය බ්‍රාහ්මණ සමය යි අටුවාවෙහි කියා තිබේ. බ්‍රාහ්මණයන් ගේ පිළිගැනීම බ්‍රහ්මයා විසින් සත්ත්වයන් මවනු ලැබූ නිසා සත්ත්වයෝ සුවදුක් ලබත්ය කියා ය. මේ වේදනාවන් වර්තමාන භවයේ සත්ත්වයා විසින් කරන ලද්දකින් හෝ කෙනකුගේ ආඥාවකින් හෝ පෙර කළ කර්මයකින් හෝ හේතුවක් නැතිව ම හෝ ඇති විය නො හැකිය. මේවා ඇති වන්නේ බ්‍රහ්මයාගේ මැවීම නිසා ම ය යනු ඔවුන්ගේ අදහස ය. එබැවින් ඔවුහු පිත්ත සෙම්හාදි වේදනා හේතු ප්‍රතික්ෂේප කෙරෙති.

සත්ත්වයා යම්කිසි සුවයක් හෝ දුකක් හෝ උපේක්ෂාවක් හෝ විඳී නම් ඒ සියල්ල විඳින්නේ කිසි හේතුවක් නැතිවය යනු එක් දෘෂ්ටියෙකි. එය අහේතුක වාදය ය. වා පිත් සෙම් ගිනි ගල් මුල් ආදියෙන් වේදනා ඇති වීම නිසා ඉතා ප්‍රකටව තිබිය දී වේදනාව ඉබේම ඇති වන අහේතුක දෙයකැයි කීම මෝඩ බොළඳ කථාවකැයි සිතෙන්නට පිළිවන. එසේ සිතෙන්නේ මෙය කියවන ඔබගේ නුවණ මඳ බව නිසාය.

සත්ත්වයන් ඉතා ම අගය කොට ඉතා ම ඇලුම් කරන දෙය ද වේදනාව ය. සත්ත්වයාට ඉතා ම අප්‍රිය ඔහු බිය වන දෙයත් වේදනාව ය. ඇලුම් කරන දෙය සුඛ වේදනාව ය. බිය වන දෙය දුඃඛ වේදනාව ය. සත්ත්වයන් අඹු දරුවන්ට නෑයන්ට මිතුරන්ට ඇලුම් කරන්නේ ඔවුන් නිසා සුඛ වේදනාව ඇති වන නිසාය. වස්ත්‍රාභරණ ආහාර පානාදි වස්තූන්ට මිල මුදල්වලට ඇලුම් කරන්නේ ද ඒවායින් සුඛ වේදනාව ඇති වන නිසා ය. ඒවාට ඇලුම් කිරීම වස්තූන්ට ඇලුම් කිරීමක් නොව සුඛ වේදනාවට ඇලුම් කිරීම ය. සතුරන්ට සර්පාදි නපුරු සතුන්ට බිය වන්නේ ද සුඛ වේදනාවට බිය වීම නිසා ය. ඔවුන් නිසා දුඃඛ වේදනාවක් නො වන්නේ නම් ඔවුන්ට බිය නො වන්නාහ. මෙසේ බලන කල්හි මේ වේදනාව ඉතා ප්‍රකට දෙයකි. එහෙත් වේදනාව කුමක් ද? එහි

Non-commercial distribution

සැටි කෙසේ ද? එය කොහි තිබී එනවා ද? ඇවිත් නැවත කොහි යනවා ද? ඇති වූ වේදනාවට කුමක් වෙනවා ද? සුඛ වේදනාවක් ඇති වූ පසු එය දිගට ම තබා ගත නො හැක්කේ කුමක් නිසා ද? ඒ වේදනාව කුමකින් ඇති වෙනවා ද? කෙනකු විසින් ඇති කරනවා ද? යන මේ කරුණු ඉතා ගැඹුරු ය. දත නො හැකිය. අතකින් ශරිරයක් පිරිමැදීමේ දී සුඛ වේදනාවක් ඇති වේ. ඒ අත ම තද කොට පිරිමැදීම කළ හොත් දුඃඛ වේදනාවක් ඇති වේ. පිරිමැදීමේ දී ඇති වන සුඛය කුමක් ද? දුඃඛය කුමක් ද? ඒවා ඇති කළේ අත ද? අතට සුව දුක් ඇති කළ හැකි ද? අත නොවේ නම් පිරිමදිනු ලබන ශරීරයම ද? ශරීරයට එබඳු හැකියාවක් තිබේ ද? ශරිරය අත යන දෙකට ම හැකියාවක් නැති නම් වේදනාවක් ඇති වූයේ කෙසේ ද? යන මේවා විමසිය යුතු කරුණු ය. මේවා ගැන විමසුවහොත් පිළිතුරක් ලැබිය නො හැකි වුව ද ඔබට වේදනාවේ ගැඹුරු බව වටහා ගත හැකි වනු ඇත. වේදනාව පිළිබඳ පූර්වකෘත හේතු වාදය ඊශ්වර නිර්මාණ වාදය අහේතුක වාදය යන දෘෂ්ටි ලෝකයේ ඇති වූයේ වේදනාව තේරුම් ගත නො හැකි වීම නිසා ය. පූර්වකෘත හේතුවාදදි මේ දෘෂ්ටි තුනට **තිත්ථායතනයෝ** යයි කියනු ලැබේ.

තිත්ථායතන යන්නෙහි තේරුම මෙසේය. තිත්ථ යනු දෙසැටක් වූ මිථ්‍යා දෘෂ්ටිවලට නමෙකි. ඒ දෘෂ්ටීන් පිළිගෙන සිටින්නෝ තිත්ථිය (තීර්ථක) නම් වෙති. ආයතන යන වචනයෙන් ඇතිවන ස්ථානය, රැස්වන ස්ථානය, කාරණය යන අර්ථ තුන කියැ වේ. සියලු ම දෘෂ්ටීන් ඇති වන්නේ පූර්වකෘත වූ හේතුවාදදී වූ මේ කරුණු තුනෙහි ය. එබැවින් අනේක දෘෂ්ටීන් නැතහොත් දෘෂ්ටිගතිකයන් ඇතිවන ස්ථානය බැවින් මේ කරුණු තුන තිත්ථායතන නම් වේ. සියලු ම දෘෂ්ටිගතිකයන් රැස්වන්නේ ද මේ කරුණු තුනෙහි ය. එබැවින් දෘෂ්ටිගතිකයන් රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද මේ කරුණු තුන තිත්ථායතන නම් වේ. අනේකප්‍රකාර දෘෂ්ටීන් හා දෘෂ්ටිගතිකයන් ඇති වීමට හේතු වන්නේ ද මේ කරුණු තුන ය. එබැවින් දෘෂ්ටි හා දෘෂ්ටිගතිකයන් ඇති වීමේ කාරණයෝ ය යන අර්ථයෙන් ද මේ කරුණු තුන තිත්ථායතන (තීර්ථායතන) නම් වේ.

Non-commercial distribution

**කිඝද්වත**

### 46. රාගෝ කිඝද්වතං 47. දෝසෝ කිඝද්වතං 48. මෝහෝ කිඝද්වතං

දන ශීල භාවනා සංඛ්‍යාත කුශලයන් ඇති වීමට ඇති කිරීමට බාධා කරන ධර්මයෝ කිඝද්වත නම් වෙති. රාගය ඇති වූ කල කුශලයට බාධා කරයි. කුශලයන්ට ඇති වන්නට නො දෙයි. එබැවින් රාගය කිඝද්වතයකි. ද්වේෂය ද කිඝද්වතයකි. මෝහය ද කිඝද්වතයකි.

**අංගණ**

### 49. රාගෝ අංගණං 50. දෝසෝ අංගණං 51. මෝහෝ අංගණං

තියුණු ක්ලේශයෝ අංගණ නම් වෙති. රාග ද්වේෂ මෝහ ඉතා තියුණු ක්ලේශයෝ ය. එබැවින් රාගාදි තුනට අංගණය යි කියනු ලැබේ.

**මල**

### 52. රාගෝ මලං 53. දෝසෝ මලං 54. මෝහෝ මලං

වස්ත්‍රාදියෙහි ඇලී ඒවායේ සුන්දරත්වය ශෝභනත්වය නැති කරන දැලි ආදීහු මලයෝ ය. රාග ද්වේෂ මෝහ යන මේ ධර්ම තුන ද සිතෙහි ඇලී එහි සුන්දරත්වය නසන්නෝ ය. එබැවින් රාගය මලයෙකි. ද්වේෂය මලයෙකි. මෝහය මලයෙකි.

**විසම**

### 55. රාගෝ විසමං 56. දෝසෝ විසමං 57. මෝහෝ විසමං

ගල් මුල් වළවල් ඇති බිම විෂම ය. එහි යන්නෝ පැකිළ වැටෙති. එමෙන් රාග ද්වේෂ මෝහයන්හි පැකිළ සත්ත්වයෝ අනභිරතියෙන් හෝ සික පද ඉක්මවීමෙන් හෝ

Non-commercial distribution

ශාසනයෙන් වැටෙති. දෙව්ලොවින් මිනිස් ලොවට වැටෙති. අපායට වැටෙති. එබැවින් රාගය විෂමයෙකි. ද්වේෂය විෂමයෙකි. මෝහය විෂමයෙකි..

## 58. කාය විසමං 59. වචී විසමං 60. මනෝ විසමං.

විෂම භූමියෙහි සත්ත්වයන් පැකිළ වැටෙන්නාක් මෙන් අකුශල කර්මයන්හි පැකිළ සත්ත්වයෝ මිනිස් ලොවින් ද දෙව් ලොවින් ද වැටෙති. නරකයට ද වැටෙති. තිරිසන් බවට ද වැටෙති. ප්‍රේතත්ත්වයට ද වැටෙති. එබැවින් අකුශල කාය කර්මය කාය විෂම නමි. අකුශල වාක් කර්මය වාක් විෂම නමි. අකුශල මනඃ කර්මය මනෝ විෂම නමි.

**ගිනි**

## 61. රාගග්ගි 62. දෝසග්ගි 63. මෝහග්ගි

සාමාන්‍යයෙන් සියලු ම ක්ලේශයන්හි දවන ස්වභාවය ඇත්තේ ය. රාගය ද්වේෂය මෝහය යන මේ කෙලෙස් තුනෙහි වඩාත් දවන ස්වභාව ඇත්තේ ය. එබැවින් රාගය රාගග්ගි නම් වේ. ද්වේෂය දෝසග්ගි නම් වේ. මෝහය මෝහග්ගි නම් වේ. රාගාදිය යම් සන්තානයක ඇති වූයේ නම් ඒ සන්තානය දවයි. රාගාදීන්ගේ ද නොයෙක් ප්‍රමාණ ඇත්තේ ය. දුබල වූ මඳ වූ රාගාදියෙහි දැවීම ඇත ද එය අප්‍රකට ය. බලවත් වූ රාගය සමහර විට පුද්ගලයා දවා මරයි. ඒ බව මේ කතා වලින් දත යුතු ය.

එක් තරුණ භික්ෂුණියක් සිතුල්පව් විහාරයේ පෝය ගෙට ගොස් එහි වූ දෙරටුපල් රුවක් දෙස බලා හුන්නා ය. ඇයට ඒ රූපය දැකීමෙන් බලවත් රාගය උපන්නේ ය. ඒ මෙහෙණිය ඇය තුළ ඇවිලුණු රාග ගින්නෙන් දැවී එ තැන සිට ගෙන ම කළුරිය කළා ය.

(විභංගට්ඨකථා)

එක් දවසක් **සද්ධාතිස්ස රජතුමා** අන්තඃපුර ස්ත්‍රීන් පිරිවරා විහාරයට ආයේ ය. එක් තරුණ භික්ෂුවක් ලෝහප්‍රාසාද

Non-commercial distribution

ද්වාරයේ සිට ඒ ආ එක් ස්ත්‍රියක් දෙස බැලීය. ඒ ස්ත්‍රිය ද ගමන නවතා භික්ෂුව දෙස බැලීය. දෙදෙනා තුළ ම ඔවුනොවුන් කෙරෙහි බලවත් රාගය උපන්නේ ය. ඒ රාග ගින්නෙන් දැවී දෙදෙනා ම එතැන ම මළහ.

(මනෝරථපූරණී.)

කැලණි විහාරයේ එක් තරුණ භික්ෂුවක් උගෙනීම පිණිස **කාලදීඝවාපිගාමද්වාර** විහාරයට ගොස් උගෙනීම නිම කොට පෙරළා යන්නේ විහාරයේ සාමණේරයන් විසින් ඇසුව හොත් ගමේ ආකාරය කිය යුතු වන්නේ යයි ඒ ගමෙහි පිඬු පිණිස හැසිරෙනුයේ එහි එක් ස්ත්‍රියක කෙරෙහි ඇල්ම ඇති කර ගෙන විහාරයට ගියේ ය. ඒ ස්ත්‍රිය මැරී ඇය හැඳ සිටි වස්ත්‍රය භික්ෂූන්ට ලැබිණි. ඇය කෙරෙහි පෙම් බැඳ සිටි තරුණ මහණ ඒ වස්ත්‍රය දැක හැඳින භික්ෂූන්ගෙන් තොරතුරු අසා ඇය මළ බව දැන ඇය ගැන ඇති වූ රාගාග්නියෙන් දැවී කළුරිය කෙළේ ය.

(මනෝරථපූරණී)

ද්වේෂය තදින් ඇති වූ කල්හි ඇඟ රත් වී ඩහදිය ගලනු පෙනේ. වෙවුලනු පෙනේ. ශරීර වර්ණය වෙනස් වී තිබෙනු පෙනේ. ඒ විකාරයන් වන්නේ ද්වේෂාග්නියෙන් දැවීමෙනි. මිනිස් ලොව ද්වේෂාග්නියෙන් දැවී මැරෙනුවන් ගැන අසන්නට නැත. බියෙන් ශෝකයෙන් මැරෙනුවන් ගැන අසන්නට ලැබේ. බිය කියනුයේ ද ඒ ආකාරයෙන් ඇති වන ද්වේෂයට ම ය. ශෝකය ඇති වන්නේ ද තැවෙන ආකාරයෙන් ඇති වන ද්වේෂය සමග ම ය. එබැවින් බියෙන් ශෝකයෙන් මැරෙන අය ද්වේෂාග්නියෙන් දැවී මැරෙන අය ලෙස සැලකිය හැකිය. **මනෝපදූසික** නම් දේව කොට්ඨාසයක් ගැන බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ. ඔවුන් සමහර විට එකිනෙකාට ද්වේෂ කර ද්වේෂාග්නියෙන් දැවී මැරෙන බව කියා තිබේ. මෝහය සත්ත්වයන් දවන්නේ රාග ද්වේෂ දෙක හා එක්වීමෙනි. මෝහයෙන් තොර වූ රාග ද්වේෂයෝ නූපදීති. මේ ගිනි තුන පිළිබඳ ව **ඉතිවුත්තකයේ** එන දේශනාවක් මෙසේ ය :-

Non-commercial distribution

1. රාගග්ගි දහති මච්චේ නරේ කාමාධිමුච්ඡිතේ,
දෝසග්ගි පන බ්‍යාපන්නේ නරේ පාණාතිපාතිනෝ
මෝහග්ගි පන සම්මූළ්හෙ අරියධම්මේ අකෝවිදේ

2. ඒතේ අග්ගි අජානන්තා සක්කායාභිරතා පජා,
තේ වඩ්ඪයන්ති නිරයං තිරච්ඡානඤ්ච යෝනියෝ
අසුරං පෙත්තිවිසයං අමුත්තා මාරබන්ධනා.

3. යේ ච රත්තින්දිවා යුත්තා සම්මා සම්බුද්ධසාසනෙ
තේ නිබ්බාපෙන්ති රාගග්ගිං නිච්චං අසුභසඤ්ඤිනො

4. දෝසග්ගිං පන මෙත්තාය නිබ්බාපෙන්ති නරුත්තමං
මෝහග්ගිං පන පඤ්ඤාය යායං නිබ්බේධගාමිනී

5. තේ නිබ්බාපෙත්වා නිපකා රත්තින්දිව මතන්දිතා
අසේසං පරිනිබ්බන්ති අසේසං දුක්ඛමච්චගුං

6. අරියද්දසා වේදගුනෝ සම්මදඤ්ඤාය පණ්ඩිතා,
ජාතික්ඛය මභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භවං

**තේරුම:**

1. රාග නමැති ගින්න කාමයන්හි මුළාවී සිටින්නා වූ ජනයන් දවයි. ද්වේෂ ගින්න වනාහි දූෂිත සිත් ඇති ප්‍රාණවධ කරන්නා වූ මිනිසුන් දවයි. මෝහ නමැති ගින්න ආය්‍ය‍ී ධර්මය නො දන්නා වූ මුළාවී සිටින මිනිසුන් දවයි.

2. ඒ ගිනි නො දන්නා වූ සක්කාය නම් වූ උපාදන ස්කන්ධ පඤ්චකයෙහි ඇලුණා වූ මාර බන්ධනයෙන් නො මිදුණා වූ ඒ සත්ත්වයෝ නරකය ද තිරශ්චීන යෝනිය ද අසුර යෝනිය ද ප්‍රේත යෝනිය ද නැවත නැවත එහි ඉපදීම් වශයෙන් වැඩි කෙරෙත්.

3. යම් කෙනෙක් සම්‍යක් සම්බුද්ධ ශාසනයෙහි රෑ දවල් දෙක්හි භාවනාවෙහි යෙදුණාහු වෙත් ද නිරතුරු අසුභසංඥාව ඇත්තා වූ ඔවුහු රාගාග්නිය නිවන්නාහුය.

4. උත්තම පුද්ගලයෝ මෛත්‍රියෙන් ද්වේෂාග්නිය නිවන්නාහ. ක්ලේශස්කන්ධය නිවමින් පවත්නා වූ යම් ඒ ප්‍රඥාවක් වේ ද එයින් මෝහාග්නිය නිවන්නාහ.

Non-commercial distribution

5. නුවණැත්තා වූ රෑ දවල් දෙක්හි අනලස වූ ඒ නරෝත්තමයෝ කෙලෙස් ගිනි නිවා අනුපාදිශේෂ වශයෙන් පිරිනිවෙන්නාහ. ඔවුහු සකල සංසාරදුඃඛය ඉක්මවූහ.

6. ආයඝියන් විසින් දක්නා ලද චතුස්සත්‍ය ධර්මය දුටුවා වූ නුවණින් සංසාරයාගේ කෙළවරට ගියා වූ පණ්ඩිතයෝ දත යුතු කුශලාදි ධර්මයන් මැනවින් දැන ජාතික්ෂයය වූ නිවන මැනවින් දැන නැවත භවයට නොම එන්නාහ.

**කසාවඃ**

**64. රාග කසාවෝ 65. දෝස කසාවෝ**
**66. මෝහ කසාවෝ 67. කාය කසාවෝ**
**68. වචී කසාවෝ 69. මනෝ කසාවෝ**

පැණි බී ඉවත ලූ උක්සප බඳු ඕජාවක් රසයක් නැති දෙය කසාව නම් වේ. රාගාදියෙහි හා අකුශල කාය කර්මාදීන්හි කිසි රසයක් නැති බැවින් ඒවා කසාව නම් වේ. මේ විභංගඅටුවාවෙහි කසාව විස්තර කර ඇති ආකාරය ය.

කසාව යන්නෙහි අර්ථය අන් අයුරකින් ද දැක්විය හැකි ය. කසාව යන වචනය ඕජා රහිත දෙය යන අර්ථය සඳහා යෙදී ඇති අන් තැනක් නො දක්නා ලැබේ. කසාව යන වචනය පිටකත්‍රය පාළියෙහි නොයෙක් තැන යෙදී ඇත්තේ කසට යන අර්ථය සඳහා ය. සිවුරට කාසාව, කාසාය යන වචන කියන්නේ ද එය කසට පෙවූ වස්ත්‍රයක් වන නිසාය. කසටය වනාහි ලෙහෙසියෙන් ඉවත් කළ නො හෙන සේ වස්ත්‍රාදියෙහි බැඳී ඒවා කිලිටි කරන දෙයකි. රාග ද්වේෂ මෝහයෝ ද පහසුවෙන් ඉවත් කළ නොහෙන ලෙස සත්ත්ව සන්තානයෙහි බැඳී සිටින්නෝ ය. බැඳී සිට සිත කෙලෙසන්නෝ ය. එ බැවින් රාගාදියට කසට ය යි කීම ඉතා සුදුසු ය. අකුශල කර්මයෝ ද එසේ ම ඉවත් කළ නො හෙන පරිදි සත්ත්වසන්තානයෙහි බැඳී සිට අනිෂ්ට විපාක ගෙන දෙන්නෝ ය. එබැවින් ඒවාට ද කසට ය යි කීම සුදුසු ය.

Non-commercial distribution

## 70. අස්සාද දිට්ඨි 71. අත්තානුදිට්ඨි 72. මිච්ඡාදිට්ඨි

කාමයන් පරිභෝග කිරීමෙන් දෙසක් නැතය යන දෘෂ්ටි අස්සාද දිට්ඨි නම් වේ. ඒ දෘෂ්ටිය ගත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මේ කාමයන් ඇත්තේ සත්ත්වයන්ගේ ප්‍රයෝජනයට ය. සත්ත්වයන්ට සැප ලැබීමට අවශ්‍ය මේවා පරිභෝග නො කොට දුක් විඳීම අනුවණ කමකැ යි සලකා සිත් සේ කාමයන් පරිභෝග කරති. ආහාර පාන වස්ත්‍ර වාසස්ථානාදීහු කාමයෝ ය. ඒවා පරිභෝග කිරීමේ නිරවද්‍ය ක්‍රමයක් ද ඇත්තේ ය. සාවද්‍ය ක්‍රමයක් ද ඇත්තේ ය. තණ්හාවෙන් තොරව නුවණින් පරිභෝග කිරීම නිරවද්‍ය ක්‍රමය ය.

“යථාප්පච්චයං පවත්තමානෝ ධාතුමත්තකෝ යේවායං පිණ්ඩපාතෝ, තදුපභුඤ්ජකො ච පුග්ගලෝ ධාතු මත්තකෝ නිස්සත්තෝ නිජ්ජීවෝ සුඤ්ඤො. සබ්බෝ පනායං පිණ්ඩපාතෝ අජිගුච්ඡනීයෝ. ඉමං පූතිකායං පත්වා අතිවිය ජිගුච්ඡ-නීයෝ ජායති.”

යනුවෙන් දැක්වෙන පරිදි මේ ආහාරය ප්‍රත්‍යය අනුව පවත්නා වූ ධාතු මාත්‍රයෙක . එය අනුභව කරන පුද්ගලයා ද සත්ත්ව නොවූ ජීව නොවූ සත්ත්වභාවයක් නැත්තා වූ ධාතුමාත්‍රයෙක. දැනට පිළිකුල් නො වූ මේ ආහාරය මේ කුණු කයට ඇතුළු වීමෙන් ඉතා පිළිකුල් බවට පැමිණෙන්නේ ය. මෙසේ නුවණින් සලකා තණ්හා-වෙන් තොර ව ආහාර වළඳන භික්ෂූන් ගේ ඒ රසකාමී සම්භෝගය නිරවද්‍ය ය. වස්ත්‍රාදිය පරිභෝගයත් එසේම ය. ආහාර රස විඳිමින් සප්‍රීතික තණ්හාවෙන් ආහාර වැළඳීම සාවද්‍ය පරිභෝගය ය. මේවා තිබෙන්නේ අපට ප්‍රයෝජන ගැනීමට ය, ප්‍රීති වීමට ය, නැතහොත් මේවා දෙවියන් විසින් මවා ඇත්තේ අහක දැමීමට නොව අපට භුක්ති විඳීමට ය කියා ආහාර ගැනීම වඩාත් සාවද්‍ය ය. අන්‍ය වස්තූන් පරිභෝගය ද එසේ ම ය. සාවද්‍ය කාම සම්භෝගය වුව ද අපායෝත්පත්තියට හේතු වන කර්මපථයක් නො වේ.

“මාතාපිතරෝහි භාතුභගිනි ආදයෝ ච පුත්තභාතිකානං ආවාහවිවාහමංගලං නාම කාරෙන්ති. එවං තාවෙස ලෝකවජ්-

Non-commercial distribution

ජවසේන පවත්තරාගො අප්පසාවජ්ජෝ. සදරසන්තෝසස මූලිකා පන අපායේ පටිසන්ධි නාම න හෝති.”

(මනෝරථපූරණී)

මරණාසන්නයෙහි කාම වස්තුව ගැන ආශාවෙන් විසූව හොත් ඒ හේතුවෙන් ප්‍රේතව හෝ තිරිසන් ව හෝ ඉපදිය හැකි ය. තථාගතයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන කලක **තිස්ස** නම් ස්ථවිර නමක් සියුම් වස්ත්‍රයක් ලැබ එයින් සිවුරක් කොට සෙට එය පරිභෝග කරමි යි තබා ගෙන සිටිය දී එදින රාත්‍රියේ හටගත් අජීර්ණ රෝගයකින් සිවුරට ආශාව තබාගෙන කලුරිය කළේ ය. ඒ ස්ථවිර තෙමේ ඒ ආශාව නිසා සිවුරෙහි උකුණෙක් ව උපන්නේ ය. මේ ධම්මපදට්ඨකථාවේ සඳහන් කථාවෙකි. බුද්ධ කාලයේ අරිට්ඨ නමැති භික්ෂුවක් හා කණ්ඨක නමැති සාමණේර නමක් කාම සම්භෝගයේ වරදක් නැතය යන මේ දෘෂ්ටිය ගෙන සිටි බව විනයෙහි සඳහන් වේ.

**අත්තානුදිට්ඨි** යනු ඉහත දැක් වූ සත්කාය දෘෂ්ටිය ම ය. එය විස්තර කර ඇත.

මිච්ඡාදිට්ඨි යනු නත්ථි දින්නං නත්ථි යිට්ඨං යනාදීන් දැක්වෙන දශවස්තුක මිථ්‍යා දෘෂ්ටිය ය. එය ද විස්තර කර ඇත.

## 73. අරති 74. විහේසා 75. අධම්මචරියා

ගමට දුර ආරණ්‍ය සේනාසනවල, විවේක සේනාසන වල, විසීමට හා සමථ විදර්ශනා භාවනාවන්හි යෙදීමට සතුටක් නැති බව **අරති** නම් වේ. මෙය සූක්ෂ්ම ද්වේෂයකි. මෙය පිළිවෙත් පුරනු පිණිස අරණ්‍ය සේනාසනයකට හෝ භාවනා මධ්‍යස්ථානයකට හෝ භාවනාව සඳහා වෙනත් තැනකට හෝ ගිය අයට ඇති වන ක්ලේශයෙකි. ශ්‍රද්ධාව මඳ බව, නුවණ මඳ බව, නුගත් බව, ආහාරපාන දුර්වලත්වය, මැසි මදුරු ආදී කරදර කරන සතුන් බහුල බව, චණ්ඩ මෘගයන් සමීපයේ හැසිරීම, අමනුෂ්‍යයන් ඇති බව, ශබ්ද කරන සතුන් බහුල බව, වීර්‍ය්‍ය මඳ බව, ඇසුරු කිරීමට සුදුස්සන් නැති බව, ඥාති මිත්‍රයන් සිහි වන බව, බොහෝ දෙනා හා එක්ව

Non-commercial distribution

විසීමේ ආශාව, ඇවිදීමේ ආශාව යනාදිය අරතිය ඇති වීමේ හේතු ය. අරතිය යෝගාවචරයන්ට ඉමහත් බාධක ධර්මයෙකි. එය පොහෝ දිනයන්හි සිල් සමාදන් වන උපාසකෝපාසිකාවන්ට ද බාධක ධර්මයෙකි. අරතිය ද එක්තරා වඤ්චක ධර්මයෙකි. අරතියට ප්‍රධාන හේතුව අශ්‍රඬාව ය. අශ්‍රද්ධාව නිසා අරතිය ඇති වූ යෝගා-වචරයාට ආහාර පාන ලැබීම මඳ නිසා මෙතැන වාසය නො කළ හැකි ය, භාවනා නො කළ හැකිය, මදුරුවන් වැඩි නිසා සර්පයන් වැඩි නිසා මෙහි නො විසිය හැකිය යනාදි අදහස් පහළ වේ. එයින් ඔහු විවේකස්ථාන හැර භාවනාව හැර යයි. අරතිය ඇති තැනැත්තා භාවනා කළ ද ඔහු එය අලස කමින් මැනවින් නො කරන බැවින් ඔහුට සමාධි ප්‍රඥාවෝ නො වැඩෙති. බොහෝ කල් භාවනා කළ ද එකම තත්වයේ සිටී. භාවනාවට ලොකුම සතුරා අරතිය ය. එය භාවනාරාමතා නමැති ආර්‍ය්‍යවංශ ධර්මය ඇති කර ගැනීමෙන් දුරු කර ගත යුතු ය. භාවනාරාමතාව, සත්පුරුෂ සේවනයෙන් සඬර්ම ශ්‍රවණයෙන් යෝනිසෝ මනසිකාරයෙන් ඇති කර ගත හැකි ය.

ඇතැම්හු බැණීමෙන් තර්ජනයෙන් ගල්මුල්වලින් කෝටුවලින් පොලුවලින් ආවුධ වලින් අන්‍යයන්ට හිංසා කරති. මහල්ලන් රෝගීන් අංගවිකලයන් මෝඩයන් පිස්සන් දුටු විට විනෝද පිණිස ඔවුනට කරදර කරති. බැඳ තැබීමෙන් කූඩු වල සිරකර තැබීමෙන් සතුන්ට හිංසා කෙරෙති. එසේ කරන ස්වභාවය **විහේසා** නම් පාපධර්මය ය.

කයින් පව් කම් කිරීම වචනයෙන් පව් කම් කිරීම සිතින් පව් කම් කිරීම **අධම්මචරියා** නම් වේ. මාපියන්ට ගුරුවරුන්ට වැඩිමහල්ලන්ට පැවිද්දන්ට උපකාර කළවුන්ට නො සලකා හැරීම හා යුතුකම් ඉටු නො කිරීම ද අධම්මචරියා නම් වේ.

## 76. දෝවචස්සතා 77. පාපමිත්තතා 78. නානත්තසඤ්ඤා

ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන් විසින් බුදුන් වහන්සේ පනවා ඇති සිකපදයෙන් අනුශාසනා කරන කල්හි රාත්‍රියට ආහාර ටිකක් ගෙන සාගින්න නිවා ගැනුමේ වරද කුමක් ද? තණ උදුරා දමා මිදුල පිරිසිදු

Non-commercial distribution

කිරීමේ වරද කුමක් ද? යනාදීන් තර්ක ඉදිරිපත් කෙරෙමින් සිකපදයට විරුද්ධ පැත්ත ගන්නා බව, විරුද්ධ ව සිටීම ම මිහිරි බව, සිකපදවලට හා ආචාර්යෝපාධ්‍යායයන්ට අනාදර කරන බව, අගෞරව කරන බව **දෝවචස්සතා** නම් වේ. මාපියාදීන් විසින් දරුවන්ට අවවාද කරන කල්හි ඉදහිට යහළුවකු බලන්න යන්නේ නැති ව යහළුවන් හා ඇවිදින්න යන්නේ නැති ව සිරේ සිටින්නාක් මෙන් අපට මේ ගෙහි ම සිටිය හැකි ද? නිතර ම වැඩ කළ හැකි ද? නිතර ම පාඩම් කළ හැකි ද? උත්සවයකට ගිය විට මත්පැන් ටිකක් බීවාට බේබද්දෙක් වෙනවා ද? යනාදි තර්ක ඉදිරිපත් කරමින් අවවාදයට විරුද්ධ පැත්ත ගන්නා ස්වභාවය, විරුද්ධ ව සිටීම මිහිරි බව, අවවාදයට අනාදර කරන බව, අවවාද නො පිළිගන්නා බව ගිහියන්ගේ දෝවචස්සතාව ය. මාපියාදීන් ගේ අවවාද නො පිළිගෙන තමන් ගේ මතය අනුව ක්‍රියා කිරීමෙන් සොරුන් වී සූදුකාරයන් බේබද්දන් වී රෝගීන් වී රැකියා නැතියන් වී දුක් විඳින්නෝ ලෝකයේ බොහෝ ය. මාපියන්ගෙන් ලත් ඉඩම් කැබැල්ලට, ගෙට අහිමි වී අසරණ වී සිටින්නෝ ද බොහෝ ය. ලෝකයේ උසස් තත්ත්වයකින් සිටින සැම දෙනා ම වාගේ බාල කාලයේ තරුණ කාලයේ මාපියාදීන් ගේ අවවාද පිළිගෙන ඒවා අනුව පිළිපත් පුද්ගලයෝ ය. සෝවචස්සතාව උතුම් මංගල්‍යයෙකි. මංගල සූත්‍රයේ එන අටතිසක් මහුල් කරුණු වලින් ද එකකි.

දියුණුවට හේතුවන අවවාදනුශාසනා කරන ආදර්ශ දෙන උත්තම පුද්ගලයන් අප්‍රිය බව තමා ද නො මග යෙමින් අන්‍යයන් ද නො මඟ යවන පාප පුද්ගලයන්ට කැමති බව **පාපමිත්තතාවය** ය.

පරිහානියට දුකට හේතුවන නානාවිධ සංඥාවෝ **නානත්ත සඤ්ඤා** නම් වෙති. ඔවුහු නම් කාම සංඥා ව්‍යාපාද සංඥා විහිංසා සංඥාදීහු ය.

## 79. උද්ධච්චං 80. කෝසජ්ජං 81. පමාදෙ

සුළං පුරවා බිම ගසන බෝලය බිම නො පිහිටා උඩ විසි වන්නාක් මෙන් සිත අරමුණෙහි නොපිහිටා විසි වන ස්වභාවය,

Non-commercial distribution

සැඩසුළං වදින ජලයක් මෙන් කොඩියක් මෙන් සිත සැලෙන දහලන වෙවුලන ස්වභාවය **උද්ධච්ච** නම් වේ. මෙය සිත එක් අරමුණක තබා ගැනීමට එක් කටයුත්තක යෙදවීමට බාධක ධර්මයකි. ඇති නැති බව තේරුම් ගැනීමට දුෂ්කර චෛතසික ධර්මයෙකි. යෝගාවචරයන්ට නීවරණයෙකි. අධික වීර්‍ය්‍යයත් උද්ධච්චයට හේතු වන බව කියා තිබේ.

සිත ආරක්ෂා නො කොට පඤ්චකාමයන්හි දුශ්චරිතයන්හි යෙදීමට ඉඩ හැර තිබීම, කුශල් කිරීමෙහි දී නො සැලකිල්ලෙන් නො මනා පරිදි කරන බව, කලාතුරකින් මිස කුශලය නිතර නො කරන බව, කුශලය කලින් කල නවත නවතා මඳින් මඳ කරන බව, කුශල් කිරීමට පසු බසින බව, කුශල් කිරීමේ බලාපොරොත්තුව නැති බව, කුශලයන් නො කරන බව, **කෝසජ්ජ** නම් වේ. උගෙනීම නො කරන බව, කළ ද මැනවින් නො කරන බව, ගොවිකම් අත්කම් ආදි වැඩ නොකරන බව, කළ ද මැනවින් නො කරන බව, කෝසජ්ජයය. කුසීත බවය, අලස බවය කියනුයේ ද මෙයට ම ය. මේ කුසීත බව ඇති වන්නේ ඒ ඒ වේලාවට ලැබිය හැකි සැපය ගැන ආසාව නිසා හා අනාගතය වැසෙන මෝහයත් නිසා ය. මෙය ගිහි පැවිදි කාහටත් මහා පරිහානිකර ධර්මයෙකි. උගෙනීමෙහි නො යෙදෙන කළ යුතු වත පිළිවෙත මැනවින් නො කරන භාවනාවෙහි නො යෙදෙන අලස පැවිද්ද දෙලොවින් ම පිරිහේ. බාලකාලයේ අලස කමින් නිදමින් විනෝද වෙමින් සිට උගෙනීමක් නො කළ පැවිද්ද වැඩි වියට පත් වූ විට පැවිද්දන් විසින් කළ යුතු ධර්මදේශනාදි කටයුතු වලට අසමත් වීමෙන් හිස් පුද්ගලයකු වශයෙන් සලකන, කිසිවකු විසින් ගණන් නො ගන්නා බොහෝ දෙනාට අප්‍රිය පුද්ගලයෙක් වේ. එයින් ඔහුට සමහර විට පැවිද්දෙන් ඉවත් වීමට ද සිදු වේ. ගිහි වුව ද කිසිවක් නො දන්නා කිසිවකට නො සමත් වූ ඔහුට, ගත කරන්නට සිදු වන්නේ කාලකණ්ණි ජීවිතයෙකි. උගෙනීමෙහි හෝ රැකියාවක් පුහුණු කර ගැනීමෙහි හෝ නො යෙදෙමින් මා පියන් සපයන ධනයෙන් කා බී හැඳ පැළඳ ඇවිදිමින් නිදමින් විනෝදයෙන් ජීවත් වන බාලයෝ තරුණයෝ අනාගතයේ දී කිසිවක් කර ගැනීමට නො සමත් අවාසනාවන්තයෝ වෙති. එබඳු අය සමහරවිට සොරු හෝ යාචකයෝ හෝ

Non-commercial distribution

වෙති. ලෝකයේ උසස් තත්ත්වවලට පැමිණ සිටින්නේ විනෝද වීමට කාලය ගත නො කොට වෙහෙසී උගෙනීම කළ අයය ය. ධනවතුන් වී සිටින්නේ වෙහෙසී රැකියාවන් කළ අය ය.

**උට්ඨාන ඵලූපජීවී න කම්ම ඵලූපජීවී.**
**කම්ම ඵලූපජීවී න උට්ඨාන ඵලූපජීවී.**
**උට්ඨාන ඵලූපජීවී චෙව කම්ම ඵලූපජීවී.**
**නේව උට්ඨාන ඵලූපජීවී න කම්මඵලූපජීවී.**

මෙසේ අංගුත්තර නිකාය චතුෂ්ක නිපාතයේ පුද්ගලයන් සතර දෙනකුන් දක්වා ඇත්තේ ය. කුශල කර්ම ඵලයෙන් ජීවත් නො වී වීර්‍ය්‍ය ඵලයෙන් ජීවත් වන මනුෂ්‍යයෝ උට්ඨාන ඵලූප ජීවී න කම්ම ඵලූප ජීවී පුද්ගලයෝ ය. වීර්‍ය්‍ය ඵලයෙන් ජීවත් නො වී කුශල කර්ම ඵලයෙන් ම ජීවත් වන දෙවියෝ කම්ම ඵලූපජීවී න උට්ඨාන ඵලූපජීවී පුද්ගලයෝ ය. උට්ඨාන ඵලය කුශල කර්ම ඵලය යන දෙකින් ම ජීවත් වන රාජ රාජ මහාමාත්‍යාදීහු උට්ඨාන ඵලූපජීවී කම්ම ඵලූපජීවී පුද්ගලයෝ ය. නෛරයික සත්ත්වයෝ නේව උට්ඨාන ඵලූපජීවී න කම්ම ඵලූපජීවී පුද්ගලයෝ ය.

මේ පුද්ගලයන් සතර කොටසින් සාමාන්‍ය මනුෂ්‍යයන් අයත් වන්නේ උට්ඨාන ඵලූප ජීවී ගණයට ය. ඔහුට කුශල කර්ම ඵලය ලැබෙන්නේ ඉතා සුළු වශයෙනි. වීර්‍ය්‍ය නො කළ හොත් එය ද නො ලැබේ. එබැවින් දෙලොව වැඩ සාද ගනු කැමැතියන් විසින් අලස නොවී වීර්‍ය්‍ය කළ යුතු ය.

විභංග පාළියේ පමාදය විස්තර කර ඇත්තේ ද කෝසජ්ජය සේ ම ය. ඒකක නිර්දේශයේ එය විස්තර කර ඇත.

## 82. අසන්තුට්ඨිතා 83. අසම්පජඤ්ඤතා 84. මහිච්ඡතා

ඇතැම් භික්ෂූන්ගේ චීවර පිණ්ඩපාත සේනාසන ග්ලානප්‍රත්‍යයන් පිළිබඳ ලද පමණින් සතුටු නොවන වඩ වඩා බලාපොරොත්තු වන ස්වභාවය වූ මහා තණ්හාව ද ගිහියන් ගේ කාම වස්තූන් පිළිබඳ ලද පමණින් සතුටු නො වන වඩ වඩා බලාපොරොත්තු වන

Non-commercial distribution

ස්වභාවය වූ මහා තණ්හාව ද **අසන්තුට්ඨිතා** නම් වේ. මෙය බුද්ධාදීන් විසින් පිළිකුල් කරන ලද ඉතා පහත් ස්වභාවයෙකි. ප්‍රත්‍යයන් ගැන ලද පමණින් සතුටු නොවන පැවිද්දෝ කුල දූෂණාදියෙන් නො මනා පරිදි, ප්‍රත්‍යය සපයා මෙලොවත් දුශ්ශීලයන් වශයෙන් ජීවත් වී මරණින් මතු ද ශ්‍රමණ යක්ෂයන් ශ්‍රමණ ප්‍රේතයන් වී දුක් විඳින්නාහ. කාම වස්තූන් ගැන සෑහීමට පත් නො වන ගිහියෝ ද වස්තූන් සෙවීම් සඳහා සොරකම් ආදි පව් කම් කොට සමහර විට මෙලොව ද දුකට පත් වී මරණින් මතු අපායට ද යෙති.

කොතෙක් වස්තුව ලබා ඇත ද එයින් සෑහීමකට පත්ව නැති පුද්ගලයාට සැපයක් නැත්තේ ය. ඔහුට ඇත්තේ මදිය මදිය යන තැවිල්ල ය. එබැවින් හේ සැම කල්හි ම දුකින් ජීවත් වේ. සැපය නම් සතුට ය. ස්වල්ප වූ ද ලද දෙයින් සතුටු ව සිටින පුද්ගලයාට සැම කල්හි සැපය ඇත්තේ ය. ඔහු සියලු සම්පත් ඇතියකු වැනි ය. එ බැවින් භේසජ්ජමඤ්ජුසා නම් වෛද්‍ය ග්‍රන්ථයේ මනෝ රෝග චිකිස්සාවෙහි "අප්පේපි තුට්ඨ මනසො සන්ති සබ්බාපි සම්පද" යි කියන ලදී. ලද දෙයින් සතුටු නො වන්නහුට මහා තණ්හාව නිසා ඒ තණ්හා නමැති ගින්නෙන් ශරීරය දැවී නොයෙක් රෝග ද ඇති වන්නේ ය. ඒ රෝග දුරු කිරීමට බෙහෙත් ද නැත. තණ්හා රෝග දුරු කිරීමට ඇත්තා වූ එකම ක්‍රමය කවරාකාරයෙන් හෝ රෝගියා ගේ සිතින් ඒ තණ්හාව ඉවත් කිරීම ය. පෙර මහා බෝධිසත්ත්වයන් වහන්සේ රජුන් දෙදෙනකුගේ මනෝ රෝගයන් දුරු කළ සැටි ජාතක පොතෙහි දක්වා ඇත්තේ ය. ඉන් එක් කථාවක් මෙසේ ය.

පෙර බරණැස් නුවර තමාගේ රජයෙන් තෘප්තියට නො පැමිණ අන් රාජ්‍යයන් ද තමා සතු කර ගැනීමට මං සොයමින් සිටි අධික තණ්හාවෙන් පෙළෙන රජෙක් විය. එක් දවසක් සක්දෙව් රජතුමා මනුෂ්‍යයෝ දනාදි පින්කම් කෙරෙත් දැයි ලෝකය බලනුයේ කිසි පිනක් නො කොට තණ්හාවෙන් තව තවත් ධනය සොයමින් වෙසෙන ඒ රජු දැක මොහුට හොඳ පාඩමක් උගැන්විය යුතුය යි සිතා තරුණයකු ගේ වේශයෙන් රාජද්වාරයට ගොස් උපායයෙහි දක්ෂ තරුණයෙක් පැමිණ සිටින්නේ යයි රජුට දන්වා යවා ඇතුළු

Non-commercial distribution

වීමට අවසර ලබා රජු වෙත ගොස් ජය වේවා යි ආචාර කොට සිටියේ ය. රජු ආ කාරණය විචාළ කල්හි "දේවයන් වහන්ස, නුඹ වහන්සේට සැල කරන්නට කරුණක් ඇත්තේ ය. එයට සුදුසු තැනක් උවමනාය" යි කීය. එවිට ශක්‍රානුභාවයෙන් ම එහි සිටියෝ ඉවත් ව ගියහ. එකල්හි තරුණයා "දේවයන් වහන්ස, මම බොහෝ ජනයා ඇති බොහෝ සම්පත් ඇති නගර තුනක් දනිමි. ඒවා මට උපායයෙන් නුඹ වහන්සේට යටත් කර දිය හැකි ය. වහා ම එහි යාමට සූදනම් වුව මැනව" යි කී ය. අධික තණ්හාවට වසඟ වී සිටි රජ ඉතා සතුටු වූයේ ය. ඔහු ශක්‍රානුභාවයෙන් ම පැමිණි තරුණයාගෙන් කිසිවක් නො විචාළේ ය. කිසි සත්කාරයක් ඔහුට නො කළේය. සක්දෙව් රජ දෙව් ලොවට ගියේ ය.

රජතුමා ඇමතියන් කැඳවා "අපට රාජ්‍ය තුනක් ලබා දීමට තරුණයෙක් පැමිණ සිටියි. නුවර බෙර ලවා වහා සේනාව රැස් කරවි, ඒ තරුණයා ද කැඳවවිය" යි කීය. එකල්හි ඇමතියෝ රජතුමා කියන තරුණයා නො දැක "දේවයන් වහන්ස, ඒ තරුණයාට සත්කාර කළ සේක් ද? ඔහුගේ වාසස්ථානය විචාළ සේක්දැ" යි කීහ. "මම ඔහුට සත්කාර නො කෙළෙමි. ඔහු වාසය කරන තැන ද නො විචාළෙමි"යි රජතුමා කීය. ඇමතියෝ බරණැස් නුවර සැම තැන ම තරුණයා සොයා නො දැක ඒ බව රජුට දැන්වූහ. රජතුමාට රාජ්‍ය තුන නො ලැබීම ගැන මහත් ශෝකයක් ඇති විය. "ඔහු මා ඒ තරුණයාට සත්කාරයක් නො කළ නිසා කිපී යන්නට ඇත. මාගේ ප්‍රමාදය නිසා ලැබෙන්නට තුබූ මහත් යසසින් පිරිහුනෙමිය" යි නැවත නැවත සිතන්නට විය. ඒ ශෝකයෙන් ඔහුගේ ශරීරය හුණු වී ලේ අතීසාරය හට ගත්තේ ය. මහත් මහත් රාජ වෛද්‍යයන් පැමිණ ප්‍රතිකාර කළ නමුත් රජුට මඳ ගුණයකුදු නො වීය. ගන්න ගන්නා ආහාරපාන සියල්ල ම පිට වෙන්නට විය.

එකල්හි මහ බෝසතාණන් වහන්සේ තක්සලා නුවරට ගොස් ශිල්ප ඉගෙනීම නිමවා මාපියන් දකිනු සඳහා බරණැස් නුවරට පැමිණ සිටියාහු රජුගේ රෝගය ගැන අසන්නට ලැබී එහි ගොස් රජු වැඳ සිට "දේවයන් වහන්ස, බිය නොවනු මැනව, මම නුඹ වහන්සේට පිළියම් කරන්නෙමි. නුඹ වහන්සේගේ රෝගය හට ගත් සැටි පමණක් මට කියනු මැනව"යි කීය. රජු කීමට

Non-commercial distribution

ලැජ්ජාවෙන් 'නුඹට එයින් කම් නැත., බෙහෙත් පමණක් කරව''යි කීය. ''දේවයන් වහන්ස, නිදානය නොදන්නා රෝගයකට බෙහෙත් නො යෙදිය හැකි ය. වෛද්‍යයන් බෙහෙත් කරන්නේ රෝග නිදානය අනුවය''යි බෝසතාණෝ කීහ. රජතුමා රෝග නිදානය කීය.

බෝසතාණෝ රජුට අවවාද කරන්නාහු ''දේවයන් වහන්ස, ශෝක කිරීමෙන් රාජ්‍ය තුන ලැබිය හැකිදැ''යි කීහ. 'දරුව, නො හැකිය'' යි රජ කීය. ''එසේ නම් නුඹ වහන්සේ කුමට ශෝක කරන්නාහු ද? දේවයන් වහන්ස, සියලු වස්තූන් හා තමාගේ ශරීරයත් සැම දෙනා විසින් ම හැර යා යුතු ය. රාජ්‍ය සතරක් ලබා ගෙන ඔබ වහන්සේට එක වර බත් තලි සතරක් නො වැළඳිය හැකි ය. යහන් සතරක නො සැතපිය හැකිය. වස්ත්‍ර ජෝඩු සතරක් නො හැඳිය හැකිය. තෘෂ්ණාවට වසඟ නො විය යුතුය. තණ්හාව වැඩුණ හොත් සතර අපායෙන් මිදෙන්නට නො ලැබෙන්නේ ය. මෙසේ රජුට අවවාද කොට ධර්ම දේශනා කිරීම් වශයෙන් මේ ගාථා කීහ.

1. කාමං කාමයමානස්ස - තස්ස චේතං සමිජ්ඣති.
අද්ධා පීතිමනෝ හෝති - ලද්ධා මච්චෝ යදිච්ඡති.

2. කාමං කාමයමානස්ස - තස්ස චේතං සමිජ්ඣති
තතෝ නං අපරං කාමේ - ඝම්මේ තණ්හාව වින්දති.

3. ගවං ච සිංගිනෝ සිංගං - වඩ්ඪමානස්ස වඩ්ඪති
ඒවං මන්දස්ස පෝසස්ස - බාලස්ස අවිජානතො,
භියෝ්‍යා තණ්හා පිපාසා ච - වඩ්ඪමානස්ස වඩ්ඪති.

4. පඨව්‍යා සාලි යවකං - ගාවස්සං දසපෝරිසං,
දත්වාපි නාල මේතස්ස - ඉති විද්වා සමං චරේ

5. රාජා පසය්හ පඨවිං විජේත්වා
සසාගරන්තං මහිමාවසන්තෝ,
ඕරං සමුද්දස්ස අතිත්තරූපෝ
පාරං සමුද්දස්සපි පත්ථයේථ

Non-commercial distribution

6. යාව අනුස්සරං කාමේ - මනසා තිත්ති නාජ්ඣගා
තතෝ නිවත්තා පටිකම්ම දිස්වා
තේ වේ තිත්තා යේ පඤ්ඤාය තිත්තා

7. පඤ්ඤාය තිත්තිනං සෙට්ඨං - න සො කාමේහි කප්පති
පඤ්ඤාය තිත්තිනං පුරිසං - තණ්හා න කුරුතේ වසං

8. අපචිනේථෙව කාමානි - අප්පිච්ඡස්ස අලෝලුපෝ,
සමුද්දමත්තෝ පුරිසෝ - නසෝ කාමෙහි තප්පති.

9. රථකාරෝව චම්මස්ස - පරිකන්තං උපාහනං
යං යං වජති කාමානං - තං තං සම්පජ්ජතේ සුඛං
සබ්බඤ්ච සුඛමිච්ඡෙය්‍ය - සබ්බකාමේ පරිච්චජේ

**තේරුම:**

1. කාමයන් කැමති වන්නහුට ඉදින් ඒ අදහස මුදුන් පත් වී නම් බලාපොරොත්තු වූ කාමයන් රිසි සේ ලබා ප්‍රීති සිත් ඇත්තේ වේ.

2. කාමයන් කැමති වන්නහුට ඉදින් ඔහුගේ අදහස සමෘද්ධ වී නම් ඔහුට ග්‍රීෂ්ම කාලයේ පවස වැඩෙන්නාක් මෙන් කාම තණ්හාව වැඩේ.

3. වස්සාගේ ශරීරය වැඩෙත් ම ඒ අනුව අං වැඩෙන්නාක් මෙන් ධර්මය නො දන්නා වූ අඥ වූ බාල පුද්ගලයාට කාම තණ්හා කාම පිපාසාවෝ කාමයන් ලැබෙත් ලැබෙත් ම වැඩෙන්නා හ.

4. ඉදින් රාජ්‍ය තුනක් ලබා දීමට පැමිණි ඒ තරුණයා අවිඤ්ඤාණක සවිඤ්ඤාණක සියලු ධනය හා මුළු පොළව ලබා දී ගිය ද තෘෂ්ණා වශික පුද්ගලයා සෑහීමට පත් නො වන්නේය. එබැවින් නුවණැත්තේ ඒ තණ්හාව සන්සිඳවා ගන්නේ ය.

5. ඉදින් රජ තෙමේ මුළු පොළව දිනා ගෙන සාගරය කෙළවර කොට ඇති පොළවට අධිපතිව වාසය කරන්නේ සමුද්‍රයෙන් මෙතරින් පමණක් සෑහීමකට පත් නො වී සමුද්‍රයෙන් එතෙර අත් කර ගැනීමට ද බලාපොරොත්තු වන්නේ ය.

Non-commercial distribution

6. මහරජ, මිනිසා බොහෝ කාමයන් ලැබ බොහෝ කාමයන් ගැන සිතා තෘප්තියක් නො ලබන්නේ ය. ඇතය යි සෑහීමට පත් නොවන්නේ ය. යමෙක් කාමයන් ගැන සිතීම නවත්වා කයින් ද කාමයන් ගෙන් බැහැරව කාමයන් ගේ ආදීනවය නුවණින් දැන තෘප්තියට පත් වූවාහු නම් ඔව්හු ම තෘප්තියට පත් වූවෝ ය.

7. මහරජ, ප්‍රඥාවෙන් තෘප්තියට පත් වීම ශ්‍රෙෂ්ඨය. හෙතෙමේ කාමයන් නිසා නො තැවෙන්නේය. ප්‍රඥාවෙන් තෘප්තියට පත් පුරුෂයා තෘෂ්ණාව ස්වවශයට නො ගන්නේ ය.

8. තණ්හාවන් දුරු කරන්නේ ය. අල්පේච්ඡ වන්නේ ය. ලොල් නොවන්නේ ය. මහත් වූ ද ගින්නකින් සමුද්‍රය නො තැවෙන්නාක් මෙන් සමුද්‍රය බඳු නුවණැති පුරුෂ තෙමේ කාමයන් ගෙන් නො තැවෙන්නේ ය.

9. පාවහන් තනන කම්කරුවා හමෙහි නො මනා තැන් කපා ඉවත් කළ පමණින් යහපත් පාවහනක් ඇති වන්නේ ය. එමෙන් යම් යම් පමණකට කාමයන් බැහැර කරන ලද්දේ නම් ඒ ඒ පමණට ඔහු ගේ කාය කර්මාදිය යහපත් වීමෙන් පුද්ගලයා සුඛිත වන්නේ ය. ඉදින් සර්ව සම්පූර්ණ සුඛයක් කැමැත්තේ නම් සියලු කාමයන් පරිත්‍යාග කරන්නේ ය. අත් හරින්නේ ය.

මේ ගාථා ඇසීමෙන් මහා වෛද්‍යයන්ට සුව නො කළ හැකි වූ රජුගේ රෝගය සුව විය. බෝසතාණන් වහන්සේට ඒ ගාථා කීමේදී කාමයන් එපා වී ධ්‍යාන ලබා ගත හැකි විය. රජතුමා මහා වෛද්‍යයන්ට සුව කළ නුහුණු රෝගය මේ මාණවකයා ඔහු ගේ නුවණින් සුව කළේ යයි ඉමහත් සතුටට පැමිණ, බෝසතුන් අමතා "ඔබගේ ගාථා ඉතා යහපත් ය. එක් එක් ගාථාවක් දහස බැගින් අගනේ ය. මහා බ්‍රහ්මය, මේ අට දහස පිළිගනුව"යි කීයේ ය. එය ප්‍රතික්ෂේප කොට තමන් ලත් ධ්‍යාන බලයෙන් අහසින් හිමවතට ගොස් පැවිදි ව ධ්‍යාන සුවයෙන් කල් යවා බ්‍රහ්මලෝක පරායණ වූහ. මේ ජාතක පාලියේ ද්වාදශක නිපාතයේ **කාම ජාතකය** ය.

ඇති සැටියෙන් ලද සැටියෙන් සතුටු නො වන පැවිද්ද දයකයන්ට හා ආචාර්‍යෝපාධ්‍යායයන්ට අප්‍රිය වේ. ගිහියා ද

Non-commercial distribution

මාපියාදීන්ට අප්‍රිය වේ. ඒ අධික තණ්හාව නිසා සමහර විට ඔවුනට ලැබෙන දෙයත් නැති වී යන්නේ ය.

**අසම්පජඤ්ඤතා**

සංස්කාරයන්ගේ නියම ආකාරය දැනීමට කළ යුත්ත නො කළ යුත්ත පින් පව් දැනීමට නො සමත් බව **අසම්පජඤ්ඤතා** නම් වේ. අවිද්‍යාවය මෝහය කියනුයේ ද එයට ම ය. බාලයෝ යයි කියනුයේ ද අසම්පජඤ්ඤතා නම් වූ ඒ මෝහය අධික අයට ය. ලොවට නොයෙක් විපත් පැමිණෙන්නේ බාලයන්ගෙනි. බාලයන් ඇසුරු කරනුවන්ට ඔවුන්ගෙන් නොයෙක් විපත් පැමිණේ. එබැවින් “අසේවනා ච බාලානං” යනුවෙන් බාලයන් සේවනය නො කිරීම මංගලයකැයි මංගල සූත්‍රයෙහි වදාරා ඇත්තේ ය. මහ බෝසත් **අකීර්ති පණ්ඩිතයන්** වහන්සේ බාලයා නොදැක සිටීමටත්, බාලයාගේ ආරංචියක් වත් නො අසා සිටීමටත්, බාලයා හා කථා කරන්නට නො ලැබීමටත් සක්දෙව් රජුගෙන් වරයක් ඉල්ලූ බව ජාතක පොතෙහි දැක් වේ. සක්දෙව් රජ “ඔබට බාලයා කිනම් අපරාධයක් කෙළේ ද ඔබ කුමක් නිසා බාලයා දක්නට නො කැමැත්තෙහි දැ”යි ඇසීය. එකල්හි අකීර්ති පණ්ඩිතයෝ තමන් බාලයා දක්නට නො කැමති කරුණු මෙසේ පැවසූහ.

අනයං නයති දුම්මේධෝ - අධුරායං නියුඤ්ජති
දුන්නයෝ සෙය්‍යයෝ සෝති - සම්මා වුත්තෝ පකුප්පති
විනයං සෝ න ජානාති - සාධු තස්ස අදස්සනං.

නුවණ නැති තැනැත්තේ අකාරණය කාරණය වශයෙන් ගන්නේ ය. නො යෙදිය යුත්තෙහි යෙදෙන්නේ ය. දුශ්ශීල කර්මාදි නො මනා දෙය ඔහුට උතුම් වේ. යමක් කරුණු සහිතව මැනවින් කී කල්හි කිපෙයි. හේ විනය නො දන්නේ ය. එබැවින් ඔහු නො දැකීම යහපත් ය යනු එහි තේරුම ය.

අවවාද තේරුම් ගැනීමට තරම් නුවණක් නැති කරුණාවෙන් කරන යහපත් අවවාදය නො පිටට පිළිගෙන කිපෙන බාලයන්ට අවවාද කිරීම ද අන්තරායකර ය. සමහර විට මාපියන්ට ගුරුවරුන්ට බාලයන් ගෙන් නොයෙක් විපත් පැමිණේ. මේ බුදු

Non-commercial distribution

සසුනෙහි දෙවන බුදු කෙනකුන් වැනි **මහාකාශ්‍යප** මහරහතන් වහන්සේට එක්තරා බාල පැවිද්දකුගෙන් පැමිණි විපතක් **ජාතකට්ඨ කථාවෙහි** සඳහන් වේ. ඒ මෙසේ ය:

එක් කලෙක මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ රජගහ නුවර සමීපයේ අරණ්‍යයෙහි කුටියක විසූහ. කුඩා දෙනමක් උන් වහන්සේට උවටැන් කළහ. ඉන් එක් නමක් දුර්වචයෙකි. ඔහු අනිත් නම කරන දෑ තමා කළාක් මෙන් තෙරුන් වහන්සේට අඟවයි. අනික් නම තෙරුන් වහන්සේට මුව දෝනා පැන් පිළියෙල කර තිබූ කල්හි කපටි නම තෙරුන් වහන්සේ වෙත ගොස් පැන් පිළියෙල කර තැබූ බව දන්වයි. සුවච නම කලින් ම නැගිට තෙරුන් වහන්සේ ගේ මිදුල හැම ද තබයි. කපටි නම තෙරුන් වහන්සේ නික්මෙන වෙලාවට එහි ගොස් ඉදලක් ගෙන ඒ මේ අත ගසා ඇමදීම තමා කළාක් මෙන් අඟවයි. සුවච නම තෙරුන් වහන්සේට නෑමට උණු පැන් පිළියෙළ කර තැබූ කල්හි කපටි නම තෙරුන්ට නෑමට ආරාධනා කරයි. එක් දවසක් වත් කරන නම "මේ කපටියාගේ ක්‍රියාව ප්‍රකට කරවමි"යි සිතා ඔහු වළඳා නිදන වෙලාවෙහි තෙරුන් වහන්සේට නෑමට පැන් උණු කොට ඒවා නාන ගෙයි පිටිපස තබා උණු කරන සැළියෙහි දිය ස්වල්පයක් තබා නිශ්ශබ්ද ව සිටියේය. කපටි නම සැළියෙන් දුම් දමනු දැක පැන් පිළියෙල කර ඇතැයි සිතා තෙරුන් වහන්සේ වෙත ගොස් නෑමට ආරාධනා කෙළේය. තෙරුන් වහන්සේ ඔහු ද සමග එහි වැඩම කළහ. නාන ගෙහි පැන් නොතිබිණි. තෙරුන් වහන්සේ පැන් කොහි දැයි ඇසූ කල්හි ඔහු උඳුන මත ඇති සැළිය වෙත ගොස් පැන් ගැනීමට කිණිස්ස සැළියට දැමීය. පැන් එහි නොතිබිණි. කපටි නමට කරන්නට දෙයක් නැති විය. අනික් නම පැමිණ පිටිපස තුබූ පැන් ගෙනැවිත් තෙරුන් වහන්සේට නෑමට පිළියෙල කළේ ය. කපටි නමගේ වැඩේ තෙරුන් වහන්සේ ට දැනිණ. තෙරුන් වහන්සේ සවස් කාලයේ තමන් වෙත පැමිණි කල්හි "ඇවැත්නි, පැවිද්ද විසින් තමා කළ දෙයක් ම කෙළෙමි යි කිය යුතුය. නොකළ දෙයක් කෙළෙමි යි කීම සම්පජාන මුසාවාදයක් ය. මතු මෙබඳු දේ නො කරව"යි අවවාද කළහ. ඔහු එයින් කිපී පසුදින තෙරුන් වහන්සේ සමග පිණ්ඩපාතය පිණිස නො ගියේය. ඔහු තෙරුන් වහන්සේට උපස්ථාන කරන ගෙයකට

Non-commercial distribution

ගොස් තෙරුන් වහන්සේ අසනීපව විහාරයෙහි ම වැඩ සිටින බව කියා තෙරුන් වහන්සේට මේ මේ දේ වුවමනාය කියා තමාට වුවමනා දේ ලබාගෙන අන් තැනකට ගොස් වළඳා විහාරයට ආයේ ය. පසු දින තෙරුන් වහන්සේ පිණ්ඩපාතය පිණිස ඒ ගෙට වැඩම කළහ. ඒ ගෙයි වැසියෝ තෙරුන් වහන්සේ ගෙන් සුවදුක් විචාරා ඊයේ සිදු වූ දේ උන් වහන්සේට සැල කළහ. තෙරුන් වහන්සේ තුෂ්ණීම්භූතව වළඳා විහාරයට වැඩම කොට එදින සවස් කාලයේ ද කපටි නමට අවවාද කළහ. ඔහු තෙරුන් වහන්සේ කෙරෙහි කිපී හොඳ වැඩක් කරමියි සිතා පසුදින තෙරුන් වහන්සේ ගමට පිඩු පිණිස වැඩම කළ කල්හි භාජන සියල්ල බිඳ දමා තෙරුන් වහන්සේ වෙසෙන කුටියට ද ගිනි තබා පලා ගියේ ය. මේ මෝඩයාට අවවාද කිරීමෙන් සිදු වූ දෙය ය. කපටි පැවිද්ද ඒ පාපයෙන් වියළී ගිය ශරීරයෙන් ප්‍රේතයකු මෙන් ජීවත් වී මරණින් පසු අවීචි මහ නරකයෙහි උපන්නේ ය.

**මහිච්ඡතා** නමැති ක්ලේශය යට ඒකක නිර්දේශයේ විස්තර කර ඇත.

## 85. අහිරිකං 86. අනොත්තප්පං 87. පමාදො

මේ ත්‍රිකයට අයත් අහිරික අනොත්තප්පයන් යට ද්විකනිර්දේශයේ විස්තර කර ඇත. පමාදය ඒකක නිර්දේශයේ විස්තර කර ඇත්තේ ය.

## 88. අනාදරියං 89. දෝවචස්සතා 90. පාපමිත්තතා

මාපියන් ගුරුවරුන් විසින් කරන ලද අවවාදයට අනුශාසනයට අනාදර කරන බව සමච්චල් කරන බව **අනාදරිය** නම් වේ. ඇතැම් ශිෂ්‍යයෝ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් විසින් අවවාද වශයෙන් යමක් කී කල්හි ඔය පරණ අදහස් මේ කාලයට ගැලපෙන්නේ නැත යනාදීන් අවවාදයටත් ගුරුන්ටත් අනාදර කරති. ඇතැම් දරුවෝ ද මාපියන් යමක් කී කල්හි මහළු අයගේ ඔය පරණ

Non-commercial distribution

අදහස් මේ කාලයට ගැලපෙන්නේ නැත. කාලයේ සැටියට රටේ සැටියට අප හැසිරෙන්න ඕනෑය කියමින් අවවාදයට අනාදර කරති. ඒ **අනාදරිය** නම් ක්ලේශය ය. **දෝවචස්සතා පාපමිත්තතා** යන දෙක දුක නිර්දේශයේ විස්තර කර ඇත්තේ ය.

## 91. අස්සද්ධියං 92. අවදඤ්ඤුතා 93. කෝසජ්ජං

බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය විශ්වාස නො කරන බව නො පිළිගන්නා බව **අස්සද්ධිය** නම් වේ. එනම් ශ්‍රද්ධාව නැති බවය. මෙය ඉතා හානිකර අනර්ථදයක ක්ලේශයකි. ශ්‍රද්ධාව නැති පුද්ගලයා අත් නැති මිනිසකු වැනිය. පියාපත් නැති පක්ෂියකු වැනිය. සොඬ නැති ඇතකු වැනි ය. ලෝකයේ බුදු කෙනකුන් පහළ වන්නේ කලාතුරකිනි. බුද්ධශූන්‍ය කල්ප කෝටි ගණනින් ඉක්ම යන්නේ ය. බුදු කෙනකුගේ ලොව පහළ වීම සියල්ල ඇති කප් රුකක් පහළ වීම වැනි ය. සියල්ල වෙළඳාමට තබා ඇති වෙළඳ සැලක් විවෘත වීම වැනි ය. බුදුන් වහන්සේ විසින් විවෘත කරන ලද ඒ වෙළඳ සැලෙහි අන් තැනකින් ලබා ගත නොහෙන බොහෝ සම්පත් ඇත්තේ ය. එහි මනුෂ්‍ය සම්පත් දේව සම්පත් බ්‍රහ්ම සම්පත් නිර්වාණ සම්පත් යන සියල්ල ඇත්තේ ය. ශ්‍රද්ධාව නැතියවුන්ට කලාතුරකින් පහළ වන ඒ වෙළඳ සැළින් කිසිවක් ලැබිය නො හැකිය. ඒවා ලැබීමට වුවමනා ධනය නම් ශ්‍රද්ධා ධනය ය.

**ආයුං ආරෝගතා වණ්ණං සග්ගං උච්චාකුලීනතං**
**අසංඛතඤ්ච අමතං අත්ථි සබ්බාපණේ ජිනේ.**
**අප්පේන බහුකේනාපි කම්මමූලෙන ගය්හති**
**සද්ධාමූලෙන කිණිත්වා සධනා හෝථ භික්ඛවෝ.**

(මිළින්ද පඤ්හ)

බුදු සසුනෙන් ලැබිය හැකි ප්‍රයෝජනය ලැබීමට, දෙව් මිනිස් සම්පත් ලැබීමට, නිවන් සම්පත් ලැබීමට අත්‍යවශ්‍ය දෙය ශ්‍රද්ධාව ය. එය සෑමට වුවමනා සෑම දෙනා විසින් ම ඇති කර ගත යුතු උතුම් ගුණයෙකි. බෞද්ධයකුට තිබිය යුතු ප්‍රධාන

Non-commercial distribution

ගුණය ය. බුදු දහමෙහි එයට දී ඇත්තේ ඉතා උසස් තැනෙකි. සප්තායර්‍ය ධනය දේශනය කිරීමේ දී මුලට ම ගෙන ඇත්තේ සද්ධා ධනය ය. ඉන්ද්‍රිය දේශනයේ දී මුලට ම ගෙන ඇත්තේ සද්ධින්ද්‍රිය ය. බලදේශනයේදී මුලට ම ගෙන ඇත්තේ සද්ධා බලය ය. ශ්‍රමණ ප්‍රතිපදව දක්වන සූත්‍රවල මුලට ම ගෙන ඇත්තේ ද ශ්‍රද්ධාව ම ය. "සඩා බීජං" යනුවෙන් ශ්‍රද්ධාව සැපසම්පත්වලට බීජයකැයි ද, සද්ධීධ වීත්තං පුරසස්ස සෙට්ඨං" යනුවෙන් ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ ධනයකැයි ද, "සද්ධාය තරති ඕඝං" යනුවෙන් සද්ධාව කරණ කොට සංසාරෞඝයෙන් එතරවේය යි ද, "සද්ධා හත්ථෝ මහා නාගෝ" යනුවෙන් ශ්‍රද්ධාව අතකැයි ද බුදුන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය. මහා ප්‍රාඥ වූ අප මහ බෝසතාණන් වහන්සේ විසින් ද ශ්‍රද්ධාව මුල් කරගෙන ම ක්‍රියා කළ බව **මහා සච්චක සූත්‍රයෙහි** එන "න ඛෝ ආළාරස්සේව කාලාමස්ස අත්ථි සද්ධා මය්හම්පත්ථි සද්ධා" යනාදි පාඨ වලින් පෙනේ. බුදු රජාණන් වහන්සේ විසින් අනේකාකාරයෙන් වර්ණනා කරන ලද උසස් ගුණ ධර්මයක් වන මේ ශ්‍රඩාව ඇතැම් උගත්තු ඇතැම් පඬිවරු මෝඩයන් ගේ දෙයක් ලෙස පහත් කර කථා කරති. එසේ කථා කරන්නේ පණ්ඩිත බව නිසා නොව ඔවුන්ගේ මෝඩකම නිසාය යි කිය යුතු ය. එසේ කථා කරන අය කාලාම සූත්‍රය වරදවා තේරුම් ගෙන ඒවා කියා අන්‍යයන් ද මුළා කරති.

සත්ත්වයනට සංසාරයක් ඇති බව, පින් පව් ඇති බව, පින් පව් වල විපාක ඇති බව, සත්ත්වයන් පින් පව් අනුව සුවදුක් ලබන බව, අපේ ඉන්ද්‍රියයන්ට අසු නො වන සත්ත්වයන් හා වස්තූන් ඇති බව, අපාය දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝක ඇති බව, ධ්‍යානාභිඥා ඇති බව, මාර්ග ඵල ඇති බව, නිර්වාණය ඇති බව යන මේවා සාමාන්‍ය මනුෂ්‍ය ඥානයෙන් නො දත හැකිය. ඒ කරුණු දත හැක්කේ සාමාන්‍ය මනුෂ්‍ය ඥානය ඉක්මවා උත්තරීතර ඥානයක් ලබා ඇති අයට ය. බුදුන් වහන්සේ එබඳු උත්තරීතර ඥානයක් ලබා ඇති බැවින් උන් වහන්සේට සියල්ල ම දැකිය හැකිය. උත්තරීතර ඥානය ලබා ඇති ඇතැම් බුද්ධ ශ්‍රාවකයෝ ද වෙති. ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදි ඒ උත්තම පුද්ගලයන්ට ඉහත කී කරුණු දත හැකිය. ඉහත කී කරුණු වලින් යම්කිසි ප්‍රමාණයක් දැකීමට

Non-commercial distribution

සමත් නුවණ ලබා ඇති බාහිර තවුසෝ ද වූහ. උත්තරීතර ඥානයක් නැති සාමාන්‍ය ජනයා විසින් ඒ නුවණ ලබා ඇති උත්තම පුද්ගලන්ගේ කීම පිළිගත යුතු ය. එසේ පිළිගැනීම ශ්‍රද්ධාවය. ඒ උත්තම පුද්ගලයන් විසින් පවසන ලද ධර්මය තමන්ට නො දැනෙන නො පෙනෙන නිසා ප්‍රතික්ෂේප කිරීම ජාත්‍යන්ධයකු ලෝකයේ වර්ණ නැතැය යි කියන්නාක් මෙනි. තමාට නො දැනෙන නො පෙනෙන පමණින් යමක් ප්‍රතික්ෂේප කිරීම අනුවණ කමකි.

බුදුන් වහන්සේ ගේ ධර්මය නුවණැතියෝ උන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් පිළිගනිති. ඇතැමුන් කියන සැටියට තමාට දැනෙන දෙය හැර අනිකක් නො පිළිගන්නේ නම් කාහටවත් කිසි පිනක් කරන්නට නො ලැබෙන්නේ ය. බුදුන් වහන්සේ රජ පවුලක උපන් කෙනෙකි. මනුෂ්‍යයකුට ලැබිය හැකි සියලු සම්පත් අඩුවක් නැතිව උන්වහන්සේට තිබිණ. වුවමනාවට ද වඩා තිබිණ. ඒ සියල්ල හැර උන් වහන්සේ පැවිදි වූහ. සවසක් දුක් විඳ උන්වහන්සේ සියල්ල දත හැකි නුවණ ලබාගත්හ. උන්වහන්සේ හිස මුඩුකර ගෙන සිවුරු හැඳ පොරවා ගෙන පාත්‍රයක් ගෙන පිඬු සිඟා ජීවත් වෙමින් ගමින් ගම රටින් රට පා ගමනින් ම වැඩම කරමින් තමන් වහන්සේ විසින් අවබෝධ කර ගන්නා ලද ධර්මය ලෝකානුකම්පාවෙන් දේශනය කළහ. උන් වහන්සේ එසේ දහම් දෙසමින් හැසිරුණේ නැවත ගිහි වී ගිහි සම්පත් ලැබීමේ මගක් නැති නිසා නො වේ. උන් වහන්සේ සැම කල්හි ම විසූවේ රාජ්‍යය කිරීමට සුදුසු තත්වය ඇතිව ම ය. දිනක් උන් වහන්සේ දක්නට ගිය ත්‍රිවේදයේ පර තෙරට පැමිණ සිටි තුන්සියයක් මානවකයනට වේදය ඉගැන්වූ **සේල** නම් බ්‍රාහ්මණ පඬිවරයා උන් වහන්සේ දැක පිළිසඳර කථා කොට උන් වහන්සේගේ රූපය වර්ණනා කොට “මෙබඳු උත්තම රූපයක් ඇත්තා වූ ඔබ වහන්සේට මේ පැවිද්දෙන් කිනම් ප්‍රයෝජනයක් ද? ඔබ චක්‍රවර්ති රජ වීමට සුදුසු ය. ඔබ වහන්සේ චක්‍රවර්ති රජ වන්න” යයි කී බව **මජ්ඣිම නිකායේ සේල සූත්‍රයෙහි** සඳහන් වේ. එබඳු තත්ත්වයක් ඇති බුදුන් වහන්සේට තමන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කර ගෙන ඇති ධර්මයක් නැතිනම් දුක් විඳිමින් මහජනයා රවටමින් ඇවිදීමට කිසි කරුණක් නැත. නුවණැතියන්ට බුදුන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා උන්

Non-commercial distribution

වහන්සේගේ ධර්මය පිළිගැනීමට මේ කාරණය ම ප්‍රමාණවත් ය. බුදුරජාණන් වහන්සේට රජ පවුල් සිටු පවුල් ධනවත් බ්‍රාහ්මණ පවුල් වලින් පැවිදි වූ බොහෝ ශ්‍රාවකයෝ වූහ. මහකසුප් තෙරණුවෝ සත්විසි කෝටියක් ධනයට හිමි ව සිටි කෙනෙකි. යස තෙරුන් වහන්සේ බොහෝ ධනය ඇති සිටු පවුලක කෙනෙකි. උන් වහන්සේට තුන් සෘතුවට වාසය කිරීමට වෙන් වෙන් වූ ප්‍රාසාද තුනක් තිබිණ. වස්සාන සෘතුවේ දී පුරුෂයන්ගෙන් තොර ප්‍රාසාදයේ පොළොවෙහි පය නො තබා ම සුව විඳි කෙනෙකි. එබඳු උසස් බුද්ධ ශ්‍රාවකයෝ බොහෝ වූහ. බුදුරදුන් අසර්වඥ නම් ශාසනය හිස් නම් ඒ ශ්‍රාවකයෝ දුක් විඳිමින් බුදු සස්නෙහි රැඳී නො සිටින්නාහ. මේ කරුණු ද බුදුන් වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි විශ්වාසය තැබීමට වැදගත් හේතුහුය.

දන් දීමෙහි මේ මේ අනුසස් ඇත්තේ ය. එබැවින් දිය යුතුය. විහාරාරාම කළ යුතු ය. ළිං පොකුණු මාවත් තැනිය යුතුය. ගිලන් හල් ගිමන් හල් දහම් හල් පාසල් ආදිය තැනිය යුතුය යි සත්පුරුෂයන් විසින් කරනු ලබන අනුශාසනය තේරුම් ගත නොහෙන බව තේරුම් නොගන්නා බව **අවදඤ්ඤුතා** නම් වේ. තද මසුරන්ට ඒ අනුශාසනය නො වැටහේ. ඔවුහු ධනය රැස් කර තබා සමහර විට තුමූ ද ප්‍රයෝජනයක් නො ලබා මැරී ප්‍රේතත්වයට හෝ තිරශ්චීනත්වයට පැමිණෙති. කෝසජ්ජය යට විස්තර කර ඇත.

## 94. උද්ධච්චං 95. අසංවරො 96. දුස්සීල්‍යං

උද්ධච්චය යට විස්තර කර ඇත්තේ ය. ඉන්ද්‍රියේසු අගුත්තද්වාරතා යනුවෙන් යට විස්තර ඇත්තේ ද මේ අසංවරය ම ය.

චක්ඛුනා සංවරෝ සාධු, සාධු සෝතේන සංවරෝ,
ඝාණේන සංවරෝ සාධු, සාධු ජිව්හාය සංවරෝ,
කායේන සංවරෝ සාධු, සාධු වාචාය සංවරෝ,
මනසා සංවරෝ සාධු, සාධු සබ්බත්ථ සංවරෝ,
සබ්බත්ථ සංවුතෝ භික්ඛු, සබ්බ දුක්ඛා පමුච්චති.

(ධම්මපද)

Non-commercial distribution

ඇසට හමුවන ඉෂ්ට රූපයන් නිසා රාගය ඇතිවීමටත් අනිෂ්ට රූපයන් නිසා ද්වේෂය ඇතිවීමටත් රූපයන් නිත්‍ය සුඛ සුභ වශයෙන් ගෙන සම්මෝහය ඇතිවීමටත් ඉඩ හැරීම **අසංවරය** ය. එසේ නොවන පරිදි ආරක්ෂා වීම, චක්ෂුස වසා ගැනීම චක්ඛුන්ද්‍රිය සංවරය ය. එය යහපති. සෝත ඝ්‍රාණ ජිව්හා යන ඉන්ද්‍රියයන් සංවර කර ගැනීම ද යහපති. ප්‍රසාදකාය චෝපන කාය කියා කාය දෙකක් ඇත්තේය. ප්‍රසාද කාය යනු ශරීරයේ පැතිර ඇති ස්පර්ශය දැන ගැනීමට උපකාර වන කාය ප්‍රසාදය ය. චෝපන කාය යනු ගමනාදි ක්‍රියා සිදු කරන කය ය. ස්ප්‍රෂ්ටව්‍යයන් නිසා රාග ද්වේෂාදි ක්ලේශයන් ඇති වන්නට ඉඩ හැරීම ප්‍රසාද කායයේ අසංවරය ය. කෙලෙස් නූපදිනා පරිදි ආරක්ෂා වීම ප්‍රසාද කායද්වාරසංවරය ය. ප්‍රාණඝාතාදි කාය දුශ්චරිතයන් සිදුවන්නට ඉඩ හැරීම චෝපනකාය අසංවරය ය. ඉඩ නො හැරීම සංවරය ය. ප්‍රසාදකාය චෝපනකායයන් ආරක්ෂා කර ගැනීම යහපති. මුසාවාදාදි පව්කම් නොවන පරිදි වාක්ද්වාර සංවරය යහපති. අභිධ්‍යාදි පව්කම් සිදු නොවන පරිදි මනෝද්වාර සංවරය යහපති. සියලු තැන් සංවර කර ගත් භික්ෂු තෙමේ සියලු දුකින් මිදෙන්නේ ය.

සිල් නැති බව **දුස්සීල්‍ය** නම් වේ. සිල් නැති පුද්ගලයා දුශ්ශීල නම් වේ. ගෘහස්ත දුශ්ශීලයාය ශ්‍රමණ දුශ්ශීලයාය යි දුශ්ශීලයෝ දෙදෙනෙකි. පස්පව්න් නො වැළකෙන ගිහියා ගෘහස්ථ දුශ්ශීලයා ය. පරිජි වී ඇති පැවිද්ද ශ්‍රමණ දුශ්ශීලයා ය. ගිහියන් ප්‍රසිද්ධියේ ම පව් කරන බැවින් ඔවුන්ගේ දුශ්ශීලත්වය ප්‍රකට ය. පැවිද්දගේ දුශ්ශීලත්වය අප්‍රකට ය. පාවහන් යුවලක් ලාගෙන දිලිසෙන සිවුරක් පොරොවාගෙන මුදල් පසුම්බියක් අතේ ඇති ව ඇවිදින පැවිද්ද එයින් දුශ්ශීලයෙකැ යි නො කිය හැකි ය. දුඹුරු සිවුරක් පොරොවා පාත්‍රයක් උරයෙහි එල්වා කබල් කුඩයක් ගෙන බිම බලා ගමන් කරන පැවිද්ද එපමණකින්ම සිල්වතෙකැයි ද නො කිය හැකි ය. පැවිද්දන්ගේ දුශ්ශීලත්වය නොදැන දුශ්ශීලයෝය යි පැවිද්දන්ට ගරහා බොහෝ ගිහියෝ පව් සිදු කර ගනිති. පුදුමය නම් බොහෝ ගිහියන් තමන් දුශ්ශීලව හිඳ දුශ්ශීලයෝ ය යි පැවිද්දන්ට ගර්හා කිරීම ය. බොහෝ ගිහියෝ සුරාපානාදි පව්කම්

Non-commercial distribution

කරමින් ම ගිය ගිය තැනදී පන්සිල් සමාදන් වෙති. එයින් ඔවුහු සිල්වත් නො වෙති. සිල්වතාය කියයුත්තේ සැම කල්හි පඤ්ච දුශ්ශීලයෙන් වැළකී සිටින තැනැත්තාට ය. සත්ත්වයන් බොහෝ සෙයින් අපායට යන්නේ දුසිල්කම් නිසා ය. දුශ්ශීලත්වයෙහි ආදීනව බොහෝ ය. ශීලයේ අනුසස් ද එසේම ඉතා බොහෝය. ශීලය සම්බන්ධයෙන් **සීලව** මහරහතන් වහන්සේ විසින් ප්‍රකාශිත ගාථා පෙළක් මෙසේ ය.

1. සීලමේවිධ සික්ඛෙථ - අස්මිං ලෝකේ සුසික්ඛිතං
සීලං හි සබ්බසම්පත්තිං - උපනාමේති සේවිතං,

2. සීලං රක්ඛෙය්‍ය මේධාවී - පත්ථයානෝ තයෝ සුඛෙ
පසංසං පිත්තිලාභං ච - පෙච්ච සග්ගේ පමෝදනං.

3. සීලවා හි බහූ මිත්තෙ - සංයමේනාධිගච්ඡති,
දුස්සීලෝ පන මිත්තේහි - ධංසතේ පාපමාචරං.

4. අවණ්ණඤ්ච අකිත්තිඤ්ච - දුස්සීලෝ ලභතෙ නරෝ
වණ්ණං කිත්තිං පසංසඤ්ච - සදා ලභති සීලවා.

5. ආදි සීලං පතිට්ඨා ච - කල්‍යාණානඤ්ච මාතුකං
පමුඛං සබ්බධම්මානං - තස්මා සීලං විසෝධයෙ.

6. වේලා ච සංවරං සීලං - චිත්තස්ස අභිහාසනං,
තිත්ථඤ්ච සබ්බබුද්ධානං - තස්මා සීලං විසෝධයෙ.

7. සීලං බලං අප්පටිමං - සීලං ආවුධ මුත්තමං,
සීලමාභරණං සෙට්ඨං - සීලං කවචමබ්භුතං.

8. සීලං සේතුමහේසක්ඛෝ - සීලංගන්ධෝ අනුත්තරෝ
සීලං විලේපනං සෙට්ඨං - යේන වාති දිසෝදිසං,

9. සීලං සම්බලමේවග්ගං - සීලං පාථෙය්‍ය මුත්තමං,
සීලං සෙට්ඨෝ අතිවාහෝ - යේන යාති දිසෝදිසං.

10. ඉධෙව නින්දං ලභති - පෙච්චාපායේ ච දුම්මනෝ
සබ්බත්ථ දුම්මනෝ බාලෝ - සීලේසු අසමාහිතෝ.

Non-commercial distribution

11. ඉධෙව කිත්තිං ලභති - පෙච්ච සග්ගේච සුම්මනෝ
සබ්බත්ථ සුමනෝ ධීරෝ - සීලේසු සුසමාහිතෝ.

12. සීලමේව ඉධ අග්ගං - පඤ්ඤවා පන උත්තමෝ
මනුස්සේසු ච දේවේසු - සීලපඤ්ඤාණතෝ ජයං.

**තේරුම :**

1. මේ ලෝකයෙහි චාරිත්‍ර වාරිත්‍රාදි ශීලය ම අඛණ්ඩාදි භාවයෙන් මැනවින් පුරන්නේ ය. මැනවින් පවත්වන ලද ශීලය සකල ලෞකික ලෝකෝත්තර සම්පත්තීන් ගෙන දෙන්නේ ය.

2. ප්‍රශංසාව ප්‍රීතිය මතු ස්වර්ගයෙහි සතුටු වීම යන මේ සැප තුන පතන තැනැත්තේ ශීලය රකින්නේ ය.

3. සිල්වත් තැනැත්තේ තමාගේ හික්මීමෙන් බොහෝ මිත්‍රයන් ලබන්නේ ය. දුශ්ශීලයා වනාහි පව් කිරීමෙන් මිත්‍රයන් ගෙන් පිරිහෙන්නේ ය. ඔහුට මිත්‍රයෝ නැති වන්නාහ.

4. දුශ්ශීල මනුෂ්‍ය තෙමේ ඉදිරියෙහි ගර්හාව ද අපකීර්තිය ද ලබයි. සිල්වත් මනුෂ්‍ය තෙමේ ඉදිරියේ ප්‍රශංසාව ද කීර්තිය ද ලබයි.

5. ශීලය කුශල ධර්මයන්ගේ ආදියය. මූලයය. සියලු උත්තරීතර මනුෂ්‍ය ධර්මයන්ගේ ප්‍රතිෂ්ඨාව ය. සමථ විදර්ශනාදි කල්‍යාණ කර්මයන්ගේ මව ය. සකල කුශල ධර්මයන් ගේ පැවැත්මට දෙරටුව ය. එ බැවින් ශීලය පිරිසිදු කර ගන්නේ ය.

6. කාය දුශ්චරිතාදීන්ට ඉක්මවා යා නො හෙන බැවින් ශීලය වෙරළකි. කාය දුශ්චරිතාදීන්ගේ උත්පත්ති ද්වාරයන් වසන බැවින් සංවරයෙකි. සිත අතිශයින් සතුටු කරවන්නකි. සර්වඥ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රැත බුද්ධ යන සියලු බුදුවරයන් කෙලෙස් මල සෝදා ගන්නා තොටකි. එබැවින් ශීලය පිරිසිදු කර ගන්නේ ය.

7. ශීලය මාර සේනා මර්ධනයට අසදෘශ බලයෙකි. කෙලෙසුන් සිදීමට උතුම් අවියෙකි. ගුණ ශරීරය සැරසීමට ශ්‍රේෂ්ඨ ආභරණයෙකි. ආත්මාරක්ෂාවට සන්නාහයෙකි. සැට්ටයෙකි.

Non-commercial distribution

8. සංසාර මහෝඝයෙන් එතර වීමට ශීලය මහ බලය ඇති හෙයකි. ශීලය ප්‍රතිවාතයෙහි ද යන උතුම් සුවඳකි. ශීලය ශ්‍රේෂ්ඨ විලවුනෙකි. ශීල සුගන්ධය ඇත්තේ සකල දිශාවන්හි ම සුවඳ පතුරවයි.

9. ශීලය සංසාර මාර්ගයෙහි ගමන් කරන මගියාට උතුම් බත් මුලෙකි. සොරුන් විසින් පැහැර ගත නොහෙන හෙයින් අග්‍ර වූ මාර්ගෝපකරණයෙකි. ශීලය සත්ත්වයා කැමති තැන්වලට පමුණුවන වාහනයෙකි. සිල්වතා එයින් කැමති කැමති දිශාවට යන්නේය.

10. ශීලයෙන් නො හික්මුණු තැනැත්තේ මේ ලෝකයේ දී නින්ද ලබයි. මරණින් මතු අපායෙහි ඉපදී නො සතුටු සිත් ඇත්තේ වන්නේය. මෙලොව පරලොව සැම තැනම නො සතුටු සිත් ඇත්තේ වන්නේය.

11. ශීලයෙන් හික්මුණු නුවණැත්තේ මෙලොවෙහි කීර්තිය ලබයි. මරණින් මතු ස්වර්ගයෙහි ඉපද සතුටු වෙයි. මෙලොව පරලොව දෙක්හි සැම තන්හි සතුටු වෙයි.

12. මේ ලෝකයෙහි ශීලය ම අග්‍රය. ප්‍රඥාවන්තයා වනාහි උත්තමය. මිනිස් ලොවෙහි ද දෙව්ලොවෙහි ද ශීල ප්‍රඥා දෙකින් ජය ගන්නේ ය.

## 97. අරියානං අදස්සන කම්‍යතා
## 98. සද්ධම්මං අසෝතු කම්‍යතා
## 99. උපාරම්භචිත්තතා

"අරියානං අදස්සන කම්‍යතා" යනු ආර්‍ය්‍යයන් නො දකිනු කැමති බව ය. නො කළ යුත්තෙහි නො යෙදෙන කළ යුත්තෙහි උත්සාහයෙන් යෙදෙන ගරු බුහුමන් පූජා සත්කාර කිරීමට සුදුසු පුද්ගලයෝ ආර්‍ය්‍යයෝ ය. ලොවුතුරා බුදුවරු ද පසේ බුදුවරු ද සතර ආර්‍ය්‍යඵලයෙන් අතුරෙන් යම් කිසිවකට පැමිණ ඇති ගිහි වූ ද, පැවිදි වූ ද බුද්ධ ශ්‍රාවකයෝ ද

Non-commercial distribution

ආයර්‍ය්‍යයෝ ය. ආයර්‍ය්‍යයන් හැඳින ගැනීම දුෂ්කර ය. ආයර්‍ය්‍යයෝ තමන්ගේ ආයර්‍ය්‍ය භාවය ප්‍රකාශ නො කෙරෙති. ඔව්හු එය දුගියෙකු නිධානයක් ආරක්ෂා කරන්නාක් මෙන් අන් කිසිවකුට නො දන්වා ආරක්ෂා කරති. ඔවුන් ඇසුරු කරන්නවුන්ට වුවද ඔවුන්ගේ ආයර්‍ය්‍යභාවය නො දත හැකි ය. ආයර්‍ය්‍යයන් දැන ගැනීමේ දුෂ්කරත්වය පිළිබඳ ව **ධම්මසංගණී අට්ඨ කථාවේ** දක්වා ඇති කථාවක් මෙසේ ය :-

සිතුල්පව් වෙහෙර වැඩ විසූ රහතන් වහන්සේ කෙනකුන්ට එක් බුඩ්ඪපබ්බජිත භික්ෂු නමක් උපස්ථාන කරමින් විසුවේය. දිනක් ඒ භික්ෂුව තෙරුන් වහන්සේ සමග පිඬු පිණිස හැසිර තෙරුන් වහන්සේගේ පාසිවුරු ගෙන තෙරුන් වහන්සේ ගේ පසුපසින් එන්නේ "ස්වාමීනි, ආයර්‍ය්‍යයෝ නම් කෙබන්දෝදැ"යි විචාළේය. එකල්හි තෙරුන් වහන්සේ "ඇවැත්නි, ඇතැම් මහල්ලෙක් ආයර්‍ය්‍යයන්ගේ වත්පිළිවෙත් කරමින් පා සිවුරු ගෙන එක් ව හැසිරෙන්නේ ද ආයර්‍ය්‍යයන් නො හැඳින ගන්නේය. ආයර්‍ය්‍යයන් හැඳින ගැනීම දුෂ්කරය" යි කීහ. එයින් ද මහලු භික්ෂු තෙමේ තෙරුන් වහන්සේගේ ආයර්‍ය්‍යභාවය තේරුම් නො ගත්තේ ය. මේ ඒ කථාව ය.

ධර්මයක් නැති ධර්මය නො දත් පව්කම්හි ඇලී සිටින අන්ධ පෘථග්ජන පුද්ගලයන්ට කිසි ලෙසකින් ආයර්‍ය්‍යයන් හැඳින ගත නො හැකිය. එබැවින් ඔවුනට ආයර්‍ය්‍යයන් නො දකිනු කැමැත්තක් ඇති වේ. මෙහි ආයර්‍ය්‍යයන් නො දකිනු කැමැත්තය යි කියන ලදුයේ ආයර්‍ය්‍යයන් දුටහොත් අහක බලා ගන්නා බව හෝ ඇස පියා ගන්නා බව හෝ ආයර්‍ය්‍යයන් ඇතය කියන තැනකට නොයන බව හෝ නො වේ. ආයර්‍ය්‍යයෝ ද, තරමකට ආයර්‍ය්‍ය ගුණ ඇති කළ්‍යාණ පෘථග්ජනයෝ ද පව්කම් වලින් වැළකී සිටිති. කුශල ක්‍රියාවෙහි යෙදෙති. තමන්ට හමුවන තමන් වෙත පැමිණෙන අයට ධර්මයෙන් අනුශාසනා කෙරෙති. ධර්මයක් නැති ධර්මය නොදත් පව්කම් හි ඇලී ධර්මයෙන් ඈත්ව සිටින පාප පුද්ගලයන්ට ප්‍රිය ඔවුන් ගේ ජාතියේ පව් කරන පුද්ගලයෝ ය. ධර්මයක් ඇති තමන්ට හමු වන්නවුන්ට ධර්මයෙන් අනුශාසනා කරන ආයර්‍ය්‍ය පුද්ගලයන් හා කළ්‍යාණ පෘථග්ජන පුද්ගලයන් ඔවුනට අප්‍රිය ය. ඒ උත්තම

Non-commercial distribution

පුද්ගලයන් ගේ අනුශාසනය ද ඔවුනට අප්‍රිය ය. එබැවින් පාපකාරීහු ඒ උත්තම පුද්ගලයන් වෙත යාමට ඔවුන් තමන් වෙත පැමිණීමට ඔවුන් හා එක්ව විසීමට මිත්‍රත්වයක් පැවැත්වීමට නො කැමැතියහ. මෙහි ආර්‍ය්‍යයන් නො දකිනු කැමති බවය යි කියන ලදුයේ එයට ය. සත්පුරුෂයන්ට ආර්‍ය්‍යයන් ප්‍රිය ය. ආර්‍ය්‍යයන් දකිනු සඳහා සත්පුරුෂයෝ **පාටලී පුත්‍ර බ්‍රාහ්මණයා** මෙන් රටින් රට පවා යන්නාහ. පාටලී පුත්‍ර බ්‍රාහ්මණයාගේ කථාව මෙසේ ය.

පාටලීපුත්‍ර නගරද්වාරයේ ශාලාවක හුන් බ්‍රාහ්මණයෝ දෙදෙනෙක් **කාලවල්ලි මණ්ඩපවාසී මහානාග** තෙරුන් වහන්සේ ගේ ගුණ අසා අප ඒ උත්තමයන් දක්නට යා යුතුය යි කථා කරගෙන ලක්දිව බලා එන්නට පිටත් වූහ. එක් බමුණෙක් අතරමග කලුරිය කෙළේ ය. ඉතිරි බමුණා මුහුදු තෙරට පැමිණ නැවකින් ලක්දිවට පැමිණ මහාතීර්ථපට්ටනයෙන් ගොඩ බැස අනුරාධ-පුරයට ගොස් කාලවල්ලි මණ්ඩපය කොහි දැ යි අසා රෝහණ ජනපදයේ යයි මිනිසුන් කී කල්හි එහි ගොස් චුල්ලනගර නම් ගමෙහි ගෙයක නවාතැන් ගෙන තෙරුන් වහන්සේට පිළිගැන්වීමට දනය ද පිළියෙල කර ගෙන පසු දින උදෑසන තෙරුන් වහන්සේ වෙසෙන තැන අසා එහි ගොස් තෙරුන් වහන්සේ වැඩම කරනු දැක දුරදී ම වැඳ තෙරුන් වහන්සේ වෙත ගොස් උන් වහන්සේගේ පා අල්ලා වඳිමින් "ස්වාමීනි, නුඹ වහන්සේ උස්ය" යි කීය. නැවත ඔහු "ස්වාමීනි, නුඹ වහන්සේ ඉතා උස් නො වෙති. නුඹ වහන්සේගේ ගුණ නිල්වන් මහ සමුදුරට උඩින් ගොස් මුළු දඹදිව යට කෙළේය. මම පාටලීපුත්‍ර නගරයේ දී නුඹ වහන්සේගේ ගුණ ඇසීමි"යි කීය. ඔහු තෙරුන් වහන්සේට දන් පිළිගන්වා පා සිවුරු පිළියෙල කර තෙරුන් වහන්සේ සමීපයේ පැවිදිව උන්වහන්සේගේ අවවාදය පරිදි මහණ දම් පුරා දින කිහිපයකින් සියලු කෙලෙසුන් නසා අර්හත්වයට පැමිණියේ ය.

(මනෝරථපූරණී.)

**සද්ධම්මං අසෝතුකම්‍යතා** යනු සද්ධර්මය ඇසීමට නො කැමති බව ය. ලෝකෝත්තර ගුණ යෝගයෙන් ශෝභන වූ පුරුෂයෝ සත් පුරුෂයෝ ය. ඔවුහු නම් බුද්ධාදීහුය. බුද්ධාදීන්

Non-commercial distribution

විසින් දේශනය කරන ලද පුරුදු කරන ලද ලෝකානුකම්පාවෙන් දේශනය කරන ලද ධර්මය **සද්ධර්ම** නම් වේ. ඒ ධර්මය සියලු විෂ සියලු රෝග දුරු කරන උතුම් ඖෂධයෙකි.

යේ කේචි ඕසධා ලෝකේ - විජ්ජන්ති විවිධා බහූං
ධම්මෝසධ දසං නත්ථි - ඒතං පිවථ භික්ඛවෝ

(මිලින්ද පඤ්හ)

ලෝකයේ අනේකප්‍රකාර බොහෝ ඖෂධයෝ ඇත්තාහ. ධර්මය නමැති ඖෂධයට සමාන ඖෂධයක් නැත. මහණෙනි, ධර්මෞෂධපානය කරවිය යනු එහි තේරුම ය.

ඒ උත්තම ධර්මය අසා බොහෝ දෙන එය අනුව පිළිපැද දෙව් මිනිස් සැප ලබති. ජාති, දුඃඛයෙන් මිදෙති. ජරා දුඃඛයෙන් මිදෙති. ව්‍යාධි දුඃඛයෙන් මිදෙති. මරණ දුඃඛයෙන් මිදෙති. ශෝකපරිදේව දුඃඛදෞර්මනස්‍යයන්ගෙන් මිදෙති. පරම සුන්දර නිර්වාණසුඛය ලබති. බුඬ ධර්මයෙන් මිස අන් කිසි ධර්මයකින් විද්‍යාවකින් ශිල්පයකින් ශාස්ත්‍රයකින් සත්ත්වයාට සංසාර දුඃඛයෙන් නො මිදිය හැකි ය. ඇතැම් ධර්මයන් අනුව පිළිපැදීමෙන් දෙව් මිනිස් සැප ලැබිය හැකි ය. ධර්මය නො අසා ධර්මය නො දැන දුකින් නො මිදිය හැකි ය. ධර්මය නො දන්නෝ ධර්මයට ගරු නො කරන්නෝ ධර්මය අනුව නො පිළිපදින්නෝ සතර අපාය පුරවන්නෝ ය.

**උපාරම්භචිත්තතා** යනු අනුන් කරන හොඳ වැඩ වලට හා අනුන්ටත් චෝදනා ඉදිරිපත් කරන දෙස් නඟන සිත ඇති බව ය. උපාරම්භ චිත්තය ඇතියෝ අනුන් කොතරම් යහපත් වැඩක් කළත් එහි යම් කිසි දෙසක් දකිති. උපාරම්භ චිත්තයෙන් අනුන්ගේ වැඩ දෙස බලන්නවුන්ට එහි වරදක් පෙනෙන්නේ ය. මේ උපාරම්භ චිත්තය දේශපාලන පක්ෂවලට බැඳී සිටින අය අතර බෙහෙවින් දක්නා ලැබේ. එක් පක්ෂයකින් කොතරම් යහපත් දෙයක් කළ ද අනික් පක්ෂය එහි දෙස් දක්වයි. ඇතැම්හු උපාරම්භ චිත්තයෙන් දහම් ඇසීම් කරති. ඔවුනට ධර්මය අවබෝධ නො වේ. ධර්ම රසය නො ලැබේ. ධර්මය තේරුම් ගත හැකි වන්නේ ධර්ම රසය ලැබිය

Non-commercial distribution

හැකි වන්නේ උපාරම්භ චිත්තයෙන් තොරව ගෞරවයෙන් දහම් අසනුවන්ට පමණෙකි. මේ උපාරම්භය ධර්මය අසා එයින් යහපතක් සිදු කර ගැනීමට බාධාවෙකි.

"පඤ්චහි භික්ඛවේ ධම්මේහි සමන්නාගතෝ සුණන්තෝපි සද්ධම්මං අභබ්බෝ නියාමං ඔක්කමිතුං කුසලේසු ධම්මේසු සම්මත්තං. කතමේහි පඤ්චහි? මක්ඛී ධම්මං සුණාති මක්ඛපරියුට්ඨිතෝ උපාරම්භචිත්තෝ ධම්මං සුණාති රන්ධගවේසී ධම්මදේසකේ ආහත චිත්තෝ හෝති ඛීලජාතෝ, දුප්පඤ්ඤෝ හොති ජළෝ එලමූගෝ, අනඤ්ඤාතේ, අඤ්ඤාතමානී හෝති, ඉමේහි ඛෝ භික්ඛවේ පඤ්චහි ධම්මේහි සමන්නාගතෝ සුණන්තෝපි සද්ධම්මං අභබ්බෝ නියාමං ඔක්කමිතුං කුසලේසු ධම්මේසු සම්මත්තං."

(අංගුත්තර පඤ්චක)

**තේරුම :-**

මහණෙනි, අංග පසකින් යුක්ත වූයේ සද්ධර්මය අසන්නේ ද ලෝකෝත්තර මාර්ගයට පැමිණීමට අභව්‍ය වන්නේ ය. කවර අංග පසකින් ද යත්? ගුණමකු කම ඇතිව දහම් අසයි. දෙස් නගන සිත් ඇතිව දෙස් සොයමින් දහම් අසයි. ධර්ම දේශකයා කෙරෙහි ගැටුණු තද සිත් ඇතිව දහම් අසයි. නුවණ නැති මුවින් කෙළ ගලන මෝඩයෙක් වෙයි. නො දත් දෙය දතිමිය යන හැඟීම ඇත්තේ වෙයි. මහණෙනි, මේ පඤ්චාංගයෙන් යුක්ත වූයේ බණ අසන්නේ ද ලෝකෝත්තර මාර්ගයට නො පැමිණෙන්නේ වෙයි.

## 100. මුට්ඨසච්චං 101. අසම්පජඤ්ඤං 102. චේතසෝ වික්ඛෙපො

මුට්ඨසච්ච යනු සිහිය නැති බව ය. පමාද යන වචනයෙන් කියැවෙන්නේ ද එය ම ය. ලෝභාදි අකුශල ධර්මයන්ට ඇති වන්නට නො දී සිත කුශලයෙහි පවත්වන්නේ කායකොට්ඨාසාදියෙහි පවත්වන්නේ සතියෙනි. සතිය නැති වූ කෙණෙහි ම සිත යන්නේ අකුශල පක්ෂයට ය. සිහිය නැති බවය කියනුයේ රාගාදි අකුශල

Non-commercial distribution

ධර්මයන්ගේ පැවැත්මට ය. දුකින් මිදෙන්නට නම් නිතර ම සිහියෙන් විසිය යුතු ය. සතිය අත්‍යවශ්‍ය ධර්මයෙකි. එබැවින් බෝධිපාක්ෂික ධර්ම දේශනයේ දී සතිපට්ඨාන නාමයෙන් සතිය මුලට ම ගෙන ඇත්තේ ය. සතින්ද්‍රිය, සතිබල, සතිසම්බොජ්ඣංග, සම්මාසති, යන නම් වලින් දැක්වෙන්නේ ද මේ සතිය ය. මේ සතිය අකුශලයන් යටපත් කොට කුශලය මතු කර දෙන ධර්මයෙකි. එබැවින් නාගසේන ස්ථවිරයන් වහන්සේ මිලිඳු රජුට මෙසේ වදරා ඇත්තේ ය. "මහරජ සක්විති රජුගේ භාණ්ඩාගාරික තෙමේ උදය සවස රජු වෙත ගොස්, දේවයන් වහන්ස, නුඹ වහන්සේට ඇත්හු මෙපමණය. අශ්වයෝ මෙපමණය. රථ මෙපමණය. පාබල සෙනග මෙපමණය. අමුරන් මෙපමණය. රන් මෙපමණය. මේ සියලු සම්පත්තිය නුඹ වහන්සේ සිහි කරන සේක්වා" යි කියයි. "මහරජ එමෙන් ම මේ සතිය අකුශල ධර්මයන් යටපත් කරයි. මේ සතර සතිපට්ඨානයෝය. මේ සතර සම්‍යක් ප්‍රධානයෝය. මේ සතර ඍද්ධිපාදයෝ ය. මේ පස ඉන්ද්‍රියෝය. , මේ පස බලයෝය, මේ සත බෝධ්‍යංගයෝ ය. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගයය, මේ සමථය, මේ විදර්ශනාවය, මේ විද්‍යාවය, මේ විමුක්තියය, මේ ලෝකෝත්තර ධර්මයෝය" යි කුශල ධර්මයන් මතු කරයි. "මහරජ, මෙසේ සතිය මතු කර දෙන ලක්ෂණය ඇත්තේ ය. තව ද මේ සතිය අහිත ධර්මයන් බැහැර කරන ස්වභාව ඇත්තේ ද වේ. එබැවින් නාගසේන ස්ථවිරයන් වහන්සේ මෙසේ වදළහ. "මහරජ, චක්‍රවර්ති රජුගේ පරිනායක රත්නය, මොවුහු රජුට හිතයෝ ය, මොවුහු අහිතයෝය, මොවුහු උපකාරකයෝය, මොවුහු අනුපකාරකයෝ යයි රජුට හිතාහිතයන් දන්වන්නේ ය. හෙතෙමේ රජුට අහිතයන් බැහැර කරයි, හිතවතුන් ළං කරයි. මහරජ, එමෙන් සතිය මේ ධර්මයෝ හිතයෝය, මේ ධර්මයෝ අහිතයෝය, මේ ධර්මයෝ උපකාරකයෝය, මේ ධර්මයෝ අනුපකාරකයෝය යි හිතාහිත ධර්මයන්ගේ ස්වභාවය සොයයි. ඒවා දැන අහිත වූ ධර්මයන් දුරු කරයි. හිත ධර්මයන් ළං කරයි. මහරජ මෙසේ සතිය අනුග්‍රහ කරන ස්වභාව ඇත්තේ ය." මෙසේ දැක්වෙන පරිදි අතිශයින් උපකාරක ධර්මයක් වන මේ සතිය සැම කල්හි පවත්වා ගැනීමට උත්සාහ කළ යුතු ය.

Non-commercial distribution

චිත්ත ඵස්ස වේදනාදි නාම ධර්මයන් හා පඨවි ආපෝ තේජෝ වායෝ ආදි රූප ධර්මයන් ද වෙන් වෙන් වශයෙන් හැඳින ගැනීමට සමත් වන්නා වූ ද, ඒවායේ ලක්ෂණ වෙන් වශයෙන් හැඳින ගැනීමට සමත් වන්නා වූ ද, ඒවායේ සාධාරණ ලක්ෂණ වූ අනිත්‍ය ලක්ෂණය දුඃඛ ලක්ෂණය අනාත්ම ලක්ෂණය දැන ගැනීමට සමත් වන්නා වූ ද, දුක දුකට හේතුව දුක් නිවීම දුක් නිවීම වූ නිවනට පැමිණීමේ උපාය දැන ගැනීමට සමත් වන්නා වූ ද විශේෂ ඥානය **සම්පජඤ්ඤ** නම් වේ. සම්පජඤ්ඤය ඇති වීමට ඉඩ නො දෙන නාම රූප ධර්මයන් හා ඒවායේ ලක්ෂණ වසන මෝහය **අසම්පජඤ්ඤ** නම් වේ. අවිද්‍යාව යයි කියනුයේ ද මෙයට ම ය. සත්ත්වයන්ට සංසාරය දික් වන්නේ නැවත නැවත අපායෙහි වැටෙන්නට සිදුවන්නේ මේ ධර්මයන්ගේ ස්වභාවය වසන අවිද්‍යාව නිසා ය.

**චේතසෝ වික්ඛෙපෝ** යනු සිතෙහි නො සන්සුන් බව ය. අරමුණෙහි සිත සැලෙන දඟලන බව ය. උද්ධච්ච යයි කියනුයේ ද මේ ස්වභාවයටය. සිතට අරමුණ අමිහිරි වීම නිසා මේ සැලීම ඇති වේ. මෙය භාවනා කරන අයට සමාධිය ලැබීමට බාධා කරන ක්ලේශයෙකි. නීවරණයෙකි.

## 103. අයෝනිසෝමනසිකාරෝ
## 104. කුම්මග්ග සේවනා
## 105. චේතසෝ ලීනත්තං

කාරණයට නුසුදුසු වන පරිදි පිනෙන් පිරිහෙන පරිදි පව් වැඩෙන පරිදි වැරදි ලෙස සිතීම **අයෝනිසෝමනසිකාර** නම් වේ. දිළිඳුව අමාරුවෙන් ජීවත් වන්නෙක් මා කුමක් හෝ කොට ජීවත් විය යුතුය. දැහැමි රැකියාවක් නැති බැවින් මා සතුන් මැරීම හෝ කළ යුතුය. සොරකම් හෝ කළ යුතුය. මත්පැන් තනා විකිණීම හෝ කළ යුතු යයි සිතීම අයෝනිසෝ මනසිකාරය ය. ජීවත් වීම සඳහා යහපත් ක්‍රමයක් ගැන කල්පනා කිරීම යෝනිසෝ මනසිකාරය ය. අධර්මයෙන් පොහොසත් වීමට වඩා දිළිඳු බවම යහපතැයි සිතීම යෝනිසෝ මනසිකාරය ය. දැන් මා හට ධනය අඩු වී ගොස් ඇත. එබැවින් දන් දීම නැවැත්විය යුතු යයි සිතීම

Non-commercial distribution

අයෝනිසෝ මනසිකාරයය. දුප්පත් වුව ද ඇති සැටියකින් දීම කර ගෙන යන්නට සිතීම යෝනිසෝ මනසිකාර ය ය. මට ලැබෙන පඩිය මඳ නිසා අල්ලස් ගැනීම හෝ කළ යුතු යයි සිතීම අයෝනිසෝ මනසිකාරය ය. පිරිමසාගෙන ඇති සැටියකින් දැහැමින් ජීවත් වන්නට සිතීම යෝනිසෝ මනසිකාරය ය. පැවිද්දකු විසින් ලැබෙන ප්‍රත්‍යය මඳ නිසා සික පද කඩකරමින් නොමනා ලෙස ජීවත් වන්නට සිතීම අයෝනිසෝ මනසිකාරය ය. දුකසේ වුව ද දැහැමින් ජීවත් වන්නට සිතීම යෝනිසෝ මනසිකාරය ය.

**නාහං භික්ඛවේ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි. යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්තිං උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති. යථයිද, භික්ඛවේ අයෝනිසෝ මනසිකාරෝ. අයෝනිසෝ භික්ඛවේ මනසිකරෝතෝ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති. උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්ති.**

(අංගුත්තර එකක නිපාත)

**තේරුම :–**

"මහණෙනි, යමකින් නූපන් අකුසල ධර්මයෝ උපදිත් ද උපන් කුශල ධර්මයෝ පිරිහෙත් ද මහණෙනි, මේ අයෝනිසෝ මනස්කාරය යම්බඳු ද එබඳු අන් එක් ධර්මයකුදු මම නො දනිමි. මහණෙනි, කාරණයට අනුකූල නො වන පරිදි මෙනෙහි කරන්නහුට නූපන් අකුශල ධර්මයෝ වැඩෙති. උපන් කුශල ධර්මයෝ පිරිහෙති."

මේ සූත්‍රයෙහි උපන් කුශලයෝ පිරිහෙතියි වදාරා ඇත්තේ රූපාවචර අරූපාවචර කුශලයන් සඳහා ය. රූපාවචරාරූපාවචර ධ්‍යානයන් ලබා ඇතියෝ සමහර විට අයෝනිසෝ මනසිකාරය නිසා කෙලෙස් ඇති වී ධ්‍යානයෙන් පිරිහෙති. ඔවුහු ධ්‍යානයෙන් නො පිරිහී කලුරිය කළ හොත් ඒ කුශලයේ බලයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපදිති. ධ්‍යානයෙන් පිරිහුණ හොත් බ්‍රහ්මලෝකයෙහි නූපදිති. පිරිහුණු ධ්‍යාන කුශලයෙන් ඔවුනට අනාගත භව වලදී කිසි විපාකයක් නො ලැබේ. ඒ කුශලය සම්පූර්ණයෙන් ම විපාකය නැති තැනට පැමිණේ. ලෝකෝත්තර කුශලය කිසි කලෙක නො පිරිහේ. එහි විපාකය වූ ලෝකෝත්තර ඵලය එකෙණෙහි ම ලැබේ. ආර්‍යයෝ කිසි කලෙක ලෝකෝත්තර ඵලයෙන් නො

Non-commercial distribution

පිරිහෙති. කාමාවචර කුශලය ද සම්පූර්ණයෙන් නො පිරිහේ. අපර චේතනාව නරක් වීමෙන් එහි බලය හීන වේ. **අපුත්තක සිටු** ගේ කථාව එයට නිදසුනෙකි.

සැවැත් නුවර බොහෝ ධනය ඇති සිටුවරයෙක් විය. ඔහුට රන් ම ලක්ෂ සියයක් පමණ තිබිණි. ප්‍රමාණයක් නැති තරමට රිදී තිබිණි. එහෙත් ඔහු ඒ ධනයෙන් ප්‍රයෝජනයක් නො ගත්තේ ය. ඔහු අනුභව කළේ කාඩි සහ සුනු සහල් බත ය. ඇන්දේ කැබලි තුනක් එක් කොට මසා ගත් හණ රෙදිය. ගමන් කළේ කබල් කරත්තයකිනි. ඔහුට දූ දරුවෝ නුවූහ. මරණින් පසු හිමියකු නැති ඒ ධන සම්භාරය කොසොල් රජතුමා රජ ගෙට ගෙන්වා ගෙන අපුත්තක සිටු ගේ පුවත බුදුන් වහන්සේට සැළ කෙළේය. බුදුන් වහන්සේ රජතුමාට අපුත්තක සිටුගේ අතීත කථාව වදළ සේක. ඒ මෙසේය :

එක් දවසක් **පදුමවතී දේවියගේ** තුන්වන පුත් වූ **තරගසිඛී** නම් පසේ බුදුන් වහන්සේ ගන්ධමාදන පර්වතයේ සමවත් සුවයෙන් වැස අලුයම් වේලෙහි **අනවතත්ත** විලෙන් මුව සෝද **මනෝසිලා** තලයෙහි සිට හැඳ කායබන්ධනය බැඳ පාසිවුරු ගෙන අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැදී ඍද්ධියෙන් අහසට නැඟ ගොස් නගරද්වාරයේදී අහසින් බැස නගරවාසීන් ගේ ගෘහ ද්වාරයන්හි දහසින් බැඳි පියල්ලක් තබන්නාක් මෙන් ප්‍රසාදනීය ගමනින් පිළිවෙළින් සිටුතුමා ගේ ගෙදෙරට වැඩම කළ සේක. එදින සිටු තෙමේ උදෑසනින් ම ප්‍රණීත භෝජන අනුභව කොට තෘප්තියට පත් වී ගෙපිළෙහි දත් පිරිසිදු කරමින් සිටියේ ය. සුහිත ව සිටි සිටුවරයාට එදින පසේබුදුන් වහන්සේ දුටු කෙණෙහිම දීමට සිතක් ඇති විය. හෙතෙමේ බිරිය කැඳවා මේ ශ්‍රමණයාට පිණ්ඩපාතය දෙන්න යයි කියා ගියේ ය. සිටු බිරිය සිතන්නී මා මෙතෙක් මොහුගෙන් දෙන්නය යන වචනය අසා නැත. මොහු අද දෙන්න කීයේ ද එසේ මෙසේ කෙනකුට නො වේ, රාගද්වේෂ මෝහයන් ක්ෂය කර සිටින පසේබුදුන් වහන්සේ කෙනකුට ය. මුන් වහන්සේට යන්තමින් දෙයක් නොදී ප්‍රණීත පිණ්ඩපාතයක් පිළියෙළ කර දෙමිය යි සිතා පසේ බුදුන් වහන්සේ වෙත ගොස් පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන ගෙයි අසුනක් පනවා පසේ බුදුන් වහන්සේ එහි

Non-commercial distribution

වැඩ හිඳුවා පිරිසිදු ඇල්සහලින් බත් පිස සුදුසු ව්‍යඤ්ජන හා කැවිලි පිළියෙළ කොට පාත්‍රය පුරවා, පිට ද සුවඳින් සරසා පසේ බුදුන් වහන්සේට පිළි ගැන්වූවා ය. පසේ බුදුන් වහන්සේ මෙයින් අන් පසේබුදුවරයන්ට ද සංග්‍රහ කරමි යි සිතා එහි දී පිණ්ඩපාතය නො වළඳා ඇයට අනුමෝදනා කොට පාත්‍රය ගෙන නික්මුණු සේක. සිටු තුමා පෙරළා එනුයේ පසේ බුදුන් දැක "මම ඔබ වහන්සේ ට පිණ්ඩපාතය දෙන්නට කියා ගියෙමි. කිමෙක් ද පිණ්ඩපාතය ලදහුදැ"යි ඇසීය. පසේ බුදුන් වහන්සේ "ලදිමි සිටුතුමාණෙනි" කීහ. එකල්හි සිටු හිස ඔසවා පිණ්ඩපාතය කෙසේදැයි බැලීය. එහි සුවඳ වැදී සිටුවරයාට සිත සතුටු කර ගත නො හැකි විය. නිකම් ඉන්නා මේ මහණහුට මේ පිණ්ඩපාතය නො දී මෙය අපගේ දසයකුට හෝ කම්කරුවකුට හෝ දුන්නේ නම් යහපතකැයි සිතීය. අපර චේතනාව අයහපත් වීමෙන් ඔහුගේ කුශලය දුබල විය. ඒ පිනෙන් ඔහු සත්වරක් දෙව්ලොව උපන්නේ ය. සත්වරක් සැවැත් නුවර සිටු විය. අපරචේතනාව අයහපත්වීමේ දෝෂයෙන් ඔහුට ලද සම්පතින් ප්‍රයෝජන නො ලැබිය හැකි විය. සත්වන වාරයේ සිටු වීමෙන් ඔහු ගේ පින කෙළවර විය. මළ සිටු තුමා පෙර කළ පවින් රෞරව නරකයෙහි උපන්නේ ය.

**කුම්මග්ගසේවනා** යනු වැරදි මඟ ගැනීම ය. මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි යන අනාර්‍ය්‍යමාර්ගය නො මඟ ය. ඒ මඟ ගත්තෝ එයින් සතර අපායට යෙති.

**චේතසෝලීනත්තං** යනු කුශලධර්මයන්හි සිත ඉදිරියට නො ගොස් හැකිළෙන බවය. ඒ ථීනමිද්ධය ය. පිනට හැකිළෙන සිත් ඇත්තේ දන් දීමට කථා කළ හොත් වස්තුව ඇත ද ඉදිරිපත් නො වේ. පසුබසී. අන් පින්කමක් ගැන කථා කළ ද වස්තුව බලය ඇත ද එය කිරීමට ඉදිරිපත් නො වේ. ඉදිරිපත් වුව ද කටයුත්ත අතරමඟ නවත්වයි. සිල් සමාදන් වීමට අලස වේ. භාවනා කිරීමට අලස වේ. එයින් ඔහුට සංසාරය දික් වේ.

**ත්‍රිකනිර්දේශය නිමි.**

Non-commercial distribution

## චතුෂ්ක වශයෙන් දැක්වෙන ක්ලේශ සපනස

චත්තාරෝ ආසවා, චත්තාරෝ ගන්ථා, චත්තාරෝ ඕඝා, චත්තාරෝ යෝගා, චත්තාරෝ උපාදනානි, චත්තාරෝ තණ්හුප්පාද, චත්තාරි අගතිගමනානි, චත්තාරෝ විපරියේසා, චත්තාරෝ අනරියවෝහාරා, අපරේපි චත්තාරෝ අනරියවෝහාරා, චත්තාරි දුච්චරිතානි, අපරානිපි චත්තාරි දුච්චරිතානි, චත්තාරි භයානි. අපරානිපි චත්තාරි භයානි, චතස්සෝ දිට්ඨියෝ.

(ඛුද්ධක වත්ථු විභංග)

**චත්තාරෝ ආසවා:**

1. **කාමාසවෝ**, 2. **භවාසවෝ**,
3. **දිට්ඨාසවෝ**, 4. **අවිජ්ජාසවෝ**.

භාජනවල බහා කලක් පල් කරන ලද මත් කරවන ස්වභාවය ඇති මල්රස ආදිය **ආසව** නම් වේ. ඒවා පල් කරන කල්හි ඒවා අනුව භාජන ද පල් වේ. කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන ධර්ම සතර ද සත්ත්වයා ගේ කොනක් දැකිය නොහෙන අතීත භව පරම්පරාවෙහි පර්ය්‍යුත්ථාන වශයෙන් හා අනුශය වශයෙන් ද පැවැතියේය. අතිදීර්ඝ කාලයක් එසේ සත්ත්ව සන්තානයෙහි පැවතීමෙන් ඒවා පල්වූවෝය. සත්ත්ව සන්තානය ද ඒවා නිසා පල් ව ඇත්තේ ය. අතිදීර්ඝ කාලයක් පල්වී ඇති සත්ත්ව සන්තානය අර්හත්මාර්ගඥාන නමැති ජලයෙන් මිස අන් ක්‍රමයකින් පිරිසිදු නො කළ හැකිය. අර්හත්වයට පැමිණ පිරිසිදු වීම දක්වා සත්ත්ව සන්තානයෙහි ආශ්‍රව ධර්ම සතර අනාගතයෙහිත් පවත්නේය. කාම භව දිට්ඨි අවිජ්ජා යන මේ ධර්මයෝ සතර දෙන ඉහත කී ආශ්‍රව-යන්ට පල් වීම් වශයෙන් සමාන බැවින් ආසව නම් වෙති. පුප්ඵාසවාදි ආසවවලින් මත් කරවන්නේ මඳ කලකටය. ඒවායින් වන මත පැය ගණනකින් සන්සිඳෙන්නේ ය. කාමාසවාදීන් ගෙන් වන මත අති දීර්ඝ කාලයක් පවතී. අර්හත් මාර්ගයෙන් ඒ කෙලෙස්

ප්‍රහාණය කරන තුරු ම ඒ මත පවතී. එ බැවින් කාමාසවාදිය පල් කළ මල්රස ආදි ආසවයන්ට වඩා මත් කරවන දෙයක් බව කිය යුතු ය. මත් කිරීම් වශයෙන් ද ආසවයන්ට සමාන බැවින් කාම භව දිට්ඨි අවිජ්ජා යන ධර්මයෝ ආසව නම් වෙති.

පැස වූ කුෂ්ඨ වණ ගෙඩිවලින් ගලන ඕජස ද ආසව නම් වේ. පැස වූ කුෂ්ඨය ඇතියහුගේ තුවාල වලින් ඕජාව ගලා හැඳිවත් හා වාසස්ථාන දූෂණය කරන්නාක් මෙන් කාමාසවාදීහු චක්ඛු සෝත ඝාන ජිව්හා කාය මන යන ද්වාර සයෙන් ගලා රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්ම යන අරමුණු සය දූෂණය කෙරෙති. එ බැවින් ෂට්ද්වාරයෙන් ගලන්නෝය යන අර්ථයෙන් ද කාමභවාදීහු ආසව නම් වෙති.

ස්කන්ධ පරම්පරාව නො සිඳී දිගින් දිගට පවත්නේ මේ ධර්ම සතර නිසාය. සංස්කාර දුඃඛය ඉදිරියට දිගට පවත්වන්නෝය යන අර්ථයෙන් ද කාමාදීහු ආසව නම් වෙති.

මේ ධර්මයෝ සතර දෙන භවාග්‍රය දක්වා ලෝකයත්, මාර්ග චිත්තයට පූර්ව භාගයේ ඇතිවන ගෝත්‍රභූ චිත්තය දක්වා ඇති ධර්ම සියල්ලත් අරමුණු කිරීම් වශයෙන් ගලා යට කර ගෙන සිටින බැවින් ද ආසව නම් වේ.

කාම වස්තූහුය, ඒවායේ ඇලෙන තණ්හාවය යන දෙකට ම කාමය යි කියනු ලැබේ. කාමාසව යන මෙහි කාම යනුවෙන් අදහස් කරන්නේ කාම වස්තූන් කෙරෙහි පවත්නා තණ්හාවය, රාගය ය. කාම වස්තූන් සම්බන්ධයෙන් ඇති වන තණ්හාව, රාගය කාමාසවය ය. එය ලෝභය ම ය.

**භවාසව** යන මෙහි භව යනුවෙන් කියැවෙන්නේ රූපාරූප භවයන්හි උප්පත්තිය සිදුකරන කුශල කර්මයන් හා ඒ කුශල් වලින් උපදවන රූපාරූප භවයන්හි ස්කන්ධයන් පිළිබඳ වූ ද තණ්හාව ය. ඒ තණ්හාව භවාසවය ය.

**දිට්ඨාසව** යනු මිථ්‍යා දෘෂ්ටීහු ය. අවිජ්ජාසව යනු අවි-ද්‍යාව ම ය. ධර්ම වශයෙන් බලන කල්හි කාමාසව භවාසව යන දෙකින් ම කියැවෙන්නේ එකම ලෝභය ය. එබැවින් ලෝභය දිට්ඨිය මෝහය කියා ධර්ම වශයෙන් ආශ්‍රවයෝ තිදෙනෙක් ම වෙති.

Non-commercial distribution

**චත්තාරෝ ගන්ථා :**

5. **අභිජ්ඣා කායගන්ථෝ**
6. **ව්‍යාපාදෝ කායගන්ථෝ**
7. **සීලබ්බතපරාමාසෝ කායගන්ථෝ**
8. **ඉදං සච්චාභිනිවේසෝ කායගන්ථෝ**

වර්තමාන භවයේ චුති චිත්තයට අනතුරුව ම අනාගත භවයක ප්‍රතිසන්ධි චිත්තය ඇති කිරීමෙන් භව පරම්පරාව සිඳෙන්නට නො දී සංසාරය දිගට පවත්වන ධර්මයෝ ගන්ථ නම් වෙති. ගන්ථ යන්නෙහි අදහස එක් භවයක් හා අන් භවයක් එක් කොට බඳින, සම්බන්ධ කරන ධර්මය යනුයි. එක් භවයකට අයත් කය හා අන් භවයක කය සම්බන්ධ කරන්නෝය යන අර්ථයෙන් **කායගන්ථ** නම් වෙති.

දශ අකුශල කර්ම පථය දක්වන තැන්වල අභිජ්ඣා යන වචනයෙන් කියැවෙන්නේ හොඳය කියා ඇලුම් කිරීම් මාත්‍රයෙන් නො නැවතී අන් සතු වස්තූන් තමා කෙරෙහි ආරෝපණය කිරීම් වශයෙන් ඇති වන අධික ලෝභය ය. අභිජ්ඣා කායගන්ථ යන මෙහි අභිජ්ඣා යනුවෙන් කියැවෙන්නේ සෑම ආකාරයකින්ම ඇති වන ලෝභය ය. ආශාව තණ්හාව ආදරය ආලය රාගය ප්‍රේමය ස්නේහය කාමතණ්හාව භවතණ්හාව විභව තණ්හාව රූපාශාව ශබ්දාශාව ගන්ධාශාව රසාශාව ඵොට්ඨබ්බාශාව ජීවිතාශාව ධනාශාව පුත්‍රාශාව යනාදි නොයෙක් නම් වලින් කියැවෙන සර්වාකාර ලෝභය **අභිජ්ඣාකායගන්ථය ය**.

දශ අකුශල කර්ම පථයන් දක්වන තන්හි ව්‍යාපාද යනුවෙන් කියැවෙන්නේ සාමාන්‍ය නො සතුට විරුද්ධත්වය ඉක්මවා ගිය අන්හු නැසෙත්වා යි සිතීම් වශයෙන් පවත්නා නපුරු ද්වේෂය ය. මෙහි ව්‍යාපාද යනුවෙන් අදහස් කරනුයේ සර්වාකාර වූ ම ද්වේෂය ය. කෝපය ගැටුම නො සතුට තරහව වෛරය අමනාපය පිළිකුල යනාදි නොයෙක් නමින් කියැවෙන ද්වේෂය **ව්‍යාපාදකායගන්ථය ය**.

Non-commercial distribution

ගෝශීල ගෝව්‍රතාදි මිථ්‍යාශීල මිථ්‍යාව්‍රතයන් පිරිසිදු වීමේ මාර්ගය වශයෙන් වරදවා ගැනීම වූ මිථ්‍යාදෘෂ්ටිය **සීලබ්බත පරාමාස කායගන්ථ** නම් වේ.

ලෝකය ශාස්වතය; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, ලෝකය අශාස්වතය; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, ලෝකය අන්තවත්ය; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, ලෝකය අනන්තවත්ය; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, ජීවයත් එයය ශරීරයත් එයය; සත්‍යය මෙයමය. අන්‍ය වාද හිස්ය කියා හෝ, ජීවය අනෙකක ශරීරය අනෙකක; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, සත්ත්වයා මරණින් පසු ද ඇත; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, මරණින් මතු සත්ත්වයා නැත; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ, සත්ත්වයා මරණින් පසු ඇත්තේ ද වේ නැත්තේ ද වේ; සත්‍යය මෙයමය. අන්‍ය වාද හිස්ය කියා හෝ, සත්ත්වයා මරණින් මතු ඇත්තේ ද නොවේ නැත්තේ ද නොවේ; සත්‍යය මෙයමය. අන්‍යවාද හිස්ය කියා හෝ යම් කිසි වාදයක පිහිටා එය ම සත්‍යයයි තදින් ගන්නා ස්වභාවය වූ මිථ්‍යා දෘෂ්ටිය **ඉදංසච්චාභිනිවේස කායගන්ථය ය**.

ධර්ම වශයෙන් ගන්නා කල්හි සීලබ්බත පරාමාස කායගන්ථ ඉදංසච්චාභිනිවේස කායගන්ථ යන දෙක එක ම දෘෂ්ටි චෛතසිකය ය. එබැවින් ලෝභ ද්වේෂ දිට්ඨි යයි ධර්ම වශයෙන් ගන්ථ තුනක් ම වේ.

**චත්තාරෝ ඕඝා:**

| | |
|---|---|
| **9. කාමෝඝො** | **10. භවෝඝො** |
| **11. දිට්ඨෝඝෝ** | **12. අවිජ්ජෝඝෝ** |

වැටුණු සත්ත්වයන්හට ගොඩවිය නො හෙන පරිදි ගිල ගන්නා වූ මහා ජලස්කන්ධය **ඕඝ** නම් වේ. ඕඝ නම් වූ මේ ධර්මයෝ සතර දෙන ද ඒ ධර්මයන් ඇත්තා වූ පුද්ගලයා සංසාර නමැති මහෝඝයෙහි ගිල්වති. ගොඩ එන්නට නො දෙති. එබැවින් ඒ ධර්මයෝ ඕඝ නම් වෙති. කාමෝඝාදීහු ධර්ම වශයෙන්

Non-commercial distribution

කාමාසවාදීහුමය. කාමාසවය ම කාමෝඝය ද වේ. භවාසවාදීහු භවෝඝාදීහු ද වෙති.

**චත්තාරෝ යෝගා:**

**13. කාමයෝගෝ 14. භවයෝගෝ**
**15. දිට්ඨි යෝගෝ 16. අවිජ්ජා යෝගෝ**

සත්ත්වයා සංසාරයෙහි නැවත නැවත යොදවන සංසාරයෙන් මිදෙන්නට නො දෙන ධර්මයෝ යෝග නම් වෙති. ආසව නාමයෙන් කියන ලද්ද වූ ද, ඕඝ නාමයෙන් කියන ලද්ද වූ ද, කාම භව දිට්ඨි අවිජ්ජා යන ධර්ම සතරට ම සත්ත්වයා සංසාරයෙහි යොදවන බැවින් **යෝග**යෝය යි කියනු ලැබේ.

**චත්තාරි උපාදනානි:**

**17. කාමුපාදනං 18. දිට්ඨුපාදනං**
**19. සීලබ්බතුපාදනං 20. අත්තවාදුපාදනං**

සර්පයකු විසින් මැඩියකු අල්වා ගන්නාක් මෙන් ලෙහෙසියෙන් නො මුදන පරිදි තදින් අල්වා ගන්නා ධර්මයෝ **උපාදන** නම් වෙති.

ලෙහෙසියෙන් නො මුදන පරිදි රූපාදිය තදින් ගන්නා දැඩි රාගය, ඕනෑමය කියා තදින් ගන්නා තණ්හාව **'කාමුපාදන'** නම් වේ. යම්කිසිවක් ගැන මුලින් ලිහිල්ව ඇති වී මෝරා ගිය රාගය හා තණ්හාවය. රාගය හා තණ්හාව මුලින් ලිහිල්ව ඇති වී මෝරා උපාදන භාවයට පැමිණේ. "තණ්හා පච්චයා උපාදනං" යි වදරා ඇත්තේ එබැවිනි.

මිථ්‍යා කථා අසනුවන්ට මිථ්‍යා පොත් කියවන්නන්ට මළ සත්ත්වයා නැවත උපදින්නේ නැත, අපායක් නැත, දෙව්ලොවක් නැත, පින් පව් නැත, පින් පව් වලින් ලැබෙන විපාකයක් නැත යනාදීන් ලිහිල් ලෙස මිථ්‍යාදෘෂ්ටිය ඇති වේ. කල් ගත වීමෙන් ඒ දෘෂ්ටිය මෝරා කිසිවකු විසින් බණ කියා ඉවත් කරවිය නො හෙන තත්ත්වයට මෝරයි. ඒ මෝරා හැරවිය නොහෙන තත්ත්වයට බලවත් වූ දෘෂ්ටිය **දිට්ඨුපාදන** නම් වේ.

Non-commercial distribution

කලක් පැවතීමෙන් මෝරා ගිය ගෝශීල ගෝව්‍රතාදි මිථ්‍යා ශීලව්‍රතවලින් ශුද්ධිය ලැබිය හැකි ය යන දෘෂ්ටිය **සීලබ්බතුපාදන** නම් වේ.

පඤ්චස්කන්ධය ආත්ම වශයෙන් සත්ත්ව පුද්ගල වශයෙන් ගන්නා දෘෂ්ටිය **අත්තවාදුපාදන** නම් වේ.

දිට්ඨුපාදන සීලබ්බතුපාදන අත්තවාදුපාදන යන තුන ම ඒ ඒ ආකාරවලින් පවත්නා දෘෂ්ටිය ම ය. එබැවින් ධර්ම වශයෙන් තණ්හාව දෘෂ්ටියය කියා උපාදන දෙකකි.

**චත්තාරෝ තණ්හුප්පාද:**

21. **චීවරහේතු වා භික්ඛුනෝ තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.**
22. **පිණ්ඩපාත හේතු වා භික්ඛුනෝ තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.**
23. **සේනාසන හේතු වා භික්ඛුනෝ තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.**
24. **ඉති භවාභව හේතු වා භික්ඛුනෝ තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති.**

භික්ෂුවහට සිවුරු නිසා තණ්හාව උපදී.
භික්ෂුවහට පිණ්ඩපාතය නිසා තණ්හාව උපදී.
භික්ෂුවට සෙනසුන නිසා තණ්හාව උපදී.
භික්ෂුවට තෙල් ගිතෙල් මී පැණි සකුරු ආදි
ප්‍රණීත වස්තූන් නිසා තණ්හාව උපදී.

මේ තණ්හුප්පාද සතර ය.

තථාගතයන් වහන්සේගේ දේශනාව පුද්ගලාධිෂ්ඨාන දේශනාවය., ධර්මාධිෂ්ඨාන දේශනාව යයි දෙ පරිදි වේ. පුද්ගලයා ප්‍රධාන කොට පුද්ගලයාට ධර්මය දක්වන දේශනාව පුද්ගලාධිෂ්ඨාන දේශනාවය. පුද්ගලයා නො ගෙන ධර්මය පමණක් ගෙන කරන දේශනාව ධර්මාධිෂ්ඨාන දේශනාව ය. තණ්හුප්පාද දේශනාව පුද්ගලාධිෂ්ඨාන දේශනාවකි. අභිධර්ම පිටකයෙහි පුද්ගලාධිෂ්ඨාන දේශනා විරලය. සූත්‍ර පිටකයෙහි පුද්ගලාධිෂ්ඨාන දේශනා බහුලය.

Non-commercial distribution

තණ්හුප්පාද සතර ධර්මාධිෂ්ඨාන ක්‍රමයෙන් කියතහොත් කිය යුත්තේ මෙසේය.

භික්ඛුනෝ චීවර හේතු උප්පජ්ජමානා තණ්හා.
භික්ඛුනෝ පිණ්ඩපාත හේතු උප්පජ්ජමානා තණ්හා.
භික්ඛුනෝ සේනාසන හේතු උප්පජ්ජමානා තණ්හා.
ඉති භවාභව හේතු වා භික්ඛුනෝ උප්පජ්ජමානා තණ්හා.

මෙය සිංහලෙන් කිය යුත්තේ මෙසේය. භික්ෂුවට සිවුරු නිසා උපදනා තණ්හාව එක් ක්ලේශයෙකි. භික්ෂුවට පිණ්ඩපාතය (ආහාරය) නිසා උපදනා තණ්හාව එක් ක්ලේශයෙකි. භික්ෂුවට සේනාසනය නිසා උපදනා තණ්හාව එක් ක්ලේශයෙකි. ප්‍රණීත තෙල් ගිතෙල් මී පැණි සකුරු ආදිය නිසා උපදනා තණ්හාව එක් ක්ලේශයෙකි.

භික්ෂුවට ධ්‍යාන මාර්ග ඵල ධර්මයන් ලබා උසස් තත්ත්වයට පැමිණීමට ඇති මහත් බාධාව මේ තණ්හා හතර ය. බුදුන් වහන්සේ විසින් ආර්‍යවංශ ධර්ම සතර දේශනය කර ඇත්තේ මේ තණ්හා සතර ප්‍රහාණ කළ හැකි වීම පිණිසය. ආර්‍යවංශ ධර්මය බුදු සසුනේ උසස් ධර්මයෙකි. ආර්‍යවංශ ප්‍රතිපදාව උසස් ප්‍රතිපදාවකි. ආර්‍යවංශ ධර්මය ත්‍රිපිටකය ම ඇතුළුවන ධර්මයෙකි. **අතීතයේ බොහෝ විහාරයන්හි වර්ෂයකට වර බැගින් ආර්‍යවංශ ධර්මය දේශනය කිරීමේ සිරිතක් පැවති බව** අටුවාවල එන කථාවලින් පෙනේ. එය ඇසීමට ද බොහෝ ජනයා පැමිණෙන බව ද කියා තිබේ. විස්තර වශයෙන් ආර්‍යවංශධර්මය අංගුත්තර නිකාය චතුෂ්ක නිපාතයෙහි හා එහි අටුවාවෙන් ද බලා ගත යුතුය. එය සැකෙවින් මෙසේ ය.:–

ඝන වූ හෝ සියුම් වූ හෝ රළු වූ හෝ මෘදු වූ හෝ අලුත් වූ හෝ පරණ වූ හෝ යම්කිසි ලද චීවරයකින් සතුටු වීම, තණ්හාවෙන් තොරව චීවරය පරිභෝග කිරීම, නො මනා සිවුරු නිසා නො සතුටු නොවීම පළමුවන ආර්‍යවංශ ධර්මය ය.

ප්‍රණීත වූ හෝ රූක්ෂ වූ හෝ බොහෝ වූ හෝ මඳ වූ හෝ ලද පිණ්ඩපාතයකින් සතුටු වීම, තණ්හාවෙන් තොරව පිණ්ඩපාතය පරිභෝග කිරීම, පිණ්ඩපාතය නො ලැබීම හෝ නො මනා පිණ්ඩපාතයක් ලැබීම ගැන හෝ නො සතුටට පත් නොවීම දෙවන ආර්‍යවංශ ධර්මය ය.

Non-commercial distribution

ලැලි ඇඳක් හෝ වැල් ඇඳක් හෝ වියන් ඇඳක් හෝ පැදුරක් හෝ මෙට්ටයක් හෝ අතු පැළක් හෝ ගුහාවක් හෝ ප්‍රාසාදයක් හෝ ලද නම්, ලද සෙනසුනෙන් සතුටු වීම, සෙනසුන ගැන දෙමනසට නො පැමිණීම, තණ්හාවෙන් තොර ව සෙනසුන පරිභෝග කිරීම තුන්වන ආර්‍ය්‍යවංශ ධර්මය ය.

භාවනාවෙහි යෙදී විසීමේ සතුට, ක්ලේශ ප්‍රහාණයෙහි යෙදී විසීමේ සතුට, සතර වන ආර්‍ය්‍යවංශ ධර්මයය. තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වෙසෙමින් කළ මහා ආර්‍ය්‍යවංශ සූත්‍ර දේශනය අසා සතළිස් දහසක් භික්ෂූහු සව් කෙලෙසුන් නසා අර්හත්වයට පත් වූහ.

**චත්තාරි අගතිගමනානි:**

**21. ඡන්දගතිං ගච්ඡති**
**22. දෝසාගතිං ගච්ඡති**
**23. මෝහාගතිං ගච්ඡති**
**24. භයාගතිං ගච්ඡති**

අගති යනු නො කළ යුත්ත කිරීම ය. ආර්‍ය්‍යයන් නො කරන අනාර්‍ය්‍යයන් කරන ලාමක වැඩ කිරීම ය. නෑකමක් හෝ මිතුරු කමක් හෝ හැඳුනුම්කමක් හෝ අල්ලසක් හෝ නිසා විනිශ්චය කිරීමේදී වාසි කිරීම, අහිමි දෙය හිමි කර දීම **ඡන්දාගති** නම් ක්ලේශය ය. එය ඒ ආකාරයෙන් පවත්නා තණ්හාව ය. විනිශ්චය කිරීමේ දී මොහු මාගේ සතුරෙක් ය කියා කලක පටන් පවත්නා වෛරයක් නිසා හෝ එකෙණෙහි ඇති වූ කෝපය නිසා හෝ නිවැරදි කරුවකුට වරද ආරෝපණය කිරීම, හිමි දෙයක් අහිමි කිරීම **දෝසාගති** නම් ක්ලේශය ය. එය ධර්ම වශයෙන් ද්වේෂය ය. වරදකරු නිවරදකරු තේරුම් ගැනීමට සමත් හිමිකම් අහිමිකම් තේරුම් ගැනීමට සමත් නුවණ නැති බැවින් හෝ කාරණය නිසි ලෙස නො විමසීමෙන් හෝ නිවැරදිකරුවකු වරදකරු කිරීම, වරදකරුවකු නිදහස් කිරීම, යමක් අහිමියකුට හිමි කිරීම,හිමියකුට අහිමි කිරීම **මෝහගති** නම් ක්ලේශය ය. එය ධර්ම වශයෙන් මෝහය ය. මොහු නපුරෙක, උසස් නෑ මිතුරන් ඇතියෙක. මැති

Non-commercial distribution

ඇමතිවරුන්ගේ මිතුරෙක, මොහුට අවාසි වුව හොත් මොහුගෙන් විපත් පැමිණිය හැකි යයි භයින් වරදින් නිදහස් කිරීම, අහිමි දෙය හිමි කර දීම **භයා ගති** නම් ක්ලේශය ය. ධර්ම වශයෙන් වනාහි ඒ ආකාරයෙන් පවත්නා ද්වේෂය ය.

සංඝ ලාභය සැමට ම සම සේ බෙදා දිය යුතුය. යමෙක් සංඝ ලාභයක් බෙදීමේදී මොහු මගේ මිතුරෙක හිතවතෙක නෑයෙක කියා යමෙකුට වැඩි කොට හෝ වටනා දේ හෝ තෝරා දීම ඡන්දගතිය ය. පවත්නා වෛරයක් නිසා හෝ එකෙණෙහි හටගත් ද්වේෂය නිසා හෝ අඩු කොට දීම නො මනා භාණ්ඩ තෝරා දීම දෝසාගතිය ය. බඩුවල හොඳ නරක නො දැනීම නිසා හෝ දුන් නුදුන් අය නො දැනීම නිසා හෝ අසාධාරණ ලෙස බෙදා දීම මෝහාගතිය ය. මොහුට මඳක් හෝ වැඩි කොට නුදුන හොත් වටනා දෙයක් නුදුන හොත් විපත් පැමිණිය හැකියයි බියෙන් වැඩිකොට දීම, වටිනා දේ තෝරා දීම භයාගතිය ය.

**ඡන්ද දෝසා භයා මෝහා - යෝ ධම්මං අතිවත්තති.**
**නිහීයති තස්ස යසෝ - කාළපක්ඛෙව චන්දිමා**

**ඡන්ද දෝසා භයා මෝහා - යෝ ධම්මං නාතිවත්තති.**
**ආපූරති තස්ස යසෝ - සුක්ඛපක්ඛෙව චන්දිමා**

ඡන්දයෙන් ද්වේෂයෙන් භයින් මෝහයෙන් යමෙක් ධර්මය ඉක්මවා ද ඔහුගේ යසස කාළ පක්ෂයේ චන්ද්‍රයා මෙන් පිරිහෙන්නේ ය.

ඡන්දයෙන් ද්වේෂයෙන් භයින් මෝහයෙන් යමෙක් ධර්මය නො ඉක්මවා ද ඔහු ගේ යසස ශුක්ල පක්ෂයේ චන්ද්‍රයා මෙන් වැඩෙන්නේ ය.

**චත්තාරෝ විපරියේසා :**

**25.** **අනිච්චෙ නිච්චන්ති සඤ්ඤා විපරියේසෝ**
**චිත්ත විපරියේසෝ දිට්ඨි විපරියේසෝ.**

**26.** **දුක්ඛෙ සුඛන්ති සඤ්ඤා විපරියේසෝ**
**චිත්ත විපරියේසෝ දිට්ඨි විපරියේසෝ.**

**27.** **අනත්තනි අත්තාති සඤ්ඤා විපරියේසෝ**
**චිත්තවිපරියේසෝ දිට්ඨි විපරියේසෝ**

Non-commercial distribution

## 28. අසුභෙ සුභන්ති සඤ්ඤා විපරියේසෝ චිත්ත විපරියේසෝ දිට්ඨි විපරියේසෝ.

අනිත්‍ය වූ පඤ්චස්කන්ධය නිත්‍යයයි ගන්නා වැරදි හැඟීමක් වැරදි දැනීමක් වැරදි දැකීමක් ඇත්තේ ය. දුක් වූ පඤ්චස්කන්ධය සැපයෙකැයි ගන්නා වැරදි හැඟීමක් වැරදි දැනීමක් වැරදි දැකීමක් ඇත්තේ ය. ආත්ම නොවූ පඤ්චස්කන්ධය ආත්ම යයි ගන්නා වැරදි හැඟීමක් වැරදි දැනීමක් වැරදි දැකීමක් ඇත්තේ ය. අසුභ වූ පඤ්චස්කන්ධය සුභ යයි ගන්නා වැරදි හැඟීමක් වැරදි දැනීමක් වැරදි දැකීමක් ඇත්තේ ය. මේ **විපරියේස** සතර ය.

දැන් අපි පැමිණ සිටින්නේ ඉතා ගැඹුරු තේරුම් ගැනීමට දුෂ්කර අවුල් තැනකට ය. විපරියේස යනු දැනට සිංහල අකුරෙන් මුද්‍රිත විභංගප්‍රකරණයේ ඇති ආකාරය ය. එය ඡට්ඨ සංගායනාවේදී සංශෝධනය කොට මුද්‍රිත විභංගප්‍රකරණයේ ඇත්තේ **විපරියාස** කියාය. අංගුත්තර චතුෂ්කනිපාතයේ ඇත්තේ **විපල්ලාස** කියා ය. මෙසේ ඒ ඒ පිටපත් වල විපරියේස විපරියාස විපල්ලාස කියා එකම කරුණ තුන් ආකාරයකින් තිබීමත් අවුලකි. මෙය විස්තර කිරීමේ දී අප විසින් **විපර්‍ය්‍යාස** යන වචනය යොදනු ලැබේ.

මෙහි විපර්‍ය්‍යාසයන් කොටින් දැක්වීමේ දී හැඟීම් යන වචනය යොද ඇත්තේ සඤ්ඤා යන්න වෙනුවට ය. දැනීමයයි යොද ඇත්තේ චිත්ත යන්න වෙනුවට ය. දැකීම යයි යොද ඇත්තේ දිට්ඨි යන්න වෙනුවට ය. විපර්‍ය්‍යාසය යන වචනයෙන් අදහස් කරන්නේ යමක ඇති සැටියට විරුද්ධාකාරයෙන් ගැනීම ය. දික් දෙය කෙටිය කියා ද, කෙටි දෙය දිගය කියා ද, සතරැස් දෙය වටය කියා ද, වට දෙය සතරැස්ය කියා ද ඇති සැටියට විරුද්ධාකාරයෙන් ගැනීම සැලකීම විපර්‍ය්‍යාසය ය. මේ විපර්‍ය්‍යාස සතර තේරුම් ගත හැකි වන්නේ පඤ්චස්කන්ධය හා එයට අයත් ධර්ම වල අනිත්‍ය දුඃඛ අනාත්ම අශුභ ලක්ෂණයන් දැන සිටින අයට පමණෙකි. ඒවාත් සමග විස්තරයක් කිරීමට මෙතැන්හි අවකාශ මදය.

සංඥාවය චිත්තය දෘෂ්ටිය යි විපර්‍ය්‍යාස ධර්ම තුනෙකි. ඒ එක එකක් අනිත්‍ය දුඃඛ අනාත්ම අශුභ යන කරුණු සතර සම්බන්ධයෙන් ඇතිවන බැවින් විපර්‍ය්‍යාස දොළොසක් වේ. සංඥා

Non-commercial distribution

චිත්ත දෘෂ්ටි යන මේ ධර්ම තුන පිළිවෙළින් එකිනෙකට බලවත්ය. මේ විපයඹාසයන් ඇති වන්නේ මෙසේය. චිත්තය වනාහි සත්ත්ව ශරීරයන්හි හා බාහිර වස්තූන්හි ඇති රූප ධර්මයන් පරමාර්ථ වශයෙන් වෙන් කොට දැකීමට සමත් ධර්මයක් නොවේ. පරමාර්ථ රූප ධර්මයන් ගේ උත්පාද ස්ථිති භංගයන් දැකීමට සමත් එකක් ද නොවේ. චිත්තය දක්නේ එකට බැඳී ඝනව පවත්නා රූප කලාප සමූහයන් එක් එක් දෙයක් ලෙසය. චිත්තයට දැනෙන්නේ පටන් ගත් තැන සිට සමුද්‍රය දක්වා ගඟක ඇති ජලස්කන්ධය එක දෙයක් ලෙස ය. සවස් කාලයේ දල්වන ලදුව මධ්‍යම රාත්‍රිය දක්වා පවත්නා පහන් සිළුව එක් දෙයක් ලෙස ය. අද පවත්නා වූ ද අවුරුදු ගණනකට පෙර පැවැතියා වූ ද තමාගේ ශරීරය එක් දෙයක් ලෙස ය. උත්පත්තියේ පටන් මරණය දක්වා පවත්නා සිත් පරම්පරාව එක් සිතක් ලෙස ය. සිත දක්නේ නාම රූප ධර්මයන් පිළිබඳ වූ සමූහ සන්තති ප්‍රඥප්ති දෙක ය. එබැවින් සිතට වස්තූන් මිස පරමාර්ථ ධර්ම දැනෙන්නේ නැත. සන්තතිය මිස ඉපදීම් පෙනෙන්නේ නැත. එබැවින් සිත අනිත්‍ය වූ නාමරූප ධර්මයන් නිත්‍ය ඒවා ලෙස දකී. ඒ චිත්ත විපයඹාසය ය. සිත එසේ ස්කන්ධයන් වරදවා ගත් කල්හි ඒ නාම රූප ධර්ම මමය, සත්ත්වයාය, නැතහොත් සත්ත්වයාගේ සාරය බලන තැනැත්තාය, අසන තැනැත්තාය කියා වරදවා තදින් ගන්නා ස්ථිර වශයෙන් ගන්නා දෘෂ්ටි ඇති වේ. ඒ දෘෂ්ටි විපයඹාසය ය. සංඥාව දුබලය. එය තමා විසින් ම යම්කිසිවක් නිත්‍යාදි වශයෙන් වරදවා හෝ නිත්‍යාදි වශයෙන් සත්‍ය ලෙස හෝ ගැනීමට සමත් ධර්මයක් නො වේ. පඤ්චස්කන්ධය නිත්‍ය ය යි ගන්නා සිත හා එක්වීමෙන් ද දෘෂ්ටිය හා එක්වීමෙන් ද සංඥාව ද අනිත්‍ය හා නිත්‍ය වශයෙන් ගනී. එසේ ගන්නා සංඥාව, සංඥා විපයඹාස ය. යම්කිසි කරුණක් ගැන ඇති වූ සංඥාව කලින් දුබල වුව ද කල් යාමෙන් ස්ථිර වී, දුරු කළ නො හෙන තත්ත්වයට පැමිණේ. සත්ත්වයාට සසරින් නො මිදිය හැකිව ඇත්තේ මේ සංඥා චිත්ත දෘෂ්ටි විපයඹාසයන් නිසා ය. සත්ත්වයා තුළ ඒවා ඇති තාක් ඔහු සංසාර චක්‍රයේ කැරකෙන්නේ ය. විදර්ශනා භාවනාව ඇත්තේ මේ විපයඹාසයන් ප්‍රහාණය කිරීම පිණිස ය. විදසුන් වඩා විපයඹාසයන් ප්‍රහාණය කොට සසර දුකින් මිදෙත්වා!

Non-commercial distribution

මේ දොළොස් වැදෑරුම් විපර්‍යාසයන් අතුරෙන් අනිත්‍ය දෙය නිත්‍ය යයි ගන්නා සංඥා චිත්ත දෘෂ්ටි විපර්‍යාස තුන ය., ආත්ම නොවන පඤ්චස්කන්ධය ආත්ම යයි ගන්නා සංඥා චිත්ත දෘෂ්ටි විපර්‍යාස තුනය, දුඃඛය සුඛයයි ගන්නා දෘෂ්ටි විපර්‍යාසය ය, අශුභය ශුභයයි ගන්නා දෘෂ්ටි විපර්‍යාසය ය යන විපර්‍යාස අට සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වේ. දුඃඛය සුඛ යයි ගන්නා සංඥා විපර්‍යාසය, චිත්ත විපර්‍යාසය, අශුභය ශුභයයි ගන්නා සංඥා විපර්‍යාසය, චිත්ත විපර්‍යාසය යන මේ විපර්‍යාස සතර සෝවාන් පුද්ගලයන්ට ද ඇත්තේ ය. අනිත්‍ය ලක්ෂණය දුඃඛ ලක්ෂණය අනාත්ම ලක්ෂණය යන මේ තුනෙන් දුඃඛ ලක්ෂණය සම්පූර්ණයෙන් තේරුම් ගැනීමට දුෂ්කර ලක්ෂණය ය. සෝවාන් පුද්ගලයාට සතර අපායට අයත් ස්කන්ධයන්ගේ දුඃඛ ලක්ෂණය නිරවශේෂයෙන් වැටහී ඇත. එබැවින් ඔහු කිසි කලෙක අපායට නො යයි. මනුෂ්‍ය ලෝක දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝකවල දුඃඛය සෝවාන් පුද්ගලයාට සර්ව සම්පූර්ණයෙන් වැටහී නැත. ඔහුට ඒවා පිළිබඳ සුඛ දෘෂ්ටිය නැත ද සුඛ සංඥාව සුඛ චිත්තය ඇත්තේ ය. එබැවින් සෝවාන් පුද්ගලයෝ සෙස්සන් මෙන් ම මිනිස් ලොව මිනිස් සම්පත් විඳිති. දෙව්ලොව දිව්‍ය සම්පත් විඳිති. බඹලොව බ්‍රහ්ම සම්පත් විඳිති. අනාගාමීන්ට කාම සම්පත් පිළිබඳ සුඛ සංඥා සුඛ චිත්ත සුඛ දෘෂ්ටි නැත්තේ ය. එබැවින් ඔවුහු කාම ලෝකයේ නූපදිති. බ්‍රහ්ම සම්පත්තිය පිළිබඳ වූ සුඛ සංඥාව සුඛ චිත්තය ඔවුනට ඇත්තේ ය. එබැවින් ඔවුහු බ්‍රහ්ම ලෝක වල ඉපිද බ්‍රහ්ම සම්පත් විඳිති. බ්‍රහ්ම සුඛය පිළිබඳ වූ සංඥාවිපර්‍යාස චිත්ත විපර්‍යාසයන් ප්‍රහාණය වන්නේ අර්හත් මාර්ගයෙනි. ඒවා ප්‍රහාණය වීම නිසා රහත්හු බ්‍රහ්ම ලෝකයෙහි නො ඉපිද පිරිනිවෙති.

**චත්තාරෝ අනරියවෝහාරා:**

**29.** **අදිට්ඨෙ දිට්ඨවාදිතා.**

**30.** **අස්සුතෙ සුතවාදිතා.**

**31.** **අමුතේ මුතවාදිතා.**

**32.** **අවිඤ්ඤාතේ විඤ්ඤාතවාදිතා**

Non-commercial distribution

නොදක්නා ලද්ද දක්නා ලද්දේය යි කියන බව, නො ඇසූ දෙය අසන ලදැයි කියන බව, සාණ ජිව්හා කායද්වාරයන් කරණ කොට නො දන්නා ලද්ද දන්නා ලදැයි කියන බව, මනසින් නො දන්නා ලද්ද දන්නා ලදැයි කියන බව යන මේ සතර අනාර්ය්‍ය ව්‍යවහාරයෝය.

**අපරේපි චත්තාරෝ අනරියවෝහාරා:**

**33**. **දිට්ඨෙ අදිට්ඨවාදිතා**.
**34**. **සුතේ අස්සුතවාදිතා**.
**35**. **මුතේ අමුතවාදිතා**.
**36**. **විඤ්ඤාතේ අවිඤ්ඤාතවාදිතා**.

දක්නා ලද්ද නො දක්නා ලදැයි කියන බව, අසන ලද්ද නො අසන ලදැයි කියන බව, සාන ජිව්හා කායද්වාරයන්ගෙන් දන්නා ලද්ද නො දන්නා ලදැයි කියන බව, සිතින් දන්නා ලද්ද නො දන්නා ලදැයි කියන බව යන මේ සතර ද අනාර්ය ව්‍යවහාරයෝ ය.

මේ අටට අෂ්ටානාර්ය ව්‍යවහාරය යි ද කියනු ලැබේ. අනරියවෝහාර යනුවෙන් අෂ්ටාකාරයකින් දක්වා ඇත්තේ බොරු කියන බව වූ එකම කරුණ ය. බොරුව බුද්ධාදි ආයර්‍යයන් විසින් අන් හැම පවකට වඩා පිළිකුල් කරන පාපයෙකි. ආර්ය්‍යයෝ තමන්ගේ ජීවිතය රැක ගැනීම පිණිස වුව ද බොරු නො කියති.

අප බෝසතාණන් බෝධිසම්භාර පුරන කාලයේ සමහර ජාති වලදී උන් වහන්සේ අතින් වෙනත් පව් කම් සිදු වී ඇති නමුත් කිසි කලෙක බොරු කීම කර නැති බව **හාරිත ජාතක අටුවාවේ** කියා තිබේ. බොරු කීම ලාමක පුද්ගලයන්ගේ සිරිතක් බැවින් ඉහත දැක්වූ කරුණු අටට අනාර්ය්‍ය ව්‍යවහාර යන නම තබා ඇත්තේ ය. බොරු කීම පව් වලින් ප්‍රධාන පව ලෙස කිව යුතුය. එහෙයින්

**ඒකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තුනො.**
**විතිණ්ණ පරලෝකස්ස - නත්ථි පාපං අකාරියං**

යනු වදරන ලදී.

(ධම්මපදය ලෝකවග්ග)

Non-commercial distribution

සත්‍යය නමැති එක් දෙයක් හරනා ලද්ද වූ වචන දශයකින් එකකුදු සත්‍යය නොවන පරිද්දෙන් බොරු කියන්නා වූ පරලොව අත්හල පුද්ගලයාට නො කළ හැකි පවක් නැත ය යනු එහි තේරුම ය.

**චත්තාරි දුච්චරිතානි:**

**37**. **පාණාතිපා තෝ**. **38**. **අදින්නාදනං**
**39**. **කාමේසු මිච්ඡාචාරෝ**. **40**. **මුසාවාදෝ**.

**අපරානි චත්තාරි දුච්චරිතානි:**

**41**. **මුසාවාදෝ** **42**. **පිසුණාවාචා**.
**43**. **ඵරුසාවාචා**. **44**. **සම්ඵප්පලාපෝ**.

මේ දෙකොටසෙහි ධර්ම වශයෙන් ඇත්තේ දුශ්චරිත සතෙකි. පාණාතිපාත අදින්නාදන කාමේසුමිච්ඡාචාර යන තුන කාය දුශ්චරිතයෝ ය. මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්පලාප යන සතර වාග් දුශ්චරිතයෝ ය. මේවා බොහෝ පොත් වල විස්තර කර ඇති බැවින් මෙහි විස්තර නො කරමු.

**චත්තාරි භයානි :**

**45**. **ජාති භයං**. **46**. **ජරාභයං**.
**47**. **ව්‍යාධිභයං**. **48**. **මරණභයං**

ජාතිය හෙවත් භවයෙහි ඉපදීම ගැන සිත්හි හට ගන්නා තැති ගැනීම කම්පනය ජාති භය නම් වේ. දිරීම ගැන සිත්හි හට ගන්නා තැති ගැනීම කම්පනය ජරාභය නම් වේ. ව්‍යාධිය ගැන සිත්හි හට ගන්නා තැති ගැන්ම කම්පනය ව්‍යාධි භය නම් වේ. මරණය ගැන සිත්හි හට ගන්නා තැති ගැනීම කම්පනය මරණ භය නම් වේ. මේ සතර ආකාර භය, ධර්ම වශයෙන් නම් භයාකාරයෙන් ඇතිවන ද්වේෂ නමැති ක්ලේශයය.

Non-commercial distribution

**අපරානි චත්තාරි භයානි :**

**49**. රාජභයං, **50**. චෝරභයං,
**51**. **අග්ගිභයං**, **52**. **උදකභයං**

රජුන් නිසා සිත්හි හට ගන්නා බිය රාජභය නම් වේ. සොරුන් නිසා සිත්හි හට ගන්නා බිය චෝර භය නම් වේ. ගින්න නිසා සිත්හි හට ගන්නා බිය අග්ගි භය නම් වේ. ජලය නිසා සිත්හි හට ගන්නා බිය උදකභය නම් වේ.

**අපරානි චත්තාරි භයානි**

**53**. **ඌම්භයං**, **54**. **කුම්භීලභයං**,
**55**. **ආවට්ටභයං**, **56**. **සුසුකාභයං**

ජලයෙහි යාත්‍රා කරන්නවුන්ට හා ජලයට පිවිසි අයට රළ නිසා සිත්හි හට ගන්නා බිය ඌම්භය නම් වේ. කිඹුලන් නිසා හට ගන්නා බිය කුම්භීලභය නම් වේ. දියසුළි නිසා හට ගන්නා බිය ආවට්ට භය නම් වේ. නපුරු මසුන් නිසා හට ගන්නා බිය සුසුකාභය නම් වේ.

**අපරානි චත්තාරි භයානි:**

**57**. **අත්තානුවාදභයං**, **58**. **පරානුවාදභයං**
**59**. **දණ්ඩභයං**, **60**. **දුග්ගති භයං**,

පව්කම් කළවුන්ට මා විසින් මෙනම් අපරාධයක් කරන ලදැයි තමා විසින් ම චෝදනා කරනු ලැබීමෙන් වන බිය අත්තානුවාදභය නම් වේ. නුඹ මෙබඳු අපරාධයක් කෙළෙහිය යි අන්‍යයන් චෝදනා කිරීමෙන් වන බිය පරානුවාදභය නම් වේ. කළ වරද අසු වුව හොත් තමාට රජුන් විසින් දඬුවම් පමුණුවනු ලැබේය කියා ඇති වන බිය දණ්ඩභය නම් වේ. මරණින් මතු අපායට යන්නට සිදුවෙතැයි හට ගන්නා බිය දුග්ගති භය නම් වේ.

මේ චතුෂ්ක සතරින් භය සොළොසක් දැක් වේ. ධර්ම වශයෙන් කියතහොත් ඇත්තේ ඒ ඒ කාරණයෙන් ඇති වන

Non-commercial distribution

භයාකාර ද්වේෂය ම ය. දියට බසින්නවුන්ට ඌර්මිභය කුම්භීලභය ආවට්ටභය සුසුකාභය යයි භය සතරක් ඇතිවන බව අංගුත්තර නිකායේ චතුෂ්ක නිපාතයේ සූත්‍රයක දේශනය කර ඇත්තේ ය. ඒ භය සතර මෙසේ ය.

**ඌමිභයන්ති ඛෝ භික්ඛවේ කෝධූපායස්සේතං අධිවචනං** "මහණෙනි, ඌර්මිභය යනු ක්‍රෝධ සංඛ්‍යාත චිත්ත පීඩාවට නමෙක" යනු එහි තේරුම ය. සබ්‍රහ්මචාරීහු සසුනෙහි පැවිදිවූවන්ට මෙසේ යා යුතුය, මෙසේ නො යා යුතුය, මෙසේ හිඳිය යුතුය, මෙසේ නො හිඳිය යුතුය, මෙසේ හැඳිය යුතුය, මෙසේ නො හැඳිය යුතුය, මෙසේ පෙරවිය යුතුය, මෙසේ නො පෙරවිය යුතුය යනාදීන් අවවාදනුශාසනා කරති. මහලු වයසේදී පැවිදි වූ ඇතැම් භික්ෂුවකට මෙසේ සිතෙයි. අප පෙර සිටියේ අන්‍යයන්ට අවවාදනුශාසනා කරමිනි. අපට අවවාදනුශාසනා කරන්නෝ නො වූහ. දැන් අපට අපේ දරුවන් මුණුබුරන් පමණ වන අය අනුශාසනා කරන්නා හ. එසේ සිතා ඔහු කිපී නැවත ගිහි වෙයි. එසේ ගිහි වූ තැනැත්තාට බුදු සසුනෙහි රැඳිය හැකි නුවූයේ අන් කරුණක් නිසා නොව ඔහු තුළ මුහුදු රළ සේ නැගි නැගී එන කෝපය නිසා ය. ඔහු බුදු සසුනෙන් පහ කර යැවූයේ අනිකකු නොව ඒ කෝපය ම ය. පැවිද්දන් සසුනෙන් ඉවත් කරවන ඒ කෝපය භික්ෂුවට ඇති ඌර්මිභය ය.

**කුම්භීලභයන්ති ඛෝ භික්ඛවේ ඕදරිකත්තස්සේතං අධිවචනං**. "මහණෙනි, කුම්භීලභය (කිඹුල්බිය) යනු ආහාරයට ලොල් බවට (කෑදරකමට) නමක් ය" යනු එහි තේරුම ය. ඇතැම් පැවිද්දෙක් මෙසේ වැළඳිය යුතුය, මෙසේ නො වැළඳිය යුතුය, මෙය වැළඳිය යුතුය, මෙය නො වැළඳිය යුතුය, විකාලයෙහි නො වැළඳිය යුතුය යි සබ්‍රහ්මචාරීන් විසින් අවවාදනුශාසනා කරන කල්හි, අපි ගිහිව සිටින කල්හි කැමති දෙයක් කෑවෙමු, කැමති දෙයක් බීවෙමු, දැන් අපට ඒවාට ඉඩක් නැත, ඇතැම් සැදැහැවත්හු විකාලයෙහි ද අපට කෑ යුතු දෙය දෙන්නාහ, අපට නිරායාසයෙන් ලැබෙන ඒ දෙයක් කෑමට බීමට දැන් ඉඩක් නැතයයි නො සතුටු වී ඇතැම් භික්ෂුවක් සිවුරු හැර යයි. එසේ සසුනෙන් පහව යන භික්ෂුවට සසුනෙන් පහවීමට හේතු වූයේ ඔහු තුළ පැවති ආහාර ලෝලත්වය ය. ඔහු සසුනෙන් නෙරපා හැරියේ අනිකකු විසින් නොව ඔහු තුළ ඇති

Non-commercial distribution

ආහාරලෝලත්වයෙනි. ඒ ආහාර ලෝලත්වය සසුනේ භික්ෂූන් පලවා හරින කුම්භීලභය ය.

**ආවට්ටභයන්ති බෝ භික්ඛවේ පඤ්චන්නං කාම ගුණානං අධිවචනං** "මහණෙනි, ආවට්ටභය (දියසුළි බිය) යනු පඤ්චකාම-යන්ට නමක් ය" යනු එහි තේරුම ය. ඇතැම් භික්ෂුවකට නගර-ග්‍රාමයන්ට පිවිසි කල්හි ඒවායේ පස්කම් සුව විඳිමින් වෙසෙන ජනයා දැක පඤ්චකාමාශාව ඇති වීමට ද මොවුන් සේ පස්කම් සුව විඳිමින් ජීවත් වන්නට ධනය ඇත, ශක්තිය ඇත යයි සිතෙයි. ඔහු සිවුරු හැර යයි. එසේ සසුනෙන් පහවීමට හේතු වන භික්ෂූන් සසුනෙන් පහකරවන පඤ්චකාම තණ්හාව ආවට්ට භය ය.

**සුසුකාභයන්ති බෝ භික්ඛවේ මාතුගාමස්සේතං අධිවචනං.** "මහණෙනි, සුසුකාභය යනු මාගමට (ස්ත්‍රියට) නමක් ය" යනු එහි තේරුම ය. අසංවරයෙන් නගරග්‍රාමයන්ට පිවිසෙන ඇතැම් භික්ෂුවකට ශරීරාවයවයන් පෙනෙන සේ නො මනා ලෙස හැඳ සිටින කාන්තාවන් දැක රාගය ඇති වේ. එයින් ඒ භික්ෂුවට බුදු සසුනෙහි රැඳී සිටිය නොහී ගිහි බවට පත් වෙයි. එබැවින් ස්ත්‍රිය මේ ශාසනයෙහි භික්ෂූන්ට ඇති සුසුකා භයයයි වදරන ලද්දේ ය.

**චතස්සෝ දිට්ඨියෝ** :

**61. සයං කතං සුඛදුක්ඛන්ති සච්චතෝ ථෙතතෝ දිට්ඨි උප්පජ්ජති.**

**62. පරං කතං සුඛදුක්ඛන්ති සච්චතෝ ථෙතතෝ දිට්ඨි උප්පජ්ජති.**

**63. සයං කතඤ්ච පරං කතඤ්ච සුඛදුක්ඛන්ති සච්චතෝ ථෙතතෝ දිට්ඨි උප්පජ්ජති.**

**64. අසයං කාරං අපරං කාරං අධිච්චසමුප්පන්නං සුඛ දුක්ඛන්ති සච්චතෝ ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

සත්‍යය වශයෙන් ම ස්ථිර වශයෙන් ම සුඛදුඃඛය ස්වයංකෘතය කියා දෘෂ්ටිය උපදී. ඒ දෘෂ්ටිය උපදින්නේ වේදනාව ආත්මයයි ගන්නවුන්ටය. වේදනාව ආත්මය්යි ගෙන සුවදුක් උපදවන්නේ ඒ වේදනාව ම යයි ඔවුහු ගනිති. එසේ වතහොත් ඒ වේදනාව

Non-commercial distribution

සුවදුක් ඇති වීමට කලින් තිබිය යුතු වන බැවින් එය ශාස්වත දෘෂ්ටියක් වේ.

සත්‍ය වශයෙන් ම ස්ථිර වශයෙන් ම මේ වර්තමාන සුඛදුඃඛය අන්‍ය වේදනාවකින් කරන ලද්දෙකැයි දෘෂ්ටිය උපදී. ඒ දෘෂ්ටිය ගන්නවුන් වර්තමාන වේදනාවෙන් අන්‍ය වේදනාවක්, වේදනා හේතුව ලෙස ගන්නා බැවින් එය උච්ඡේද දෘෂ්ටියට අයත් වේ.

සත්‍ය වශයෙන් ම ස්ථිර වශයෙන් ම මේ සුඛදුඃඛය වේදනා වූ තමා විසින් හා අනිකකින් කරන ලද්දෙකැයි දෘෂ්ටිය උපදී. මෙයත් ඇතැමකුට ශාස්වතෝච්ඡේද දෙකට ම වැටෙන දෘෂ්ටියෙකි.

සත්‍ය වශයෙන් ම ස්ථිර වශයෙන් ම සුඛදුඃඛය කිසි හේතුවකින් නොව ඉබේ ම ඇති වන්නකැයි දෘෂ්ටිය උපදී. එය අහේතුක දෘෂ්ටියෙකි.

මේ දෘෂ්ටිය ගැන මෙකල අසන්නට නැත. මේවා අතීතයේ විසූ ඇතැම් පිරිවැජියන් අතර පැවති දෘෂ්ටිහු ය. තිම්බරුක්ඛ නම් පිරිවැජියෙක් බුදුන් වහන්සේ වෙත එළඹ මේ දෘෂ්ටි සතර ගැන බුදුන් වහන්සේ ගේ අදහස් විචාරා බණ අසා පැහැදී බුදුන් වහන්සේ සරණ ගිය බව නිදානවග්ග සංයුත්තයේ සූත්‍රයක සඳහන් වේ.

මෙහි මුලින් සඳහන් කර ඇත්තේ චතුෂ්ක වශයෙන් දේශිත ධර්ම සපනසක්ය කියා ය. එහෙත් පාළියේ සූසැටක් ධර්ම දැක්වෙන්නේ ය. එය එක්තරා අවුලකි. කෙලෙස් එක්දහස් පන්සියය විභාග කර දක්වන තැන්වල ධර්මසංගනී මූලටීකාවෙහි හා අනුටීකාවෙහි සඳහන් වන්නේ චතුෂ්ක තුදුසෙකි. ධර්ම සපනසෙකි. විභංග අටුවාවෙහි ඛුද්දකවත්ථු විභංග වර්ණනාව ආරම්භයේදී දක්වා ඇත්තේ ද, “ආසව චතුක්කාදයෝ චුද්දසචතුක්කා” කියා ය. මෙහි චතුෂ්ක දෙකක් අධික වී ඇත්තේ පසු කලෙක ඇතුළත් වීමෙනැයි සිතිය හැකිය.

**චතුෂ්ක නිර්දේශය නිමි.**

Non-commercial distribution

# පඤ්චක වශයෙන් දැක්වෙන ධර්ම පන්සැත්තෑව

පඤ්චෝරම්භාගියානි සඤ්ඤෝජනානි, පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤෝජනානි, පඤ්චමච්ඡරියානි, පඤ්චසංගා, පඤ්ච සල්ලා, පඤ්ච චේතෝඛිලා, පඤ්චචේතසෝවිනිබන්ධා, පඤ්චනීවරණානි, පඤ්චකම්මානි ආනන්තරියානි, පඤ්ච දිට්ඨියෝ, පඤ්ච වේරා, පඤ්ච ව්‍යසනා, පඤ්ච අක්ඛන්තියා ආදීනවා, පඤ්ච භයානි, පඤ්ච දිට්ඨධම්ම නිබ්බානවාද.

**පඤ්චෝරම්භාගියානි සඤ්ඤෝජනානි:**

1. **සක්කායදිට්ඨි**
2. **විචිකිච්ඡා**
3. **සීලබ්බතපරාමාසෝ**
4. **කාමච්ඡන්දෝ**
5. **ව්‍යාපාදෝ**

**පඤ්චුද්ධම්භාගියානි සඤ්ඤෝජනානි:**

6. **රූපරාගෝ**
7. **අරූපරාගෝ**
8. **මානෝ**
9. **උද්ධච්චං**
10. **අවිජ්ජා**

ඕර යනු මොබය. උද්ධ යනු උඩය. මේ කාම ලෝකයේ සිට කරන කථාවක් බැවින් කාම ලෝකයට ඕර හෙවත් මොබයයි කියනු ලැබේ. රූපාරූප ලෝක වලට උද්ධ හෙවත් උඩ යයි කියනු ලැබේ. සත්ත්වයාට සසරින් බැහැර වන්නට නො දී එහි බඳින ධර්මයෝ **සඤ්ඤෝජන** නම් වෙති. ඔවුහු දස දෙනෙකි. ඒවායින් සක්කායදිට්ඨි ආදි පස සත්ත්වයා කාම භවයෙහි බඳින බැවින් ඒවාට ඕරම්භාගිය සඤ්ඤෝජනයයි කියනු ලැබේ. අජ්ඣත්ත සඤ්ඤෝජන යනු ද ඒවාට කියන නමකි. මෙහි දූක නිද්දේසයේ ඒවා අජ්ඣත්ත සඤ්ඤෝජන නමින් දක්වා ඇත. මූලපයසීය සූත්‍රයෙහි ද ඒවා අජ්ඣත්ත සඤ්ඤෝජන නමින් දක්වා ඇත්තේ ය.

Non-commercial distribution

ඕරම්භාගිය සඤ්ඤෝජන තිබීම බ්‍රහ්මලෝකයේ ඉපදීමට බාධාවක් නොවේ. ඒවා ඇතියෝ ද ධ්‍යාන වඩා බ්‍රහ්ම ලෝක වල උපදිති. එහෙත් ඔවුන් සිටින්නේ කාම බන්ධනය ඇතිව ය. එබැවින් ඔවුහු නැවත කාම ලෝකයට පැමිණෙති. අනාගාමී මාර්ගයෙන් ඕරම්භාගිය සඤ්ඤෝජනයෙන් සිඳ අවසාන කළ අනාගාමී පුද්ගලයෝ කාම ලෝකයෙහි නැවත නූපදිති. උද්ධම්භාගිය සඤ්ඤෝජන නම් වූ රූප රාගාදි පස ඔවුනට ඉතිරි වී ඇති බැවින් ඔවුහු රූපාරූප භවයන්හි බැඳී සිටිති. ඔවුහු මරණින් පසු රූපභව අරූපභව දෙක්හි උපදිති. කාමබන්ධනය සුන් කර ඇති බැවින් කාම ලෝකයට නැවත කිසි කලෙක ඉපදීම් වශයෙන් නො පැමිණෙති. ඔවුනට ඉතිරි වී ඇති රූපරාගාදි සඤ්ඤෝජන පස උද්ධම්භාගිය සඤ්ඤෝජන නම් වේ. කාම භවයෙහි සත්ත්වයා බඳින ප්‍රධාන සඤ්ඤෝජන කාම රාගය ය. රූපාරූප භවයන්හි බඳින ප්‍රධාන සඤ්ඤෝජන රූපරාග අරූපරාග දෙකය. විචිකිච්ඡා උද්ධච්චාදීන්ගේ සඤ්ඤෝජන භාවය අප්‍රකට ය. ඒවා සඤ්ඤෝජන වන්නේ කාමරාගාදීන්ට එක්වීම් වශයෙනි.

**පඤ්ච මච්ඡරියානි :**

**11. ආවාසමච්ඡරියං** **13. ලාභමච්ඡරියං**
**12. කුලමච්ඡරියං** **14. වණ්ණමච්ඡරියං**
**15. ධම්ම මච්ඡරියං**

මච්ඡරිය පස යට ද්වික නිර්දේශයේ විස්තර කරන ලද්දේ ය.

**පඤ්චසංගා :**

**16. රාගසංගෝ** **18. මෝහසංගෝ**
**17. දෝසසංගෝ** **19. මානසංගෝ**
**20. දිට්ඨිසංගෝ**

සංග යනු පුද්ගලයන් කෙරෙහි හා වස්තූන් කෙරෙහි එල්ලෙන ධර්මයෝ ය. මාගේ බිරියය, මාගේ සැමියා ය, මාගේ දරුවෝ ය, මාගේ මාපියෝ ය, සහෝදරයෝ ය කියා පුද්ගලයන් කෙරෙහි ද මාගේ ගෙයය, වත්තය, කුඹුරය, වාහනයය, මුදල්ය, ඇඳුම්ය, පැළඳුම්ය යනාදි වශයෙන් වස්තූන්හි ද රාගය එල්ලෙන්නේ ය. යමකු ගැන ද්වේෂය ඇති වූ කල්හි මොහු මාගේ සතුරාය, මොහුට

Non-commercial distribution

මෙසේ කරන්නට ඕනෑය කියා ද්වේෂය සතුරාගේ කයෙහි එල්ලෙන්නේ ය. මෝහය අනිත්‍ය දුඃඛ අනාත්ම වූ ස්කන්ධයන් නිත්‍ය සුඛ ආත්ම වශයෙන් ගෙන ඒවායේ එල්ලෙන්නේ ය. ඒවා නො හැර ගෙන සිටින්නේ ය. මානය තමාගේ පඤ්චස්කන්ධය උසස් කොට එහි එල්ලෙන්නේ ය. දිෂ්ටිය ද පඤ්චස්කන්ධය ආත්ම වශයෙන් ගෙන එහි එල්ලෙන්නේ ය.

පඤ්ච ඡින්දේ පඤ්ච ජහේ - පඤ්ච චුත්තරි භාවයේ
පඤ්ච සංගාතිගෝ භික්ඛු - ඕඝතිණ්ණෝති වුච්චති.

(ධම්මපද භික්ඛුවග්ග)

**තේරුම :-**

සත්ත්වයා යට අපාය භූමිවලට ගෙන යන්නා වූ ඕරම්භාගිය සංයෝජන පස පයෙහි බැඳි රැහැනක් ආයුධයකින් සිඳින්නාක් මෙන් සෝවාන් සකෘදගාමී අනාගාමී යන මාර්ගත්‍රයෙන් සිඳෙන්නේ ය. මතු බ්‍රහ්ම ලෝකයන්ට සත්ත්වයා ගෙන යන්නා වූ උද්ධම්භාගිය සංයෝජනයන් ගෙළ බැඳි රැහැනක් සිඳින්නාක් මෙන් අර්හත් මාර්ග ඥානයෙන් සිඳෙන්නේ ය. උද්ධම්භාගිය සංයෝජනයන් ප්‍රහාණය කරනු පිණිස ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය ධර්ම පස වඩන්නේ ය. රාගාදි පඤ්ච සංගයන් ඉක්ම වූ භික්ෂු තෙමේ චතුරෝඝය එතර කෙළේ යැයි කියනු ලැබේ.

**පඤ්චසල්ලා :**

**21. රාගසල්ලං** **23. මෝහසල්ලං**
**22. දෝසසල්ලං** **24. මානසල්ලං**
**25. දිට්ඨිසල්ලං**

හුල් ශරීරයට කා වැදෙන්නාක් මෙන් චිත්ත සන්තානයට කා වැදෙන ධර්මයෝ සල්ල නම් වෙති. රාගාදීහු ලෙහෙසියෙන් ඉවත් කළ නො හෙන පරිදි චිත්ත සන්තානයෙහි කා වැදී සිටින්නෝ ය. එබැවින් රාගාදි ධර්මයෝ පස් දෙන සල්ල නම් වෙති.

**පඤ්ච චේතෝඛීලා:**

**26. සත්ථරි කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති.**

Non-commercial distribution

27. **ධම්මේ කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති.**

28. **සංඝෙ කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති**

29. **සික්ඛාය කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති**

30. **සබ්‍රහ්මචාරීසු කුපිතෝ හෝති අනත්තමනෝ ආහත-චිත්තෝ ඛිලජාතෝ.**

ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයි. ශාස්තෘන් වහන්සේ ගැන සොයමින් වෙහෙසෙයි. එසේ යයි විනිශ්චයට නො පැමිණෙයි. නො පැහැදෙයි. මේ එක් චේතෝඛිලයෙකි.

ධර්මය කෙරෙහි සැක කරයි. ධර්මය ගැන සොයමින් වෙහෙසෙයි. එසේය යි විනිශ්චයට නො පැමිණෙයි. නො පැහැදෙයි. මේ එක් චේතෝඛිලයෙකි.

සංඝයා කෙරෙහි සැක කරයි. සංඝයා ගැන සොයමින් වෙහෙසෙයි. නිශ්චයකට නො පැමිණෙයි. නො පහදී. මේ එක් චේතෝඛිලයෙකි.

ශික්ෂාව ගැන සැක කරයි. සොයමින් වෙහෙසෙයි. නිශ්චය-කට නො පැමිණෙයි. නො පහදියි. මේ එක් චේතෝඛිලයෙකි.

සබ්‍රහ්මචාරීන් කෙරෙහි කිපුණේ වෙයි. නො සතුටු සිත් ඇත්තේ වෙයි. ගැටුණු සිත් ඇත්තේ වෙයි. තද සිත් ඇත්තේ වෙයි. මේ එක් චේතෝඛිලයෙකි.

මේ චේතෝඛිල දේශනාව පුද්ගලාධිෂ්ඨාන දේශනාවකි. ධර්ම වශයෙන් මෙහි ඇත්තේ විචිකිත්සා ද්වේෂ යන ධර්ම දෙකය. **චේතෝඛිල** යනු ශීල සමාධි ප්‍රඥාවන් වැඩීමට, කෙලෙස් දුරු කිරීම සඳහා උත්සාහ කිරීමට, නො නැමෙන වියළි දණ්ඩක් මෙන් සිත තද කරන ධර්මයෝ ය. ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කිරීමය යනු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇති රැස් විහිදෙන ශරීරයක් තිබිය හැකි ද? අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහි සියල්ල දැනීමට සමත් සර්වඥතා ඥානයක් තිබිය හැකිද? කියා සැක කිරීම ය. ධර්මය ගැන සැක කිරීමය යනු සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් ඇති ත්‍රිපිටක බුද්ධ වචන සංඛ්‍යාත ධර්මයක් ඇත යයි කියති. එය සත්‍යයක්ද? එවැනි ධර්මයක් ඇත්තේ ද? මේ ත්‍රිපිටකය කියන

Non-commercial distribution

ධර්මය බුද්ධභාෂිතයක් ම ද? පසු කලෙක භික්ෂූන් විසින් ඇති කරන ලද්දක් ද? විදර්ශනාවෙන් ලැබෙන සතර මාර්ග සතර ඵලයන් හා නිවනක් ඇත යයි කියති. මේ කියන ධර්ම සත්‍ය වශයෙන් ම ඇති ඒවා ද? මේවා යම් යම් අයගේ කල්පනා මාත්‍ර ද කියා සැක කිරීම ය. සංඝයා ගැන සැක කිරීම ය යනු සුපටිපන්න උජුපටිපන්නාදි ගුණ වලින් හෙබි අෂ්ටාර්‍ය්‍ය පුද්ගල පිරිසක් ඇත යයි කියති. සත්‍යය වශයෙන් එබඳු පිරිසක් ඇත්තේ ද? නැත්තේ ද? කියා සැක කිරීමය. ශික්ෂාවෙහි සැක කිරීම යනු අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යයි ශික්ෂාත්‍රයක් ඇති බව කියති. ඒ කියන ශික්ෂාත්‍රය සත්‍ය වශයෙන් ම ඇතියක් ද? කියා සැක කිරීමය. මෙවැති සැක ඇති පුද්ගලයාට ක්ලේශප්‍රහාණය සඳහා සමථ විදර්ශනාවන්හි නො යෙදිය හැකිය. ඔහුගේ සිත ඒවාට නො නැමිය හැකි ලෙස කණුවක් මෙන් තදව පවතී. ඒ තද බව කරන්නේ විචිකිච්ඡාව ය. ඒ චේතෝඛිලයකි. මේ ශාසනයෙහි පිළිවෙත් පිරීම භික්ෂූන් සමගියෙන් කරන ක්‍රියාවෙකි. අන්‍ය භික්ෂූන් හා කෝපයෙන් සිටින භික්ෂුව ගේ සිත ප්‍රතිපත්තියට නො නැමී තදව පවතී. එබැවින් කෝපය චේතෝඛිලයෙකි.

**පඤ්ච චේතසො විනිබන්ධා:**

**31.** **කාමෙ අවිගතරාගෝ හෝති අවිගතඡන්දෝ අවිගත-පේමෝ අවිගතපිපාසෝ අවිගතපරිළාහෝ අවිගත තණ්හෝ**

**32.** **කායේ අවිගතරාගෝ හෝති.**

**33.** **රූපේ අවිගතරාගෝ හෝති.**

**34.** **යාවදත්ථං උදරාවදෙහකං භුඤ්ජිත්වා සෙය්‍යසුඛං පස්ස සුඛං මිද්ධ සුඛං අනුයුත්තෝ විහරති.**

**35.** **අඤ්ඤතරං දේවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතේන වා තපේන වා බ්‍රහ්මචරියේන වා දේවෝ වා භවිස්සාමි දේවඤ්ඤතරෝවාති.**

කාමයන් කෙරෙහි පහ නො වූ රාගය ඇත්තේ වෙයි, පහ නො වූ ඡන්දය ඇත්තේ වෙයි, පහ නොවූ ප්‍රේමය ඇත්තේ වෙයි,

Non-commercial distribution

පහ නො වූ පිපාසාව ඇත්තේ වෙයි, පහ නො වූ දාහය ඇත්තේ වෙයි, පහ නොවූ තෘෂ්ණාව ඇත්තේ වෙයි.

ස්වීය කයෙහි පහ නො වූ රාගය ඇත්තේ වෙයි.
පිටත රූපයන්හි පහ නො වූ රාගය ඇත්තේ වෙයි.

ඇති තාක් කුස පිරෙන තුරු ආහාර වළඳා යහනින් ලැබෙන සුවය යහනෙහි පාර්ශ්වවලින් ලැබෙන සුවය නිදි සුවය විඳීමෙහි යෙදුණේ වෙයි.

මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හෝ මහේශාඛ්‍ය දෙවියෙක් හෝ වන්නෙමිය සාමාන්‍ය දෙවියෙක් හෝ වන්නෙමිය යි එක්තරා දේව නිකායක් පතා බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි යෙදෙයි.

මේ චේතසෝ නිබන්ධ පස ය. මෙයද පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙකි. ධර්ම වශයෙන් චේතෝඛිල පස ම තෘෂ්ණාව වූ එක ම ධර්මයෙකි. මේ ධර්මයෝ මීදී පලා යා නො හෙන පරිදි කුඩා සතකු මිටින් අල්ලා ගන්නාක් මෙන් තද කර ගන්නාක් මෙන් පැන යා නො හෙන පරිදි සත්ත්වයා ගේ සිත අල්ලා ගනිති. බැඳ ගනිති. ඒ බැවින් ඔවුහු **චේතසෝ විනිබන්ධ** නම් වෙති. විනිබන්ධයන් විසින් බැඳ ගන්නා ලද සිත සමථ විදර්ශනාවන්ට නො නැමේ. කාමයන් හි ම ඇලී සිටී. එබැවින් පුද්ගලයාට සසරින් එතර විය නො හැකි වේ.

**පඤ්ච නීවරණානි:**

**36**. **කාමච්ඡන්ද නීවරණං** **37**. **ව්‍යාපාද නීවරණං** **38**. **ථීනමිද්ධ නීවරණං** **39**. **උද්ධච්චකුක්කුච්ච නීවරණං** **40**. **විචිකිච්ඡා නීවරණං**.

සත්ත්වයා හට ධ්‍යාන මාර්ග ඵල නිර්වාණයන් කරා යන මග ආවරණය කරන, ඒවාට පැමිණෙන්ට නො දෙන ධර්මයෝ **නීවරණ** නම් වෙති. සත්ත්වයාගේ චිත්ත සන්තානයෙහි නූපන් කුශලයන් ඇති වන්නටත් උපන් කුශලයන් ගේ පැවැත්මට හා වැඩීමටත් නො දී ආවරණය කරන ධර්මයෝ නීවරණයෝ ය.

Non-commercial distribution

මේ නීවරණයෝ සත්ත්වයන්ට ආත්මාර්ථය දැන ගැනීමට හා පරාර්ථය දැන ගැනීමට ද ඓහලෞකිකාර්ථය හා පාරලෞකිකාර්ථය දැන ගැනීමට ද නොදී ආවරණය කරන්නෝ ය.

**"පඤ්චිමේ භික්ඛවේ ආවරණා නීවරණා චේතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා"**

යනුවෙන් මේ ධර්මයෝ පස්දෙනා කුශලය ආවරණය කරන්නෝ ය, වසන්නෝ ය, සිත මැඩ නැඟ සිටින්නෝ ය ප්‍රඥාව දුබල කරන්නෝ ය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය.

**පඤ්චිමේ භික්ඛවේ නීවරණා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤා නිරෝධ භාගියා විඝාතපක්ඛියා අනිබ්බාන සංවත්තනිකා.**

යනුවෙන් මේ නීවරණයෝ පස් දෙන සත්ත්වයන් අන්ධ කරන්නෝ ය, ඇස් නැතියන් කරන්නෝ ය, අඥයන් කරන්නෝය, ප්‍රඥාව නසන්නෝ ය, දුක් ගෙන දෙන්නෝය, නිවන් ලැබීමට හේතු නො වන්නෝ යයි ද වදරා ඇත්තේ ය.

කාමච්ඡන්දය ව්‍යාපාදය ථිනමිද්ධය උද්ධච්ච කුක්කුච්චය විචිකිච්ඡාවය යි නීවරණ පසෙකි. **ධම්මසංගණියෙහි** වනාහි අවිද්‍යාව ද නීවරණයක් වශයෙන් ගෙන නීවරණ සයක් දක්වා ඇත්තේ ය.

කාමච්ඡන්ද යන මෙහි කාම යනුවෙන් කියැවෙන්නේ ආශාව ය. ඡන්ද යනුවෙන් කියැවෙන්නේ ද ආශාව ය. සමානාර්ථ ඇති වචන දෙකක් එක් තැන යොදන්නේ අධිකාර්ථයක් දැක්වීම පිණිස ය. කාම ඡන්ද යන වචන දෙක එක් කොට එක් ධර්මයක් දැක්වීම සඳහා යොද ඇත්තේ කැමැත්ත යනුවෙන් කියැවෙන අර්ථය දෙගුණ කොට දැක්වීම පිණිස ය. එ බැවින් **කාමච්ඡන්ද** යනුවෙන් කියැවෙන්නේ බලවත් රාගය ය. රූප රාගය අරූප රාගය යන දෙක හැර සියලු තණ්හාවන් කාමච්ඡන්දයට සංග්‍රහ වන්නේ ය. නීවරණ පසක් වුව ද නීවරණ භාවය අතිශයින් ඇති

Non-commercial distribution

බව කිය යුත්තේ කාමච්ඡන්දයෙහි ය. දන් දීමෙන් වළක්වන්නේ සිල් රැකීමෙන් වළක්වන්නේ පැවිදිවීමෙන් වළක්වන්නේ පැවිදි වූවන් නැවත ගිහි බවට යවන්නේ භාවනා කරන්නවුන්ට වඩා බාධා කරන්නේ මේ කාමච්ඡන්ද නීවරණය ය.

ව්‍යාපාද නීවරණය යනු කුශල ධර්මයන් ආවරණය කරන ද්වේෂය ය. මොහු මට අතීතයේ අනර්ථ කෙළේ ය, දැනට ද කරන්නේ ය, මතුත් කරන්නේ ය. මාගේ අඹුදරු ආදි ප්‍රියයන්ට මොහු පෙර අනර්ථ කෙළේ ය, දැනට ද කරන්නේ ය, මතු ද කරන්නේ ය. මාගේ සතුරන්ට මොහු උපකාර කෙළේ ය, දැනට ද කරන්නේ ය, මතු ද කරන්නේ ය ය යි මෙසේ නවාකාරයකින් ද්වේෂය ඇති වේ. ඒ කරුණුවලින් එකකුදු නැති ව අස්ථානයෙහි ද ව්‍යාපාදය ඇති වන්නේ ය. අනේකාකාරයෙන් ඇති වන්නා වූ ඒ ව්‍යාපාදය ව්‍යාපාදනීවරණ නම් වේ. සිල් සමාදන් වීමට භාවනා කිරීමට විශේෂයෙන් බාධා කරන්නේ ඒකක නිර්දේශයේ **අරති** නමින් දක්වන ලද සියුම් ද්වේෂය ය.

**ථීනමිද්ධ** නීවරණ යන මෙහි ථීනය මිද්ධය කියා අකුශල චෛතසික දෙකක් ඇත්තේ ය. බරක් පටවන ලද්දක් මෙන් සිතට ඉක්මනින් ක්‍රියා කළ නො හෙන පරිදි සිත තද කර ගෙන යට කර ගෙන සිට සිත දුබල කරන සිත අකර්මණ්‍ය කරන ස්වභාවය **ථීන** නම් වේ. එය එක් අකුශල චෛතසිකයෙකි. එසේ ම චෛතසික යන් තද කරගෙන යට කරගෙන දුබල කරන අකර්මණ්‍ය කරන ස්වභාවය **මිද්ධ** නම් වේ. එය ද එක් අකුශල චෛතසිකයෙකි. ථීනමිද්ධයන් ඇති වන කල්හි සිත කුශල් කිරීමෙහි අලස වේ. කිරීමට ඉදිරිපත් නො වෙයි. ථීනමිද්ධයන් බලවත් ව ඇති වන කල්හි ගමනාදි ක්‍රියා සිදු කිරීමට ද නො සමත් වන තරමට චිත්තචෛතසිකයෝ දුබල වෙති. ඒ අනුව රූපකය ද දුබල වේ. එයින් පුද්ගලයා නිද වැටේ. නිදීම ද කරයි. ථීන මිද්ධ දෙක වෙන් වෙන් වූ චෛතසික දෙකක් වුව ද ඇති වන කල්හි එක් සිතේ ම එකට ඇති වන ධර්ම දෙකකි. ථීනයෙන් තොර ව මිද්ධය හෝ මිද්ධයෙන් තොරව ථීනය හෝ කිසි කලෙක නූපදී. එද මේ ධර්ම දෙක එක් නීවරණයක් වශයෙන් දේශනය කිරීමේ හේතුවක් හැටියට

Non-commercial distribution

සැලකිය හැකිය. කෘත්‍ය වශයෙන් හා උත්පත්ති හේතු වශයෙන් ද විරුද්ධ ධර්ම වශයෙන් ද එකිනෙකට සමාන බැවින් ථිනමිද්ධ දෙක එක් නීවරණයක් කොට දේශනා කරන ලදැයි කියනු ලැබේ. අලස බවට පැමිණවීම ථිනමිද්ධ දෙක්හි ම කෘත්‍ය ය. ඒ දෙක ම උපදිනුයේ තන්දි විජම්භිතා යන හේතු නිසා ය. ඒ දෙක ම වීර්‍ය්‍යයට විරුද්ධ ය. මෙසේ ථිනමිද්ධ දෙක කෘත්‍ය වශයෙන් හා උත්පත්ති හේතු වශයෙන් ද විරුද්ධ ධර්ම වශයෙන් ද සමාන වේ.

**උද්ධච්චකුක්කුච්ච** නීවරණ යන මෙහි ද උද්ධච්චය කුක්කුච්චය කියා ධර්ම දෙකකි. උද්ධච්චය යට ත්‍රිකනිර්දේශයේ විස්තර කරන ලද්දේ ය. කුක්කුච්ච යනු කළ නො කළ පව් පින් සම්බන්ධයෙන් ඇති වන පසු තැවීම ය. පව් කරන අවස්ථාවේදී පාපකාරීන්ට එය මිහිරි ය. එසේ පව් කළවුන්ට පසු කාලයේ දී දහම් ඇසීම් ආදියෙන් එහි දෝෂය, එයින් තමන්ට විය හැකි නපුර දැන ගැනීමෙන් මා විසින් මෙනම් පාපයක් කරනු ලැබීය යි කළ පාපය ගැන සිත් තැවුලක් ඇති වේ. ඒ කුක්කුච්ඡය ය. කැපය නිරවද්‍යය ය යන හැඟීමෙන් ඇතැම් වරදවල් කළ පැවිද්දන්ට ද එය දැන ගත් පසු ඒ ගැන කුක්කුච්චය ඇති වේ. ඇතැම්හු ශක්තිය ඇති ධනය ඇති කාලයේ කිසි පින්කමක් නො කොට ප්‍රමාදයෙන් කාලය ගත කොට මහලු වයසට පැමිණ දුබල වූ කල්හි දැන් මට මරණයට ළංව ඇත්තේ ය. මා විසින් නොයෙක් සපන්කම් කර ඇතත් පරලොවට පිහිට වන දෙයක් කර නැත. මාගේ ජීවිතය හිස්ය. මට මරණින් මතු අපායට යන්නට සිදුවිය හැකි ය කියා පසු තැවෙති. එය කුක්කුච්චය ය. කුක්කුච්චය කුශලයක් නො ව මරණින් මතු අපායෝත්පත්තියට හේතු වන අකුශලයෙකි. කුක්කුච්චය නිසා අතීතයේ කොට අමතක වී තුබූ පව් කම්වලට ද පණ නැගේ. කෙනකුට අන්තිම කාලයේ ද පරලොවට පිහිට වන පින් කිරීමට අවකාශ ඇත. ඒ කාලයේ උද්ධච්චකුක්කුච්චයන් නැඟී සිටිය හොත් පුද්ගලයාගේ සිත එයට නො නැමේ. එහෙයින් මෙය නීවරණයක් වෙයි. භාවනාවෙහි යෙදෙන අයට ද උද්ධච්ච කුක්කුච්චයන් නැඟී සිටිය හොත් සමාධිය හා ප්‍රඥාව දියුණු කිරීම දුෂ්කර වේ. එබැවින් ද මෙය නීවරණයක් ය යි කිය යුතු ය.

Non-commercial distribution

කුක්කුච්චය සැම කල්හි ඇති වන්නේ උද්ධච්චය සමග ම ය. උද්ධච්චය කුක්කුච්චයෙන් තොර ව ද ඇති වේ. නීවරණයක් වශයෙන් ගණන් ගත යුත්තේ උද්ධච්ච කුක්කුච්ච දෙක එකට ම ඇති වන කල්හි ය. මේ ධර්ම දෙක එක් නීවරණයක් වශයෙන් වදරා ඇත්තේ ද කෘත්‍ය හේතු ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ වශයෙන් ඒ දෙක සමාන වන බැවිනි. උද්ධච්ච කුක්කුච්ච දෙකින් ම කරන්නේ සිත නො සන්සුන් කිරීමය. දෙකට ම හේතු වන්නේ ඤාති ව්‍යසනාදිය ගැන කල්පනා කිරීම ය. මේ ධර්ම දෙක ම සමථයට විරුද්ධය. මෙසේ කෘත්‍ය හේතු ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ වශයෙන් සම වන බැවින් උද්ධච්ච කුක්කුච්ච යන චෛතසික ධර්ම දෙක එක් නීවරණයක් වශයෙන් වදරා ඇත්තේ ය.

**විචිකිච්ඡා** නීවරණ යනු බුද්ධාදීන් ගැන ඇති වන සැකය ය. විචිකිච්ඡාව ත්‍රික නිර්දේශයේ විචිකිච්ඡාසඤ්ඤෝජන යන නමින් විස්තර කර ඇත්තේ ය. විචිකිච්ඡාව හෙවත් සැකය ඇති තැනැත්තා ගේ සිත කුශලයට නො නැමේ. විචිකිච්ඡාව ඇත්තේ කුශලයන් කළ ද මැනවින් නො කරයි. සැලකිල්ලෙන් නො කරයි. විචිකිච්ඡාවෙහි නීවරණ භාවය ප්‍රකට ය.

කාමච්ඡන්දදි ඒ ඒ නීවරණයන් ඇතිවීමේ වෙන් වෙන් වූ හේතු ද ඇත්තේ ය. සර්වසාධාරණ හේතුවක් ද ඇත්තේ ය. එනම් **අයෝනිසෝමනසිකාරය** ය. එබැවින් මෙසේ වදරන ලදී.

“අයෝනිසෝ භික්ඛවේ, මනසිකරෝතෝ අනුප්පන්නෝ චේව කාමච්ඡන්දෝ උප්පජ්ජති. උප්පන්නෝච කාමච්ඡන්දෝ භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නෝ ච ව්‍යාපාදෝ උප්පජ්ජති, උප්පන්නෝච ව්‍යාපාදෝ භීයොභාවාය වේපුල්ලාය සංවත්තති. අනුප්පන්නඤ්ච ථිනමිද්ධං උප්පජ්ජති, උප්පන්නඤ්ච ථිනමිද්ධං භීයොභාවය වේපුල්ලාය සංවත්තති, අනුප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං භීයොභාවාය වේපුල්ලාය සංවත්තති, අනුප්පන්නාච විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා භීයොභාවාය වේපුල්ලාය සංවත්තති”

Non-commercial distribution

**තේරුම :**

මහණෙනි, වැරදි ලෙස අකාරණානුකූල ව මෙනෙහි කරන්නහුට නූපන් කාමච්ඡන්දය උපදී. උපන් කාමච්ඡන්දය දියුණු වේ. නූපන් ව්‍යාපාදය උපදී. උපන් ව්‍යාපාදය දියුණු වේ. නූපන් ථිනමිද්ධය උපදී. උපන් ථිනමිද්ධය දියුණු වේ. නූපන් උද්ධච්චකුක්කුච්චය උපදී. උපන් උද්ධච්චකුක්කුච්චය දියුණු වේ. නූපන් විචිකිච්ඡාව උපදී. උපන් විචිකිච්ඡාව දියුණු වේ.

**පඤ්ච කම්මානි ආනන්තරියානි:**

**41. මාතා ජීවිතා වෝරෝපිතා හෝති.**

**42. පිතා ජීවිතා වෝරෝපිතෝ හෝති.**

**43. අරහන්තෝ ජීවිතා වෝරෝපිතෝ හෝති**

**44. දුට්ඨෙන චිත්තේන තථාගතස්ස ලෝහිතං උප්පාදිතං හෝති.**

**45. සංඝෝ භින්නෝ හෝති.**

මවගේ දිවි තොර කිරීමය, පියාගේ දිවි තොර කිරීමය, රහත් නමකගේ දිවි තොර කිරීමය, ද්වේෂ සහගත සිතින් ලොවුතුරා බුදුකෙනකුගේ ශරීරයේ ලේ ඉපදවීමය, සංඝයා භේද කිරීමය, මේ අකුශල කර්මයෝ **ආනන්තර්‍ය කර්මයෝ** ය.

ආනන්තර්‍ය කර්මය යනු මරණයට අනතුරුව දෙවන භවයේ ඒකාන්තයෙන් විපාක දෙන කර්මය ය. එක් එක් පුද්ගලයකුට මතු විපාක දීමට සමත් බොහෝ කුශලාකුශල කර්ම ඇත්තේ ය. මරණින් මතු දෙවන ප්‍රතිසන්ධිය ඇති කරන්නේ ඒ කුශලා කුශලකර්මයන් අතුරෙන් යම් කිසි එක් කර්මයකිනි. මව මැරීම ආදි කර්ම පස අතුරෙන් යම් කිසිවක් කර ඇති තැනැත්තාගේ, අන්‍ය සියලුම කුශාලකුශල කර්මයන් යටපත් කොට ඒ කර්මය ම දෙවන ජාතියේ මුලින් ම විපාක දෙන්නේ ය.

“තස්ස විපාකං පටිබාහිස්සාමීති සකලචක්කවාළං මහා චේතිප්පමාණෙහි කඤ්චන ථූපෙහි පූරෙත්වා පි සකලචක්කවාළං

Non-commercial distribution

පුරෙත්වා තිසින්න භික්ඛුසංඝස්ස මහා දනං දත්වාපි බුද්ධස්ස භගවතෝ සංඝාටිකණ්ණං අමුඤ්චිත්වා විචරිත්වා පි කායස්ස භෙද නිරයමෙව උප්පජ්ජති.

(ඤාණවිභංගට්ඨකථා)

තේරුම:

"ඒ ආනන්තර්යය කර්මයාගේ විපාකය වළක්වමියි මුළු සක්වළ පුරා රුවන්වැලි මහසෑය පමණ ඇති චෛත්‍යවලින් පුරවාද, මුළු සක්වළ පුරා වැඩ සිටින මහා සංඝයාහට මහා දනයක් දී බුදුන් වහන්සේගේ සඟළ සිවුරු කොන නො හැර හැසිර ද මරණින් මතු නරකයෙහි ම උපදී"

මාතෘඝාත පිතෘඝාත කර්මදෙක දක්වා ඇත්තේ මනුෂ්‍යයන් සම්බන්ධයෙනි. මනුෂ්‍ය ජාතික දරුවකු විසින් මනුෂ්‍ය ජාතික වූ ම මවගේ හෝ පියාගේ දිවි තොර කිරීමෙන් ම කර්මය ආනන්තර්‍ය්‍ය වේ. මනුෂ්‍ය දරුවකු විසින් තිරිසන්ගත මවකු හෝ පියකු මැරුව ද තිරිසනකු විසින් මනුෂ්‍ය වූ හෝ තිරිසන් වූ හෝ මවක් හෝ පියෙක් මරණ ලදුයේ නම් ඔහුගේ කර්මය ආනන්තර්යය නො වේ. ආනන්තර්‍ය්‍ය කර්මයට ළංවන බරපතල අකුශලයක් ඔහුට වේ. අරහන්තඝාතනය ආනන්තර්‍ය්‍ය වන්නේ ද මනුෂ්‍ය රහත් කෙනකු මැරීමෙනි. අමනුෂ්‍යයන් අතර ද රහතුන් සිටිය හැකි ය. අමනුෂ්‍ය රහතුන් මැරීමේ කර්මය ආනන්තර්‍ය්‍ය නොවේ. බරපතල අකුශල කර්මයක් වේ. සෝවාන්, සකෘදගාමී, අනාගාමී, ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ දිවි නැසීම ද ආනන්තර්‍ය්‍ය කර්මයට ළං වන බරපතල අකුශල කර්මයකි. මරණු සඳහා යම් කිසි පුද්ගලයකුට පහර දුන් පසු හෝ විෂ දුන් පසු හෝ ඔහු රහත් වී ඒ ආබාධයෙන් කලුරිය කළේ නම් පහර දුන් පුද්ගලයාට ආනන්තර්‍ය්‍ය කර්මයක් වේ. පෘථග්ජන පුද්ගලයකුට පිරිනැමූ දනයක් ඔහු රහත් වී වැළඳුයේ ද, දයකයාට හිමි වන්නේ පෘථග්ජනයකුට දීමේ කුශලය ය. එයට හේතුව ප්‍රාණඝාත කර්මයාගේ සිද්ධිය සත්ත්වයා ගේ මරණයෙන් සිදු වීම ය. මරනු සඳහා පහර දුන ද එයින් නො මළහොත් ප්‍රාණඝාත කර්මය සිදු නො වේ. දනමය කුශලයේ සිද්ධිය ප්‍රතිග්‍රාහකයාගේ පරිභෝගයෙන් වන්නේ නොවේ. ප්‍රතිග්‍රාහකයා ගේ පරිභෝග කිරීම

Non-commercial distribution

හෝ නො කිරීම දනමය කුශලයාගේ සිද්ධාසිද්ධියට කරුණක් නොවේ. එය දනවස්තුව දුන් සැටියේ ම සිද්ධියට පැමිණේ. එබැවින් දනය රහත් වී වැළඳීමෙන් දයකයාට අමුතු පිනක් නොවේ.

බුදුවරුන්ගේ ජීවිතය කිසිවෙකුට නො නැසිය හැකිය. බුද්ධඝාතක කර්මයක් කිසිකලෙක සිදු නො වේ. බුද්ධ ශරීරයේ සම ද උන්වහන්සේගේ කැමැත්ත නැතිව කිසිවකුට සිදුරු නො කළ හැකි ය. දේවදත්ත විසින් බුදුන් වහන්සේ නැසීම සඳහා පෙරළා යැවූ ගලෙන් ගැළ වී ගිය පතුර තථාගතයන් වහන්සේගේ පා කෙළවර වැදී පොරෝ පහරක් දුන් කලෙක මෙන් තථාගතයන් වහන්සේගේ ශරීරය කාගෙන ගියේ ය. එහෙත් සම සිදුරු නොවීය. එතැනට ලේ එකතු විය. එසේ කිරීම ලෝහිතුප්පාද නම් ආනන්තර්‍ය්‍ය කර්මය ය. ජීවක වෛද්‍යවරයා තථාගතයන් වහන්සේගේ කැමැත්ත පරිදි සැතකින් සම පලා දූෂිත ලෙය ඉවත් කොට ඒ ආබාධය සුව කෙළේ ය.

බුදුරදුන් පිරිනිවීමෙන් පසු චෛත්‍ය බිඳීම, බෝ රුක් සිඳීම, ධාතූන් නැති කිරීමට උපක්‍රම කිරීම යන මේවා ද ආනන්තර්‍ය්‍ය කර්මයට ළං වන බලවත් පාප කර්මයෝ ය. බුදු පිළිමය උද්දේශික චෛත්‍යය වන බව ද සැලකිය යුතුය. සධාතුක චෛත්‍යයකට හෝ බුදු පිළිමයකට බාධා වන බෝ අතු සිඳ දැමීම වරද නැති බව කියා තිබේ. චෛත්‍යය බිඳ ගෙන යන බෝ මුල් ඉවත් කිරීම ද සුදුසු බව කියා ඇත. බෝධිඝර බෝධිප්‍රාකාර මලසුන් රැකීම සඳහා බෝ අතු හෝ බෝ මුල් කැපීම වරදය. මලසුන් ගෙයක සර්වඥධාතූන් තැන්පත් කර ඇති නම් එය රැකීම පිණිස බෝ මුල් බෝ අතු ඉවත් කිරීම සුදුසු ය.

සංඝභේද කර්මය කළ හැක්කේ උපසපන් භික්ෂුවකටය. ගිහියකුට හෝ අනුපසම්පන්න පැවිද්දකුට එය නො කළ හැකි ය. සංඝකර්ම කළ යුත්තේ සීමාවකට රැස් වූ සියලු භික්ෂූන්ගේ ම සමානච්ඡන්දයෙනි. එක් භික්ෂුවකුදු විරුද්ධ නම් කර්මය කිරීම නුසුදුසු ය. සීමාවකට සංඝයා රැස් වූ කල්හි යම් කිසි භික්ෂුවක් රැස් වූ සංඝයාගෙන් කොටසක් තමාට පක්ෂ කර ගෙන පාමොක් උදෙසීම හෝ අන් සංඝ කර්මයක් හෝ කෙළේ නම් එය සංඝයා

Non-commercial distribution

භේද කිරීම ය. ආනන්තර්යා කර්මයන්ගෙන් වඩා බලවත් අකුශල කර්මය සංඝභේද කර්මය ය. "සංඝභේදකෝ ආපායිකෝ නේරයිකෙද කප්පට්ඨෝ අතේකිච්ඡෝ" යනුවෙන් සංඝ භේදකයා කල්පයක් අපා දුක් විඳින්නකු බව **පරිවාර පාළියෙහි** දක්වා ඇත්තේ ය. ඉතිරි ආනන්තර්යා කර්ම කළවුන් ගැන අපා දුක් විඳීමේ කාල නියමයක් නැත. ආනන්තර්ය කර්ම පිළිබඳ අටුවාවල දැක්වෙන විස්තරයත් අවුල් එකකි. ඒවායේ තවත් මුද්‍රණ දෝෂ ලිපි දෝෂ ද ඇත්තේ ය. ඒවා ගැන විස්තර කරන්නට ගිය හොත් අතිදීර්ඝ වන බැවින් ආනන්තර්යා කර්ම විස්තරය මෙතෙකින් අවසන් කරමු.

**පඤ්ච දිට්ඨියෝ:**

46. **සඤ්ඤී අත්තා හෝති අරෝගෝ පරම්මරණා.**

47. **අසඤ්ඤී අත්තා හෝති අරෝගෝ පරම්මරණා.**

48. **නේවසඤ්ඤී නාසඤ්ඤී අත්තා හෝති අරෝගෝ පරම්මරණා.**

49. **සතෝ වා පන සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.**

50. **දිට්ඨධම්ම නිබ්බානං වා පනේකේ අභිවදන්ති.**

මරණින් මතු ද සංඥා සහිත ආත්මය අවිනෂ්ට ව පවත්නේ ය යනු එක් දෘෂ්ටියකි. සංඥාවාද සොළොසක් බ්‍රහ්මජාල සූත්‍රයේ දැක්වේ. ඒවා මතු විස්තර කරන්නෙමු. මරණින් මතු සංඥා රහිත ආත්මය අවිනෂ්ට ව ඇත්තේ ය යනු එක් දෘෂ්ටියකි. බ්‍රහ්මජාලයෙහි අසඤ්ඤිවාද අටක් දක්වා ඇත්තේ ය. මරණින් මතු සංඥාවක් ඇත්තේ ද නො වන නැත්තේ ද නො වන ආත්මය අවිනෂ්ට ව ඇත්තේ ය යනු එක් දෘෂ්ටියකි. නේවසඤ්ඤා නාසඤ්ඤා වාද ද අටක් ඇත්තේ ය. මරණින් මතු ඇත්තා වූ සත්ත්වයා විනාශ වන්නේ ය, සිඳෙන්නේ ය යනු එක් දෘෂ්ටියකි. දෘෂ්ටධර්මයෙහි හෙවත් වර්තමාන භවයේ ම නිවන ඇත්තේ ය යනු එක් දෘෂ්ටියකි. දිට්ඨධම්ම නිබ්බාන වාද පසක් ඇත්තේ ය. මේ සියල්ල මතු විස්තර වන්නේ ය.

Non-commercial distribution

**පඤ්ච වේරා**

**51. පාණාතිපාතෝ** **52. අදින්නාදානං**
**53. කාමේසුමිච්ඡාචාරෝ** **54. මුසාවාදෝ**
**55. සුරාමේරයමජ්ජපමාදට්ඨානං.**

පාණාතිපාතචේතනා අදින්නාදනචේතනා කාමේසු මිච්ඡාචාරචේතනා මුසාවාදචේතනා සුරාපානචේතනා යන අකුශලචේතනා පස සත්ත්වයාට මෙලොව පරලොව දෙක්හි ම දුක් ගෙන දෙන්නෝ ය. ඒවා සත්ත්වයාට සතුරු ය. ඒවා වෛර නම් වෙති.

**පඤ්ච ව්‍යසනා:**

**56. ඤාතිව්‍යසනං** **57. භෝගව්‍යසනං**
**58. රෝගව්‍යසනං** **59. සීලව්‍යසනං**
**60. දිට්ඨිව්‍යසනං**

ව්‍යසන යනු විනාශය ය. වසංගත රෝගයකින් හෝ දුර්භික්ෂයකින් හෝ භූමිකම්පා ජලගැලීම් ආදි විපතකින් හෝ නෑයන් විනාශ වීම ඤාතිව්‍යසනය ය. රජුන් විසින් සොරුන් විසින් ගැනීමෙන් හෝ සතුරන් විසින් විනාශ කිරීමෙන් හෝ ගිනි දිය ආදියෙන් විනාශ වීමෙන් හෝ වස්තුව නැතිවී යාම භෝගව්‍යසනය ය. සුව කිරීමට දුෂ්කර රෝග ඇතිවීම රෝගව්‍යසනය ය. සිල් බිඳී දුශ්ශීල වීම සීලව්‍යසනය ය. මිථ්‍යාදෘෂ්ටිය ගැනීම දිට්ඨිව්‍යසනය ය. ඤාතිව්‍යසන භෝගව්‍යසන රෝගව්‍යසන යන තුනෙන් සත්ත්වයාට අපායට යන්නට සිදු නො වේ. සීලව්‍යසන දිට්ඨිව්‍යසන දෙකින් සත්ත්වයා අපායෙහි වැටීම සිදු වන්නේ ය.

**පඤ්ච අක්ඛන්තියා ආදීනවා :**

**61. බහුනෝ ජනස්ස අප්පියෝ හෝති අමනාපෝ.**

**62. වේරබහුලෝ ච හෝති.**

**63. වජ්ජබහුලෝ ච.**

**64. සම්මූළ්හෝ කාලං කරෝති.**

**65. කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පජ්ජති.**

Non-commercial distribution

නො ඉවසීමේ ආදීනව පසෙකි. බොහෝ ජනයාට අප්‍රිය අමනාප පුද්ගලයෙක් වේ. වෛර බහුල වූයේ වේ. වරද බහුල වූයේ වේ. මුළා වූයේ කලුරිය කෙරේ. කායයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ දුක් ඇත්තා වූ පාපකාරීන් වැටෙන තැන වූ නරකයෙහි උපදී. මේ පස, නො ඉවසීමේ ආදීනවයෝ ය. නො ඉවසීම හා ඉවසීම පිළිබඳ විස්තරයක් යට ද්වික නිර්දේශයේ දක්වා ඇත.

**පඤ්ච භයානි:**

**66. ආජීවික භයං** **67. අසිලෝක භයං**
**68. පරිසසාරජ්ජ භයං** **69. මරණ භයං**
**70. දුග්ගති භයං**

දිවි පැවැත්වීම හේතු කොට උපදනා භය ආජීවික භය නම් වේ. දිවි පෙවෙත සඳහා නොයෙක් පව්කම් කළ අයට මරණය ළං වූ කල්හි නොයෙක් අසුබ නිමිති පෙනෙන්නට වේ. එවිට ඔවුනට මා විසින් බොහෝ පව්කම් කර ඇත්තේ ය යි මහත් භයක් ඇති වේ. අකප්පිය පරිදි අනේසනයෙන් ප්‍රත්‍යය සපයා ජීවත් වූ පැවිද්දන්ට ද එසේ ම වේ. ඒ ආජීවිකභය ය. පව්කම් කරන්නා වූ ගිහි පැවිදි කාහටත් සොරෙක සල්ලාලයෙක බොරු කාරයෙක බේබද්දෙක කියා අපකීර්තියක් ඇති වේ. අපකීර්තිය පැවිද්දන්ට වඩාත් ඇති වේ. අපකීර්තිය ගැන ඇති වන බිය අසිලෝක භය නම් වේ. පව් කළවුන්ට පිරිසකට ගිය කල්හි මා කළ පව් කම් දන්නා අය මෙහි ඇත ද, යමෙක් මේ සභාවේ මාගේ පව්කම් ප්‍රකාශ කෙරේ ද, ඒවා ගැන ප්‍රශ්න කෙරේ දැ යි බියක් ඇති වේ. එය පරිසසාරජ්ජ භය නම් වේ. මරණය වේ දෝ යි ඇති වන භය මරණභය ය. අපායට යන්නට වේ දෝ යි ඇති වන භය අපාය භය ය.

**පඤ්ච දිට්ඨධම්මනිබ්බානවාදා:**

**71. යතෝ ඛෝ අයං අත්තා පඤ්චහි කාමගුණෙහි සමප්පිතෝ සමංගිභූතෝ පරිචාරේති. එත්තා වතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්ම නිබ්බානප්පත්තෝ හෝති.**

Non-commercial distribution

**72 පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති**

**73. දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති.**

**74. තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති.**

**75. චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති.**

**දෘෂ්ටධර්ම නිර්වාණවාද පසෙකි. ඒ මෙසේ යː-**

ඇතැමෙක්, මේ සත්ත්වයා අඩුවක් නැතිව වුවමනා පමණ උසස් පඤ්චකාමවස්තූන් ලබා ඒවායේ ඉන්ද්‍රියයන් හසුරවමින් කාමයෙන් නැළවී සිටී නම් එය වර්තමාන භවයේ ම ලබන නිර්වාණය යි කියති. මේ පළමුවන දෘෂ්ටිධර්ම නිර්වාණවාදය ය.

ඇතැමෙක්, පඤ්චකාම සම්පත්තියෙන් සතුටු වෙමින් විසීම පරමදෘෂ්ට ධර්ම නිර්වාණය යි කියන්නහුට මෙසේ කියති. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. එහෙත් එපමණකින් ඒ ආත්මය පරමදෘෂ්ට ධර්ම නිර්වාණයට පැමිණියේ නො වේ. කුමක් හෙයින් ද? කාමයෝ අනිත්‍යයෝ ය. දුඃඛයෝ ය. වෙනස් වන ස්වභාව ඇතියෝ ය. ඒ කාමයන්ගේ වෙනස් වීම අන් ආකාරයකට පැමිණීම හේතු කොට ඔහුට ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ ඇති වෙති. එහෙයිනි. පින්වත, මේ ආත්මය කාමයන්ගෙන් වෙන් ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව ප්‍රථම ධ්‍යානයට පැමිණ සිටින්නේ ද එයින් මේ ආත්මය පරම දෘෂ්ට ධර්ම නිර්වාණයට පැමිණ ඇත්තේ ය. මේ දෙවන දෘෂ්ට ධර්ම නිර්වාණවාදය ය.

ප්‍රථමධ්‍යානය පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කියන්නහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතය යි නො කියමි. එහෙත් එපමණකින් ඒ ආත්මය පරම දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ නො වේ. කුමක් හෙයින් ද? ඒ ප්‍රථමධ්‍යානයෙහි සිත අරමුණට යවන විතර්කය ඇත. අරමුණ පිරිමදින විචාරය ඇත. එයින් ඒ ප්‍රථමධ්‍යානය ඖදරිකය. පින්වත, මේ ආත්මය විතර්ක රහිත වූ විචාර රහිත වූ ද්විතීයධ්‍යානයට පැමිණියේ නම් එයින් පරම දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ වන්නේ ය. මේ තුන්වන දෘෂ්ටධර්ම නිර්වාණ වාදය ය.

Non-commercial distribution

ද්විතීයධ්‍යානය පරම දෘෂ්ටධර්ම නිර්වාණයයි කියන්නහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැත යයි නො කියමි. එහෙත් ද්විතීයධ්‍යානයට පැමිණීමෙන් ඒ ආත්මය පරම දෘෂ්ට ධර්ම නිර්වාණයට පැමිණියේ නොවේ. කුමක් හෙයින්ද? ඒ ද්විතීයධ්‍යානයෙහි ප්‍රීතියක් ඇත. එය සිත ඉල්පෙන බවකි. එයින් එය ඖදරිකය. පින්වත, යම් කලෙක ඒ ආත්මය ප්‍රීතියෙහි නො ඇලී තෘතීයධ්‍යානයට පැමිණියේ වේ නම් එයින් ඒ ආත්මය පරම දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ වන්නේ ය. මේ සතර වන දෘෂ්ටධර්ම නිර්වාණ වාදය ය.

තෘතීයධ්‍යානය පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කියන්නහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැත යයි නො කියමි. එහෙත් තෘතීයධ්‍යානයට පැමිණි පමණින් ආත්මය පරම දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ නොවේ. කුමක් හෙයින් ද? එහි සුඛයක් ඇත. ධ්‍යානයෙන් නැඟී ඒ සුඛය නැවත නැවත සිහි කරන බැවින් ඒ ධ්‍යානය ඖදරිකය. පින්වත, මේ ආත්මය සුඛය ද ප්‍රහාණය කොට උපේක්ෂාවෙන් යුක්ත වන චතුර්ථධ්‍යානයට පැමිණියේ නම් එයින් ඒ ආත්මය පරම දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ වන්නේ ය. මෙ පස්වන දෘෂ්ටධර්ම නිර්වාණ වාදය ය.

පඤ්චක වශයෙන් දැක්වෙන ධර්මයන්ගේ විස්තරය ය.

**පඤ්චක නිර්දේශය නිමියේ ය**

Non-commercial distribution

# ෂට්ක වශයෙන් දැක්වෙන ධර්ම සූ අසූව

ඡ විවාදමූලානි, ඡ ඡන්දරාගා, ඡ විරෝධවත්ථූනි, ඡ තණ්හාකායා, ඡ අගාරවා, ඡ පරිහානියා ධම්මා, අපරේපි ඡ පරිහානියා ධම්මා, ඡ සෝමනස්සූපවිචාරා, ඡ දෝමනස්සූපවිචාරා, ඡ උපෙක්ඛූපවිචාරා, ඡ ගේහසිතානි සොමනස්සානි, ඡ ගේහසිතානි දෝමනස්සානි, ඡ ගේහසිතා උපෙක්ඛා, ඡ දිට්ඨියෝ.

(ඛුද්දක වත්ථුවිභංග)

**ඡ විවාද මූලානිඃ**

**1. කෝධෝ. 2. මක්ඛෝ 3. ඉස්සා**
**4. සාඨෙය්‍යං 5. පාපිච්ඡතා**
**6. සන්දිට්ඨි පරාමාසිතා.**

මේ විවාද මූලධර්ම සයෙන් යට විස්තර නො කෙරුණු ධර්මයක් ඇත්තේ සන්දිට්ඨිපරාමාසිතා යන සවන ධර්මය පමණෙකි. ඇතැමෙක් තමා යමක් කමක් දැන ඇත්තේ නම් පිළිගෙන ඇත්තේ නම් සිතා ගෙන ඇත්තේ නම් එය අසත්‍යය අයුක්තිය අධර්මය අවිනය වූවද කවුරුන් කීවද අත නොහැර එය ම තදින් ගෙන එය ස්ථිර කරන්නට වෑයම් කරයි. ගත් අදහසෙහි ම තදින් පිහිටා සිටී. ඒ ස්වභාවය **සන්දිට්ඨිපරාමාසිතාවය**. වැරදි හැනීම් වැරදි දැනීම් කාහටත් ඇති විය හැකි ය. අනිකකු වරද කියා දුන් විට පහදා දුන් විට තමාගේ වැරදි මතය හළ යුතුය. එසේ කිරීම සත් පුරුෂ ධර්මය ය. තමාගේ වරද පහදා දුන් විට එය නො පිළි ගන්නේ මානය නිසා ය. එය ඒ පුද්ගලයාට පරිහානිකර කරුණෙකි.

භික්ෂූන් අතර නොයෙක් වාද විවාද ඇති වන්නේ ක්‍රෝධාදි මේ කරුණු සය නිසා ය. එබැවින් ඒ ධර්මයෝ විවාද මූලයෝ ය.

Non-commercial distribution

විවාද මූලධර්මයන්ගෙන් කවරක් හෝ භික්ෂුවකට ඇත්තේ නම් බුදුන්ට ගරු නො කරන යටත් නො වන, ධර්මයට ගරු නො කරන යටත් නො වන, සංඝයාට යටත් නො වන ගරු නො කරන ශික්ෂාව සම්පූර්ණ නො කරන දමරික පැවිද්දෙක් වේ. ඔහු නොයෙක් කරුණු සම්බන්ධයෙන් වාද විවාද කෝලාහල ඇති කරයි. භික්ෂූන් අතර වාද ඇතිවීම ගිහි පැවිදි බොහෝ දෙනාට අනර්ථය අහිතය පිණිස පවත්නා කරුණෙකි. ප්‍රබල භික්ෂූන් දෙනමක් අතර විවාදයක් ඇති වූ කල්හි බොහෝ භික්ෂූහු ද ඒ ඒ පැති ගැනීමෙන් එයට සම්බන්ධ වෙති. ඒ භික්ෂූන්ගේ ඥාතීහු ද දායකයෝ ද එයට සම්බන්ධ වෙති. එයින් වන්නේ ඒ සැමට ම අනර්ථයෙකි. විවාදය බොහෝ දෙනාට අනර්ථය පිණිස පවතීය යි කියනුයේ එබැවිනි.

**ඡ ඡන්දරාගාඃ**

7. **මනාපියේසු රූපේසු ගේහසිතෝ රාගෝ**
8. **මනාපියේසු සද්දේසු ගේහසිතෝ රාගෝ**
9. **මනාපියේසු ගන්ධෙසු ගේහසිතෝ රාගෝ**
10. **මනාපියේසු රසේසු ගේහසිතෝ රාගෝ**
11. **මනාපියේසු පොට්ඨබ්බේසු ගේහසිතෝ රාගෝ**
12. **මනාපියේසු ධම්මේසු ගේහසිතෝ රාගෝ**

රූප ඡන්දරාගය ශබ්ද ඡන්දරාගය ගන්ධ ඡන්ද රාගය රස ඡන්දරාගය ස්ප්‍රෂ්ටව්‍ය ඡන්දරාගය ධර්ම ඡන්දරාගය යි ඡන්දරාග සයෙකි.

**රාග** යනු ප්‍රීතිය හා බැඳුණු තණ්හාවය. දරුවකු සුරතල් කරන මවකට පියකුට ඒ අවස්ථාවෙහි දරුවා ගැන ඇති වන සප්‍රීතික තණ්හාව රාගය ය. මුණුපුරකු සුරතල් කරන මුත්තකුට මිත්තනියකට ඒ අවස්ථාවෙහි මුණුපුරා ගැන ඇති වන සප්‍රීතික තණ්හාව රාගය ය. අඹු සැමියන් ඔවුනොවුන් සතුටු වන අවස්ථාවන්හි ඇති වන සප්‍රීතික තණ්හාව රාගය ය. ප්‍රියමනාප කිනම් කාමවස්තුවක් නිසා වුවද ඇති වන සප්‍රීතික තණ්හාව රාගය ය. රාගය, සොයා ගැනීමේ ලබා ගැනීමේ රැස් කර තබා ගැනීමේ අයත් කර ගෙන සිටීමේ තණ්හාවට වඩා වෙනස්වූ

Non-commercial distribution

තණ්හාවෙකි. මේ ෂට්කයෙහි දැක්වෙන්නේ සාමාන්‍ය රාගය නොව බලවත් වූ රාගය ය. බලවත් රාගය ඇතියෝ අඹු දරු ආදි රාග වස්තූන් නට කල්හි හඬති. විලාප කියති. හිසට පපුවට ගසා ගනිති. බිම පෙරළෙති. සිහි නැති වී වැටෙති. සමහර විට එයින් නැසෙති. මේ රාගය ගිහි පැවිදි කාහට ද ඇතියකි. එහෙත් පැවිද්දන් හිතවතුන්ගේ මරණවලදී වස්තු හානිවලදී බලාපොරොත්තු සුන්වීම්වලදී ගිහියන් මෙන් මහ හඬින් හඬනු විලාප කියනු හිසට පපුවට ගසනු සිහි නැතිව වැටෙනු බිම පෙරළෙනු නො දක්නා ලැබේ. එයින් සැලකිය යුත්තේ ගිහියන්ට තරමේ බලවත් රාගයක් පැවිද්දන්ට නැතය කියා ය. බලවත් රාගය ගිහියන්ට ඇති වන්නක් බැවින් එයට **ගේහසිත රාගය** යි කියනු ලැබේ.

මනාප වූ රූපයන් ගැන ඇති වන ගේහසිත රාගය මනාප වූ ශබ්දයන් ගැන ඇති වන ගේහසිත රාගය මනාප වූ ගන්ධයන් ගැන ඇති වන ගේහසිත රාගය මනාප වූ රසයන් ගැන ඇති වන ගේහසිත රාගය මනාප වූ ස්ප්‍රෂ්ටව්‍යයන් ගැන ඇති වන ගේහසිත රාගය යන මේ සය මේ ෂට්කයේ දැක්වෙන කෙලෙස් සය ය.

මෙහි ධර්මය යි කියනුයේ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යන පස හැර සත්ත්වයනට ප්‍රියමනාප අන් සියල්ල ය. උගත්කම උපාධි ගරුනාම තනතුරු කීර්ති ප්‍රශංසා ශූරභාවය වීරභාවය ශීල සමාධි ප්‍රඥා යනාදි සත්ත්වයන්ට ප්‍රියමනාප සියල්ල පිළිබඳ වූ ගේහසිත රාගය, ධර්මයන් ගැන ඇති වන ගේහසිත රාගය යි දත යුතු.

**ජ විරෝධවත්ථූනි:**

**13. අමනාපියේසු රූපේසු චිත්තස්ස ආඝාතෝ.**

**14. අමනාපියේසු සද්දේසු චිත්තස්ස ආඝාතෝ.**

**15. අමනාපියේසු ගන්ධෙසු චිත්තස්ස ආඝාතෝ.**

**16. අමනාපියේසු රසේසු චිත්තස්ස ආඝාතෝ.**

**17. අමනාපියේසු ඵොට්ඨබ්බේසු චිත්තස්ස ආඝාතෝ.**

**18. අමනාපියේසු ධම්මේසු චිත්තස්ස ආඝාතෝ.**

Non-commercial distribution

විරෝධවත්ථු යනු විරෝධය ම ය. අමනාප අප්‍රිය රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්ම යන සය පිළිබඳ වූ විරෝධ, විරෝධවත්ථු සය ය. විරෝධය යි කියනුයේ බණිත ගසන කෝලාහල කරන තරමට බලවත් නො වූ නො සතුටු වීම් මාත්‍රය වූ ද්වේෂය ය.

**ෂ තණ්හාකායාඃ**

**19.** **රූපතණ්හා** **20.** **සද්දතණ්හා**
**21.** **ගන්ධතණ්හා** **22.** **රසතණ්හා**
**23.** **ඵොට්ඨබ්බතණ්හා** **24.** **ධම්මතණ්හා**

තණ්හාකාය යනු තණ්හාව ම ය. රූප තණ්හාදි වශයෙන් තණ්හා කාය සයෙකි. මෙහි දැක්වෙනුයේ රාගයෙන් අන්‍ය වූ සෙවීම, අයිති කරගැනීම, රැස් කර තබා ගැනීම පිළිබඳ තණ්හාව ය.

**ෂ අගාරවාඃ**

**25.** **සත්ථරි අගාරවෝ විහරති අප්පතිස්සෝ.**
**26.** **ධම්මේ අගාරවෝ විහරති අප්පතිස්සෝ.**
**27.** **සංඝෙ අගාරවෝ විහරති අප්පතිස්සෝ.**
**28.** **සික්ඛාය අගාරවෝ විහරති අප්පතිස්සෝ.**
**29.** **අප්පමාදෝ අගාරවෝ විහරති අප්පතිස්සෝ.**
**30.** **පටිසන්ථාරෙ අගාරවෝ විහරති අප්පතිස්සෝ.**

ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත ව යටහත් පැවතුම් නැති ව වාසය කරයි. ධර්මය කෙරෙහි ගෞරව රහිත ව යටහත් පැවැත්ම නැතිව වාසය කරයි. සංඝයා කෙරෙහි ගෞරව රහිතව යටහත් පැවැත්ම නැති ව වාසය කරයි. ශික්ෂාව කෙරෙහි ගෞරව රහිත ව යටහත් පැවැත්ම නැති ව වාසය කරයි. අප්‍රමාදයෙහි ගෞරව රහිත ව යටහත් පැවැත්ම නැති ව වාසය කරයි. ප්‍රතිසන්ථාරයෙහි ගෞරව රහිත ව යටහත් පැවැත්ම නැති ව වාසය කරයි. මේ සය **අගාරවයෝ** ය. මේ පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙකි. මෙහි ධර්ම වශයෙන් ඇත්තේ මානය ය.

ශාස්තෘන් වහන්සේ ධරමාන කාලයේ දවසේ තුන් කාලයෙහි උපස්ථානයට නො යාම, ශාස්තෘන් වහන්සේ අනුපාහනව සක්මන්

Non-commercial distribution

කරන කල්හි ස උපාහන ව සක්මන් කිරීම, ශාස්තෘන් වහන්සේ පහත් තැන සක්මන් කරන කල්හි උස් තැන සක්මන් කිරීම, පහත් තැනක වැඩ සිටින කල්හි උස් තැන විසීම, ශාස්තෘන් වහන්සේ පෙනෙන තැන දෙ උර වසා පොරවා සිටීම, කුඩ ඉසලීම, වහන් පය ලෑම, නෑම, මලමූත්‍ර පහ කිරීම ශාස්තෘන් වහන්සේට අගෞරව කිරීම ය. ශාස්තෘන් වහන්සේ පිරිනිවීමෙන් පසු දවසට තුන්වර විහාරයට නො යාම, චෛත්‍ය පෙනෙන තැන කුඩ ඉසලා, වහන් පය ලා දෙවුර වසා පොරවා හැසිරීම, මලමූත්‍ර කිරීම, සෑමලු බෝමලුවල කෙළ ගැසීම යන මේවා ද ශාස්තෘන් වහන්සේට අගෞරව කිරීම ය. ධර්මශ්‍රවණයට ඝෝෂා කළ කල්හි යා හැකි ව තිබිය දී නො යාම, ගිය ද ගෞරවයෙන් දහම් නො ඇසීම, ධර්ම දේශනය පවත්වන තැන අන්‍යවිහිත ව සිටීම, කථා කරමින් සිටීම ධර්මයට අගෞරව කිරීම ය. සංඝ ස්ථවිරයන් වහන්සේගෙන් ආරාධනාවක් අවසරයක් නැති ව සඟ මැද දහම් දෙසීම, ප්‍රශ්න විසඳීම වැඩි මහලු භික්ෂූන්ගේ කයෙහි ගැටෙමින් යාම සිටීම හිඳීම, සඟ මැද දෙවුර වසා සිටීම, කුඩ පාවහන් දරා සිටීම සංඝයාට අගෞරව කිරීමය. සංඝයාට අයත් එක් භික්ෂුවකට වුව ද අගෞරව කිරීම සංඝයාට අගෞරව කිරීමකි. “එක භික්ඛුස්මිංපි අගාරවේ කතේ සංඝෙ අගාරවෝ හෝති” යනු අටුවායි. ත්‍රිශික්ෂාවන් නො පිරීම ශික්ෂාවට අගෞරව කිරීම ය. අප්‍රමාදය ගැන නො සිතීම කුශලයෙහි නො යෙදීම අප්‍රමාදයෙහි අගෞරවය ය. ආමිෂප්‍රතිසන්ථාර ධර්මප්‍රතිසන්ථාර දෙක්හි නොයෙදීම ප්‍රතිසන්ථාරයෙහි අගෞරවය ය.

**ජ පරිහානියා ධම්මා:**

**31.** **කම්මාරාමතා** **32.** **භස්සාරාමතා**
**33.** **නිද්දාරාමතා** **34.** **සංඝණිකාරාමතා**
**35.** **සංසග්ගාරාමතා** **36.** **පපඤ්චාරාමතා**

කම්මාරාමතාදි මේ ධර්ම සය භික්ෂූන්ගේ පරිහානියට හේතු ය. කීර්ති ප්‍රශංසා ලැබීම, බොහෝ ප්‍රත්‍යය ලැබීම, බොහෝ දායකයන් ඇතිවීම, බොහෝ විහාර බොහෝ කෙත්වතු ලැබීම, උපාධි ලැබීම, තනතුරු ලැබීම මේ ශාසනයෙහි භික්ෂුවගේ දියුණුව

Non-commercial distribution

නොවේ. භික්ෂුවගේ දියුණුව නම් ශීලය සම්පූර්ණ කිරීම, සමථ විදර්ශනාවන්හි යෙදී ධ්‍යානාභිඥා මාර්ගඵල ලැබීම යන මේවාය. අර්හත්වයට පැමිණීම දියුණුවේ අන්තිම ය. නිද්දරාමතාදි ධර්ම ඇතියවුන්ට ඒ දියුණුවට නො පැමිණිය හැකි ය. ඒවා ඇති භික්ෂුව ධ්‍යානාදි උත්තරී මනුෂ්‍ය ධර්මයන් ගෙන් පිරිහෙන්නේ ය.

**කම්මාරාමතා** යනු විහාර, චෛත්‍ය, ධර්මශාලා ආවාස ආදිය කිරීමෙහි හා සිවුරු කිරීම් ආදි නොයෙක් කර්මාන්තයන්හි යෙදී සිටීමට කැමති බව ය. කර්මාන්තයන් කිරීමෙන් කරවීමෙන් ම කාලය ගත කරන බව ය. අලස ව නිකම් ම කාලය ගත කිරීමට වඩා කුශල පක්ෂයට අයත් කර්මාන්තයන්හි යෙදීම යහපත් බව කිය යුතු ය. එය උත්තරී මනුෂ්‍ය ධර්මයන් ගෙන් පිරිහීමට හේතුවකි.

**භස්සාරාමතා** යනු තිරශ්චීන කථාවන්හි යෙදී විසීමට කැමති බව ය. ඒවායේ යෙදීමට කාලය ගත කරන බව ය. ධර්ම කථාවෙහි යෙදීම භික්ෂුවගේ දියුණුවට හේතු වේ.

**නිද්දරාමතා** යනු නිදීමට කැමති බව ය. දවසෙන් වැඩි කාලයක් අලසකමින් නින්දෙන් ගත කරන බව ය. පමණ ඉක්මවා නිදන ස්වභාව ගිහි පැවිදි කාහටත් ලෞකික ලෝකෝත්තර දෙපක්ෂයෙන් ම පිරිහීමට හේතුවකි. මේ ශාසනයෙහි භික්ෂූන්ට නියමිත **ජාගරියානුයෝග** නම් ප්‍රතිපදවක් ඇත්තේ ය. එනම් දවල් කාලය හා රාත්‍රියේ ප්‍රථම පශ්චිම යාම දෙක ද නො නිද සක්මනින් හා හිඳීමෙන් ගත කිරීම ය. පෙර විසූ උත්සාහවත් ඇතැම් මහ තෙරවරුන් බොහෝ අවුරුදු ගණන් සම්පූර්ණයෙන් ම නිදීමෙන් වැළකී විසූ බව ඇඳක පිට තැබීම නො කළ බව සක්කපඤ්හ සූත්‍ර අටුවාවෙහි සඳහන් ව ඇත්තේ ය.

**සංගණිකාරාමතා** යනු බොහෝ දෙනා හා එක් ව විසීමෙහි ඇලීම ය. සංගණිකාරාමතාව සකල සත්ත්වයන්ට පිහිටා ඇති ස්වභාවයකි. සත්ත්වයනට හුදකලා වාසය අප්‍රිය ය. එ බැවින් මිනිසුන් තබා තිරිසන්හු ද අන්‍ය සත්ත්වයන්ට එක් වී සමූහ වශයෙන් වෙසෙති. එය ලෞකික පක්ෂයෙන් පරිහානියට කරුණක්

Non-commercial distribution

නො ව දියුණුවට කරුණෙකි. ලෝකෝත්තර පක්ෂයේ දියුණුව ලැබීමට නම් එය බාධක ය. එ බැවින් පැවිද්දෝ ජන ශූන්‍ය ස්ථානවල හුදකලාව වෙසෙති.

**සංසග්ගාරාමතා** යන මෙහි සංසර්ගයඃ දර්ශන සංසර්ගය, ශ්‍රවණ සංසර්ගය, කායසංසර්ගය, සමුල්ලපන සංසර්ගය, සම්භෝග සංසර්ගය යි පඤ්ච ප්‍රකාර වේ. දර්ශන සංසර්ගය යනු දැකීමෙන් ඇති වන රාගය ය. එයට නිදසුන් වශයෙන් දක්වා ඇති කථාවක් මෙසේ යඃ- ලක්දිව **කාලදීඝ** නම් ගමට පිඩු පිණිස ගිය කැළණි වෙහෙර වැසි තරුණ භික්ෂුවක් දැක ඒ ගමෙහි එක් තරුණ කතකට බලවත් රාගය ඇති විය. ඕ කිසි උපායකින් ඒ භික්ෂුව ලබා ගත නොහී කලුරිය කළා ය. පසු දිනක ඒ කත හැඳ සිටි වස්ත්‍රයෙන් කොටසක් දුටු ඒ භික්ෂුවට ද බලවත් රාගය ඇති වී "මේ වස්ත්‍රය හැඳ සිටි කත හා එක් ව විසීමට නො ලැබිණැයි" හට ගත් ශෝකයෙන් ඇති වූ කම්පනයෙන් ඒ භික්ෂුව ද කලුරිය කළේ ය. දර්ශන සංසර්ගය ඒ දෙදෙනාගේ ම මරණයට හේතු විය.

ශ්‍රවණ සංසර්ගය යනු යමෙකුගේ අනුන් කියන රූප සම්පත්තිය ඇසීමෙන් හෝ තමා ම කරන හසිත ලපිතාදි ශබ්දය ඇසීමෙන් හෝ හටගන්නා රාගය ය. එයට නිදසුන් වශයෙන් **පඤ්චග්ගල** නම් ලෙණ විසූ තරුණ පැවිද්දකුගේ කථාවක් දක්වා ඇත්තේ ය. ඒ භික්ෂුව ධ්‍යාන ලබා අහසින් යමින් සිටියෙකි. දිනක ඒ භික්ෂුව අහසින් යනුයේ විලක නා මල් පැළඳ දැරියන් පස් දෙනකු ද සමග මහ හඬින් ගී කියමින් සිටි කතකගේ ගී හඬ අසා රාගය ඉපදී ධ්‍යානයෙන් පිරිහී බිම පතිත විය.

කාය සංසර්ග යනු ඔවුනොවුන්ගේ ශරීර ස්පර්ශයෙන් හට ගන්නා රාගය ය. එයට නිදර්ශන වශයෙන් ධර්ම දේශක තරුණ භික්ෂුවක ගේ කථාවක් දක්වා ඇත. එක් දවසක් ඒ තරුණ භික්ෂුව මහා විහාරයෙහි දහම් දෙසුමක් කෙළේ ය. දහම් ඇසීමට බොහෝ ජනයා පැමිණියහ. රජතුමා අන්තඃපුර ස්ත්‍රීන් සමග පැමිණියේ ය. ඒ භික්ෂුවගේ රූපයත් හඬත් නිසා රාජකුමාරිකාවකට බලවත් රාගය උපන. ඇය දැක භික්ෂුවට ද එසේ ම රාගය උපණ. ඔවුන්

Non-commercial distribution

ගේ ප්‍රකෘතිය වෙනස් විය. රජතුමා ඒ බව දැක ඒ දෙදෙනා තිරයකින් ආවරණය කරවී ය.

ඔවුහු ආවරණය තුළ ඔවුනොවුන් වැළඳ ගත්හ. බලවත් රාගාග්නියෙන් දැවී ඒ දෙදෙන එතැන ම මළහ. තිරය ඉවත් කොට බැලූ කල්හි දෙදෙනා ම මැරී සිටිනු දක්නා ලදී.

ඔවුනොවුන් කථා කිරීමෙන් හටගන්නා රාගය සමුල්ලපන සංසර්ගය ය. ඔවුනොවුන්ගේ වස්තූන් පරිභෝග කිරීමෙන් හටගන්නා රාගය සම්භෝග සංසර්ගය ය. ඒ දෙකට ම නිදර්ශන වශයෙන් එදෙකින් ඇති වූ රාගයෙන් පාරාජිකාපත්තියට පැමිණි භික්ෂුවකගේ හා භික්ෂුණියකගේ කථාවක් දක්වා ඇත. දුටුගැමුණු රජතුමා මිරිස වැටි මහා විහාර පූජෝත්සවයේ දී උභය සංඝයාට ආරාධනා කොට මහා දනයක් දිණි. එහි දී උණු කැඳ පිළිගැන් වූ කල්හි පාත්‍රය තබා ගැනීමට ආධාරයක් නැති ව සිටි සාමණේර නමකට එක් සාමණේරියක් පාත්‍රය තබා ගැනීම සඳහා වළල්ලක් දී කථා කළා ය. ඒ දෙදෙනා පසු කාලයේ උපසපන් වී සැටවස් පිරුණු පසු පරතෙරට ගියාහු ය. එහි දී ඔවුනොවුන් මුණ ගැසී කථා කරන්නාහු එද මිරිසවැටි විහාර පූජෝත්සවයේදී කළ කථාව සිහි වී හටගත් රාගයෙන් සිකපද ව්‍යතික්‍රමණය කොට දෙදෙන ම පාරාජිකාවට පත් වූහ. මේ පඤ්ච ප්‍රකාර සංසර්ගයන්හි යෙදෙන බව "සංසග්ගාරාමතා" නම් වේ. (මේ කථා සුත්තනිපාතට්ඨකථාවෙන් ගන්නා ලදී.)

සංසාරය දිර්ඝ කරන බැවින් පපඤ්ච නම් වූ තෘෂ්ණා මාන දෘෂ්ටි යන ධර්ම තුනෙහි යෙදීම, ඒවා ස්ව සන්තානයෙහි පැවැත්වීම පපඤ්චාරාමතා නම් වේ.

**අපරේපි ඡ පරිහානියා ධම්මා**

**27.** **කම්මාරාමතා** **38.** **භස්සාරාමතා**
**39.** **නිද්දරාමතා** **40.** **සංසණිකාරාමතා**
**41.** **දෝවචස්සතා** **42.** **පාපමිත්තතා**

මේ සියල්ල යට විස්තර කර ඇත්තේ ය. මෙසේ පරිහානීය-ධර්ම දෙයාකාරයකින් පුද්ගලාධ්‍යාශ වශයෙන් වදරා ඇත්තේ ය.

Non-commercial distribution

ෂට්ක දෙක්හි ම ඇති කරුණු එකතු කළ හොත් කම්මාරාමතා, හස්සාරාමතා, නිද්දරාමතා, සංගණිකාරාමතා, සංසග්ගාරාමතා, පපඤ්චාරාමතා, දෝවචස්සතා, පාපමිත්තතා යි පරිහානීය ධර්ම අටෙකි.

**ජ සෝමනස්සුපවිචාරා:**

**43. චක්ඛුනා රූපං දිස්වා සෝමනස්සට්ඨානියං රූපං උපවිචරති.**

**44. සෝතේන සද්දං සුත්වා සෝමනස්සට්ඨානියං සද්දං උපවිචරති.**

**45. ඝාණෙන ගන්ධං ඝායිත්වා සෝමනස්සට්ඨානියං ගන්ධං උපවිචරති.**

**46. ජිව්හාය රසං සායිත්වා සෝමනස්සට්ඨානියං රසං උපවිචරති.**

**47. කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා සෝමනස්සට්ඨානියං ඵොට්ඨබ්බං උපවිචරති.**

**48. මනසා ධම්මං විඤ්ඤාය සෝමනස්සට්ඨානියං ධම්මං උපවිචරති.**

ඇසින් රූප දැක සොම්නසට හේතුවන රූපයන්හි සිත හැසිරවීම, කනින් ශබ්ද අසා සොම්නසට හේතු වන ශබ්දයන්හි සිත හැසිරවීම, නාසයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට සොම්නසට හේතු වන ගන්ධයෙහි සිත හැසිරවීම, දිවෙන් රස දැන සොම්නසට හේතු වන රසයෙහි සිත හැසිරවීම, කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කොට සොම්නසට හේතු වන ස්ප්‍රශ්ටව්‍යයෙහි සිත හැසිරවීම, සිතින් ධම්මාරම්මණය දැන සොම්නසට හේතු වන ධර්මයෙහි සිත හැසිරවීම යන මේ සය සෝමනස්සුපවිචාරයෝ ය.

මේවායින් කියැවෙන්නේ ෂට්ද්වාරයෙන් ගන්නා ලද රූපාදි ආරම්මණයන් අතුරෙන් සොම්නසට හේතු වන ඉෂ්ටාරම්මණයන්හි තණ්හා වශයෙන් රාග වශයෙන් සිත නැවත නැවත හැසිරවීම ය. ඒවා ගැන නැවත නැවත සිතීම ය.

Non-commercial distribution

**ඡ දොමනස්සූපවිචාරා:**

**49. චක්ඛුනා රූපං දිස්වා දොමනස්සට්ඨානියං රූපං උපවිචරති.**

**50. සෝතෙන සද්දං සුත්වා දොමනස්සට්ඨානියං සද්දං උපවිචරති.**

**51. ඝාණෙන ගන්ධං ඝායිත්වා දෝමනස්සට්ඨානියං ගන්ධං උපවිචරති.**

**52. ජිව්හාය රසං සායිත්වා දෝමනස්සට්ඨානියං රසං උපවිචරති.**

**53. කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා දොමනස්සට්ඨානියං ඵොට්ඨබ්බං උපවිචරති.**

**54. මනසා ධම්මං විඤ්ඤාය දෝමනස්සට්ඨානියං ධම්මං උපවිචරති.**

ඇසින් රූප දැක දොම්නසට හේතු වන රූපයෙහි සිත හැසිරවීම, කනෙන් ශබ්ද අසා දොම්නසට හේතු වන ශබ්දයෙහි සිත හැසිරවීම, නාසයෙන් ගන්ධ දැන දොම්නසට හේතුවන ගන්ධයෙහි සිත හැසිරවීම, දිවෙන් රස දැන දොම්නසට හේතු වන රසයෙහි සිත හැසිරවීම, කයින් ස්පර්ශය දැන දොම්නසට හේතුවන ස්ප්‍රෂ්ටව්‍යයෙහි සිත හැසිරවීම, මනසින් ධම්මාරම්මණය දැන දොම්නසට හේතු වන ධම්මාරම්මණයෙහි සිත හැසිරවීම යන මේ සය **දෝමනස්සූපවිචාරයෝ** ය.

මෙයින් දැක්වෙන්නේ දොම්නසට හේතු වන රූපාදියෙහි සිත පවත්වමින් ද්වේෂ කරමින් විසීම ය. ඇතැමකුට අනුන්ගේ දොස් අඩුපාඩුකම් ගැන සිතමින් ද්වේෂයෙන් කල් ගත කරන ස්වභාව ඇත්තේ ය. ඒ දෝමනස්සූපවිචාරය ය.

**ඡ උපෙක්ඛූපවිචාරා:**

**55. චක්ඛුනා රූපං දිස්වා උපෙක්ඛාඨානියං රූපං උපවිචරති.**

**56. සෝතේන සද්දං සුත්වා උපෙක්ඛාඨානියං සද්දං උපවිචරති.**

Non-commercial distribution

**57**. **ඝාණෙන ගන්ධං ඝායිත්වා උපෙක්ඛාඨානියං ගන්ධං උපවිචරති**.

**58**. **ජිව්හාය රසං සායිත්වා උපෙක්ඛාඨානියං රසං උපවිචරති**.

**59**. **කායේන පොට්ඨබ්බං ඵුසිත්වා උපෙක්ඛාඨානියං පොට්ඨබ්බං උපවිචරති**.

**60**. **මනසා ධම්මං විඤ්ඤාය උපෙක්ඛාඨානියං ධම්මං උපවිචරති**.

ඇසින් රූප දැක උපේක්ෂාවට හේතු වන රූපයන්හි සිත හැසිරවීම, කනින් ශබ්ද අසා උපේක්ෂාවට හේතු වන ශබ්දයෙහි සිත හැසිරවීම, නාසයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට උපේක්ෂාවට හේතු වන ගන්ධයෙහි සිත හැසිරවීම, දිවෙන් රස දැන උපේක්ෂාවට හේතු වන රසයෙහි සිත හැසිරවීම, කයින් ස්ප්‍රෂ්ටව්‍යය ස්පර්ශ කොට උපේක්ෂාවට හේතු වන ස්ප්‍රෂ්ටව්‍යයෙහි සිත හැසිරවීම, සිතින් ධම්මාරම්මණය දැන උපේක්ෂාවට හේතු වන ධම්මාරම්මණයෙහි සිත හැසිරවීම යන මේවා **උපෙක්ඛූපවිචාර** නම් වේ.

මෙයින් දැක්වෙන්නේ උපේක්ෂාවට හේතු වන ආරම්මණයන්හි ලෝභමූලික උපේක්ෂා සිතක් නැවත නැවත ඉපදවීම ය. මෝහ සහගත අඤ්ඤාණුපෙක්ඛාව හෝ පැවැත්වීම ය.

**ජ ගේහසිතානි සෝමනස්සානි:**

**61**. **මනාපියේසු රූපේසු ගේහසිතං චේතසිකං සාතං**

**62**. **මනාපියේසු සද්දේසු ගේහසිතං චේතසිකං සාතං**.

**63**. **මනාපියේසු ගන්ධේසු ගේහසිතං චේතසිකං සාතං**.

**64**. **මනාපියේසු රසේසු ගේහසිතං චේතසිකං සාතං**

**65**. **මනාපියේසු පොට්ඨබ්බේසු ගේහසිතං චේතසිකං සාතං**

**66**. **මනාපියේසු ධම්මේසු ගේහසිතං චේතසිකං සාතං**.

ගේහසිත සෝමනස්ස යනු කාමය පිළිබඳව ඇතිවන **සොම්නස** ය. සිතෙහි ඇති වන මිහිර ය. ඉහත දැක්වෙන්නේ ප්‍රිය මනාප රූපාදි ආරම්මණ ෂය සම්බන්ධයෙන් ඇති වන සරාග වේදනා ෂය ය.

Non-commercial distribution

**ජ ගේහසිතානි දෝමනස්සානි**

**67.** **අමනාපියේසු රූපේසු ගේහසිතං චේතසිකං අසාතං.**

**68.** **අමනාපියේසු සද්දේසු ගේහසිතං චේතසිකං අසාතං**

**69.** **අමනාපියේසු ගන්ධෙසු ගේහසිතං චේතසිකං අසාතං.**

**70** **අමනාපියේසු රසේසු ගේහසිතං චේතසිකං අසාතං**

**71.** **අමනාපියේසු ඵොට්ඨබ්බේසු ගේහසිතං චේතසිකං අසාතං**

**72.** **අමනාපියේසු ධම්මේසු ගේහසිතං චේතසිකං අසාතං.**

මේ ෂට්කයෙන් පැවසෙන්නේ අප්‍රිය අමනාප රූපාදි ආරම්මණයන් නිසා ඇති වන **දොම්නස** ය.

**ජ ගේහසිතා උපෙක්ඛා**

**73.** **උපෙක්ඛායාතියේසු රූපේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

**74.** **උපෙක්ඛායාතියේසු සද්දේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

**75.** **උපෙක්ඛායාතියේසු ගන්ධේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

**76.** **උපෙක්ඛායාතියේසු රසේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

**77.** **උපෙක්ඛායාතියේසු ඵොට්ඨබ්බේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

**78.** **උපෙක්ඛායාතියේසු ධම්මේසු ගේහසිතං නේවසාතං නාසාතං.**

මේ ෂට්කයෙහි දැක්වෙන්නේ උපේක්‍ෂා වේදනාවට හේතු වන රූපාදිය සම්බන්ධයෙන් ඇති වන මිහිරි ද නො වූ අමිහිරි ද නො වූ ලෝභ සම්ප්‍රයුක්ත **උපේක්‍ෂා** වේදනා සය ය.

Non-commercial distribution

**ඡ දිට්ඨියො:**

**79. අත්ථි මේ අත්තාති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

**80. නත්ථි මේ අත්තාති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

**81. අත්තනාව අත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

**82. අත්තනා වා අනත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

**83. අනත්තනා වා අත්තානං සඤ්ජානාමීති වා අස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

**84. අත වා පනස්ස එවං දිට්ඨි හොති, සො මෙ අයං අත්තා වාදො වේදෙය්‍යො, තත්‍ර තත්‍ර දීඝරත්තං කල්‍යාණපාපකානං කම්මානං විපාකං පච්චනුභොති. න සො ජාතො නාහොසි න සො ජාතො න භවිස්සති. නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මොති වා පනස්ස සච්චතො ථෙතතො දිට්ඨි උප්පජ්ජති.**

සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් මට ආත්මයක් ඇතය යි ගැනීම එක් දෘෂ්ටියකි. එසේ ගන්නා තැනැත්තේ ආත්මය අතීතයේත් තිබිණ, දැනුදු ඇත, එය අනාගතයේත් එසේ ම ඇත්තේ ය යි ගන්නේ නම් එය ශාස්වත දෘෂ්ටිය වේ. වර්තමානයෙහි පමණක් ඇත්තේ යයි ගන්නේ නම් එසේ ගැනීම උච්ඡේද දෘෂ්ටිය ය.

සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් මාගේ ආත්මය නැතය යි ගැනීම එක් දෘෂ්ටියකි. එයින් අදහස් කරන්නේ අතීතානාගත දෙක්හි නැති බව ය. මරණින් ආත්මය කෙළවර වන බව ය. ඒ උච්ඡේද දෘෂ්ටිය ය. ආත්මය අතීතයෙහි නො තිබී දැන් ඇතය යි ගන්නේ නම් එය ආත්මය ඉබේ ම ඇති වූයේ ය යන අධිච්ච සමුප්පන්න නම් ශාස්වත දෘෂ්ටිය වේ.

සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මයෙන් ආත්මය දනිමි යයි ගැනීම එක් දෘෂ්ටියකි. එයින් අදහස් කරන්නේ පඤ්චස්කන්ධය

Non-commercial distribution

ආත්ම වශයෙන් ගෙන එයින් එකක් වන සංඥාස්කන්ධයෙන් ආත්ම වශයෙන් ගන්නා ලද රූප වේදනා සංස්කාර විඥාන යන ස්කන්ධයන් ආත්මය යි සැලකීම ය.

සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මයෙන් ආත්ම නො වන දෙය දනිමිය යනු එක් දෘෂ්ටියකි. එයින් අදහස් කරන්නේ සංඥාස්කන්ධය පමණක් ආත්ම වශයෙන් ගෙන ආත්ම වශයෙන් නො ගන්නා ලද ඉතිරි ස්කන්ධ සතර දැන ගැනීම ය.

සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්ම නො වන දෙයකින් ආත්මය දැනගනිමිය යනු එක් දෘෂ්ටියකි. එයින් අදහස් කරනුයේ දැනගන්නා සංඥාස්කන්ධය ආත්ම වශයෙන් නො ගෙන ඉතිරි ස්කන්ධ සතර ආත්ම වශයෙන් ගෙන සංඥාස්කන්ධයෙන් ඒ ආත්ම වශයෙන් ගන්නා ලද ස්කන්ධ සතර දැනගැනීම ය.

කථා කරන්නා වූ දන්නා වූ විඳින්නා වූ ඒ ඒ භවයන්හි දීර්ඝ කාලයක් කුශලාකුශල කර්මයන්ගේ විපාකය අනුභව කෙරේ. ඒ නූපදනා ස්වභාව ඇති ඒ ආත්මය උපන් දෙයක් නො වේ. අතීතයෙහි නූපන්නේ ය. අනාගතයෙහිදී ද නූපන්නේ ය. ඒ ආත්මය ඇති වීම නැති වීම දෙක නැති බැවින් නිත්‍ය ය, ස්ථිරය, සර්වකාලිකය, නො පෙරළෙන ස්වභාව ඇතියකැයි ගැනීම එක් දෘෂ්ටියෙකි. මේ ශාස්වත දෘෂ්ටියෙකි.

මේ ෂට්ක වශයෙන් දේශිත සූවාසූවක් වන
ධර්මයන්ගේ විස්තරය ය.

**ෂට්ක නිර්දේශය නිමියේ ය.**

Non-commercial distribution

# සප්තක නිර්දේශය

සප්තක වශයෙන් දැක්වෙන ධර්ම එකුන් පනස

සත්තානුසයා, සත්ත සඤ්ඤෝජනානි, සත්ත පරිවුට්ඨානානි, සත්ත අසද්ධම්මා, සත්ත දුච්චරිතානි, සත්ත මානා, සත්ත දිට්ඨියො.

(ඛුද්දකවත්ථුවිභංග)

**සත්තානුසයා**

1. **කාමරාගානුසයෝ.** 2. **පටිඝානුසයෝ.**
3. **මානානුසයෝ.** 4. **දිට්ඨානුසයෝ.**
5. **විචිකිච්ජානුසයෝ.** 6. **භවරාගානුසයෝ.**
7. **අවිජ්ජානුසයෝ**

මේ ධර්ම සියල්ල ම යට විස්තර කර ඇත. කාමරාගානුසය, හා භවරාගානුසය ධර්ම වශයෙන් ලෝභය වූ එක ම ධර්මය බැවින් ධර්ම වශයෙන් අනුසය සයෙකි.

ලෝකෝත්තර මාර්ගය උපදවා එහි බලයෙන් මතු නූපදනා පරිදි කාමරාගාදිය සම්පූර්ණයෙන් ප්‍රහාණය නො කළ පුද්ගලයන් තුළ කරුණක් පැමිණිය හොත් උත්පත්තියට හේතු වන අරමුණක් එළඹ සිටිය හොත් උපදිය හැකි ආකාරයෙන් අලු යට ගිනි අඟුරු සෙයින්, නිද සිටින සර්පයන් මෙන්, ක්‍රියා විරහිත ව පවත්නා කාමරාගාදීහු **අනුසය** නම් වෙති. අනුසයයෝ අකුශලයෝ ය. එහෙත් ඔවුහු කුශලයට විරුද්ධ නැත්තෝ ය. සත්ත්වයා දන් දීමෙහි යෙදී සිටින අවස්ථාවෙහිද ශීලය රක්නා අවස්ථාවෙහි ද බණ කියන බණ අසන සමථ විදර්ශනා භාවනාවන්හි යෙදෙන අවස්ථාවන්හි ද ඒවාට විරුද්ධ නැති ව ඒවාට අනුකූල ව අනුශයයෝ සන්තානයෙහි පවත්නාහ. අකුශල වුව ද කුශලයට ද

Non-commercial distribution

අනුකූල ව අවිරුද්ධ ව පවත්නෝ ය යන අර්ථයෙන් ද කාම රාගාදීහු අනුසය නම් වෙති.

ශයිත අවස්ථාවය පර්යුත්ථානාවස්ථාවය ව්‍යතික්‍රමණාවස්ථාවය යි කාමරාගාදීන්ගේ අවස්ථා තුනක් ඇත්තේ ය. ක්‍රියා විරහිත, ඇති බව නො දත හැකි ආකාරයෙන් සන්තානයෙහි යටපත්ව පවත්නා අවස්ථාව ශයිත අවස්ථාවය. කාරණයක් ඇති වූ කල්හි ඉපදීමට පැමිණි අවස්ථාව, චිත්තය හා උත්පාදස්ථිතිභංග යන අවස්ථාවන්ට පැමිණි අවස්ථාව, තවත් ක්‍රමයකින් කියත හොත් ජවන චිත්තය හා රූපාදි ආරම්මණයන් ගෙන ඉපද ඇති අවස්ථාව පර්යුත්ථානාවස්ථාවය. එනම් නැඟී සිටීමය. අවදිවීමය. නැඟී සිටියා වූ කාමරාගාදීහු බොරු කීම් ආදිය සඳහා මුඛයත් අදත්තාදනාදිය සඳහා කයත් ක්‍රියා කරවති. ඒ අවස්ථාව ව්‍යතික්‍රමණ අවස්ථාවය. අනුසයයෝ ය යි කියනුයේ මේ අවස්ථා තුනෙන් ශයිත අවස්ථාවෙහි පවත්නා කාමරාගාදීන්ටය. අනුශයයන් ලෝකෝත්තර මාර්ගයෙන් මිස අනිකකින් ප්‍රහාණය නො කළ හැකි ය.

**සත්ත සඤ්ඤොජනානි**

**8. කාමරාගසඤ්ඤොජනං. 9. පටිඝසඤ්ඤොජනං.**
**10. මානසඤ්ඤොජනං. 11. දිට්ඨිසඤ්ඤොජනං.**
**12. විචිකිච්ඡාසඤ්ඤොජනං. 13. භවරාගසඤ්ඤොජනං.**
**14. අවිජ්ජාසඤ්ඤොජනං.**

සත්ත්වයා සංසාරයෙහි බන්ධනය කරන්නේ ය යන අර්ථයෙන් කාමරාගාදීහු **සඤ්ඤොජන** නම් වෙති. මේ ධර්ම සත ම යට විස්තර කරන ලද්දේ ය.

**සත්ත පරියුට්ඨානානි:**

**15. කාමරාගපරියුට්ඨානං. 16. පටිඝපරියුට්ඨානං.**
**17. මානපරියුට්ඨානං. 18. දිට්ඨිපරියුට්ඨානං.**
**19. විචිකිච්ඡාපරියුට්ඨානං. 20. භවරාගපරියුට්ඨානං.**
**21. අවිජ්ජාපරියුට්ඨානං.**

Non-commercial distribution

ජවන චිත්තය හා එක් ව ඉපදීම් වශයෙන් නැඟී සිටියා වූ හෙවත් උත්පාද ස්ථිති භංග යන ක්ෂණත්‍රයට පැමිණීම් වශයෙන් නැඟී සිටියා වූ ධර්මයෝ **පරියුට්ඨාන** නම් වෙති. නැඟී සිටි කාමරාගය කාමරාග පරියුට්ඨානය ය. නැඟී සිටි ද්වේෂය පටිඝපරියුට්ඨානය ය. නැඟී සිටි මානය මානපරියුට්ඨානය ය. සෙස්ස ද මේ නයින් දත යුතු ය.

**සත්ත අසද්ධම්මා:**

22. **අස්සද්ධෝ හෝති.**
23. **අහිරිකෝ හෝති.**
24. **අනොත්තප්පී හෝති.**
25. **අප්පස්සුතෝ හෝති.**
26. **කුසීතෝ හෝති.**
27. **මුට්ඨස්සති හෝති.**
28. **දුප්පඤ්ඤෝ හෝති.**

අසත්පුරුෂයන්ගේ ස්වභාවයෝ, ලාමක අශාන්ත ස්වභාවයෝ අසද්ධර්මයෝ ය. මේ පුද්ගලාධිෂ්ඨාන දේශනාවෙකි. ශ්‍රද්ධාව නැතිබව, පවට ලජ්ජාව නැති බව, පවට බිය නැති බව, නූගත් බව, අලස බව, සිහිමුළා බව යන මේ කරුණු සත **අසද්ධර්මයෝ** ය. මෙහි නූගත් බවය කියනුයේ ධර්මය නො දන්නා බව ය.

**සත්ත දුච්චරිතානි:**

29. **පාණාතිපාතෝ.**
30. **අදින්නාදානං.**
31. **කාමේසු මිච්ඡාචාරෝ**
32. **මුසාවාදෝ.**
33. **පිසුණාවාචා.**
34. **ඵරුසාවාචා.**
35. **සම්ඵප්පලාපෝ.**

රාගාදි ක්ලේශයන් ගෙන් දූෂිත වූ බැවින් ප්‍රාණඝාතාදීහු **දුශ්චරිත** නම් වෙති.

**සත්ත මානා:**

36. **මානෝ.**
37. **අතිමානෝ.**
38. **මානාතිමානෝ.**
39. **ඔමානෝ.**
40. **අධිමානෝ.**
41. **අස්මිමානෝ.**
42. **මිච්ඡාමානෝ.**

මේ මාන සත ඒකක නිර්දේශයේ විස්තර කර ඇත්තේ ය.

Non-commercial distribution

**සත්ත දිට්ඨියෝ:**

මෙහි පාළිය දීර්ඝ බැවින් නො දක්වනු ලැබේ.

සත්ත දිට්ඨි යනුවෙන් මේ සප්තක නිර්දේශයේ දැක්වෙන්නේ උච්ඡේද දෘෂ්ටි සතෙකි. උච්ඡේද දෘෂ්ටියයි කියනුයේ මරණින් සත්ත්වයා කෙළවර වන්නේ ය යි ගැනීම ය. "ද්වේ ජනා උච්ඡේද දිට්ඨිං ගණ්හන්ති ලාභී ච අලාභී ච" යනුවෙන් ධ්‍යාන ලාභී වූ ද අලාභී වූ ද දෙදෙනකු උච්ඡේද දෘෂ්ටිය ගන්නා බව බ්‍රහ්මජාල සූත්‍රාර්ථකථාවෙහි දැක්වේ. දිවැස් ලබා ඇති ඇතැමෙක් රහතුන් ගේ චුතිය දැක ප්‍රතිසන්ධියක් නො දැකීමෙන් ආත්මය සිඳී ගියේ ය යන දෘෂ්ටිය ගනී. සත්ත්වයන් ගේ චුතිය පමණක් දැකිය හැකි ප්‍රතිසන්ධිය දැකීමට නො සමත් ධ්‍යානලාභීහු ද ඇත. ඔවුහු ද මරණින් සත්ත්වයා සිඳීයේය යි උච්ඡේද දෘෂ්ටිය ගනිති. ඇතැම්හු පරලොවක් ඇත ද නැත ද කියා කවුරු දනිත් ද? ඉඳී බිම වැටෙන ගස්වල කොළ නැවත නො වැඩෙන්නාක් මෙන් මළ සත්ත්වයා නැවත නො වැඩෙන්නේ ය යි කල්පනා කොට උච්ඡේද දෘෂ්ටිය ගනිති. බොහෝ පව් කළ පින් නො කළ අය ද පස් කම් සැප විඳීම ම උසස් දෙය කොට සලකා ගෙන සිටින ලෝභාධිකයෝ ද සුභාෂිත තේරුම් ගැනීමට තරම් නුවණ නැතියෝ ද උච්ඡේද දෘෂ්ටිය ගනිති.

43. රූපස්කන්ධය ප්‍රධාන කොට පඤ්චස්කන්ධය ආත්මය ලෙස සලකන ඇතැම් ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් මා පියන් නිසා උපන්නා වූ චාතුර්මහාභූතික වූ රූපවත් වූ මේ ආත්මය මරණින් කෙළවර වන්නේ ය, නැසෙන්නේ ය යි මෙසේ සත්ත්වයාගේ උච්ඡේදය ප්‍රකාශ කරයි. මේ එක් උච්ඡේද දෘෂ්ටියකි.

44. ඔහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. එහෙත් ඒ ආත්මය ඔබ කියන පරිදි සිඳෙන්නේ නො වේ. පින්වත, දිව්‍යමය වූ රූපවත් වූ කබලිංකාරාහාරය අනුභව කරන්නා වූ කාමාවචර දිව්‍යලෝකයන්ට අයත් වූ ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහිය, මම එය දනිමිය. දකිමිය. පින්වත, ඒ ආත්මය මරණින් මතු සිඳෙන්නේ ය. මේ එක් උච්ඡේද වාදයෙකි.

Non-commercial distribution

45. ඔහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. පින්වත, එහෙත් ඔබ කියන පරිදි ඒ ආත්මය සිඳෙන්නේ නො වේ. පින්වත, දිව්‍යමය වූ රූපවත් වූ ධ්‍යාන චිත්තයෙන් උපන්නා වූ සර්වාංග ප්‍රත්‍යංග සම්පූර්ණ වූ ඉන්ද්‍රිය පරිපූර්ණ වූ අන් ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහි ය, නො දක්නෙහි ය. මම එය දනිමිය, දකිමි ය. පින්වත, මේ ආත්මය එහි දී සම්පූර්ණයෙන් සිඳෙන්නේ ය. මේ එක් උච්ජේද වාදයෙකි.

46. ඔහුට අනිකෙක් මෙසේ කියයි පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැත යයි නො කියමි. එහෙත් ඔබ කියන පරිදි ඒ ආත්මය සිඳෙන්නේ නො වේ. පින්වත, සර්වාකාරයෙන් රූපාවචරධ්‍යාන සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන්ගේ අස්තංගමයෙන් නානත්ත සංඥාවන් මෙනෙහි නො කිරීමෙන් ‘අනන්තෝ ආකාසෝ’යි භාවනා කිරීමෙන් ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණියා වූ ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහි ය. නො දක්නෙහි ය. මම එය දනිමිය. දකිමිය. පින්වත, ඒ ආත්මය මරණින් මතු සිඳෙන්නේ ය. මේ එක් උච්ජේද වාදයෙකි.

47. ඔහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. එහෙත් ඔබ කියන පරිදි එය සිඳෙන්නේ නො වේ. පින්වත, ආකාසානඤ්චායතන ධ්‍යානය ඉක්මවා ‘අනන්තං විඤ්ඤාණං’ යි භාවනා කොට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට පැමිණියා වූ ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහි ය. නො දකින්නෙහි ය. මම එය දනිමිය දකිමිය. ඒ ආත්මය මරණින් සිඳෙන්නේ ය. මේ එක් උච්ජේද වාදයෙකි.

48. ඔහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. එහෙත් ඔබ කියන පරිදි ඒ ආත්මය සිඳෙන්නේ නො වේ. පින්වත, සර්වාකාරයෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ඉක්මවීමෙන් “නත්ථි කිඤ්චි” යි භාවනා කොට ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණි ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහි ය, නො දකින්නෙහිය. මම එය

Non-commercial distribution

දනිමිය. දකිමිය. මරණින් මතු ඒ ආත්මය සිඳෙන්නේ ය. මේ එක් උච්ඡේද වාදයෙකි.

49. ඔහුට අනිකෙක් මෙසේ කියයි. පින්වත, ඔබ කියන ආත්මය ඇත. එය නැතයයි නො කියමි. එහෙත් ඔබ කියන පරිදි ආත්මය එපමණකින් සිඳෙන්නේ නො වේ. පින්වත, සර්වාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණි ආත්මයක් ඇත. එය ඔබ නො දන්නෙහි ය. නො දක්නෙහි ය, මම එය දනිමිය, දකිමිය. පින්වත, ඒ නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණි ආත්මය මරණින් මතු සිඳෙන්නේ ය. අභාවයට යන්නේ ය. මේ එක් උච්ඡේද වාදයෙකි., මේ දෘෂ්ටි සත ය.

**සප්තක නිර්දේශය නිමියේ ය.**

---

*Non-commercial distribution*

# අෂ්ටක වශයෙන් දැක්වෙන ධර්ම සිවු සැට

අට්ඨ කිලේසවත්ථූනි, අට්ඨ කුසීතවත්ථූනි, අට්ඨසු ලෝකධම්මේසු චිත්තස්ස පටිඝාතෝ, අට්ඨ අනරිය වෝහාරා, අට්ඨ මිච්ඡත්තා, අට්ඨ පුරිස දෝසා, අට්ඨ අසඤ්ඤිවාද, අට්ඨ නේවසඤ්ඤිනාසඤ්ඤීවාද.

(ඛුද්දකවත්ථු විභංග)

**අට්ඨ කිලෙසවත්ථූනි:**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | **ලෝභෝ** | 2. | **දෝසෝ** | 3. | **මෝහෝ** |
| 4. | **මානෝ** | 5. | **දිට්ඨි** | 6. | **විචිකිච්ඡා** |
| 7. | **ථීනං** | 8. | **උද්ධච්චං.** | | |

කිලේසවත්ථු යන මෙහි ක්ලේශයෝ ම කිලේස වත්ථූහු ය. වත්ථු යන වචනයෙන් කියැවෙන විශේෂාර්ථයක් නැත. මේ ධර්ම අට යට ඒ ඒ තැන්වල විස්තර කර ඇත්තේ ය.

**අට්ඨ කුසීතවත්ථූනි:**

කුසීත පුද්ගලයා විසින් අලස බවට පිහිට කර ගන්නා වූ කරුණු කුසීත වස්ථු නම් වෙති. කුසීත වස්තූන් පිළිබඳ පාළිය දීර්ඝ බැවින් එය නො දක්වා එහි අදහස පමණක් දක්වනු ලැබේ.

**9 පළමු වන කුසීත වත්ථුව:**

මේ ශාසනයෙහි භික්ෂුවට වැඩක් කළ යුතු ව ඇත්තේ වේ. එවිට ඔහුට මෙබඳු අදහසක් වෙයි: මට වැඩක් කරන්නට ඇත්තේ ය. වැඩ කිරීමේ දී මාගේ ශරීරය වෙහෙසට පත් වන්නේ ය. එසේ සිතා හෙතෙමේ නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීම සඳහා ඒවා ලැබීම සඳහා සාක්ෂාත් කිරීම

Non-commercial distribution

සඳහා කායික මානසික වීර්‍ය්‍ය නො කරයි. මේ පළමුවන කුසීත වත්ථුව ය.

**10. දෙවන කුසීත වත්ථුව:**

භික්ෂුව විසින් කර්මයක් කොට නිමවන ලද්දේ වෙයි, ඔහුට මෙබඳු අදහසක් ඇති වෙයි; මම කර්මයක් කෙළෙමි. කර්මයක් කළා වූ මාගේ කය වෙහෙසට පත් විය. එබැවින් දැන් නිදමියි සිතා නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීම සඳහා වීර්‍ය්‍ය නො කරයි. ඒ ධර්මයන් ලැබීම සඳහා සාක්ෂාත් කරනු සඳහා වීර්‍ය්‍ය නො කරයි. මේ දෙවන කුසීත වත්ථුව ය.

**11. තුන්වන කුසීත වත්ථුව:**

භික්ෂුවට ගමනක් යාමට සිදු වී ඇත්තේ වෙයි. ඔහු මෙසේ සිතයි. මා විසින් ගමනක් යා යුතුව ඇත. යන කල්හි මාගේ ශරීරය වෙහෙසට පත් වන්නේ ය. එබැවින් මා විසින් කලින් සැතපිය යුතුය යි හෙතෙමේ නිදයි. නො පැමිණියා වූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලවලට පැමිණීමට වීර්‍ය්‍ය නො කරයි. ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍ය්‍ය නො කරයි. මේ තුන්වන කුසීත වත්ථුව ය.

**12. සතර වන කුසීත වත්ථුව:**

භික්ෂුව විසින් ගමන නිම කළේ වෙයි. ඔහුට මෙබඳු අදහසක් ඇති වේ. ගමනක් ගියා වූ මාගේ කය වෙහෙසට පත්ව ඇත්තේ ය. දැන් මම නිදමියි සිතා හෙතෙම නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීමට ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍ය්‍ය නො කරයි. මේ සතරවන කුසීතවත්ථුවය.

**13. පස් වන කුසීත වත්ථුව:**

භික්ෂුව ගමක හෝ නියම්ගමක හෝ පිඬු පිණිස හැසිර රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ පිණ්ඩපාතයක් සෑහෙන පමණට නො ලබයි. ඔහුට මෙබඳු අදහසක් වෙයි. මම පිඬු පිණිස හැසිර වුවමනා පමණට භෝජනයක් නො ලැබුවෙමි. මාගේ සිරුර ක්ලාන්තය, අප්‍රාණිකය එබැවින් මම නිදමියි නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන් ලැබීමට වීර්‍ය්‍ය නො

Non-commercial distribution

කරයි. ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍යය නො කරයි. මේ පස්වන කුසීත වත්ථුව ය.

**14. සවන කුසීත වත්ථුව:**

භික්ෂුව ගමක හෝ නියම්ගමක පිඬු පිණිස හැසිර රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භෝජනයක් සෑහෙන පමණට ලබයි. ඔහු මෙසේ සිතයි. මම ගමක හෝ නියම්ගමක පිඬු පිණිස හැසිර රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ භෝජනය රිසි පමණට ලැබුවෙමි. දැන් මාගේ කය ක්ලාන්තය. අකර්මණ්‍යය. බරය. දැන් විශ්‍රාම ගනිමි යි නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීමට වීර්‍යය නො කරයි. ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍යය නො කරයි. මේ සවන කුසීත වත්ථුවය.

**15. සත් වන කුසීත වත්ථුව:**

භික්ෂුවට ස්වල්ප ආබාධයක් ඇති වේ. ඔහුට මෙබඳු අදහසක් වෙයි. මට දැන් ස්වල්ප ආබාධයක් ඇත්තේ ය. දැන් මට විවේක ගැනීමට කාලය යි. ඔහු නිදයි. නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීමට වීර්‍යය නො කරයි. ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍යය නො කරයි. මේ සත්වන කුසීත වත්ථුවය.

**16. අට වන කුසීත වත්ථුව:**

භික්ෂුව රෝගයෙන් නැඟුණේ වෙයි. ඔහුට මෙබඳු අදහසක් ඇති වෙයි. මම දැන් රෝගයෙන් නැඟී සිටිමි. මාගේ කය තව ම දුබල ය. අකර්මණ්‍යය. මම දැන් නිදමියි නිදයි. නො පැමිණියා වූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීමට වීර්‍යය නො කරයි. ඒවා ලැබීමට සාක්ෂාත් කිරීමට වීර්‍යය නො කරයි. මේ අටවන කුසීත වත්ථුව ය. මේ කුසීත වස්තු අට දේශනය කර ඇත්තේ බුද්ධ කාලයේ හා එයට සමීප අතීත කාලයේ වර්තමාන ජාතියේදී ම රහත්වීමේ බලාපොරොත්තුවෙන් පිළිවෙත් පිරූ භික්ෂූන් වහන්සේ අනුව ය.

සංසාර දුඃඛයෙන් එතරවීමේ අපේක්ෂාවෙන් බුදු සස්නෙහි පැවිදි ව පිළිවෙත් පුරන සැදැහැවත් භික්ෂූන්ට, කුසීත වස්තු වශයෙන් දක්වන ලද මේ කරුණු අට වීර්‍යය කිරීමට හේතුවන

Non-commercial distribution

කරුණු ද වේ. එබැවින් ඒවා **අංගුත්තර නිකායේ අෂ්ටක නිපාතයේ** සූත්‍රයක **ආරම්භ වස්තු** නාමයෙන් ද වදරා ඇත්තේ ය.

ඉදිරියට වැඩක් කරන්නට යෙදී තිබීම අලස භික්ෂුවට නිද ගැනීමට කරුණක් වන්නාක් මෙන් ම සැදැහැවත් භික්ෂුවට වීර්‍ය්‍ය කිරීමට කරුණක් වේ. ශ්‍රද්ධාවත් භික්ෂු තෙමේ ඉදිරි කාලයේ වැඩක යෙදෙන්නට සිදුවී ඇති කල්හි වැඩක යෙදෙන්නා වූ මට නො පැමිණි ධ්‍යානාදියට පැමිණීම සඳහා භාවනා කිරීමට නො ලැබෙන්නේ ය වැඩ පටන් ගැනීමට කලින් නො පැමිණි ධ්‍යානාදියට පැමිණීමට උත්සාහ කළ යුතු ය යි විශ්‍රාම ගැනීමක් නො කොට වඩා උත්සාහයෙන් මහණ දම් පිරීමේ යෙදෙයි. මේ කුසීත වස්තුව ආරම්භ වස්තුව වන ආකාරය ය.

අලස භික්ෂුව පටන් ගත් කර්මාන්තය නිම වූ සැටියේ මහන්සිය සිතා නිදන්නේ ය. වීර්‍ය්‍යවත් භික්ෂු තෙමේ වැඩක යෙදී සිටීමට වූ ඒ කාලය තුළ දී භාවනාවෙහි යෙදෙන්නට නො ලැබීමෙන් සිදු වූ පාඩුව පිරිමසා ගත යුතු යයි වහා භාවනාවෙහි යෙදෙයි.

අලස භික්ෂුව ගමනක් යාමට ඇති කල්හි ඉදිරියට වන්නට ඇති වෙහෙස ගැන සිතා කලින් ම නිදයි. වීර්‍ය්‍යවත් භික්ෂු තෙමේ ගමනක් යෑමට ඇති කල්හි ගමනෙහි දී භාවනාවෙහි යෙදීමට අවකාශ නො ලැබී යෑම ගැන සලකා වඩාත් උත්සාහයෙන් ගමනට පෙර භාවනාවෙහි යෙදෙයි.

වීර්‍ය්‍යවත් භික්ෂු තෙමේ ගමන අවසන් කළ පසු වෙහෙසුණෙමි යි අලස භික්ෂුව නිදන්නාක් මෙන් නො නිද ගමනෙන් වූ පාඩුව සලකා භාවනාවෙහි යෙදේ.

වීර්‍ය්‍යවත් භික්ෂු තෙමේ මඳ අහරක් ලද දිනයේ අලස භික්ෂුව මෙන් සෑහෙන පමණට ආහාර නො ලදිමි යි නො නිද මඳ ආහාරයක් වැළඳූ මාගේ කය සැහැල්ලුය යි සලකා භාවනාවෙහි යෙදේ. සෑහෙන පමණට ආහාරය ලද දිනයෙහි ද අද මාගේ ශරීරය බරය ක්ලාන්තය කියා නො නිද අද මාගේ ශරීරය බලවත්ය කර්මණ්‍යය යි වඩාත් උත්සාහයෙන් භාවනාවෙහි යෙදේ.

Non-commercial distribution

වීය්‍ය්‍යවත් භික්ෂුව ස්වල්ප ආබාධයන් ඇති වූ කල අලස භික්ෂුව මෙන් නො නිද මේ ආබාධය වර්ධනය වුව හොත් මා හට නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලයන්ට පැමිණීම සඳහා භාවනාවෙහි යෙදෙන්නට නො ලැබෙන්නේ ය යි මහත් වූ වීය්‍ය්‍යයෙන් භාවනාවෙහි යෙදේ. රෝගයක් වැළඳී එය සුව වූ පසු ද මට තවම ශක්තිය නැත, ක්ලාන්තය කියා නිදන්නේ නැති ව රෝගී ව සිටි කාලයේ දී මා හට නො පැමිණි ධ්‍යාන විදර්ශනා මාර්ග ඵල ලැබීම සඳහා පිළිවෙත් නො පිරිය හැකි විය. දැන් ඒ පාඩුව පිරිමැසීමටත් භාවනාවෙහි යෙදෙමි යි සිතා ම මහෝත්සාහයෙන් භාවනාවෙහි යෙදේ. මේ වීය්‍ය්‍යවත් භික්ෂුවට අලසයාට නිදීමට හේතු වන කරුණු වීය්‍ය්‍ය කිරීමට හේතු වන ආකාරය ය.

**අට්ඨසු ලෝකධම්මේසු චිත්තස්ස පටිඝාතෝ:**

| | |
|---|---|
| **17. ලාභේ සාරාගෝ** | **18. අලාභේ පටිවිරෝධෝ** |
| **19. යසේ සාරාගෝ** | **20. අයසේ පටිවිරෝධෝ.** |
| **21. පසංසාය සාරාගෝ** | **22. නින්දය පටිවිරෝධෝ** |
| **23. සුඛෙ සාරාගෝ** | **24. දුක්ඛෙ පටිවිරෝධෝ.** |

භික්ෂුව විසින් තමාට අවශ්‍ය චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය යන මේවා ලද කල්හි මට බොහෝ ප්‍රත්‍යය ඇත, මම බොහෝ ප්‍රත්‍යය ලබමි යි ප්‍රත්‍යයන් සම්බන්ධයෙන් ඇති වන අධික තණ්හාව ද, ගිහියා විසින් ඔහුට අවශ්‍ය වතු, කුඹුරු, ගෙවල්, වාහන මිල මුදල් ආදිය ලද කල්හි ඒවා ගැන ඇති වන අධික තණ්හාව ද, "ලාභේ සාරාගෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය.

පැවිද්දාට හෝ ගිහියාට හෝ ලැබී ඇති දෑ නැති වීමෙන් හා ලැබීමේ මාර්ග නැති වීමෙන් හට ගන්නා වූ දොම්නස "අලාභේ පටිවිරෝධෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය.

ශිෂ්‍යයෝය, සභාග භික්ෂූහුය, නෑයෝ ය, මිත්‍රයෝ ය, දායකයෝ ය යන මොවුහු භික්ෂුවගේ පිරිවර ය. දූ දරුවෝ ය, සහෝදර සහෝදරියෝ ය, නෑයෝ ය, මිතුරෝ ය, සේවකයෝ ය යන මොවුහු ගිහියාගේ පිරිවර ය. පිරිවර ඇති කල්හි මට බොහෝ

Non-commercial distribution

පිරිවර ඇත්තේ ය යි පිරිවර සම්බන්ධයෙන් ඇති වන අධික තණ්හාව "යසේ සාරාගෝ" යනුවෙන් දැවෙන ක්ලේශය ය.

පරිවාර ජනයා විසින් තමා හළ කල්හි පිරිවර මඳ වූ කල්හි දැන් මට කවුරුන්වත් නැත, මම තනි වීමියි ඇති වන දොම්නස "අයසේ පටිවිරෝධෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය.

අන්‍යයන් විසින් ප්‍රශංසා කරන කල්හි ඒ ප්‍රශංසාව ගැන ඇති වන අධික වූ සප්‍රීතික තෘෂ්ණාව "පසංසාය සාරාගෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය. අන්‍යයන් නින්ද කරන කල්හි නින්දව නිසා ඇති වන දොම්නස "නින්දය පටිවිරෝධෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය.

සිත කය දෙකට සැප ඇති වන කල්හි මට සැපය කියා සැපය ගැන ඇති වන අධික තණ්හාව "සුඛෙ සාරාගෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය. රෝග වැළඳීම් ආදියෙන් දුක් ඇති වන කල්හි ඇති වන දොම්නස "දුක්ඛෙ පටිවිරෝධෝ" යනුවෙන් දැක්වෙන ක්ලේශය ය.

ලාභය, අලාභය, යස, අයස, ප්‍රශංසා, නින්ද, සුඛ, දුඃඛ යන මේ කරුණු අට එකින් එක මතු වෙමින් යට වෙමින් සත්ත්ව ලෝකය යට කරගෙන පෙරළෙන බැවින් ද, ලොවුතුරා බුදුවරයන් ඇතුළු සකල සත්ත්ව සමූහය ම මේ ධර්මයන් අනුව පෙරළෙන බැවින් ද **ලෝක ධර්ම** නම් වෙති. ලෝක ධර්මයන් අනුව නො පෙරළී සැම කල්හි එකම ආකාරයකින් සිටීමට සමත් පුද්ගලයෙක් ලෝකයේ නැත්තේ ය. මේ අෂ්ට ලෝක ධර්මය බුදු සිරිතෙන් වඩාත් පැහැදිලි ව පෙනේ.

බුදුන් වහන්සේට බොහෝ ලාභ උපණ. එපමණ ලාභී වූ අන් ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් නො වූහ. උන්වහන්සේට දනයක් දීමට අවකාශයක් ලබා ගත නො හැකි ව අවකාශයක් ලැබූ විටෙක දන් දෙමියි ඇතැම් සැදැහැවත්හු ගැල්වල බඩු පටවාගෙන උන් වහන්සේ ලුහුබැඳ ගියහ. ඒ මහා ලාභී වූ භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක කාගෙන්වත් ආහාරයක් නො ලබමින් **වේරඤ්ජාවෙහි** වැඩ වෙසෙමින් තෙමසක් යව වැළඳූහ. උන්වහන්සේට පිරිවර වූ

Non-commercial distribution

බොහෝ ශ්‍රාවකයෝ වූහ. නොයෙක් විට උන්වහන්සේ චාරිකාවෙහි යෙදුණේ ද පන්සියයක් පමණ භික්ෂූන් පිරිවරා ගෙන ය. එහෙත් එක් කලෙක උන්වහන්සේ කිසිදු ශ්‍රාවකයකු නො මැතිව **පාරිලෙය්‍යක** වනයෙහි තනි වූහ. උන් වහන්සේ මිනිසුන් ගෙන් පමණක් නොව දේව බ්‍රහ්මයන්ගෙන් ද අපමණ ප්‍රශංසා ලැබූහ. **චිඤ්චමාණවිකාදීන්ගෙන්** බොහෝ නින්ද ද ලැබූහ. උන්වහන්සේ කාම සුඛයන්ට වඩා ප්‍රණීත වූ ධ්‍යාන සුඛ ඵලසමාපත්ති සුඛ විඳිමින් විසූහ. සමහර අවස්ථාවලදී දුක් ගෙන දෙන ශාරීරිකාබාධ ද උන්වහන්සේට ඇති විය. මෙසේ ලොවුතුරා බුදුවරුන් කෙරෙහි ද ලෝක ධර්මයන් ඇති කල්හි සෙස්සන් ගැන කියනුම කිම?

සසර සැරි සරන කිසි ම පුද්ගලයකුට අෂ්ට ලෝක ධර්මයට යට නොවී නො විසිය හැකි ය. පෙරළෙන්නාවූ ලෝක ධර්මය අනුව සිත පෙරළෙන්නට නොදී යම් කිසිවකුට නො සැලී සම සිතින් විසිය හැකි නම් ඒ පුද්ගලයා උත්තම පුද්ගලයෙකි. ලෝක ධර්මයන් නිසා සර්වාකාරයෙන් නො සැලී සිටීමට සමත් වන්නේ රහතුන් පමණෙකි. පෘථග්ජනයෝ ලෝක ධර්මයෙන් සැලෙති. එහෙත් ඔවුන්ගේ වෙනසක් ඇත. අන්ධ පෘථග්ජනයාය, කල්‍යාණ පෘථග්ජනයායයි පෘථග්ජනයෝ දෙදෙනෙකි. ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය ප්‍රතීත්‍ය සමුත්පාදාදි ධර්ම විභාග නො දන්නා වූ සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණය නො දන්නා වූ පෘථග්ජනයා **අන්ධ පෘථග්ජනයා** ය. ඔහුට ලාභ යස ප්‍රශංසා සුඛයන්ගේ අනිත්‍යතාව නො වැටහෙන බැවින් ඔහු ඒවායේ තදින් ඇලේ. ඒවා නිසා උඩඟු වේ. අලාභ අයශ නින්ද දුක්වලදී දොම්නසට පැමිණේ. බිය වේ. බැගෑපත් වේ.

“එවං සෝ අනුරෝධ විරෝධ සමාපන්නෝ න පරිමුච්චති ජාතියා ජරාය මරණේන සෝකේහි පරිදේවේහි දුක්ඛෙහි දෝමනස්සේහි උපායාසේහි න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි”

(අංගුත්තර අට්ඨක නිපාත)

යනුවෙන් මෙසේ ලෝක ධර්මයන්හි ඇලීම හා විරෝධය ඇති පුද්ගල තෙමේ ජාතියෙන් ජරාවෙන් මරණයෙන් ශෝකයන්-

Non-commercial distribution

ගෙන් පරිදේවයන්ගෙන් දුඃඛයන්ගෙන් දෞර්මනස්‍යයන්ගෙන් උපායාසයන්ගෙන් නො මිදේ. දුකින් නො මිදේය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය.

ස්කන්ධාදි ධර්ම විභාග ගැන හා සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණය ගැන උගෙනීම් පිළිවිසීම් ඇත්තා වූ බුද්ධ ධර්මය උගත් පෘථග්ජන පුද්ගලයා **කල්‍යාණ පෘථග්ජනයා** ය. ඔහු ලෝක ධර්මයන්ගේ අනිත්‍යතාව දුඃඛතාව දන්නා බැවින් අෂ්ටලෝක ධර්මයන්හි තදින් නො ඇලේ. ඒවා නිසා උඩඟු නො වේ. අෂ්ට ලෝක ධර්මයන් නිසා ශෝක නො වී බැගෑපත් නො වී නො කීපී මැදහත් ව වෙසේ. අලාභයක් කෙළේ ය, පිරිස භේද කෙළේ ය, නින්ද කෙළේ ය, කියා අන්‍යයන්ගෙන් පළි ගැනීම් වශයෙන් අපරාධ නො කරයි. ලාභාදිය පිණිස පව් කම් නො කරයි. එසේ ලෝක ධර්මයන්හි සමව හැසිරෙන පුද්ගලයාට මෙලොව ද ලෝක ධර්මයන් නිසා වන මානසික පීඩා මඳ ය. දුකින් මිදිය හැකි වන්නේ ද ලෝක ධර්මයන්හි සමව පැවතිය හැකි පුද්ගලයන්ට ය. ලෝක ධර්මයන්හි නො සැලී විසිය හැකි තත්ත්වය ඇති කර ගත හැක්කේ බුදුන් වහන්සේ ගේ ධර්මය උගෙනීමෙනි. ලෝක ධර්මයන්හි නො සැලී සිටිය හැකි බව මංගල සූත්‍රයේ වදරා ඇති අටතිස් මඟුල් කරුණු වලින් ද එකකි.

**අට්ඨ අනරිය වෝහාරා:**

**25. අදිට්ඨෙ දිට්ඨවාදිතා**
**26. අසුතේ සුතවාදිතා**
**27. අමුතේ මුතවාදිතා**
**28. අවිඤ්ඤාතේ විඤ්ඤාතවාදිතා**
**29. දිට්ඨෙ අදිට්ඨවාදිතා**
**30. සුතේ අසුතවාදිතා**
**31. මුතේ අමුතවාදිතා**
**32. විඤ්ඤාතේ අවිඤ්ඤාතවාදිතා**

මේ අනාර්‍ය්‍ය ව්‍යවහාර අට චතුෂ්ක නිර්දේශයේ විස්තර කර ඇත්තේ ය.

Non-commercial distribution

**අට්ඨ මිච්ඡත්තා:**

| | | | |
|---|---|---|---|
| **33**. | **මිච්ඡාදිට්ඨි** | **34**. | **මිච්ඡාසංකප්පො** |
| **35**. | **මිච්ඡාවාචා**. | **36**. | **මිච්ඡාකම්මන්තො** |
| **37**. | **මිච්ඡා ආජීවො**. | **38**. | **මිච්ඡාවායාමො**. |
| **39**. | **මිච්ඡාසති**.. | **40**. | **මිච්ඡාසමාධි**. |

මිච්ඡත්තා යනු වැරදි ස්වභාවයෝ ය.

මිච්ඡාදිට්ඨි යනු පින්පව්වල විපාකයන් නැත, පරලොවක් නැත යනාදි වැරදි පිළිගැනීම ය. මිච්ඡා සංකප්ප යනු කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසා විතර්ක යන මිථ්‍යා විතර්කයෝ ය. මිච්ඡාවාචා යනු මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප යන වාක් දුෂ්චරිත සතර ය. මිච්ඡාකම්මන්ත යනු ප්‍රාණඝාතාදි කාය දුශ්චරිත තුන ය. මිච්ඡාජීව යනු වැරදි ලෙස ජීවත් වීම ය. ජීවත් වීම සඳහා ප්‍රාණඝාතාදි පාප කර්මයන් කිරීම හා මත්පැන් ආදිය වෙළඳම් කිරීම ගිහියාගේ මිථ්‍යාජීවය ය. කුලදූෂණ, අනේසනවලින් ජීවත් වීම පැවිද්දන්ගේ මිථ්‍යාජීවය ය. අකුශල කරණයෙහි නො පසුබස්නා බව වූ අකුශල චිත්ත සම්ප්‍රයුක්ත වීර්‍ය්‍යය මිච්ඡාවායාමය ය. මිච්ඡා සතිය කියා විශේෂ චෛතසිකයක් නැත. අකුශලකරණය ම මිච්ඡාසතිය ය. අකුශල චිත්තසම්ප්‍රයුක්ත වූ ඒකාග්‍රතාව මිච්ඡා සමාධිය ය. එය සියලු අකුශල චිත්තයන්හි ඇත්තේ ය.

**අට්ඨ පුරිසදෝසා:**

පුරිස දෝස යනු පුද්ගලයන්ගේ දෝෂයෝ ය. පාළිය දිග බැවින් මෙහි නො දක්වනු ලැබේ. මේ භික්ෂූන් පිළිබඳ කරුණු අටෙකි.

41. මේ ශාසනයෙහි භික්ෂුවක් ඔබ මෙනම් ඇවතට පැමිණියෙහි ය යි භික්ෂුවකට චෝදනා කරයි. ඒ භික්ෂු තෙමේ එවැන්නක් කළ බවක් මට මතක නැත කියා වරදින් මිදෙන්නට තැත් කරයි. මේ පළමුවන පුරුෂ දෝෂය ය. වරදක් වුව හොත් එයට කළ යුතු ප්‍රතිකාර කොට ශීලය පිරිසිදු කර ගත යුතු ය. මේ දෝෂය නිසා ඒ භික්ෂුව පාරිශුද්ධියක් නො ලබයි.

Non-commercial distribution

42. ඇතැම් භික්ෂුවක් අන් භික්ෂුවක් විසින් තමාට ආපත්තියෙන් චෝදනාවක් ඉදිරිපත් කළ කල්හි බාල වූ අව්‍යක්ත වූ ඔබගේ කථාවෙන් කවර ප්‍රයෝජනයක් ද ඔබත් චෝදනා කරන්න සිතන්නෙහි ද කියා චෝදක භික්ෂුවට දෝෂාරෝපනය කර තමා නිදහස් වන්නට උත්සාහ කරයි. මේ දෙවන පුරුෂ දෝෂය ය.

43. ඇතැම් භික්ෂුවක් අන් භික්ෂුවක් විසින් තමාට ආපත්තියෙන් චෝදනා කරන කල්හි ඔබ ද මෙනම් ඇවතට පැමිණ ඇත්තෙහි ය. ඔබගේ ආපත්තියට පළමුවෙන් ප්‍රතිකාර කර ගනුවයි චෝදකයාට ම චෝදනා කොට තමාගේ ආපත්තිය යටපත් කිරීමට උත්සාහ කරයි. මේ තුන්වන පුරුෂ දෝෂය ය.

44. ඇතැම් භික්ෂුවක් භික්ෂූන් විසින් ආපත්තියෙන් චෝදනා කරන කල්හි එය යටපත් කිරීමට අනිකක් කියයි. කථාව අන් අතකට හරවයි. ඔබ ඇවතට පැමිණියෙහිය යි කියන කල්හි කවරෙක් ආපත්තියට පැමිණියේ ද කුමකට පැමිණියේ ද කෙසේ ඇවතට පැමිණියේ ද ඔබ වහන්සේලා කියන්නේ කාටද යනාදිය කියයි. ඔබ ඇවතට පැමිණියෙහිය යි කියන කල්හි මම සැවැත් නුවරට ගියෙමි. එහි බොහෝ ජනයා ඇත යනාදීන් කථාව අන් අතකට ගෙන යයි. කෝපයත් නො සතුටක් දක්වයි. මේ සතර වන පුරුෂ දෝෂය ය.

45. ඇතැම් භික්ෂුවක් භික්ෂූන් විසින් ආපත්තියෙන් චෝදනා කරන කල්හි සඟ මැද දෙ අත් ඔසවා හරඹ කරමින් නො සරුප් කතා කරයි. මේ පස්වන පුරුෂ දෝෂය.

46. ඇතැම් භික්ෂුවක් භික්ෂූන් විසින් ආපත්තියෙන් චෝදනා කරන කල්හි මා ඇවතකට පැමිණ නැතය යි තුෂ්ණීම්භූත ව හිඳ සංඝයා වෙහෙසවයි. මේ සවන පුරුෂ දෝෂය ය.

47. ඇතැම් භික්ෂුවක් භික්ෂූන් විසින් සඟ මැද ආපත්තියෙන් චෝදනා කරන කල්හි සංඝයා හට සැලකිල්ලක් නො කොට චෝදකයා ගණන් නො ගෙන චෝදනාව ගණන් නො ගෙන ඇවතින් නොනැඟී සාපත්තික ව ම නැඟී යයි. මේ සත්වන පුරුෂ දෝෂයය.

Non-commercial distribution

48. ඇතැම් භික්ෂුවක් භික්ෂූන් විසින් ආපත්තියෙන් චෝදනා කරන කල්හි ඔබ වහන්සේලා අප ගැන බොහෝ වෙහෙසෙන්නාහුය. අප ගැන වෙහෙසීමෙන් කම් නැත. ඔබ වහන්සේලාට කරදරයක් නැති වීම පිණිස අපි යන්නෙමුයි සිවුරු හැර යයි. මේ අටවන පුරුෂ දෝෂය ය.

**අට්ඨ අසඤ්ඤී වාදා:**

**49. රූපී අත්තා හෝති. අරොගො පරම්මරණාති අසඤ්ඤීති තං පඤ්ඤාපෙන්ති.**
**50. අරූපී අත්තා -පෙ-**
**51. රූපී ච අරූපී ච -පෙ-**
**52. නේවරූපී නාරූපී -පෙ-**
**53. අන්තවා අත්තා හෝති අරෝගෝ පරම්මරණාති අසඤ්ඤීති තං පඤ්ඤාපෙන්ති**
**54. අනන්තවා අත්තා හෝති -පෙ-**
**55. අන්තවා ච අනන්තවා ච අත්තා හෝති -පෙ-**
**56. නේවන්තවා නානන්තවා අත්තා හෝති -පෙ-**

අසංඥ ආත්මයක් ඇතයයි ගන්නා දෘෂ්ටිවාද අටෙකි. මරණින් මතු ද රූපවත් ආත්මයක් නො නැසී පවතීය, එය අසංඥී ය යි ගන්නා එක් වාදයෙකි. ධ්‍යාන ලාභීන්ට කසිණ රූපය ආත්මය යි ගැනීම් වශයෙන් මේ දෘෂ්ටිය ඇති වේ. ධ්‍යාන නැතියෝ තර්කමාත්‍රයෙන් ඒ දෘෂ්ටිය ගනිති. ඇතැම් ධ්‍යානලාභීහු අරූපධ්‍යාන නිමිත්ත ආත්ම වශයෙන් ගෙන එය අසංඥීයයි කියති. ධ්‍යාන නැතියෝ තර්කමාත්‍රයෙන් අරූපී ආත්මය මරණින් මතු ඇතය යි කියති. ඒ ආත්මය අසඤ්ඤීය යි ද කියති. මේ එක් දෘෂ්ටියෙකි. රූපවත් වූ ද අරූපී වූ ද ආත්මයක් මරණින් මතු නො නැසී ඇත. එය අසංඥීය යි කීම එක් දෘෂ්ටි වාදයෙකි. මේ දෘෂ්ටිය රූපාවචර අරූපාවචර සමාපත්ති දෙවර්ගය ම ඇතියන්ට හා තාර්කිකයන්ට ද ඇති වේ. මරණින් මතු රූපයක් ඇත්තේ ද නැත්තේ ද නො වන ආත්මයක් නො නැසී ඇත. එය අසංඥීය යනු එක් දෘෂ්ටිවාදයෙකි. එය තාර්කිකයන් හට ම ඇති වන දෘෂ්ටියකි.

මරණින් මතු අන්තවත් ආත්මයක් නො නැසී ඇත. එය අසංඥීය යනු එක් දෘෂ්ටි වාදයෙකි. එය කුඩා වූ කසිණ නිමිත්ත

Non-commercial distribution

ආත්මය යි ගන්නවුන්ට ඇති වන දෘෂ්ටියකි. අනන්තවත් ආත්මයක් මරණින් මතු ද නො නැසී ඇත. එය අසංඥීය යි ගැනීම එක් දෘෂ්ටි වාදයකි. ප්‍රමාණයක් නො ගත හැකි පමණට මහත් කසිණ නිමිත්ත ඇති ධ්‍යානලාභීන්ට මේ දෘෂ්ටිය ඇති වේ. මරණින් මතු ද නො නැසී පවතින අන්තවත් ද අනන්තවත් ද වූ ආත්මයක් ඇත. එය අසංඥීය යි ගෙන කීම එක් දෘෂ්ටිවාදයෙකි. එය උඩ යට දෙකින් පර්යාන්ත ඇති සරසින් පර්යාන්තයක් නැති කසිණ නිමිත්ත ඇතියන්ට ඇති වන දෘෂ්ටියෙකි. මරණින් මතු අන්තවත් ද නො වූ අනන්තවත් ද නො වූ ආත්මයක් නො නැසී ඇත. එය අසංඥීය යි පැවසීම එක් දෘෂ්ටි වාදයෙකි. එය තාර්කිකයන්ට ඇතිවන දෘෂ්ටියෙකි.

**අට්ඨ නේවසඤ්ඤී නාසඤ්ඤී වාද:**

**57. රූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති.**
**58. අරූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා -පෙ-**
**59. රූපී ච අරූපී ච අත්තා හෝති -පෙ-**
**60. නේවරූපී නාරූපී අත්තා හෝති -පෙ-**
**61. අන්තවා අත්තා හෝති -පෙ-**
**62. අනන්තවා අත්තා හෝති -පෙ-**
**63. අන්තවා ච අනන්තවා ච අත්තා හෝති -පෙ-**
**64. නේවන්තවා නානන්තවා අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤී නාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති.**

මේ නේවසංඥීවාද අට ඉහත කී අසංඥීවාද අටට සමාන ය. වෙනස ආත්මය අසංඥී නො ව නේවසඤ්ඤී නාසඤ්ඤීය යි කීම පමණෙකි. එහි තේරුම මරණින් මතු ඇති ආත්මය සංඥාව ඇත්තේ ද නො වන නැත්තේ ද නො වන දෙයක් ය යනුයි.

මේ අෂ්ටක වශයෙන් දැක්වෙන ධර්ම සිවු සැටය.

**අෂ්ටක නිර්දේශය නිමියේ ය.**

Non-commercial distribution

# නවක වශයෙන් දැක්වෙන ධර්ම එක් අසූව

නව ආඝාත වත්ථූනි, නව පුරිසමලානි, නවවිධමානා, නව තණ්හාමූලිකා ධම්මා, නව ඉඤ්ජිතානි, නව මඤ්ඤිතානි, නව ඵන්දිතානි, නව පපඤ්චිතානි, නව සංඛතානි.

**නව ආඝාත වත්ථූනිः**

1. **අනත්ථං මේ අචරීති ආඝාතෝ ජායති.**
2. **අනත්ථං මේ චරතීති ආඝාතෝ ජායති.**
3. **අනත්ථං මේ චරිස්සතීති ආඝාතෝ ජායති.**
4. **පියස්ස මේ මනාපස්ස අනත්ථං අචරි.**
5. **අනත්ථං චරති.**
6. **අනත්ථං චරිස්සතීති ආඝාතෝ ජායති.**
7. **අප්පියස්ස මේ අමනාපස්ස අත්ථං අචරි.**
8. **අත්ථං චරති.**
9. **අත්ථං චරිස්සතීති ආඝාතෝ ජායති.**

ආඝාත යනු ක්‍රෝධය ය. මොහු මා හට පෙර අනර්ථ කෙළේ ය යි ආඝාතය ඇති වේ. මොහු මා හට දැන් අනර්ථ කෙරේය යි ආඝාතය ඇති වේ. මොහු මතු මට අනර්ථ කරන්නේ ය යි ආඝාතය හට ගනී. තමාගේ දෙයක් සොරා ගත් එකකු තමාට අවමානයක් කළ එකකු තමාට පහර දුන් එකකු තමාට විරුද්ධව සාක්ෂි දී ඇතියකු යම්කිසි කරුණක දී තමාට විරුද්ධ ව ක්‍රියා කර ඇතියකු සිහි වන කල්හි දකින කල්හි මොහු මට අනර්ථ කර ඇතියෙකැයි ආඝාතය උපදී. තමා සපා කෑ සුනඛයකු සර්පයකු ගොවිතැන පාළු කළ ගවයකු මීයකු දකින සිහි වන විට තිරිසන් සතුන් ගැන ද ආඝාතය ඇති වේ. වරද කරන අවස්ථාවෙහි ආඝාතය ඇති වීම ප්‍රකට ය. මොහු අනාගතයේ මට අනර්ථ කරන්නේ ය කියා ආඝාතය ඇති වීම මඳ ය. අතීතයේ ඇතැම් රජුන් මොවුන් දියුණු වුවහොත් මා මරනු ඇතැයි සිතා ඇතැම් දරුවන් මරා දැමූ බව

Non-commercial distribution

අතීත කතා වල දක්නා ලැබේ. ඒ මතු අනර්ථ කරන්නේය කියා ඇති වන ආඝාතය ය. ඇතැම් බලවත්හු මොවුන් දියුණු වුවහොත් අපට කරදර කරනු ඇතය යි අන්‍යයන් ගේ දියුණුවට බාධා කරති. එය අනාගතයේ අනර්ථ කරනු ඇත ය යි ඇතිවන ආඝාතය ය. ඇතැම්හු මොවුන් වැඩුණ හොත් අපට කරදරයක් වන්නේය යි බලු බළල් පැටවුන් විනාශ කරති. එය අනාගතය සම්බන්ධයෙන් ද ඇති වන ආඝාතය ය.

මාගේ ප්‍රියමනාප පුද්ගලයන්ට මොහු අනර්ථ කෙළේ යයි ද ආඝාතය ඇති වේ. මාගේ ප්‍රියමනාප පුද්ගලයන්ට මොහු අනර්ථ කරයි, මතු කරන්නේ ය යි ආඝාතය ඇති වේ. ප්‍රිය පුද්ගලයෝ නම් අඹු දරු සහෝදරාදීහු ය.

මාගේ සතුරන්ට මොහු උපකාර කෙළේ ය, දැනට කරන්නේ ය, මතු ද කරන්නේ ය යි ආඝාතය හට ගනී. මේ නව විධ ආඝාත වස්තූහු ය.

**නව පුරිස මලානි:**

| | | | | | |
|---|---|---|---|---|---|
| 10. | **කෝධෝ.** | 11. | **මක්ඛෝ.** | 12. | **ඉස්සා.** |
| 13. | **මච්ඡරියං.** | 14. | **මායා.** | 15. | **සාඨෙය්‍යං** |
| 16. | **මුසාවාදො.** | 17. | **පාපිච්ඡතා.** | 18. | **මිච්ඡාදිට්ඨි** |

පුරුෂමලයෝය යනු පුද්ගලයන් කිලිටි කරන ධර්මයෝ ය. ක්‍රෝධාදි මේ ධර්ම නවය ඇත්තෝ ඒවායින් කිලිටි වෙති. කිලිටි වීම ය යි කියනුයේ ජනයාට අප්‍රිය බවට පත්වීම ය. කුණු තැවරුණු වස්ත්‍රය, භාජනය, කසළ ඇති ගෙය, කසළ සහිත මිදුල ජනයාට අප්‍රිය වන්නාක් මෙන් ක්‍රෝධාදි ධර්ම නවයෙන් කවරක් හෝ ඇති පුද්ගලයා බොහෝ ජනයාට අප්‍රියයෙක් වේ. ක්‍රෝධාදි මල ධර්ම නවය යට ඒ ඒ තැන්වල විස්තර කර ඇත්තේ ය. දශ අකුශල කර්මයන්ගෙන් මුසාවාදය පමණක් මේ කොට්ඨාසයට ගෙන ඇත්තේ එය විශේෂයෙන් පුද්ගලයාගේ චරිතය කිලිටි කරන පාපයක් බැවින් බුද්ධාදි උත්තමයන් විසින් වඩාත් පිළිකුල් කරන පාපයක් බැවිනි. අප මහ බෝසතාණන් වහන්සේ පෙර **කපිල** නම් සෘෂිවරයෙක් ව විසූ සමයෙහි **චේතිය** නම් රජකුට බොරු කීමේ ආදීනව දක්වා ප්‍රකාශ කළ ගාථා පෙළක් මෙසේ ය.

Non-commercial distribution

1. අලිකං භාසමානස්ස අපක්කමන්ති දේවතා,
පූතිකඤ්ච මුඛං වාති සකඨානා ච ධංසති.

2. අකාලේ වස්සති තස්ස කාලේ තස්ස න වස්සති,
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං, අඤ්ඤථා නං වියාකරේ

3. ජිව්හා තස්ස ද්විධා හෝති උරගස්සේව දිසම්පති.
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරේ.

4. ජිව්හා තස්ස න භවති මච්ඡස්සේව දිසම්පති,
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරේ

5. ථියෝ'ව තස්ස ජායන්ති න පුමා ජායරේ කුලේ
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරේ

6. පුත්තා තස්ස න භවන්ති පක්කමන්ති දිසෝ දිසං
යෝ ජානං පුච්ඡිතෝ පඤ්හං අඤ්ඤථා නං වියාකරේ

**තේරුම :**

1. මහරජ, ආරක්ෂක දේවතාවෝ බොරු කියන්නහු හැර යති. ඔහුගේ මුවින් කුණුවී ගඳ විහිදේ. ස්වීය ස්ථානයෙන් ද හේ පිරිහෙයි.

2. මහරජ, ප්‍රශ්න විචාරන ලදුයේ යමෙක් දැන ම අන් ආකාරයකින් ප්‍රකාශ කෙරේ ද ඒ රජුගේ රටට අකාලයෙහි වස්නේ ය, සුදුසු කලට නො වස්නේ ය.

3. මහරජ, යමෙක් ප්‍රශ්නයක් අසන ලදුයේ දැන ම අන් අයුරකින් විසඳ ද ඔහුට සර්පයන්ට මෙන් දෙදිවක් වන්නේ ය.

4. මහරජ, යමෙක් ප්‍රශ්නයක් අසන ලදුයේ දැන අන් අයුරකින් විසඳ ද ඔහුට මසකුට මෙන් දිවක් නො වන්නේ ය.

5. මහරජ, යමෙක් ප්‍රශ්නයක් අසන ලද්දේ දැනම අන් අයුරකින් විසඳා ද ඔහුගේ පවුලෙහි ස්ත්‍රීහු උපදනාහ. පුරුෂයෝ නූපදනාහ.

6. මහරජ, යමෙක් ප්‍රශ්නයක් අසන ලදුයේ දැන, අන් අයුරකින් විසඳ ද, ඔහුට පුත්‍රයෝ නොවන්නාහ. උපන්නාහු ද ඔවුහු මාපියන් හැර ඒ ඒ තැන යන්නාහ. ඔහුට දරුවන්ගෙන් ප්‍රයෝජනයක් නො වන්නේ ය.

Non-commercial distribution

**නව විධ මානා:**

**19.** **සෙය්‍යස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ**
**20.** **සෙය්‍යස්ස සදිසෝ හමස්මීති මානෝ**
**21.** **සෙය්‍යස්ස හීනෝ හමස්මීති මානෝ**
**22.** **සදිසස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ**
**23.** **සදිසස්ස සදිසෝ හමස්මීති මානෝ**
**24.** **සදිසස්ස හීනෝ හමස්මීති මානෝ**
**25.** **හීනස්ස සෙය්‍යෝ හමස්මීති මානෝ**
**26.** **හීනස්ස සදිසෝ හමස්මීති මානෝ**
**27.** **හීනස්ස හීනෝ හමස්මීති මානෝ**

මේ මාන නවය යට ඒකක නිර්දේශයේ විස්තර කරන ලද්දේ ය.

**නව තණ්හා මූලකා ධම්මා:**

**28.** **තණ්හං පටිච්ච පරියේසනා**
**29.** **පරියේසනං පටිච්ච ලාභෝ**
**30.** **ලාභං පටිච්ච විනිච්ඡයෝ.**
**31.** **විනිච්ඡයං පටිච්ච ඡන්දරාගෝ**
**32.** **ඡන්දරාගං පටිච්ච අජ්ඣෝසානං**
**33.** **අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහෝ**
**34.** **පරිග්ගහං පටිච්ච මච්ඡරියං**
**35.** **මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ**
**36.** **ආරක්ඛාධිකරණං දණ්ඩාදන සත්ථාදන කලහ විග්ගහ විවාද තුවං තුවං පේසුඤ්ඤ මුසාවාද අනේකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති.**

තණ්හාව මුල් කොට ඇති වන අකුශල ධර්මයෝ නව දෙනෙකි. තණ්හාව නිසා ධනය සෙවීම වේ. සෙවීම නිසා ධන ලාභය වේ. ලාභය නිසා මෙතෙක් ධනය අපට ආහාර පිණිසය, මෙතෙක් ඇඳුම් පැළඳුම් පිණිසය, මෙතෙක් ධනය බිරියටය, මෙතෙක් ධනය පුතාටය, දුවටය, මෙතෙක් ධනය තැන්පත් කිරීමටය යනාදීන් විනිශ්චය ඇති වේ. මෙසේ අකුශල විතර්ක ඇති වීම හේතු කොට

Non-commercial distribution

ලැබී ඇති වස්තූන් ගැන දුර්වල රාගය ද ඇති වේ. බලවත් රාගය ද ඇති වේ. මෙතන්හි අදහස් කරන්නේ දුර්වල රාගය ය. ඒ දුබල ඡන්ද රාගය නිසා මම ය මාගේය යි බලවත් විනිශ්චය ඇති වේ. ඒ අජ්ඣොාසානය හෙවත් විනිශ්චය නිසා තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් තදින් ගැනීම ඇති වේ. තදින් ගැනීම නිසා වස්තු අනුන්ට අයිති වීම අනුන්ට ප්‍රයෝජන වීම නො කැමති වන බව වූ මාත්සර්යය ඇති වේ. මාත්සර්‍ය්‍ය නිසා ආරක්‍ෂාව ඇති වේ. ආරක්‍ෂාව නිසා අන්‍යයන් වළකනු පිණිස දඬු ගැනීම, ආයුධ ගැනීම, කෝලාහල, විවාද, තෝ තෝ කියා බැණීම, කේලාම් කීම, බොරු කීම ආදි අනේක ලාමක අකුශල ධර්මයෝ ඇති වෙති. මේ තණ්හා මූලක ධර්ම නවය ය.

**නව ඉඤ්ජිතානි:**

**37. අස්මීති ඉඤ්ජිතමේතං**
**38. අහමස්මීති ඉඤ්ජිතමේතං**
**39. අයමස්මීති ඉඤ්ජිතමේතං**
**40 භවිස්සන්ති ඉඤ්ජිතමේතං**
**41. රූපී භවිස්සන්ති ඉඤ්ජිතමේතං**
**42. අරූපී භවිස්සන්ති ඉඤ්ජිතමේතං**
**43. සඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමේතං**
**44. අසඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමේතං**
**45. නේවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති ඉඤ්ජිතමේතං**

ඉඤ්ජිත යනු සැලෙන දහලන ස්වභාවයට නමෙකි. මානය සැලෙන දහලන ස්වභාවයකි. එබැවින් එයට ඉඤ්ජිතය යි කියනු ලැබේ. සැලෙන ආකාරයන්ගේ වශයෙන් ඉඤ්ජිත යන නාමයෙන් මාන නවයක් දැක්වේ. පුද්ගලයකු නො ගෙන ඉදිමි ඉදිමියි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. මම ඉදිමියි සැලකීම එක් ඉඤ්ජිත යෙකි. මේ මම ය යි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. පුද්ගලයකු නො ගෙන වන්නෙමි යි ඉදින්නෙමි යි අනාගත තත්ත්වයෙන් සැලකීම එක් ඉඤ්ජිතයෙකි. රූපය ඇතියෙක් වන්නෙමි යි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. රූපය නැතියෙක් වන්නෙමියි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. සංඥා ඇතියෙක් වන්නෙමි යි සැලකීම එක් ඉඤ්ජිත-

Non-commercial distribution

යෙකි. සංඥ නැතියෙක් වන්නෙමි යි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. සංඥා ඇත්තේ ද නැත්තේ ද වන්නෙමියි සැලකීම එක් ඉඤ්ජිතයෙකි. මේ ඉඤ්ජිත නවය ය. මේවා අප්‍රකට ක්ලේශයෝ ය.

**නව මඤ්ඤිතානි:**

**46. අස්මීති මඤ්ඤිතමේතං**
**47. අහමස්මීති මඤ්ඤිතමේතං**
**48. අයමස්මීති මඤ්ඤිතමේතං**
**50. රූපී භවිස්සන්ති මඤ්ඤිතමේතං**
**51. අරූපී භවිස්සන්ති මඤ්ඤිතමේතං**
**52. සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමේතං**
**53. අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමේතං**
**54. නේවසඤ්ඤී නාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමේතං.**

මේ නවයෙහි දැක්වෙන්නේ ද ඉඤ්ජිත යනුවෙන් ඉහත දැක්වුණු කරුණු නවය ම ය. වෙනස නම පමණකි. මඤ්ඤිත යනු **හැඟීම** ය. මෙහි අදහස් කරන්නේ මාන වශයෙන් ඇති වන හැඟීම ය. මෙහි දැක්වෙන්නේ මාන නවයෙකි.

**නව ඵන්දිතානි.**

**55. අස්මීති ඵන්දිතමේතං**
**56. අහමස්මීති ඵන්දිතමේතං**
**57. අයමස්මීති ඵන්දිතමේතං**
**58. භවිස්සන්ති ඵන්දිතමේතං**
**59. රූපී භවිස්සන්ති ඵන්දිතමේතං**
**60. අරූපී භවිස්සන්ති ඵන්දිතමේතං**
**61. සඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමේතං**
**62. අසඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමේතං**
**63. නේවසඤ්ඤී නාසඤ්ඤී භවිස්සන්ති ඵන්දිතමේතං**

ඵන්දිත යන වචනයෙන් කියැවෙන්නේ **කම්පනය** ය. මේ නවකයෙහි දැක්වෙන්නේ . මාන නවයෙකි. මානය එක්තරා කම්පනයෙකි.

Non-commercial distribution

**නව පපඤ්චිතානි:**

64. **අස්මීති පපඤ්චිතමේතං**
65. **අහමස්මීති පපඤ්චිතමේතං**
66. **අයමස්මීති පපඤ්චිතමේතං**
67. **භවිස්සන්ති පපඤ්චිතමේතං**
68. **රූපී භවිස්සන්ති පපඤ්චිතමේතං**
69. **අරූපී භවිස්සන්ති පපඤ්චිතමේතං**
70. **සඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමේතං**
71. **අසඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමේතං**
72. **නේවසඤ්ඤී නාසඤ්ඤී භවිස්සන්ති පපඤ්චිතමේතං**

දීර්ඝ කිරීම විස්තර කිරීම **පපඤ්ච** නම් වේ. පඤ්චස්කන්ධය මමය යි වරදවා ගෙන එය උසස් කොට ගෙන එයට ඇලුම් කිරීමෙන් සංසාරය දීර්ඝ වේ. සංසාරය දීර්ඝ කරන බැවින් අස්මී අහමස්මී යනාදීන් ගන්නා වූ මානයෝ නව දෙන පපඤ්චිත නමුදු වෙති.

**නව සංඛතානි:**

73. **අස්මීති සංඛතමේතං**
74. **අහමස්මීති සංඛතමේතං**
75. **අයමස්මීති සංඛතමේතං**
76. **භවිස්සන්ති සංඛතමේතං**
77. **රූපී භවිස්සන්ති සංඛතමේතං**
78. **අරූපී භවිස්සන්ති සංඛතමේතං**
79. **සඤ්ඤී භවිස්සන්ති සංඛතමේතං**
80. **අසඤ්ඤී භවිස්සන්ති සංඛතමේතං**
81. **නේවසඤ්ඤී නාසඤ්ඤී භවිස්සන්ති සංඛතමේතං**

මෙහි සංඛත යනුවෙන් දැක්වෙන්නේ ද ඉහත නවකවල දැක්වුණු නවාකාර මානය ම ය. **සංඛත** යන වචනයේ තේරුම ප්‍රත්‍යයන් විසින් ඇති කරන ලදය, ප්‍රත්‍යයන් නිසා ඇති වන දෙයය යනු යි. මානය ඇති වන්නේ ජාතිය කුලය ගෝත්‍රය ධනය පිරිවර තනතුරු උපාධි උගත්කම් යනාදි අනේක හේතූන්

Non-commercial distribution

නිසා ය. එබැවින් එයට සංඛතය යි ද කියනු ලැබේ. මෙහි ඉඤ්ජිත, මඤ්ඤිත, එන්දිත, පපඤ්චිත, සංඛත යන නම් වලින් නවක පසක ම නොයෙක් නම් වලින් මානය ම දේශනා කර ඇත්තේ අනේක හේතූන් නිසා ය. අනේකාකාරයෙන් ඇති වන ඒ මානය තේරුම් ගැනීමට දුෂ්කර සියුම් ක්ලේශයක් වන නිසාය. එය සියුම් නිසා ම ප්‍රහාණය ද දුෂ්කර ය. සෝවාන් සකෘදගාමී අනාගාමි මාර්ගයෝ මානය නිරවශේෂයෙන් ප්‍රහාණය කිරීමට සමත් නො වෙති. එය සෝවාන් සකෘදගාමී අනාගාමී ආර්ය පුද්ගලයන්ට ද ඇත්තේ ය. එය ප්‍රහාණය කිරීමට සමත් වන්නේ අර්හත් මාර්ගය ය. අර්හත් මාර්ගයට පැමිණෙන තුරු මාන නමැති මේ ක්ලේශය පවත්නේ ය.

මේ නවක වශයෙන් දැක්වෙන ක්ලේශ ධර්ම එක් අඩුව ය.

**නවක නිර්දේශය නිමියේ ය.**

Non-commercial distribution

# දශක වශයෙන් දැක්වෙන ධර්ම සැත්තෑව

දස කිලේසවත්ථූනි, දස ආඝාතවත්ථූනි, දස අකුසලකම්මපථා, දස සඤ්ඤෝජනානි, දස මිච්ඡත්තා, දස වත්ථුකා මිච්ඡාදිට්ඨි, දස වත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි

(ඛුද්දකවත්ථුවිභංග)

**දස කිලේසවත්ථූනි:**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | **ලෝභෝ.** | 2. | **දෝසෝ.** | 3. | **මෝහෝ** |
| 4. | **මානෝ.** | 5. | **දිට්ඨි.** | 6. | **විචිකිච්ඡා.** |
| 7. | **ථීනං.** | 8. | **උද්ධච්චං.** | 9. | **අහිරිකං.** |
| | | 10. | **අනොත්තප්පං** | | |

කිලේසවත්ථු යන මෙහි වත්ථු යන වචනයෙන් කියැවෙන විශේෂාර්ථයක් නැත්තේ ය. ක්ලේශයෝ ම ක්ලේශවස්තූහු ය. ලෝභය දෝසය මෝහය මානය දිට්ඨිය විචිකිච්ඡාවය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මොහු ක්ලේශයෝ ය. මේ දශයට පමණක් විශේෂයෙන් ක්ලේශ නාමය ව්‍යවහාර කරන්නේ ඒවා ප්‍රධාන ක්ලේශ වන බැවිනි. නොයෙක් නම් වලින් කියැවෙන අන්‍ය සකල ක්ලේශයෝ මේ දශයට සම්බන්ධව පවත්නෝ ය. මේවා සමඟ මේවා හා බැඳී ඇති වන්නෝ ය. එබැවින් නොයෙක් තැන්වල ක්ලේශ වශයෙන් කියන්නේ මේ කෙලෙස් දශය ය.

**ලෝභය**

රූපාදි ආරම්මණයන්හි ඇලෙන ස්වභාවය ය, ඇලීම ලෝභය ය. එය මක්කටාලේපය මෙන් ආරම්මණය තදින් අල්ලා ගනී. මක්කාටාලේපය යි කියනුයේ වඳුරන් රිලවුන් ඇල්ලීම සඳහා

Non-commercial distribution

සාද ගන්නා ලාටුවකි. එය ගසක යම්කිසි තැනක ගල්වා තැබූ කල්හි එකැනින් යන වඳුරාගේ අතක් හෝ පයක් එහි ඇලේ. එක් අතක් ඇලුණු වඳුරා එය ගැළවීම් සඳහා අනික් අත ලාටුව මත තබයි. එය ද එහි ඇලේ. අනතුරුව අත් ගැලවීමට වීයසී ගැනුම පිණිස එහි පයක් තබයි. එයත් එහි ඇලේ. අනතුරු ව ඇලුණු අත් පා ගැළ වීම පිණිස ඉතිරි පය ද එහි තබයි. එයත් ඇලෙයි. අත් පා ගැළවීම සඳහා මුහුණ එයට ළං කරයි. එය ද ඇලී වඳුරා මිනිසුන්ට අසු වේ. මක්කටාලේපය වඳුරා තදින් අල්ලන්නාක් මෙන් මේ ලෝභය රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් තදින් අල්ලා ගනී. යම්කිසි අරමුණෙක්හි ලෝභය වරක් ඇති වූ විට ගංගාවක් ගලා යන්නාක් මෙන් දිගින් දිගට ම නැවත නැවත ඒ ලෝභය ඇති වේ. ගංගා ප්‍රවාහය එයට හසුවන සියල්ල සාගරය කරා ගෙන යන්නාක් මෙන් ගංගාවක් මෙන් දිගට ඇති වන ලෝභය එයට හසුවන සත්ත්වයන් අපාය කරා ගෙන යන්නේ ය.

සාමාන්‍ය ජනයා ආදරය ආලය ප්‍රේමය යන වචන ව්‍යවහාර කරන්නේ ද මේ ලෝභයට ම ය. ධර්ම විභාග නො දත් ඇතැම්හු සතුට ශ්‍රද්ධාව කරුණාව මෛත්‍රිය යන වචන ද ලෝභය සඳහා භාවිතා කරති. අනේකාකාර ඇත්තා වූ මේ ලෝභයට අනේක නාමයන් ඇත්තේ ය. තණ්හා, නන්දිරාග, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා, කාමාසව, භවාසව, කාමෝඝ, භවෝඝ, කාමයෝග, භවයෝග, කාමච්ඡන්දනීවරණ, අභිජ්ඣාපරාමාස, කාමරාගානුසය, භවරාගානුසය, කාමරාගසඤ්ඤෝජන, රූප රාග සඤ්ඤෝජන, අරූපරාගසඤ්ඤෝජන, භවරාගසඤ්ඤෝජන යනාදි නොයෙක් නම් ඇත්තේ ය.

සැපයීමේ ලෝභය, පරිභෝග කිරීමේ ලෝභය, රැස් කර තබා ගැනීමේ ලෝභය යි ද ලෝභය තුන් ආකාර වේ. ධන සැපයීමේ ලෝභය අධිකව ඇත්තේ සැපයීම සඳහා බොහෝ වෙහෙසෙයි. ආහාර ගැනීම, නිදීම ගැන දූ දරුවන් ගැන සැළකිල්ලක් නො කොට රෑ දවල් දෙක්හි වෙහෙස නො බලා ධන සැපයීම කරයි. ඒ සඳහා මහන්සි වීම ඔහුට මිහිරකි. ඒ සැපයීම පිළිබඳ වූ ලෝභයේ සැටිය ය. පරිභෝග කිරීමේ ලෝභය අධික තැනැත්තේ

Non-commercial distribution

ආහාර පාන වස්ත්‍ර ගෙවල් යාන වාහනාදිය සඳහා ද, නොයෙක් ආකාරයෙන් ඉන්ද්‍රියයන් පිනවීම සඳහා ද ඇති තාක් ධනය වියදම් කරයි. සමහර විට ණය වෙයි. සොරකම් කරයි. රැස් කර තැබීමේ ලෝභය ඇතියේ ලැබෙන සියල්ල සඟවයි. ඔහුට සාගින්නේ සිටගෙන වුව ද ධනය ලබා ගැනීම මිහිරි ය. රැස්ව ඇති ධනය වැඩි තරමට ඔහුට වඩා සතුටක්, වඩා මිහිරක් ඇති වේ.

තණ්හා එකසිය අටකැයි ද කියනු ලැබේ. ඒ මෙසේය:- රූපතණ්හා, සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යි ආරම්මණයන්ගේ වශයෙන් තණ්හා සයක් වේ. ඉන් එක එකක් කාමතණ්හා භවතණ්හා විභවතණ්හා යන මොවුන්ගේ වශයෙන් තුන් තුන් ආකාර වීමෙන් තණ්හා අටළොසක් වේ. ඒ අටළොසින් එක එකක් අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයාගේ වශයෙන් තුන බැගින් වීමෙන් තණ්හා සිවුපනසක් වේ. ඉන් එක එකක් ආධ්‍යාත්මික බාහ්‍ය වශයෙන් දෙවදෑරුම් වීමෙන් තණ්හා එකසිය අටක් වේ.

**දෝසය**:-

ද්වේෂය වස්තූන් ගැනත් සත්ත්වයන් ගැනත් ඇති වේ. වස්තූන් ගැන ඇති වන්නේ ස්වල්ප වශයෙනි. බෙහෙවින් ඇති වන්නේ ද තදින් ඇති වන්නේ ද පුද්ගලයන් ගැන ය. තමාට අලාභයක් හෝ අවමානයක් හෝ කළ එකකු සිතට අරමුණු වන කල්හි, ඒ පුද්ගලයා හා ගැටෙන, පුද්ගලයා තල්ලු කර දමන, පුද්ගලයා කෙරෙහි එල්ලෙන, පුද්ගලයාට රිදවන, එක්තරා රෞද්‍ර ස්වභාවයක් සිත හා එක් ව ඇතිවේ. ඒ ද්වේෂය ය. එහි ලක්‍ෂණය වන්නේ ගල්පහරක් වැදුණු සර්පයකු සේ රෞද්‍ර භාවය ය. එය විෂක් මෙන් වහා ශරීරයෙහි පැතිර යයි. ගින්නක් මෙන් ඇති වූ පුද්ගලයාගේ සිත කය දවයි. එක් අයකු තුළ අනිකකු ගැන ඇති වන ද්වේෂය අනෙකා දවන්නට නම් සමත් නොවේ. එය ද්වේෂය ඇති වූ තැනැත්තා ගේ සන්තානය දවන්නට වෙවුලවන්නට ලේ තරක් කරන්නට විරූප කරන්නට පුද්ගලයා පිස්සකු කරන්නට සමත් ය. එබැවින් ද්වේෂය නිතර ඇතිවන තැනැත්තා රෝග බහුල පුද්ගලයෙක් වේ. හේ ඉක්මනින් මහලු ද වේ.

Non-commercial distribution

ද්වේෂයේ ද නොයෙක් ආකාර ඇත්තේ ය. ද්වේෂය ඇති වන පුද්ගලයා දුබල වී එයට ලක් වන පුද්ගලයා බලවත් වන කල්හි ද්වේෂය පසුබසින පලායන වෙවුලන ආකාරයෙන් ඇති වේ. ඒ ද්වේෂය **භය** නම් වේ. එයින් සිත කය දෙක අතිශයින් දවනු ද දුබල කරනු ද ලැබේ. එයින් බෝකල් ප්‍රතිකාර කොට මිස සුව කළ නො හෙන රෝග හට ගනී. සමහර විට ඒ භයින් සිහි නැති වී වැටේ. සමහර විට මැරී වැටේ.

ඉතා විරූපී පුද්ගලයන්, ලාදුරු පරංගි කුෂ්ඨාදි රෝග ඇතියන්, සත්ත්ව කුණපයන් හා අසූචි ආදිය දක්නා කල්හි එයින් පසු බසින ඈත් වන ඇකිලෙන ස්වභාවයක් ඇති වේ. එය ද හැකිලෙන ආකාරයෙන් ඇති වන ද්වේෂය ය. එයට **පිළිකුලයයි** කියති. යම් යම් දේ ප්‍රතිකූල වශයෙන් දක්නා ඥානයක් ද ඇත. එය ද්වේෂය නො වේ. කේශාදි කොට්ඨාසයන් පිළිකුල් ලෙස සලකමින් භාවනා කරනුවන්ට ඇති වන පිළිකුල නියම ස්වභාවය දක්නා ඥානය ය.

**ශෝකය** යනු ද ඥතිව්‍යසනාදිය නිසා තැවීම් වශයෙන් ඇති වන දෝමනස්ස වේදනාවය. ද්වේෂයෙන් තොර ශෝකයක් නැත. එබැවින් ශෝකය අකුශල කොට්ඨාසයට අයත් ධර්මයක් බව කිය යුතුය. ශෝක කිරීම ගුණ ධර්මයක් ලෙස ඇතැමුන් සලකන නමුත් එය ගුණ ධර්මයක් නො වේ. ඇතැමුන් **සංවේගය** ශෝකය යන මේ දෙක එකක් වශයෙන් ගෙන කාරණය අවුල් කර ගෙන තිබේ. ශෝකය අනිකකි. සංවේගය අනිකකි. අනිත්‍ය දුඃඛ අසුභ අනාත්ම වූ සංස්කාරයක් බිය විය යුතු දේ සැටියට දක්නා නුවණ සංවේග නම් වේ. එය කුශල පක්ෂයට හා අව්‍යාකෘත පක්ෂයට අයත් ගුණ ධර්මයෙකි. ශෝකය හැඬීමට විලාප කීමට හේතු වේ. සංවේගය වීර්ය කිරීමට කරුණෙකි. කෙනකු මළ කල්හි ශෝකය ඇති වූයේ හඬයි. සංවේගයට පැමිණියේ මරණයේ දුක සලකා මරණයෙන් එතර වීමට නිවන් දැකීමට වීර්ය කරයි. මේ ශෝක සංවේග දෙක්හි වෙනස ය.

සිල් සමාදන් වන භාවනා කරන මහණ දම් පුරන අයට ඒවා එපා වන ස්වභාවයක් ඇති වේ. රැකියාවක් කරන්නකුට උගෙනීමක්

Non-commercial distribution

කරන්නකුට එය එපා වන ස්වභාවයක් ඇති වේ. එය සියුම් ද්වේෂයෙකි. එයට **අනභිරතිය** යි කියනු ලැබේ. සමහර විට මා පියන්ට දරුවෝ අප්‍රිය වෙති. සැමියාට බිරිය ද බිරියට සැමියා ද අප්‍රිය වේ. දරුවන්ට මාපියෝ අප්‍රිය වෙති. නෑයෝ අප්‍රිය වෙති. ඒ අප්‍රිය වීම ද සියුම් ද්වේෂයය. මෙසේ ද්වේෂය අනේකාකාර වන්නේ ය.

**මෝහය:**

සිතින් යම්කිසි අරමුණක් ගන්නා කල්හි ඒ අරමුණ ඇති සැටියට නිවැරදි ලෙස දැනගත නො හෙන පරිදි ආවරණය කරන ධර්මය මෝහය ය. ඒ ආවරණය නිසා නොයෙක් විට ඒ ඒ ආරම්මණයන් ඇති සැටිය හැර අන් ආකාරයකින් වැරදි ලෙස දැන ගනී. ඒ මෝහය ඇසක ඇතිවන පටලයක් බඳු ය. අන්ධකාරයක් වැනි ය. මේ මෝහයෙන් කරන ආවරණය නිසා අනිත්‍ය වූ පඤ්චස්කන්ධය නිත්‍ය වූවක් සේ වැටහේ. දුකක් වන පඤ්චස්කන්ධය සැපයක් සේ වැටහේ. අශුභ වූ පඤ්චස්කන්ධය ශුභයක් මෙන් වැටහේ. අනාත්ම වූ පඤ්චස්කන්ධය ආත්මයක් සේ සත්ත්වයකු සේ වැටහේ. නියම සැපය වන නිවන නපුරක් සේ වැටහේ. නිවන් මඟ වන ආර්යෂ්ටාංගික මාර්ගය කරදරයක් සේ වැටහේ. පින පලක් නැතියක් සේ වැටහේ. පාපය මිහිරක් සේ වැටහේ. අවිද්‍යාව යනු ද මේ මෝහය ම ය. දුක නිර්දේශයේ **අවිද්‍යා** යන නාමයෙන් විස්තර කර ඇත්තේ මේ මෝහය ම ය. ලෝභය ඇති වූ විට පුද්ගලයාට ඒ බව දැනේ. ද්වේෂය ඇතිවූ විට ද ඒ බව දැනේ. මෝහය එසේ දැනෙන ක්ලේශයක් නො වේ. එබැවින් එය ප්‍රහාණය කිරීම දුෂ්කර ය.

**මානෝ:**

මානය යට නොයෙක් තැන්වල නොයෙක් නම් වලින් විස්තර කර ඇත්තේ ය. මද යන නාමයෙන් දැක්වෙන්නේ ද මේ මානය ම ය. මෙය ප්‍රහාණය කිරීමට දුෂ්කර අර්හත්වය දක්වා පවතින ක්ලේශයෙකි. දිට්ඨි විචිකිච්ඡා ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන මේවා ද ද්වික නිර්දේශයේ විස්තර කර ඇත්තේ ය.

Non-commercial distribution

**දස ආඝාත වත්ථූනි**

**11. අනත්ථං මේ අචරීති ආඝාතෝ ජායති**
**12. අනත්ථං මේ චරතීති ආඝාතෝ ජායති**
**13. අනත්ථං මේ චරිස්සතීති ආඝාතෝ ජායති**
**14. පියස්ස මේ මනාපස්ස අනත්ථං අචරීති ආඝාතෝ ජායති**
**15. පියස්ස මේ මනාපස්ස අනත්ථං චරතීති ආඝාතෝ ජායති**
**16. පියස්ස මේ මනාපස්ස අනත්ථං චරිස්සතීති ආඝාතෝ ජායති**
**17. අප්පියස්ස මේ අමනාපස්ස අත්ථං අචරි**
**18. අත්ථං චරති**
**19. අත්ථං චරිස්සතීති ආඝාතෝ ජායති**
**20. අට්ඨානේ වා පන ආඝාතෝ ජායති.**

මේ දශාඝාත වස්තූන්ගෙන් මුල් නවය නවක නිර්දේශයේ දැක්විණ. දසවැන්න **අස්ථාන කෝපය** ය. ද්වේෂ මෝහාධික ඇතැම්හු වැස්සට ද කිපෙති. අව්වට ද කිපෙති. පය සැපුණු විට ගල් මුල්වලට කිපෙති. බඩු නරක් වූ කල්හි බඩුවලට කිපෙති. ඒ අස්ථාන කෝපය ය. ඇතැම් දරුවෝ අවවාදනුශාසනා කිරීම නිසා මාපියන්ට කිපෙති. ශිෂ්‍යයෝ ආචාර්‍ය්‍යෝපාධ්‍යායයන්ට කිපෙති. ඇතැම්හු ධර්ම දේශකයන්ට කිපෙති. තමාට අනුකූල නො වන්නවුන්ට, ඉල්ලීම් ඉටු නො කරන කියන දෙය නො කරන අයට කිපෙති. නො මනා වැඩක් කරන විට කරුණාවෙන් එහි වරද දක්වන ගුණවතුන්ට කිපෙති. වරද කළහ යි සිතා වරද නො කළවුනට කිපෙති. ඒ අස්ථාන කෝපය ය. අස්ථාන කෝපය ද ඉතා නපුරු ය. ඇතැමුන් අස්ථාන කෝපයෙන් මහාපරාධයන් කර ඇත්තේ ය.

**දස අකුසල කම්ම පථා:**

**21. පාණාතිපාතෝ**
**22. අදින්නාදානං**
**23. කාමේසු මිච්ඡාචාරෝ**
**24. මුසාවාදෝ**
**25. පිසුණාවාචා**
**26. ඵරුසාවාචා**
**27. සම්ඵප්පලාපෝ**
**28. අභිජ්ඣා**
**29. ව්‍යාපාදෝ**
**30. මිච්ඡාදිට්ඨි**

Non-commercial distribution

අකුශල කර්මපථ දශය අප විසින් සම්පාදිත **බෞද්ධයාගේ අත් පොතෙහි** විස්තර කර ඇත්තේ ය වෙනත් නොයෙක් පොත්වලද විස්තර කර ඇත්තේ ය.

**දස සඤ්ඤෝජනානි:**

**31. කාමරාග සඤ්ඤෝජනං**
**32. පටිඝ සඤ්ඤෝජනං**
**33. මාන සඤ්ඤෝජනං**
**34. දිට්ඨි සඤ්ඤෝජනං**
**35. විචිකිච්ඡා සඤ්ඤෝජනං**
**36. සීලබ්බතපරාමාස සඤ්ඤෝජනං**
**37. භවරාග සඤ්ඤෝජනං**
**38. ඉස්සා සඤ්ඤෝජනං**
**39. මච්ඡරිය සඤ්ඤෝජනං**
**40. අවිජ්ජා සඤ්ඤෝජනං**

සත්ත්වයා හට සසරින් එතර වන්නට නො දී එහි ම බැඳ තබන ධර්මයෝ සඤ්ඤෝජන නම් වෙති. මේ සියල්ල යට ඒ ඒ තැන්වල විස්තර කර ඇත්තේ ය.

**දස මිච්ඡත්තා:**

**41. මිච්ඡාදිට්ඨි**
**42. මිච්ඡාසංකප්පෝ**
**43. මිච්ඡාවාචා**
**44. මිච්ඡාකම්මන්තෝ**
**45. මිච්ඡාආජීවෝ**
**46. මිච්ඡාවායාමෝ**
**47. මිච්ඡාසති**
**48. මිච්ඡාසමාධි**
**49. මිච්ඡාඤාණං**
**50. මිච්ඡා විමුත්ති**

මිච්ඡත්තයන් ගෙන් මුල් අට අෂ්ටක නිර්දේශයේ විස්තර කරන ලදී. මිච්ඡාඤාණ යනු පාප ක්‍රියාවන්හි උපාය චින්තනය කරන්නා වූ ද, පව්කම් කොට මා විසින් යහපතක් කරන ලදැයි මෙනෙහි කරන අවස්ථාවන්හි ඇති වන්නා වූ ද මෝහය ය. ක්ලේශයන්ගෙන් හා සංසාර දුක්ඛයෙන් මිදෙන්නේ ලෝකෝත්තර මාර්ගවලිනි. කෙලෙසුන් කෙරෙන් හා සංසාර දුඃඛයෙන් නො මිදීම මම මිදුණෙමියි ඇති වන වැරදි හැඟීම මිච්ඡා විමුක්තිය ය.

Non-commercial distribution

**දසවත්ථුකා මිච්ඡාදිට්ඨි :**

**51. නත්ථි දින්නං  52. නත්ථි යිට්ඨං**
**53. නත්ථි හුතං  54. නත්ථිසුකත දුක්කතානං කම්මානං ඵලං විපාකො**
**55. නත්ථි අයං ලෝකෝ**
**56. නත්ථි පරෝ ලෝකෝ  57. නත්ථි මාතා**
**58. නත්ථි පිතා  59. නත්ථි සත්තා ඕපපාතිකා**
**60. නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා සමග්ගතා සම්මා පටිපන්නා යේ ඉමඤ්ච ලෝකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙන්ති.**

මේ දශවස්තුක මිථ්‍යා දෘෂ්ටිය බුද්ධකාලයේ විසූ අජිත කේසකම්බල නම් ශාස්තෘවරයා පැවසූ දෘෂ්ටිය ය. ඒ බව දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ. මේ කරුණු දශය ත්‍රිකනිර්දේශයේ මිච්ඡාදිට්ඨි යන පදය විස්තර කිරීමේ දී දක්වා ඇත.

**දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි:**

**61. සස්සතෝ ලෝකෝ**
**62. අසස්සතෝ ලෝකෝ**
**63. අන්තවා ලෝකෝ**
**64. අනන්තවා ලෝකෝ**
**65. තං ජීවං තං සරීරං**
**66. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං**
**67. හෝති තථාගතෝ පරම්මරණා**
**68. න හෝති තථාගතෝ පරම්මරණා**
**69. හෝති ච න හෝති ච තථාගතෝ පරම්මරණා**
**70. නේව හෝති න නහෝති තථාගතෝ පරම්මරණා**

සස්සතෝ ලෝකෝ යන මෙහි ලෝකයයි කියනුයේ පඤ්චස්කන්ධය ය. පඤ්චස්කන්ධ සංඛ්‍යාත ලෝකය ශාස්වතය හෙවත් නිත්‍යය, ස්ථිරය, සර්වකාලිකය යි ගැනීම එක් දෘෂ්ටියෙකි. ලෝකය හෙවත් සත්ත්වයා අසාස්වතය මරණින් සිඳෙන්නේ ය යි ගැනීම එක් දෘෂ්ටියෙකි. වට්ටියක් පමණ කුඩා කසිණයක ධ්‍යානයට සමවදින පුද්ගලයාට සමාපත්තිය තුළ පැවති රූපාරූප

Non-commercial distribution

ධර්මයන් ආත්මය ය යන හැඟීමක් ඇති වේ. එයින් ඔහුට කසිණ පරිච්ඡේදය අනුව ඒ ආත්මය අන්තවත්ය, හෙවත් පරිච්ඡේද සහිතය යන හැඟීම ඇති වේ. එය අන්තවා ලෝකෝ යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය ශාස්වත දෘෂ්ටිය ද වේ. උච්ඡේද දෘෂ්ටිය ද වේ. කසිණ නිමිත්ත මහත් කොට වඩා මහත් වූ කසිණ නිමිත්තෙහි ධ්‍යානයට සමවදින පුද්ගලයා ඒ සමාපත්තිය තුළ පවත්නා රූපාරූප ධර්මයන් ආත්ම වශයෙන් ගෙන මහත් වූ කසිණ නිමිත්ත අනුව ආත්මය අනන්තය හෙවත් එහි පරිච්ඡේදයක් නැත, අති විශාලය යන දෘෂ්ටියට බැසගනී. මේ අනන්තවා ලෝකෝ යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය ශාස්වත දෘෂ්ටිය ද වේ. උච්ඡේද දෘෂ්ටිය ද වේ. ජීවය ශරීරය යන දෙක එකක් වශයෙන් ගැනීම "තං ජීවං තං සරීරං" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය උච්ඡේද දෘෂ්ටියකි. ජීවය අනිකෙක, ශරීරය අනිකකැයි ගන්නා දෘෂ්ටිය "අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. ශරීරය නැසී සිඳී ගිය ද ජීවය ඉතිරි වේ යයි ගන්නා ඒ දෘෂ්ටිය ශාස්වත දෘෂ්ටියෙකි. "හෝති තථාගතයෝ පරම්මරණා" යන මෙහි තථාගතය යි කියනුයේ සත්ත්වයාට ය. සත්ත්වයා හෙවත් ආත්මය මරණින් මතු ද නො මැරී ඇතය යි ගන්නා ශාස්වත දෘෂ්ටිය "හෝති තථාගතයෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. සත්ත්වයා මරණින් සිඳී යන්නේය මරණින් ඔබ නැතය යි ගැනීම "න හෝති තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය උච්ඡේද දෘෂ්ටියෙකි. සත්ත්වයා මරණින් මතු ඇත්තේ ද නැත්තේ ද වේය යනු "හොති ච න හෝති ච තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැකවෙන දෘෂ්ටිය ය. එය ඒකත්‍ය ශාස්වත දෘෂ්ටියෙකි. මරණින් මතු සත්ත්වයා ඇත්තේ ද නැත්තේ ද නොවේය යි ගන්නා දෘෂ්ටිය "නේව හෝති න හෝති තථාගතෝ පරම්මරණා" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිය ය. එය එක් වාදයකද ස්ථිර පිහිටීමක් නැති ව පැත්තෙන් පැත්තට පනින වික්ෂේප දෘෂ්ටියෙකි.

මේ දශක වශයෙන් දැක්වෙන ධර්ම සැත්තෑව ය.

**දශක නිර්දේශය නිමියේ ය:**

Non-commercial distribution

# දෙසැට මිථ්‍යාදෘෂ්ටිය

චත්තාරෝ සස්සතවාදා, චත්තාරෝ ඒකච්ච සස්සතිකා, චත්තාරෝ අන්තානන්තිකා, චත්තාරෝ අමරා වික්ඛේපිකා, ද්වේ අධිච්චසමුප්පන්නිකා, සොළස සඤ්ඤීවාද, අට්ඨ අසඤ්ඤීවාද, අට්ඨ නේවසඤ්ඤී නාසඤ්ඤීවාද, සත්ත උච්ඡේදවාද, පඤ්ච දිට්ඨධම්ම නිබ්බානවාද, ඉමානි ද්වාසට්ඨී දිට්ඨිගතානි බ්‍රහ්මජාලේ වෙය්‍යාකරණේ වුත්තා භගවතාති.

(ඛුද්දක වත්ථු විභංග)

ශාස්වතවාද සතරක් ද, ඒකත්‍ය ශාස්වතවාද සතරක් ද, අන්තානන්තිකවාද සතරක් ද, අමරාවික්ඛේපික වාද සතරක් ද, අධිත්‍යසමුපන්නිකවාද දෙකක් ද, සඤ්ඤී වාද සොළොසක් ද, අසංඥ්ඤීවාද අටක් ද, නේවසඤ්ඤී නාසංඥ්ඤීවාද අටක් ද, උච්ඡේදවාද සතක් ද, දෘෂ්ටධර්ම නිර්වාණවාද පසක් ද මෙසේ දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීහු දීඝනිකායේ ප්‍රථම සූත්‍රය වන බ්‍රහ්මජාල සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ.

## ශාස්වතවාද සතර

ලෝකයෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ බලවත් වීර්‍ය්‍යයත් අප්‍රමාදයත් සම්‍යක්මනස්කාරයත් නිසා තමාගේ අතීත ජාතීන් සිහි කිරීමට සමත් චිත්ත සමාධියක් ලබයි. ඔහුට ඒ චිත්ත සමාධියේ බලයෙන් මම අතීයේ මෙබඳු ශරීරයක් ඇති ව මෙබඳු නමක් ගෝත්‍රයක් ඇති ව මෙබඳු ආහාර ඇති ව මෙබඳු සැප දුක් ඇතිවූ මෙපමණ ආයු ඇතිව අසවල් තැන විසූවෙමි. ඉන් ච්‍යුතව අසවල් තැන උපන්නෙමි. එහි ද මෙබඳු ශරීරයක් ඇතිව, මෙබඳු නාමයක් ගෝත්‍රයක් ඇති ව, මෙබඳු ආහාර ඇති ව මෙබඳු සුවදුක් ඇති ව, මෙ පමණ ආයු ඇති ව විසූයෙමි යි සිය ගණන් දහස් ගණන් ලක්ෂ ගණන් අතීත ජාතීන් දැකිය හැකි වේ. ඔහු තමාගේ

Non-commercial distribution

අතීත ජාති පිළිවෙළ දැක මේ ආත්මය මහ පොළොව මහගල් පර්වත ඉර සඳ සේ ස්ථිර නො නැසෙන දෙයක, ලෝකය වඳය, අලුත් සත්ත්වයන් ඉපදවීමට සමතුන් නැත, ලෝකයේ වෙසෙන්නා වූ සත්ත්වයෝ ම නැවත නැවත ඒ ඒ භවවල උපදනාහ යන දෘෂ්ටිය ගනී. ඉක්බිති මා මේ කියන්නේ අනුන්ගෙන් අසා හෝ අනුමානයෙන් හෝ නොව මාගේ ම චිත්ත සමාධි බලයෙන් ප්‍රත්‍යක්ෂ ලෙස දැකීමෙනැයි ඒ ශාස්වත දෘෂ්ටිය අන්‍යයන්ට ප්‍රකාශ කරයි. මේ පළමුවන ශාස්වත වාදය ය.

ඇතැම් ශ්‍රමණයෙක් බ්‍රාහ්මණයෙක් තමා ලත් චේතෝ සමාධියේ බලයෙන් කල්ප දශයක අතීත භවයන් දැකීමට සමත් වෙයි. හේ ද තමාගේ අතීත ජාතිපිළිවෙළ බලා ආත්මය නො නැසී පවතීය යන දෘෂ්ටිය ගෙන එය ප්‍රකාශ කරයි. ඒ දෙවන ශාස්වත වාදය ය. අනිකෙක් ඔහු ලැබූ සමාධියේ බලයෙන් සතළිස් කපක් අතීතය දැකීමට සමත් වෙයි. ඔහු ද තමාගේ අතීත ජාති පරම්පරාව දැක ජාතියෙන් ජාතියට යන නිත්‍ය ආත්මයක් ඇත යන දෘෂ්ටිය ප්‍රකාශ කරයි. ඒ තුන්වන ශාස්වත වාද ය ය. සමාධි ලාභී මන්ද ප්‍රාඥ තීර්ථකයෝ අතීත ජාති ලක්‍ෂ ගණනක් දැකීමට සමත් වෙති. මධ්‍යම ප්‍රාඥ තීර්ථකයෝ කල්ප දශයක් අතීත ජාති දැකීමට සමත් වෙති. තීක්ෂණ ප්‍රාඥ තීර්ථකයෝ සතළිස් කපෙක අතීත ජාති දැකීමට සමත් වෙති. ඉන් ඔබ්බෙහි අතීතය දැකීමට තීර්ථකයෝ සමත් නො වෙති.

ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මේ සත්ත්වයා ඇති වූයේ කෙසේදැයි කල්පනා කරයි. ඔහුට සත්ත්වයා යම්කිසි හේතුවකින් තොර ව ඉබේම ඇති විය නො හෙන බව වැටහේ. යම්කිසි පුද්ගලයකුට සත්ත්වයන් ඇති කළ නො හෙන බව ද වැටහේ. ඔහු කල්පනා කිරීමෙන් තමාට වැටහුණු පරිදි “ලෝකය වඳය. මේ සත්ත්වයෝ පොළොව මෙන් මහ ගල්කුළු මෙන් ඉර හඳ මෙන් ස්ථිර ව ලෝකයෙහි සැම කල්හි ම සිටින්නාහ. මේ ඇත්තා වූ සත්ත්වයෝ ම භවයෙන් භවයට සංක්‍රමණය වන්නාහ” යි ශාස්වත දෘෂ්ටිය ප්‍රකාශ කරයි. ඒ සතරවන ශාස්වත වාදය ය.

Non-commercial distribution

අනුශ්‍රැති තාර්කිකයා ය. ජාතිස්මරණ තාර්කිකයා ය, ධ්‍යානලාභීතාර්කිකයා ය, ශුද්ධතාර්කිකයා ය යි **තාර්කිකයෝ** (කල්පනා කරන්නෝ) සතර දෙනෙකි. බුදුන් වහන්සේ පෙර වෙස්සන්තර රජ වූහ යනාදිය ඇසීමෙන් බුදුහු ම වෙස්සන්තර රජු නම් මේ ආත්මය නිත්‍ය එකකැයි ශාස්වත දෘෂ්ටිය ගන්නෝ අනුශ්‍රැති තාර්තිකයෝ ය. ඇතැම්හු පෙර ජාති එකක් හෝ දෙක තුනක් සිහි කිරීමට සමත් වෙති. ඔවුහු එයින් පෙර සිටියේත් දැනට සිටින්නේත් මම ම ය කියා ආත්මය නිත්‍යය යි ශාස්වත දෘෂ්ටිය ගනිති. ඇතැම් ධ්‍යානලාභීහු මාගේ ආත්මය දැන් සුඛිතව පවතී, අතීතයෙහි ද එසේ පැවතියේ ය, අනාගතයෙහි ද එය එසේ ම පවතින්නේ ය යි ශාස්වත දෘෂ්ටිය ගනිති. ශුද්ධතාර්කිකයෝ මෙය ඇති කල්හි මෙය වන්නේ ය මෙය ඇති කල්හි මෙය නො වන්නේ ය යනාදීන් කල්පනා කොට තමන්ට වැටහෙන පරිදි ශාස්වත දෘෂ්ටිය ගනිති.

**ඒකත්‍යශාස්වතවාද සතර:**

ඒකත්‍යශාස්වතවාදය යනු ඇතැමෙක් ශාස්වතය ඇතැමෙක් අශාස්වතය යන දෘෂ්ටිය ය. මේ ලෝකය කලකදී විනාශ වෙයි. ලෝක විනාශය සිදු වන කල්හි බොහෝ සත්ත්වයෝ ධ්‍යාන වඩා ආභස්සර නම් බ්‍රහ්ම ලෝකයෙහි උපදිති. ඔවුහු එහි ප්‍රීතිය ආහාර කොට ස්වීයාලෝකයෙන් ම හැසිරෙති. දීර්ඝ කාලයක් ගතවීමෙන් පසු නැවත යට යට බ්‍රහ්ම ලෝකයෝ පහළ වෙති. ඒවා සත්ත්වයන්ගෙන් හිස්ය. එසේ පවත්නා අතර එක්තරා බ්‍රහ්මයෙක් ආභස්සරයෙන් ච්‍යුත ව යට බඹලොව උපදී. ඔහු ද ප්‍රීතිය ආහාර කොට ස්වීයාලෝකයෙන් එහි හැසිරෙයි. එහි අන් කිසිවකු නැතිව තනිව වෙසෙන්නා වූ බ්‍රහ්මයාහට මම තනිව වෙසෙමි, තවත් අය මෙහි පැමිණිය හොත් යෙහෙකැ" යි සිතෙයි. එසේ කලක් ගත වන කල්හි ආයුඃක්ෂයයෙන් හෝ කර්මක්ෂයයෙන් හෝ ආභස්සර බ්‍රහ්මලෝකයෙන් ච්‍යුතව ඇතැම් බ්‍රහ්මයෝ එහි උපදිති. ඔවුන් දක්නා මුලින් උපන් බ්‍රහ්මයාහට මොවුහු මාගේ සිතීම නිසා මෙහි පහළ වූවෝ ය. මොවුහු මා විසින් මවන ලද්දෝ ය. මම මැවුම් කරු වෙමිය යන අදහස ඇති වේ. පසුව උපන් බ්‍රහ්මයන්ට ද මෙහි මුලින් විසුයේ මොහු ය. අපි මෙහි පසුව උපන්නමෝ ය, අපි මොහු විසින් මවන ලද්දෝ ය යන හැඟීම

Non-commercial distribution

ඇති වේ. එහි පළමු උපන් බ්‍රහ්මයෝ ආයුෂයෙන් හා වර්ණයෙන් ද අනුභාවයෙන් ද පසු ව උපනුන්ට වඩා උසස් වේ. පසුව උපන්නෝ පළමු බ්‍රහ්මයාට ආයුෂයෙන් වර්ණයෙන් ආනුභාවයෙන් හීනයෝ වෙති. ඔවුහු පළමු බ්‍රහ්මයා එහි සිටියදී ම එයින් ච්‍යුත ව මිනිස්ලොව උපදිති. එසේ උපනුවන්ගෙන් එකෙක් පැවිදිව භාවනා කොට සමාධියක් ලබා ගනී. ඒ සමාධියේ බලයෙන් ඔහු අතීත භවය දැකීමට සමත් වේ. ඉන් ඔබ අතීතය දැකීමට නොසමත් වේ. ඔහු ඒ බ්‍රහ්මලෝකයේ පළමු උපන් බ්‍රහ්මයා ජීවත් වනු දැක මොහු මහා බ්‍රහ්මයා ය, මැවුම් කරුය, ලෝකය මැවූයේ මොහු ය, මොහු ස්ථිර ය, ඔහු විසින් මවන ලද අපි ස්ථිර නො වෙමුය, මන්දායුෂ්කයෝ ය, එබැවින් අපි එයින් ච්‍යුත වී මෙහි පැමිණියෙමු ය යි සිත යි. ඉක්බිති ඔහු ඒ හැඟීම ස්ථිර වශයෙන් ගෙන අප මැවූ මහා බ්‍රහ්මයෙක් ඇත, ඔහු නිත්‍ය ය, අපි අනිත්‍ය ය යන ඒකත්‍ය ශාස්වතවාදය ප්‍රකාශ කරයි. මේ පළමුවන ඒකත්‍ය ශාස්වතවාදය ය. මේ ලෝකයත් සත්ත්වයාත් බ්‍රහ්මයා විසින් මවන ලදය යන දෘෂ්ටිය පළමුවෙන් ඇති වූ ආකාරය ය.

**ඛිඩ්ඩාපදෝසික** නම් දේවකොට්ඨාසයක් ඇත. ඔවුහු ක්‍රීඩාවෙන් සිනාවෙන් බොහෝ කොට වෙසෙන්නෝ ය. ක්‍රීඩාව රස වීමෙන් ඔවුනට සමහර විට ආහාර ගැනීම අමතක වෙයි. එක් වේලක් ආහාර නො ගත හොත් ඒ දෙවියෝ ජීවත් නො වෙති. ඔවුන් ගෙන් ඇතැම්හු ක්‍රීඩාවෙහි ඇලීම නිසා ආහාර ගැනීම අමතක වී දේවත්වයෙන් ච්‍යුත වෙති. එසේ ච්‍යුත ව මිනිස්ලොව උපන්නවුන් අතුරෙන් යම්කිසිවෙක් පැවිදිව භාවනාවෙහි යෙදී පෙර ජාතිය සිහි කිරීමට සමත් චිත්තසමාධියක් ලබා ගනී. ඔහු ඒ සමාධියේ බලයෙන් අතීත ජාතිය දකී. ඉන් ඔබ ජාතීන් දැකීමට සමත් නො වේ. ඔහු ඒ සමාධියේ බලයෙන් එහි වෙසෙන දෙවියන් දකී. ඉක්බිති ඔහු මෙසේ පවසයි. පින්වත්නි; ඛිඩ්ඩාපදෝසික නො වන දෙවියෝ ඇතහ. ඔවුහු බොහෝ වේලා ක්‍රීඩාවෙහි සිනාවෙහි නො යෙදෙන්නාහ. ඔවුන්ට අමතක වීමක් නො වන්නේ ය. එබැවින් ඔවුහු ඒ දෙව්ලොව ස්ථිර ව වෙසෙන්නාහ. අපි වනාහි ඛිඩ්ඩාපදෝසිකයෝ වෙමු. බොහෝ වේලා ක්‍රීඩාවෙහි යෙදුණා වූ සිහි මුළා වී එයින් ච්‍යුත වීමු. අප ස්ථිර නො වූවෝ ය.

Non-commercial distribution

අල්පායුෂ්කයෝ ය, ච්‍යුත වන ස්වභාව ඇතියෝ ය. මේ දෙවන ඒකත්‍ය ශාස්වතවාදය ය.

**මනෝපදූසික** නම් දේව කොට්ඨාසයක් ඇත. ඔවුහු ක්‍රෝධ චිත්තය නිසා නැසෙන්නෝ ය. ඒ දෙවියෝ සමහර විට ඔවුනොවුන්ට ක්‍රෝධ කොට ක්‍රෝධයෙන් දැවී නැසෙති. සමහර විටෙක එසේ නැසුණු දෙවියන් ගෙන් එකෙක් මේ මිනිස් ලොව ඉපද පැවිදිව භාවනා කොට අතීත ජාතිය සිහි කිරීමට සමත් සමාධියක් උපදවා ගනී. හේ ඉන් ඔබ අතීත ජාති දැකීමට සමත් නො වේ. හේ තමාගේ අතීත භවය දකී. තමා විසූ දෙව්ලොව ජීවත් වන අන්‍ය දෙවියන් දකී. ඉක්බිති හේ මෙසේ පවසයි. පින්වත්නි, මනෝපදූසික නො වන ඔවුනොවුන්ට නො කිපෙන දෙවියෝ ඇතහ. ඔවුහු ඒ දිව්‍ය ලෝකයෙහි නිත්‍ය ව වසන්නාහ. ච්‍යුත නො වන්නාහ. ච්‍යුත වන ස්වභාව ඇති අල්පායුෂ්ක වූ අපි එයින් චුත ව මේ ලෝකයට පැමිණියෙමු ය, අප අස්ථිරයෝ ය. ඒ දෙවියෝ සැම කල්හි එහි වෙසෙන්නෝ ය. මේ තුන් වන ඒකත්‍යශාස්වතවාදය ය.

ආත්මය ගැන කල්පනා කරන්නා වූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඇස කන නාසය දිව කය යයි කියනු ලබන්නා වූ මේ ආත්මය නැසෙන්නේ ය, චිත්තයය මනසය විඥානය යයි කියනු ලබන්නා වූ මේ ආත්මය නො නැසෙන්නේ ය. එය පොළොව මෙන් මහගල්කුළු මෙන් ඉර සඳ මෙන් ස්ථිර ව පවත්නේ ය යි තමාගේ කල්පනාවට වැටහුණු පරිදි ගෙන ඒ දෘෂ්ටිය ප්‍රකාශ කරයි. ඒ සතරවන ඒකත්‍ය ශාස්වත දෘෂ්ටිය ය. එය තර්කීවාද නම් වේ.

**අන්තානන්තිකවාද සතර:**

ආත්මය අන්තවත්ය යනු එක් වාදයෙකි. ආත්මය අනන්තය යනු එක් වාදයෙකි. ආත්මය අනන්තවත්ද අනන්ත ද වේය යනු එක් වාදයෙකි. ආත්මය අන්ත ඇත්තේ ද නැත්තේ ද නො වේය යනු එක් වාදයෙකි. මෙසේ අන්තානන්තික වාද සතරෙකි.

ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් සක්වළ පමණට මහත් නො වන පරිදි කසිණ නිමිත්ත වඩා එහි ධ්‍යානයට

Non-commercial distribution

සම වදී. ඔහු ආත්මයත් කසිණ නිමිත්තේ ප්‍රමාණයට ඇතය යි සිතා ආත්මය අන්තවත්ය යි සිතා ගනී. අනතුරු ව ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ආත්මය අන්තයක් නැතියකැයි කියති. එය අසත්‍ය ය, ආත්මය අන්තවත් ය. මම එය මා ලබා ඇති සමාධිය නිසා දකිමියි කියයි. මේ පළමු වන අන්තානන්තිකවාදය ය.

එකෙක් සක්වළ පමණට කසිණ නිමිත්ත මහත් කොට වඩා ධ්‍යානයට සම වැදෙයි. ඔහු කසිණය අරමුණු කරන විඥානය ආත්මය වශයෙන් ගෙන කසිණ නිමිත්ත සේම ආත්මයත් අන්තයක් නැතියකැයි ගනී. ඔහු ඒ දෘෂ්ටිය පවසයි. මේ දෙවන අන්තානන්තික වාදය ය.

එකෙක් සරසින් කොනක් නො ලැබෙන පමණට කසිණ නිමිත්ත මහත් කොට වඩා උඩ යට දෙකට නො වඩා ඒ නිමිත්තෙහි ධ්‍යානයට සමවැදී එය අරමුණු කරන ධ්‍යානචිත්තය ආත්ම වශයෙන් ගෙන කසිණ නිමිත්ත අනුව ආත්මය උඩ යට දෙකින් අන්තවත් ද සරසින් අනන්ත ද වේය යි දෘෂ්ටිය ගනී. ඉක්බිති ආත්මය අන්තවත්ය කීමත් අනන්තය කීමත් අසත්‍ය ය. ආත්මය අන්තවත් ද අනන්ත ද වේ ය යි කියයි. මේ තුන්වන අන්තානන්තිකවාදය ය.

චිත්ත සමාධියක් ලබා නැති ආත්මය ගැන කල්පනා කරන්නෝ තමන්ට වැටහෙන පරිදි "මේ ආත්මය අන්තවත් ද නො වේය. අනන්ත ද නො වේය. ආත්මය අන්තවත්ය කීම මුසාවෙක. අනන්තය කීම ද මුසාවෙක. අන්තවත්ද අනන්ත ද වේ ය යි කීමද මුසාවෙක. මේ ආත්මය අන්තවත් ද නො වේ. අනන්ත ද නො වේය" යි කියති. මේ සතරවන අන්තානන්තික වාදය ය.

**අමරාවික්ෂේපිකවාද සතරː**

එක් කරුණක ස්ථිර ලෙස නො පිහිටන බැවින් දෘෂ්ටිය බිඳලීම් වශයෙන් මැරිය නො හෙන, වික්ෂේපයට පමුණුවන දෘෂ්ටි **අමරාවික්ඛේපික** නම් වේ. අන් ක්‍රමයකින් කියත හොත් ආඳ නමැති මත්ස්‍යයා දියෙහි මතු වෙමින් ගැලෙමින් ඒ මේ අතට පනින

Non-commercial distribution

බැවින් මස් මරණුවන්නට ඇල්ලීම දුෂ්කරය. ආදා මෙන් ප්‍රශ්න කරන අයට හසු නො වන පරිදි එක් වාදයක නො පිහිටා ඒ මේ අත පනින, ප්‍රශ්නය ඒ ඒ අතට විසි කර අවුල් කරන දෘෂ්ටිය අමරාවික්ඛේපික වාදය ය.

ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් පින්පව් තත්ත්වාකාරයෙන් නො දනී. එබැවින් යම්කිසිවක් කුශලයක්ද අකුශලයක්දැ යි ප්‍රශ්න කළ හොත් ඔහු එයට කෙළින් පිළිතුරු දීමට බිය වෙයි. හරියට නො දැන කියන දෙය බොරු විය හැකි ය. බොරු කීම මට දුකෙක අන්තරායෙකැ යි හෙතෙමේ මේ කුශලයක්දැයි විචාළ හොත් මාගේ එසේ පිළිගැනීමක් නැතය යි කියයි. එසේ නම් මෙය අකුශලයක්දැයි ඇසුව හොත් මාගේ එසේ පිළිගැනීමක් ද නැතය යි කියයි. එසේ නම් මෙය කුශලාකුශල දෙකින් අතිකක් දැයි ඇසුව හොත් මාගේ එසේ පිළිගැනීමකුත් නැත ය යි කියයි. ඒ තුන් ආකාරයෙන් නො වේය යනු ඔබගේ ලබ්ධිය දැයි ඇසුව හොත් මාගේ එබඳු ලබ්ධියකුත් නැතය යි කියයි. එසේ නම් සියල්ලටම නැත ය නැතය කීම ම ඔබගේ ලබ්ධිය දැ යි ඇසුව හොත් මාගේ එබඳු ලබ්ධියකුත් නැතය යි කියයි. මෙසේ එක කාරණයක ද නො පිහිටා කුමකට වත් හසු නො වන පරිදි ප්‍රශ්නය අවුල් කරයි. ඒ මේ අතට පැන ගැළවෙයි. එසේ මුසාවාදයට බියෙන් ඒ මේ අතට පැමිණීම පළමුවන අමරාවික්ෂේපික වාදය ය.

කුශලාකුශලයන් තත්ත්වාකාරයෙන් නො දන්නා වූ ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මෙසේ සිතයි. හරියට නො දැන යමක් කුශලය කියා හෝ අකුශලය කියා හෝ කීයෙම් නම් එයින් මට ඡන්දය හෝ රාගය හෝ ද්වේෂය හෝ ප්‍රතිඝය හෝ ඇති විය හැකිය. එය මට උපාදනයක් වන්නේ ය. උපාදනය අන්තරායක් වන්නේ ය. එසේ සිතා උපාදනයට බියෙන් මේ කුශලය යි කෙළින් නො කියයි, මේ අකුශලයයි කෙළින් නො කියයි. ප්‍රශ්න කරන කල්හි පෙර කී පරිදි ඒ මේ අතට පනිමින් අවුල් කරයි. මෙසේ ඒ මේ අත පනිමින් ප්‍රශ්නය අවුල් කරන්නහුගේ දෘෂ්ටිය දෙවන අමරාවික්ෂේපික වාදය ය.

Non-commercial distribution

කුශලාකුශලයන් තත්ත්වාකාරයෙන් නො දන්නා වූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මෙසේ සිතයි. ලෝකයෙහි පණ්ඩිත වූ සියුම් නුවණ ඇත්තා වූ වාද කිරීමෙහි පුරුද්ද ඇත්තා වූ ස්වීය ප්‍රඥාවෙන් සියුම් වූ ද අනුන්ගේ දෘෂ්ටීන් බඳින්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතහ. ඉදින් මම හරියට නො දැන මේ කුශලය මේ අකුශලය යි කීයෙම් නම් ඔවුන් විසින් මාගෙන් කරුණු පිළිවිසුව හොත් මම කියන්නට සමත් නො වෙමි. එසේ සිතා මේ කුශල යයි ද ප්‍රකාශ නො කරයි. මේ අකුශල යයි ද ප්‍රකාශ නො කරයි. ප්‍රශ්න කළහොත් මාගේ එබඳු පිළිගැනීමක් නැත යනාදීන් කියා ඒ මේ අත පනී. වික්ෂේප කරයි. එසේ අන්‍ය පණ්ඩිතයන් විසින් වාදාරෝපණය කිරීමට බියෙන් ප්‍රශ්නය අවුල් කිරීම තුන්වන අමරාවික්ෂේපික වාදය යි.

ප්‍රශ්න විසඳිය හැකි නුවණ නැති මුඪ වූ ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් තමාගේ අනුවණ බව නිසා පරලොවක් ඇත්තේ දැ යි ඇසුව හොත් ඔබ පරලොවක් ඇතිදැයි අසන්නෙහි ය, මට පරලොවක් ඇත යයි හැඟේ නම් මම පරලොවක් ඇතය යි කියන්නෙමි. මට මෙසේ හැඟීමක් නැත. එසේ හැඟීමක් ද නැත අන්‍යාකාර හැඟීමක් ද නැත, පරලොව නැත ය යන හැඟීමක් ද නැත, නැත්තේ නොවේය යන හැඟීමක් ද නැතය යි කියා ප්‍රශ්නය අවුල් කරයි. වික්ෂේපයට පමුණුවයි.

පරලොවක් නැතදැ යි අසන කල්හි ද, පරලොවක් ඇත්තේ ද - නැත්තේ ද වේදැයි අසන කල්හි ද, ඕපපාතික සත්ත්වයෝ (මරණින් මතු උපදනා සත්ත්වයෝ) ඇත්දැයි අසන කල්හි ද, ඕපපාතික සත්ත්වයෝ නැත්දැයි අසන කල්හි ද, ඕපපාතික සත්ත්වයෝ ඇත්තාහු ද - නැත්තා හු ද වෙත්දැ යි අසන කල්හි ද, ඕපපාතික සත්ත්වයෝ නැත්තාහු ද - ඇත්තාහු ද වේදැ යි අසන කල්හි ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේදැයි අසන කල්හි ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක නැතිදැ යි අසන කල්හි ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵලවිපාක ඇත්තේ ද - නැත්තේ ද වේදැයි අසන කල්හි ද, සුකෘත දුෂ්කෘත කර්මයන්ගේ ඵල විපාක නැත්තේ ද නොවේ - ඇත්තේ ද නොවේදැ යි අසන

Non-commercial distribution

කල්හි ද, සත්ත්වයා මරණින් මතු ඇත්තේ ද - නැත්තේ දැයි අසන කල්හි ද, ඇතැම් සත්ත්වයන් ඇත - ඇතැම් සත්ත්වයන් නැතදැ යි අසන කල්හි ද, මරණින් මතු සත්ත්වයා නො මැත්තේ ද - ඇත්තේ ද නොවේදැ යි අසන කල්හි ද ඉහත කී පරිදි ම කියා වික්ෂේප කරයි. මේ සතරවන අමරාවික්ෂේපික වාදය ය.

ප්‍රශ්නය අවුල් කිරීමේ හේතුන් අනුව මෙසේ අමරාවික්ෂේපික වාද සතරක් දේශනය කර ඇත ද ඒ සතරදෙනාගේ ම දෘෂ්ටිය සමාන ය. සතරදෙනාට ම ඇත්තේ එක ම දෘෂ්ටියෙකි. එනම් පින්පව් පිළිබඳ වූ ද පරලොවක් ඇති නැති බව ආදිය පිළිබඳ වූ ද විසඳීමට දුෂ්කර මේ කරුණු නො විසඳ අවුල් කර දැමිය යුතු ය යනු ඔවුන්ගේ දෘෂ්ටිය ය.

**අධීත්‍ය සමුත්පත්තික වාද දෙක:**

**අසංඥසත්ත්ව** නම් වූ දේව කොට්ඨාසයක් ඇත්තේ ය. ඔවුනට ඇත්තේ රූප කාය පමණකි. සිත් ඔවුනට නැත. ඔවුන්ගේ ආයුෂය කල්ප පන්සියයෙකි. තීර්ථක ශාසනවල පැවිදි වූ ඇතැම්හු වායෝ කසිණයෙන් චතුර්ථධ්‍යානය උපදවා අත්පා සිඳීම් ආදි යම් දුකක් ඇත්තේ නම් ඒ සියල්ල වන්නේ සිත නිසාය. සිතක් නැති නම් කුමක් සිදුවුවත් දුකක් නැතය යි සිතෙහි දෝෂ දැක සිත් නැති ආත්මභාවයක් බලාපොරොත්තු වෙති. සිත පිළිකුල් කරන ඔවුහු ඒ ධ්‍යාන කුශලයේ බලයෙන් මරණින් මතු අසංඥභවයෙහි උපදිති. මේ භවයේ අන්තිම සිත වන ච්‍යුතිචිත්තය නිරුද්ධ වනු සමග ම ඔවුනට එහි සංඥවිරහිත රූප කායයක් පහළ වේ. ඔවුහු එහි කල්ප පන්සියයක් ම සංඥ විරහිතව වෙසෙති. චතුර්ථධ්‍යාන කුශලයේ බලය ක්ෂය වනු සමඟ මෙහි නැවත ඔවුනට ප්‍රතිසන්ධි චිත්තයක් ඇති වේ. අසංඥභූමියෙන් ච්‍යුත ව මෙහි උපන් යම් කිසිවෙක් පැවිදි ව භාවනා කොට අතීතය දැකීමට සමත් චිත්ත සමාධියක් ලබා ඒ සමාධියේ බලයෙන් තමාගේ අතීතය බලයි. ඔහුට ප්‍රතිසන්ධිය දක්වා තමාගේ අතීතය පෙනේ. විඤ්ඤාණයක් නො පැවති බැවින් ඔහුට ප්‍රතිසන්ධියෙන් ඔබ අතීතය නො පෙනේ. එයින් ඔහු මෙසේ කියයි: 'මේ සත්ත්වයා කිසි

Non-commercial distribution

හේතුවකින් තොරව ඉබේ ම ඇති වන්නේ ය මම පෙර නො විසූයෙමි. දැනට මම සත්ත්වයෙක් වී සිටිමි.' මේ පළමුවන අධීත්‍යසමුත්පන්න වාදය ය.

ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් සත්ත්වයාගේ ඇතිවීම ගැන කල්පනා කරනුයේ කිසි හේතුවක් නො දැක තමන්ගේ කල්පනාවේ සැටියට තමාට වැටහෙන පරිදි මේ සත්ත්වයෝ යම්කිසි හේතුවකින් තොරව ඉබේ ම ඇති වූහයි පවසයි. මේ දෙවන අධීත්‍ය සමුත්පන්නිකවාදය ය.

ශාස්වතවාද සතරය ඒකත්‍යශාස්වතවාද සතරය අන්තානන්තිකවාද සතරය අමරාවික්ෂේපිකවාද සතරය අධිත්‍ය-සමුත්පන්නිකවාද දෙකය යන මේ දෘෂ්ටි අටළොස සත්ත්වයන්ගේ අතීත කොට්ඨාසයන් සම්බන්ධයෙන් ඇති වන දෘෂ්ටීන් වන බැවින් පූර්වන්තානු දෘෂ්ටීහු නම් වෙති.

**සඤ්ඤීවාද සොළොසඃ**

මරණින් මතු පවතින රූපවත් ආත්මයක් ඇත. එය සංඥ ඇතියක යනු එක් වාදයෙකි. ධ්‍යාන ලාභීහු කසිණ රූපයාගේ වශයෙන් ආත්මය රූපයක් ඇතියකැයි ද කසිණ නිමිත්තෙහි පැවති සංඥව අනුව එහි සංඥාව ඇතය යි ද ගනිති. ඇතැම්හු තමන්ගේ කල්පනාව අනුව එසේ පවසති.

මරණින් මතු ද නොනැසී නිත්‍ය ව පවත්වන අරූපී ආත්මයක් ඇත. එය සංඥා ඇතියෙක යනු එක් වාදයෙකි. ඇතැම් ධ්‍යානලාභීහු අරූප සමාපත්ති නිමිත්ත ආත්ම වශයෙන් ද එහි පැවති සංඥාව සංඥ වශයෙන් ද ගෙන එසේ කියති. නිගණ්ඨාදීහු කල්පනා මාත්‍රයෙන් ද එසේ කියති.

මරණින් මතු රූපවත් වූ ද, අරූපී වූ ද ආත්මයක් ඇත. එය සංඥ ඇතියක යනු එක් වාදයෙකි. එය රූපාරූප සමාපත්ති දෙවර්ගය ම ලබා ඇතියන්ගේ වාදයෙකි.

රූපය ඇත්තේ ද නො වන නැත්තේ ද නො වන ආත්මයක් මරණින් මතු ඇත. එය සංඥව ඇතියක යනු එක් වාදයකි.

Non-commercial distribution

මරණින් මතු නො නැසී පවත්නා සංඥා ඇති අන්තවත් ත්මයක් ඇත. අන්ත නැති ආත්මයක් ඇත. අන්තවත් වූ ද, අන්තවත් නො වූ ද ආත්මයක් ඇත. අන්තවත් ද අනන්තවත් ද නො වූ ආත්මයක් ඇත. මෙසේ වාද සතරෙකි.

මරණින් මතු පවත්නා එක් සංඥවක් ඇති ආත්මයක් ඇත. නොයෙක් සංඥා ඇති ආත්මයක් ඇත. කුඩා සංඥාවක් ඇති ආත්මයක් ඇත. මහත් සංඥාවක් ඇති ආත්මයක් ඇත. මෙසේ වාද සතරෙකි. ධ්‍යානයට සමවන් පුද්ගලයාට ඇත්තේ එක් සංඥාවකි. එක් සංඥාවක් ඇති ආත්මයයි කියනුයේ සමවන් පුද්ගලයාගේ වශයෙනි. ධ්‍යාන නැතියවුන්ට අනේක සංඥා ඇත්තේ ය. නොයෙක් සංඥ ඇති ආත්මයක් පනවන්නේ ධ්‍යාන නැතියවුන්ගේ වශයෙනි. කුඩා සංඥ ඇති ආත්මයක් පනවන්නේ කුඩා කසිණ නිමිත්තක ධ්‍යානයට සමවදින පුද්ගලයාගේ වශයෙනි. මහා සංඥ ඇති ආත්මයක් පනවන්නේ විශාල කසිණ නිමිත්තෙහි ධ්‍යානයට සමවදින පුද්ගලයාගේ වශයෙනි.

ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයෝ සුඛය සහිත ධ්‍යානයෝ ය. ඒ ධ්‍යානයන් ලබා ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යාන භූමිවල උපනුවන් දිවැසින් බලා මරණින් මතු පවතින ඒකාන්තයෙන් සුඛයෙන් යුක්ත ආත්මය පනවති. නරකයෙහි උපනුවන්ට ඇත්තේ නිරන්තර දුකෙකි. ඔවුන් දිවැසින් දැක මරණින් මතු පවත්නා ඒකාන්ත දුක්ඛිත ආත්මයක් ඇතය යි කියති. මිනිස් ලොව උපනුවන් දැක සුවදුක් දෙක ම ඇති ආත්මයක් ඇතය යි කියති. චතුර්ථධ්‍යානය උපේක්‍ෂා සහගත ය. එය ලබා වේහප්ඵලයෙහි උපනුවන් දැක මරණින් මතු පවත්නා උපේක්‍ෂක ආත්මයක්, සුවදුක් දෙකම නැති ආත්මයක් ඇතය යි කියති. මේ සංඥීවාද සොළොසය.

**අසඤ්ඤිවාද අට:**

අතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මරණින් මතු නිත්‍ය ව පවත්නා රූපය ඇති ආත්මයක් ඇත. එය සංඥ නැතියකැයි කියති. ඇතැම්හු රූපය නැති ආත්මයක් ඇත. එය සංඥ නැතියකැයි

Non-commercial distribution

කියති. ඇතැම්හු රූපය ඇත්තා වූ ද රූපය නැත්තා වූ ද ආත්මයක් ඇත. එය සංඥා නැතියකැයි කියති. ඇතැම්හු රූපය ඇත්තේ ද නො වන නැත්තේ ද නො වන ආත්මයක් ඇත. එය සංඥා නැතියෙකැයි කියති. ඇතැම්හු අන්තවත් ආත්මයක් ඇත. එය සංඥා නැතියෙකැයි ද, ඇතැම්හු අනන්ත ආත්මයක් ඇත එය සංඥා නැතියෙකැයි ද ඇතැම්හු අන්තවත් වූ ද අනන්ත වූ ද ආත්මයක් ඇත. එය සංඥා නැතියෙකැයි ද, ඇතැම්හු අන්තවත් ද නො වන අනන්ත ද නො වන ආත්මයක් ඇත. එය සංඥා නැතියෙකැයි ද කියති. මේ අසඤ්ඤීවාද අට ය.

**නේවසංඥීනාසංඥීවාද අටː**

ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ මරණින් මතු ද නිත්‍යව පවතින රූපය ඇති ආත්මයක් ඇත. එය සංඥා ඇත්තේ ද නැත්තේ ද නො වන්නකැයි කියති. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ අරූපී ආත්මයක් ඇතයයි ද, රූපී වූ ද අරූපී වූ ද ආත්මයක් ඇතයයි ද, රූපී ද නො වන අරූපී ද නො වන ආත්මයක් ඇතය යි ද, අන්තවත් ආත්මයක් ඇතය යි ද, අනන්ත ආත්මයක් ඇතය යි ද, අන්තවත් ද අනන්ත ද ආත්මයක් ඇතය යි ද, අනන්තවත්ද නො වන අනන්ත ද නොවන ආත්මයක් ඇතය යි ද, ඒ ආත්මයෝ නේවසඤ්ඤීනාසඤ්ඤීහුය යි ද කියති. මේ නේවසඤ්ඤීනාසඤ්ඤීවාද අට ය.

**උච්ඡේවාද සත**

මරණින් සත්ත්වයා කෙළවර වන්නේ ය. මතු ඉපදීමෙක් නැත ය යන වාදය උච්ඡේදවාදය ය. මාපියන්ගෙන් උපන් චාතුර්මහා-භූතික වූ මේ කය ආත්මය යි ගෙන මරණින් ඒ ආත්මය කෙළවර වේ ය සිදේ යයි කීම එක් උච්ඡේදවාදයෙකි. කාමාවචර දිව්‍යලෝකයන්හි මරණින් ආත්මය සිඳී යේයැයි කීම එක් උච්ඡේදවාදයෙකි. රූපී බ්‍රහ්මලෝකවලදී මරණයෙන් ආත්මය සිඳේය යි කීම එක් උච්ඡේදවාදයෙකි. ආකාසානඤ්චායතන භූමියේදී මරණයෙන් ආත්මය සිඳේය යි කීම එක් උච්ඡේදවාදයෙකි. විඤ්ඤාණඤ්චායතන භූමියේදී මරණයෙන් ආත්මය සිඳේය යි කීම එක් උච්ඡේදවාදයෙකි. ආකිඤ්චඤ්ඤායතන භූමියේදී මරණයෙන් ආත්මය සිඳේය යි කීම එක් උච්ඡේදවාදයෙකි. නෙවසඤ්ඤා-

Non-commercial distribution

නාසඤ්ඤායතන භූමියේදී ආත්මය සිඳේ යයි කීම එක් උච්ඡේදවාදයෙකි. මේ උච්ඡේදවාද සත ය.

**දෘෂ්ට ධර්ම නිර්වාණ වාද පසː**

දුක් නිවීම වූ නිර්වාණය ඇත්තේ මේ ආත්මයෙහි ම ය. හෙවත් වර්තමාන පඤ්චස්කන්ධයෙහි ම ය යි කීම දෘෂ්ටධර්ම නිර්වාණවාදය ය. මේ ලෝකයෙහි රිසි පමණ ඉෂ්ට පංචකාමයන් ලබා ඒවායින් ඉන්ද්‍රියයන් පිනවමින් විසීම පරම දෘෂ්ටධර්ම නිර්වාණ යයි කීම එක් දෘෂ්ටධර්ම නිර්වාණ වාදයෙකි. ප්‍රථම ධ්‍යානයට පැමිණ විසීම පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කීම එක් දෘෂ්ටධර්ම නිර්වාණ වාදයෙකි. ද්විතීයධ්‍යානයට පැමිණ විසීම පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කීම එක් දෘෂ්ටධර්ම නිර්වාණ වාදයෙකි. තෘතීයධ්‍යානයට පැමිණ විසීම පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කීම එක් දෘෂ්ටධර්ම නිර්වාණ වාදයෙකි. චතුර්ථධ්‍යානයට පැමිණ විසීම පරම දෘෂ්ටධර්ම නිර්වාණය යි කීම එක් දෘෂ්ටධර්ම නිර්වාණ වාදයෙකි. මේ දෘෂ්ටධර්ම නිර්වාණවාද පස ය.

සඤ්ඤීවාද සොළොසය, අසඤ්ඤීවාද අටය, නේවසඤ්ඤී නාසඤ්ඤීවාද අටය, උච්ඡේදවාද සතය, දෘෂ්ටධර්ම නිර්වාණ වාද පසය යන මේ දෘෂ්ටි වාද සිවුසාළිස සංසාරයාගේ අපර කොට්ඨාසය හා සම්බන්ධ දෘෂ්ටීන් වන බැවින් අපරන්තානු දෘෂ්ටීහු නම් වෙති. පූර්වන්තානු දෘෂ්ටි අටළොස හා අපරන්තානු දෘෂ්ටි සිවු සාළිස එකතු කළ කල්හි දෙසැටක් වේ. ඒ බ්‍රහ්මජාලයෙහි වදරා ඇති මිථ්‍යා දෘෂ්ටි දෙසැට ය.

**ද්වාෂෂ්ටි දෘෂ්ටි නිර්දේශය නිමියේ ය.**

Non-commercial distribution

මෙතෙකින් මේ ග්‍රන්ථයෙහි සත්සිය පස් පනසක් (755) ධර්මයෝ දක්වන ලදහ. ඒ සියල්ලෝ ම සත්ත්වයන්ගේ සිත් කිලිටි කරන්නාවුන් බැවින් ක්ලේශයෝ ය. ඒ ක්ලේශ ධර්ම සත් සිය පස් පනස මෙසේ යඃ-

අභිධර්ම පිටකයේ දෙවන ග්‍රන්ථය වන විභංග ප්‍රකරණයේ දී ඛුද්දකවත්ථු විභංගයේ-

| | |
|---|---|
| ඒකක වශයෙන් දේශිත ධර්ම | 73 |
| ද්වික අටළොසෙහි ධර්ම | 36 |
| ත්‍රික පන්තිසෙහි ධර්ම | 105 |
| චතුස්ක තුදුසෙහි ධර්ම | 56 |
| පඤ්චක පසළොසෙහි ධර්ම | 75 |
| ෂට්ක තුදුසෙහි ධර්ම | 84 |
| සප්තක සතෙහි ධර්ම | 49 |
| අෂ්ටක අටෙහි ධර්ම | 64 |
| නවක නවයෙහි ධර්ම | 81 |
| දශක සතෙහි ධර්ම | 70 |
| බ්‍රහ්ම ජාලයේ දෘෂ්ටි | 62 |
| එකතුව | 755 |

මේ සත්සිය පස්පනසක් ක්ලේශයෝ සත්ත්වයන් තුළ අතීතයෙහි උපන්නෝ ය. අනාගතයෙහි ද උපදින්නෝ ය. අතීතයේ උපන් ක්ලේශයෝ **උත්පන්න** නම් වෙති. මෙතෙක් නූපන් අනාගතයේ උපදින්නට ඇති කලේශයෝ **අනුත්පන්න** නම් වෙති.

| | |
|---|---|
| උත්පන්න ක්ලේශ | 755 |
| අනුත්පන්න ක්ලේශ | 755 |
| එකතුව | 1510 |

සියය පන්සියය දහස යනාදි ප්‍රධාන ගණන්වලට මදක් අඩු වැඩි දෙයට ද සියය පන්සියය දහසය යි ව්‍යවහාර කරති. ඒ අනුව දසයක් අධික වූ මේ කෙලෙස් එක් දහස් පන්සියයට, අධික ය ගණන් නොගෙන කෙලෙස් එක් දහස් පන්සියය යි

Non-commercial distribution

කියනු ලැබේ. මේ කෙලෙස් එක් දහස් පන්සියය දක්වන එක් ක්‍රමයෙකි. මේ ක්‍රමය සඳහන් වන්නේ අභිධර්ම ග්‍රන්ථයක් වන ධම්ම සංගණී මූලටීකාවෙහි ය.

"ඛුද්දකවත්ථුවිභංගෙ ආගතේසු ඒකාධිකේසු අට්ඨසු කිලේස සතේසු අට්ඨාරස තණ්හාවිචරිතානි අපනෙත්වා සේසා ද්වාසට්ඨි දිට්ඨියෝ ච උප්පන්නානුප්පන්න භාවේන දිගුණිතානි දියඩ්ඪකිලේස සහස්සානි දසාධිකානි හොන්ති. අප්පකං පන ඌන මධිකංවා න ගණනූපගං හෝතීති දියඩ්ඪකිලෙස සහස්සන්ති වුත්තං"

(ධම්ම සංගනී මූලටීකා)

කෙලෙස් එක්දහස් පන්සියය දක්වන නොයෙක් ක්‍රම ඇත්තේ ය. ධම්මසංගණී අනුටීකාවෙහි ක්‍රම සයකින් කෙලෙස් එක් දහස් පන්සියය වන සැටි දක්වා ඇත්තේ ය.

ලෝභය දෝසය මෝහය මානය දිට්ඨිය විචිකිච්ඡාවය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය කියා ක්ලේශ යන නාමයෙන් ම දේශනය කර ඇති කෙලෙස් දසයක් ඇත්තේ ය. අන් ක්‍රම සියල්ල ම ඇත්තේ ඒ ක්ලේශ දශය ප්‍රධාන කරගෙන ය.

**අනුටීකාවෙහි එන පළමු වන ක්‍රමය මෙසේ ය:**

මෝහ අහිරික අනොත්තප්ප උද්ධච්ච ලෝභ දිට්ඨි මාන දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථීන මිද්ධ විචිකිච්ඡා යයි මෙසේ ඒකාන්ත අකුශල චෛතසික තුදුසක් ඇත්තේ ය.

සද්ධා සති හිරි ඔත්තප්ප අලෝභ අදෝස තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා, සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව කරුණා මුදිතා පඤ්ඤින්ද්‍රියයි මෙසේ කුශලාව්‍යාකෘත චෛතසික පස්විස්සක් ඇත්තේ ය.

ඵස්ස වේදනා සඤ්ඤා චේතනා ඒකග්ගතා ජීවිතින්ද්‍රිය මනසිකාර විතක්ක විචාර අධිමොක්ඛ විරිය පීති ඡන්ද කියා කුශලාකුශල අව්‍යාකෘත චෛතසික තෙළෙසක් ඇත්තේ ය.

Non-commercial distribution

ඒකාන්තාකුශල චෛතසික තුදුසය, කුශලාව්‍යාකෘත චෛතසික පස්විස්සය, කුශලාකුශලාව්‍යාකෘත චෛතසික තෙළෙසය, සිතය යන මේ නාම ධර්ම තෙපනසය.

පඨවි ආපෝ තේජෝ වායෝ, චක්ඛුපසාද සෝත පසාද, ඝාන පසාද, ජිව්හාපසාද, කායපසාද, රූප සද්ද ගන්ධ රස, ඉත්ථිභාව, පුරිසභාව, හදය, ජීවිත, ආහාර, පරිච්ඡේද රූප, කායවිඤ්ඤත්ති, වචීවිඤ්ඤත්ති, ලහුතා මුදුතා, කම්මඤ්ඤතා, (උපචය සන්තති) ජරතා අනිච්චතා යන රූප ධර්ම සත්විස්සය යන මේ ධර්ම අසූවෙන් භාවරූප දෙකින් එකක් හැර ඉතිරි සැත්තෑනවය ආධ්‍යාත්මික බාහ්‍ය වශයෙන් ද්විගුණ කළ කල්හි එකසියපනස් අටක් වේ. ඒ එක් සිය පනස් අටක් වූ ධර්මයන්ගෙන් එක් එක් ධර්මයක් ගැන ම ලෝභාදි ක්ලේශ දශය උපදී. එබැවින් ඒ නාමරූප ධර්ම එකසිය පනස් අට ඉහත දැක්වූ ලෝභාදි ක්ලේශ දසයෙන් ගුණ කළ යුතුය. එසේ කළ කල්හි කෙලෙස් එක්දහස් පන්සිය අසූවක් වේ. අසූව ගණන් නො ගෙන ප්‍රධාන ගණන පමණක් ගෙන කෙලෙස් එක් දහස් පන්සියය යි කියනු ලැබේ. මෙහි රූප සත් විස්සකට ගණන් ගනුයේ උපචය සන්තති දෙක එක් රූපයක් වශයෙන් සැලකීමෙනි.

**දෙවන ක්‍රමය:**

චෛතසික දෙපනසය, සිතය යන නාමධර්ම තෙපනසය, නිෂ්පන්න රූප අටළොසය, ආකාශ ධාතුවය, උපචය සන්තති දෙක එකක් කොට ලක්ෂණ රූප තුනය යන පන්සැත්තෑ ධර්ම විෂයෙහි දශ ක්ලේශයන් ගෙන් එක එකක්ම ඇති වන බැවින් ලෝභාදි ක්ලේශයෝ එකෙකක් පන්සැත්තෑව බැගින් වෙති. එසේ ගැනීමෙන් කෙලෙස් සත්සිය පනසක් වෙති. ඒවා ස්වසන්තානයෙහි ද ඇත. පරසන්තානයෙහි ද ඇත. ස්වසන්තානයෙහි ඇති වන කෙලෙස් සත්සිය පනස **ආධ්‍යාත්මික** නම් වෙති. පරසන්තානයෙහි ඇති වන කෙලෙස් සත්සිය පනස **බාහ්‍ය** නම් වෙති. ආධ්‍යාත්මික කෙලෙස් සත්සිය පනස හා බාහ්‍ය කෙලෙස් සත්සිය පනස එකතු කළ කල්හි කෙලෙස් එක්දහස් පන්සියයක් වේ.

Non-commercial distribution

**තුන්වන ක්‍රමය:**

සුඛවේදනා, දුක්ඛවේදනා, සෝමනස්සවේදනා, දෝමනස්ස-වේදනා, උපේක්ඛාවේදනා යන වේදනා පස ඉතිරි චෛතසික එක්පනසය, සිතය, රූපාරූප අටළොසය යන විදර්ශනාවට ගත යුතු පන්සැත්තෑ ධර්මය කෙලෙස් දසයෙන් පෙර කී පරිදි වැඩි කළ කල්හි කෙලෙස් සත්සිය පනසක් වේ. ඒවා ආධ්‍යාත්මික බාහ්‍ය දෙකින් ගුණ කළ කල්හි එක් දහස් පන්සියයක් වේ.

**සතරවන ක්‍රමය:**

පළමුවන අකුශල සිත වන සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ දිට්ඨි උද්ධච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශ සය ඇත.

දෙවන සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ දිට්ඨි ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සත ඇත.

තෙවන සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ මාන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සය ඇත.

සතරවන සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සත ඇත.

පස්වන උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ දිට්ඨි උද්ධච්ච අහිරික අනෝත්තප්ප යන කෙලෙස් සය ඇත.

සවන උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත සසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ දිට්ඨි ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සත ඇත.

සත්වන උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ මාන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සය ඇත.

Non-commercial distribution

අටවන උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංඛාරික චිත්තයෙහි ලෝභ මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සත ඇත.

නවවන දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාරික චිත්තයෙහි දෝස මෝහ උද්ධච්ච අහිරික අනෝත්තප්ප යන කෙලෙස් පස ඇත්තේ ය.

දසවන දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සසංඛාරික චිත්තයෙහි දෝස මෝහ ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සය ඇත්තේ ය.

එකොළොස්වන උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්ත චිත්තයෙහි මෝහ විචිකිච්ඡා උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් පස ඇත්තේ ය.

දොළොස්වන උපෙක්ඛා සහගත උද්ධච්ච සම්පයුත්ත චිත්තයෙහි මෝහ උද්ධච්ච අහිරික අනොත්තප්ප යන කෙලෙස් සතර ඇත්තේ ය.

මෙසේ අකුශල සිත් දොළොසෙහි කෙලෙස් දෙසැත්තෑවක් ඇත්තේ ය. අකුශල චිත්තයෝ ෂට් ද්වාරයෙහි උපදින්නෝ ය. චක්ෂුද්වාරික අකුශල චිත්තයන්හි කෙලෙස් දෙසැත්තෑව රූපාරම්මණිකයෝ ය. ශ්‍රෝත්‍රද්වාරාදියෙහි ඇති වන අකුශල චිත්තයන්හි ක්ලේශයෝ ද ශබ්දාරම්මණික ගන්ධාරම්මණික රසාරම්මණික පොට්ඨබ්බාරම්මණික ක්ලේශයෝ ය. එබැවින් පඤ්චද්වාරික චිත්තයන්හි දෙසැත්තෑව බැගින් ඇති ක්ලේශයෝ පඤ්චාරම්මණයන්ගේ වශයෙන් තුන්සිය සැටක් වේ. මනෝද්වාරික චිත්තයෝ ෂඩාරම්මණය ම අරමුණු කෙරෙති. එබැවින් මනෝද්වාරික අකුශල චිත්තයන්හි ක්ලේශයෝ ෂඩාරම්මණයන්ගේ වශයෙන් සාරසිය දෙතිසක් වේ. එකතු කළ කල්හි සත්සිය අනූ දෙකක් වේ. ඒ කෙලෙස් සත්සිය අනූදෙක ආධ්‍යාත්මික බාහ්‍ය වශයෙන් ඇති වන බැවින් කෙලෙස් එක් දහස් පන්සිය සූ අසූවක් වේ. සූ අසූව ගණින් නො ගෙන කෙලෙස් එක් දහස් පන්සියයයි කියනු ලැබේ.

Non-commercial distribution

### පස්වන ක්‍රමය

රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යන ආරම්මණ පස හා ඉතිරි රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන ස්කන්ධ පස ද යන මේ දශය ආධ්‍යාත්ම බාහ්‍ය දෙකින් ගුණ කළ කල්හි විස්සක් වේ. එයට ප්‍රඥප්තිය එකතු කළ කල්හි ධර්ම එක් විස්සක් වේ. ඒ ධර්ම එක් විස්සෙහි ම ඉහත කී දෙසැත්තෑ ක්ලේශයෝ උපදිති. ධර්ම එක්විස්ස කෙලෙස් දෙසැත්තෑවෙන් ගුණ කළ කල්හි එක් දහස් පන්සිය දොළොසක් වේ. දොළොස ව්‍යවහාරයට නො ගෙන මේ ක්‍රමයෙන් ද කෙලෙස් එක් දහස් පන්සියය යි කියනු ලැබේ.

### සවන ක්‍රමය

පළමුවන අකුශල සිත වන සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික චිත්තයෙහි අන්‍යසමාන චෛතසික තෙළෙසය අකුශල සාධාරණ චෛතසික සතරය ලෝභය දෘෂ්ටිය යන මේ එකුන්විසි චෛතසිකයෝ යෙදෙති. සිත ද සමඟ එහි අකුශල ධර්ම විස්සකි. එසේ ම දෙවන අකුශල චිත්තයෙහි ධර්ම දෙ විස්සක් ද තුන්වන අකුශල චිත්තයෙහි ධර්ම විස්සක් ද සතරවන අකුශල චිත්තයෙහි දෙවිස්සක් ද පස්වන අකුශල චිත්තයෙහි එකුන් විස්සක් ද සවන අකුශල චිත්තයෙහි එක් විස්සක් ද සත්වන අකුශල චිත්තයෙහි එකුන් විස්සක් ද අටවන අකුශල චිත්තයෙහි එක්විස්සක් ද නවවන අකුශල චිත්තයෙහි එක් විස්සක් ද දසවන අකුශල චිත්තයෙහි තෙවිස්සක් ද එකොළොස්වන චිත්තයෙහි සොළසක් ද දොළොස්වන චිත්තයෙහි සොළොසක් ද වේ. සියල්ල එක් කළ කල්හි අකුශල ධර්ම දෙසිය සතළිසක් වේ. ඒවා රූපාදි ෂඩාරම්මණයෙහි පවතින බැවින් ෂඩාරම්මණයෙන් ගුණ කළ කල්හි අකුශල ධර්ම එක් දහස් සාරසිය සතළිසක් වේ. සැටක් අඩු වුව ද ඒ අකුශල ධර්ම රාශියට කෙලෙස් එක් දහස් පන්සියය යි කියනු ලැබේ.

Non-commercial distribution

# ක්ලේශප්‍රහාණය

සත්ත්වයනට නරක තිර්‍යක් ප්‍රේත අසුරකාය යන සතර අපායට නැවත නැවත වැටී අපාදුක් විඳින්නට සිදු වන්නේත් ජාති ජරා ව්‍යාධි මරණ අප්‍රිය සම්ප්‍රයෝග ප්‍රිය විප්‍රයෝග ශෝක පරිදේවාදි දුඃඛයන් විඳින්නට සිදු වන්නේත් කලේශයන් නිසා ය. ඒ දුක් වලින් මිදීම වූ පරමසුඛය වූ නිර්වාණයට පැමිණිය හැක්කේ ක්ලේශයන් ප්‍රහාණය කිරීමෙනි. දුරු කිරීමෙනි. ක්ලේශයෝ වනාහි මිනිසුන් මැරීමට නගර ග්‍රාමයන් විනාශ කිරීමට රටවල් විනාශ කිරීමට සමත්, සත්ත්වයන් අපායට ගෙන යාමට සමත් මහ බලයක් ඇතියෝ ය. එහෙත් ඒවා රූපයක් නැති සටහනක් නැති ඇසින් දැකිය නො හෙන කනින් ඇසිය නො හෙන අතින් ගත නො හෙන ඉතා සියුම් ධර්මයෝ ය. ඝණ්ටාවකට ගැසීමේ දී නැගි නැගී අවුත් සැණෙකින් නැති වෙමින් යන හඬවල් මෙන් චිත්තසන්තානයෙහි ඉපද ඉපද වහ වහා නැති වී යන්නෝ ය. ශරීරයේ හෝ භාජනයක වස්ත්‍රයක තැවරුණු කුණු පිස හෝ සෝද ඉවත් කරන්නාක් මෙන් ක්ලේශයන් සත්ත්ව සන්තානයෙන් ඉවත් කළ හැක්කේ නො වේ. ක්ලේශයන් දුරු කිරීමය, ප්‍රහාණය කිරීමය කියනුයේ ක්ලේශයන් ගේ ඇති වීම වැළැක්වීමට ය. සියලු ම අකුශලයෝ ක්ලේශයෝ ය. කෙලෙසුන් කොතෙක් බලවත් වුව ද අඳුරට විරුද්ධ වූ අඳුර දුරු කිරීමට සමත් ආලෝකයක් ඇතිවාක් මෙන්, උෂ්ණය දුරු කිරීමට සමත් ශීතලක් ඇතිවාක් මෙන්, ගින්න නිවීමට සමත් ජලයක් ඇතිවාක් මෙන්, රෝග දුරු කිරීමට සමත් ඖෂධයන් ඇතිවාක් මෙන් සියලුම කෙලෙසුන් දුරු කිරීමට සමත් කුශල ධර්මයෝ ඇත්තාහ. ක්ලේශයන්, අකුශලයන් දුරලීමට සමත් එකම බලය කුශලය ය. තදංගප්‍රහාණය විෂ්කම්භණප්‍රහාණය සමුච්ඡේදප්‍රහාණයයි ක්ලේශ ප්‍රහාණ තුනක් ඇත්තේ ය.

Non-commercial distribution

**තදංගප්‍රහාණය:**

ඒ ඒ රෝග සුව කිරීමේ ශක්තිය ඇති ඖෂධයන් වෙන වෙන ම ඇතිවාක් මෙන් ඒ ඒ ක්ලේශයන් දුරු කිරීමට සමත් ඒ ඒ පාපයන් දුරු කිරීමට සමත් කුශලයෝ ද වෙන වෙන ම ඇත්තාහ. රෝග බොහෝ ගණනක් සුව කිරීමට සමත් ඖෂධයන් ඇතිවාක් මෙන් බොහෝ කෙලෙසුන් දුරු කිරීමට බොහෝ පව්කම් නැසීමට සමත් කුශලයෝ ද ඇත්තාහ. ඒ ඒ ක්ලේශයට, ඒ ඒ අකුසල කර්මයට විරුද්ධ කුශලයන් ඇති කර ගැනීමෙන් ඒ ඒ ක්ලේශයන් පාපකර්මයන් ඇති වීම වැළැක්වීම තදංග ප්‍රහාණය ය. තදංගප්‍රහාණයන් ගේ සංඛ්‍යාවක් දැක්වීම දුෂ්කර ය. සල්ලේඛ සූත්‍රය අනුව කියත හොත් තදංග ප්‍රහාණ සිවුසාළිසක් කිය හැකි ය.

සිත රිදෙන වචනවලින් හා අත් පා ආදියෙන් පහර දීමෙන් ද කීර්තිය කැළැල් කිරීමෙන් හා ගෞරව නැති කිරීමෙන් ද, අන්‍යයන්ට පීඩා කරන ස්වභාව ඇතියකු විසින්, "සියල්ලෝම සැපයට කැමැත්තෝ ය. පීඩාවට නො කැමැත්තෝ ය. පීඩා කරන්නහුට ද නො කැමැත්තෝ ය. මා විසින් අන්‍යයන්ට පීඩා කිරීම නුසුදුසු ය, අන්‍යයන්ට යහපතක් ම කළ යුතු යයි' කියා කරුණාව නමැති කුශල ධර්මය ඇති කර ගත හොත් කරුණාව පවත්නා තෙක් කරුණාව නමැති කුශලාංගයේ බලය ඒ පුද්ගලයාගේ සන්තානයෙහි පවත්නා තෙක් ඔහු ගේ සන්තානයෙහි අන්‍යයන්ට හිංසා කරන්නා වූ ද්වේෂ සහගත ඊර්ෂ්‍යා සහගත අකුශල චේතනාවන් හා එයට සම්බන්ධ වන ක්ලේශයෝ නූපදිති. හේ අන්‍යයන්ට හිංසා නො කරයි. මෙසේ අවිහිංසා සංඛ්‍යාත කුශලාංගයෙන් හිංසා චේතනාව හා ක්ලේශයන් දුරු කිරීම එක් තදංග ප්‍රහාණයෙකි.

අනුන්ගේ සම්පත් ඉවසිය නො හෙන අනුන්ගේ සම්පත් හීනවී නැතිවීම ගැන සතුටු වන අනුන්ගේ සම්පත් නැති කිරීමට උත්සාහ කරන පුද්ගලයකු තුළ සත්පුරුෂ සේවන සද්ධර්ම ශ්‍රවණයන් ලැබ නුවණ ලැබී ඊර්ෂ්‍යාවේ දෝෂය දැක පරසම්පත්තිය ගැන සතුටු වන ස්වභාවය වූ මුදිතා නමැති කුශල ධර්මය ඇති

Non-commercial distribution

වුවහොත් ඉන් පසු එහි බලයෙන් ඔහු තුළ පරසම්පත්තිය ගැන ඊර්ෂ්‍යාව ඇති නො වේ. එසේ මුදිතාව නමැති කුශලාංගයෙන් ඊර්ෂ්‍යා නමැති ක්ලේශය දුරුවීම එක් තදංගප්‍රහාණයෙකි.

ප්‍රාණඝාතය කරන්නකු දහම් ඇසීම සත්පුරුෂ සේවනය ලබා ප්‍රාණ වධයේ දෝෂය දැක ප්‍රාණඝාතයෙන් වැළකීම වූ කුශල ශීලය සමාදන් වුව හොත් ඉන්පසු ඔහු ප්‍රාණඝාතයෙන් වළකින්නේ ය. ඔහුගේ සන්තානයෙහි ප්‍රාණඝාත චේතනාව හා එයට සම්බන්ධ ද්වේෂ මෝහාදි ක්ලේශයෝ ඇති නො වෙති. පාණාතිපාතා වේරමණී යන කුශල ශීලාංගයෙන් ප්‍රාණඝාත චේතනාව ඇතුළු ඒ ක්ලේශයන් ඇති නො වීම එක් තදංග ප්‍රහාණයෙකි.

අදින්නාදනා වේරමණී යන කුශල ශීලාංගයෙන් වන අදින්නාදන චේතනාවගේ හා එයට සම්බන්ධ ක්ලේශයන්ගේ ද කාමේසුමිච්ඡාචාරා වේරමණී යන ශීලාංගයෙන් මිථ්‍යාචාර චේතනාවගේ හා ක්ලේශයන්ගේ ද, අබ්‍රහ්මචරියා වේරමණී යන ශීලාංගයෙන් මෛථුන චේතනාවේ හා ක්ලේශයන්ගේ ද, මුසාවාද වේරමණී යනාදි ශීලාංගවලින් මුසාවාද චේතනාදියගේ ද ප්‍රහාණය තදංග ප්‍රහාණයෝ ය.

විදර්ශනා වඩන යෝගාවචරයන්ට ඇති වන නාම රූප පරිච්ඡේද ඥනයෙන් සත්කාය දෘෂ්ටිය ප්‍රහාණය වේ. ප්‍රත්‍යයපරිග්‍රහ ඥනයෙන් අහේතු විෂම හේතු දෘෂ්ටීන්ගේ හා විචිකිච්ඡාවන් ගේ ප්‍රහාණය වේ. කලාපසම්මර්ෂණඥනයෙන් මමය මගේය යන සමූහ ග්‍රහණයාගේ ප්‍රහාණය වේ. මාර්ගාමාර්ගව්‍යවස්ථා ඥානයෙන් අමාර්ගයෙහි මාර්ග සංඥව ප්‍රහාණය වේ. සංස්කාරයන්ගේ උත්පාදය දක්නා ඥනයෙන් උච්ඡේද දෘෂ්ටි ප්‍රහාණය වේ. ව්‍යයදර්ශන ඥනයෙන් ශාස්වත දෘෂ්ටිය ප්‍රහාණය වේ. මේ ප්‍රහාණයෝ ද තදංග ප්‍රහාණයෝ ය.

**විශ්කම්භණ ප්‍රහාණය:**

රූපාවචර අරූපාවචර ධ්‍යානචිත්තයන් ඇති වන කල්හි කාමච්ඡන්දාදි නීවරණයෝ බැහැර වෙති. නැඟී නො එති. ධ්‍යානයට පෙර පසු කාල දෙක්හි ද නීවරණයෝ නැඟී නො එති. කාමච්ඡන්දදීන්ට නැඟී නො ආ හැකි තත්ත්වයට පැමිණවිය හැකි

Non-commercial distribution

බව ධ්‍යාන චිත්තයන්හි ඇති බල විශේෂයෙකි. ධ්‍යානචිත්තයන් නිසා වන ඒ කෙලෙසුන්ගේ දුරුවීම විෂ්කම්භණප්‍රහාණ නම් වේ.

තදංග වශයෙන් විෂකම්භණ වශයෙන් කරන ක්ලේශප්‍රහාණය ස්ථිර නැත. එසේ ප්‍රහාණය කළ ක්ලේශයෝ කලක් යටපත් ව තිබී නැවත නැඟී එති. එබැවින් කලෙක සිල්වත් ව විසුවෝ කලෙක දුශ්ශීල වෙති. කාමයන් හැර ධ්‍යාන ලබා අහසින් ගමන් කළාහු කලෙකදී කිසිදු බලයක් නැති කාමභෝගීහු වෙති. අප බෝසතාණන් වහන්සේට පවා එසේ වූ බව ජාතක කථාවල සඳහන් ව ඇත්තේ ය.

**සමුච්ඡේද ප්‍රහාණය:**

ශ්‍රෝතාපත්තිමාර්ගය සකෘදගාමී මාර්ගය අනාගාමී මාර්ගය අර්හත් මාර්ගය යන ලෝකෝත්තර කුශලයන්ට කෙලෙස් නැසීමේ මහා බලයක් ඇත්තේ ය. ඔවුහු මතු කිසි කලෙක නැඟී නොඑන ලෙස සමූලඝාතනයෙන් කෙලෙසුන් නසති. මතු කිසි කලෙක මතු වී ආ නො හැකි වන පරිදි ලෝකෝත්තර මාර්ග කුශලයන් විසින් කරන ක්ලේශප්‍රහාණය සමුච්ඡේද ප්‍රහාණ නම් වේ. තදංගප්‍රහාණයෙන් කෙලෙසුන් ප්‍රහාණය කළ පුද්ගලයන්ට හා විෂ්කම්භණ ප්‍රහාණයෙන් කෙලෙසුන් ප්‍රහාණය කළ පුද්ගලයන්ට නැවත ඒ කෙලෙස් මතු වන්නාක් මෙන් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය කළ කෙලෙස් නැවත මතුවී සෝවාන් පුද්ගලයෙක් කිසි කලෙක පෘථග්ජන නො වන්නේ ය. සෝවාන් පුද්ගලයා භවාන්තරයට පැමිණ තමාගේ ආර්‍යශ්‍රාවක භාවය නො දැන සිටිනා විටෙක වුව ද අපායෝත්පත්තියට හේතු වන පව්කම් නො කරන්නේ ය. සම්පත් දීමෙන් පොළඹවා හෝ මෙය නො කළහොත් තුඹට මේ මේ වැඩ කරමි යි බිය ගැන්වීමෙන් හෝ සෝවාන් පුද්ගලයකු ලවා කුහුඹුවකු ද නොමැරවිය හැකි බව **මනෝරථ පූරණියේ** දක්වා ඇත්තේ ය.

"භවන්තරේහිපි අරියසාවකෝ ජීවිතහේතුපි නෙව පාණං හනති, න සුරං පිවති, සචේපිස්ස සුරඤ්ච ඛීරඤ්ච මිස්සෙත්වා මුඛෙ පක්ඛිපන්ති, ඛීරමේව පවිසති න සුරා."

(කූටදන්ත සුත්ත වණ්ණනා)

Non-commercial distribution

යනුවෙන් භවාන්තරයෙහි ද ආයසීශ්‍රාවකයා ජීවිතය නිසා ද ප්‍රාණයක් නො නසන බවත් සුරා හා කිරි මිශ්‍ර කොට ඔහුගේ මුඛයෙහි වත්කළ හොත් කිරි පමණක් පෙවෙන බවත් සුරාව නො පෙවෙන බවත් දක්වා ඇත්තේ ය. එසේ වන්නේ ලෝකෝත්තර මාර්ගයෙන් කෙරෙන ක්ලේශ ප්‍රහාණයේ ස්ථිරත්වය නිසා ය.

ඒ ඒ මාර්ග ඥානවලින් ප්‍රහාණය කරන ක්ලේශයෝ මෙසේ ය. අකුශල සිත් දොළොසෙන් ලෝභ මූල දෘෂ්ටි සම්ප්‍රයුක්ත සිත් සතර ය, විචිකිච්ඡා සහගත සිත ය, ඒ සිත් හා යෙදෙන දෙවිසි චෛතසිකයෝ ය යන මේ ධර්මයෝ සෝවාන් මාර්ගයෙන් නිරවශේෂ වශයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්. අපායෝත්පත්තියට හේතුවන දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතර ය, ද්වේෂ මූල සිත් දෙක ය, ඒවා හා යෙදෙන චෛතසික පස්විස්සය යන මේ ධර්මයෝ තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

සකෘදගාමී මාර්ගයෙන් නිරවශේෂයෙන් ප්‍රහාණය කරන ධර්ම නැත. ඖදරික වූ දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතරය, ඖදරික ද්වේෂ මූල සිත් දෙකය, තත්සම්ප්‍රයුක්ත චෛතසිකයෝ ය යන මොවුහු සකෘදගාමී මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

කාමරාග සම්ප්‍රයුක්ත දෘෂ්ටි සම්ප්‍රයුක්ත සිත් සතරය ද්වේෂ මූල සිත් දෙකය තත් සම්ප්‍රයුක්ත චෛතසික පස් විස්සය යන මොහු අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

රූපරාග අරූපරාග සහගත දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතර ය, උද්ධච්ච සහගත සිතය, තත් සම්ප්‍රයුක්ත චෛතසික එක් විස්සය යන මේ ධර්මයෝ අර්හත් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

ක්ලේශ ප්‍රහාණය **විසුද්ධි මග්ගයේ** දැක්වෙන්නේ මෙසේ යː– සඤ්ඤෝජනයන්ගෙන් සක්කායදිට්ඨිය විචිකිච්ඡාව සීලබ්බතපරාමාසය අපායගමනීය කාමරාගය පටිඝය යන මේ ධර්මයෝ පස්දෙනා සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්. ඖදාරික වූ කාමරාග පටිඝයෝ සකෘදගාමි මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්. සියුම් වූ කාමරාග පටිඝයෝ අනාගාමි මාර්ගයෙන්

Non-commercial distribution

ප්‍රහාණය කරනු ලැබෙත්. රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන මොහු අර්හත් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

දශ ක්ලේශයන් අතුරෙන් දිට්ඨි විචිකිච්ඡා දෙක ප්‍රථම මාර්ගයෙන් ද ද්වේෂය අනාගාමි මාර්ගයෙන් ද ලෝභ මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්පයෝ අර්හත් මාර්ගයෙන්ද ප්‍රහාණය කරනු ලැබෙත්.

මිච්ඡත්තයන් අතුරෙන් මිච්ඡාදිට්ඨි මුසාවාද මිච්ඡා කම්මන්ත මිච්ඡා ආජීව යන මොහු සෝවාන් මාර්ගයෙන්ද මිච්ඡා සංකප්ප පිසුණාවාචා ඵරුසාවාචා යන මොහු අනාගාමි මාර්ගයෙන් ද සම්ඵප්පලාප මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාවිමුක්ති මිච්ඡා ඤාණ යන මොවුහු අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබෙත්.

අෂ්ටලෝක ධර්මයන්හි ප්‍රතිඝය අනාගාමි මාර්ගයෙන් ද අනුනය අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ. යශයෙහි ප්‍රශංසාවෙහි අනුනය (ඇලීම) අර්හත් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබේය යනු එක් ආචාය්‍ය්‍යවාදයෙකි. මාත්සර්ය්‍යයෝ සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

විපල්ලාසයන් අතුරෙන් අනිත්‍ය දෙය නිත්‍යය යි ද ආත්ම නොවන දෙය ආත්මය යි ද ඇති වන සඤ්ඤා විපල්ලාස චිත්ත විපල්ලාස දිට්ඨිවිපල්ලාසයෝ ද දුක්ඛය සුඛය අසුභය කියා ඇති වන දිට්ඨිවිපල්ලාසය ද යන මොහු සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්. අසුභය සුභය කියා ඇති වන සඤ්ඤා විපල්ලාස චිත්ත විපල්ලාසයයෝ අනාගාමි මාර්ගයෙන් ද දුක්ඛය සුඛය කියා ඇති වන සඤ්ඤාවිපල්ලාසය අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබෙත්.

ගන්ථයන් අතුරෙන් සීලබ්බතපරාමාසකායගන්ථ ඉදං-සච්චාභිනිවේසකායගන්ථ යන දෙක සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබේ. ව්‍යාපාදකායගන්ථය අනාගාමි මාර්ගයෙන් ද අභිජ්ඣාකායගන්ථය අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ. අගතීහු සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබෙත්.

ආසවයන්ගෙන් දිට්ඨාසවය සෝවාන් මාර්ගයෙන්ද කාමාසවය අනාගාමි මාර්ගයෙන්ද භවාසවය හා අවිජ්ජාසවය

Non-commercial distribution

අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ. ඕඝ යෝගයන්ගේ ප්‍රහාණය ද එසේ ම ය.

නීවරණයන් අතුරෙන් විචිකිච්ඡා නීවරණය සෝවාන් මාර්ගයෙන් ද කාමච්ඡන්ද ව්‍යාපාද කුක්කුච්ච යන තුන අනාගාමි මාර්ගයෙන් ද ථීන උද්ධච්ච යන දෙක අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ. පරාමාසය සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කරනු ලැබේ.

උපාදනයන්ගෙන් කාමුපාදනය අර්හත් මාර්ගයෙන් ද ඉතිරි තුන සෝවාන් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ. රූපරාග අරූපරාග දෙක ද කාමුපාදනයට අයත් බැවින් එය ප්‍රහාණය වන්නේ අර්හත් මාර්ගයෙනි.

අනුසයයන් අතුරෙන් දිට්ඨානුසය හා විචිකිච්ඡානුසය සෝවාන් මාර්ගයෙන් ද කාමරාගානුසය පටිඝානුසය යන දෙක අනාගාමි මාර්ගයෙන් ද මානානුසය භවරාගානුසය අවිජ්ජානුසය යන තුන අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ.

මලයන්ගෙන් දෝසමලය අනාගාමි මාර්ගයෙන් ද රාගමලය හා මෝහමලය අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ.

අකුශල කර්මපථයන් අතුරෙන් පාණාතිපාත අදින්නාදන මිච්ඡාචාර මුසාවාද මිච්ඡාදිට්ඨි යන පස සොවාන් මාර්ගයෙන් ද පිසුණාවාචා ඵරුසාවාචා ව්‍යාපාද යන තුන අනාගාමි මාර්ගයෙන් ද සම්ඵප්පලාප අභිජ්ඣා යන දෙක අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ.

අකුශල චිත්තයන් අතුරෙන් ලෝභ මූල දිට්ඨිගත සම්පයුත්ත සිත් සතරය විචිකිච්ඡා සහගත සිතය යන මේ පස සෝවාන් මාර්ගයෙන් ද පටිඝසම්පයුත්ත සිත් දෙක අනාගාමි මාර්ගයෙන් ද ඉතිරි සිත් පස අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ.

**චිත්තෝපක්ලේශ ප්‍රහාණය**

1. අභිජ්ඣා විසමලෝභෝ චිත්තස්ස උපක්කිලේසෝ
2. බ්‍යාපාදෝ චිත්තස්ස උපක්කිලේසෝ

Non-commercial distribution

3. කෝධො චිත්තස්ස උපක්කිලේසො
4. උපනාහො චිත්තස්ස උපක්කිලේසො
5. මක්ඛො චිත්තස්ස උපක්කිලේසො
6. පළාසො චිත්තස්ස උපක්කිලේසො
7. ඉස්සා චිත්තස්ස උපක්කිලේසො
8. මච්ඡරියං චිත්තස්ස උපක්කිලේසො
9. මායා චිත්තස්ස උපක්කිලේසො
10. සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලේසො
11. ථම්භො චිත්තස්ස උපක්කිලේසො
12. සාරම්භො චිත්තස්ස උපක්කිලේසො
13. මානො චිත්තස්ස උපක්කිලේසො
14. අතිමානො චිත්තස්ස උපක්කිලේසො
15. මදො චිත්තස්ස උපක්කිලෙසො
16. පමාදො චිත්තස්ස උපක්කිලේසො

මෙසේ මධ්‍යමනිකායේ වස්තූපම සූත්‍රයෙහි චිත්තෝපක්ලේශ යන නාමයෙන් ධර්ම සොළොසක් දේශනය කර ඇත්තේ ය. ඒ ධර්ම සියල්ල ම මේ ග්‍රන්ථයෙහි ඒ ඒ තැන්වල විස්තර කර ඇත්තේ ය.

මේ චිත්තෝපක්ලේශයන් අතුරෙන් මක්ඛ පලාස ඉස්සා මච්ඡරිය මායා සාඨෙය්‍ය යන සය සෝවාන් මාර්ගයෙන් ද ඛ්‍යාපාද කෝධ උපනාහ පමාද යන සතර අනාගාමි මාර්ගයෙන් ද අභිජ්ඣා විසමලෝභ ථම්භ සාරම්භ මාන අතිමාන මද යන මේ සය අර්හත් මාර්ගයෙන් ද ප්‍රහාණය කරනු ලැබේ.

**ක්ලේශ ප්‍රහාණ නිර්දේශය නිමියේ ය.**

රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරයන් වහන්සේ
විසින් සම්පාදිත කෙලෙස් එක්දහස් පන්සියය
නමැති ග්‍රන්ථය නිමියේ ය.

Non-commercial distribution

## කෙලෙස් එක්දහස් පන්සියය.

# අනුක්‍රමණිකාව


අකණිට්ඨක 64
අකප්පිය 179
අකර්මණ්‍ය 204
අකාලය 18
අකාලවාදි 88
අක්ඛන්ති 75
අගති 153, 255
අගාරව 185
අගුත්තද්වාරතා 80
අගෝචරය 74
අංගණ 4, 110
අජ්ජව 73
අජ්ඣත්ත 85
අජ්ඣත්ත සඤ්ඤෝජන 164
අජ්ඣෝසානය 218
අඤ්ඤාණ 60
අඤ්ඤානුපෙක්ඛාව 192
අතප්පය 64
අතිධාවනය 105, 107
අතිමානය 42
අත්තවාදුපාදන 150
අත්තානුදිට්ඨි 116
අත්තානුවාද භය 160
අත්‍රිච්ඡතා 24
අත්‍රිච්ඡයා 24
අදින්නාදන 252
අධම්මචරියා 117
අධර්මවාදී 88
අධිගමනය 44
අධිචිත්ත 168
අධිච්ච සමුත්පන්න 194
අධිප්‍රඥ 168
අධිමාන 43
අධිශීල 168
අධිත්‍ය සමුත්පන්තික වාදය 239
අනජ්ජව 73
අනන්තවාදිට්ඨි 66
අනභිරතිය 111, 226
අනරියවෝහාර 157, 209
අනර්ථවාදි 88
අනවඤ්ඤත්ති පටිසං-
යුත්තාවිතක්ක 48
අනවඤ්ඤාත මද 20
අනාගාමි 4, 253
අනාදරිය 128
අනාර්ය 153, 158, 209
අනුකූල මානය 42
අනුත්පන්න 7, 244
අනුත්පාද නිරෝධය 61
අනුනය 255
අනුපකාරකයා 141
අනුපාදිශේෂ 114
අනුපාහන 185
අනුශ්‍රැති 233
අනුසය 196, 256
අනුසස් 13


Non-commercial distribution

අනේසනය 74, 179
අනොත්තප්පය 67, 222
අන්තග්‍රාහික 97, 99
අන්තරාය 54
අන්තවාදිට්ඨි 66
අන්තානන්තිකවාද 235
අන්‍යවිහිත 186
අපරන්තානු දිට්ඨි 67
අපරන්තානු දෘෂ්ටි 243
අපරාන්තය 61
අපාය ගමනීය 254
අප්පටිසන්ථාර 78
අප්පමාණ සුභ 64
අප්පමාණාභ 64
අප්පමාද 23
අප්‍රමාදය 23
අභිජ්ඣා 90,148, 256
අභූතවාදි 88
අමද්දව 74
අමර 47
අමර විතක්ක 46
අමරා වික්ඛෙප 99
අමරාවික්ඛේපිකවාදය 237
අයාථාවමාන 42
අයෝනිසෝමනසිකාර 142, 173
අරති 32, 116, 171
අරූප රාග 170
අරූපාවචර 65
අරූපි 212
අර්හත්වය 64
අල්පලාභි 15, 57
අල්පේච්ඡයා 27
අවදඤ්ඤුතා 132
අවිජ්ජා 59, 255
අවිද්‍යාව 63, 103, 170
අවිනයවාදී 88
අවිහ 64
අව්‍යාකෘත 225
අව්‍යාකෘත චෛතසික 245
අශුභ භාවනාව 30
අෂ්ට ලෝකධර්ම 207
අසංඥ භවය 239
අසංඥ සත්ව 239
අසඤ්ඤීය 212
අසඤ්ඤිවාද 177, 242
අසංවරය 133
අසඤ්ඤසත්ත 64
අසද්ධර්ම 30, 198
අසන්තුට්ඨිතා 120
අසභාග වුත්ති 30
අසම්පජඤ්ඤ 83, 126, 142
අසාබල්ල 77
අසිලෝක භය 179
අසුරකාය 250
අසෝරච්ච 77
අස්තංගමය 200
අස්ථාන 227
අස්මිමානය 45
අස්සද්ධිය 129
අස්සාද දිට්ඨි 115
අහිරික 67, 222
අහේතුක වාදය 108
ආකාසානඤ්චායතන 65, 200
ආකිඤ්චඤ්ඤායතනය 65, 200
ආඝාත 214
ආජීවකයා 67
ආජීවික භය 179
ආතුර 11
ආත්ම දෘෂ්ටිකයා 66
ආත්ම දෘෂ්ටිය 91
ආත්මීය 51
ආදීනවය 5
ආධ්‍යාත්මික 224, 246
ආනන්තරිය 50


Non-commercial distribution

| | |
|---|---|
| ආනන්තර්ය | 174 |
| ආපත්තිය | 211 |
| ආභස්සර | 64, 233 |
| ආමිෂය | 79 |
| ආමිස පටිසන්ථාරය | 79 |
| ආයතන | 109 |
| ආරම්මණ | 224 |
| ආරෝග්‍ය මද | 11 |
| ආරෝහ මද | 21 |
| ආර්ය ධර්මය | 64, 113 |
| ආර්යයා | 136 |
| ආයර්‍ය්‍යවංශ ධර්මය | 117, 152 |
| ආර්යවංශ ප්‍රතිපදාව | 76, 152 |
| ආර්ය විද්‍යාව | 64 |
| ආවට්ට භය | 160, 162 |
| ආවාසිකයා | 79 |
| ආවාස මච්ඡරිය | 55 |
| ආසව | 4, 146, 255 |
| ඉඤ්ජිත | 218 |
| ඉදංසච්චාභිනිවේස | 149, 255 |
| ඉද්ධිමද | 20 |
| ඉන්ද්‍රිය | 80 |
| ඉන්ද්‍රිය සංවරය | 80 |
| ඉරියාපථ මද | 20 |
| ඉස්සා | 53, 245 |
| ඉහ ආත්මය | 13 |
| ඊර්ෂ්‍යාව | 53, 252 |
| ඊශ්වර නිර්මාණවාදය | 108 |
| උක්කුටිකය | 44 |
| උච්ඡේදදිට්ඨි | 66 |
| උච්ඡේදදෘෂ්ටිය | 65, 199, 230 |
| උච්ඡේද වාදය | 199, 242 |
| උට්ඨාන ඵලූපජීවී | 120 |
| උතුපරිණාමජ වේදනා | 106 |
| උත්තරි මනුෂ්‍ය ධර්ම | 35 |
| උත්පන්න | 7, 244 |
| උත්පාද | 156 |
| උද්ධ | 164 |
| උද්ධච්ච | 119, 142, 172 |
| උද්ධම්භාගිය | 165 |
| උන්මත්තකයා | 9 |
| උපකාරකයා | 141 |
| උපක්කිලේස | 4 |
| උපචය | 246 |
| උපනාහ | 51, 257 |
| උපසම්පදාව | 11 |
| උපාදාන | 61, 113, 150, 256 |
| උපාධ්‍යායයා | 31 |
| උපායාස | 180 |
| උපාරම්භ චිත්තතා | 139 |
| උපේක්ෂාව | 181, 192 |
| ඌමි භය | 160 |
| ඒකත්‍ය ශාස්වතවාදය | 99, 233 |
| ඒකාග්‍රතාව | 210 |
| ඒසනා | 97 |
| ඓහලෞකික | 170 |
| ඔතප් | 68 |
| ඔත්තප්ප | 68 |
| ඔඝ | 4, 149 |
| ඔපක්කමික වේදනා | 107 |
| ඔපපාතික | 238 |
| ඔමාන | 42 |
| ඔර | 164 |
| ඔරම්භාගිය | 164 |
| ඖදරික | 180 |
| කදරිය | 54 |
| කබලිංකාරාහාරය | 199 |
| කමටහන් | 45 |
| කම්මඵලූපජීවී | 120 |
| කම්මාරාමතා | 186 |
| කසාව | 114 |
| කසිණ නිමිත්ත | 66 |
| කාමච්ඡන්දය | 170 |
| කාම ධාතු | 89 |


Non-commercial distribution

කාමභවය 85
කාමය 88, 113, 147
කාමරාගය 5
කාම විතක්ක 88
කාම සඤ්ඤා 89
කාමුපාදන 150
කාමේසනා 97
කාමෝඝය 249
කාය 133
කාය ගන්ථ 148
කාය දුච්චරිත 89
කාසාය 114
කාසාව 114
කිඤ්චන 110
කිලේස 4
කිලේශ වත්ථූ 202, 222
කුක්කුච්ච 172, 245
කුණප 10
කුම්භීල භය 161
කුම්මග්ග සේවනා 145
කුලමච්ඡරිය 55
කුසලාව්‍යාකෘත චෛතසික 245
කුසීත වත්ථුව 202
කුහකයා 27
කුහනා 33
කෛරාටිකයා 16
කෝසජ්ජ 119
ක්‍රෝධය 51
ක්ලේශ 4, 222, 245
ක්ෂාන්ති 75

ගජවාසිය 58
ගන්ථ 148, 255
ගරුකාර මද 16
ගිරිභණ්ඩවාහන 29
ගුණමකු 52
ගූථය 68
ගේහසිත රාගය 183
ගෝත්‍රභූ චිත්තය 147
ගෝත්‍රමද 9
ගෝමූත්‍ර වංකය 74
ග්ලාන ප්‍රත්‍යය 120

චතුරෝඝය 166
චතුෂ්ක 163
චන්ද්‍රලේඛා වංකය 74
චපල 30
චාතුර්මහාභූතික 199, 242
චාපල්‍ය 30
චේතසෝලීනත්ත 33
චේතසෝ විනිබන්ධ 169
චේතෝඛිල 4, 167
චෝදකයා 211
චෝපනකාය 133

ඡන්දරාගය 183
ඡන්දගති 153
ජනපද විතක්ක 46
ජනාදරය 18
ජරා භය 102
ජාගරියානුයෝගය 187
ජාතක භාණක 36
ජාති භය 102
ජාතිමද 9
ජීවිත මද 13

ඣාන මද 21
ඤාති විතක්ක 46

තණ්හා 64, 223
තණ්හා කාය 185
තණ්හුප්පාද 151
තථාගත 230
තදංග ප්‍රහාණය 252
තන්දි 32, 172
තම 103
තරුණ මද 12
තර්කී වාද 235

Non-commercial distribution

තාර්කිකයා 67, 212, 233
තිත්ථ 109
තිත්ථායතන 109
තිත්ථිය 109
තින්තිණ 30
තිරශ්චීන ධර්ම 68
තීර්යාක් 25, 250
තීර්ථකයා 232
ත්‍රික 6
ත්‍රිශික්ෂාව 94

ථම්භ 23, 257
ථින මිද්ධ 33, 145, 171

දිට්ඨධම්ම නිබ්බාන වාද 177
දිට්ඨි 199
දිට්ඨි විපත්ති 84
දිට්ඨුපාදාන 150
දීඝ භාණක 76
දුක 6, 49
දුර්වචයා 127
දුශ්ශීලයා 133
දුෂ්කෘත 238
දුස්සීල්‍ය 173
දෘෂ්ටධර්මනිර්වාණ වාදය 180, 243
දෘෂ්ට ධර්මය 177, 180, 243
දෘෂ්ටි 63, 155, 194
දෘෂ්ටි ගතික 47, 99, 109
දෘෂ්ටි වාද 212
දේව ධර්මය 68
දේශනාව 151
දෝමනස්සූපවිචාරය 191
දෝවචස්සතා 69, 118
දෝසය 224
දෝසාගති 153
දෞර්මනස්‍ය 180

ධන මදය 17
ධම්ම පටිසන්ථාරය 79
ධම්ම මච්ඡරිය 56
ධම්මාරම්මණය 192
ධර්ම 184
ධර්මාදිෂ්ඨාන 151
ධූතගුණ 39, 40
ධ්‍යානලාභි 233

නංගලශීර්ෂ වංකය 74
නන්දිරාග 223
නානත්ත සඤ්ඤා 118, 200
නිකාය 24
නිගණ්ඨයා 67, 240
නිදානය 123
නිද්දාරාමතා 187
නිප්පේසිකතා 37
නිමන්ත්‍රණය 79
නියත මිථ්‍යාදෘෂ්ටිකයා 66
නිරෝධ තණ්හා 96
නීවාසනය 31
නීවරණය 169
නෛමිත්තිකතා 36
නෛරයික 120
නේවසඤ්ඤීනාසඤ්ඤී 213, 242
නේවසඤ්ඤානාසඤ්ඤායතන 65
නේවසඤ්ඤානාසඤ්ඤී වාද 177

පඤ්චස්කන්ධය 62, 97, 226,
පටිඝ 197, 254
පටිච්ච සමුප්පාදය 61, 63, 95
පටිභාණ මද 19
පටිසන්ථාර 78
පටිසන්ථාරවත 79
පපඤ්ච 189, 220
පපඤ්චිත 220
පරානුද්දයතා 47
පරාමාසය 256
පරිණායක රත්නය 141
පරිණාහ මද 21

Non-commercial distribution

පරිත්තාභ 64
පරිදේව 139, 180, 209
පරිභෝග 115
පරිමණ්ඩල 70
පරියුට්ඨාන 197
පරිවාර මද 17
පරිස සාරජ්ජ භය 179
පරෝපක්‍රමය 105
පර්යන්තය 66, 213
පර්යාප්ති ධර්මය 56
පර්යුත්ථාන 146
පලාස 53, 257
පාපමිත්තතා 71, 118
පාපිච්ඡතා 27
පාමොක් 176
පාරලෞකික 170
පාරාජිකා 84, 189
පාරිපූරිමද 21
පිටකය 24
පිණ්ඩපාතික 19
පිණ්ඩපාතික මද 19
පිළිසිඹියා 44
පුද්ගලාධිෂ්ඨාන 185, 198
පුනර්භව 2
පුබ්බන්තානුදිට්ඨි 67
පුබ්බාපරන්තෙ අඤ්ඤාණං 62
පුරිස දෝස 210
පුරුෂ මද 83
පුරුෂ මල 215
පුරෙක්ඛාර මද 16
පූර්වකෘත හේතුවාදය 104
පූර්වන්තානු දෘෂ්ටි 240, 243
පූර්වාන්තය 67
පෘථග්ජනයා 12, 208
ප්‍රඥප්තිය 249
ප්‍රඥාව 63
ප්‍රතිකූල 225
ප්‍රතිග්‍රාහක 34
ප්‍රතිසය 237
ප්‍රතිවේධ ධර්මය 56
ප්‍රතිපදව 61
ප්‍රතිසන්ථාරය 186
ප්‍රත්‍යය පරිග්‍රහ ඥානය 252
ප්‍රත්‍යවේක්ෂා 43, 82
ප්‍රමාද 22
ප්‍රසාද කාය 133
ප්‍රහීණ 45
ප්‍රේත 2, 116, 250
එන්දිත 219

බහිද්ධ 85
බහුශ්‍රැතය 64
බාලයා 126
බාහ්‍ය 246
බුඩ්ඪ පබ්බජිත 29, 137
බ්‍රහ්මචරියේසනා 97, 99
බ්‍රහ්මචර්යාව 99
බ්‍රහ්ම පාරිසජ්ජ 64
බ්‍රහ්ම පුරෝහිත 64
බ්‍රහ්මයා 233
බ්‍රාහ්මණ සමය 108

භත්ත සම්මද 33
භය 102, 160, 225
භයතුපට්ඨාන ඤාණ 102
භයාගති 153
භවතණ්හා 65, 96
භව දිට්ඨි 65
භවයෝග 223
භවාසව 147, 223
භවේසනා 97, 99
භවෝඝ 223
භස්සාරාමතා 186
භාණක 36
භාවනාරාමතා 117
භෝගමද 17
භෝජනේඅමත්තඤ්ඤුතා 82


Non-commercial distribution

භෝජනේ මත්තඤ්ඤුතා 83

මක්කටාලේපය 222
මක්ඛ 52, 257
මච්ඡරිය 53, 165
මඤ්ඤිත 219
මත 8
මද 8, 22, 226, 257
මනස්කාරය 231
මනෝදුච්චරිත 90
මනෝපදූසික 112, 235
මරණ 103
මරණ භය 102
මල 135, 215, 256
මළ 112
මසුරු 54
මහා බ්‍රහ්ම 64
මහා ලාභී 15
මහා සාවද්‍ය 50
මහිච්ඡතා 25
මහේශාක්‍ය 169
මහෝඝය 136, 149
මාත්සර්යය 54, 218, 255
මාන 42, 185, 219, 226
මාන මද 83
මානාතිමාන 42
මායා 57
මාර බන්ධන 113
මර්ගාමාර්ග
ව්‍යවස්ථාඥාන 252
මිච්ඡත්තා 210, 228
මිච්ඡා ඤාණ 228, 255
මිච්ඡා දිට්ඨි 228, 229
මිච්ඡා මාන 45
මිච්ඡා විමුක්ති 228, 255
මිථ්‍යාදෘෂ්ටි 46, 65
මිද්ධ 171

මුට්ඨසච්ච 83, 140
මුසාවාදය 215
මෛත්‍රිය 88
මෝහය 226

යසමද 20
යාථාවමාන 42
යොබ්බන මද 12
යෝග 4, 150
යෝගාවචරයා 43, 119
යෝනිසෝමනසිකාරය 117, 142
යෞවන මද 13

රත්තඤ්ඤූමද 19
රූක්ෂ 33
රූපකලාප 100
රූපතණ්හා 96
රූපරාග 170, 223
රූපාවචර 65

ලපනා 36
ලපිත 188
ලබ්ධිය 237
ලාභ මච්ඡරිය 55
ලාභ මද 15
ලාභෙන ලාභං නිජිගිංසනතා 33, 38
ලෝක 96
ලෝක ධර්ම 207
ලෝකනාසක ධර්ම 68
ලෝක වද්‍ය 50
ලෝකෝත්තර 65
ලෝහිතුප්පාදය 176

වචී දුච්චරිත 90
වණ්ණ මච්ඡරිය 56
වික්ෂේප 238
විචාරය 180
විචිකිච්ඡාව 93, 173
විජම්භිතා 33, 17[illegible]
විජ්ජා 5

Non-commercial distribution

විඤ්ඤාණඤ්චායතනය 65, 200

විතර්කය 180, 210
විදර්ශනාව 43
විධා 102
විනිබන්ධ 169
විපරියාස 155
විපරියේස 155
විපර්යාසය 157
විපල්ලාස 155, 255
විපාක වද්‍ය 50
විභව තණ්හා 96
විභව දිට්ඨි 65
විරෝධ වත්ථු 185
විවාද 182
විෂම 110
විෂ්කම්භණ ප්‍රහාණය 252
විහිංසා 88
විහිංසා ධාතු 89
විහේසා 116

වේදනා 105, 108
වේර 178
වේහප්ඵලය 64, 241
ව්‍යතික්‍රමණය 189
ව්‍යය දර්ශන ඥනය 252
ව්‍යසන 178
ව්‍යාපාද 88, 171
ව්‍යාපාදකායගන්ථ 148, 255
ව්‍යාපාද ධාතු 89
ව්‍රත 96
වෛරය 51

ශයිත 197
ශාස්වත දෘෂ්ටි 65, 230
ශාස්වත වාද 231
ශික්ෂාත්‍රය 168
ශීලව්‍රත පරාමර්ශ 96

ශෝකය 225
ශ්‍රද්ධා 129

ෂට්ක 182
ෂඩාරම්මණ 248

සංඥ 155
සඤ්ඤීවාද 177, 240
සංයෝජන 85
සංවේග 225
සංසග්ගාරාමතා 188, 189
සංසර්ගය 188
සංස්කාර 43
සක්කාය දෘෂ්ටිය 45
සංඛත 220
සංග 165
සංගණිකාරාමතා 187, 190
සංඝ භේද 176
සංඝ ලාභය 154
සඤ්ඤෝජන 164, 223
සණ්ඨාන මද 21
සති චෛතසිකය 84
සතින්ද්‍රිය 84, 141
සතිපට්ඨාන 84, 141
සතිබල 84, 141
සතිය 141
සතිසම්බොජ්ඣංගය 84, 141
සත්කාය දෘෂ්ටිය 92, 100
සත්කාර මද 15
සදිස මානය 38, 102
සද්ධර්ම 138
සද්ධින්ද්‍රිය 130
සන්තති 156, 246
සන්දිට්ඨි පරාමාසිතා 182
සමුච්ඡේද ප්‍රහාණය 250, 253
සමුල්ලපන 188
සම්පජඤ්ඤය 142
සම්පජාන මුසාවාදය 127

Non-commercial distribution

සම්භෝගය 115, 188
සම්මාසති 84, 141
සම්මෝහය 8, 133
සම්‍යක් ප්‍රධාන 141
සරූප් 211
සල්ල 166
සස්සත දිට්ඨි 66
සාඨෙය්‍ය 57, 59, 257
සාපත්තික 211
සාරම්භ 23, 257
සාරාණීය වත 79
සිංග 29
සිංහසෙය්‍යාව 35
සිප්ප මද 27
සිලෝකපටිසංයුත්ත විතක්ක 48
සීල 95
සීලබ්බත පරාමාස 95, 254
සීලබ්බතුපාදන 151
සීල මද 20
සීල විපත්ති 84
සුකෘත 238
සුතමද 18
සුදස්සය 64
සුදස්සිය 64
සුප්‍රතිපන්න 94
සුභකිණ්ණ 64
සුසුකාභය 160, 162
සෙය්‍යමානය 8, 38, 102
සේනාසන 206
සෝමනස්සූපවිචාර 190
සෝවචස්සතා 70,118
ස්ප්‍රෂ්ටව්‍ය 88
ස්වර්ගය 10, 65
හසිත 188
හිරි 66
හීනමානය 8, 38
හේතුවාද 104


Non-commercial distribution